# ආත්මික උපක්‍රම:

# ආත්මික සටන සඳහා අත්පොත

## හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි.
මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන

කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . . 4
හැඳින්වීම . . . . . . . . . 5
පාඨමාලාවේ අරමුණු . . . . . . . . 9

## යුද්ධායුධ ගැනීමට කෙරෙන කැඳවීම

1. අදෘශ්‍යමාන සටන . . . . . . . 10

## නිලයට පත්කිරීම

2. දෙවියන්වහන්සේගේ යුද හමුදාවට බැඳීම . . . . 20

## මූලික පුහුණුව

3. ප්‍රධාන අණදෙන නිලධාරී : සේනාවල ස්වාමීන්වහන්සේ . . . 30
4. යහපත් ආත්මික බලවේග : දේව දූතයෝ . . . . 48
5. සතුරා : සාතන් . . . . . . . . 59
6. යක්ෂයන් : ආත්මික නපුරු බලවේග . . . . . . 70
7. යක්ෂයාගේ බල ප්‍රදේශය . . . . . . . . 79
8. සතුරාගේ උපක්‍රම . . . . . . . . 90
9. දෙවියන්වහන්සේගේ සටන් සැලැස්ම . . . . . . 96

## හමුදා සේවයට කැඳවීම

10. පහරදීමේ හා ආරක්ෂාකාරී සටන් කිරීම් . . . . . . 117
11. ආරක්ෂක යුද්ධායුධ . . . . . . . 127
12. පහරදීමේ යුද්ධායුධ . . . . . . . 138
13. ආත්මික සටනේ ස්වභාවික සමාන්තරයන් . . . . . . 144

## ආක්‍රමණය කිරීම

14. යුදමය කලාපයට ඇතුළු වීම: ලෝකය,
මාංශය හා යක්ෂයා සමග සටන් කිරීම . . . . . . 154
15. මනස තුළ කෙරෙන සටන . . . . . . 169
16. දිව සමග කෙරෙන සටන. . . . . . . 183
17. පවුරු මත කෙරෙන සටන . . . . . . 199
18. උපක්‍රමික බලප්‍රදේශවල කෙරෙන සටන් . . . . . . 208

## ආත්මික සටන : උසස් පුහුණුව


19. ආත්ම පවරා දීම . . . . . . . . . 221

20. ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම . . . . . 231

21. යක්ෂ බලවේග සමග කටයුතු කිරීම . . . . . . . 244

22. යුද්ධයෙන් අනතුරට පත්වූවෝ . . . . . . . 268

23. සටනක් පරාජය වුවත් යුද්ධය ජයගත හැකි ක්‍රමය . . . . 284


## අවසාන දැනුවත් කිරීම


24. අවසාන යුද්ධය . . . . . . . . . 295


## උප ග්‍රන්ථය


බයිබලයෙහි තීරණාත්මක සටන්. . . . . . . . 305

පරීක්ෂණ සඳහා පිළිතුරු . . . . . . . . 328

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සෑසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ජේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ජේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ජේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා,** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ජේදයක එක් එක් කොටස සාකච්ජා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයින්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**පරීක්ෂා කිරීම**: ශිෂ්‍යයින් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් (පරීක්ෂා කිරීමේ පිටුව) පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයින් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**දක්ෂ ලෙස උපාය හැසිරවූ උපාය මාර්ග:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් කළ හැක.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණයද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

**මොඩියුලය : නියෝජනය කිරීම**
**පාඨමාලාව : ආත්මික උපක්‍රම**
**ආත්මික සටන සඳහා අත්පොත**

# හැඳින්වීම

අද ලෝකයේ මහත් සටනක් පවතී. එය ජාතීන් අතර හෝ ගෝත්‍ර අතර හෝ රජයේ නායකයන් අතර හෝ ඇති ගැටුමක් නොවේ. එය කැරැල්ලක් හෝ කුමන්ත්‍රණයක් හෝ නොවේ. එය ආත්මික ලෝකයේ කෙරෙන වැදගත් අදෘශ්‍යමාන සටනකි. දෙවියන්වහන්සේගේ සෙනග දැන ගැනීම නැති කමින් නාස්ති වී සිටින බව බයිබලයේ සඳහන් වේ. (හොෂෙයා 4:6) දැන ගැන්ම නැති නිසා පරාජය වන එක් ප්‍රධාන අංශයක් වන්නේ ආත්මික සටන පිළිබඳව වේ.

මුල් සභාව තම ආත්මික අත්දැකීම් දුටුවේ සටනක විලාශයකිනි. අලුත් ගිවිසුම මුළුල්ලේම යුධ හමුදාමය පරිභාෂිත පද භාවිතා කර ඇත. දෙවියන්වහන්සේගේ යුද්ධායුධ ඇඳුම් කට්ටලය තුල ආරක්ෂාව තිබූ බව පෙනිනි. දෙවියන්වහන්සේගේ වචනය කඩුවකට සම කර ඇත. සාතන්ගේ ප්‍රහාරයන් ගිනිමය ඊතල ලෙස හැඳින්විනි. ඇදහිල්ල ' සටනක්" ලෙසත් ඇදහිලිවතුන්ට "යහපත සටනක යොදන" ලෙසද පවසා ඇත. මුල් සභාව තමන් ප්‍රබල ආත්මික සටනක නියුක්තව සිටින බව දැන සිටියේය.

එම ආත්මික සටනම අදද පවතී. එහෙත් සතුරා හා සමග සටන් කරනු වෙනුවට අද ඇදහිලිවතුන් විශාල දේවස්ථාන ගොඩනගිති, සංගීතමය නාට්‍ය නිපදවති, සහභාගීත්ව රැස්වීම් පවත්වති.. එකිනෙකා සමග සටන් කරති. ඔවුන් එසේ කරන්නේ මේ මහත් ආත්මික සටන ඔවුන් වටා පවතිද්දී වේ. යුද පිටියේ ඉදිරි පේලිවලින් ඉවත් වී සිටින සභාවන්ට එරෙහිව සාතන් තම සංග්‍රාමය ප්‍රබල කර ඇත.

අවසාන කාලය ළං වන විට සභා ඉතිහාසයේ මුල් දිනවලට වඩා ආත්මික සටන ගැන ඇදහිලිවතුන් දැන ගැනීම ඉතා වැදගත්ය. ප්‍රේරිතවූ පාවුල් තුමා මෙසේ අනතුරු අඟවා ඇත.

> **"අන්තිම දවස්වලදී අන්තරා සහිත කාලවල් පැමිණෙන බව දැනගන්න"**
> **(2 තිමොති 3:1)**

මෙම අන්තරා සහිත කාලවල් සඳහා හොඳින් සූදානම්ව සිටීමට ආත්මික සටන පිළිබඳ උපක්‍රම ගැන අලුත් අවධාරණයක් තැබිය යුතුය. කිතුනු ජීවිතය යුද්ධයකි. එය හැඳින ගෙන ඒ සඳහා කලින්ම සූදානම් වූ තරමට ජයග්‍රහණය අත්දැකීමද ඉක්මන් වනු ඇත.

ලූක් 14:31 හි මෙසේ සඳහන් වේ. **"වෙන රජෙකුට විරුද්ධව යුද්ධයට යන කවර රජෙක් තමාට විරුද්ධව විසිදහසක් ගෙනඑන්නාවූ ඔහු ඉදිරියට දසදහසක් සමග යන්නට පුළුවන්දෝ කියා පළමු කොට හිඳ මන්ත්‍රණය නොකරන්නේද?"** සංග්‍රාමික උපක්‍රම වර්ධනය කර ගැනීම හා තමාට ඇති සම්පත් පිළිබඳව පරෙස්සමින් පරීක්ෂා නොකර කිසිදු රජ කෙනෙක් යුද්ධයකට අවතීර්ණ වන්නේ නැත. අප මෙම පාඨමාලා වෙන් කරන්නේද ඒ දෙයම වේ. අපගේ සතුරා වූ සාතන්ට එරෙහිව කරනු ලබන යුද්ධය ජයගැනීම සඳහා අප සතුව ඇති උපක්‍රම, ආයුධ හා බලය පිළිබඳ ඇගයීමක් ප්‍රවේසමෙන් මෙහිදී අපි කරන්නෙමු.

හමුදාමය කටයුතු වලදී "උපක්‍රම" යනු හමුදාමය මෙහෙයුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ විද්‍යාව වේ. එය ජයග්‍රහණයේ ඉලක්කය කරා ගෙන යනු ලබන ක්‍රම හෝ සැලසුම් වේ. මෙම පාඨමාලාවේදී ආත්මික ලෝකයේ ජයග්‍රහණය ගෙන දෙන ආත්මික යුධමය උපක්‍රම සැකසීමට හා ක්‍රියාත්මක කිරීමට ඔබ ඉගෙන ගන්නෙහිය.

# අත්පොත

සෑම පාඩමක්ම හමුදාමය භාෂාව භාවිතයෙන් ඉදිරිපත් කර ඇති අතර පහත දැක්වෙන කොටස් මෙහි අන්තර්ගතය.

## ආයුධ ගැනීමට කෙරෙන කැඳවීම:

1 පරිච්ඡේදයෙන් අදෘශ්‍යමාන යුද්ධය පැහැදිලි කරන අතර සියලුම සැබෑ ඇදහිලිවතුන්ට "ආයුධ ගැනීමට කැඳවීමක් " කරයි.

## නිලයට පත් කිරීම:

ස්වභාවික ලෝකයේ සියලුම යුධ හමුදාවල නිලයට පත්කිරීමේ ක්‍රියාවලියක් ඇත. මේවා හමුදාවට බැඳීම සඳහා ඔබ කළ යුතු විශේෂ දේවල් වේ. දෙවියන්වහන්සේගේ යුධ හමුදාව සඳහාද මේ දේවල් අවශ්‍යය. දෙවියන්වහන්සේගේ යුධ හමුදාවට බැඳෙන ආකාරය 2 පරිච්ඡේදයෙන් විස්තර කෙරේ.

## මූලික පුහුණුව:

යුධ හමුදා නිලයකට පත් කළ පසු සෑම සෙබලෙකුටම මූලික පුහුණුවක් ලැබේ. දෙවියන්වහන්සේගේ හමුදාව සඳහා දෙනු ලබන මූලික පුහුණුව 3-9 පරිච්ඡේදවලින් ඉදිරිපත් කර ඇත. අදෘශ්‍යමාන යුද්ධයේ සංග්‍රාමික ක්‍රම අර්ථ විග්‍රහ කර ඇත. සේනාවල ස්වාමීන්වහන්සේ, දේව දූතයන්, සාතන්, යක්ෂයන්, ලෝකය හා මාංශය ඇතුළුව සියලු යහපත් හා අයහපත් බලවේග සාකච්ඡා කර ඇත. සතුරාගේ භූමි ප්‍රදේශය හා උපක්‍රම හඳුනාගෙන ඇති අතර දෙවියන් වහන්ස්ගේ සංග්‍රාම සැලස්මේ සාමාන්‍ය සංක්ෂිප්තයක් ඉදිරිපත් කර තිබේ.

## කැඳවීම:

හමුදාවක් කැඳවා නොමැති නම් පුහුණු කිරීමෙන් ප්‍රයෝජනයක් නැත. මෙහිදී "කැඳවීම" යන්නෙහි තේරුම "ක්‍රියාකාරී යුද සේවය සඳහා සූදානම්ව සිටීමේ තත්ත්වයකට පත්කිරීම"වේ. මෙම පාඩමාලාවේ 10-13 පරිච්ඡේදවල ඇති "කැඳවීමේ" කොටසින් ඔබ ආක්‍රමණකාරී හා ආරක්ෂා සටන් කිරීම්, ඔබගේ සටන සඳහා ආයුධ භාවිත කරන ආකාරය, හා ආත්මික සටන සමග ඇති ස්වභාවික සමාන්තරතාවයන් ඉගෙන ගන්නහිය.

## ආක්‍රමණය:

සාමාන්‍ය ලෝකයේ ආක්‍රමණයකදී හමුදාවක් සටන් භූමියට ඇතුළු වන්නේ සතුරන් හා භූමිය අල්ලා ගැනීමටය. උගත් දේ ක්‍රියාවට නංවන්නේ නොමැති නම් මූලික පුහුණුවෙන් වැඩක් නැත. ආයුධ සන්නද්ධව යුද්ධයට කැඳවූ හමුදාවක් අයිනකට වී අක්‍රියව සිටින්නේ නම් ඉන් කිසි ප්‍රයෝජනයක් නැත. යුද්ධයකදී ඵලදායි වීමට නම් සැබෑ යුද භූමියට ඇතුළු විය යුතුය. 14-19 පරිච්ඡේදවල සඳහන් "ආක්‍රමණ" අවස්ථාවේ ඔබ ලෝකයේත්, මාංශයේත් හා යක්ෂයාගේත් යුධ භූමියට ඇතුළු වන්නේය. ඔබ මනසේ ඇති වන සටනද, වචන වලින් (දිවෙන්) හා ආත්මික බාධක වලට ඉහලින් ඇති සටනද උස් ස්ථානවල හා වැදගත් උපක්‍රමික ස්ථානවල ඇති වන සටන පිළිබඳව අධ්‍යයනය කරනු ඇත. මේ සෑම පාඩමකම සාතන්ගේ සුවිශේෂී උපක්‍රම හඳුනාගන්නා අතර සතුරා පරාජය කළ හැකි උපක්‍රම ඉදිරිපත් කර ඇත.

## ආත්මික සටනෙහි උසස් පුහුණුව (SPIRITUAL WARFARE ADVANCED TRAINING)

යුදබිමේදී අත්දැකීම් ලබාගත් පසු සෙබලුන්ට සාමාන්‍යයෙන් යුද්ධයේ සුවිශේෂී ක්ෂේත්‍ර පිළිබඳව උසස් පුහුණුවක් දෙනු ලැබේ. "ආත්මික සටනෙහි උසස් පුහුණුව" ලෙස අත්පොතෙහි නම් කර ඇති මෙම කොටස ˜,ළ්ඹ, යන්නෙහි මුල් අකුරු හඳුන්වා දෙයි. යුදමය කටයුතුවලදී ˜,ළ්ඹ, කණ්ඩායමක් යනු අසීරු මෙහෙයයන් සඳහා යොදා ගන්නා විශේෂ පුහුණුවක් ලද හමුදා භට ඛණ්ඩයකි. මෙම අත්පොතෙන් දෙනු ලබන උසස් පුහුණුවෙන් ඔබ ආත්ම සංක්‍රාමණය, සිරකරුවන්ට හා යුද්ධයෙන් තුවාළ ලැබූවන්ට සහාය වන ආකාරය හා යක්ෂ බලවේගයන් සමග කටයුතු කරන ආකාරය ගැන ඉගෙනගන්නවා ඇත. එමෙන්ම එක් සටනක් පැරදුනත් යුද්ධය දිනන ආකාරයද ඔබ ඉගෙනගන්නහිය.

## අවසාන උපදෙස් දීම:

26 පරිච්ඡේදයේ ඇති අවසාන උපදෙස් දීම, කාලයක් තිස්සේ පවතින මෙම යුද්ධයේ ජයග්‍රාහි සමාප්තිය ගෙනෙන "අවසාන ගැටුම" ඔබ අධ්‍යයනය කරන්නෙහිය.

## උපග්‍රන්ථය:

මෙම අත්පොතේ උපග්‍රන්ථයේ ඔබ, ඔබගේ ආත්මික යුදමය හැකියාවන් දියුණු කරගන්නා අතරම "බයිබලයේ ඇති තිරණාත්මක සටන්" පිළිබඳ ඓතිහාසික වාර්තා සොයා බලනු ඇත.

# පාඩම්

සටන් පිළිබඳ මෙම අත්පොතේ සෑම පාඩමක්ම සංවිධානය කර ඇත්තේ පහත දැක්වෙන පරිදි වේ.

## අරමුණු:

මේවා, ඔබ ඒ පාඩම අධ්‍යයනය කිරීමෙන් සාක්ෂාත් කරගත යුතු ආත්මික සටන් පිළිබඳ ඉලක්ක වේ.

## යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය:

කිසියම් ජාතියක් යුද්ධයක් ප්‍රකාශ කළ පසු බොහෝ අවස්ථාවල ඔවුහු "යුද්ධය පිළිබඳ ලිපියක්" නිකුත් කරති. මෙම ලියවිල්ලෙන් ඔවුන් යුද්ධ කිරීමට හේතුව පැහැදිලි කරන අතර සතුරා හඳුනාගැනීමත් යුද්ධයේ අරමුණු ප්‍රකාශ කිරීමත් කරනු ලැබේ. බයිබලය, ආත්මික හමුදාවේ අණදෙන නිලධාරි වන, එකම සැබෑ දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය වේ. ආත්මික සටන් සඳහා "යුද්ධය පිළිබඳ ලිපි" බයිබලයේ අඩංගුය. සෑම පාඩමකම, "යුද්ධය පිළිබඳ ලිපිවලින් ගත් ප්‍රධාන පදය" එම පාඩමේ ප්‍රධාන සංකල්පය අවධාරණය කරයි.

## හැඳින්වීම:

එම පරිච්ඡේදයේ අන්තර්ගතය පිළිබඳ සංක්ෂිප්තයක් හැඳින්වීමෙන් ඉදිරිපත් කෙරේ.

## පාඩම:

මෙය එම පරිච්ඡේදය සඳහා "යුදමය අවසාන උපදෙස් දීම " ඉදිරිපත් කරයි. "අවසාන උපදෙස් දීම " යනු සටනට පෙර සාර්ථක සංග්‍රාමයක් සඳහා අවශ්‍ය තොරතුරු සපයන උපදෙස් දීමේ කාලය වේ.

## පරීක්ෂා කිරීම:

ස්වභාවික හමුදාවක "පරීක්ෂා කිරීම" නිරන්තරයෙන්ම කරනු ලැබේ. ඒ හමුදා භටයන්ගේ සූදානම හා දක්ෂතාවයන් පිරික්සීමටය. සෑම පරිච්ඡේදයකම "පරීක්ෂා කිරීමේ" කොටසින් කරනු ලබන්නේ පාඩමේ අරමුණු ඔබ සාක්ෂාත් කරගෙන ඇත්දැයි විමසා බැලීම වේ.

## උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම:

ස්වභාවික හමුදාවක, උපායමාර්ග දක්ෂ ලෙස හැසිරවීමේදී කරනු ලබන්නේ, හමුදා භටයන් තමා උගත් දේ සත්‍ය සටන් අවස්ථාවකට යොදා ගැනීම වේ. සෑම පාඩමකම මෙම කොටස ඔබ උගත් දේ භාවිතා කිරීමටත් පාඩමට අදාළ වෙනත් කරුණු අධ්‍යයනය කිරීමටත් අවස්ථාවක් සලසා දෙයි.

# ඔබ දැන් සූදානම්ද ?

සතුරා හා ඔහුගේ උපායමාර්ග අනාවරණය කිරීම දේව වචනයේ එක් ශ්‍රේෂ්ඨ එළිදරව් කිරීමක් වේ. මීටත් වඩා ශ්‍රේෂ්ඨ එළිදරව් කිරීමක් වන්නේ ඇදහිලිවතුන් ලෙස අපට සතුරාගේ සියලු බලවේගවලට වඩා වැඩි බලයක් තිබීම පෙන්වීම වේ. මෙම අත්පොත කෙසේවත් ආත්මික සටන පිළිබඳ විෂය ගැන වෙහෙසකරවන අධ්‍යයනයක් නොවේ. එය ගැඹුරු ශුද්ධ ලියවිලි විශ්ලේෂණයකි. ස්වභාවික යුද්ධයක මෙන්ම ආත්මික යුද්ධයක දක්ෂතාවන්ද, යුධ භූමියට ඇතුළු වී සටන ආරම්භ කරන විට වැඩි දියුණු වනවා ඇත.

# පාඨමාලාවෙහි අරමුණු:

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට :

- ආත්මික රාජධානි දෙක හැඳිනගැනීමට
- "ආත්මික සටන" යන්නෙහි තේරුම පැහැදිලි කිරීමට
- මේ මහා ආත්මික සටනට හේතුන් හැඳිනගැනීමට
- යහපත් ආත්මික බලවේග හැඳිනගැනීමට
- නපුරු ආත්මික බලවේග හැඳිනගැනීමට
- සාතන්ගේ උපාය මාර්ග හැඳිනගැනීමට
- ආත්මික ප්‍රති උපායමාර්ග ඵලදායි ලෙස භාවිතා කිරීමට
- ආත්මික ලෝකයේ පවතින යුද්ධයට ස්වභාවික සමාන්තරතා යෙදවීමට
- ආක්‍රමික මෙන්ම ආරක්ෂක යුද්ධායුධ භාවිත කිරීමට
- යක්ෂාවේශවීම් අනාවරණය කර ගැනීමට
- යක්ෂයන්ගෙන් මිදීම ලබාගන්නා ආකාරය අවබෝධ කරගැනීමට
- ආත්මික සටනක් පරාජය වුවත් යුද්ධය ජයග්‍රහණය කිරීමට
- අදෘශ්‍යමාන යුද්ධය අවසන් කෙරෙන අවසාන ගැටුම විස්තර කිරීමට
- බයිබලයේ සඳහන් තීරණාත්මක සටන්වල ආත්මික යුදමය මූලධර්ම හැඳිනගැනීමට හැකිවනු ඇත.

# යුද්ධායුධ ගැනීමට කෙරෙන කැඳවීම

## අදෘශ්‍යමාන යුද්ධයට කෙරෙන කැඳවීම

ආත්මික ලෝකයේ මහත් සටනක් පැවැත්වේ. එය මාංශය හා ආත්මය අතර කෙරෙන පෞද්ගලික සටනකි. එය ලෝකයේ නපුරු බලවේග සමග කෙරෙන සමාජීය සටනකි. එය නපුරු අධිස්වභාවික බලවේග සමග කෙරෙන ආත්මික සටනකි.

පැරණි ගිවිසුම් යුගයේ දෙවියන්වහන්සේගේ සෙනග සටනට කැඳවීම සඳහා හොරණෑවක් භාවිතා කළේය. අද, මුළු ලොව පුරා වෙසෙන සියලු ජාතීන් වෙත ආත්මික කැඳවීම හඬ නංවයි. එය අදෘශ්‍යමාන යුද්ධයට කෙරෙන කැඳවීමකි. එය යුද්ධායුධ ගන්නා ලෙස කෙරෙන කැඳවීමකි.

# පළමුවන පරිච්ඡේදය

## අදෘශ්‍යමාන සටන

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ස්වභාවික හා ආත්මික ක්ෂේත්‍ර අවබෝධ කරගත් බව ප්‍රදර්ශනය කිරීමට
- “රජු” යන වචනය අර්ථවිග්‍රහ කිරීමට
- “රාජධානිය” යන වචනය අර්ථවිග්‍රහ කිරීමට
- ආත්මික රාජධානි දෙක හැඳින ගැනීමට
- ඔබ අයත් රාජධානිය තීරණය කිරීමට
- යහපත් ආත්මික බලවේග හැඳිනගැනීමට
- නපුරු ආත්මික බලවේග හැඳිනගැනීමට
- “ආත්මික සටන” යනු කුමක්දැයි පැහැදිලි කිරීමට
- අදෘශ්‍යමාන සටනට හේතු හැඳින ගැනීමට
- ආත්මික සටන අවබෝධ කර ගැනීමේ මූලික සිද්ධාන්ත හැඳිනගැනීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **මක්නිසාද අපේ පොර බැදීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම් වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මූලාදැනීන්ටත් ස්වර්ගය ස්ථානවල සිටින දුෂ්ඨකමේ ආත්ම සේනාවටත් විරුද්ධවය (එපීස 6:12)**

## හැඳින්වීම

ඔබ මෙම පාඨමාලාවේ හැඳින්වීමෙන් උගත් පරිදි, අද ලෝකයේ මහා යුද්ධයක් පවතී. එය ජාතීන් හෝ ගෝත්‍ර හෝ රාජ්‍ය නායකයන් හෝ අතර ඇති ගැටුමක් නොවේ. එය කැරැල්ලක් හෝ කුමන්ත්‍රණයක් හෝ නොවේ. එය ආත්මික ලෝකයේ කෙරෙන අදෘශ්‍යමාන සටනකි.

සෑම ඇදහිලිවන්තයෙක්ම යෙදී සිටින අදෘශ්‍යමාන සටන මෙම පරිච්ඡේදයෙන් හඳුන්වා දෙයි. මෙය කිසිදු කෙනෙක් නිල ඇඳුමක් නොඅඳින සටනකි, එහෙත් සෑම කෙනෙක්ම එහි ඉලක්කයකි.

මෙම යුද්ධය පිළිබඳව ඓතිහාසික හා අනාගතය හෙළිකෙරෙන වාර්තා දේව වචනයේ, එනම් බයිබලයේ අන්තර්ගතය.

## ස්වභාවික හා ආත්මික ක්ෂේත්‍ර

මෙම අදෘශ්‍යමාන යුද්ධය අවබෝධ කර ගැනීමට ඔබ පළමුවෙන්ම ස්වභාවික හා ආත්මික ලෝක අවබෝධ කරගත යුතුය. මිනිසා ලෝක දෙකක ජීවත් වේ. ඒ ස්වාභාවික ලෝකය හා ආත්මික ලෝකයය. ස්වභාවික ලෝකය යනු දැකීමට, ස්පර්ශ කිරීමට, ඇසීමට හා රස විඳීමට හැකි ලෝකය වේ. එය දෘශ්‍යමානය. ඔබ ජීවත්වන රට, දේශය, නගරය හා ගම ස්වභාවික ලෝකයේ කොටසකි. ඔබ ලෝකයේ දෘශ්‍යමාන මහද්වීපයක පිහිටි ස්වභාවික රාජ්‍යයක පුරවැසියෙකි. ඔබට ඔබගේ පරිසරයේ කොටසක් වූ මිනිසුන්ව දැකගත හැකිය. ඔබට ඔවුන් සමග සන්නිවේදනය කළ හැකිය. ඔබට ඔබ වටාපිටාවේ ඇති දර්ශන, ශබ්ද හා සුවඳ අත්දැකිය හැකිය.

එහෙත් ඔබ ජීවත්වන තවත් ලෝකයක් තිබේ. එය ආත්මික ලෝකයයි. ඔබට ඔබගේ ඇස් දෙකෙන් එය දැකගත නොහැකිය, එහෙත් එය ඔබ ජීවත්වන ස්වාභාවික ලෝකය තරම්ම තාත්වික වේ.

පාවුලුතුමා මේ ස්වභාවික හා ආත්මික බෙදීම ගැන මෙසේ පවසයි:

> **ස්වර්ගික ශරීරද, භූමික ශරීරද ඇත්තාහ. (1 කොරින්ති 15:40)**

සෑම මිනිසෙකුටම ස්වභාවික ලෝකයේ ජීවත්වන ස්වභාවික ශරීරයක්ද ඇත. එහෙත් මනුෂ්‍යයා සදාතන ප්‍රාණයක් හා ආත්මයක් සහිත ආත්මික කෙනෙකි. මනුෂ්‍යයාට ශාරීරයක්, ප්‍රාණයක් හා ආත්මයක් ඇත. ඔබගේ ආත්මික පුද්ගලයා (ප්‍රාණය හා ආත්මය) ආත්මික ලෝකයේ කොටසකි. එය ඔබගේ ස්වභාවික ශරීරය ස්වාභාවික ලෝකයේ කොටසක් මෙන්ම වේ.

## ආත්මික විමසා බැලීම

ආත්මික සටන - ආත්මික බැවින්, එය ආත්මික මනසකින් අවබෝධ කරගත යුතුය. අපගේ ස්වභාවික, පාපි ස්වභාවයෙන් ආත්මික දේවල් අපට අවබෝධ කරගත නොහැකිය.

> **නමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළි නොගනියි. ඒවා ඔහුට මෝඩකමය: ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය (1 කොරින්ති 2:14)**

ආත්මික දේ අවබෝධ කර ගැනීමට "ආත්මික ලෙස විමසීම " අවශ්‍ය වේ.

ස්වභාවික හා ආත්මික දේ නිර්ණය කිරීම පිළිබඳ එක් හොඳ උදාහරණයක් 2 රාජාවලිය 6 වන පරිච්ජේදයේ වාර්තා කර ඇත. සතුරු සිරියා රාජ්‍යය, දිවැසිවර එළිෂා නැවතී සිටි දෝතාන් නමැති කුඩා නගරය වටකරගෙන සිටි, ස්වභාවික සටනක් පිළිබඳ කතාවක් එහි වාර්තා වේ. එළිෂා ගේ සේවකයා වූ ගෙහාසි සතුරු සේනාව දුටුවිට බිය විය. එළිෂා යාච්ඤා කරමින් ඉල්ලා සිටියේ ඔවුන් වටා ඔවුන්ව ආරක්ෂා කරමින් සිටින දේවදූත. සේනාව ගෙහාසීට පෙනෙන පිණිස ඔහුගේ ආත්මික ඇස් විවෘත කරන ලෙසය. මේ අවස්ථාවේ දෙවියන්වහන්සේ ගෙහාසි ගේ ස්වාභාවික ඇස් විවෘත කරමින් ඒ සටන සඳහා පෙළගැසී සිටින දෙවියන්වහන්සේගේ බලවත් සේනාව ඔහුට දැකගැනීමට ක්‍රියාකළ සේක.

දෝතාන්හි සටන පිළිබඳ මෙම කතාන්දරය අද සභාවේ පවතින ආත්මික තත්ත්වයට සමානය. එලිෂා මෙන් ආත්මික ක්ෂෙත්‍රය පැහැදිලිව පෙනෙන සමහර අය සිටිති. ඔවුහු ගැටුමක් ඇති බව දන්නා අතර සතුරා හඳුනාගෙන ඇත. එමෙන්ම ජයග්‍රහණය සහතික කෙරෙන දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ බලයන්ද හඳුනාගෙන ඇත. තවද ගෙහාසි වැනි අයද සිටිති. සුළු දිරිදීමක් මගින් ඔවුන්ගේ ආත්මික ඇස් විවෘත කළ හැකිය. එවිට ඔවුන් තවදුරටත් බිය වන්නේ හෝ සතුරා මගින් පරාජය වන්නේ හෝ නැත. එහෙත් කණගාටුවකට මෙන් අද දෝතාන් නගරයේ සෙනග මෙන් ආත්මිකව නිදා සිටින බොහෝ අය සිටිති. සතුරා ඔවුන්ව වටකර ඔවුන්ට පහරදීමට සූදානම්ව සිටින බවවත් ඔවුහු නොදනිති.

# ආත්මික රාජධානි දෙක

අප මේ කතා කරන ස්වභාවික හා ආත්මික ක්ෂේත්‍ර තුළ එකිනෙකට වෙනස් රාජධානි පවතින අතර ඒවා පාලනය කරන්නේ ස්වාභාවික හා ආත්මික නායකයන් විසිනි.

## ස්වභාවික රාජධානි :

සියලුම මිනිසුන් ජීවත් වන්නේ ලෝකයේ ස්වභාවික රාජධානියක වේ. ඔවුන් ජීවත් වන්නේ දේශයක කොටසක් වන නගරයක හෝ ගමක හෝ වේ. එම දේශය ලෝකයේ රාජධානියකි. ස්වභාවික රාජධානියක් යනු එක්තරා ප්‍රදේශයක් හෝ සෙනගක් හෝ වන අතර එය පාලනය කරනු ලබන්නේ පරමබලධාරී පාලකයෙකු වූ රජතුමකු හෝ දේශපාලන නායකයෙකු හෝ විසිනි. මේ ස්වභාවික රාජධානි බයිබලය හඳුන්වන්නේ "ලෝකයේ රාජ්‍යයන්" ලෙසය. ලෝකයේ රාජධානිය සාතන්ගේ බලයට හා බලපෑමට යටත් වී තිබේ.

> **නැවතත් යක්ෂයා උන්වහන්සේ ඉතා උස් කන්දකට පමුණුවා, ලෝකයේ සියලු රාජ්‍යයන්ද එහි ඓශ්වර්යයද උන්වහන්සේට පෙන්වා: ඔබ බිම වැටී මට නමස්කාර කරන්නෙහි නම් මේ සියල්ල ඔබට දෙන්නෙමියි උන්වහන්සේට කීවේය. (මතෙව් 4:8-9)**

යොහාන් 5:19 අපට කණගාටුවෙන් මතක් කරන්නේ "මුළු ලෝකයම නපුරාගේ පාලනය යටතේ තිබෙන" බවය.

## ආත්මික රාජධානි :

මේ ලෝකයේ ස්වාභාවික රාජධානිවලට අමතරව ආත්මික රාජධානි දෙකක් තිබේ. ඒවා නම් සාතන්ගේ රාජධානිය හා දෙවියන්වහන්සේගේ රාජධානියයි. මෙලොව ජීවත් වන සෑම කෙනෙක්ම මේ රාජධානි දෙකෙන් එකක වාසය කරන්නෝ වෙති.

සාතන්ගේ රාජධානියට අයත් වන්නේ, සාතන්, යක්ෂයන් ලෙස හැඳින්වෙන ආත්මික අයවලුන්, හා දේව වචනයට විරුද්ධව හා පාපයේ ජීවත්වන සියලු මනුෂ්‍යයෝ වේ. අද ලෝකයේ ක්‍රියාත්මක වන නපුරු ආත්මික බලවේග වන්නේ ඉහත කී අයවලුන්ද ලෝකය හා මාංශයත්ය.

දෙවියන්වහන්සේගේ රාජධානියට අයත් වන්නේ පියවූ දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ, දේවදූතයන් ලෙස හැඳින්වෙන ආත්මික අය, හා දේව වචනයට කීකරු ජීවත්වන සියලුම ධර්මිෂ්ඨයෝ වෙති. මේවා යහපත් ආත්මික බලවේගයන්ය.

දෙවියන්වහන්සේගේ රාජධානිය නිකායකට අයත් සභාවක් නොවේ. නිකායන් යනු මිනිසා සෑදූ සභා සමූහයක සංවිධානයකි. එවා පිහිටුවා ඇත්තේ සංවිධානය කිරීමේ හා පරිපාලනය කිරීමේ පරමාර්ථයක් ඇතිවය. නිකායන් යනු බැප්ටිස්ට්, එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් සභාව !ධධ-, මෙතෝදිස්ත, ලූතරන් වැනි ප්‍රධාන සභා සංවිධාන වේ. බයිබලය කතා කරන්නේ නිකායක් හෝ ආගමික සංවිධානයක් හෝ නොවන සැබෑ සභාවක් ගැන වේ. සැබෑ සභාවට අයත් වන්නේ දේව රාජ්‍යයේ වාසය කරන සියලු දෙනා වෙති.

මෙම ස්වභාවික ලෝකයේ වර්තමාන යුගයේ දේව රාජ්‍යය, තම ජීවිතයේ රජතුමා ලෙස යේසුස් වහන්සේ පත් කරගෙන ඇති සෑම පුරුෂයෙකුම, ස්ත්‍රියකම, පිරිමි හෝ ගැහැණු ළමයෙකුම තුළ පෞද්ගලිකවම පවතී. එමෙන්ම එය, දෙවියන්වහන්සේට අවශ්‍ය ආකාරයට මෙලොව වෙනස් කර ඇති ඕනෑම තැනක සිටින සෙනග හා සැබෑ සභාව තුළ සාමූහිකව පවතී. අනාගතයේදී දේව රාජ්‍යය සැබෑ ලෙෂ දෘශ්‍යමාන වනවා ඇත.

# අදෘශ්‍යමාන යුද්ධය

අදෘශ්‍යමාන ආත්මික යුද්ධය, සියලු පුරුෂයන් හා ස්ත්‍රීන් සම්බන්ධ වී සිටින සටනකි. සාතන්ගේ රාජධානියත් ආත්මික රාජධානියක් බැවින් ...

> **... අපේ පොරබැඳීම වනාහි මාංසයට හා රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය (එපීස 6:12)**

ආත්මික සටන යනු මාංශය හා රුධිරය අතර කෙරෙන ස්වාභාවික සටනක් නොවේ. එය මිනිසාට විරුද්ධව මිනිසා කරන සටනක්ද නොවේ. එය ආත්මික ලෝකයේ ඇති අදෘශ්‍යමාන සටනකි. එය මිනිසා තුළ හා මිනිසා වටා කෙරෙන සටනකි. මෙහි ඇත්තේ ආත්මයන් බැවින් එය දෘශ්‍යමාන සටනක් නොවේ. ආත්මයට මාංශය හෝ ඇටකටු හෝ නොමැති බව අපි ලූක් 24:39 හි උගත්තෙමු..

ආත්මික සටන "බහුමාන" වේ. ඉන් අදහස් වන්නේ එය විවිධ මානවලින් සටන් කරන බවය. එය ...

1. ඇදහිලිවන්තයා හා ලෝකය අතර කෙරෙන සමාජීය සටනකි. යොහාන් 15:18-27
2. මාංශය හා ආත්මය අතර කෙරෙන පෞද්ගලික සටනකි. ගලාති 5:16-26
3. ඇදහිලිවතුන් හා නපුරු ආත්මික බලවේගයන් අතර කෙරෙන අධිස්වභාවික සටනකි. එපීස 6:10-27

ජීවත්වන සෑම පුද්ගලයෙක්ම දැන හෝ නොදැන හෝ මෙම සටනෙහි නිරත වී ඇත. මෙහි අපක්ෂපාත භූමියක් නොමැත. නොඇදහිලිවන්තයන් නපුරා හා බැඳී ඇති අතර සතුරු බල වේග විසින් අත් අඩංගුවට ගෙන ඇත. ඔවුහු යුද්ධයේ ගොදුරු බවට පත්ව සිටිති.

ඇදහිලිවන්තයෝ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් සතුරාගෙන් නිදහස් වී ජයග්‍රාහිකයන් වී ඇති නමුත් ඔවුහු තවමත් යුද්ධයේ නිරත වෙති. මෙම පරිච්ඡේදයේ ප්‍රධාන පදයෙන් පෙන්නුම් කෙරෙන්නේ අප (සියලු ඇදහිලිවන්තයන්) පොර බදන්නේ නපුරු ආත්මික බලවේගවලට එරෙහිව බව වේ.

"පොර බැඳීමේදී" පෞද්ගලිකව සමීප ස්පර්ශයක් ඇත. කිසිම කෙනෙකු මෙම සටනින් නිදහස් කර නැත. කිසිම කෙනෙකුට ඈත සිට මෙය නැරඹිය නොහැකිය. ඔබ පිළිගත්තත් නැතත් ඔබ මෙම ගැටුම මධ්‍යයේ සිටී. එය යහපත් වේ යයි ඔබ සිතන්නෙහි නම් එය වැරදිය. කිතුනු සටන කිසි දිනෙක අවසන් නොවේ.

## සටන පැවැත්වෙන ස්ථානය

මෙම අදෘශ්‍යමාන සටන පැවැත්වෙන්නේ පෘථිවියෙහි වේ.

> **සොරා (සාතන්) එන්නේ (පෘථිවියට) සොරකම් කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය. (යොහාන් 10:10)**

ලෝක රාජධානිය පාලනය කිරීම පවත්වාගෙන යෑමට සාතන් සටන් කරයි. එය දෙවියන් වහන්ස්ගේ ආධිපත්‍යය යටතට පත්වීම සාතන්ට අවශ්‍ය නැත. මෙම සටන පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ හදවත් තුළත්, සිත් තුළත් ආත්මය තුළත් පවතී. සාතන් නොඇදහිලිවතුන්ගේ සිත් අන්ධ කර තබන අතර ඇදහිලිවතුන්ට පහර දෙන්නේ නමස්කාරය, වචනය, දෛනික කටයුතු හා ඔවුන් දෙවියන්වහන්සේ වෙනුවෙන් කරන වැඩ යන ක්ෂේත්‍ර වල වේ.

## සටන ආරම්භ වූ ආකාරය

මෙම ආදෘශ්‍යමාන සටන ආරම්භ වුයේ ස්වර්ගයේදී ලුසිෆර් නමැති දේවදූතයා ගෙනි. ඔහු පටන්ගැනීමේදී දෙවියන්වහන්සේ විසින් මවන ලද රූප සම්පන්න දේවදූතයෙක් වූ අතර ඔහු දේව රාජ්‍යයේ කොටසක් විය. දෙවියන්වහන්සේ රාජ්‍යය අත් පත් කර ගැනීමට ලුසිෆර් තීරණය කළේය. ඔබට මේ කැරැල්ල පිළිබඳව යෙසායා 14:12-17 හා එසකියෙල් 28:12-19 හි කියවිය හැකිය. ඔබ මෙම පාඨමාලාවෙන්ද ඒ පිළිබඳව විස්තරාත්මකව අධ්‍යයනය කරන්නෙහිය. මෙම කැරැල්ලේදී දේව දූතයෝ කණ්ඩායමක් (දැන් සාතන් ලෙස හැඳින්වේ) ලුසිෆර් හා සමග එක්වූහ. ලුසිෆර් හා

කැරලිකාර දේව දූතයන්ව දෙවියන්වහන්සේ ස්වර්ගයෙන් පන්නා දැමූ සේක. ඔවුහු ඔවුන්ගේ රාජ්‍යය පොළොවේ පිහිටුවා ගත්හ.

> **තවද ස්වර්ගයෙහි යුද්ධයක් විය. ඒ වනාහි මිකායෙල් සහ ඔහුගේ දූතයන් මහා සර්පයාට විරුද්ධව යුද්ධයට යාමය. මහා සර්පයාද තමාගේ දූතයෝ ද සටන් කොට, ජය නොලැබුවෝය. (එළිදරව් 12:7)**

> **මුළු ලෝකයා රවටන්නා වන යක්ෂයාය, සාතන් යයි කියනලද මහා සර්පයා නමැති ඒ පුරාණ සර්පයා පහතට හෙළනු ලැබුවේය: ඔහු පොළොවට හෙළනු ලැබුවේය, ඔහුගේ දූතයෝද ඔහු සමග හෙළනු ලැබුවෝය. (එළිදරව්ව 12:9)**

ලුසිෆර් සාතන් ලෙසත්, ඔහුව අනුගමනය කළ දේව දූතයන් යක්ෂයන් ලෙසත් හැඳින්විනි. සාතන්ගේ රාජ්‍යයට අයත් මනුෂ්‍යයන් තුළට ඇතුළු වීමට, ඔවුන්ට හිරිහැර කිරීමට, පාලනය කිරීමට හා ඔවුන්ව භාවිත කිරීමට යක්ෂාත්මවලට පුළුවන. පුරුෂයන් හා ස්ත්‍රීන් දුෂ්ට ක්‍රියාවන් සඳහා ඔවුහු පොළඹවති. යක්ෂයන්ගේ නපුරු ක්‍රියාවන් සඳහා මඟ පෙන්වනු ලබන්නේ සාතන් විසිනි. සියලුම මනුෂ්‍යයන්ට එරෙහිව යුද්ධ කිරීමට ඔහු මේ ප්‍රබල බලවේගයන් ලෝකයා හා මාංශය සමග එක් කරයි.

## ගැටුම පසුපස ඇති හේතු

පටන්ගැන්මෙහිදී මනුෂ්‍යයා මවනු ලැබුවේ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් හා උන්වහන්සේව මහිමයට පත් කිරීමටය (උත්පත්ති 2 පරිච්ඡේදය). මිනිසාට එරෙහි මේ අදෘශ්‍යමාන සටන ආරම්භ වූයේ ඒදන් උයනේ වූ පළමු පරීක්ෂාවත් සමගය (උත්පත්ති 3 පරිච්ඡේදය). ආදම් හා ඒව පාපයට පෙළඹවූයේ සාතන් විසිනි. මෙහි ප්‍රතිඵලය වූයේ සියලුම මිනිසුන් මූලික පාපී ස්වභාවය උරුම කර ගැනීම හා මෙම ස්වභාවය නිසා පෞද්ගලික පාපී ක්‍රියාවල ඔවුන් නිරතවීමය.

> **එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණ කොටගෙන පාපයත් පාපය කරණ කොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක්මෙන්, සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමිණුණේය. (රෝම 5:12)**

එමෙන්ම එහි ප්‍රතිඵලය වූයේ මිනිසා හා නපුරු බලවේග අතර අදෘශ්‍යමාන සටනක් ඇතිවීමය.

> **මම තා (සාතන්) සහ ස්ත්‍රිය (මනුෂ්‍ය වර්ගයා) අතරෙහිද තාගේ වංශය හා (නපුරු බලවේග) හා ඇගේ වංශය (යහපත් බල වේග) අතරෙහිද සතුරුකම තබන්නෙමි. (උත්පත්ති 3:15).**

පාපය නිසා මනුෂ්‍යයා දෙවියන්වහන්සේගෙන් වෙන් කෙරුනු අතර මරනයට තින්දු කෙරිනි. එහෙත් දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කොතරම් ප්‍රේම කළේද යත් පාපයෙන් ඔහු ගළවා ගැනීමට විශේෂ සැලසුමක් සකස් කළේය.

> **මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එවූවේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය (යොහාන් 3:16-17)**

යේසුස්වහන්සේ තුළ විශ්වාසය තැබීමෙන්ද, පාපය ගැන පාපොච්චාරණය කිරීමෙන් හා පසුතැවිලි වීමෙන්ද, සතුරාගේ බලයෙන් පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට නිදහස් විය හැකිය. යේසුස් වහන්සේගේ මරණයෙන් හා උත්ථාන වීමෙන් පාපයෙන් ගැළවීම ලැබුවා පමණක් නොව, එය සතුරාව-සාතන්ව-පරාජයද කළේය.

> **... දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිණිසය, එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශකරන පිණිසය (1 යොහාන් 3:8)**

එහෙත් සාතන් පරාජය කර ඇත්නම් යුද්ධය තවමත් පවතින්නේ මන්ද? ඕනෑම යුද්ධයකින් පසුව, බල කෙරෙන තෙක් සටන අත් නොහරින කුඩා සතුරු කණ්ඩායම් සහ කැරලි ගසන්නන් ඉතිරි වේ. යේසුස් වහන්සේ සාතන්ව පරාජය කළ ද අප ජීවත් වන්නේ සතුරු බලවේග තවමත් ක්‍රියාත්මක වන ප්‍රදේශයක වේ. මෙම නපුරු බලවේග සමග ක්‍රියා කිරීමට ආත්මික සටන් උපක්‍රම අවබෝධ කර ගැනීමෙන් අපට හැකියාව ලැබේ.

සාතන් උත්සාහ කරන්නේ මනුෂ්‍යයන්ව පාපයේ සිරකර තැබීමට වේ. රැවටිලිකාර ක්‍රම මගින් තාවකාලික කාම තෘෂ්ණාවන්ට හා පාපී ජීවිතයක් ගත කිරීමට පුරුෂයන්ට හා ස්ත්‍රීන්ව ඔහු පොළඹවයි. නිත්‍යානුකූලව දෙවියන්වහන්සේට අයත් අපගේ ආත්මයේ හා ප්‍රාණයේ ප්‍රේමය ඔහු ඉලක්කර කර ඇත.

> **සොරා (සාතන්) එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශ කරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය (යොහාන් 10:10)**

සාතන්ට තවමත් උත්තරීතර පාලකයා වීමට අවශ්‍යය. ඔහු මනුෂ්‍යයාගේ හදවත, සිත, ප්‍රාණය හා ආත්මය සඳහා බලවත් සටනක යෙදෙයි. ඔහුගේ උපායමාර්ග යොමුකර ඇත්තේ දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ සැලැස්ම හා උන්වහන්සේගේ සෙනග වෙතටය. මේ සටන අවසාන ගැටුම දක්වා පවතිනු ඇත. ඔබ ඒ පිළිබඳව මෙම පාඨමාලාවේ අවසාන පරිච්ඡේදයෙන් ඉගෙන ගනු ඇත.

## ආත්මික සටනෙහි තේරුම

ආත්මික සටන යනු අදෘශ්‍යමාන ආත්මික යුද්ධයට එරෙහිව ක්‍රියාකිරීම සහ එය විශ්ලේෂණය කිරීම වේ. යහපත් හා නපුරු ප්‍රතිවිරෝධී බලවේග, සාතන්ගේ උපක්‍රම හා සතුරා පරාජය කරන ආත්මික උපක්‍රම අධ්‍යයනය කිරීම මීට ඇතුළත්ය. ආත්මික සටන යනු ආත්මික මූලධර්ම විශ්ලේෂණය කිරීමට වඩා වැඩිමනක් දෙයක් වේ. එය, ජීවිතයේත් සේවයේත් මෙම උපක්‍රම ව්‍යවහාර කිරීම මගින් යුද්ධයේදී ක්‍රියාකාරීව සහභාගි වීම වේ.

සාතන්ගේ බොහෝ ඵලදායි උපාය මාර්ගයක් වන්නේ ඇදහිලිවන්තයන් මෙම උපක්‍රම පිළිබඳව නොදැන සිටීමට සැලැස්වීමය.

> **... සාතන් අප කෙරෙහි වාසි නොලබන පිණිස, ක්‍රිස්තුස්වහන්සේ ඉදිරියෙහි නුඹලා උදෙසාය. මක්නිසාද ඔහුගේ උපායවල් අප විසින් නොදැන සිටිනවා නොවේ. (2 කොරින්ති 2:10, 11)**

සාතන්ගේ පහරදීමේ උපාය මාර්ග අප හැකිතරම් උගතයුතුය. එමෙන්ම නපුරු බලවේග හා සාතන් පරාජය කෙරෙන ශුද්ධ ලියවිලි පදනම අප අවබෝධ කරගත යුතුය. ඥානාන්විතව සටන් කිරීමට අප කැඳවා ඇත. ආත්මික සටන අවබෝධ කරගැනීමට මුල් වන්නේ මෙම ප්‍රධාන මූලධර්මය වේ. එනම්,

> *ජීවිතයේ සටන් සියල්ල ඒවා ශාරීරික වුවද, මූල්‍යමය වුවද, ආත්මික වුවද, මානසික වුවද, හැඟීම් තුල වුවද, නැතහොත් මනුෂ්‍ය පෞරුෂත්වය පිළිබඳව වුවද, ආත්මික හේතූන් බාහිරව ප්‍රකාශ කිරීමක් වේ.*

ස්වභාවික ලෝකයේ ගැටළු පෙනෙන්නේ ජීවිතයේ අවස්ථාවන් තුළින් ඇතිවුවන් මෙන් වුවද මේ ස්වභාවික සටන්වල පදනම ආත්මික ලෝකය වේ. මෙම මූලධර්මය සනාථ කෙරෙන ජෝබ්ගේ කතාව කියවන්න (ජෝබ් 1-2 පරිච්ඡේද)

අප මේ ලෝකයේ නපුර පාලනය කරන්නට උත්සාහ කරන්නේ අධ්‍යාපනය, ව්‍යවස්ථාව හා දියුණු කළ පරිසරය මගිනි. එහෙත් එය සාර්ථක වී නැත. ඊට හේතුව මේ ලෝකයේ අපට පෙනෙන නපුර ආත්මික හේතුවල ප්‍රතිඵලයක් බැවිනි.

## ඔබ අයත් වන්නේ කුමන රාජධානියටද ?

ස්වභාවික ලෝකයේ රාජ්‍යයක පරමබලධාරී පාලකයා රජතුමා වේ. එම රාජධානියේ සියලුම භූමිය හා සෙනග අයත් ඔහුටය. ඔහුගේ අතවැසියන්ගේ ජීවිතය හා මරණය පිළිබඳ බලය ඔහු සතුය.

ආත්මික ලෝකය පිළිබඳවද මේ දෙයම සත්‍යයකි. ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ හෝ සාතන්ගේ රාජ්‍යයේ හෝ කොටස් කරුවෙකි. ඔබගේ ජීවිතය කෙරෙහි බලය ඇත්තේ දෙවියන්වහන්සේටය නැතහොත් සාතන්ටය.

යේසුස් වහන්සේ විසින් කියන ලද එක් උපමාවකින් සියලුම මිනිසුන් දෙවියන්වහන්සේගේ හෝ සාතන්ගේ හෝ රාජ්‍යයේ කොටස් කරුවන් බව පැහැදිලි වේ. යේසුස් වහන්සේ ලෝකය කෙතකට සමාන කළ සේක. කෙතේ වපුරන ලද බීජ දේව රාජ්‍යයේ දරුවෝ වෙති. වල් පැලෑටි වැඩුනු නරක බීජ නපුරාගේ දරුවන්ය.

> **... කෙත නම්, ලෝකයය: හොඳ බීජ නම්, රාජ්‍යයේ පුත්‍රයෝය: කිරිඳි නම්, නපුරාගේ පුත්‍රයෝය. (මතෙව් 13:38-39)**

සාතන්ගේ රාජ්‍යයට මිනිසුන් ඇතුළු වන්නේ ස්වභාවික උපතෙනි. සියලුම මිනිසුන් පාපය ඇතිව උපන් බව බයිබලය අපට උගන්වයි. මින් අදහස් වන්නේ ඔවුන්ට මුලිකවම පාපි ස්වභාවයක් ඇති බවය. නැතහොත් පාපයේ "බීජය" ඇතුලත් බවය. ඔවුන්ගේ ස්වාභාවික නැඹුරුව වන්නේ පව් කිරීමට වේ.

> **බැලුව මැනව, මම අයුතුකම සහිතව සාදනු ලැබීමි. මාගේ මෑණියෝ පාප සහිතව මා ගැබ්ගත්තාය. (ගීතාවලිය 51:5)**

> **එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත් පාපය කරණ කොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක්මෙන්, සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුණේය. (රෝම 5:12)**

> **මක්නිසාද සියල්ලෝම පව් කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)**

අප පාප ස්වභාවය ඇතිව ඉපදුනු බැවින්, එක්තරා කාලයක අපි සියලු දෙනාම සාතන්ගේ රාජ්‍යයේ කොටසක්ව සිටියෙමු. පව්කරුවන් ලෙස ඉතිරිව සිටින අය සාතන්ගේ රාජ්‍යයේ කොටස් කරුවන් ලෙස ඉතිරිව සිටිති.

දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයේ, එනම් බයිබලයේ, මුළු පණිවුඩයම සාතන්ගේ මෙම නපුරු රාජ්‍යයෙන් ඉවත්ව දෙවියන්වහන්සේගේ රාජ්‍යය වෙතට පැමිණෙන ලෙස කරන ආයාචනය වේ. ස්වාභාවික උපත මගින් මිනිස්සු සාතන්ගේ රාජ්‍යයට ඉපදෙති. ඔවුන් ආත්මික උපත මගින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට නැවත ඉපදිය යුතුය. දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවීම, යොහාන් 3 පරිච්ඡේදයෙන් පැහැදිලි කර ඇති පරිදි, අලුතින් ඉපදීමේ අත්දැකීම තුළින් විය යුතුය.

මෙම අදෘශ්‍යමාන යුද්ධයේ ඇත්තේ බෙදීම් දෙකක් පමණි. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක, "මගේ පක්ෂයට නොසිටින්නා මට විරුද්ධය" (ලූක් 11:23). මෙම ආත්මික යුද්ධයේ ඔබට අපක්ෂපාතව සිටිය නොහැකිය. ඔබ කුමන හෝ පැත්තක සිටින්නෙහිය. ඇතැම් ඇදහිලිවත්තු, සතුරා සමග ගැටුමක් ඇතිකර ගැනීමට ඇති බිය නිසා, යුද්ධය නොසලකා හැර සතුරා සමග ගිවිසුමක් ඇති කර ගැනීමට උත්සාහ කරති. ඔවුන් සිතන්නේ ඔවුන් සාතන් නොසලකා හැරියහොත් සාතන් ඔවුන්ට කරදර නොකරන බවය. මෙය සාතන්ගේ එක් ප්‍රධාන උපායකි. ඔහු ත්‍රස්ත ක්‍රියා මගින් දෙවියන්වහන්සේගේ යුද හමුදාවේ සමාජිකයන් අක්‍රිය කිරීමට උත්සාහ කරයි.

එහෙත් මේ යුද්ධයට අපක්ෂපාති බවක් නොමැත. ඔබ ජයග්‍රාහකයෙකි, නැතහොත් සාතන්ට අසු වී සිටින්නෙකි. "යුද්ධායුධ ගැනීමට කෙරෙන ආත්මික කැඳවීම" දැන් ක්‍රියා කරයි... ඔබ සිටින්නේ යහපත පැත්තේද, නපුර පැත්තේද? ඔබ සාතන්ගේ රාජ්‍යයේ කොටස් කරුවෙක්ද නැතහොත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ කොටස් කරුවෙක්ද? ඔබ අයත් කුමන රාජ්‍යයටද? මෙම අදෘශ්‍යමාන සටනේ ඔබ ජයග්‍රාහයෙක්ද නැතහොත් සාතන්ට අසුවුවෙක්ද?

## පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ගත් ප්‍රධාන පදය ලියන්න.

2. 1 කොරින්ති 15:44-49 හි සඳහන් බෙදීම් දෙක මොනවාද?

3. අද ලෝකයේ පවතින අදෘශ්‍යමාන රාජ්‍යයන් දෙක මොනවාද?

4. නපුරාගේ බලවේග ලැයිස්තුගත කරන්න.

5. යහපත් ආත්මික බලවේග ලයිස්තුගත කරන්න.

6. "රජතුමා" යන වචනය අර්ථවිග්‍රහ කරන්න.

7. "රාජධානිය" යන වචනය අර්ථවිග්‍රහ කරන්න.

8. "ආත්මික සටන" යන පදයේ තේරුම කුමක්ද?

9. මහා ආත්මික ගැටුම පසුපස ඇති හේතුව කුමක්ද?

10. ආත්මික සටන අවබෝධ කරගැනීම සඳහා අවශ්‍ය මූලික සිද්ධාන්තය කුමක්ද ?

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. "ආත්මික සටනෙහි උපාය මාර්ග" නමැති මෙම පාඨමාලාව අවධාරණය කෙරෙන්නේ සාතන්ගේ රාජධානිය සහ ඔහුගේ රාජධානියත් දෙවියන්වහන්සේගේ රාජධානියත් අතර පැවැත්වෙන ආත්මික සටන පිළිබඳවය. , රාජ්‍යයේ ජිවත් විම, නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව දෙවියන්වහන්සේ රාජ්‍යය පිළිබඳව සම්පූර්ණ අධ්‍යයනයක් සපයයි. ( ඔබ හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ ලියා පදිංචි වී, යෝජනා කර ඇති අනුපිළිවෙල අනුව පාඨමාලා අධ්‍යයනය කරන්නෙහි නම් මෙම පාඨමාලාව ඔබ දැනටමත් අධ්‍යයනය කර ඇත) ඔබ හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ ලියාපදිංචි වී නොමැති නම් මෙම පාඨමාලාවට සහාය විම සඳහා , රාජ්‍යයේ ජිවත් විම , ලබාගත යුතුය. අද ලෝකයේ ඇති ආත්මික රාජධානි දෙක පිළිබඳවම අවබෝධයක් ලබා ගැනිම වැදගත් වේ.

2. සාර්ථක ආත්මික සටනක් මෙහෙයවීම සඳහා හොඳ ආත්මික පදනමක් අවශ්‍යය. ඔබ අලුත් ඇදහිලිවන්තයෙක් නම් හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ, ඇදහිල්ලේ පදනම යන පාඨමාලාව ලබාගන්න (හාවස්ටයිම් පාඨමාලා ඔබ යෝජනා කර ඇති අනුපිලිවෙල අනුව අධ්‍යයනය කරන්නෙහිනම්, දැනටමත් ඔබ මෙම පාඨමාලාව අධ්‍යයනය කර ඇත.)

3. ආත්මික සටනේ, "ගොදුරක්" වී සිටි බව ඔබට හැඟේද? ඔබ සටන පරාජය වන්නේ ඔබගේ ජිවිතයේ හෝ සේවයේ හෝ කුමන ක්ෂෙත්‍රවලද? ඔබ මේ කුමකින් සටන පරාජය වී ඇත්ද?

   ආත්මික ක්ෂෙත්‍රයද?
   හැගිම් ක්ෂෙත්‍රයද?
   ශාරීරික ක්ෂෙත්‍රයද?
   මානසික ක්ෂෙත්‍රයද?
   මුල්‍යමය ක්ෂෙත්‍රයද?
   මනුෂ්‍යය පෞරුෂත්වය සමග

   ඔබ පරාජය වී ඇති මේ ක්ෂෙත්‍ර හඳුනා ගැනිම වැදගත්ය. එවිට මේ අධ්‍යයනයෙන් ඔබ ලබාගත් දැනුම, ජිවිතයේ හා සේවයේ මෙම ප්‍රායෝගික ක්ෂෙත්‍රවලට ව්‍යවහාර කළ හැකිය.

4. මෙම පාඩම් සාකච්ජා කළ 2 රාජාවලිය 6 හි ඇති කතාන්දරය නැවත බලන්න. ගෙහාසි වැනි අය හෝ දෝතාන් නගරවැසියන් වැනි අය හෝ පිළිබඳව ඔබ දන්නෙහිද? ඔවුන්ට ඔබ උපකාර කරන්නේ කෙසේද?

5. ආත්මික සටනට මාන බොහෝමයක් ඇති බැවින් අප පාපයට එරෙහිව පෞද්ගලිකවත්, ලෝකයේ නපුරට විරුද්ධව සාමාජිකවත්, ගැළවීමේ සේවය තුළින් අධිස්වභාවිකවත් සටන් කළ යුතුය.

6. බයිබලය, ආත්මික සටන් අත්පොතක් ලෙස අධ්‍යයනය කරන්න. එය පසුගිය සටන්වල පරාජයන් හා ජයග්‍රහණයන් එළිදරව් කරන ආත්මික සටන් පිළිබඳ ඓතිහාසික වාර්තාවකි. අවසාන ගැටුමේ කාලය එනතුරු සටනේ මාර්ගය පෙන්වන මෙය අනාගතය හෙළි කරන්නකි.

# නිලයට පත්කිරීම

## දෙවියන්වහන්සේගේ හමුදාවේ කොටසක් වීම

ස්වභාවික ලෝකයේ සැම හමුදාවකටම නිලයට පත්කිරීමේ ක්‍රියාවලියක් ඇත. එනම් හමුදාවට බැඳීම සඳහා ඔබ කළ යුතු විශේෂ දේවල් වේ.

ඔබ දෙවියන් වහන්ස්ගේ හමුදාවේ කොටසක් වීමට කැමැත්තෙහිද ?

# දෙවන පරිච්ජේදය

## දෙවියන්වහන්සේගේ යුද හමුදාවට බැඳීම

**අරමුණු :**

මෙම පරිච්ජේදයේ අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- " පසුතැවිලිවීම" අර්ථවිග්‍රහ කිරීමට
- පසුතැවිලිවීමේ වැදගත්කම පැහැදිලි කිරීමට
- " දෙවියන්වහන්සේ වෙතට හැරීම" අර්ථ විග්‍රහ කිරීමට
- දෙවියන්වහන්සේ වෙතට හැරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට
- "සාධාරණීකරනය" අර්ථ විග්‍රහ කිරීමට
- "ගැළවීම ලැබුවේය" යන්නෙහි තේරුම පැහැදිලි කිරීමට
- පසුතැවිලිවීම හා හැරීම විස්තර කිරීමට අකීකරු පුත්‍රයාගේ උපමා කතාව යොදා ගැනීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

**පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් පසුතැවිලිවීමට කැඳවන්ට මම නාවෙමි (ලූක් 5:32)**

## හැඳින්වීම

පසුගිය පරිච්ජේදයෙන් ඔබ ඉගෙන ගත්තේ ආත්මික ලෝකයේ පවතින මහත් අදෘශ්‍යමාන සටන පිළිබඳවය. මෙම පරිච්ජේදයෙන් ඔබ ඉගෙන ගන්නේ දෙවියන්වහන්සේගේ යුදහමුදාවට බැඳෙන ආකාරය වේ. ස්වභාවික ලෝකයේ, යුද හමුදාවට බැඳීම සඳහා, හමුදා භටයින් වීමට බලාපොරොත්තු වන්නන් සහභාගි විය යුතු විශේෂ නිලාරම්භ චාරිත්‍ර තිබේ. මෙසේ "නිලයට පත් කිරීම" ඔහු හමුදාවේ කොටසක් බවට පත් කරයි.

දෙවියන්වහන්සේටද නිලයට පත් කිරීම සඳහා විශේෂ සැලැස්මක් ඇත. උන්වහන්සේගේ ආත්මික හමුදාවේ ඔබ කොටසක් වන්නේ එමගිනි. උන්වහන්සේගේ සැලැස්ම ප්‍රධාන සංකල්ප දෙකක් වටා කේන්ද්‍රගත වේ. ඒ, පසුතැවිලිවීම හා දෙවියන්වහන්සේ වෙතට හැරීමය. එහි ප්‍රතිඵලය ධර්මිෂ්ඨ කරනු ලැබීම වේ.

# පසුතැවිලිවීම

ස්වභාවික ලෝකයේ හමුදා භටයෙක් හමුදාවට බැඳෙන විට, වෙන රටකට හෝ හමුදාවකට හෝ ඔහුගේ තිබූ බැඳීම් සියල්ල අත්හැරිය යුතුය. ඔබ දෙවියන්වහන්සේගේ හමුදාවට බැඳෙන විටද පාපය හා සාතන්ගේ රාජ්‍යය සමග ඔබගේ තිබූ සම්බන්ධතා ගැන ඔබ පසුතැවිලි විය යුතුය. මෙය පසුතැවිලිවීමෙන් කරනු ලැබේ.
පසුතැවිලිවීම යනු “අභ්‍යන්තර තිරණයක් හෝ මනසේ වෙනසක් වන අතර එහි ප්‍රතිඵලය වන්නේ පාපයෙන් දෙවියන්වහන්සේ හා ධර්මිෂ්ඨකම වෙතට හැරෙන බාහිර ක්‍රියාවකි”. ක්‍රියා 20:21 න් “දෙවියන්වහන්සේ කෙරෙහි පසුතැවිලි වීමට” කැඳවීමක් කර ඇත. පසුතැවිලි වීමේ ක්‍රියාවෙන් ඔබ පාපයෙන් ඉවතට හැරෙන අතර සාතන්ගේ රාජධානිය අත්හරිනු ඇත.

පසුතැවිලිවීම යනු සාතන්ගේ රාජ්‍යයට තැබූ ඔබගේ පක්ෂපාතකම දෙවියන්වහන්සේගේ රාජ්‍යය වෙතට වෙනස් කිරීමට ඔබ ගන්නා පෞද්ගලික තිරණයක් වේ. මෙම සිත වෙනස් වීම හා පාපයෙන් හැරීම ඔබටම කළ නොහැකිය. පාපිෂ්ඨයෙකුගේ සිතේ, හදවතේ හා ජීවිතයේ සැබෑ වෙනසක් ගෙන එන්නේ දෙවියන් වහන්ස්ගේ බලයෙන් වේ.

> **... එසේවී නම් දෙවියන්වහන්සේ අන්‍යජාතීන්ටත් ජීවනය පිණිස වූ පශ්චාත්තාපය දුන්සේකැයි කීවෝය. (ක්‍රියා 11:18)**

පසුතැවිලිවීම දෙවියන්වහන්සේගේ දීමනාවකි.

> **... පශ්චාත්තාපයත් පව් කමාවත් දෙන අධිපතියෙක්ද ගැළවුම් කාරයෙක්ද වන පිණිස දෙවියන්වහන්සේ තමන්ගේ දකුණතින් උන් වහන්සේව (යේසුස් වහන්සේව) උසස් කළසේක. (ක්‍රියා 5:31)**

පසුතැවිලිවීමෙහි හැඟීම් ඇතුළත් වුවද සැබෑ පසුතැවිලි වීම තිරණයක් මිස හැඟීමක්ම නොවේ. පාපය වෙනුවෙන් කණගාටුවීම හා කඳුළු සැලීම පමණක් ප්‍රමාණවත් නොවේ. මෙය සමග බාහිර වෙනසක් පෙන්නුම් කෙරෙන අභ්‍යන්තර තිරණයක් තිබිය යුතුය.

## පසුතැවිලිවීමේ වැදගත්කම :

පසුතැවිලිවීම වැදගත් වන්නේ පහත දැක්වෙන කරුණු නිසා වේ.

### එය දෙවියන්වහන්සේගේ ආඥාවකි.

> **... නුමුත් සියලු මනුෂ්‍යයන්ට හැමතැන්හි පසුතැවිලිවෙන්ට දැන් අණකරනසේක. (ක්‍රියා 17:30)**

### ආත්මික මරණය මගහැරීමට එය අවශ්‍යය.

> **... පසුතැවිලි නුණොත් නුඹලා සියල්ලෝම එසේම විනාශවන්නෝය (ලූක් 13:3)**

### සදාතන ජිවිතයට එය අවශ්‍යය.

පසුතැවිලිවීම තුළින් මරණයේ දඬුවම ඉවත්කර ඇති අතර සදාතන ජීවනය ප්‍රදානය කරනු ඇත.

> **ඔව්හු ඒ අසා, නිශ්ශබ්දවී, දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින්: එසේවී නම් දෙවියන්වහන්සේ අන්‍යජාතීන්ටත් ජීවනය පිණිස වූ පශ්චාත්තාපය දුන්සේකැයි කීවෝය. (ක්‍රියා 11:18)**

### කමාවදීම සඳහා එය අවශ්‍යය.

ඔබ පසුතැවිලි නුවුවහොත් ඔබට කමාව දීමට දෙවියන්වහන්සේට නොහැකිය.

**පේත්‍රුස්: නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබාපල්ලා, එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. (ක්‍රියා 2:38)**

## එය සියලු දෙනා වෙනුවෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත වේ.

කිසිවෙක් ආත්මික මරණය තුළින් දෙවියන්වහන්සේගෙන් සදහටම වෙන්වී අපායේ ගතකිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවේ.

**... ස්වාමීන්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවනසේක, නුමුත් සියල්ලන්ම පසුතැවිලිවෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමැතිව, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසන සේක (2 පේත්‍රුස් 3:9)**

## යේසුස්වහන්සේ මෙලොවට වැඩීමට හේතුව එය වේ.

**පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් පසුතැවිලිවීමට කැඳවන්ට මම නාවෙමියි කීසේක. (ලූක් 5:32)**

## දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වීමට එය අවශ්‍යය.

**එතැන් පටන් යේසුස්වහන්සේ : පසුතැවිලිවෙයල්ලා, මක්නිසාද ස්වර්ග රාජ්‍යය ලංවී තිබේය කියා දේශනාකරන්ට පටන්ගත්සේක. (මතෙව් 4:17)**

ඔබ දේව රාජ්‍යයේ කොටසක් වූ විට, ඔබ දෙවියන්වහන්සේගේ හමුදාවට බැඳෙන්නේය.

# දෙවියන්වහන්සේ වෙතට හැරීම

ඔබ පාපයට කමාව ඉල්ලූ විට "දෙවියන්වහන්සේ වෙතට හැරීමේ" අත්දැකීම ඔබට ලැබේ. "දෙවියන්වහන්සේ වෙතට හැරීම" යනු තමා ගිය මග වෙනස් කිරීමකි. බයිබලිය පසුතැවිලිවීම සමග එය භාවිතා කරන විට, එහි තේරුම "වැරදි මාර්ගයෙන් හරි මාර්ගයට හැරීම" වේ. ඔබ සාතන්ගේ රාජධානිය අත්හැර දෙවියන්වහන්සේගේ රාජධානියට එක් වේ.

**ඔහු ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් බොහෝ දෙනෙකු ඔවුන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ වෙතට හරවන්නේය (ලූක් 1:16)**

**ලිද්දායෙහිද ෂාරොනෙහිද විසූ සියල්ලෝ ඔහු දැක ස්වාමීන් වහන්සේ වෙතට හැරුණෝය. (ක්‍රියා 9:35)**

**ස්වාමීන්වහන්සේගේ හස්තය ඔවුන් සමග වූයේය, විශ්වාස කළාවූ විශාල ගණනක් ස්වාමීන්වහන්සේ වෙතට හැරුණෝය (ක්‍රියා 11:21)**

දෙවියන්වහන්සේ වෙතට හැරීම යනු පාපයේ අන්ධකාරයෙන් දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමේ ආලෝකය වෙතට හැරීම වේ.

**ඔවුන් අන්ධකාරයෙන් ආලෝකයට ... හැරෙන ලෙස ... (ක්‍රියා 26:18)**

එය සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතට හැරීමය.

**... ඔවුන් සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතට හැරෙන ලෙස ... (ක්‍රියා 26:18)**

එය ලෞකික දේවලින් ආත්මික දේවලට හැරීමය.

**නුඹලා මේ නිෂ්ඵල දේවලින් දුරුව ... දෙවියන්වහන්සේ වෙතට හැරෙන පිණිස ... (ක්‍රියා 14:15)**

එය ව්‍යාජ දෙවිවරුන්ගෙන් සැබෑ ජීවමාන දෙවියන්වහන්සේ වෙතට හැරීමය.

> **... නුඹලා ජීවමානවූ සැබෑවූ දෙවියන්වහන්සේට මෙහෙකරන පිණිසද ... දේවතා රූප කෙරෙන් දෙවියන්වහන්සේ වෙතට හැරුණ හැටිත් ඔව්හුම දන්වති. (1 තෙසලෝනික 1:9-10)**

### දෙවියන්වහන්සේ වෙතට හැරීමේ වැදගත්කම :

දෙවියන්වහන්සේ වෙතට හැරීම පසුතැවිලිවීම සමග විය යුතුය. ඔබ වැරදි දෙයින් නිවැරදි දෙයට හැරිය යුත්තේ ...

### දේව රාජ්‍යයට ඇතුළුවීමට එය අවශ්‍ය බැවිනි.

> **සැබවක් නුඹලාට කියමි නුඹලා හැරී කුඩා දරුවන් මෙන් නුණොත්. කිසිසේත් ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නහුය. (මතෙව් 18:3)**

### එය ආත්මික මරණයෙන් ගළවාගන්නා බැවිනි.

> **... නුඹලා අතරෙන් යමෙක් සැබෑකමෙන් මුළාව ගියේද, යමෙක් ඔහු හරවාගන්නේ නම්, පව්කාරයෙකු තමාගේ මාර්ගයේ මුළාවෙන් හරවාගන්න තැනැත්තා ප්‍රාණයක් මරණයෙන් ගළවා, පව් රාශියක් වසන බව ඔහු දැනගනීවා. (ජාකොබ් 5:19-20)**

### පාපය මකා දැමීමට එය අවශ්‍යය.

ඔබ පසුතැවිලිවී දෙවියන්වහන්සේ වෙතට හැරෙන තුරු ඔබගේ පාප දෙවියන්වහන්සේගේ වාර්තාවල ලියා තිබේ. ඔබ පසුතැවිලි වූ පසු එම පාප මකා දමනු ලැබේ.

> **... නුඹලාගේ පාපයන් මකා දමනු ලබන පිණිස පශ්චාත්තාපව හැරියල්ලා (ක්‍රියා 3:20)**

## අකිකරු පුත්‍රයා

අකිකරු පුත්‍රයා පිළිබඳව යේසුස් වහන්සේ පැවසූ කතාන්දරයෙන් පසුතැවිලිවීම හා දෙවියන්වහන්සේ වෙතට හැරීම මනාසේ පැහැදිලි වේ. ලූක් 15:11-24 හි ඇති එම කතන්දරය කියවන්න. මේ තරුණයා තම පියා හා ගෙදර අත්හැර, ඈත ප්‍රදේශයකට ගොස්, පාපය තුළින් ඔහුට අයත් සියල්ල නැති නාස්ති කළේය. අන්තිමේදී තම තත්ත්වය ඔහුට පැහැදිලි විය. ඔහු කුසගින්නේ, තනිවම, වැරහැලි ඇඳගෙන රැකියාවක් ලෙස ඌරන් බලා ගනිමින් සිටියේය. ඉන්පසු ඔහු වැදගත් තීරණයක් ගත්තේය. "මම නැගිට මාගේ පියා වෙතට යමි" යි ඔහු පැවසුවේය. මෙම අභ්‍යන්තර තීරණය ඔහුගේ බාහිර ක්‍රියාවන් වෙනස් කළේය. ඔහු කමාව සොයමින් ඔහුගේ පියා වෙත ගියේය.

### පසුතැවිලිවීම ... මනස වෙනස් කර ගැනීම

ලූක් 15:17-19 කියවන්න. මෙම තරුණයාට තම පාපී ස්වභාවය අවබෝධ විය. තම පියා ළඟට ගොස් පාපය වෙනුවෙන් පසුතැවිලි වීමට ඔහු තීරණය කළේය. මෙය පසුතැවිලිවීම පිළිබඳ නිදසුනකි. අභ්‍යන්තර තීරණයක ප්‍රතිඵලය වූයේ බාහිර ක්‍රියාවකි.

### දෙවියන්වහන්සේ වෙතට හැරීම... තීරණය මත ක්‍රියා කිරීම

ලූක් 15:20 හි වාර්තා වන්නේ මෙම තරුණයා නැගිට තම පැරණි ජීවිතය අත්හැර අලුත් ජීවිතයක් ආරම්භ කිරීමට තම පියා ළඟට ගිය ආකාරය වේ. මෙය හැරීමකි.

### අකිකරු මිනිසා

මිනිසා අකිකරු පුත්‍රයා මෙනි. ඔහුගේ පාපී ස්වභාවයේදී ඔහු, ඔහුගේ පියාණන් වූ දෙවියන්වහන්සේටද ඔහුගේ නිවෙස වූ ස්වර්ගයටද පිටු පෑවේය. ඔහු ගන්නා සෑම පියවරක්ම

දෙවියන්වහන්සේගෙන් ඈත්වීමට ගන්නා පියවරක් වන අතර, ආත්මික මරනයට හා සදාකාලිකවම දෙවියන්වහන්සේගෙන් වෙන් වීමට ගන්නා පියවරක් ද වේ. ඔහු ගත යුතු වැදගත් තීරණයක් ඇත. ඔහු "ඔහු වෙතටම පැමිණ" තම ආත්මික තත්ත්වය අවබෝධ කරගත යුතුය. ආත්මික දිශාව වෙනස් කෙරෙන තීරණයක් ඔහු ගත යුතුය.

## ගැළවීම හා සාධාරණීකරණය

පසුතැවිලිවීම හා සම්බන්ධ වෙනත් පද දෙකක් බයිබලයේ භාවිත කර ඇත. මේ පද නම් "සාධාරණීකරණය" හා "ගැළවීම" වේ. සියලු මනුෂ්‍ය වර්ගයාගේ විනිශ්චයකරු දෙවියන්වහන්සේ වේ. ඔබ පාපයේ ජීවත් වන විට ඔබ උන්වහන්සේ ඉදිරියේ විනිශ්චය කරනු ලබන්නෙහිය.

> **උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා විනිශ්චය කරනු නොලැබේ. අදහා නොගන්නා දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහා නොගෙන සිටින බැවින් දැනටම විනිශ්චය කරනු ලැබ සිටියි. විනිශ්චය නම් මේය. ලෝකයට ආලෝකය පැමිණ තිබෙන නමුත්, මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන් ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම්වූ බවය. (යොහාන් 3:18-19)**

ඔබ පාපයට පසුතැවිලිවී ඔබගේ පාපී මාර්ගවලින් ඉවත් වීමට තීරණයක් ගනු ලැබුවහොත්, එමගින් දෙවියන්වහන්සේ සමග නිවැරදි සම්බන්ධතාවක් පිහිටුවන්නේය. මෙම නිවැරදි සම්බන්ධතාව හෙවත් දෙවියන්වහන්සේ ඉදිරියේ නිවැරදිව සිටීම "සාධාරණීකරණය" ලෙස හැඳින්වේ.

> **නුඹලා කීකරුකම පිණිස දාසයන් කොට යමකට නුඹලාම භාර දෙන්නහුද, එය මරණයට පමුණුවන්නා වූ පාපය වේවා, ධර්මිෂ්ඨකමට පමුණුවන්නාවූ කීකරුකම වේවා, නුඹලා කීකරු වන එකට දාසයන් වන බව නොදනිමුද? එහෙත් නුඹලා පාපයේ දාසයන්ව සිටි නුමුත්, යම් ඉගැන්වීම් ක්‍රමයකට නුඹලා භාරදෙනලදද, ඊට සිතින්ම කීකරුවී, පාපයෙන් නිදහස්කරන ලදුව, ධර්මිෂ්ඨකමේ දාසයන් වූ බැවින්, දෙවියන්වහන්සේට ස්තුති වේවා. (රෝම 6:16-18)**

ඔබ පසුතැවිලි වීමෙන් හා හැරීම මගින් ධර්මිෂ්ඨ කරනු ලැබීම වු විට, ඔබ පාපී ජීවිතයකින් එමෙන්ම පාපයේ දඬුවමෙන්ද "ගැළවීම" ලබන්නෙහිය. "ගැළවීම" ලැබීම යන්නෙහිත් "ගැළවීම" යන පදය භාවිතා කරන විට බයිබලයෙන් අදහස් කරන දෙයකින් තේරුම මෙය වේ.

## ආත්මික සටන හා බයිබලිය ලෝක දැක්ම

ආත්මික සටන පිළිබඳ විෂය අධ්‍යයනය කළ යුත්තේ පව්කාර මනුෂ්‍ය වර්ගයාගේ ගැළවීම උදෙසා දෙවියන්වහන්සේගේ පූර්ණ අභිප්‍රාය යන සන්දර්භය ඇතුළත වේ. වපුරන්නාගේ උපමාව හා කිරිඳි ගැන උපමාව මතෙව් 13 හි අධ්‍යයනය කරන්න. මේ උපමා දෙකම දේව වචනය පැළ කිරීම තුළින් සිදුවන දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ වේ. උපමා දෙකෙන්ම පෙන්නුම් කෙරෙන්නේ දෙවියන්වහන්සේගේ ගැළවීමේ අභිප්‍රාය කේන්ද්‍ර කරගෙන සිදුවන රාජධානි දෙක අතර යුද්ධය වේ.

ආත්මික සටන ඉගෙනීම මගින් මේ ලෝකයේ සංග්‍රාම භූමියට ඔබ ඇතුළු කිරීමට සුදානම් කෙරෙන අතරම පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේද පිරිමි හා ගැහැණු ළමයින්ගේද ආත්ම වෙනුවෙන් සටන් කරන්ට ඔබව සුදානම් කරයි. ගෝලයන් ශුභාරංචිය බෙදා ගැනීමට පිටත් කර යැවීමට පෙර ඔවුන්ට සාතන් ජයගැනීමට අධිකාරී බලය දෙනු ලැබුවේ මේ නිසාය (මතෙව් 28:18-20). ඔබ ක්‍රිස්තුස්වහන්සේ වෙතට මිනිසුන් දිනා ගැනීමට හා ඔවුන් දෙවියන්වහන්සේගේ පාලනය යටතට ගෙන ඒමට උත්සාහ කරන විට සාතන් හා ඔහුගේ සේනාව ඔබට විරුද්ධව සටන් කරනු ඇත. ආත්මික සටන පිළිබඳව ශුද්ධ ලියවිල්ලට අනුකුල උපක්‍රම යොදා ගැනීමෙන් මනුෂ්‍ය ජීවිතත්, සමාජයත්, ලෝකයේ ප්‍රදේශත් පාලනය කරන අධිපතීන්ට හා බලය ඇත්තන්ට අභියෝග කිරීමට ඔබට උපකාරී වනු ඇත.

## දෙවියන්වහන්සේගේ හමුදාවට බඳවාගැනීම

පසුතැවිලිවීමේ හා හැරීමේ ප්‍රතිඵලය වන්නේ ධර්මිෂ්ඨ කරනු ලැබීම හා ගැළවීම වේ. මෙය හමුදාවට බැඳීමේ දෙවියන්වහන්සේගේ සැලැස්ම වේ. ඔබ තවමත් දෙවියන්වහන්සේගේ හමුදාවට බැඳී නොමැති නම්, මෙම පාඩමේ "උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම" යන කොටස ඔබට

හමුදාවට බැඳීම සඳහා අවස්ථාව සලසා දෙනු ඇත. ඔබ දැනටමත් දෙවියන්වහන්සේගේ හමුදාවේ සාමාජිකයෙකු නම්, අන් අයව හමුදාවට බඳවා ගැනීමට මෙම කොටස සහාය වේ.

දෙවියන්වහන්සේගේ හමුදාවට ආදරයෙන් පිළිගනිමු.

## පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. "පසුතැවිලිවීම" අර්ථ විග්‍රහ කරන්න.

3. පසුතැවිලිවීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

4. "දෙවියන්වහන්සේ වෙතට හැරීම" අර්ථ විග්‍රහ කරන්න.

5. දෙවියන්වහන්සේ වෙතට හැරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

6. "සාධාරණීකරණය" අර්ථ විග්‍රහ කරන්න.

7. "ගැළවීම ලැබීම" යන්නෙහි තේරුම පැහැදිලි කරන්න.

8. පසුතැවිලිවීම හා දෙවියන්වහන්සේ වෙතට හැරීම විස්තර කිරීමට අකීකරු පුත්‍රයාගේ උපමා කතාව භාවිතා කරන්න.

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

## උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. ඔබ පසුතැවිලි වී ඇද්ද? දෙවියන්වහන්සේ වෙතට හැරී ඇද්ද? එසේ නොමැති නම් මේ අධ්‍යයනය දැන්මම නවතා පහත දැක්වෙන දේ කරන්න.

- ඔබේ පව් ගැන පසුතැවිලිවන්න.
- ඔබට කමාව දෙන ලෙස යේසුස්වහන්සේගෙන් ඉල්ලන්න.
- ඔබගේ ස්වාමීන්වහන්සේ ලෙස හා ගැළවුම්කාරයාණන් ලෙස උන්වහන්සේව පිළිගන්න.
- ඔබගේ පාපිෂ්ඨ මාර්ගවලින් හැරෙන්න.

2. ඇදහිලිවන්තයෙකු ලෙස, ඔබ පව් කළ විට, ඔබ පසුතැවිලි විය යුතුය. පහත දැක්වෙන බයිබලීය නිදසුන් අධ්‍යයනය කරන්න.

### කොරින්තිවරුන්

කොරින්ති නම් නගරයේ සිටි ඇදහිලිවතුන්ට පසුතැවිලි වීමට සිදුවිය.

**නුඹලා ශෝකයට පමුණුවනු ලැබූ නිසා නොව පසුතැවිලිවීම සඳහා නුඹලා ශෝකයට පමුණුවනු ලැබූ බැවින් දැන් ප්‍රීතිවෙමි. (2 කොරින්ති 7:9)**

**මක්නිසාද මා ආ කල .... මේ දක්වා පව්කොට තමුන් කළ අපිරිසිදුකමද වේශ්‍යාකමද සල්ලාලකමද ගැන පසුතැවිලි නුවූ බොහෝ දෙනා උදෙසා මට වැලපෙන්ට වේදෝ කියාද භය වෙමි. (2 කොරින්ති 12:20-21)**

### එපීසිවරු

එපීසියේ සිටි ඇදහිලිවතුන්ට පසුතැවිලිවීමට කියන ලදී.

**එබැවින් නුඹ වැටී සිටින්නේ කොතැනින්දැයි සිහිකොට, පසුතැවිලිව, පළමු ක්‍රියාවන් කරපන්න. (එළිදරව් 2:5)**

### පර්ගමම්හි කිතුනුවෝ

පර්ගමම්හි කිතුනුවන්ට දෙවියන්වහන්සේ මෙසේ කී සේක.

**එබැවින් පසුතැවිලි වෙයන්න : නැතහොත් මම ඉක්මනින්ම නුඹ ළඟට ඇවිත්, මාගේ මුඛයේ කඩුවෙන් ඔවුන්ට විරුද්ධව සටන් කරන්නෙමි (එළිදරව් 2:16)**

### සර්දිස්හි කිතුනුවෝ

**එබැවින් නුඹ ලැබුවේ කෙසේද, ඇසුවේ කෙසේදැයි සිහිකර, ඒ දේ පවත්වා, පසුතැවිලි වෙයන්න. (එළිදරව් 3:3)**

### ලවොදිකයෙහි කිතුනුවෝ

**මම ප්‍රේමකරන සියල්ලන්ට තරවටුකර දඬුවම් කරමි. එබැවින් නුඹ ජ්වලිතව සිට පසුතැවිලි වෙයන්න (එළිදරව් 3:19)**

### ඔබ කෙසේද? ...

ඔබ ජීවිතයේ පසුතැවිලි නුවූ පාප තිබේද? පාපය ඇත්තේ කොතැනද එතැන පසුතැවිලි වීම තිබිය යුතුය.

**අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටා ගනිමුව, සැබෑවද අප තුළ නැත. අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත් සියලු අධම්මිෂ්ඨකම්න් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහාන් 1:8-9)**

3. ගැළවීම සඳහා පසුතැවිලිවීම අවශ්‍ය බැවින්, පසුතැවිලිවීම පිළිබඳ පණිවුඩය සෑම කෙනෙකුටම ලැබෙන්නට සැලැස්වීම සඳහා දෙවියන්වහන්සේ විශේෂ සැලැස්මක් සෑදූ සේක. පසුතැවිලිවීම සඳහා කැඳවීම ආරම්භ වන්නේ අලුත් ගිවිසුමේ යොහාන් බව්තිස්තගේ මෙහෙයෙනි.

**ස්වාමීන්වහන්සේගේ මාර්ගය පිළියෙල කරව්, උන්වහන්සේ මාවත් සමතලා කරව්යයි වනාන්තරයේ හඬගසන්නෙකුගේ ශබ්දයය කියා අනාගතවක්තෘවූ යෙසායාගේ පොතේ ලියා තිබෙන ප්‍රකාරයට, යොහාන් ආවේය. ඔහු වනාන්තරයෙහි බව්තිස්මකරමින් පව්කමාව පිණිස පසුතැවිල්ලේ බව්තිස්මය ප්‍රකාශ කෙළේය. (මාක් 1:3-4)**

යේසුස් වහන්සේ දේශනා කළ පළමු පණිවුඩය, පසුතැවිලිවීම වේ.

**යොහාන් පාවාදෙනු ලැබුවායින් පසු යේසුස් වහන්සේ ගලිලයට පැමිණ දෙවියන්වහන්සේගේ ශුභාරංචිය දේශනා කරමින් : කාලය සම්පූර්ණ විය, දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය. පසු තැවිලිවී ශුභාරංචිය අදහාගනිල්ලායයි කී සේක. (මාක් 1:14-15)**

මුල් සභාවේ ඇදහිලිවන්තයෝ පසුතැවිලිවීම ගැන දේශනා කළහ.

**ඔව්හු පිටත්ව ගොස් පසුතැවිලි වෙයල්ලා යයි දේශනා කළහ (මාක් 6:12)**

**දෙවියන්වහන්සේ කෙරෙහි පසුතැවිල්ලත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලත් ගැන යුදෙව්වරුන්ට හා ග්‍රීකවරුන්ට සාක්ෂි දුනිමි. (ක්‍රියා 20:21)**

පසුතැවිලිවීමේ පණිවුඩය මුළු ලොව පුරා පැතිරවීමේ වගකීම අදද ඇදහිලිවතුන්ට ඇත. යේසුස් වහන්සේ තම අනුගාමිකයන්ට අවසාන වශයෙන් උපදෙස් දුන්නේ :

**යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුය යනුවෙනි (ලූක් 24:47)**

ඔබ පසුතැවිලිවීමේ පණිවුඩය දේශනා කරන විට ඔබ සැබවින්ම කරනු ලබන්නේ දෙවියන්වහන්සේ හමුදාවට බැඳෙන ලෙස අන් අයට කැඳවීම වේ. මෙම ශ්‍රේෂ්ඨ ආත්මික හමුදාවට මිනිසුන් බඳවා ගැනීමට ඔබ කැපවී ක්‍රියා කරන්නෙහිද ?

4. පසුතැවිලි වීමේ පණිවුඩය බෙදා ගැනීමේත්, අන් අය දෙවියන්වහන්සේගේ හමුදාවේ ලියාපදිංචි කිරීමේ වගකීම ඔබ බාරගන්නෙහි නම්, පසුතැවිලිවීම සඳහා මිනිසුන් පෙළඹවීමට ඔබ දන ගත යුතුය.

මිනිසුන් පසුතැවිලි වන්නේ පහත දැක්වෙන කරුණු නිසාය.

## දෙවියන්වහන්සේගේ යහපත්කම :

අභක්තික පුද්ගලයෙකුගේ ජීවිතයට දෙවියන්වහන්සේ ආශිර්වාද කිරීම, එම ජීවිත ශෛලය දෙවියන්වහන්සේ අනුමත කිරීමක් ලෙස වරදවා නොසිතිය යුතුය. දෙවියන්වහන්සේගේ යහපත් කියා තමන් වහන්සේ වෙතට හැරෙන ලෙෂ මිනිසුන්ගෙන් ඉල්ලා සිටින එක් ක්‍රමයකි.

**නුඹ පසුතැවිල්ලට පමුණුවන පිණිස දෙවියන්වහන්සේගේ යහපත්කම පවතින බව නොදැන, උන්වහන්සේගේ යහපත්කමේද ක්ෂාන්තියේද ඉවසීමේද බහුලත්වය සුලු කොට සිතා... (රෝම 2:4)**

**දේශනා කිරීම :**

දේව වචනය දේශනා කිරීම නිසා මිනිස්සු පසුතැවිලි වෙති. යෝනාගේ දේශනා කිරීමේ ප්‍රතිඵලය වූයේ මුළු නිනිවා නගරයම පසුතැවිලි වීමය.

**නිනිවයේ මනුෂ්‍යයෝ. මේ පරම්පරාවට විරුද්ධව විනිශ්චයේදී නැගිට එය වරදට පත් කරන්නෝය. මක්නිසාද යෝනාගේ දේශනා කිරීමෙන් ඔවුහු පසුතැවිලි වූවෝය. (මතෙව් 12:41)**

**ක්‍රිස්තුස් වහන්සේගේ කැඳවීම :**

දෙවියන්වහන්සේගේ වචනය දේශනා කරන විට සෙනග ඒ අසා ක්‍රිස්තුස් වහන්සේගේ කැඳවීමට ප්‍රතිචාර දක්වන්නේය. එය පසුතැවිලිවීමට මඟ පෙන්වයි.

**මම පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් කැඳවන්ට නාවෙමි (මතෙව් 9:13)**

**පිය වූ දෙවියන්වහන්සේ :**

පියාණන් වහන්සේ විසින් අදිනු නොලැබුවේ නම් කිසිවෙකුට යේසුස්වහන්සේ වෙතට පැමිණිය නොහැකියයි උන්වහන්සේ පැවසූ සේක.

**මා එවූ පියාණන් වහන්සේ විසින් අදිනු ලැබූ කෙනෙකුට මිස වෙන කිසිවෙකුට මා ළඟට එන්ට බැරිය (යොහාන් 6:44)**

**තරවටු කිරීම :**

තරවටු කිරීම නිසා මනුෂ්‍යයෝ පසුතැවිලි වෙති. තරවටු කිරීම යනු දේව වචනයෙන් දෙනු ලබන නිවැරදි කිරීමකි.

**නුඹේ සහෝදරයා පව්කළොත් ඔහුට තරවටුකරපන්න, ඔහු පසුතැවිලිවේ නම් ඔහුට කමාවෙයන්න. (ලූක් 17:3)**

**දැහැමි කණගාටුවීම :**

ඔබ උගත් පරිදි, පසුතැවිලිවීම හා හැඟීම් එකට බැඳී ඇත. ස්වාභාවික හැඟීම් පමණක් සැබෑ පසුතැවිලිවීම නොවේ, එහෙත් දැහැමි හැඟීම් සැබෑ පසුතැවිලිවීමට මඟ පෙන්වයි.

**මක්නිසාද දේවකැමැත්තට එකඟ වූ ශෝකයෙන් (පාපය නිසා), තැවෙන්ට කාරණයක් නොවන්නාවූ ගැළවීමට පමුණුවන පසුතැවිලිවීම හටගන්නේය. (2 කොරින්ති 7:10)**

# මූලික පුහුණුව

## යුද්ධයට සූදානම් වීම

ස්වභාවික ලෝකයේ මූලික පුහුණුවක් නොලබා කිසිදා හමුදා භටයෙක් සටනට නොයයි. මේ පුහුණුව යුද භූමියට ඇතුළු වීමට ඔහුව සූදානම් කරයි.

# තෙවන පරිච්ඡේදය

## ප්‍රධාන අණදෙන නිලධාරී : සේනාවල ස්වාමීන් වහන්සේ

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- යහපත් ආත්මික බලවේග හැඳිනගැනීමට
- දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයේ පෞරුෂත්වයන් හැඳින ගැනීමට
- ත්‍රිත්ව දෙවියන්වහන්සේගේ ස්වභාවය විස්තර කිරීමට
- ආත්මික සටනේ පියවූ දෙවියන්වහන්සේගේ කාර්යය පැහැදිලි කිරීමට
- ආත්මික සටනේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කාර්යය සාරාංශගත කිරීමට
- ආත්මික සටනේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ කාර්යය සාරාංශගත කිරීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **එම්බා ඉශ්‍රායෙල් අසාපන්න. අපේ දෙවි වූ ස්වාමීන්වහන්සේ එකම ස්වාමීන්වහන්සේය. (ද්විතිය කථාව 6:4)**

## හැඳින්වීම

යහපත් හා නපුරු බලවේග අතර ඇති මහා ආත්මික සටන පිළිබඳව ඔබ පළමුවන පරිච්ඡේදයෙන් ඉගෙන ගත්තෙහිය. මේ පාඩමේ හා ඊළඟ පාඩමේ යහපත් ආත්මික බලවේග විස්තර කරයි. මෙහි පියවූ දෙවියන්වහන්සේත්, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේත්, ශුද්ධාත්මයාණන්වහන්සේ හා දේව දූතයන් අන්තර්ගත වේ. මෙම සියල්ලෝම සටනේදී ඇදහිලිවතුන්ට සහාය වන ප්‍රබල ආත්මික බලවේග වේ.

## දෙවියන්වහන්සේගේ ත්‍රිත්වය

ලොව පුරා වැඳුම් ලබන දෙවිවරු බොහෝ වෙති, එහෙත් සැබෑවූ දෙවිඳුන් එක් කෙනෙකු පමණී. මෙම සැබෑවූ දෙවියන්වහන්සේ පිළිබඳ කතාන්දරය ශුද්ධවූ බයිබලයේ සඳහන් වේ. මේ එකම දෙවියන්වහන්සේ එකිනෙකට වෙනස් පෞරුෂත්ව තුනකින් එළිදරව් වී ඇත. ඒ පියාණන්වහන්සේ, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ ලෙසිනි.

පියවූ දෙවියන්වහන්සේත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේත් ශුද්ධාත්මයාණන්වහන්සේත් ඔවුන්ගේ ස්වභාවය අනුව බයිබලයේ විස්තර කර ඇත. අපි "ස්වභාවය" ගැන කතා කරන විට අප අදහස් කරන්නේ දෙවියන්වහන්සේ විස්තර කෙරෙන මූලික ගුණාංග වේ. මේ ගුණාංග "ගති ලක්‍ෂණ" යන තේරුම ඇති " ලක්ෂණ" ලෙසත් හැඳින්වේ.

බයිබලය එළිදරව් කරන්නේ දෙවියන්වහන්සේ :

## ත්‍රිත්වයක් බවය :

දෙවියන්වහන්සේට ත්‍රිත්ව ස්වභාවයක් ඇත. මින් අදහස් වන්නේ උන්වහන්සේට එකිනෙකට වෙනස් පැහැදිලි පෞරුෂත්ව තුනක් ඇති බව වේ. එසේ වුවද උන්වහන්සේ එකම දෙවියන්වහන්සේය.

> **එම්බා ඉශ්‍රායෙල් අසාපන්න. අපේ දෙවිවූ ස්වාමින්වහන්සේ එකම ස්වාමින්වහන්සේය (ද්විතිය කථාව 6:4)**

දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයේ මෙම පුද්ගලයන් තිදෙනා හැඳින්වෙන්නේ, පියවූ දෙවියන්වහන්සේ, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ ලෙසිනි. දෙවියන්වහන්සේගේ මේ ත්‍රිත්ව ස්වභාවය ස්ථිර කෙරෙන ශුද්ධ ලියවිලි පාඨ බොහොමයක් ඇත. යොහාන් බව්තිස්ත යේසුස් ක්‍රිස්තුස්වහන්සේව යොර්දාන් ගඟේ බව්තිස්ම කරන අවස්ථාවේ දෙවියන්වහන්සේ කතා කළ අතර ශුද්ධාත්මයාණන්වහන්සේ පහළට වැඩිය සේක.

> **යේසුස්වහන්සේ බව්තිස්ම ලැබ එකෙණෙහිම දියෙන් ගොඩනැගුණුසේක. බලව, අහස උන්වහන්සේට විවරවිය, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු මෙන් බසිනවාද තමන් පිටට පැමිණෙනවාද උන්වහන්සේ දුටුසේක, තවද: මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක් විය (මතෙව් 3:16-17)**

පෘථිවියේ තම සේවය අවසන් කර ස්වර්ගයට යෑමට පෙර, දෙවියන්වහන්සේගෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණෙන බව යේසුස්වහන්සේ පැවසූ සේක.

> **නුමුත් පියාණන්වහන්සේ කෙරෙන් මා විසින් නුඹලාට එවන සැනසිලිකාරයාණන්වහන්සේ එනම් පියාණන්වහන්සේ වෙතින් නික්මෙන්නාවූ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන් වහන්සේ මා ගැන සාක්ෂිදෙනසේක. (යොහාන් 15:26)**

ප්‍රේරිත වූ පේතෘස්තුමාද දෙවියන්වහන්සේගේ ත්‍රිත්ව ස්වභාවය ගැන කතා කර ඇත.

> **ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා නින්දාකරනු ලබන්නහු නම් නුඹලා ආශිර්වාදලද්දහුය. මක්නිසාද මහිමයේ ආත්මයාණන්වහන්සේ වන දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි රඳනසේක. (1 පේත්‍රැස් 4:14)**

ප්‍රේරිතවූ පාවුල් තුමාද තමාගේ ලියකියවිලිවල ත්‍රිත්වය පිළිබඳව සඳහන් කරයි.

> **මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස් කළාය. මක්නිසාද දෙවියන්වහන්සේ තමන් වහන්සේගේම පුත්‍රයාණන් පාප-මාංසයේ සමානකමෙන්ද පාපය නිසාද ඒවා, මාංසයේ පාපය දඬුවමට පත්කරමින්, මාංසය කරණකොට ගෙන දුර්වලවූ ව්‍යවස්ථාවට බැරිවූ දේ ඉෂ්ටකළසේක. (රෝම 8:2-3)**
>
> **ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවද දෙවියන්වහන්සේගේ ප්‍රේමයද ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහභාගිකමද නුඹලා සියල්ලන් හා සමග වේවා. (2 කොරින්ති 13:14)**
>
> **මක්නිසාද උන්වහන්සේ කරණකොටගෙන අප දෙගොල්ලට එක ආත්මයාණන්වහන්සේ තුළ පියාණන්වහන්සේ ළඟට පැමිණීමේ පුළුවන්කම තිබේ (එපීස 2:18)**

ක්‍රියා පොතේද දෙවියන්වහන්ස්ගේ ත්‍රිත්ව ස්වභාවය ගැන සඳහන් වේ.


> **එහෙයින් උන්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණතින් උසස් කරනු ලැබ, පොරොන්දුවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පියාණන්වහන්සේගෙන් ලබා, නුඹලා අසන දකින මේ දේ වැගිරවූසේක (ක්‍රියා 2:33)**

## උන්වහන්සේ සදාතනිකය :

දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයට ආරම්භයක් හෝ අවසානයක් හෝ නොමැති අතර සදාතනික වේ.

> **ස්වාමිනි, සියලු පරම්පරාවල ඔබ අපේ වාසස්ථානය වූ සේක. කඳුවල උත්පත්තියටත් ඔබ විසින් පොළොව හා ලෝකය සෑදීමටත් පළමුවෙන් සදාකාලයෙන් සදාකාලයට ඔබ දෙවියන්වහන්සේය (ගීතාවලිය 90:1-2)**
>
> **ආබ්‍රහම් බෙයර්-ෂෙබාහි ඒෂෙල් ගසක් සිටුවා එතැන්හි සදාකාල දෙවි වූ ස්වාමීන්වහන්සේගේ නාමය කියා යාච්ඤාකෙළේය. (උත්පත්ති 21:33)**

දෙවියන්වහන්සේගේ සදාතනික ස්වභාවය හොඳින්ම පැහැදිලි කෙරෙන්නේ වෘත්තයකිනි. වෘත්තයට දෘශ්‍යමාන ආරම්භක ලක්ෂයයක් හෝ අවසාන ලක්ෂයයක් හෝ නැත. එහෙත් එය පවතී.



දෙවියන්වහන්සේගේ සදාතනික ස්වභාවය

## උන්වහන්සේ ආත්මයකි :

දෙවියන්වහන්සේ ආත්මයකි. මින් අදහස් වන්නේ උන්වහන්සේට මාංශය හෝ රුධිරය හෝ නොමැති බවය. එබැවින් උන්වහන්සේ ස්වභාවික ඇස්වලට නොපෙනේ.

> **දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාරකරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාරකළ යුතුය. (යොහාන් 4:24)**

## සර්වබලධාරීය :

දෙවියන්වහන්සේ මුළු විශ්වයේම සර්වබලධාරී (ශ්‍රේෂ්ඨතම) බලය වේ. එපිස 1 හා රෝම 9 කියවන්න.

## සර්ව ව්‍යාප්තිය :

මින් අදහස් වන්නේ දෙවියන්වහන්සේ සෑම තැනම වැඩ වාසය කරන බවය.

> **... උන්වහන්සේ ඇස් පොළොව මුළුල්ලෙහි ඔබ මොබ දුවන්නේය (2 ලේකම් 16:9)**
>
> **ස්වාමීන්වහන්සේගේ ඇස් සෑම තැනම පැවත, නපුරන්ද යහපතුන්ද බලන්නේය. (හිතෝපදේශ 15:3)**
>
> **ඔබගේ ආත්මය කෙරෙන් කොතැනට යන්නෙම්ද? ඔබ ඉදිරියෙන් කොතැනට පලායන්නෙම්ද? මම ස්වර්ගයට නැගුණොම් නුමුත් ඔබ එහිය, ෂෙයෝල්ලෙහි (පාතාලයෙහි) මාගේ යහන පිළියෙල කෙරෙම් නුමුත් ඔබ එහිය. (ගීතාවලිය 139:7-8)**

## සර්වඥානය :

මින් අදහස් වන්නේ දෙවියන්වහන්සේ සියල්ල දන්නා බවය.

> **මක්නිසාද ස්වාමිනි ඔබ මුළුමනින්ම නොදන්නාවූ කිසි වචනයක් මාගේ දිවේ නැත්තේය. (ගීතාවලිය 139:4)**
>
> **දෙවියන්වහන්සේ අප සිතට වඩා උතුම්ව සියලු දේම දන්නා නිසාය (1 යොහාන් 3:20)**
>
> **උන්වහන්සේ ඇස් ඉදිරියේ සියල්ල වැස්මක් නැතිව ඇරී තිබේ, අපෙන් ගණන්ගන්නේ උන්වහන්සේය (හෙබ්‍රෙව් 4:13)**

**සර්වබලධාරීය :**

මින් අදහස් වන්නේ දෙවියන්වහන්සේ බොහෝ සේම බලගතු බවය.

> **... මම සර්වපරාක්‍රම වූ දෙවියන්වහන්සේය. (උත්පත්ති 17:1)**
>
> **... නුමුත් දෙවියන්වහන්සේට සියල්ලම පුළුවනැයි කීසේක. (මතෙව් 19:26)**
>
> **... සර්වපරාක්‍රම වූ අපගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ රජකම් කරන බැවින් ... (එළිදරව් 19:6)**
>
> **දෙවියන්වහන්සේ එක්වරක් කීසේක. මම මෙය දෙවරක් ඇසීමි. එනම් බලය දෙවියන්වහන්සේට අයිති බවය. (ගීතාවලිය 62:11)**

**නොවෙනස් වේ :**

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පෞද්ගලිකත්වය, ස්වභාවය, පරමාර්ථය හෝ සැලැස්ම වෙනස් නොකරන සේක.

> **මක්නිසාද ස්වාමීන්වහන්සේ වන මම වෙනස් නොවෙමි. (මලාකි 3:6)**
>
> **යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත් අදත් සදාකාලයටත් එකාකාරමය (හෙබ්‍රෙව් 13:8)**

**ශුද්ධවන්තය :**

දෙවියන්වහන්සේ පාප රහිතය. සම්පූර්ණයෙන්ම පවිත්‍රය.

> **නුඹලා ශුද්ධව සිටිය යුතුය. මක්නිසාද නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ වන මම ශුද්ධය (ලෙවී කථාව 19:2)**

**සාධාරණය :**

දෙවියන්වහන්සේ සාධාරණ වන අතර විනිශ්චයේදී අපක්ෂපාති වේ.

> **උන්වහන්සේ විශ්වාස වූ අයතු කමෙන් තොරවූ දෙවිකෙනෙක, උන්වහන්සේ වනාහි ධර්මිෂ්ඨය, අවංකය (ද්විතිය කථාව 32:4)**

**විශ්වාසවන්තය :**

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දු කඩ නොකරන අතර සම්පූර්ණයෙන් විශ්වාස වන්තය.

> **... උන්වහන්සේ විශ්වාසව සිටින සේක ... තමන් වහන්සේගේ වචනය බොරුකරන්ට උන්වහන්සේට බැරිය (2 තිමෝති 2:13)**

**පරිත්‍යාගශිලිය :**

දෙවියන්වහන්සේ යහපත්ය, කරුණාවන්තය, එමෙන්ම ඔබගේ ශුභසාදනය අපේක්ෂා කරන සේක.

> **ස්වාමීන්වහන්සේ සියල්ලන්ට යහපත්ය. උන්වහන්සේගේ දයාබරකම් උන්වහන්සේගේ සියලු කර්මාන්ත කෙරෙහිය. (ගීතාවලිය 145:9)**

**දයාවන්තය :**

පව්කාර මනුෂ්‍ය වර්ගයාට දෙවියන්වහන්සේ දයාව පෙන්වන සේක :

**උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණවූ, දයාවන්තවූ, උදහස්වීමට ප්‍රමාදවන්නාවූ අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ දෙවි කෙනෙක්ය. උන්වහන්සේ දහස් ගණනකට කරුණාව පවත්වන සේක ... (නික්මයාම 34:6-7)**

## කරුණාභරිතය :

දෙවියන්වහන්සේ පාපි මිනිසාට, ඔහුට සුදුසු නොවූ කරුණාවක් පෙන්වන සේක.

**.... මක්නිසාද මම කරුණාභරිතය. (නික්මයාම 22:27)**

ස්වාමින්වහන්සේ දයාවන්තය, අනුකම්පාවෙන් පූර්ණය, උදහස්වීමට ප්‍රමාදය, මහත් කරුණාවෙන් යුක්තය. (ගීතාවලිය 145:8)

## ප්‍රේමවන්තය :

දෙවියන්වහන්සේ ප්‍රේමය වේ.

**ප්‍රේම නොකරන්නා දෙවියන්වහන්සේව නාඳුනයි, මක්නිසාද දෙවියන්වහන්සේ ප්‍රේමයය. (1 යොහාන් 4:8)**

## ප්‍රඥාවන්තය :

දෙවියන්වහන්සේ ගැඹුරු අවබෝධයක් හා තියුණු විමසිමක් පෙන්නුම් කරන සේක.

**ස්වාමින්වහන්සේ ප්‍රඥාව කරණකොටගෙන පොළොවේ අත්තිවාරම් තැබූසේක, ඥානය කරණකොටගෙන අහස පිහිටවූසේක. (හිතෝපදේශ 3:19)**

## සීමාවක් රහිත වේ :

දෙවියන්වහන්සේ ස්වභාවික මනුෂ්‍ය සීමාවලට භාජනය නොවන සේක. උන්වහන්සේ අවකාශයේ සීමාවලටද භාජනය නොවන සේක :

**නුමුත් දෙවියන්වහන්සේ සැබවින්ම පොළොවේ වසන්ට සතුටුවනසේක්ද? ස්වර්ගයද ස්වර්ගවල ස්වර්ගයද ඔබවහන්සේට ඉඩ මදිය, එසේනම් මා විසින් ගොඩනැගූ මේ ගෘහය ඊට වඩා කොපමණ මදිද? (1 රාජාවලිය 8:27)**

උන්වහන්සේ කාලයේ සීමාවන්ට භාජනය නොවන සේක.

**ස්වාමින්වහන්සේ සදාකල්ම රජකම් කරන සේක. (නික්මයාම 15:18)**

# පියවූ දෙවියන්වහන්සේ

පියවූ දෙවියන්වහන්සේ නපුරු ආත්මික බලවේගවලට විරෝධතාව දක්වන යහපත් ආත්මික බලවේගවලට අණදෙන නිලධාරියා වේ. මෙය ආත්මික සටන් භූමියේ උන්වහන්සේගේ විශේෂ වගකීම වේ.

## දෙවියන්වහන්සේ කොතැනද?

දෙවියන්වහන්සේ සර්වව්‍යාප්ති බව ඔබ උගත්තෙහිය. ඉන් අදහස් වන්නේ උන්වහන්සේ විශ්වයේ සෑම තැනම වැඩ වාසය කරන බවය. දෙවියන්වහන්සේගේ සිංහාසනය ස්වර්ගය නම් ස්ථානයේ වේ. එහෙත් උන්වහන්සේ සර්වව්‍යාප්තිය.

**ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක. අහස මාගේ සිංහාසනයය. පොළොව මාගේ පාපුටුවය. (යෙසායා 66:1)**

## දෙවියන්වහන්සේට ඇති නම් :

බයිබලයේ දෙවියන්වහන්සේට වෙනත් නම් දී ඇත. එමගින් ඔබ මේ මහා ආත්මික ගැටුමේ නිරත වී සිටින තුරු උන්වහන්සේගේ සේවය ඔබට එළිදරව් වන්නේය.

1. **යෙහෝවා:** එහි අදහස ස්වාමීන්වහන්සේය. බයිබලය දෙවියන්වහන්සේට ඇති අනෙක් නම් සමග මේ වචනය සම්බන්ධ කර ඇත.

| | | |
|---|---|---|
| යෙහෝවා-රාෆා | "සුවකරන්නාවූ ස්වාමීන් වහන්සේ" | නික්මයාම 15:26 |
| යෙහෝවා-නිස්සි | "ධජයේ ස්වාමීන්වහන්සේ" | නික්මයාම 17:8-15 |
| යෙහෝවා-ෂාලොම් | "සමාදානයේ ස්වාමීන් වහන්සේ" | විනිශ්චයකාරයා 6:24 |
| යෙහෝවා-රාආ | "එඬෙරාවූ ස්වාමීන් වහන්සේ" | ගීතාවලිය 23:1 |
| යෙහෝවා-සිඩ්කේනු | "ධර්මිෂ්ඨවූ ස්වාමීන් වහන්සේ" | යෙරමියා 23:6 |
| යෙහෝවා-ජිරේ | "සපයන්නාවූ ස්වාමීන් වහන්සේ" | උත්පත්ති 22:14 |
| යෙහෝවා-ෂම්මා | "එහි සිටින ස්වාමීන් වහන්සේ" | එසකියෙල් 48:35 |

2. **එලෝහිම්:** එහි අදහස දෙවියන්වහන්සේ වේ. දෙවියන්වහන්සේගේ නිර්මාණාත්මක බලයන් භාවිත කරන තැන්වල එය භාවිත කරයි.

3. **පියාණන් වහන්සේ:** ක්‍රියා 17:28, යොහාන් 1:12-13

4. **අදොනායි:** යන්නෙහි තේරුම ස්වාමීන්වහන්සේ හෝ ස්වාමියා වේ. නික්මයාම 23:17 යෙසායා 10:16,33

5. **එල්:** මෙය බොහෝ විට භාවිත කරන්නේ දෙවියන්වහන්සේට ඇති අනෙකුත් වචන සමග එකට සම්බන්ධකර වේ.

| | | |
|---|---|---|
| එල් ෂඩායි : | "තම සෙනගගේ අවශ්‍යතාවන් සපුරාලන දෙවියන්වහන්සේ" | නික්මයාම 6:3 |
| එල් ඔලාම් : | "සදාතන දෙවියන්වහන්සේ" | උත්පත්ති 21:33 |
| එල් එලොන්: | "ඉතා උසස් දෙවියන්වහන්සේ, දෙවිවරුන් යයි කියන අනෙකුත් සියල්ලන්ටම වඩා මහොත්තමය." | උත්පත්ති 14:18,22 |

6. **යාවේ:** පැරණි ගිවිසුම ලියන ලද භාෂාව වූ හෙබ්‍රෙව් භාෂාවෙන් "යාවේ" යන්නෙහි තේරුම දෙවියන්වහන්සේ වේ. දෙවියන්වහන්සේගේ ගති ලක්ෂණ තව දුරටත් එළිදරව් කිරීමට මෙම වචනය තවත් වචන සමග සම්බන්ධ කර ඇත. දෙවියන්වහන්සේට පහත දැක්වෙන නම් භාවිත කෙරේ:

| | | |
|---|---|---|
| යාවේ ජිරේ : | - "සපයන්නාවූ ස්වාමීන් වහන්සේ" | - උත්පත්ති 22:14 |
| යාවේ නිස්සි : | - "මාගේ ධජය වූ ස්වාමීන්වහන්සේ" | - නික්මයාම 17:15 |
| යාවේ ෂාලොම් : | - "සමාදානයේ ස්වාමීන්වහන්සේ" | - විනිශ්චයකාරයා 6:24 |
| යාවේ සබාහොත් : | - "සේනාවල ස්වාමීන්වහන්සේ" | - 1 සාමුවෙල් 1:3 |
| යාවේ මක්කද්දේෂ්කෙම්: | - "ශුද්ධවන්ත කරන්නාවූ ස්වාමීන්වහන්සේය" | - නික්මයාම 31:13 |
| යාවේ සිඩ්කේනු : | - "ධර්මිෂ්ඨ වූ ස්වාමීන්වහන්සේ" | - යෙරමියා 23:6 |
| යාවේ ෂම්මා : | - "එහි සිටින ස්වාමීන්වහන්සේ" | - එසකියෙල් 48:35 |
| යාවේ එලොහිම් ඉශ්රායෙල් | - "ඉශ්රායෙල්හි දෙවි ස්වාමීන්වහන්සේ" | - විනිශ්චයකාරයා 5:3 |
| කදෝශ් ඉශ්රායෙල් | - "ඉශ්රායෙල්හි ශුද්ධවන්ත තැනැන්වහන්සේ" | - යෙසායා 1:14 |

7. **සේනාවල ස්වාමීන්වහන්සේ:** බයිබලයේ වාර්තාවල දෙවියන්වහන්සේට විවිධ නම් භාවිත කළේ තමන්වහන්සේගේ සෙනග වෙනුවෙන් විශේෂ ආකාරයෙන් ක්‍රියාකරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින විටය. නිදසුනක් වශයෙන් "සුවකරන්නාවූ ස්වාමීන්වහන්සේ" යන තේරුම ඇති යෙහෝවා-රාෆාම් යන නම භාවිත කළේ සුවය සොයන අවස්ථාවලය.

ආත්මික සටන සඳහා භාවිත කෙරෙන දෙවියන්වහන්සේගේ සුවිශේෂ නම "යාවේ සබාහොත්" වේ. එය බයිබලයේ කිං ජේම්ස් නම් ඉංග්‍රිසි පරිවර්තනයේ "සේනාවල ස්වාමින් වහන්සේ" ලෙස පරිවර්තනය කර ඇත. යුද්ධයේදී මේ නම භාවිත කරන විට, සටන ස්වාමීන් වහන්සේගේ වන අතර ස්වර්ගයේ සියලුම සේනාවන් ඔබගේ ආධාරයට පැමිණෙනු ඇත.

## දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වූ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දිව්‍යමය හා මනුෂ්‍යමය ස්වභාවයන් දෙකම එකට සම්බන්ධ කර ඇත. පියවූ දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේගේ දිව්‍යමය ස්වභාවය රඳවා ගනිමින්ම, උන්වහන්සේ මනුෂ්‍යාකාරයෙන් පොළොවට එවූ සේක. දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පොළොවට එවන ලද්දේ මනුෂ්‍යයාට පාපයෙන් කමාව දීමට වේ.

> **මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එව්වේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය. (යොහාන් 3:16-18)**

යේසුස් වහන්සේගේ කතාව බයිබලයේ මතෙව්, මාක්, ලූක් හා යොහාන් යන පොත්වල වාර්තා කර ඇත. මෙම පොත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත, මරණය, උත්ථානවීම, ඉගැන්වීම් හා සේවය ගැන විස්තරාත්මක වාර්තාවක් සපයා ඇත.

දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටසක් වශයෙන් යේසුස්වහන්සේ මනුෂ්‍යාකාරයෙන් මෙලොවට පැමිණ, මිනිසුන් අතර සේවය කර, මිනිසාගේ පාපය වෙනුවෙන් මියගොස්, මළවුන්ගෙන් නැවත නැගිට, ලෝකයේ ජාතීන් වෙත ශුභාරංචිය ගෙන යෑමට උන්වහන්සේගේ අනුගාමිකයන්ට පැවරූසේක.

### යේසුස්වහන්සේ කොතැනද?

යේසුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ පසු, බොහෝ මිනිසුන් ඉදිරියේ පෙනී සිට, උන්වහන්සේගේ අනුගාමිකයන්ට ශුභාරංචිය පැතිරීමට නියෝග කොට, ඉන්පසු නැවත ස්වර්ගයට වැඩිසේක. එහෙත් උන්වහන්සේ ස්වර්ගයේ සිටියද උන්වහන්සේ තවමත් සර්වව්‍යාප්ති බව, එනම් උන්වහන්සේ සැම තැනම වැඩවසන බව මතක තබා ගන්න.

### විශේෂ කාර්යයන්:

ආත්මික සටන හා සම්බන්ධ යේසුස්වහන්සේගේ විශේෂ කාර්යයන් අතර පහත දැක්වෙන ඒවාද වේ.

1. මනුෂ්‍යයා පාපයෙන් ගළවාගැනීමට : ඔබව සතුරූ උගුලකට අසුකරගෙන සිටින පාපයේ බන්ධනයෙන් ඔබව නිදහස් කෙරෙන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය තුළිනි.

   **... මක්නිසාද යමෙක් යමෙකුගෙන් පරාජයවුණොත් ඔහු ඒ තැනැත්තාට වාල්ව සිටියි. (2 පේත්‍රුස් 2:19)**

   **දෙවියන්වහන්සේගේ දරුවන්ගේ මහිමයේ නිදහස්කමට පැමිණෙන්නේය යන බලාපොරොත්තුවෙන් එය යටත්කළාවූ තැනැන්වහන්සේ නිසාය. (රෝම 8:21)**

   **ක්‍රිස්තුස්වහන්සේ අප මුදාගත්තේ නිදහස්කම ඇතුව සිටීමටය. එබැවින් දාසකම නැමති වියගහකට නැවත අසු නොවී ස්ථිරව සිටපල්ලා. (ගලාති 5:1)**

2. නපුරූ බලවේග පරාජය කෙරෙන අධිකාරී බලය : ඔබ මේ පිළිබඳව පසුව මෙම පාඨමාලාවෙන් අධ්‍යයනය කරනු ඇත. යේසුස්වහන්සේගේ මරණයෙන් මිනිසා පාපයෙන් නිදහස් කළා පමණක් නොව නපුරූ බලවේග පරදවා ජයග්‍රහණය කරන්නටද හැකිවිය. මේ නිසා ඔබට සතුරා පරාජය කිරීමේ අධිකාරී බලය තිබේ.

**එකල උන්වහන්සේ දොළොස් දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී,... (ලූක් 9:1)**

3. යක්ෂයාගේ ක්‍රියාවන් විනාශ කිරීම :

**... යක්ෂයා පටන්ගැන්මේ සිට පව්කරන්නේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශකරනු ලැබුවේ මේ පිණිසය, එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශ කරන පිණිසය. (1 යොහාන් 3:8)**

4. ඇදහිලිවතුන් සඳහා මැදිහත් වීම : ආත්මික සටනේ යෙදී සිටින ඇදහිලිවතුන් වෙනුවෙන් යේසුස්වහන්සේ ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ දකුණු පස වැඩ සිටමින් මැදිහත්වන සේක. මින් අදහස් වන්නේ උන්වහන්සේ ඔබ වෙනුවෙන් පියාණන්වහන්සේට කතා කරන බව වේ.

**මැරුණෙත්, ඒ ඇර මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවෙත්, දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කම් කරන්නෙත් ක්‍රිස්තුස්වහන්සේය. (රෝම 8:34)**

## යේසුස්වහන්සේගේ නම් :

"යේසුස්" යන නාමයේ තේරුම "ගැළවුම්කාරයාණෝ" හෙවත් "මිදුම්කාරයාණෝ" වේ. (මතෙව් 1:21). "ක්‍රිස්තුස්" යන නාමයේ තේරුම "ආලේපලත් තැනැන්වහන්සේ" යන්නය (යොහාන් 4:25-26). යේසුස්වහන්සේට බයිබලයේ දී ඇති නම් අතර මේවාද වේ.

| | |
|---|---|
| ආදම් (දෙවැනි) | 1 කොරින්ති 15:45-47 |
| මැදහත්කාරයෙක් | 1 යොහාන් 2:1 |
| සර්වපරාක්‍රම වූ | එළිදරව් 1:8 |
| අල්පා සහ ඔමෙගා | එළිදරව් 21:6 |
| ආමෙන් | එළිදරව් 3:14 |
| පුරාතන කෙනෙක් | දානියෙල් 7:9 |
| උන්වහන්සේගේ අභිමුඛය වන දූත තෙමේ | යෙසායා 63:9 |
| පංගුකාරයන්ට වඩා ආලේප කළ සේක | ගීතාවලිය 45:7 |
| අභිෂේක ලත් | ගීතාවලිය 2:2 |
| අපේ ඇදහිල්ලේ ප්‍රේරිතයාණන් | හෙබ්‍රෙව් 3:1 |
| ස්වාමීන්වහන්සේගේ හස්තය | යෙසායා 51:9-10 |
| ඇදහිල්ලේ කතෘවරයාද සම්පූර්ණ කරන්නාද වූ | හෙබ්‍රෙව් 12:2 |
| සදාකාල ගැලවීමේ කර්තෘ | හෙබ්‍රෙව් 5:9 |
| දෙවියන්වහන්සේගෙන් ඉපදී සිටින | 1 යොහාන් 5:18 |
| ප්‍රේමවන්තයාණන්වහන්සේ | එපීස 1:6 |
| ආත්මවල එඬේරා, රැකවලා | 1 පේදුරු 2:25 |
| ශුභාන්විත එකම අධිපතියාණන්වහන්සේ | 1 තිමෝති 6:15 |
| පැළෑටිය | සෙකරියා 3:8 |
| (ධර්මිෂ්ඨකමේ) පැළෑටිය | යෙරෙමියා 33:15 |
| යෙස්සේගේ කඳින් අංකුරයක් | යෙසායා 11:1 |
| ජීවනදායක කෑම | යොහාන් 6:48 |
| දීප්තිමත් පහන් තාරකාව | එළිදරව් 22:16 |
| ස්වාමීන්වහන්සේගේ සේනාපතියා | යෝෂුවා 5:15 |
| වඩුවාගේ පුත්‍රයා | මතෙව් 13:55 |
| කොනේ ප්‍රධානගල | 1 පේදුරු 2:6 |
| දසදහසක් අතරේ උතුම්ය. | සාලමොන්ගේ 5:10 |
| ක්‍රිස්තුස් | යොහාන් 1:41 |
| ස්වාමිවූ ක්‍රිස්තුස් | ලූක් 2:11 |
| අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ | රෝම 8:39 |
| ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ බලය | 1 කොරි 1:24 |
| මන්ත්‍රීවරයාය | යෙසායා 9:6 |
| සෙනගගේ ගිවිසුමක් | යෙසායා 42:6 |
| අරුණාලෝකය | ලූක් 1:79 |
| අලුයම පැමිණි පහන් - පහන් තාරකාව | 2 පේතෘස් 1:19 |

| | |
|---|---|
| ගැලවුම්කාරයාණෝ | රෝම 11:26 |
| දොරකඩ | යොහාන් 10:9 |
| තෝරාගත් තැනැත්තා | යෙසායා 42:1 |
| එම්මානුවෙල් | මතෙව් 1:23 |
| සදාකාලවූ ජීවනය | 1 යොහාන් 5:20 |
| සදාකාල පියාණෝය | යෙසායා 9:6 |
| විශ්වාසය සැබෑයයි කියනු ලැබූ තැනැන්වහන්සේ | එළිදරව් 19:11 |
| විශ්වාස සාක්ෂිකාරයාවූ | එළිදරව් 1:5 |
| කුළුඳුල් පුත්‍රයා | හෙබ්‍රෙව් 1:6 |
| මාගේ කුළුඳුලා | ගීතාවලිය 89:27 |
| බොහෝ සහෝදරයන් අතරේ කුළුඳුලා | රෝම 8:29 |
| නාඹුල් එලයය | 1 කොරි. 15:23 |
| පලවෙනියා සහ අන්තිමයාය | එළිදරව් 22:13 |
| සියොන්හි අත්තිවාරම | යෙසායා 28:16 |
| මහිමයෙන් යුක්ත වූ ස්වාමීන්වහන්සේ | යෙසායා 33:21 |
| ඊශ්‍රායෙල්ගේ දෙවියන්වහන්ස | යෙසායා 45:15 |
| දෙවියන්වහන්සේ අප සමගය | මතෙව් 1:23 |
| මහොත්තම දෙවියන්වහන්සේ | තීතස් 2:13 |
| මහා උත්තම පූජකයෙක් | හෙබ්‍රෙව් 4:14 |
| සභාව නමැති ශරීරයට හිස | කොලොස්සි 1:18 |
| සියල්ලන් තුල සියල්ල | එපීස 1:22 |
| කොනේ ප්‍රධාන ගල | ගීතාවලිය 118:22 |
| සියල්ලේ උරුමක්කාරයා | හෙබ්‍රෙව් 1:2 |
| ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේ | යෙසායා 41:14 |
| තේජසේ බලාපොරොත්තුව | කොලොස්සි 1:27 |
| මම සිටිමි | යොහාන් 8:58 |
| අදෘශ්‍යමාන දෙවියන්වහන්සේගේ ස්වරූපය | කොලොස්සි 1:15 |
| එම්මානුවෙල් | යෙසායා 7:14 |
| ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ | රෝම 1:4 |
| ඉශ්‍රායෙල් විනිශ්චයකාරයාණන් | මීකා 5:1 |
| තේජසේ රජ්ජුරුවෝ | ගීතාවලිය 24:7 |
| රජතුමා | සෙකරියා 9:9 |
| මු¨ පොළොව කෙරෙහි රජ | සෙකරියා 14:9 |
| දෙවියන්වහන්සේගේ බැටළුපැටවාණෝ | යොහාන් 1:29 |
| ලෝකයේ ආලෝකය | යොහාන් 8:12 |
| මිටියාවත්වල මහනෙල් මල | සාලමොන්ගේ ගී 2:1 |
| ජීවනදායක කෑම | යොහාන් 6:51 |
| සර්වපරාක්‍රම ස්වාමීවූ දෙවියන්වහන්සේ | එළිදරව්ව 4:8 |
| සියල්ලන්ගේ ස්වාමීන්වහන්සේ | ක්‍රියා 10:36 |
| අපේ ධර්මිෂ්ඨකම වූ ස්වාමීන්වහන්සේ | යෙරමියා 23:6 |
| ස්වාමීන්වහන්සේ (ඔබේ මිදුම්කාරයාණෝ) | යෙසායා 43:14 |
| ප්‍රේමය | 1 යොහාන් 4:8 |
| දුක දන්නා මනුෂ්‍යයා | යෙසායා 53:3 |
| නායකයාණෝ | මතෙව් 23:10 |
| මෙසියස්වහන්සේ | |
| ආලේපලත් තැනැත්තා | දානියෙල් 9:25 |
| පරාක්‍රමවත් දෙවියන්වහන්සේ | යෙසායා 9:6 |
| යාකොබ්ගේ බලවන්තයාණන්වහන්සේ | යෙසායා 60:16 |
| අති ශුද්ධ | දානියෙල් 9:24 |
| බලවන්තයාණන් | ගීතාවලිය 45:3 |
| නාසරියයා | මතෙව් 2:23 |
| එකම දෙවියන්වහන්සේ | 1 තිමෝති 1:17 |
| අපගේ පාස්කුව | 1 කොරින්ති 5:7 |
| වෙට්ණන් | ලූක් 4:23 |
| සමාදානයේ කුමාරයා | යෙසායා 9:6 |
| පොළොවේ රජවරුන්ගේ අධිපතියා | එළිදරව්ව 1:5 |

| | |
|---|---|
| අනාගතවක්තෘ | ද්විතිය කථාව 18:15-18 |
| පව් ගණන් නොගෙන හැSම | රෝම 3:25 |
| රබ්බි | යොහාන් 1:49 |
| මිදුම්කරුවාණෝ | යෙසායා 59:20 |
| නැවත නැගිටීම | යොහාන් 11:25 |
| ධර්මිෂ්ඨ සේවකයාණෝ | යෙසායා 53:11 |
| පර්වතය | 1 කොරින්ති 10:4 |
| යෙස්සේගේ අංකුරය | යෙසායා 11:10 |
| ෂාරෝන් හි පුෂ්පය | සාලමොන්ගේ ගී 2:1 |
| ලෝකයේ ගැලවුම්කරුවාණෝ | 1 යොහාන් 4:14 |
| දාවිත්ගේ වංශයෙන් | යොහාන් 7:42 |
| ස්ත්‍රියගේ වංශය | උත්පත්ති 3:15 |
| එඬේරා (යහපත්) | යොහාන් 10:11 |
| දේව පුත්‍රයාණන් | රෝම 1:4-5 |
| මනුෂ්‍ය පුත්‍රයා | ක්‍රියා 7:56 |
| මරියාගේ පුත්‍රයා | මාක් 6:3 |
| මහෝත්මයාණන්ගේ පුත්‍රයාණෝය | ලූක් 1:32 |
| යාකොබ්ගේ තාරකාවක් | ගණන් කථාව 24:17 |
| ගල | මතෙව් 21:42 |
| ධර්මිෂ්ඨකමේ සූර්යයා | මලාකි 4:2 |
| සව් අත්තිවාරමක්වූ | යෙසායා 28:16 |
| ගුරුවරයෙක් | යොහාන් 3:2 |
| සත්‍යය | යොහාන් 14:6 |
| කියා නිමකළ නොහැකි දීමනාව | 2 කොරින්ති 9:15 |
| මිදිවැල | යොහාන් 15 1 |
| මාර්ගය | යොහාන් 14:6 |
| අපූර්වය | යෙසායා. 9:6 |
| වාක්‍යයාණෝ | යොහන් 1:14 |
| දෙවියන්වහන්සේගේ වාක්‍යයාණෝ | එළිදරව් 19:13 |

## ශුද්ධාත්මයාණන් වූ දෙවියන්වහන්සේ

දෙවියන්වහන්සේගේ ත්‍රිත්ව ස්වභාවයේ එක් පුද්ගලයෙක් ශුද්ධාත්මයාණන්වහන්සේය. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේට පෞද්ගලිකව පෞරුෂත්වයක්ද තිබේ. ශුද්ධාත්මයාණෝ යන විෂය මහත් විශාල බැවින් හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය නමින් වෙනම පාඨමාලාවක් සකස් කර ඇත. ශුද්ධාත්මයාණන් පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයකට මෙම පාඨමාලාව උචිතය.

### ශුද්ධාත්මයාණන්වහන්සේගේ පෞරුෂත්වය

ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව බයිබලය පහත දැක්වෙන දේ එළිදරව් කර ඇත.

***මනසක් තිබේ:***

> **... සිත් විමසන තැනැන්වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි (මනස) දන්නා සේක. (රෝම 8:27)**

***මනුෂ්‍ය මනස සොයා බලයි:***

> **නුමුත් දෙවියන්වහන්සේ ස්වකීය ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන අපට ඒ දේ එළිදරව්කළසේක. මක්නිසාද ආත්මයාණන්වහන්සේ සියලු දේ, එසේය, දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් විමසනසේක. (1 කොරින්ති 2:10)**

### *කැමැත්තක් ඇත :*

> **නුමුත් ඒ එකමවූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදා දෙමින්, මේ සියල්ල කරවනසේක. (1 කොරින්ති 12:11)**

ඇතැම් ක්‍රියාවන්ට අවසරදිම ප්‍රතික්ෂේප කරමින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ කැමැත්ත ඇදහිලිවතුන්ට මඟපෙන්වන සේක.

> **ඔව්හු ආසියාවේදී වචනය කියාදෙන්ට ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු ලැබ, පිරිගිය සහ ගලාතිය පළාත මැදින් ගියෝය, ඔව්හු මිසිය ඉදිරියට ඇවිත්, බිතිනියට යන්ට උත්සාහ කළෝය: නුමුත් යේසුස්වහන්සේගේ ආත්මයාණන් ඔවුන්ට ඉඩ නුදුන්සේක. (ක්‍රියා 16:6-7)**

ඇදහිලිවතුන්ට අවසර දිමෙන්ද ශුද්ධාත්මයාණන්වහන්සේ මග පෙන්වන සේක.

> **ඔහු දර්ශනය දුටු කල, ඔවුන්ට ශුභාරංචිය දේශනාකරන්ට දෙවියන්වහන්සේ අඬගැසූ බව තේරුම්ගෙන, එකෙණෙහිම මකිදෝනියට යන්ට අපි උත්සාහකෙළෙමුව. (ක්‍රියා 16:10)**

### *කතා කරන සේක:*

> **එවිට ආත්මයාණන්වහන්සේ පිලිප්ට කථාකොට, නුඹ මේ රථය ළඟට ගොස් එක්වෙයන්නැයි කීසේක. (ක්‍රියා 8:29)**

### *ප්‍රේමකරන සේක:*

> **... දෙවියන්වහන්සේට කරන නුඹලාගේ යාච්ඤාවලදී මා සමග බලවත් ලෙස වීර්ය කරන හැටියට අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසාද ආත්මයාණන්වහන්සේගේ ප්‍රේමය නිසාද නුඹලාගෙන් ඉල්ලමි (රෝම 15:32)**

### *මැදිහත්වනසේක:*

ඇදහිලිවන්තයන් වෙනුවෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ මැදිහත්වන සේක (දෙවියන්වහන්සේට යාච්ඤා කරන).

> **එලෙසම ආත්මයාණන්වහන්සෙත් අපගේ දුර්වලකම්වලදී උපකාරකරනසේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤාකරන්ට අපි නොදනිමුව, නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගැම්වලින් අප උදෙසා මැදහත්කම් කරනසේක. (රෝම 8:26)**

මෙම පෞරුෂත්ව ලක්‍ෂණ ලැයිස්තුවෙන්, ආත්මික සටනේදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැදගත් ක්‍රියාවන් ඉක්මනින්ම ඔබට හඳුනාගත හැකිය. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ ගේ සටනට මග පෙන්වන සේක. උන්වහන්සේ, ස්වාභාවිකව දැනගත නොහැකි ආත්මික දේ එළිදරව් කරන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ වචන හා කැමැත්ත ඔබට පවසන සේක. එමෙන්ම ඔබ ආත්මික සටන්වල නිරතව සිටියදී උන්වහන්සේ ඔබ වෙනුවෙන් මැදිහත්වන සේක.

### ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය:

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය නැමැති ආත්මික අත්දැකීමක් ඇත. එහි අන්‍ය භාෂාවලින් කතා කිරීම් (ක්‍රියා 2) හා ශුභාරංචියේ ප්‍රබල සාක්ෂිකරුවන් වීමේ බලය පෙන්වීමේ ලකුණු අන්තර්ගතය (ක්‍රියා 1:8).

ආත්මික සටන සාර්ථකව කරගෙන යෑමට, ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තීස්මය අත්දැකීම වැදගත් වේ. මෙය ආත්මික සටන සඳහා වූ බල ප්‍රභවයය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය, නැමැති පාඨමාලාවේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය පිළිබඳව සාකච්ජා කර ඇත.

**ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා:**

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන්ට විශේෂ දීමනා දෙන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ නැමැති පාඨමාලාවේ මේ දීමනා විස්තරාත්මකව සාකච්ඡා කර ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ලයිස්තුගත කර ඇති ප්‍රධාන ස්ථාන මෙසේය :

රෝම 12:1-18, 1 කොරින්ති 12:1-31, එපීස 4:1-16, 1 පේත්‍රුස් 4: 7-11

නපුරු බලවේගවලට එරෙහිව සටන් කිරීමට ඇදහිලිවන්තයන් සන්නද්ධ කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා අවශ්‍යය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා අතර මේවාද වේ.

***දෙවියන්වහන්සේ සෙනග සූදානම් කෙරෙන විශේෂ දීමනා:***

ප්‍රේරිතවරුන්, දිවැසිවරුන්, ඉවැන්ජලිස්තවරුන්, පූජකවරුන්, ගුරුවරුන්

***දෙවියන්වහන්සේගේ සත්‍යයන් පැහැදිලි කෙරෙන විශේෂ දීමනා:***

දිවැසි වැකි, ඉගැන්වීම්, උපදෙස්, ප්‍රඥාවේ වචන, දැන ගැනීමේ වචන

***දෙවියන්වහන්සේගේ වැඩකටයුතු කිරීමේ හැකියාව ලබාදෙන සේවය කිරීම් දීමනා:***

සේවය කිරීම, උපකාර කිරීම, නායකත්වය, පරිපාලනය, දීම, දයාව පෙන්වීම, ආත්ම විමසීම, ඇදහිල්ල, ආගන්තුක සත්කාරය

***දෙවියන්වහන්සේගේ අධිකාරී බලය පිහිටුවීමේ සලකුණු දීමනා:***

අන්‍යභාෂාවලින් කතා කිරීම, භාෂා තේරුම් කිරීම, හාස්කම්, සුවකිරීම්

**ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල:**

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන්ගේ ජීවිත තුළ ආත්මික ඵලද වර්ධනය කරන සේක. "ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල" යනුවෙන් අදහස් වනුයේ ඇදහිලිවතුන්ගේ ජීවිත තුළ එළිදරව් වන ආත්මයේ ස්වභාවය, එනම් සියලු කිතුනුවන්ගේ ජීවිත තුළ දැකගත හැකි ආත්මික ගති ලක්ෂණ වේ.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා බලය සඳහා වේ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ ලක්ෂණ සඳහාය. ඔබ ක්‍රිස්තුස්වහන්සේ හා සමාන ගති ලක්ෂණ වර්ධනය කර නොගතහොත් ඔබ නපුරු බලවේගවලට ගොදුරු වනු ඇත. ආත්මික ඵල වලින් පෙන්නුම් කෙරෙනුයේ ආත්මික පරිණත භාවයයි. ස්වාභාවික ලෝකයේ ඵලයක් මෙන් මෙයද ජීවන ක්‍රියාවලියේ නිපදවීමක් වේ.

ආත්මික ඵල වර්ග දෙකකි. නැවත ඇති කරන ආත්මික ඵල ඇත.

> **නුඹලා මා තෝරාගත්තා නොව මම නුඹලා තෝරාගෙන පත්කෙළෙමි. එසේ කළේ නුඹලා ගොස් ඵල දරන පිණිසත් නුඹලාගේ ඵල පවතින පිණිසත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේගෙන් නුඹලා ඉල්ලන කොයි දෙයක් නුමුත් උන්වහන්සේ නුඹලාට දෙන පිණිසත්ය. (යොහාන් 15:16)**

එමෙන්ම ක්‍රිස්තුස්වහන්සේ හා සමාන ගති ලක්ෂණ ඇති අභ්‍යන්තර ඵල ද වේ. මේ ගති ලක්ෂණ මිනිසාගේ මාංශික ස්වභාවයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වේ.

> **ඉදින් මාංසයේ ක්‍රියා ප්‍රකාශව තිබේ, එනම්, වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදිකම්, භේද, ලබ්ධිභේද, වෛර, බීමත්කම,**

**මංගල්‍ය ඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. මෙබඳු දේ කරන්නන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම නුඹලාට ප්‍රථම කී ලෙසම, දැනුත් කලින් නුඹලාට කියමි. නමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත.** (ගලාති 5:19-23)

කුරුසියේදී මාංශයේ බලය පරාජය වුවද ඇදහිලිවන්තයෙකු ලෙස ඔබට එය අත්දැකිය හැක්කේ යේසුස්වහන්සේ අවසන් කළ කාර්යය තුළ ඔබ ඇදහිල්ලෙන් ක්‍රියාත්මක වන ප්‍රමාණය අනුව වේ. එබැවින් මාංශයේ පාපි ස්වභාවයේ බලය ප්‍රතික්ෂේප කිරීම ඵලදායි වන්නට නම් ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වර්ධන කිරීම නැතහොත් "පැළඳගැනීම" අවශ්‍ය වේ.

## ශුද්ධාත්මයාණන්වහන්සේ සිටින්නේ කොතැනද?

යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට පොරොන්දු වුයේ උන්වහන්සේ ස්වර්ගයට ගිය පසු ඔවුන්ව සැනසීමට ශුද්ධාත්මයාණන්වහන්සේ එවීමටය.

**මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි, එවිට උන්වහන්සේ නුඹලා සමග සදාකල්ම සිටින පිණිස වෙන සැනසිලිකාරයෙකු නුඹලාට දෙන සේක. ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ අත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්ට ලෝකයාට බැරිය, මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය, මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවතී සිටිනසේක, නුඹලා තුළෙහි සිටිනසේක (යොහාන්** 14:16-17)

ශුද්ධාත්මයාණන්වහන්සේගේ එක් කාර්යයක් වන්නේ යේසුස්වහන්සේ වෙතට අවධානය යොමු කිරීම වේ.

**නුමුත් පියාණන්වහන්සේ කෙරෙන් මා විසින් නුඹලාට එවන සැනසිලිකාරයාණන්වහන්සේ එනම් පියාණන්වහන්සේ වෙතින් නික්මෙන්නාවූ සත්‍යතාවේ ආත්මයාණන් වහන්සේ ආ කල උන්වහන්සේ මා ගැන සාක්ෂි දෙන සේක.** (යොහාන් 15:26)

දෙවි වූ ශුද්ධාත්මයාණන්වහන්සේ, ආත්මාකාරයෙන් වන බැවින් මිනිසාගේ ස්වාභාවික ඇස් වලට නොපෙනුනද අදද ලෝකයේ සිටින සේක. උන්වහන්සේ පාපි මිනිසුන්ට වරද පෙන්වා දෙමින්, යේසුස්වහන්සේ වෙතට මිනිසුන් ඇද ගනිමින්, ආත්මික සටන සඳහා ඇදහිලිවතුන් සන්නද්ධ කරමින්, ඔවුන්ට මග පෙන්වමින් හා යේසුස්වහන්සේ පිළිබඳව සාක්ෂි දෙමින් ක්‍රියා කරන සේක.

ශුද්ධාත්මයාණන් වහන්සේ තවත් විවිධ ක්‍රම මගින් ලෝකයාට සේවය කරන සේක. මේවා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ, *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"*, යන පාඩමාලාවේ විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

### ශුද්ධාත්මයාණන්වහන්සේගේ සංවේදිතාව:

ශුද්ධාත්මයාණන්වහන්සේට සංවේදී ස්වභාවයක් ඇත. ඉන් අදහස් වන්නේ මිනිසාගේ ක්‍රියාවන් නිසා උන්වහන්සේට බලපාන හැඟීම් ඇති බවය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ සංවේදී ස්වභාවය නිසා ශුද්ධාත්මයාණන්වහන්සේ නොරැවටිය යුතු බවටත් (ක්‍රියා 5:3-4) ආත්මයාණන්ට විරුද්ධ නොවිය යුතු බවටත් (ක්‍රියා 7:51), ආත්මයාණන්වහන්සේ නොනිවිය යුතු බවටත් (1 තෙසලෝනික 5:19), ආත්මයාණන්වහන්සේට දුක් නොදිය යුතු බවටත් (ගීතාවලිය 78:40 හා එපීස 4-30) ආත්මයාණන්වහන්සේට නින්දා නොකළ යුතු බවටත් (හෙබ්‍රෙව් 6-4-6), ආත්මයාණන්වහන්සේට අපහාස නොකළ යුතු බවටත් (මතෙව් 12:31-32) හා ආත්මයාණන් වහන්සේට විරුද්ධව කැරලි නොගැසිය යුතු බවටත් (යෙසායා 63:10) බයිබලය අනතුරු හඟවයි. මෙම ක්‍රියාවන් විස්තරාත්මකව හවෙස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ, *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* යන පාඩමාලාවේ සාකච්ඡා කර ඇත.

ශුද්ධාත්මයාණන් වහන්සේගේ සංවේදී ස්වභාවයට ඔබ වේදනා නොදිය යුතුය. ඔබගේ ක්‍රියාවන් නිසා ශුද්ධාත්මයාණන්වහන්සේ වේදනාවට පත්වුවහොත් උන්වහන්සේ ඔබ මධ්‍යයෙන් ඉවත් වනු

ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය නොමැතිව ඔබට ඵලදායි ආත්මික සටනක යෙදිය නොහැකිය.

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ අනෙකුත් නම්:

ශුද්ධාත්මයාණන්වහන්සේ විස්තර කිරීමට බයිබලයේ නම් බොහොමයක් භාවිත වේ. නමක් යනු යම් පුද්ගලයෙකුගේ තත්වය හා/හෝ කාර්යයන් පැහැදිලිව විස්තර කරන්නාවූ වාක්‍ය ඛණ්ඩයකි. ඔබ ආත්මික සටනකට ඇතුළු වන විට ශුද්ධාත්මයාණන්ගේ කාර්යය දැනගැනීම වැදගත් වේ. ශුද්ධාත්මයාණන්වහන්සේට දී ඇති නම් අධ්‍යයනය කිරීමට බයිබලයේ පහත දැක්වෙන යොමු කිරීම බලන්න.

ශුද්ධාත්මයාණන් වහන්සේ මෙසේ හැඳින්වේ.

| | |
|---|---|
| දෙවියන්වහන්සේගේ ආත්මය | 1 කොරින්ති 3:16 |
| ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මය | රෝම 8:9 |
| සදාතනික ආත්මය | හෙබ්‍රෙව් 9:14 |
| සත්‍යයේ ආත්මය | යොහාන් 16:13 |
| අනුග්‍රහයේ ආත්මය | හෙබ්‍රෙව් 10:29 |
| ජීවනදායක ආත්මය | රෝම 8:2 |
| මහිමයේ ආත්මය | 1 පේත්‍රුස් 4:14 |
| ප්‍රඥාවේද එළිදරව් කිරීමේද ආත්මය | එපීස 1:17 |
| සහනදායකයාණන්වහන්සේ | යොහාන් 14:26 |
| පොරොන්දුවේ ආත්මය | ක්‍රියා 1:4-5 |
| ශුද්ධකමේ ආත්මය | රෝම 1:4 |
| ඇදහිල්ලේ ආත්මය | 2 කොරින්ති 4:13 |
| පුත්‍රකමේ ආත්මය | රෝම 8:15 |

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ සලකුණු:

ශුද්ධාත්මයාණන්වහන්සේ නියෝජනය කිරීමට බයිබලයේ බොහෝ සලකුණු භාවිත කර ඇත. සලකුණකින් යම් දෙයක් නියෝජනය කෙරේ. එය විශේෂ අදහසක් ගෙන දෙන සංකේතයකි. ඔබගේ බයිබලයේ පහත දැක්වෙන යොමු කිරීම් බලන්න. මේ සෑම තැනකම ශුද්ධාත්මයාණන්වහන්සේ නියෝජනය කෙරෙන සලකුණක් ඇත.

| | |
|---|---|
| පරෙවියා : | යොහාන් 1:32, සලමොන්ගේ ගීතිකා 6:9 |
| තෛලය : | ලූක් 4:18, ක්‍රියා 10:38, හෙබ්‍රෙව් 1:9 |
| ජලය : | යොහාන් 7:37-39, යෙසායා 44:3 |
| මුද්‍රාවක් : | එපීස 1:13, 4:30, 2 කොරින්ති 1:22 |
| සුළඟ : | යොහාන් 3:8, ක්‍රියා 2:1-2 |
| ගින්න : | නික්මයාම 3:2, 13:21, ලෙවී කථාව 9:24, ක්‍රියා 2:3 |

*"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* නමැති පාඩමාලාවේ, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මේ සෑම සලකුණකම තේරුම පැහැදිලි කර ඇත.

## සාරාංශය

ඔබ මෙම පරිච්ඡේදයෙන් දෙවියන්වහන්සේගේ ත්‍රිත්ව ස්වභාවය ගැන උගත් අතර පියවූ දෙවියන්වහන්සේත්, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේත් හා ශුද්ධාත්මයාණන්වහන්සේත් ගැන අධ්‍යයනය කෙළෙහිය. මෙම තැනැන්වහන්සේලා ආත්මික සටන් භූමියේ ඒකාබද්ධ කාර්යයන් සමග විශ්වයේ යහපත් බලවේගයක් වේ.

එහෙත් යහපත් ආත්මික බලවේග පවතින බව දැන ගැනීම පමණක් ප්‍රමාණවත් නැත. බයිබලය මෙසේ පවසයි :

**ඇත්තේ එකම දෙවියන්වහන්සේ බව නුඹ විශ්වාස කරන්නෙහිය, නුඹ කරන එක හොඳය. යක්ෂයොත් විශ්වාසකර වෙවුලති. (යාකොබ් 2:19)**

නපුරු ආත්ම බලවේග දෙවියන්වහන්සේ විශ්වාස කරන අතර උන්වහන්සේට බිය වේ. එහෙත් ඔවුන් තවමත් නපුරුය. දෙවියන්වහන්සේ විශ්වාස කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. උන්වහන්සේ ඔබගේ ජීවිතයේ ස්වාමීන්වහන්සේ බව ඔබ පිළිගත යුතුය. ඔබගේ පාප වෙනුවෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පූජා වූ බව ඔබ පිළිගත යුතු අතර ඔබ පසුතැවිලි විය යුතුය, කමාව ඉල්ලිය යුතුය. එමෙන්ම ක්‍රිස්තුස්වහන්සේගේ කෙනෙකු බවට පත්විය යුතුය.

ඔබ තවමත් යහපත් ආත්මික බලවේග පිළිබඳ අධ්‍යයනය සම්පූර්ණ කර නැත. ඊළඟ පරිච්ඡේදයේ ඇත්තේ දේවදූතයන් ලෙස හැඳින්වෙන මහත් ආත්මික දූත පිරිසක් ගැන වන අතර ආත්මික සටනේ ඔවුන්ගේ ක්‍රියාවන් විස්තර කර ඇත.

## පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපි ලේඛණවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

______________________________________________

______________________________________________

2. යහපත් ආත්මික බලවේග ලැයිස්තුගත කරන්න.

______________________________________________

______________________________________________

3. දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයේ පෞරුෂත්ව තුන නම් කරන්න.

______________________ දෙවියන්වහන්සේ

______________________ දෙවියන්වහන්සේ

______________________ දෙවියන්වහන්සේ

4. ආත්මික සටන් භූමියේ දෙවියන්වහන්සේගේ විශේෂ කාර්යයන් සාරාංශගත කරන්න.

______________________________________________

______________________________________________

5. ආත්මික සටනෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කාර්යයන් සාරාංශගත කරන්න.

______________________________________________

______________________________________________

6. ආත්මික සටනෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ කාර්යයන් සාරාංශගත කරන්න.

______________________________________________

______________________________________________

7. පළමුවන තිරුවෙන් දැක්වෙන්නේ ත්‍රිත්ව දෙවිඳුන්ගේ උප ලක්ෂණ සමහරෙකි. දෙවෙනි තිරුවෙන් මෙම උප ලක්ෂණවල අර්ථ විග්‍රහයන් දැක්වේ, එහෙත් නිවැරදි අනුපිළිවෙලින් නොවේ. පළමු තිරුවේ සෑම උප ලක්ෂණයක්ම බලන්න. ඉන්පසු ඊට අදාළ නිවැරදි අර්ථ විග්‍රහය දෙවෙනි තිරුවෙන් සොයා ගන්න. එතැන ඇති හිස් තැනේ ඒ නිවැරදි අර්ථ විග්‍රහයේ අක්ෂරය ලියන්න. නිදර්ශනයක් ලෙස පළමුවැන්න කර තිබේ.

| 1 වැනි තිරුව | | | 2 වැනි තිරුව |
|---|---|---|---|
| 1. _h_ | සදාතනිකය | a. | මාංශය හෝ රුධිරය හෝ නොමැතිව |
| 2. ___ | සර්වබලධාරී | b | සෑමතැනම වැඩ වාසය කරයි. |
| 3. ___ | සර්ව ව්‍යාප්ති | c. | යහපත්, කරුණාවන්තය |
| 4. ___ | ශුද්ධවන්තය | d. | උසස්, උත්තරීතර බලය |

| | | | |
|---|---|---|---|
| 5. ___ | අපරිමිත | e. | සියලු බල ඇති |
| 6. ___ | නොවෙනස්වන | f. | සියල්ල දන්නා |
| 7. ___ | ත්‍යාගශීලි | g. | පාප රහිත |
| 8. ___ | ආත්මයකි | h. | ආරම්භයක් හෝ අවසානයක් හෝ නැති |
| 9. ___ | සර්වඥ | i. | වෙනස් නොවන |
| 10. ___ | සර්ව බලධාරී | j. | විනිශ්චයේදී සාධාරණ හා අපක්ෂපාති |
| 11. ___ | සාධාරණ | k. | පව්කාර මනුෂ්‍ය වර්ගයාට අනුකම්පාව දක්වන |
| 12. ___ | දයාන්විත | l. | ස්වාභාවික සීමාවන්ට භාජනය නොවන |

8. ආත්මික සටනට ඇතුළුවන අවස්ථාවේ ඔබ භාවිත කළ යුතු දෙවියන්වහන්සේගේ නම කුමක්ද?

_______________________________________________

(මෙම පරීක්ෂණවලට පිලිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. යෝජිත අනුපිළිවෙල අනුව ඔබ භාවස්ටයිම් ජාත්‍යන්තර පාඨමාලාව අධ්‍යයනය කරන්නෙහි නම්, මෙම පාඨමාලාව අවසන් කිරීමෙන් පසුව ඔබ *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* අධ්‍යයනය කරනු ලබයි. *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* හි පළමු පරිච්ඡේදයේ පිය වූ දෙවියන්වහන්සේ හා පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ අධ්‍යයනය තව දුරටත් කරගෙන යෑම සඳහා සැකිල්ලක් අන්තර්ගත වේ. ආයතනයේ සම්පූර්ණ වැඩසටහනෙහි ඔබ ලියාපදිංචි වී නොමැති නම්, භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* නම් පාඨමාලාව මෙම පාඨමාලාව අවසානයේ ලබා ගන්නා ලෙස අපි යෝජනා කරමු.

2. ජීවිතය, සේවය, හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳ අතිරේක අධ්‍යයනයක් භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"රාජ්‍යයේ ජීවත්වීම"* හා *"ඉගැන්වීම් ක්‍රමවේදයන්"* යන පාඨමාලාවල සපයා ඇත.

3. කිතුනු ඇදහිල්ලේ මූලික ධර්මයන් පිළිබඳ විස්තරාත්මක උපදෙස්, භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ඇදහිල්ලේ පදනම"* යන පාඨමාලාවේ සපයා ඇත. යහපත් ආත්මික බලවේග පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට මෙම පාඨමාලාව වැදගත් වේ. ඔබ විෂයයන් අධ්‍යයනය කරන්නේ යෝජිත අනුපිළිවෙලට නම් ඔබ මෙම පාඨමාලාව දැනටමත් අවසන් කර ඇත. එසේ නොමැති නම් තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා මෙම පාඨමාලාව ලබා ගැනීමට අපි යෝජනා කරමු.

4. ඔබ දැන් සටනක යෙදී සිටින්නෙහිද? ඔබ මෙම ගැටළුව ගැන යාච්ඤා කරන අතර සේනාවල ස්වාමීන්වහන්සේගේ නමට කතා කිරීම ආරම්භ කරන්න.

5. ඔබ දැනට මුහුණ දෙන සටනක් ගැන සිතන්න. ඉන්පසු පියවූ දෙවියන්වහන්සේගේත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේත් ශුද්ධාත්මයාණන්වහන්සේගේත් යුද්ධයේදී කෙරෙන කාර්යයන් නැවතත් අධ්‍යයනය කරන්න. ඔබගේ පෞද්ගලික සටනේදී දෙවියන්වහන්සේ ඔබට සහාය විය හැක්කේ කෙසේද? යේසුස්වහන්සේ ඔබට සහාය විය හැක්කේ කෙසේද? ඔබ මුහුණ දෙන ගැටළුව පිළිබඳව ශුද්ධාත්මයාණන්වහන්සේගේ කාර්යය කුමක්ද?

# හතරවන පරිච්ඡේදය

## යහපත් ආත්මික බලවේග : දේව දූතයෝ

### අරමුණු

මෙම පරිච්ඡේදයේ අධ්‍යයනය අවසන් වූ පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දේවදූතයන් කවුරුන්ද යන්න පැහැදිලි කෙරෙන යොමුවක් සැපයීමට
- දේවදූතයන්ගේ මූලාරම්භය පැවසීමට
- දේවදූතයන් වර්ග දෙකක් හැඳිනගැනීමට
- දේවදූතයන් ක්‍රියාකරන ක්ෂෙත්‍ර හැඳිනගැනීමට
- ආත්මික සටනේ දේවදූතයන්ගේ මෙහෙය සාරංශගත කිරීමට
- දේවදූතයන්ගේ උප ලක්ෂණ හැඳිනගැනීමට
- දේවදූතයන් පිළිබඳ විවිධ වර්ගීකරණ හැඳිනගැනීමට
- දේවදූත සේනාවන්ගේ සංවිධානය පැහැදිලි කෙරෙන ශුද්ධලියවිලි යොමුවීමක් සැපයීමට

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **ස්වාමීන්ගේ දූතයා උන්වහන්සේට භය ඇත්තන් හාත්පස කඳවුරු බැඳ ඔවුන් මුදා හරියි. (ගීතාවලිය 34:7)**

## හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙන් ඔබ පිය වූ දෙවියන්වහන්සේ, පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් සමන්විත දේව ත්‍රිත්වය පිළිබඳව උගත්තෙහිය. ඔබ එම තැනැන්වහන්සේලාගේ මූලාරම්භය, උපලක්ෂණ හා ආත්මික සටනේදී ඔවුන්ගේ කාර්යයන්ද උගත්තෙහිය.

මෙම පරිච්ඡේදයෙන් තවදුරටත් යහපත් ආත්මික බලවේග පිළිබඳව අධ්‍යයනය කරන්නෙමු. එය දේවදූතයන්ගේ මූලාරම්භය, උප ලක්ෂණ, ක්‍රියාකරන ක්ෂෙත්‍රය, වර්ගීකරණය හා දේවදූතයන්ගේ සංවිධාන පැහැදිලි කරයි. එමෙන්ම ආත්මික සටනේදී ඔවුන් කෙරෙන සේවයද පැහැදිලි කරනු ඇත.

## දේවදූතයන් යනු කවුරුන්ද ?

දේවදූතයෝ යනු දෙවියන්වහන්සේ විසින්, උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට එවන ලද සේවක ආත්මයෝ වෙති.

> **ඔවුන් සියල්ලෝ ගැළවීම උරුමකරගන්ට සිටින්නන් උදෙසා සේවයකරන පිණිස එවනු ලබන සේවක ආත්මයෝ නොවෙද්ද? (හෙබ්‍රෙව් 1:14)**

"දූතයා" යන්නෙහි තේරුම පණිවුඩකරු වේ.

## දේවදූතයන්ගේ මූලාරම්භය

දේවදූතයන් මවන ලද්දේ දෙවියන්වහන්සේ විසිනි.

> **උන්වහන්සේගේ සියලු දූතයෙනි, උන්වහන්සේට ප්‍රශංසා කරව්. උන්වහන්සේගේ මුළු සේනාව, උන්වහන්සේට ප්‍රශංසා කරව්.**

**ඒ සියල්ලෝ ස්වාමින්ගේ නාමයට ප්‍රශංසා කෙරෙත්වා. මක්නිසාද උන්වහන්සේ අණකළ සේක. එවිට ඒවා මවන ලද්දේය. (ගීතාවලිය 148:2, 5)**

**මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය, සියලු දේ උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ, (කොලොස්සි 1:16)**

සියලුම දේවදූතයෝ, මුලින්ම මවන ලද අවස්ථාවේ ධර්මිෂ්ඨ වූහ. ශුද්ධ වූහ. ඔවුහු එකම සැබෑ දෙවියන්වහන්සේට සේවය කළහ, නමස්කාර කළහ. පසුව ඇතැම් දේව දූතයෝ දෙවියන්වහන්සේට විරුද්ධව කැරලි ගසා, දේවදූතයන් වශයෙන් තුබූ ඔවුන්ගේ තත්වය නැතිකර ගත්හ. ඔවුහු "යක්ෂයින්" නම් නපුරු බලවේගයක කොටසක් වූහ.

දැන් දේවදූතයන් වර්ග දෙකකි. යහපත් දේවදූතයෝ, එය මෙම පරිච්ජේදයේ විෂය වේ. තවත් නපුරු දූතයෝ (යක්ෂයින්) - එය මෙම පාඩමාලාවේ සයවන පරිච්ජේදයේ දී සාකච්ජා කරනු ලැබේ.

## දේවදූතයන්ගේ සංවිධානය

යහපත් දේවදූතයන් දෙවියන්වහන්සේ විසින් විශේෂ ක්‍රමයකට සංවිධානය කර ඇත. එම ක්‍රමයේ විස්තර බයිබලය එළිදරව් නොකරයි. එහෙත් එවැනි සංවිධානයක් ගැන බයිබලය ඉඟි කර ඇත.

**මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය, සියලු දේ උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ, (කොලොස්සි 1:16, එපිස 3:10 ද බලන්න )**

නොපෙනෙන ලෝකයේ සංවිධානය මෙහි සිංහාසන ස්වාමිකම් අධිපතිකම්, හා බලපරාක්‍රම ලෙස විස්තර කර ඇත. මෙම ව්‍යුහයේ විස්තර අපට දී නැත. සාතන්, මෙම සංවිධානය ඔහුගේම නපුරු බලවේගවල ව්‍යුහයන් ලෙස සංවිධාන කර ඇති ආකාරය ඔබ පසුව ඉගෙනගන්නහිය.

## දේවදූතයන්ගේ වර්ගීකරණය

වචනාර්ථයෙන් දේවදූත සේනා සමූහයක් (ලූක් 2:13-15) ඇති අතර ඔවුන් කරන කාර්යයන් අනුව වර්ගකර ඇති බවක් පෙනේ. පහත දැක්වෙන්නේ දේව දූතයන්ගේ ප්‍රධාන වර්ගයන් වේ.

### පණිවුඩකරුවෝ :

වැඩි වශයෙන්ම ඇත්තේ මේ දේවදූතයන් වර්ගය විය හැකිය. මේ දානියෙල් විසින් පෙන්වා ඇති ආකාරයට (දානියෙල් 7:10) ස්වර්ගයේ හා පොළොවේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන ගණන් කළ නොහැකි තරම් වූ දේවදූත කණ්ඩායම වේ. ආත්මික සටන ගැන ඇදහිලිවතුන් සමග සම්බන්ධ වන්නේ සාමාන්‍යයෙන් මෙම කණ්ඩායම වේ. ඔවුහු දෙවියන්වහන්සේගේ කැමැත්ත තේරුම් කරති, ආරක්ෂාව හා මගපෙන්වීම ගෙන දේ. යාඥා සඳහා පිළිතුරු දේ, නිවේදනයන් හා අනතුරු ඇඟවීම් ගෙන දේ, උපදෙස් ගෙන දේ, විනිශ්චය ගෙන එති, දිරිමත් කරති, පැවැත්මට උදව් වෙති, එමෙන්ම ඇදහිලිවතුන් වෙනුවෙන් මැදිහත්කාරකම් කරති.

### තෝරාගත් දේවදූතයෝ :

තෝරාගත් දේවදූතයන් පිළිබඳව සඳහනක් ඇත්තේ 1 තිමෝති 5:21 හි පමණි. මෙම කණ්ඩායම ගැන වෙනත් තොරතුරක් සොයාගත නොහැකිය.

**කෙරුබ්වරු :**

මෙම වර්ගය ගැන පළමුවෙන්ම සඳහන්ව ඇත්තේ උත්පත්ති 3:24 හි වේ. එමෙන්ම ගිවිසුම් පෙට්ටියේ කොටසක් ලෙස ද ඔවුන්ව සඳහන් කර ඇත (නික්මයාම 25:18-22). එසකියෙල් මොවුන්ව විස්තර කරමින් ඔවුන් පෙනෙන්නාවූ ආකාර හතරක් ඇති බව සඳහන් කරයි. ඒවා නම් සිංහයෙකුගේ මුහුණ, හරකෙකුගේ මුහුණ, මිනිසෙකුගේ මුහුණ හා උකුස්සෙකුගේ මුහුණ වේ. (එසකියෙල් 1:3-28, 10:22). කෙරුබ්වරුන්ගේ මෙම සංකේතවලින් පෙන්නුම් කෙරෙන්නේ එළිදරව් 4:6 හි සඳහන් දෙවියන්වහන්ස්ගේ සිංහාසනය වටකරගෙන සිටින්නේ මොවුන් බවය. දෙවියන්වහන්සේගේ රැකවලුන් වූ මොවුන් දේවදූතයන්ගේ උසස්ම වර්ගය බව පෙනේ.

**සෙරාප්වරු :**

මෙම කණ්ඩායම ගැන යෙසායා 6:2,6 හි සඳහන්ව ඇත. කෙරුබ්වරුන් සිංහාසනය වටා සිටි අතර මොවුන් සිටින්නේ සිංහාසනයට ඉහළිනි. මෙම දේවදූතයන්ගේ කාර්යය ස්වර්ගයේදී දෙවියන්වහන්සේට නමස්කාර කරන අයට නායකත්වය දීම බව පෙනේ.

**ජීවමාන සත්වයෝ :**

මෙම දේවදූත කණ්ඩායම ගැන එළිදරව් 4:6, 8؛ 5:6 හි සඳහන්ව ඇත. මෙම දේවදූතයන්ගේ දිව්‍යමය ජීවිතයේ පූර්ණත්වය මෙම තනතුරින් ප්‍රකාශ කෙරෙන බවත් ඔවුන්ගේ ප්‍රධාන සේවය දෙවියන්වහන්සේට නමස්කාර කිරීම බවත් පෙනේ.

## පෞද්ගලික දේවදූතයෝ

දේවදූතයන්ගේ විවිධ වර්ගීකරණයට අමතර, ඇතැම් පෞද්ගලික දේවදූතයන් ගැනද බයිබලයේ සඳහන් වේ.

**මිකායෙල් :**

මිකායෙල් නම් වූ අග්‍රදේවදූතයා ගැන දානියෙල් 10:13, 21؛ 12:1؛ ජුද් 9, හා එළිදරව් 12:7 හි සඳහන් වේ. අග්‍ර දේවදූතයා ලෙස හැඳින්වෙන්නේ ඔහු පමණයි. එළිදරව් 12:7 න් දැක්වෙන්නේ ඔහු දේවදූත හමුදාවක් භාරව සිටින කෙනෙකු වශයෙනි. දානියෙල් 10:13, 21؛ 12:1 හි සඳහන් වන්නේ ඔහු ඊශ්‍රායෙල් සෙනගගේ කුමාරයා ලෙසිනි.

**ගේබ්‍රියෙල් :**

ඔහුගේ නමේ තේරුම "ප්‍රතාපවත් තැනැත්තා" යන්නය. දානියෙල් 8:16؛ 9:21 හා ලූක් 1:19, 26 හි ඔහු ගැන සඳහන්ව ඇත. ඔහු සැම විටම දෙවියන්වහන්සේගේ වැදගත් පණිවුඩයක් ගෙන ඒමට යොදාගෙන ඇත. දානියෙල් 8:16؛ 9:21 හි යොහාන් ගේ හා යේසුස්වහන්සේගේ උපත දැනුම් දුන්නේද ඔහුමය.

**විශේෂ දේවදූත කණ්ඩායම් :**

විශේෂ දේවදූත කණ්ඩායම් ගැන ද බයිබලයේ සඳහන් වේ. ඉන් සමහරක් මෙසේය :

| | |
|---|---|
| සභා සතේ දූතයෝ | එළිදරව් 1:20 |
| සුළඟ පාලනය කරන දේව දූතයන් සතර දෙනා | එළිදරව් 1:7 |
| දෙවියන්වහන්සේ ඉදිරිපිට සිටින දේවදූතයෝ සත් දෙනා | එළිදරව් 8:2 |
| අවසාන වසංගත හත පාලනය කරන දේවදූතයන් සත්දෙනා | එළිදරව් 15:1,7 |
| වැඩිමහල්ලන් විසි හතර දෙනා (මොවුන් දෙවදූතයන් විය හැකිය) | එළිදරව් 4 හා 5 |

## දේව දූතයන්ගේ උපලක්ෂණ

උප ලක්ෂණ යනු පුද්ගලයෙකුගේ පෞරුෂත්ව ලක්ෂණ හෝ ගති ලක්ෂන හෝ බව පසුගිය පරිච්ඡේදයේ සඳහන් වූ බව ඔබට මතක ඇත. දේවදූතයෝ

- ආත්මයෝ වෙති : හෙබ්‍රෙව් 1:14
- ලිංග භේදයක් නැත : ලූක් 20:34-36
- අමරනියය : මතෙව් 22:28-30
- දෘශ්‍ය හා අදෘශ්‍ය ආකාර ඔවුන්ට ඇත : ගණන් කථාව 22:22-35
- මනුෂ්‍ය ආකාරයෙන් දෘශ්‍යමාන වේ : උත්පත්ති 19:22, 18:2,4.8
- හැඟීම් තිබේ : ලූක් 15:1-10 (දේවදූතයෝ ප්‍රීතිවූහ)
- ආහාර රුචියක් ඇත : උත්පත්ති 18:8
- මහිමයට පත්කළ අය වේ : ලූක් 9:26
- ඥානවන්තය : 2 සාමුවෙල් 14:20
- මෘදුය : ජුද් 9
- බලවන්තය : ගීතාවලිය 103:20, 2 පේත්‍රැස් 2:11
- විවේකයක් අවශ්‍ය නැත : එළිදරව් 4:8
- වාර්තා නොකළ වේගයකින් ගමන් කරයි : එළිදරව් 8:13, 9:1
- භාෂාවන් කතා කරයි : 1 කොරින්ති 13:1
- මහත් සංඛ්‍යාවක් ඇත: ලූක් 2:13, හෙබ්‍රෙව් 12:22, ගීතාවලිය 68:17, මාක් 1:13 එළිද. 5:19
- අමරණීයය : ලූක් 20:34-36
- විවාහ වන්නේ නැත, දරුවන් නැත : ලූක් 20:34-36
- කිකරුය : ගීතාවලිය 103:20
- ශුද්ධවන්තය : එළිදරව් 14:10, මාක් 8:38
- ගෞරවනියය : ඔවුන්ගේ උසස්ම ක්‍රියාව දේව නමස්කාරය වේ. නෙහෙමියා 9:6, පිලිප්පි 2:9-11, හෙබ්‍රෙව් 1:6

## ඔවුන්ගේ ක්‍රියාකාරී ක්ෂෙත්‍රය

දේවදූතයෝ ස්වර්ගයෙහි මෙන්ම පොළොවෙහිද ක්‍රියාකාරී වෙති. ඔවුන්ගේ බලය ඔවුන්ට දෙවියන්වහන්සේ ප්‍රදානය කර ඇති අතර පාලනයද කරන සේක. ස්වර්ගයේදී දෙවියන්වහන්සේ අභිමුඛයට යෑමට ඔවුන්ට පුළුවන

> **මක්නිසාද ස්වර්ගයේදී ඔවුන්ගේ දූතයෝ ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගේ මුහුණ නිතරම දකිතියි නුඹලාට කියමි. (මතෙව් 18:10)**

ඔවුහු පොළොවේද ක්‍රියාකාරීහු වෙති. විවිධ සේවාවන් මගින් හා බයිබලයේ වාර්තා කර ඇති මිනිසුන්ට දර්ශනය වූ බොහෝ දේවදූතයන් මගින් මෙය ලේඛණගත කර ඇත.

## දේව දූතයන්ගේ සේවය

ස්වර්ගයේත් පොළොවේත් දේවදූතයෝ විවිධාකාරයෙන් සේවය කරති. පහත දැක්වෙන්නේ සෑම එකක් සඳහාම බයිබලයේ යොමුවීම බලන්න. ඔබ මේ පද අධ්‍යයනය කරන අතර ආත්මික සටනෙහි දේවදූතයන්ගේ මැදිහත් වීම කොතරම් වැදගත් දැයි ඔබට අවබෝධ වනු ඇත.

### ස්වර්ගයෙහි දේවදූතයන්ගේ සේවයෙහි මේවා අන්තර්ගතය :

- නමස්කාරය : එළිදරව් 4:8, 5:11-12, යෙසායා 6:3 ගීතාවලිය 103:20, 148:1-2
- දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට සූදානම්ව සිටීම : ගීතාවලිය 103:20-21
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ මියගිය භක්තිවන්තයින්ට සේවය කිරීම : ජුද් 9, ලූක් 16:22

- විශේෂ ආකාරයෙන් ළමයින් නියෝජනය කිරීම : මතෙව් 18:10
- ශුභාරංචිය පිළිගත් අය ගැන ප්‍රීතිවීම : ලූක් 15:10

**පොළොවෙහි දේවදූතයන්ගේ සේවයෙහි මේවාද අන්තර්ගතය**

- ජාතීන් පාලනය කිරීම : දානියෙල් 10
- පරීක්‍ෂාවන් සිදුවන විට ඇදහිලිවතුන්ට සේවය කිරීම : මතෙව් 4:11
- ඇදහිලිවතුන් ශක්තිමත් කිරීම : ලූක් 22:43
- මිනිසුන් වෙනුවෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත අර්ථ නිරූපණය කිරීම : සෙකරියා 1:9, දානියෙල් 7:16
- ඇදහිලිවතුන්ට මග පෙන්වීම : ක්‍රියා 8:26
- ජාතීන් හා පුද්ගලයන් වෙත විනිශ්චය ගෙන ඒම : ක්‍රියා 12:23 උත්පත්ති 19:3, 2 සාමුවෙල් 24:16, එළිදරව් 16:1
- යාච්ඤාවලට පිළිතුරු ගෙන ඒම : දානියෙල් 9:21-22
- නිවේදනය කිරීම : ලූක් 1:11-20, මතෙව් 1:20,21
- අනතුරු ඇඟවීම : මතෙව් 2:13
- උපදෙස් දීම : මතෙව් 28:2-6, ක්‍රියා 10 : 3-6, දානියෙල් 4:13-17
- ධෛර්යය දීම : ක්‍රියා 27:23, උත්පත්ති 28:12
- එළිදරව්වීම : ක්‍රියා 7:53, ගලාති 3:19, හෙබ්‍රෙව් 2:2, දානියෙල් 9:21-27 එළි. 1:1
- දරා සිටීම : මතෙව් 4:11, ලූක් 22:43
- සුරක්ෂිත කිරීම : උත්පත්ති 16:7, 24:7, නික්මයාම 23:20, එළිදරව් 7:1
- ආරක්ෂා කිරීම : ගීතාවලිය 91:11
- මුදාගැනීම : ගණන් කථාව 20:16, ගීතා. 34:7, යෙසායා 63:9, දානියෙල් 3:28, 6:22, උත්පත්ති 48:16, මතෙව් 26:53, ක්‍රියා 12:1-19
- විනාශ කිරීම : ක්‍රියා 12:20-23
- මැදහත්කාරකම්කිරීම : සෙකරියා 1:12, එළිදරව් 8:3-4

**දේවදූතයන්ගේ අනාගත කාර්යයන් පහත දැක්වේ :**

- යේසුස් වහන්සේගේ නැවත පැමිණීමට සහභාගී වීමට : 1 තෙසලෝනික 4:16
- තෝරාගත්තවුන් ඒක්රැස් කිරීම : මතෙව් 24:31
- පීඩාකාලයේදී දේශනා කිරීම හා අනතුරු ඇඟවීම : එළිදරව් 14:6-9
- ධර්මිෂ්ඨයන්ගෙන් අධර්මිෂ්ඨයන් වෙන් කිරීම : මතෙව් 13:39 හා 49
- සාතන් බැඳ තැබීම : එළිදරව් 20

## දේවදූතයෝ හා ආත්මික සටන

ආත්මික සටනේදී ඇදහිලිවතුන්ට සම්බන්ධ වෙන්නේ සාමාන්‍යයෙන් පණිවුඩ ගෙනෙන දූත කණ්ඩායම වේ. ඔවුහු දෙවියන්වහන්සේගේ කැමැත්ත ඇදහිලිවන්තයාට අර්ථ නිරූපණය කරති, ආරක්ෂා කරති, මඟපෙන්වීම ලබා දෙති, යාච්ඤාවලට පිළිතුරු ගෙනෙති, නිවේදනය කරති, අනතුරු අඟවති, උපදෙස් දෙති, විනිශ්චය ගෙනෙති, ධෛර්යය දෙති, උපස්ථානය කරති, මුදවා ගනිති, හා සටනෙහි නියැලෙන ඇදහිලිවතුන් වෙනුවෙන් මැදහත්කාරකම් කරති.

බොහෝ ඇදහිලිවන්තයෝ දේවදූතයන්ගෙන් ලබාගත හැකි සහාය ගැන නොදනිති. ඊට හේතුව ආත්මික සටනේ ඔවුන්ගේ කාර්යයන් පිළිබඳව ඔවුන්ට උගන්වා නැති බැවිනි. ඔවුන් “මෙහෙකරන්නාවූ ආත්ම” වන අතර ඔවුන්ට ඔබ වෙනුවෙන් හා ඔබට සේවය කරන්ට පුළුවන. සටන්වලදී සහාය වීමට දේවදූතයන් එවන ලෙස ඔබට දෙවියන්වහන්සේගෙන් ඉල්ලීමට පුළුවන. දාවිත් රජතුමා මෙසේ කළේය. ඔහු යාච්ඤා කළේය.

> **ස්වාමින්ගේ දූතයා ඔවුන් එළවා යේවා... ස්වාමින්ගේ දූතයා ඔවුන් ලුහු බඳීවා. (ගීතාවලිය 35:5-6)**

සතුරන්ට විරුද්ධව සටන් කරන්නාවු දේවදූතයන් පිළිබඳ පහත දැක්වෙන බයිබලිය වාර්තා කියවන්න. 2 රාජාවලිය 19:35, 2 ලේකම් 32:21, යෙසායා 37:36, එළිදරව් 12:7

## වැදගත් අනතුරු ඇඟවීම්

දේවදූතයෝ ඇදහිලිවතුන් වෙනුවෙන් වැදගත් සේවයන්හි යෙදෙන ශුද්ධවන්තයෝ වෙති. ඔවුහු දෙවියන්වහන්සේගේ ත්‍රිත්වය මෙන් යහපත් ආත්මික බලවේගවල කොටසක් වෙති. එහෙත් දේවදූතයන් වෙනුවෙන් බයිබලය අනතුරු ඇඟවීම් ද කර ඇත.

### *ඔවුන්ට නමස්කාර නොකරන්න :*

ඔබ දේවදූතයන්ට නමස්කාර නොකරන්න.

> **පහත්වීමටද දේවදූතයන්ට නමස්කාර කිරීමටද කැමතිවීමෙන් දිනුම නුඹලාගේ පහකරන්ට කිසිවෙකුට ඉඩ නාරිල්ලා. එබඳු තැනැත්තා තමා දුටු දේවල හැසිරෙමින්, තමාගේ මාංසික බුද්ධියෙන් නිරර්ථක ලෙස උඩගු වී (තොලොස්සි 2:18)**
>
> **මේ දේ ඇසුවාවූ දුටුවාවූ තැනැත්තා යොහන් නම් මමය. මම ඇසු දුටු කල මේ දේ මට පෙන්වූ දේවදූතයාට නමස්කාරකරන්ට ඔහුගේ පාමුල වැටුණෙමි. ඔහු මට කථාකොට : එසේ නොකරන්ට බලාගනිල්ලා. මම නුඹේද නුඹේ සහෝදරවූ ප්‍රොපේතවරුන්ගේද මේ පොතේ වචන රක්ෂා කරන්නන්ගේද හවුල් මෙහෙකරුවක්ය. දෙවියන්වහන්සේට නමස්කාර කරපන්නැයි කීවේය. (එළිදරව් 22:8-9)**

### *"තවත් ශුභාරංචියක්" දේශනා කරන දේවදූතයෝ ප්‍රතික්ෂේප කරන්න :*

දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයට පටහැනි වන "නව එළිදරව්වීමක්" තමන්ට දුන් දේවදූතයන් දැක ඇති බව ඇතැම්හු පවසති. සම්පූර්ණ ආගමික ව්‍යාපාර එවැනි ව්‍යාජ එළිදරව් මත පදනම් කර ඇත. බයිබලය මේ ගැන අනතුරු අඟවයි.

> **නුමුත් අප විසින් නුඹලාට ප්‍රකාශ කළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේවදූතයෙක්වත් නුඹලාට ප්‍රකාශකරතොත් ඔහු ශාප ලද්දෙක් වේවා. (ගලාති 1:8)**

දෙවියන්වහන්සේගේ වචනයට පටහැනි වන සේ ඔබට මග පෙන්වන මිනිසෙකුට හෝ දේව දූතයෙකුට හෝ වෙනත් ඕනෑම කෙනෙකුට හෝ ඔබ සවන් නොදිය යුතුය. ඔබ මෙම පාඩමාලාවෙන් ඉදිරියේදී ඉගෙන ගන්නා පරිදි සාතන්ගේ එක් ප්‍රධාන උපක්‍රමයක් වන්නේ රැවටීම වේ. බයිබලය ඒ ගැන මෙසේ අනතුරු අඟවයි :

> **ඒක පුදුමයක් නොවේ : මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. (2 කොරින්ති 11:14)**

### *දේවදූතයන්ව කෝප නොකරන්න :*

ගණන් කථාව 22 හි බාලාම් පිළිබඳ කථාව කියවන්න, ඔහු දෙවියන්වහන්සේට අකීකරුව ක්‍රියා කළ දිවැසිවරයෙකි. ස්වාමීන්වහන්සේගේ දේවදූතයෙක් ඔහුට විරුද්ධ වූ බව ඔබට පෙනෙනු ඇත. ඔබ දෙවියන්වහන්සේට අකීකරු වූ විට දේවදූතයෝ සැබවින්ම ඔබට බාධා පමුණුවති. ඔබ සටනක නියැලෙනවා විය හැකිය. එහෙත් එය සතුරාට එරෙහිව කෙරෙන යුද්ධයක් නොවේ. දෙවියන්වහන්සේගේ දේව දූතයන් කෝප නොකිරීමට වගබලා ගන්න (දේශනාකාරයා 5:1-6)

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලියවිලි ඇසුරෙන් ප්‍රධාන පදය ලියන්න.

______________________________________________

______________________________________________

2. දේවදූතයන් සේවය කරන්නේ " හා " යන දෙයාකාරයෙනි

3. දේවදූතයන් ඇතිවූයේ කෙසේද?

______________________________________________

______________________________________________

4. ආත්මික සටන හා සම්බන්ධව දේවදූතයන්ගේ සේවය සාරාංශගත කරන්න.

______________________________________________

5. මෙම පරිච්ඡේදයෙන් ඔබට ලබා ගත හැකි දේවදූතයන්ගේ උප ලක්ෂණ හැකි පමණ ලියන්න.

______________________________________________

______________________________________________

6. දේවදූතයන් කවුරුන්ද යන්න පැහැදිලි කෙරෙන බයිබල් යොමුවක් දෙන්න.

______________________________________________

7. මෙම ප්‍රකාශය සත්‍යද? අසත්‍යද? ඔබ දේවදූතයන්ට නමස්කාර නොකළ යුතුය.

   මෙම ප්‍රකාශය ____________________

8. මෙම ප්‍රකාශය සත්‍යද? අසත්‍යද? දේවදූතයෙක් දර්ශනය වී දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය හා එකඟ නොවන යම් දෙයක් එළිදරව් කළහොත්, ඔහු ස්වාමීන් වහන්සේගේ පණිවුඩ කරුවෙකු නිසා ඔබ ඔහුට සවන් දිය යුතුය.

   මෙම ප්‍රකාශය ____________________

9. මෙම ඡේදය සම්පූර්ණ කිරීමට දී ඇති වචන එක් වරක් පමණක් භාවිතා කරන්න.

   පණිවුඩකරුවෝ - තෝරාගත් දේව දූතයෝ - කෙරුබ්වරුන් - සෙරාෆ්වරුන් - ජීවමාන සත්ත්වයන්

   ____________________ මෙම කණ්ඩායම පිළිබඳව සඳහන්ව ඇත්තේ එක් වරක් පමණි. (1 තිමෝති 5:21) මෙම කණ්ඩායම පිළිබඳව බයිබලයේ වෙනත් තොරතුරු නොමැත.

____________________ ආත්මික සටන හා සම්බන්ධව මෙම දූත කණ්ඩායම බොහෝ සේ ක්‍රියාකාරීය. මෙය විශාලතම දේවදූතයන් අන්තර්ගත කණ්ඩායම විය හැකිය

____________________ මෙම කණ්ඩායම උසස්ම දේවදූතයන්ට අයත් කණ්ඩායම ලෙස පෙනේ. ඔවුහු දෙවියන්වහන්සේගේ ආරක්ෂකයෝ වෙති. ඔවුහු දෙවියන්වහන්සේගේ සිංහාසනය වටකරගෙන සිටිති.

____________________ මොවුන්ගේ ප්‍රධාන සේවය දෙවියන්වහන්සේට නමස්කාර කිරීම වේ. මොවුන් සිටින්නේ සිංහාසනයට ඉහළිනි. දෙවියන්වහන්සේට නමස්කාර කිරීමට නායකත්වය දෙන්නේ මොවුන් වේ.

10. දේව දූතයන් වර්ග දෙකකි : ____________________ දේවදූතයන් හා යක්ෂයන් ලෙස හැඳින්වෙන ____________________ දේව දූතයන්ය.

11. දෙවියන්වහන්සේට විවිධාකාර දේවදූතයන්ගෙන් සමන්විත සංවිධානයක් ඇති බව එළිදරව් කෙරෙන පදය කුමක්ද?

____________________________________________________________

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. දේවදූතයන් පිළිබඳව තවදුරටත් ඉගෙනීමට පහත දැක්වෙන සැකිල්ල භාවිත කරන්න.

## පැරණි ගිවිසුමේ සඳහන් දේව දූතයෝ :

හාගර් බේරාගත්තේය : උත්පත්ති 16:-12
ඊසාක්ගේ උපත නිවේදනය කළේය : උත්. 18:1-15
සොදම්හි විනිශ්චය නිවේදනය කළේය : උත්. 18:16-33
සොදොම් විනාශ කර ලොත් බේරාගත්තේය : උත්. 19:1-29
ඊසාක් ඝාතනය කිරීම වැළැක්විය : උත් 22:11-2
ජාකොබ් ආරක්ෂා කළේය : උත්. 28:12, 31:11, 32:1, 48:16
මොසෙස්ට අධිකාරී බලය පැවරීය: නික් 3:2
ඉශ්රායෙලයට මඟ පෙන්වීය : නික් 14:19, 23:20-23, 32:34
ඊසාක්ගේ හා රෙබෙකාගේ විවාහය සැලසුම් කළේය : උත්. 24:7
ව්‍යවස්ථාව දෙන ලදී : ක්‍රියා 7:38, ගලාති 3:19, හෙබ්‍රෙව් 2:2
බාලාම්ට තරවටු කළේය : ගණන් කථාව: 22:31-35
යොෂුවාට දර්ශනය විය. යොෂුවා 5:13-15
පිළිම පූජා ගැන ඉශ්රායෙලයට තරවටු කළේය : විනි. 2:1-5
ගිඩියොන්ට අධිකාරී බලය පැවරීය : 6:11-40
සැම්සන්ගේ උපත දැන්වීය : විනි. 13
ඉශ්රායෙලයට දඬුවම් කළේය : 2 සාමු. 24:16-17
එලියා බේරාගත්තේය : 1 රාජා 19:5-8
එලිෂා වටකළේය : 2 රාජා 6:14-17
දානියෙල්ව සිංහයන්ගෙන් බේරාගත්තේය : දානි. 6:22
ආසිරියාවේ හමුදාව අල්ලා ගත්තේය : 2 රාජා. 19:35 හා යොසායා 37:36
දෙවියන්වහන්සේගේ සෙනග වටා කුඩාරම් තැනීය : ගීත.) 34:7, 91:11
දෙවියන්වහන්සේගේ හා දිවැසිවරුන්ගේ පණිවුඩකරුවන් ලෙස බොහෝ අවස්ථාවල හඳුන්වා ඇත.

## යේසුස්වහන්සේගේ ජිවිතයේ දේවදූතයෝ :

යොහාන්ගේ උපත දැන්වීය : ලූක් 1:11-17
ඔහුව නම් කළේය : ලූක් 1:13
යේසුස්වහන්සේගේ උපත පිළිබඳව මරියතුමියට දැන්විය : ලූක් 1:26-37
යේසුස්වහන්සේගේ උපත පිළිබඳව යොසෙප්ට දැන්වීය : මතෙව් 1:20-21
යේසුස්වහන්සේව නම් කළේය : මතෙව් 1:21
යේසුස්වහන්සේගේ උපත එඬේරුන්ට දැන්වීය. ලූක් 2:8-15
ගී ගැයුවෝය : ලූක් 2:13-14
මිසරයට පලා යෑමට මග පෙන්වීය: මතෙව් 2:13, 20
යේසුස්වහන්සේට, උන්වහන්සේව පරීක්ෂා කර අවස්ථාවේ උපකාර කළේය : මතෙව් 4:11
ගෙත්සෙමනේදී යේසුස්වහන්සේ වෙතට පැමිණියේය : ලූක් 22:43
උන්වහන්සේගේ සොහොනින් ගල පෙරළිය : මතෙ. 28:2
උන්වහන්සේගේ උත්ථානය දැන්වීය : මතෙ. 28:5-7
මග්දලායේ මරියාට උන්වහන්සේව ඉදිරිපත් කළේය. යොහාන් 20:11-14
උන්වහන්සේ වෙතට දේවදූතයෝ ආහ : යොහාන් 1:51
උන්වහන්සේට දේවදූතයන් ලෙගියොත් දොළොසක් තබා ගත හැකිය : මතෙ. 26:53
උන්වහන්සේ මෙළොවට නැවත වඩින විට උන්වහන්සේ සමග දේවදූතයන් එනු ඇත : මතෙ. 25:31, 16:27, මාක් 8:38, ලූක් 9:26
දේවදූතයෝ එල නෙලාගනු ඇත : මතෙ. 13:39
ඔවුන් තෝරාගත්තවුන් එක්රැස් කරනු ඇත : මතෙ. 24:31
ඔවුන් ධර්මිෂ්ඨයන් අධර්මිෂ්ඨයන්ගෙන් වෙන් කරනු ඇත. : මතෙ. 13:41,49
ඔවුහු ආබ්‍රහම් වෙතට භිඟන්නා ඔසවා ගෙන ගියහ. ලූක් 16:22
ඔවුහු පසුතැවිලි වූ පව්කරුවන් වෙනුවෙන් ප්‍රීති වේ : ලූක් 15:10
ඔවුහු කුඩා දරුවන් නියෝජනය කරති : මතෙ 8:10

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනග ගැන දේවදූතයන් ඉදිරියේ ප්‍රකාශ කරන සේක: ලූක් 12:8
ඔවුන්ට ලිංගභේදයක් නැත. මිය යන්නේ නැත : ලූක් 20:35-36
යක්ෂයාට දූෂ්ට දූතයන් ඇත : මතෙ 25:41

## ක්‍රියා පොතේ සඳහන් දේව දූතයෝ :

සිරගෙයි දොරටු විවෘත කළහ : 5:19
ඉතියෝපිය නපුංසකයා වෙතට පිලිප්ව ගෙන ගියේය 8:26
පේත්‍රුස්ව රැගෙන ඒමට කොර්නේලියස්ට මග පෙන්වීය : 10 පරි.
පේත්‍රුස්ව සිරගෙයින් මුදා ගත්තේය : 12:7-19
හෙරෝද්ට මැරෙන්නට පහර දුන්නේය 12:23
කුණාටුවේදී පාවුල්තුමා සමග සිටියේය : 27:23
එමෙන් මේ තැන්වලද සඳහන් වේ. 6:15, 7:30, 35, 38, 53, 11:13, 23 : 8-9

## යැවුම්පත්‍රවල සඳහන් දේවදූතයෝ :

තෝරාගත් දේවදූතයෝ : 1 තිමෝති 5:21
ගණන් කළ නොහැකි තරම් දේවදූතයෝ සිටිති : හෙබ්‍රෙව් 12:22
ගැළවීමේ උරුමක්කාරයන්ට දේවදූතයෝ සේවය කරති : හෙබ්‍රෙව් 1:13-14
යේසුස්වහන්සේ සමග දේවදූතයන් නැවත පැමිණෙනු ඇත : 2 තෙස. 1:7
අප දේවදූතයන්ට නමස්කාර නොකළ යුතුය. කොලොස්සි 2:18

## එළිදරව් පොතේ සඳහන් දේවදූතයෝ :

යොහාන්ට මෙම පොත ලියාගැනීමට කියෙව්වෝය: 1:1-2, 22:16
සභා හතක මුලාසනය දැරූහ : 1-2 පරි.
මුද්‍රා තැබූ පොත ගැන උනන්දුවක් දැක්වූහ: 5:2
බැටළු පැටවුන්ට ප්‍රශංසා ගී ගැයූහ :5:11-12
පොළොව කෙරෙහි විශේෂ බලයක් ඔවුන්ට දෙන ලදී :7:1-4
තෝරාගත්තවුන්ට මුද්‍රා තැබීය : 7:1-4
දෙවියන් වහනසේ ඉදිරියේ මුහුණින් වැටුණෝය: 7:11
ශුද්ධවන්තයන්ගේ යාච්ඥාවලට පිළිතුරු දීමට යොදා ගත්හ: 8:3-5
හොරණෑ හතක් ශබ්ද කළහ :8:6
පළගැටියන්ගේ හමුදාව පාලනය කළහ : 9:11
අසරුවන් 200,000.00 ක් මුදනු ලැබුවෝය 9:15-16
අවසාන කාලය නිවේදනය කළේය : 10:1,2,6
මහා සර්පයා හා ඔහුගේ දූතයින් සමග සටන් කළෝය: 12:7
ශුභාරංචිය සියලු ජාතීන්ට ප්‍රකාශ කළහ: 14:6
බබිලෝනියේ වැටීම පිළිබඳව ප්‍රකාශ කළහ: 14:8, 18:2
මෘගයන්ගේ අනුගාමිකයන්ගේ අවසානය දැන්වූහ :14:9-10
පොළොවේ අස්වැන්න ගැන දැන්වූහ: 14:15-18
අවසාන වසංගත හත රැගෙන ගියෝය :15:1
බබිලෝනියේ විනිශ්චය දැන්වූහ :17:1,5
බබිලෝනියේ විනාශ කිරීමට සහභාගි විය:18:21
යොහාන්ට අලුත් ජෙරුසලම පෙන්වූහ :21:9
ඔවුන්ට නමස්කාර කිරීම යොහාන්ට තහනම් කළේය: 22:8-9

2. විනිශ්චයකාරයා 13 හි දේවදූතයන් දෘශ්‍යමාන වීම අධ්‍යයනය කරන්න. දේවදූතයන් නැවත ස්වර්ගය පැමිණෙන්නේ නමස්කාරය තුළින් බවත් එමගින් අප වෙනුවෙන් මැදිහත්වීමට අප වටා ඇති "සාතන්ගේ වාතාවරණය" තුළින් අප වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා මාර්ගයක් විවෘත වන බවද පෙනේ. දානියෙල්ගේ කතාන්දරය සමාලෝචනය කර පර්සියාවේ අධිපතියාගේ (සාතන්ගේ බලය) බාධා කිරීම් බිඳ දැමුවේ යාච්ඥා කිරීමෙන් හා නිරාහාරව සිටීමෙන් බව සටහන් කරන්න.

3. ඇදහිලිවතුන්ට, තමාට කැමති දෙයක් කිරීමට දේවදූතයන්ට අණ කළ හැකි බවක් සනාථ කිරීමට බයිබලයෙන් උපකාරයක් නොලැබේ. එහෙත් ඔබ වෙනුවෙන් ඔවුන්ව එවන ලෙස ඔබට දෙවියන්වහන්සේගෙන් ඉල්ලිය හැකිය. ඔබ මුහුණ දෙන සටනක් ගැන සිතා ඒ අවස්ථාවේ ක්‍රියා කිරීමට උන්වහන්සේගේ "සේවක දූතයන්" එවන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

4. ගීතාවලිය 78:36,40 හා දේශනාකාරයා 5:6 කියවන්න. පාළුකරයේදී ඔහුව කෝප කරවන තෙක් ඉශ්රායෙල්වරුන්ට ඔවුන්ව රැකබලා ගැනීම සඳහා විශේෂ දේවදූතයක් සිටියේය. දෙවියන්වහන්සේ ඔබට සහාය වීම සඳහා දේවදූතයෙකු එවූ විට, ඔබ ඔහුව කෝප කළහොත් ඔහු ඔබෙන් ඉවත්ව යනු ඇත. එබැවින් නික්. 23:20-22 හි දී ඇති අනතුරු ඇඟවීමට ඇහුම්කන් දෙන්න. එමෙන්ම ඔබ නොදැනුවත්ම දේව දූතයෙකුට ආගන්තුක සත්කාර කළ හැකිය. හෙබ්‍රෙව් 13:2 බලන්න.

# පස්වන පරිච්ඡේදය

## සතුරා : සාතන්

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කර අවසන් වූ පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඔබගේ ආත්මික සතුරා ලෙස සාතන් හැඳිනගැනීමට
- සාතන් ඇතිවූ ආකාරය පැහැදිලි කිරීමට
- ඔහුගේ කලින් තත්ත්වය විස්තර කිරීමට
- සාතන් ඔහුගේ මුල් තත්ත්වයෙන් වැටුණු ආකාරය පැහැදිලි කිරීමට
- සාතන්ගේ පාපයේ ප්‍රතිඵල හැඳිනගැනීමට
- ඔහුගේ ස්වභාවයේ උප ලක්ෂණ ලයිස්තු ගත කිරීමට
- ඔහුගේ ක්‍රියාකාරී ක්ෂේත්‍රය හැඳිනගැනීමට
- සාතන්ගේ ක්‍රියාකාරකම් සාරංශගත කිරීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය:

**සිහි ඇතිව, අවදිව ඉඳිල්ලා. නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. (1 පේත්‍රුස් 5:8)**

## හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙන් ඔබ ඉගෙන ගත්තේ ආත්මික ලෝකයේ ක්‍රියාත්මක වන නොපෙනෙන මහත් යුද්ධයක් පිළිබඳව වේ. මෙම සටනේ යෙදෙන යහපත් ආත්මික බලවේග ගැනද ඔබ ඉගෙන ගත්තෙහිය. මෙහි පියවූ දෙවියන්වහන්සේ, ප්‍රත්‍රයාණන්වහන්සේ හා ශුද්ධාත්මයාණන් වහන්සේ හා දේවදූතයන්ද අන්තර්ගතය.

මෙම පරිච්ඡේදයෙන්, සාතන් ලෙස හැඳින්වෙන ප්‍රබල බලයක් වූ ඔබගේ ආත්මික සතුරා හඳුන්වා දී ඇත. ඔබ, ඔහුගේ මුලාරම්භයත්, ඔහු කලින් සිටි තත්ත්වයත්, ඒ කලින් තත්ත්වයෙන් වැටුණු ආකාරයත් හා ඔහු වැටෙන අවස්ථාවේ ඔහු රැගෙන ගිය අය ගැනත් මෙහිදී ඉගෙන ගන්නෙහිය. එමෙන්ම ඔහුගේ ස්වභාවයේ උප ලක්ෂණත්, ඔහුගේ ක්‍රියාකාරී ක්ෂෙත්‍රයත්, ඔබ ඉගෙන ගන්නා අතර ඔහු උපක්‍රමගැන හැඳින්වීමක්ද ඔබට ලැබෙනු ඇත. ඉදිරි පරිච්ඡේද දෙකේදී යක්ෂයන්, මාංශය හා ලෝකය ඇසුරෙන් ඔබ මේ නපුරු ආත්මික බලවේග ගැන ඉගෙන ගන්නවා ඇත.

ස්වාභාවික ලෝකයේ සටන්වලදී හමුදා භටයෙක් යුදභූමියට ඇතුළුවීමට පෙර තම සතුරා හැඳිනගත යුතුය. ඔහු සතුරාත් ඔහුගේ ස්වභාවයත්. උපක්‍රමත් ගැන ඇති තොරතුරු හැකි පමණ අධ්‍යයනය කළ යුතුය. සතුරා පිළිබඳ බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීමට හමුදා බලවේග බොහෝ කාලයක් වැය කරන්නේ මේ නිසාය.

ආත්මික ලෝකයේද මෙය සත්‍යයකි. ඔබට සාර්ථකව සටන් කළ හැක්කේ ඔබගේ සතුරාව හැඳිනගෙන. ඔහුගේ ස්වභාවය අවබෝධ කරගෙන, ඔහුගේ උපක්‍රම හැඳිනගෙන සිටියහොත් පමණි. ඔබ උගත් ආකාරයට සතුරු බලවේගවලට මාංශයක් නොමැත. ඔවුහු නපුරු ආත්මික සේනාවෝ වෙති.

# සාතන්ගේ මූලාරම්භය

සාතන් මුලින්ම මවනු ලැබුවේ දෙවියන්වහන්සේ විසිනි.

> **උන්වහන්සේ කරණකොටගෙන සියල්ල සාදනලද්දේය, සාදන ලද කිසිවක් උන්වහන්සේ නැතුව සාදනු නොලද්දේය. (යොහාන් 1:3)**
>
> **මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා. ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය, සියලු දේ උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ. (කොලොස්සි 1:16)**

දෙවියන්වහන්සේ නපුර මවන්නේ නැත. සාතන්, දෙවියන්වහන්සේ විසින් මවනු ලැබූ අවස්ථා වේ යහපත්ව සිටියේය. එහෙත් යහපත හා නපුර තෝරා ගැනීමේ නිදහස් කැමැත්ත ඔහුට දුන් සේක.

> **නුඹ මවනු ලැබූ දා පටන් නුඹ තුළ අධර්මිෂ්ඨකම සම්බවෙන තුරු නුඹේ මාර්ගවල නුඹ සම්පූර්ණව සිටියෙහිය. (එසකියෙල් 28:15)**

# සාතන්ගේ පළමු තත්ත්වය

සාතන්ගේ පළමු තත්ත්වය බයිබලයේ එසකියෙල් 28:12-17 මගින් විස්තර කර ඇත. මෙම පාඩම ඉදිරියට ගෙන යෑමට පෙර එම කොටස ඔබ බයිබලයේ කියවන්න. සාතන් පළමුව මවනු ලැබූ විට ඔහු දෙවියන්වහන්සේගේ දූතයෙක්ව සිටියේය. ඔහු කෙරුබ් වර්ගයේ, ශුද්ධවන්ත, ප්‍රඥාවන්ත, රූප ශෝභාවෙන් හෙබි පරිපූර්ණ දේව දූතයෙකි. ඔහු කෙරුබ්වරුන්ගේ ප්‍රධානියා වූ අතර ඔහු හැඳින්වූයේ "ආරක්ෂක" නැතහොත් "වසා සිටින" කෙරුබ්වරයා ලෙසය. ඔහුගේ මුල් නම ලුසිෆර් වේ. එහි තේරුම "දීප්තිමත් පහන් තාරකාව" (යෙසායා 14:12) වේ. ඔහු රන්වල බහාලූ අගනා මැණික් වලින් සරසා සිටියේය (එසකියෙල් 28:13, නික්මයාම 28:15-11) ඔහුට දෙවියන්වහන්සේගේ ශුද්ධ කන්දේ තැනක් දී තිබූ අතර නමස්කාරය මෙහෙය වන්නා ලෙස පෙනෙන්නට ඇත. (එසකියෙල් 28:13)

සාතන්ගේ මුල් තත්ත්වය පිළිබඳ කෙතරම් අලංකාර පින්තූරයක් දේව වචනයේ දී තිබේද? ඔහු මැණිකක් හෙවත් පුෂ්පරාගයක් ලෙස හඳුන්වා ඇත. එහෙත් මැණික් ගලකට ස්වයං ආලෝකයක් නොමැත. එය අඳුරු කාමරයක අලංකාර නැත. එහි අලංකාරය ඇත්තේ පිටතින් එන ආලෝකය පරාවර්තනය කිරීමේ හැකියාව මතය.

දෙවියන්වහන්සේ ලුසිෆර් මවන ලද්දේ, මවන ලද වෙනත් කිසිම සත්ත්වයෙකුට කළ නොහැකි වන ලෙස දෙවියන්වහන්සේගේ මහිමය පරාවර්තනය කිරීමේ හැකියාව ඇතිවය. ලුසිෆර් විහිදුවන ලද ආලෝකය දෙවියන්වහන්සේගේ අලංකාරය විය.

# සාතන්ගේ වැටීම

සාතන් ඔහුගේ මහිමාන්විත තත්ත්වය රැක ගත්තේ නැත. ඔහුගේ කැරලි ගැසීම හා වැටීම බයිබලය විස්තර කරයි.

> **අලුයම් පුත්‍රය, නුඹ ස්වර්ගයෙන් වැටුණු හැටි ජාතීන් හෙළා දැමූවාවූ නුඹ බිමට සිඳ දමනු ලැබූ හැටි නුඹ සිත තුළ සිතාගෙන මම ස්වර්ගයට නැගී, මාගේ සිංහාසනය දෙවියන්වහන්සේගේ තාරකා වලට උඩින් තබා, උතුරේ ඉතා දුර සීමාවල තිබෙන රැස්වීමේ කන්ද පිට හිඳගන්නෙමි. මම වළාකුල් මුදුන් පසුකොට ඉහළ නගින්නෙමි. මහෝත්තමයාණන්ට සමාන වන්නෙමිය කියෙහිය. එහෙත් නුඹ පාතාලය නම් වළේ ගැඹුරටම බසිනවා ඇත. (යෙසායා 14:12-15)**
>
> **නුඹේ රූව නිසා නුඹේ සිත උඩඟු වී තිබේ, නුඹේ දීප්තිමත්කම නිසා නුඹේ ප්‍රඥාව නරක්කර ගත්තෙහිය (එසකියෙල් 28:17)**

සාතන්, තම දේවදූත තත්ත්වයෙන් වැටීමට හේතුව, වැරදි ආකල්ප පහක් මගින් පෙන්නුම් කෙරෙන අහංකාරය හා කැරලිකාර ස්වභාවය වේ. සාතන් මෙසේ පැවසිය :

මම ස්වර්ගයට නගින්නෙමි. ඔහුට අවශ්‍ය වූයේ දෙවියන්වහන්සේගේ වාසස්ථානය ස්වර්ගය අල්ලා ගැනීමටය. එමගින් දෙවියන්වහන්සේගේ තත්ත්වයම බලාපොරොත්තු විය.

මම මාගේ සිංහාසනය දෙවියන්වහන්සේගේ දේවදූතයන්ට (තාරකාවලට) වඩා උඩින් තබන්නෙමි. ඔහුගේ ආශාව වූයේ දෙවියන්වහන්සේගේ වාසස්ථානය අල්ලා ගැනීම පමණක් නොවේ. දේවදූත සේනාව කෙරෙහි ඇති උන්වහන්සේගේ පාලනයටද ගිජුවිය.

මම රැස්වීම් කන්ද පිට හිඳගන්නෙමි. යෙසායා 2:2 හා ගීතාවලිය 48:2 හි ඇති ආකාරයට මෙය දෙවියන්වහන්සේගේ භූමික පාලනයේ කේන්ද්‍රස්ථානය වේ. සාතන්ට අවශ්‍ය වූයේ පොළොව පමණක් නොව දේවදූතයන්ද පාලනය කිරීමටය.

මම වලාකුල් මුදුන් පසුකොට ඉහළ නගින්නෙමි. වලාකුලු දෙවියන්වහන්සේගේ මහිමය ප්‍රකාශ කරයි. සාතන්ටද මහිමය අවශ්‍ය විය. (වලාකුලු හා දෙවියන්වහන්සේ ගේ මහිමය අතර සම්බන්ධය පහත දැක්වෙන පදවල වාර්තා වී ඇත. නික්මයාම 13:21, 40:28-34, යෝබ් 37-15-16, මතෙව් 26:64, එළිදරව් 14:14-16)

එම මහොත්තමයාණන්ට සමාන වන්නෙමි: අප මෙම පාඨමාලාවේ තෙවැනි පරිච්ඡේදයෙන් උගත් පරිදි, දෙවියන්වහන්සේට නම් බොහෝමයක් ඇත. සාතන් මේ නම තෝරා ගත්තේ මන්ද ? ඔහු මේ නම තෝරා ගත්තේ එය දෙවියන්වහන්සේ "ස්වර්ගයේ හා පොළොවේ අයිතිකරු" ලෙස පෙන්වන බැවිනි.

## සාතන්ගේ පාපයේ ප්‍රතිඵල

සාතන්ගේ පාපයේ භයානක ප්‍රතිඵල මෙහි දැක්වේ.

### 1. ස්වර්ගයෙන් පිටුවහල් කිරීම

ඔහුගේ කැරලිකාරකම නිසා, දෙවියන්වහන්සේ සාතන්ව ස්වර්ගයෙන් පන්නා දැමූ සේක.

> **නුඹ කෙලහුණු දෙයක් මෙන් දෙවියන්වහන්සේගේ කන්දෙන් අහක් කර දැමුවෙමි... මම නුඹ පොළොවට හෙළා... (එසකියෙල් 28:16-17)**

### 2. චරිතය දූෂණය වීම

ලුසිෆර්, දෙවියන්වහන්සේගේ මහිමය පිණිස මවන ලද අතර, සාතන් බවට පත්වී දෙවියන්වහන්සේ කරන, කියන සියල්ලට විරුද්ධවන චරිතයක් ඇතිකර ගත්තේය.

### 3. බලය වැරදි අතට පෙරළීම

සාතන්ගේ බලය වරක් භාවිත කළේ දෙවියන්වහන්සේගේ මහිමය පිණිසය. දැන් එය භේද කෙරෙන හා විනාශ කෙරෙන පරමාර්ථයන් සඳහා යොදා ගනී. යෙසායා 14 පරිදි ඔහු ජාතීන් දුර්වල කරයි (12 පදය) පොළොව හා රජයන් සෙලවීමට සලස්වයි. (16 පදය) එමෙන්ම ඔහුගේ සිරකරුවන් වූ අයට නිදහසක් නැත (17 පදය)

### 4. ගිනි විලකට නියම කර ඇත

සාතන් නියම කර ඇත්තේ ගිනි විලකටය (යෙසායා 14:15)

### 5. දෙවියන්වහන්සේගේ අනෙකුත් දේවදූතයන්ට බලපෑමක් ඇති කළේය

සාතන් ස්වර්ගයෙන් වැටෙන විට ඔහු තනිවම වැටුණේ නැත, ඔහු දෙවියන්වහන්සේට එරෙහි ඔහුගේ කැරැල්ලට සහභාගි වූ ස්වර්ගීය දූත සේනාවේ කොටස රැගෙන ගියේය. මේ දූත පිරිස

දැන් නපුරු බලවේගය වූ යක්ෂයන් වේ. ඔවුන් පිළිබඳව ඔබ ඊළඟ පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නෙහිය.

## 6. විශ්වයට පාපය ඇතුළු වීම

සාතන් කැරලි ගැසූ විට පාපය විශ්වයට ඇතුළු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දෙවියන්වහන්සේට ගත හැකි වූ ක්‍රියා මාර්ග දෙකක් විය.

1. සාතන්ට පහර දී ඔහුව මරා දැමීමට උන්වහන්සේට කළ හැකි විය. එහෙත් දෙවියන්වහන්සේ මේ ආකාරයෙන් පළමු සතුරාට පහර දුන් සේක් නම් තවත් කැරැල්ලක් ඇති වීමට ඉඩ තිබිණි. ස්වර්ගයේ ඉතිහාසය මෙවැනි විනාශකාරී ක්‍රියාවලින් වැසී යන්නට හැකිය.

2. දෙවියන්වහන්සේට ගත හැකිව තිබූ අනෙක් ක්‍රියා මාර්ගය, බයිබලයේ අන්දමට උන්වහන්සේ ගත් ක්‍රියාමාර්ගය වේ. උසස් බලයක් සඳහා කෙරෙන සාතන්ගේ ඉල්ලීම, අප කාලය ලෙස හඳුන්වන සදාකාලය දක්වා සම්පූර්ණ පරීක්ෂාවකට පොළොවේදී භාජනය විය යුතුය.

දෙවියන්වහන්සේ පළමු පුරුෂයා හා ස්ත්‍රිය මැවූ විට, පොළොවේ පරීක්ෂාවන් ආරම්භ විය. සාතන් විසින් ආදම් හා ඒව පරීක්ෂා කරනු ලැබීම හා ඔවුන් පාපයට වැටීම පිළිබඳ කතාන්දරය ඔබට උත්පත්ති 3 පරිච්ඡේදයේ කියවිය හැකිය. ඔබ මෙම පාඨමාලාවේ පසුව, සාතන්ගේ උපක්‍රම විශ්ලේෂණය කිරීමේදී මේ පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනය කරනු ඇත.

මෙම සටන පොළොවේ දැනටමත් ක්‍රියාත්මකය. ආත්මික සටන යනු මෙයයි. සාතන් තවමත් බලය, තත්ත්වය හා නමස්කාරය සොයයි. එහෙත් ඔබ මෙම පාඨමාලාවෙන් පසුව ඉගෙන ගන්නා පරිදි ඔහු දැනටමත් පරාජය වූ සතුරෙකි. යේසුස්වහන්සේ උන්වහන්සේගේ මරණයෙන් හා උත්ථානවීමෙන් සාතන්ගේ බලය පරාජය කළ සේක. සාතන්ගේ අවසාන ඉරණම බයිබලයෙන් දැනටමත් එළිදරව් කර ඇත.

## සාතන් ඉන්නේ කොහේද?

සාතන්, ආත්මාකාරයෙන්, ලෝකයේ වෙසෙයි.

**එවිට ස්වාමීන්වහන්සේ නුඹ කොතැන සිට ආයෙහිදැයි සාතන්ගෙන් ඇසූසේක. සාතන් ස්වාමීන්වහන්සේට උත්තර දෙමින්: පොළොවෙහි ගමන් කොට ඔබ මොබ ඇවිද ආවෙමියි කීවේය (යෝබ් 1:7)**

**සිහි ඇතිව, අවදිව ඉඳිල්ලා, නුඹලාගේ විරුද්ධකාරයා වූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. (1 පේත්‍රුස් 5:8)**

සාතන් පොළොවේ වාසය කළද ඔහු සර්ව ව්‍යාප්ති නොවේ. ඉන් අදහස් වන්නේ දෙවියන්වහන්සේට මෙන් ඔහුට එකම වේලාවේ ලෝකයේ සෑම තැනම සිටිය නොහැකිය. ඔහු ඔහුගේ කාර්යයන් ඉටු කර ගැනීමට යක්ෂයන් සමූහයක් භාවිත කරන්නේ එබැවින්ය.

## සාතන්ගේ ක්‍රියාකාරකම්

දෙවියන්වහන්සේගේ අභිමුඛයට පැමිණීමට සාතන්ට හැකි අතර ඔහු පොළොවෙන් ඉහළ "අහසේත්" පොළොවේත් ක්‍රියා කරයි.

**තවද එක් දවසක දෙවියන්වහන්සේගේ පුත්‍රයන් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි පෙනී සිටින්ට ආ කල්හි සාතන්ද ඔවුන් අතරෙහි ආයේය. එවිට ස්වාමීන්වහන්සේ නුඹ කොතැන සිට ආයෙහිදැයි සාතන්ගෙන් ඇසූ සේක. සාතන් ස්වාමීන්වහන්සේට උත්තර දෙමින් පොළොවෙහි ගමන් කොට ඔබ මොබ ඇවිද ආවෙමියි කීවේය (යෝබ් 1:6-7)**

> **පෙර කාලයක් නුඹලා මේ ලෝකයේ ව්‍යවහාරය ලෙසත්, අකීකරුකමේ පුත්‍රයන් තුළ දැන් ක්‍රියාකරන්නාවූ ආත්මය වන ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියටත්, ඒවායෙහි හැසුරුණුහුය. (එපීස 2:2)**

සාතන්ගේ ක්‍රියාකාරකමේ අපට මෙසේ සාරාංශ කළ හැකිය. ඒවා සෑම වේලෙහිම දෙවියන්වහන්සේගේ සැලැස්මට හා උන්වහන්සේගේ සෙනගට එරෙහිව ක්‍රියා කරයි. ඔහු ඔබට පහර දෙන්නේ දේව නමස්කාරය, දේව වචනය, ඔබගේ කිතුනු ගමන හා ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් කරන සේවය ආදි ක්ෂේත්‍ර වලදීය. සාතන්ගේ සුවිශේෂී ක්‍රියාකාරකම් පිළිබඳව සවිස්තරාත්මකය ඔබ පසුව එන පාඩම් වලදී ඉගෙන ගනු ඇත.

## සාතන්ගේ උප ලක්ෂණය

ඔබ දැනටමත් උගත් පරිදි සාතන් ආත්මයෙකි. එහෙත් ඔහුට සැබෑ පෞරුෂත්වයක ලක්ෂණ ඇත. බයිබලය ඔහු ගැන මෙසේ උගන්වයි.

### ඥානවින්තය, සූක්ෂමය:

> **නුමුත් සර්පයා තමාගේ ප්‍රයෝගයෙන් ඒවා රැවටුවාක්මෙන් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි පවතින අවංකකමෙන්ද පිරිසිදුකමෙන්ද යම් විධියකින් නුඹලා වෙන්කොට නුඹලාගේ සිත් දූෂ්‍යකරනු ලබේදෝ කියා භයවෙමි. (2 කොරින්ති 11:3)**

### හැඟිම්බරය:

> **මහා සර්පයා ස්ත්‍රිය කෙරෙහි උදහස් වී.... (එළිදරව් 12:17)**

### ආත්ම අධිෂ්ඨානයෙන් යුක්තය:

> **ඔහුගේ මලපතෙන් මිදෙන පිණිසද දෙවියන්වහන්සේ ඔවුන්ට පසුතැවිල්ල දෙනසේක්දෝයි බලමින් මෘදුකමින් ඔවුන්ට තරවටුකරන්ට ඕනෑය. (2 තිමෝති 2:26)**

### බලවත්ය:

> **ආකාශයේ බලයේ අධිපතියා (එපීස 2:2)**

### ප්‍රයෝගකාරය:

> **යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන්වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගනිල්ලා (එපීස 6:11)**

### රෞද්‍රය, කෲරය:

> **සිහි ඇතිව, අවදිව ඉඳිල්ලා, නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. (1 පේත්‍රුස් 5:8)**

### රැවටිලිකාරය:

> **ඒක පුදුමයක් නොවේ, මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. (2 කොරින්ති 11:14)**

## සාතන්ගේ නම්

බයිබලය සාතන්ට බොහෝ නම් දෙයි. එමගින් ඔහුගේ ස්වභාවය හා ක්‍රියාකාරකමේ එළිදරව් වේ. ඔබ කලින් උගත් පරිදි, සාතන් මුලින් හැඳින්වූයේ “ආලේපලත් කෙරුබ්” හා “ලූසිෆර්” ලෙසය. ඒ ඔහුගේ කැරල්ලට පෙර වේ. සාතන්ගේ අනෙකුත් නම් මේසේය.

| | |
|---|---|
| අබද්දෝන් (විනාශ කරන දේවදූතයා යන්නට හෙබ්‍රෙව් වචනය) | එළිදරව් 9::11 |
| සහෝදරයන්ට වරද තබන්නා | එළිදරව් 12:10 |
| විරුද්ධකාරයා | 1 පේත්‍රුස් 5:8 |
| පාතාලයේ දූතයා | එළිදරව් 9:11 |
| ආලෝකයේ දූතයා | 2 කොරින්ති 11:4 |
| අපොල්ලියොන් (විනාශකයා යන්නෙහි ග්‍රීක වචනය) | එළිදරව් 9:11 |
| බෙල්සෙබුබ් | මතෙව් 12:24, ලූක් 11:15, මාක් 3:22 |
| බෙලියෙල් | 2 කොරින්ති 6:15 |
| රවටන්නා | එළිදරව් 12:9, 20:3 |
| විනාශකරන්නා | එළිදරව් 9:11, 1 කොරින්ති 10:10 |
| යක්ෂයා | 1 පේත්‍රුස් 5:8, මතෙව් 4:1 |
| මහත් රතු සර්පයා | එළිදරව් 12:3 |
| සතුරා | මතෙව් 13:39 |
| නපුරා | 1 යොහාන් 5:19 |
| මේ ලෝකයේ දෙවියා | 2 කොරින්ති 4:4 |
| තිර්හි රජු | එසකියෙල් 28:12-15 |
| බොරුකාරයෙක්, බොරුවේ පියා | යොහාන් 8:44 |
| මිනිමරන්නෙක් | යොහාන් 8:44 |
| යක්ෂයාගේ (කුමාරයා) අධිපතියා | මතෙව් 12:24 |
| ලෝකයේ (කුමාරයා) අධිපතියා | යොහාන් 12:31, 14:30, 16:11 |
| ආකාශයේ බලයේ අධිපතියා | එපිස 2:2 |
| සාතන් (පීඩාකරන්නා) | යොහාන් 13:27 |
| සර්පයා | එළි12:9 2 කොරි 1:3 |
| පරීක්ෂකයා | මතෙව් 4:3, 1 තෙස 3:5 |
| ගොරවන සිංහයා | 1 පේත්‍රුස් 5:8 |
| අන්ධකාරයේ පාලකයා | එපිස 6:12 |
| අකීකරුකමේ දරුවන් තුළ වැඩ කරන ආත්මය | එපිස 2:2 |

ඔබට සාතන්ගේ බලය ඔහුට දී ඇති නම්වලින් හඳුනාගත හැකිය. ඔහු රැවටිලිකාර, බලවන්ත සතුරෙකු නිසා බයිබලය අනතුරු අඟවයි.

**සිහි ඇතිව, අවදිව ඉඳිල්ලා, නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. (1 පේත්‍රුස් 5:8)**

**යක්ෂයාට ඉඩ නොදෙල්ලා (එපිස 4:27)**

## සාතන් මෙවැනි කෙනෙක් නොවේ ...

දෙවියන්වහන්සේ මෙන් සාතන් සර්වඥ (සියල්ල දත්) නොවේ. සාතන්ට අනාගතය දැනගත හැකිව තිබුණේ නම්, යේසුස්වහන්සේට කුරුසියේ මැරෙන්නට ඔහු කෙසේවත් ඉඩ නොදෙනු ඇත. හේතුව යේසුස්වහන්සේගේ මරණය නිසා සාතන්ගේ බලය නෙරපා හරින බවත් සියලු මනුෂ්‍ය වර්ගයාට මරණයේ බන්ධනයෙන් නිදහස් වීමට මාර්ගයක් සැපයෙන බවත් ඔහු දැනගනු ඇත.

සාතන් සර්ව බලධාරී (සියලු බලය ඇති) නැත. සාතන්ගේ බලයට වඩා ඔබ තුළ ඇති බලය අධික බව යේසුස්වහන්සේ පැවසූ සේක. යේසුස්වහන්සේ අදහන්නන්ට සාතන් දැනුදු පරාජය වූ සතුරෙකි (යොහන් 12:31). ඔහු බලවත් වන්නේ ඔහුට ඉඩදෙන්නන්ට පමණි. දෙවියන්වහන්සේගේ බලය මගින් ඔහුගේ බලය සීමාවී තිබේ (යෝබ් 1:10-12). ඔහුට ඇදහිලිවන්තයෙකු පරාජය කළ හැක්කේ ඔවුන් ඔහුට තමාව පාලනය කිරීමට ඉඩ දුනහොත් පමණි.

සාතන් සර්වව්‍යාප්ත (සෑම තැනම සිටින) නොමැති බැවින් ඔහු යක්ෂයන් සමූහයක් ඔහුගේ පරමාර්ථයන් ඉටුකරගැනීම සඳහා ලෝකය මුළුල්ලේ යවා ඇත. ඔබ මේ පිළිබඳව තවදුරටත් ඊළඟ පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නෙහිය.

## පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ප්‍රධාන පදය ලියන්න.

2. සාතන් ඇතිවුයේ කෙසේද?

3. ඔහුගේ මුල් තත්ත්වය කුමක්ද ?

4. සාතන්ගේ වැටීමට හේතුව කුමක්ද ?

5. සාතන්ගේ පාපයේ ප්‍රතිඵල මොනවාද ?

6. සාතන්ගේ ක්‍රියාකාරී භූමිය කොතැනකද ?

7. සාතන්ගේ සාමාන්‍ය ක්‍රියාකාරකම් මොනවාද ?

8. මෙම පරිච්ඡේදයෙන් ඔබට මතකයට නැගිය හැකි සාතන්ගේ උප ලක්ෂණ හැකි පමණ ලියන්න

(මෙම පරීක්‍ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. බයිබලිය වාර්තා වල සඳහන් සාතන්ගේ වචන අධ්‍යයනය කරන්න. ඔහුගේ වචන ඔහුගේ උපක්‍රමවලට හැඳින්වීමක් ලෙස තවදුරටත් ක්‍රියාකරයි. උත්. 3:1,4,5, යෝබ් 1:7-12, යෝබ් 2:1-6, මතෙව් 4:1-11, ලූක් 4:-13

2. සාතන්, ශුද්ධාත්මයාණන්වහන්සේට ප්‍රතිවිරුද්ධ තැනැත්තා වේ. ආත්මයාණන්වහන්සේ එවන ලද්දේ දෙවියන්වහන්සේ වන අතර ඒ මිනිසුන් තමන්වහන්සේ වෙතට ඇද ගැනීමටය. දෙවියන්වහන්සේ වෙතින් මිනිසුන් ඈත් කිරීමට සාතන් කැපව සිටී.

| **ශුද්ධාත්මයාණන්වහන්සේ** | **සාතන්** | **යොමුව** |
|---|---|---|
| සත්‍යයේ ආත්මය | වරදෙහි ආත්මය | 1 යොහාන් 4:6 |
| සත්‍යය වේ | අසත්‍යය වේ | යොහාන් 14:7, 8:44 |
| ජීවනය දෙන්නෙකි | මිනීමරන්නෙකි | 1කොරි. 15:45, යොහන් 8:44 |
| ශුද්ධය | නපුරුය | රෝම 1:4, මතෙව් 6:13 |
| පරවියෙකු මෙනි | සර්පයෙකු මෙනි | මතෙව් 3:16, එළි12:9 |
| උපකාර කරන්නා | විරුද්ද වන්නා | රෝම 8:26, 1 පේත්‍රුස් 5:8 |
| කියමන් දෙන සේක | මිනිසුන් ගොළු කරයි | ක්‍රියා 2:4, මාක් 9:17 |
| මැදිහත් කාරයා | අපවාද කරන්නා | යොහාන් 14:16, යෝබ් 1:9-11 |
| සාතන්ට වඩා ප්‍රබලය | සන්නද්ධ ශක්තිමත් මිනිසෙකි | ලූක් 11:-21-22 |

3. **යේසුස් වහන්සේ පැවසුවේ සාතන් ...**

| | |
|---|---|
| සතුරෙක් බවය | මතෙව් 13:39 |
| නපුරා බවය | මතෙව් 13:38 |
| මේ ලෝකයේ අධිපතියා බවය | යොහාන් 12:31, 14:30 |
| බොරුකාරයෙකි, බොරුවේ පියාය | යොහාන් 8:44 |
| මිනීමරුවෙකි | යොහාන් 8:44 |
| අහසින් වැටුනේය | ලූක් 10:18 |
| රාජ්‍යයක් තිබේ | මතෙව් 12:26 |
| තිරිඟු අතර කිරිඳි වපුරයි | මතෙව් 13:38-39 |
| සවන්දෙන්නන්ගෙන් වචනය පැහැරගනී | මතෙව් 13:19, මාක් 4:15, ලූක් 8:12 |
| ස්ත්‍රියක අවුරුදු 18ක් බැඳ තැබීය | ලූක් 13:36 |
| පේත්‍රුස්ව ලබාගැනීමට ආසාවිය | ලූක් 22:31 |
| දේවදූතයන් ඇත. | මතෙව් 25:41 |
| සදාතන ගින්නට සූදානම්ය | මතෙව් 25:41 |

4. සාතන් පිළිබඳ මෙම පාඩම අධ්‍යයනය කරන විට සතුරා ඔබ ජීවිතයේ කුමන ක්ෂේත්‍ර වල ක්‍රියාකාරීව සිටියේදැයි හැඳිනගත්තේහිද? ඔහු ඔබ රවටා තිබේද? ඔබට බොරු කියා තිබේද? ඔහු ඉතා සූක්ෂමව ඔබ ජීවිතය තුළට රිංගා ඔබගේ ප්‍රීතිය, සාමය, හෝ කිතුනු සාක්ෂිය නැති කර ඇත්ද? මේවා නිර්ණය කිරීම ඉතා වැදගත්ය, මක්නිසාද ඔබගේ ජීවිතයේ සාතන් ක්‍රියාකාරීවන ක්ෂේත්‍ර, ඔබ මෙම පාඩමෙන් උගත් උපක්‍රම ව්‍යවහාර කෙරෙන සටන් භූමි වන බැවිනි.

5. සාතන්ව ස්වභාවික ලෝකයේ සර්පයෙකු හා සංසන්දනය කර ඇත. පහත දැක්වෙන ස්වාභාවික සිද්ධාන්තවල ආත්මික යෙදීම් ගැන සලකා බලන්න.

විෂකුරු සර්පයෙකුගේ විෂ වර්ග තුනකි.

ස්නායු හා සම්බන්ධ : මේවායින් ස්නායුවලට බලපෑමක් ඇතිවේ.

රුධිර හා සම්බන්ධ : මේවායින් රුධිරයට බලපෑමක් ඇතිවේ.
හෘදය හා සම්බන්ධ : මේවායින් හෘදයට බලපෑමක් ඇතිවේ.

මේ අයුරින්ම සාතන්ද ඔබගේ ස්නායුවලට, (ධෛර්යයට) හා හදවතට (දෙවියන්වහන්සේගේ සේවයට හා ඔබගේ නමස්කාරයට පහර දීමට) බලපෑම් ඇති කරමින් යේසුස්වහන්සේගේ රුධිරය ඔබ තුළ කෙරෙන ක්‍රියාවන් (ගැළවීම, සුවකිරීම, මුදාගැනීම) වළකාලීමට උත්සාහ කරයි.

## සර්පයන් උන්ව ආරක්‍ෂා කරගන්නේ :

- වෙස්මාරු කරගෙනය : ඇතැම් සර්පයන් උන් සිටින ගස් හෝ බිම හෝ මෙන්ම බැවින් උන් දැක ගැනීමට අපහසුය.
- අනුකරණය කරයි : ඇතැම් සර්පයන් ආරක්‍ෂා වෙන්නේ අනුකරනය මගිනි. එක් උදාහරණයක් නම් ගස්වල සිටින අප්‍රිකානු පොළඟෙක් "අවල වී" උගේ බෙල්ල අතු කැබැල්ලක් මෙන් දිස්වෙන සේ ගසේ දික්කරගෙන සිටී.
- ප්‍රමාණයෙන් විශාල වේ, "පත් ආඩර්" නමැති සර්පයා හැකි තරම් පිම්බීමෙන් තමාව ආරක්ෂා කර ගනි.
- බිය ගෙන දෙන ශබ්ද : ඇතැම් සර්පයන් පිඹියි නැතහොත් "සටපට" යන ශබ්දයක් ඇති කරයි. එමගින් ඔබව බිය ගන්වයි. ඔබගේ ආත්මික සතුරාද "ආලෝකයේ දූතයෙකු" මෙන් වෙස්වලාගෙන පැමිණ දෙවියන්වහන්සේගේ දේ අනුකරණය කරයි. එමෙන්ම විශාල වී ඔබ බිය කිරීමට උත්සාහ කරයි.

### සර්පයන් ගොදුරු අල්ලා ගන්නා ක්‍රම සතරකි.

- පහරදීම : එක්වරම පහරදෙයි.
- හිර කිරීම : සර්පයා තම ගොදුර වෙළාගෙන හිර කිරීම මගින් ඌ මරා දමයි.
- ගොදුර මරා දැමීමට ඌ මත බර පැටවේ.
- සපා කන අතර විෂ දළ මගින් ගොදුරට විෂ යවා ක්‍රමයෙන් ගොදුර අඩපණ කරයි. ඇතැම් විට සටන් කිරීමේදී දත් කැඩී යැමට ඉඩ තිබේ. එහෙත් ඒ දත් නිරන්තරයෙන්ම වැඩේ. සර්පයාගේ භයානකම කොටස උගේ මුඛයයි. ගොදුර අඩපණ කිරීමට ඌ විෂ විදිනු ලබයි. ඉන්පසු ගොදුර ගිල දමයි.

සාතන් පහරදීමට භාවිත කරන ක්‍රම මේවාට බොහෝ දුරට සමාන බව ඔබට පෙනේද ? ඇතැම් විට ඔහු සූක්ෂමව හා මාරාන්තිකව පහර දෙයි. තව සමහර විටෙක ලෞකික දේ වලින්ද පාපි ක්‍රියාවලට බරෙන්ද පැටලිලිවලින්ද ඔබගේ ආත්මික ජීවිතය මිරිකා දමයි. ඔහු සෑම විටම ඔබට බිය කිරීමට ක්‍රියා කරයි. ඔහුගේ මාරාන්තික විෂවලින් ඔබව අඩපන කර ඔබව බැඳ තැබීමට ඔහුට අවශ්‍යය.

සර්පයින් තම ගොදුර සිටින තැන සොයාගන්නේ උගේ දිවට දූවිලි ටිකක් ගැනීමෙනි. එමගින් උගේ මොලයට තොරතුරු ලැබේ. ඔබ නිශ්චලව සිටියහොත් සර්පයෙකුට ඔබ සොයාගත නොහැකිය. සාතන් ඔබව සොයාගන්නේ ඔබ බියෙන් කලබල වී දුවමින් දූවිලි අවුස්සන විට වේ. දූවිලි තැන්පත් වී ඔබ නොබියව ඔහුට විරුද්ධව සිටින විට සර්පයාට මෙන් ඔහුටද ඔබට පහරදිය නොහැකිය. "නිශ්චලව සිටින්න", "සිටගෙන සිටින්න" යයි බයිබලයේ සඳහන් වන්නේ එබැවිනි.

හදිසි බියට පත්වූ අවස්ථාවල සර්පයෙක් එක් වරම විෂ දමා ඉන්පසු නැවත විෂ නිපදවන තෙක් ආරක්ෂාවක් නොමැතිව බලා සිටී. පාළුකරයේදී උන්වහන්සේව පරීක්ෂා කරන විට සිදුවන්නට ඇත්තේද මෙය විය හැකිය. සාතන්ගේ පහරදීමට එරෙහිව යේසුස්වහන්සේ දේව වචනය භාවිතා කරන විට සාතන්ට "උන්වහන්සේ අත්හැර යෑමට" සිදු වූයේ ඒ නිසා විය හැකිය.

සාමාන්‍ය ජීවිතයේදී සර්පයන්ගේ සපා කෑම් වලින් වැළකීමට ක්‍රම කීපයක් පහත දැක්වේ. ආත්මික ක්ෂේත්‍රයටද මේවා ආදාළ බැව් මතක තබා ගන්න.

1. විෂකුරු සර්පයින් හඳුනා ගන්න (ඔබගේ සතුරා)

2. ආරක්ෂක ඇඳුම් ඇඳගන්න (ඔබගේ ආත්මික ආරක්ෂක ඇඳුම්)

3. සර්පයන් සිටින භූමිය මග හරින්න (පරීක්ෂාවන් හෝ සාතන්ගේ ක්‍රියාවන් හෝ ඇති තැන්වලට නොයන්න)

4. මිතුරෙකු සමග සිටින්න (ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ කොටසක් වීමේ වැදගත්කම් මින් පැහැදිලි වේ.

5. අඳුර වැටීමෙන් පසු හෝ අඳුරු ස්ථානවල හෝ ඇවිදීමෙන් වළකින්න. සෘජු ඉර එළියට සර්පයින් කැමති නැත (ඇදහිලිවතුන් ලෙස අප ඇවිදින්නේ අඳුරේ දරුවන් ලෙස නොව ආලෝකයේ දරුවන් ලෙසය)

6. ඔබ දැකිය නොහැකි තැන්වලට අත් හෝ පා හෝ නොදමන්න (ඔබගේ මාංශික ඉන්ද්‍රයන් පරෙස්සම් කරගන්න)

7. වටපිටාව දෙස පරෙස්සමෙන් නොබලා වාඩි නොවන්න (චලනය වන ඉලක්ක වලට වඩා අචල ඉලක්කවලට පහරදීම පහසුය)

8. සර්පයන් මරන්න නොයන්න. සර්පයන් ගැන හෝ උන්ගේ වාසස්ථාන ගැන හෝ නොදැන සර්පයන් මැරීමට යෑමෙන් මිනිසුන් දහස් ගණනක් සෑම වසරකම මිය යයි. (අප යක්ෂයාට එරෙහිව යා යුත්තේ ඔහු මුණ ගැසුනු විට වේ. අප යක්ෂයින් සිටින තැන් සොයමින් නොයා යුතුය)

9. සර්පයෙක් සපා කෑ විට කළ යුතු දේ දැනගන්න (ආරක්ෂක සටන්ක්‍රම)

සර්පයෙක් දෂ්ඨ කළවිට පළමුවෙන්ම කරනු ලබන්නේ, දළ ලකුණු ඇති සෑම තැනකම **කුරුසියේ** ;- හැඩයට කැපුමක් කපා විෂ උරා දැමීමය. යේසුස්වහන්සේ විසින් කල්වරියේ කුරුසිය මගින් අපව පාපයේ විෂ වලින් නිදහස් කිරීමේ කාර්යයේ කදිම උදාහරණයකි.

අපට සර්පයන්ට එරෙහිව අධිකාරි බලය ඇත. උත්පත්ති 3 හි දෙවියන්වහන්සේ සර්පයාට (සාතන්) සාප කළසේක. උන්වහන්සේ පැවසුවේ උගේ හිස ස්ත්‍රියගේ බීජය (යේසුස් වහන්සේ) විසින් පාගා දමනු ලබන බවත් බීජයේ (යේසුස් වහන්සේගේ) විලුඹ සර්පයා විසින් දෂ්ඨ කරනු ලබන බවත්ය.

යේසුස්වහන්සේගේ "විලුඹ" "දෂ්ඨකිරීම" මගින් පෙන්නුම් කෙරෙන්නේ සාතන්ගේ හිස කල්වරියේ කුරුසිය මගින් තැලීමේ ප්‍රතිඵලයේ පීඩනය වේ. යේසුස්වහන්සේ විසින් සාතන්ගේ හිස තැලීම, සාමාන්‍ය ලෝකයේ විෂකුරු සර්පයෙකුගේ හිස වෙන් කිරීමට සමානය. සර්පයෙකුගේ හිස ශරීරයෙන් වෙන් කළද, ඉන්පසුව පැය ගණනාවක් ඌට දෂ්ඨ කළ හැකිය. උගේ හද ගැස්ම තව දින දෙකක් පමණ පවතින අතර ඌට ඔබ මොබ යෑමට වුවද හැකිය.

යේසුස්වහන්සේ කල්වාරියේදී "සර්පයාගේ" හිස ශරීරයෙන් වෙන් කළද, සර්පයාට තවමත් පණ තිබේ. ඔහු තවමත් ලෝකයේ ක්‍රියාකාරීව සිටින අතර තවමත් බලවත්ය. එහෙත් සාතන්ට අධිකාරී බලයක් නැත. ඔහුට ඔබ ජීවිතය කෙරෙහි ඇති එකම අධිකාරී බලය ඔබ දෙනු ලබන්න වේ. ඔබ තුළ (යේසුස් වහන්සේ) බලය හා අධිකාරී බලය ඔහුගේ බලයට වඩා වැඩිය.

# හයවන පරිච්ඡේදය

## යක්ෂයන් : ආත්මික නපුරු බලවේග

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- යක්ෂයන්ගේ මුලාරම්භය මතකයට ගෙන ඒමට
- ඔවුන්ගේ මුල් තත්ත්වය පැහැදිලි කිරීමට
- ඔවුන්ගේ ක්‍රියාකාරී භූමිය හැඳිනගැනීමට
- යක්ෂයන්ගේ උප ලක්ෂණ හැඳිනගැනීමට
- යක්ෂ බලවේග සංවිධානය කර ඇති ආකාරය පැහැදිලි කිරීමට
- යක්ෂයන්ගේ ක්‍රියාකාරකම් සාරාංශගත කිරීමට
- හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපි වලින් ලබා ගත් ප්‍රධාන පදය

> **එහෙත් පසු කාලවලදී සමහරු මුළා කරවන ආත්මයන්ද යක්ෂයන්ගේ ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලි ලෙස කියන සේක. (1 තිමෝති 4:1)**

## හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙන් ඔබ සාතන් පිළිබඳව උගත්තෙහිය. මෙම පරිච්ඡේදෙයෙන් ඔබ ඉගෙන ගනු ලබන්නේ යක්ෂයන් ලෙස හැඳින්වෙන, සාතන්ගේ අණ යටතේ සිටින "සේනාවක්" පිළිබඳවය. සමහරු යක්ෂයන් පිළිබඳ විෂය සම්පූර්ණයෙන්ම අත්හරිති. අනෙක් අය ඒ පිළිබඳව අනිවාර්ය උනන්දුවක් දක්වති. අද ලෝකයේ පවතින යක්ෂාත්ම බලය අඩු තක්සේරු නොකළ යුතුය. එසේ වුවද සෑම තැනකම, සෑම වැඩකම යක්ෂයන් දකින පරිදි ඔබගේ සිත යොමු නොකළ යුතුය. යක්ෂයන් පිළිබඳව ඔබ තිබිය යුත්තේ සරල වචානාර්ථ බයිබලීය එලඹුමකි. මෙතරම් බලවත් නපුරු බලවේග ගැන ලෞකික පොත පත මගින් අධ්‍යයනය නොකරන්න. මෙම ක්ෂේත්‍රය පිළිබඳව ඔබේ එකම අධ්‍යයනය විය යුත්තේ දේව වචනය හා පිළිගත හැකි කිතුනු සාහිත්‍යය වේ.

## යක්ෂයන්ගේ මුලාරම්භය

දෙවියන්වහන්සේ මුලින්ම සියලුම දේව දූතයන් මැවූ අතර, පසුව ඉන් සමහර දෙනෙකු යක්ෂයන් බවට පත්වූහ.

> **උන්වහන්සේ කරණකොටගෙන සියල්ල සාදන ලද්දේය. සාදනලද කිසිවක් උන්වහන්සේ නැතුව සාදනු නොලද්දේය. (යොහන් 1:3)**

> **මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහි ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන් වහන්සේ තුළ මවන ලද්දේය, සියලු දේ උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ. (කොලොස්සි 1:16)**

# මුලින් තැබූ තත්ත්වය හා වැටීම

මුල් කාලයේ යක්ෂයෝ, දෙවියන්වහන්සේගේ අනෙකුත් දේවදූතයන් මෙන්ම, මෙම පාඨමාලාවේ හතරවන පරිච්ඡේදයෙන් විස්තර කරන ලද යහපත් දේවදූතයන්ගේ ලක්ෂණ හා තත්ත්වය ඇතිව සිටියහ. සාතන් දෙවියන්වහන්සේට එරෙහිව කැරලි ගසන අවස්ථාවේ, දේවදූතයන්ගෙන් කොටසක් එම කැරැල්ලට සහභාගි වූහ. දෙවියන්වහන්සේ ඔවුන්ව, සාතන් සමග ස්වර්ගයෙන් පලවා හැරිය සේක. ඔවුහු තවදුරටත් යහපත් පුද්ගලයන් (දේවදූතයෝ) නුවූහ. ඔවුහු නපුරු ආත්මික පුද්ගලයන් (යක්ෂයෝ) බවට පත්වූහ.

> **තවද ස්වර්ගයෙහි යුද්ධයක් විය. ඒ වනාහි මිකායෙල් සහ ඔහුගේ දූතයන් මහා සර්පයාට විරුද්ධව යුද්ධයට යාමය. මහ සර්පයාද තමාගේ දූතයෝද සටන් කොට, ජය නොලැබුවෝය, ඔවුන්ට ස්වර්ගයෙහි ස්ථානයක් තවත් නොවිය. මුළු ලෝකයා රවටන්නා වන යක්ෂයාය, සාතන් යයි කියන ලද මහා සර්පයා නමැති ඒ පුරාණ සර්පයා පහතට හෙළනු ලැබුවේය, ඔහු පොළොවට හෙළනු ලැබුවේය, ඔහුගේ දූතයෝද ඔහු සමග හෙළනු ලැබුවෝය. (එළිදරව් 12:7-9)**

යක්ෂයින් "වැටුණු" දේවදූතයන් නොවේ නම් ඔවුන් පැවැත්ම විස්තර කෙරෙන වෙනත් බයිබලිය පැහැදිලි කිරීමක් නැත. සියල්ල දෙවියන්වහන්සේ විසින් මවන ලද බැවින්, සාතන්ට තම බල සේනාවක් මැවිය නොහැකිය. මෙම වැටුණු දේවදූතයන්ගේ කණ්ඩායම් දෙකක් තිබේ. එක් කණ්ඩායමක් දෙවියන්වහන්සේට හා පොළොවේ සිටින උන්වහන්සේගේ සෙනඟට එරෙහිව ක්‍රියා කරති. අනෙක් කණ්ඩායම දම්වැල්වලින් බැඳ තිබේ.

> **මක්නිසාද දේවදූතයන් පව්කළ විට දෙවියන්වහන්සේ ඔවුන්ට දඬුවම් නොකර නැර, විනිශ්චය පිණිස ඉතිරිකොට තැබීමට නිරයෙහි හෙළා අන්ධකාරයේ ගුහාවලට භාරදුන්සේක් නම්, (2 පේතෘස් 2:4)**

> **තමුන්ගේම අධිපතිකමෙහි නොපැවත ස්වකීය වාසස්ථානය අත්හැරියාවූ දේවදූතයන්ද උන්වහන්සේ මහත් දවසේ විනිශ්චය පිණිස අන්ධකාරය යට සදාකාල බැඳුම්වලින් බැඳ තැබූසේක. (යුද් 6)**

සීමාවන්ට භාජනය වූ යක්ෂයෝ හා ක්‍රියාකාරී යක්ෂයෝ සිටිති. මෙම කණ්ඩායම් දෙකෙහිම නායකයා සාතන් වන අතර, ඔහු යක්ෂයන්ගේ "අධිපතියා" (මතෙ. 12:24) ලෙස හැඳින්වේ. යක්ෂයාට හා ඔහුගේ දූතයන්ට නිරය සූදානම්ව ඇත.

> **එවිට උන්වහන්සේ වම් පැත්තේ සිටින්නන්ට කියන සේක්: ශාපලත්තෙනි, මා කෙරෙන් පහව යක්ෂයාටත් ඔහුගේ දූතයන්ටත් සූදානම් කර තිබෙන සදාකාල ගින්නට පලයල්ලා. (මතෙව් 25:41)**

යේසුස් වහන්සේට යක්ෂාවේශ වූ මිනිසුන් දෙදෙනෙකු මුණ ගැසුනු විට ඔවුන්ගේ ප්‍රතිචාරය වූයේ :

> **බලව, ඔවුහු මොරගසමින් : දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෙනි, ඔබට අපෙන් කම මොකද? කාලයට ප්‍රථමයෙන් අපට වදදෙන්ට ඔබ මෙහි ආ සේක්දැයි කීවෝය. (මතෙව් 8:29)**

මිනිසුන්ට වැසී සිටි යක්ෂයෝ. ඔවුන්ගේ අවසාන ඉරණම සදාතන නිරයේ බව දැන සිටියහ. නිරය වධ හිංසා සහිත ස්ථානයක් හා එය සාතන්ටත් ඔහුගේ දූතයින්ටත් සූදානම් කර ඇති ස්ථානයක් නිසා, යක්ෂයන් වැටුණු දේවදූතයන් විය යුතුය.

# ඔවුන්ගේ ක්‍රියාකාරී භූමිය

යක්ෂයින් පොළොවේ ක්‍රියාකාරීව සිටින බව බයිබලය පුරාම පෙන්වයි. සාතන් සර්ව ව්‍යාප්ති (සෑම තැනම වසන) නොමැති නිසා මුළු ලොව පුරා ඔහුගේ කැමැත්ත හා පරමාර්ථයන් ඉටු කිරීමට යක්ෂයන් භාවිතා කරයි. ඔවුහු "ආකාශයේ බලයෙන්" (එපීස 2:2) හා "අඳුරේ බලයෙන්" (කොලො. 1:13) සමන්විත වන අතර සාතන්ගේ පාලනය යටතේ සිටිති.

## යක්ෂයන්ගේ උප ලක්ෂණ

යක්ෂයන්ට, ඔවුන්ගේ මුල් පාප රහිත තත්ත්වයේදී තිබුණේ, කලින් අධ්‍යයනය කළ යහපත් දේවදූතයන්ට තැබූ උප ලක්ෂණම වේ. වර්තමාන නපුරු තත්ත්වයන් යටතේ යක්ෂයන්ට:

| | |
|---|---|
| ආත්මයෝ වෙති | මතෙ. 8:16, ලූක් 10:17, 20 |
| දෘශ්‍යමාන විය හැකිය | උත් 3:1, සෙක. 3:1, මතෙ. 4:9-10 |
| කතා කළ හැකිය | මාක් 5:9,12, ලූක් 8:28, මතෙ. 8:31 |
| විශ්වාස කරති | යාකොබ් 2:19 |
| ඔවුන්ගේ කැමැත්ත කරති | ලූක් 11:24, 8:32 |
| ඥානවන්ත බව පෙන්වති | මාක් 1:24 |
| හැඟීම් සහිත වෙති | ලූක් 8:28, යාකොබ් 2:19 |
| අඳුනති | ක්‍රියා 19:15 |
| අධිස්වාභාවික ශක්තියක් ඇත | ක්‍රියා 19:16, මාක් 5:3 |
| අධිස්වාභාවික අභිමුඛයක් ඇත | දානියෙල් 9:21-23 |
| සදාතනිකය | මතෙව් 25:41 |
| ඔවුන්ගේම ධර්මයක් ඇත | 1 තිමෝති 4:1-3 |
| නපුරු අය වෙති | මතෙ. 10:1, මාක් 1:27, 3:11 |

## යක්ෂයින්ගේ නම්

යක්ෂයින් නපුරු ආත්ම ලෙස සය වරකුත්, අපවිත්‍ර ආත්ම ලෙස 23 වරකුත් නව ගිවිසුමේ හඳුන්වා ඇත. ඔවුන් යක්ෂයන් (මාක් 1:32) ලෙසත් යක්ෂයන්ගේ දූතයන් (මතෙ. 25:41) ලෙසත් හඳුන්වා ඇත.

## යක්ෂ බලවේගවල සංවිධානය

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දේවදූත සේනාව සංවිධානය කළ ආකාරය අපි නැවත විමසා බලමු.

> **මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහි ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන් වහන්සේ තුළ මවන ලද්දේය, සියලු දේ උන්වහන්සේ කරණ කොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ. (කොලොස්සි 1:16)**

සාතන් අනුකාරකයෙකු මිස නිර්මාණාත්මක කෙනෙක් නොවේ. ඔහු, ඔහුගේ යක්ෂයන් සංවිධානය කර ඇත්තේ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ හමුදාව සංවිධානය කර ඇති ව්‍යුහයෙන්ම වේ.

> **මක්නිසාද අපේ පොරබැදීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනින්ටත් ස්වර්ගීය ස්ථාන වල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

සාතන් ඔහුගේ හමුදාව සංවිධානය කර ඇත්තේ :

**අධිපතිකම්වලටය (රාජ්‍යයන්) :** සාතන්, ලෝකය අධිපතිකම්වලට බෙදා ඇති බව පෙනේ. අධිපතිකමක් යනු අධිපතියෙකුගේ බලය පවත්වන ක්ෂෙත්‍රය වේ. සෑම අධිපතිකමකටම, අධිපතියෙකු සාතන් පත් කර ඇත. දානියෙල් 10හි පර්සියා රාජ්‍යයේ අධිපතියා ගැන සඳහන් වේ. සාතන් ජාතික මට්ටමෙන් ක්‍රියා කරන්නේ මේ ආකාරයෙන් රාජ්‍යයන්ට හා ජාතීන්ට බලපෑම් කරමිනි.

**මෙලොව අඳුරේ බලයන් හා පාලකයන් (පරාක්‍රමධාරීන් හා අන්ධකාරයේ ලෝක මූලාදෑනීන්) :** මොලොව සමාජීය, දේශපාලනික හා සංස්කෘතික පද්ධතිවල මෙම වර්ග දෙකේ යක්ෂයෝ ක්‍රියා කරති. මේවා හා අධිපතිකම් පාලනය කරන ආත්ම පිළිබඳව කටයුතු කරන ආකාරය, 14 පරි. ලෝකය ජයගැනීම සඳහා වූ ආත්මික උපක්‍රම අධ්‍යයනයේදී ඔබ ඉගෙනගන්නෙහිය.

**උස් තැන්වල පවතින ආත්මික දුෂ්ටකම් (ස්වර්ගිය ස්ථානවල දුෂ්ට කමේ ආත්ම :** නමස්කාර පැවැත්වූයේ පැරණි ගිවිසුමේ සඳහන් උස් ස්ථානවලය. ලෝකයේ ආගමික ව්‍යුහ තුළ සාතන් ක්‍රියා කරන්නේ මේ ආකාරයෙනි. 20 වන පරිච්ඡේදයේදී. උස් තැන්වල කෙරෙන ආත්මික දුෂ්ටකම් ගැන අධ්‍යයනය කරන විට ඔබ මේ පිළිබඳව තවදුරටත් ඉගෙන ගන්නෙහිය.

මෙම කණ්ඩායම් ප්‍රමාණයෙන් වෙනස් වේ. නිදසුනක් වශයෙන් මග්දලායේ මරියාට, ගැළවීම ලැබීමට පෙර, යක්ෂයෝ හත් දෙනෙක් සිටියහ. ලූක් 8:30 හි යක්ෂයන් බොහොමයක් "ලෙගියොන්" ක් ගැන සඳහන් වේ. යේසුස් වහන්සේගේ කාලයේ රෝම හමුදාවේ ලෙගියොන් යනු පාබල සෙබලුන් 6100 ක් හා අශ්වාරෝහකයන් 726 කි.

සංවිධානයවූ යක්ෂයාගේ හමුදාව ...

**එක්සත් වේ:**

ලූක් 8:30 හි සඳහන් යක්ෂාවේශ වූ මිනිසා පිළිබඳ කතාවේදී ඔවුහු ඔවුන්ගේ පරමාර්ථය සඳහා එනම් මිනිසා ආවේස කිරිම සදහා එක්සත්ව සිටියහ. මතෙව් 12:45 හි ද මෙය සත්‍යයකි. යක්ෂයින් සත් දෙනෙකු සිටි (ලූක් 16:9) මග්දලායේ මරියා පිළිබඳවද මෙය සත්‍යයකි. යක්ෂයින්ගේ එක්සත්කම් ගැන යේසුස්වහන්සේ පැවසුවේ,

> **සාතන් විසින්ම සාතන් දුරුකරයි නම් ඔහු තමාටම විරුද්ධව භේදව සිටියි. එසේවී නම් ඔහුගේ රාජ්‍යය පවතින්නේ කොහොමද? (මතෙව් 12:26)**

**දුෂ්ටකමේ විවිධ තරාතිරම් තිබේ:**

තමා අනෙකුත් දුෂ්ටාත්ම සමග පැමිණෙන බව පැවසූ යක්ෂයාගෙන් මෙය පැහැදිලි වේ.

> **අපිරිසිදු ආත්මය මනුෂ්‍යයෙකුගෙන් දුරුව ගිය කල්හි, ඔහු දිය නැති තැන්වල ඇවිදිමින් විශ්‍රාම සොයා නොලැබ: මම පිටත්ව ආ මාගේ ගෙට හැරීයමියි කියයි. ඔහු එහි පැමිණි කල, ඒ ගේ හිස්ව අතුගා, සරහා තිබෙන බව දකියි. එවිට ඔහු ගොස් තමාට වඩා දුෂ්ටවූ වෙන ආත්මයන් සත් දෙනෙකු තමා කැටුව ගෙන එන්නේය. ඔවුහු ඇතුල්ව එහි වාසය කරති. එසේ ඒ මනුෂ්‍යාගේ පළමු ස්වභාවට වඩා අන්තිම ස්වභාව නපුරු වන්නේය. මේ නපුරු පරම්පරාවටද එසේම වන්නේයයි කී සේක. (මතෙව් 12:43-45)**

**ඔවුන්ගේ කාර්යයන් වෙනස් කළ හැකිය:**

1 රාජාවලිය 22:21-23 හි සඳහන් යක්ෂයා තමා බොරුකාර ආත්මයක් වන බව ප්‍රකාශ කළේය. "මම ඔහු පොළඹවන්නෙමි" යි කී බැවින් පෙන්නුම් කෙරෙන්නේ ඔහු කලින් එසේ නුවූ බවයි.

**විවිධ වර්ගයේ අය සිටිති:**

මිනිසාට ශරීරයක්, ප්‍රාණයක් හා ආත්මයක් ඇති බව බයිබලය උගන්වයි. මිනිසාගේ ශරීරයට ප්‍රාණයට හා ආත්මයට පහර එල්ල කරන ප්‍රධාන යක්ෂයින් වර්ගද තුනක් ඇත.

1. නපුරු හෝ අපවිත්‍ර ආත්ම : දුරාචාරය, අපවිත්‍ර සිතිවිලි, පීඩාවන්, දොම්නස්, ආවේග වීම හා අප පසුව ඉගෙන ගන්නාවූ සාතන්ගේ වෙනත් උපක්‍රම ආදියට මෙම ආත්ම වගකිවයුතු වේ. මේවා මිනිසාගේ සිතට හා ප්‍රාණයට වධ දේ (මතෙ. 10:1, 12:43, මාක් 1:23-26)

2. දුර්වල කරන්නාවූ ආත්ම : මේ ආත්ම ශරීරයට වධ දේ (ලූක් 13:11)

3. දූෂ්‍ය කරන්නාවූ ආත්ම : දූෂ්‍ය කරන්නාවූ ආත්ම මිනිසෙකුගේ මනසට, ප්‍රාණයට හා ආත්මයට වධ ගෙන දෙන අතර 1 තිමෝති 4:1 හි දක්වා ඇති පරිදි සාවද්‍ය ධර්ම විශ්වාස කිරීමට මිනිසා කෙරෙහි බලපෑම් ඇති කරයි. මෙම ආත්ම මිනිසුන් දූෂ්‍ය කර බොරුවක් විශ්වාස කිරීමට සලස්වා ඔහු සදාතනික දඬුවමට පත් කරයි. ඒවා ව්‍යාජ ධර්ම, ව්‍යාජ ක්‍රිස්තුස් හා ව්‍යාජ ගුරුවරුන්ගේ ආත්ම වේ.

## යක්ෂයන්ගේ ක්‍රියාකාරකම්

යක්ෂයන් අනුගමනය කරන්නේ තම අධිපතියා වූ සාතන්ගේ නියෝග වේ. යක්ෂයන්ගේ ක්‍රියාකාරකම් දෙවියන්වහන්සේටත් උන්වහන්සේ සැලසුම් හා උන්වහන්සේගේ සෙනගටත් එරෙහිව ඇති බව නිරීක්ෂණය කිරීමෙන් අපට සාරාංශගත කළ හැකිය. සාතන් යක්ෂයන් යොදා ගන්නේ දේව වචනයට, දේව නමස්කාරයට, දෙවියන්වහන්සේ හා සමග ඔබ යන ගමනට, හා දෙවියන්වහන්සේ වෙනුවෙන් ඔබ කරන වැඩට පහර දීමට වේ.

අට වැනි පරිච්ඡේදයෙන් ඔබ, ආත්මික සටනේදී සතුරා භාවිත කරන උපක්‍රම ගැන විස්තරාත්මකව ඉගෙන ගන්නවා ඇත. සාතන් තම යක්ෂයන්ව යොදා ගන්නේ මුළු ලොව පුරාම මෙම උපක්‍රමය සාක්ෂාත් කිරීමට වේ. රැවටීම් හා දුෂ්ටකම් වලට අනුබලය දෙමින් යක්ෂයෝ සාතන්ගේ බලය පතුරුවති. ඔවුහු පුද්ගලයන්, රාජ්‍යයන්, ජාතීන් හා ලෝක පද්ධතිය කෙරෙහි බලපෑමේ ඇති කරති. ඔවුහු දෙවියන්වහන්සේට හා මිනිසුන්ට එරෙහිව කැරලි ගැසීමට හා බොරු ප්‍රචාරයන් කිරීමට අනුබල දෙති. එමෙන්ම ඔවුහු පිළිම පූජාවලටද, ව්‍යාජ ධර්මයනටද අනුබල දෙන අතර ශුභාරංචිය වෙනුවෙන් පුරුෂයන්ව හා ස්ත්‍රීන්ව අන්ධ කරති.

මෙම යක්ෂයෝ නොඇදහිලිවන්තයන්ව, භයානක නපුරු ක්‍රියා කිරීමටද, මිනී මැරීමටද, තුවාල සිදු කිරීමටද, දිවි නසා ගැනීමටද පොළඹවති. ඔවුහු මනසට හැගීම් සම්බන්දයෙන් ගැටලුවලින්ද, ශරීරයට භෞතික දුර්වලතාවලින්ද බලපෑම් ඇති කරති. යක්ෂයන් ඇදහිලිවතුන්ට පහර දෙන්නේ පරීක්ෂාවන්, රැවටීම්, දොම්නස් හා පීඩාවන් මගිනි. ඔවුන් උත්සාහ කරන්නේ චර්යාවන්ට හා බියට ඔබව බැඳ තැබීමටය. ඔවුහු ඔබට චෝදනා කරමින්ද බොරු ප්‍රචාර කිරීමෙන්ද දෙවියන්වහන්සේගේ සෙනග අතර භේද ඇති කිරීමට උත්සාහ කරති. ඔවුහු ඔබ දෙවියන්වහන්සේ හා සමග යන ආත්මික ගමන ඉලක්ක කර ගනිමින් දේව වචනයට, දේව නමස්කාරයට හා ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් කරන කාර්යයනට එරෙහිව ක්‍රියා කරති. එමෙන් ඔබගේ ශරීරයටද ඔවුහු පහර දෙති.

යක්ෂයන්ගේ පහරදීම්වලින් ආරක්ෂා වීමට නොඇදහිලිවතුන්ට නොහැකි නමුත් ඇදහිලිවතුන්ට මේ ප්‍රබල ආත්මික බලවේගවලට මුහුණ දීමට ආත්මික ආයුධ හා උපක්‍රම තිබේ. මෙම ආත්මික සටන පිළිබඳව ඔබ තව දුරටත් අධ්‍යයනය කරන විට මේ ආයුධ හා උපක්‍රම ගැන ඉගෙන ගන්නෝය.

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපි වලින් ප්‍රධාන පදය ලියන්න.

2. යක්ෂයින් ඇතිවූයේ කෙසේද?

3. ඔවුන්ගේ ක්‍රියාකාරී ක්ෂේත්‍රය කුමක්ද?

4. ඔවුන්ගේ ක්‍රියාකාරකමේ සාරාංශගත කරන්න.

5. මෙම පරිච්ඡේදයේ සාකච්ඡාවලින් ඔබට මතක තිබෙන යක්ෂයන්ගේ උප ලක්ෂණ හැකිතරම් ලියන්න.

6. යක්ෂ බලවේග සංවිධානය කර ඇත්තේ කෙසේද?

7. යක්ෂයන්ගේ මුල් තත්ත්වය කුමක්ද?

8. ඔවුන් යක්ෂයන් වූයේ මන්ද?

9. පහත දැක්වෙන යක්ෂයන්ගේ තරාතිරම් කෙටියෙන් අර්ථ විග්‍රහ කරන්න.

අධිපතිකම් :

අඳුරේ බලවේග හා පාලකයන් :

උස්තැන්වල ආත්මික දුෂ්ටකම් :

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. නපුරාගේ ආත්මික බලවේග පිළිබඳව තවදුරටත් ඉගෙනීම සඳහා යක්ෂයන් පිළිබඳ පහත දැක්වෙන බයිබල් යොමුවීම් අධ්‍යයනය කරන්න.

   උත්පත්ති 3:1-15, 6:1-4, 41:8, 44:5
   නික්මයාම 7:8-13, 20-24, 8:6-7, 18-19, 9:11,22:18
   ලෙවී කථාව 17:7, 19:26, 31, 20:6, 27
   ගණන් කථාව 22:7, 23:23
   ද්විතිය කථාව 18:9-14, 20-22, 32:17
   විනිශ්චයකාරයා 8:21, 26
   1 සාමුවෙල් 15:23, 16:14, 18:10, 28:1-15
   1 රාජාවලිය 5:4, 18:28, 22:19-38
   2 රාජාවලිය 9:22, 17:17, 21:1-9, 23:5, 24
   1 ලේකම් 21:1
   2 ලේකම් 33:1-10
   යෝබ් 1:1-12, 2:1
   ගීතාවලිය 78:49, 91:6, 106:36-38
   යෙසායා 3:18-19, 8:19, 14: 12-17, 47:11-15
   යෙරමියා 27:9
   එසකියෙල් 21:21, 28:11-19
   දානියෙල් 1:20, 2:2, 27, 4:6-9, 5:7, 11, 15
   හොසියා 4:12
   මීකා 5:12
   සෙකරියා 3:1, 2, 10:2
   මලාකි 3:5
   මතෙව් 4:1-11, 24, 8:16, 28-34, 9:32-34, 10:1, 25:11-18, 12:22-30, 11:43-45, 13:19, 39:15:21-28, 17:14-21, 24:24, 25:41
   මාක් 1:12-13, 21-28, 32, 34, 39, 3:11-12, 15, 22-30, 5:1-20, 6:7, 13, 7:24-30, 8:33, 9:17-29, 38-40, 13:22, 16:9, 17
   ලූක් 4:1-13, 33-37, 6:18, 7:21, 33, 8:2, 26-39, 9:1, 37-42, 49-50, 10:17-20, 11:14-26, 13:10-17, 32, 22:3, 31, 24:39
   යොහන් 6:70, 7:20, 8:44, 48-49, 10:20-21, 12:31, 13:27, 14:30, 16:11, 17:15
   ක්‍රියා 5:3. 16, 8:7, 9-11, 18:24, 10:38, 13:6-12, 16:16-19, 19:12-20, 26:18
   රෝම 8:38, 16:20
   1 කොරින්ති 5:5, 7:5, 10:20-21
   2 කොරින්ති 2:11, 4:4, 6:14, 15, 17, 11:13-14, 12:7
   ගලාති 1:4, 3:1, 4:8-9, 5:19-21
   එපීස 1:21, 2:2, 4:26-27, 6:11, 12, 16
   කොලොස්සි 1:13, 2:15
   1 තෙසලෝනික 2:18, 3:5
   2 තෙසලෝනික 2:1-10, 3:3
   1 තිමෝති 1:20, 3:6, 4:1-3
   2 තිමෝති 1:7, 2:26, 4:18
   හෙබ්‍රෙව් 2:14
   යාකොබ් 2:19, 3:15, 4:7
   1 පේත්‍රැස් 5:8
   2 පේත්‍රැස් 2:4, 19
   1 යොහන් 2:13, 18, 3:8, 12 4:1-4, 6,5:18
   යුද් 1:6, 9
   එළිදරව් 2:9, 13, 24, 3:9, 9:1-11, 20-21, 12:1-13, 13:1-18, 16:13-16, 18:2, 19:20, 20:1-14 21:8

2. යක්ෂයන්ගේ බලයයන්ගේ පිළිබඳව පැරණි ගිවිසුමේ වාර්තා අධ්‍යයනය කරන්න

සර්පයාගේ ආකාරයෙන් සිටින සාතන් පිළිබඳව උත්පත්ති 3:1-24 හා යෙසායා 27:1 හි සත් වරක් සඳහන් කර ඇත.

1 ලේකම් 21:1, 2 සාමුවෙල් 24:1, ගීතාවලිය 109:6, සෙකරියා 3:1-2 හා යෝබ් පොතේ 14 වරක්ද, සාතන් ගැන සඳහන් කර ඇත.

නපුරු ආත්ම ගැන අට වරක් සාවුල් රජු පිළිබඳ වාර්තාවල සඳහන් වේ. 1 සාමුවෙල් 16:14-23, 18:10, 19:9

බොරුකාර ආත්මයන් ගැන හය වරක් 1 රාජාවලිය 22:21 -23 හි සඳහන් වේ.

ආත්ම බන්ධනාකාරයන් ගැන හය වරක් ලෙවී කථාව 20:27 හි හා 1 සාමුවෙල් 28 හි සඳහන් වේ.

ආගමික ආත්ම හා වෛශ්‍යාවන්ගේ ආත්ම පිළිබඳව හොෂෙයා පොතේ සඳහන් වේ.

යක්ෂයන් හා මිථ්‍යාදෘෂ්ටි ජාතින්ගේ දෙවිවරුන් සමග සමානව හතරවරක් ගෙන ඇත. ලෙවී 17:7 ද්විතිය කථාව 32:17, 2 ලේකම් 11:15, ගීතාවලිය 106:19-39

ජාතින් පාලනය කරන නපුරු අධිපතිවරුන් ගීතාවලියේත්, දිවැසිවර ග්‍රන්ථවලිත්, විශේෂයෙන්ම දානියෙල් 10:10-21 හිත් හඳුන්වා දී ඇත.

අපවිත්‍ර, මුරණ්ඩු ආත්ම පිළිබඳව දෙවරක් සඳහන්ව ඇත. යෙසායා 19:14

3. මේ ගැන සිතන්න. යක්ෂ බලවේග දෙවියන්වහන්සේගේ සතුරන් වුවද ඔවුන් දෙවියන්වහන්සේගේ කැමැත්තට යටත් වන අතර උන්වහන්සේ ඔවුන් ලවාම ඔවුන් පරාජය කරවන සේක.
1 සාමුවෙල් 16:14, 18:10, 19:9, 1 රාජා 22:20-22, යෙසායා 19:14

# හත්වන පරිච්ඡේදය

## යක්ෂයාගේ බල ප්‍රදේශය

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- මෙම පාඩමේ භාවිත කර ඇති ආකාරයට" ලෝකය" යන වචනය අර්ථවිග්‍රහ කිරීමට
- ලෝකයේ අධිපතියා හඳුනා ගැනීමට
- අද පවතින ලෝක පද්ධතියට හේතුව පැහැදිලි කිරීමට
- ඇදහිලිවතුන් කෙරෙහි ලෝකයා දක්වන ආකල්පය විස්තර කිරීමට
- මෙම පාඩමේ භාවිත කර ඇති ආකාරයට "මාංශය" යන වචනය අර්ථවිග්‍රහ කිරීමට
- "මාංශයේ ආශාව" යන්නෙහි තේරුම පැහැදිලි කිරීමට
- කාමාශාව වර්ධනය වන අයුරු පැහැදිලි කිරීමට
- පරාජය නොකළ කාමාශාවේ විපාක පැහැදිලි කිරීමට
- මාංශයේ කාර්යයන් ලයිස්තුගත කර ඇති ශුද්ධලියවිලි යොමු හඳුනා ගැනීමට හැකි වනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ගත් ප්‍රධාන පදය

> **ලෝකයටවත් ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේම නොකරල්ලා. යමෙක් ලෝකයට ප්‍රේම කෙරේ නම් පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල, එනම්, මාංසයේ තෘෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ. (1 යොහන් 2:15-16)**

## හැඳින්වීම

ඇත්තේ එක සතුරෙකි. එහෙත් කලින් පාඩම්වලින් උගත් පරිදි ඔහු විශාල යක්ෂ බලවේගයක් මගින් ක්‍රියාකරයි. මෙම පරිච්ඡේදයේ ප්‍රධාන පදයෙන් එළිදරව් වන පරිදි සාතන් යොදාගන්නේ යක්ෂයින්ව පමණක් නොවේ, ඔහු මාංශයෙත් ලෝකයෙත් නපුරු බලවේග තුළින්ද ක්‍රියා කරයි.



> **ලෝකයටවත් ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේම නොකරල්ලා. යමෙක් ලෝකයට ප්‍රේම කෙරේ නම් පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල, එනම්, මාංසයේ තෘෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ. (1 යොහන් 2:15-16)**



මෙම පරිච්ඡේදයේ පරමාර්ථය වන්නේ ලෝකය හා මාංශය ලෙස හැඳින්වෙන නපුරේ සතුරු බලවේග හැඳින ගැනීම හා ඒ ගැන සාකච්ඡා කිරීම වේ. පරෙස්සම් වන්නේ ඔබ ඇතුළුවන්නේ සතුරු භූමියකටය. ලෝකයත් මාංශයත් සතුරු බල ප්‍රදේශ වේ.

## 1 කොටස : ලෝකය

"ලෝකය" යන වචනයට ශුද්ධ ලියවිල්ලේ විවිධ තේරුම් තිබේ. එය භෞතික ස්වභාවයේ පවතින පොළොව හෝ විශ්වය හෝ විය හැකිය. එය යුදෙව් ජාතිය හැර අනෙකුත් සියලු ජාතීන් හැඳින්වෙන අන්‍යජාතීන්ට යොමු කිරීමක් විය හැකිය.

එහෙත් "ලෝකය" යන වචනය, දෙවියන්වහන්සේට විරුද්ධ වන්නාවූ වාර්තමාන මනුෂ්‍ය කටයුතුවල තත්ත්වයටද යොදා ගැනේ. එය මිනිසුන් වාසය කරන පොළොව ඉදිරියට ගෙන යන පද්ධතිය වන අතර එය දෙවියන්වහන්සේට හා ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට එරෙහි පද්ධතියකි. මෙම පාඩමේ "ලෝකය" යන වචනය භාවිතා කෙරෙන්නේ මේ තේරුම ඇතිව වේ. "ලෝකය" යන මනුෂ්‍ය වර්ගයා සමන්විතවන මාංශ-කෙන්ද්‍රිය පුද්ගලයන්ගේ සාමුහික කණ්ඩායමකි. මාංශය යනුවෙන් හැඳින්වෙන්නේ ඔබගේ ශරීරයේ ඇති සැබෑ මාංශයට නොවේ. එය දෙවියන්වහන්සේට එරෙහි කැරැල්ලෙහි පවතින මූලික පාපිෂ්ට මනුෂ්‍ය ස්වභාවය විස්තර කෙරෙන පදයකි.

ඔබගේ සතුරා ලෙස මෙම ලෝකය, සමාජීය, ආර්ථික, ද්‍රව්‍යමය හා ආගමික දර්ශනවල පූර්ණ සංවිධානාත්මක පද්ධතිය වන අතර ඔවුන් ප්‍රකාශ වන්නේ සංවිධාන, පෞරුෂත්ව හා රජයන් තුළිනි. එය සුවිශේෂී රජයක් හෝ සංවිධානයක් හෝ පුද්ගලයෙකු හෝ නොවේ එහෙත් එය මේවායේ පදනම වන ලෝක පද්ධතියය. මෙම ලෝක පද්ධතිය මිනිසාගේ මාංශයේ ස්වභාවයේ දිගුවකි. එය මාංශික පාපයට අනුබල දෙන වාතාවරණයක්, පරිසරයක් හා පද්ධතියක් සපයයි. එය මනුෂ්‍යයාගේ මාංශික ආශාවන් උද්දීපනය කරන දේවලින් ඔහු වටකරයි.

## ලෝකයේ අධිපතියා:

සාතන් යනු ලෝක පද්ධතියේ "අධිපතියා" හෙවත් පාලකයා වේ.

> **මේ ලෝකයේ විනිශ්චය දැන්ය. මේ ලෝකයේ අධිපතියා දැන් පිටත දමනුලබන්නේය. (යොහන් 12:31)**

> **තවත් නුඹලා සමග බොහෝකොට කතා නොකරමි, මක්නිසාද ලෝකයේ අධිපතියා එන්නේය. නුමුත් ඔහුට මා තුළ කිසිවක් නැත (යොහන් 14:30)**

එමෙන්ම මේ ලෝකයේ දෙවියා ලෙසද සාතන් හැඳින්වේ:

> **නොඇදහිලිකාරවූ ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ ස්වරූපය වූ ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ ශුභාරංචි ආලෝකය නොබැබළෙන පිණිස, මේ ලෝකයේ දෙවියා ඔවුන්ගේ සිත් අන්ධ කළේය. (2 කොරින්ති 4:4)**

ලෝකයේ රාජ්‍යයන් කෙරෙහි සාතන් අද බලපෑම් ඇති කරයි. ඒවා හසුරුවන්නේ සාතනික දර්ශන හා මූලධර්ම මගිනි. ඒවා මාංශිය-කේන්ද්‍රිය හා මාංශික-පාලක වේ.

> **නැවතත් යක්ෂයා උන්වහන්සේ ඉතා උස් කන්දකට පමුණුවා, ලෝකයේ සියලු රාජ්‍යයන්ද ඓශ්වර්යයද උන්වහන්සේට පෙන්වා: ඔබ බිම වැටී මට නමස්කාර කරන්නෙහි නම් මේ සියල්ල ඔබට දෙන්නෙමි උන්වහන්සේට කීවේය. (මතෙව් 4:8-9)**

යම් කිසි දිනෙක මේවා ස්වාමීන්වහන්සේගේ රාජ්‍යයන් බවට පත්වනු ඇත:

> **සත්වෙනි දේව දූතයාද පිම්බේය, එවිට: ලෝකයේ අධිපතිකම අපගේ ස්වාමීන්වහන්සේටද තමන් ක්‍රිස්තුස්වහන්සේටද වූයේය. උන්වහන්සේ සදාකාලේටම රජකම් කරනසේකැයි. කියන මහත් ශබ්ද ස්වර්ගයෙහි විය. (එළිදරව් 11:15)**

## ලෝකයේ මෙම තත්ත්වයට හේතුව:

මෙම ලෝකයේ අද පවතින තත්ත්වයට හේතුව පාපය වේ. ආදම් හා ඒව දෙවියන්වහන්සේ මවනු ලැබූ අවසථාවේ ලෝකයේ ආධිපත්‍යය ඔවුන්ට දුන් සේක. මින් අදහස් වන්නේ දේව සැලැස්ම අනුව ලෝකය පාලනය කිරීමටත් එහි පද්ධති හා වාසය කරන්නන්ට මග පෙන්වීමටත් ඔවුන්ට ඉඩදුන් බවය. ඔවුන් දෙවියන්වහන්සේට විරුද්ධව පව් කළ විට ඔවුන්ගේ මේ ආධිපත්‍යය නැති විය (උත්. 1-3).

සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය වෙනුවෙන් යේසුස්වහන්සේ කුරුසිපත් කළ විට හා මරණයෙන් උත්ථාන වූ විට උන්වහන්සේ ලෝකය ආපසු ලබා ගත් සේක. උන්වහන්සේ නපුරු ආත්ම බලවේගයනට විනිශ්චය ප්‍රකාශ කළ සේක.

> **උන්වහන්සේ තමන් කෙරෙන් අධිපතීන්ද බලයලත්තන්ද පහකොට, ප්‍රසිද්ධයෙන් ඔවුන් දක්වා, කුරුසිය කරණකොටගෙන ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශ කළ සේක. (කොලොස්සි 2:15)**

යේසුස්වහන්සේ සතුරාගේ බලයෙන් ලෝකය නැවත ලබාගත්තද, සාතන් තවමත් එය පිළි නොගනී. සාතන් තවමත් ඔහුගේ නපුරු බලවේග යොදා ගනිමින් ලෝකය තුළ ක්‍රියා කරයි. ඔබ මෙම පාඩමාලාවේ අවසාන පරිච්ඡේදයෙන් ඉගෙන ගනු ලබන අවසාන ගැටුම එනතුරු ලෝකයේ සියලු රාජ්‍යයන්ගේ අයිතිය යේසුස්වහන්සේ බව සාතන් පිළිගන්නේ නැත.

අද පවතින තත්ත්වය, ස්වභාවික ලෝකයේ බොහෝ විට පවතින හමුදාමය තත්ත්වයට සමාන වේ. යම් ජාතියක පාලන බලය දේශපාලන හෝ හමුදාමය හෝ බලයක් ලබා ගත්තද ජාතිය තුළ සිටින කැරලිකාර කණ්ඩායම් එය පිළිගන්නේ නැත. මෙම කැරලිකාර කණ්ඩායම් රට පුරා කැරලි මෙහෙයවයි. ඔවුන්ට නීත්‍යානුකුල අයිතියක් නැති භූමි ප්‍රදේශ ඔවුන් යටතට ගෙන එහි පුරවැසියන් පාලනය කිරීමට ඔවුහු උත්සාහ කරති. ඔවුන්ගේ පරමාර්ථයන් ඉටුකර ගැනීමට ඔවුන් බොහෝ විට යොදා ගන්නේ ත්‍රස්තවාදී උපක්‍රමය.

ආත්මික ලෝකයේ තත්ත්වයද ඒ හා සමානය. යේසුස්වහන්සේ ලෝකයේත්, සතුරාගේත්, ඔහුගේ නපුරු බලවේගවලත් ආධිපත්‍යය නැවත ලබා ගත් සේක. එහෙත් සාතන්ගේ කාරුලිකාර කණ්ඩායම් තවමත් මුළු ලොව පුරා සටන් කරති. ඔවුන්ට නීත්‍යානුකුල අයිතියක් නැති ප්‍රදේශ ඔවුන් යටතට ගෙන එහි සිටින පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට නපුරට පෙළඹවීමට ඔවුහු උත්සාහ කරති. මෙම සටන, එනම් අපගේ "ආත්මික සටන" අවසාන ගැටුම එනතුරු පවතිනු ඇත.

## ලෝකයේ ව්‍යුහය:

ලෝකයේ ව්‍යුහය දෙවියන්වහන්සේටත්, උන්වහන්සේගේ සැලැස්ම, පරමාර්ථය හා සෙනඟටත් සෘජුවම විරුද්ධය

### දුෂ්ට ලෝක පද්ධතිය:

වර්තමාන ලෝක පද්ධතිය දුෂ්ටය :

> **උන්වහන්සේ දැන් තිබෙන නපුරු ලෝකයෙන් අප ගළවන පිණිස අපගේ පිය වූ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස අපේ පව් නිසා තමන්ම පාවා දුන් සේක.** (ගලාති 1:4)

ලෝක පද්ධතියේ දෙවියන්වහන්සේ නැත :

> **ලෝකයෙහි බලාපොරොත්තුවක් නැතුව දෙවියන්වහන්සේත් නැතුව..... (එපීස 2:12)**

ඇදහිලිවන්තයන් ලෝක පද්ධතියේ කොටසක් වීම සඳහා උගුලකට අසු කිරීමට අද බොහෝ රැවටිලි ලෝකයේ ඇත.

> **මක්නිසාද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාංසයෙන් යුක්තව එන බව ඒත්තු නොගන්නාවූ බොහෝ රැවටිලිකාරයෝ ලෝකයට පැමිණ සිටිති. (2 යොහන් 7)**

දෙවියන්වහන්සේ ලෝකය දැනටමත් විනිශ්චය කර ඇති අතර , ලෝකය වරදකරුවෙකු බවට පත්කොට ඇත :

> **නුමුත් අප විනිශ්චයකරනු ලබන කල ලෝකයා සමග වරදට පත් නොවන පිනිස ස්වාමින්වහන්සේගෙන් දඬුවම් ලබමුව (1 කොරින්ති. 11:32)**

## ලෝකයේ ගුරුකම් :

"ලෝකයේ ගුරුකම්" ලෙස හැඳින්වෙන්නේ ලෝකය පාලනය කරන මූලික සිද්ධාන්ත වේ. ඒවා මනුෂ්‍යයන් ආත්මික බන්ධනයකට ගෙන යයි.

> **එසේම අපිත් බාලයන්ව සිටියදී ලෝකයේ ගුරුකම් යටතේ දාසව සිටියෙමුව (ගලාති 4:3)**

## ලෝකයේ ආකෘතී:

ලෝක පද්ධතිය පවතින ව්‍යවස්ථාවක් ඇත. ඒවා දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ රාජ්‍යය ව්‍යුහගත කරන මූලධර්මවලට පටහැනිය.

> **ක්‍රිස්තුස්වහන්සේට එකඟ නැත්තාවූ මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝගවලත් ලෝකයේ ගුරුකම්වලත් ප්‍රකාරයට තිබෙන පණ්ඩිතකමද හිස්වූ රැවටිලිකාරකමද කරණකොටගෙන නුඹලා කොල්ලයක් කරගන්න කිසිවෙක් නොසිටින හැටියට බලාගනිල්ලා. නුඹලා ලෝකයේ ගුරුකම් කෙරෙන් වෙන්ව ක්‍රිස්තුස්වහන්සේ සමග මැරුණහුනම් ලෝකයෙහි ජීවත්වන්නාක්මෙන් මනුෂ්‍යයන්ගේ ශික්ෂා හා ධර්ම අනුව....යටත් වන්නේ මක්නිසාද (කොලොස්සි 2:8, 20)**

## ලෝකයේ ආත්මය:

ලෝකයේ ආත්මය, ශුද්ධාත්මයාණන්වහන්සේට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ වේ.

> **නුමුත් දෙවියන්වහන්සේ විසින් අපට දෙනලද දේ අප විසින් දැනගන්නා පිණිස ලෝකයේ ආත්මය නොව දෙවියන්වහන්සේගෙන් වූ ආත්මය ලැබීමුව. (1 කොරින්ති. 2:12)**

## ලෝකයේ දර්ශනය:

දර්ශනය යනු දැනගැන්මේ මූලධර්ම වේ. ලෝක දර්ශන ක්‍රිස්තුස් වහන්සේගේ දර්ශන මත පදනම් වී නැත

> **ක්‍රිස්තුස්වහන්සේට එකඟ නැත්තාවූ මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝගවලත් ලෝකයේ ගුරුකම්වලත් ප්‍රකාරයට තිබෙන පණ්ඩිතකමද හිස්වූ රැවටිලිකාරකමද කරණකොටගෙන නුඹලා කොල්ලයක් කරගන්න කිසිවෙක් නොසිටින හැටියට බලාගන්න (කොලොස්සි 2:8)**

## ලෝකයේ ප්‍රඥාව:

ලෞකික ප්‍රඥාව දෙවියන්වහන්සේගේ ප්‍රඥාව නොවේ.

> **මක්නිසාද මේ ලෝකයේ ප්‍රඥව දෙවියන්වහන්සේ ඉදිරියෙහි මෝඩකමය (1 කොරින්ති. 3:19)**

## ලෝකයේ ගමන් මග :

මෙම ලෝකයේ "ගමන් මග", වර්තමාන ලෝකයේ චක්‍රය, පුරුද්ද හා එය ක්‍රියාකරන ආකාරය වේ.

> **පෙර කාලයේ නුඹලා මේ ලෝකයේ ව්‍යවහාරය ලෙසත් අකීකරුකමේ පුත්‍රයන් තුළ දැන් ක්‍රියාකරන්නාවූ ආත්මය වන ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියටත් ඒවායෙහි හැසුරුණහුය (එපීස 2:2)**

## ලෝකයේ හඬ:

ලෝකයේ ඇති "හඬ" බොහෝමයක් දෙවියන්වහන්සේගේ හඬට පටහැනිය.

> **යම් පමණ වෙනස් වූ භාෂාවල් ලෝකයේ ඇද්ද එයින් එකක්වත් අර්ථ රහිත නැත**
> **(1 කොරින්ති. 14:10)**

**ලෝකයේ සාමය:**

ලෝක සාමය තාවකාලිකය, බිඳෙන සුළුය, සමහර අවස්ථාවල රැවටිලිකාරය

> **නුඹලා වෙත සමාදානය තබා යමි, මාගේ සමාදානය නුඹලාට දෙමි, මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ නුඹලාගේ සිත් කැලඹෙන්ටවත් භයවෙන්ටවත් නොදෙන්න, (යොහන් 14:27)**

**ලෞකික ශෝකය:**

දේව භක්තික ශෝකය ලෞකික ශෝකයට වඩා වෙනස්ය.

> **මක්නිසාද දේවකැමැත්තට එකඟවූ ශෝකයෙන් තැවෙන්නට කාරණයක් නොවන්නාවූ ගැළවීමට පමුණුවන පසුතැවිලිවීම භටගන්නේය, නුමුත් ලෞකික ශෝකය මරණය උපදවන්නේය, (2 කොරින්ති 7:10)**

**ලෞකික ආකල්ප:**

ලෝකය දෙවියන්වහන්සේට වෛර කරයි.

> **ලෝකය සමග මිත්‍රකම දෙවියන්වහන්සේට සතුරුකම බව නුඹලා දන්නේ නැද්ද? එබැවින් කවරෙක් නමුත් ලෝකයට මිත්‍රවෙන්ට කැමැත්තේ නම්, ඔහු දෙවියන්වහන්සේට සතුරෙක් වන්නේය. (යාකොබ් 4:4)**

ලෝකය ඇදහිලිවතුන්ට වෛර කරයි:

> **ලෝකය නුඹලාට වෛරවෙනවා නම්, නුඹලාට පළමුවෙන් මට වෛරවුණ බව නුඹලා දනිහුය. නුඹලා ලෝකයට අයිති නම්, ලෝකයා තමන්ගේම අයට ආදරේවන්නේය. නුමුත් නුඹලා ලෝකයාගෙන් නොවන නිසාත් මා විසින් ලෝකයෙන් නුඹලා තෝරාගත් නිසාත් ලෝකයා නුඹලාට වෛර වෙති. (යොහන් 15:18-19)**

ලෝකය සැදී ඇත්තේ ඇදහිලිවතුන්ට වෛර කරන මාංශ -කේන්ද්‍රිය පුද්ගලයන්ගෙන් බැවින්, "මාංශය" නමැති මෙම ප්‍රබල බලය ගැන අප තවදුරටත් ඉගෙන ගත යුතුය.

## දෙවෙනි කොටස : මාංශය

ලෝකය සාතන්ගේ නපුරු සමාජ බලයකි. එය ඇදහිලිවතුන්ට පහරදීමට බාහිරින් ක්‍රියා කරයි. එය මාංශික පුද්ගලයන්ගෙන් සාමුහික සංවිධානයකි. මාංශය යනු ඇදහිලිවතුන් තුළ ක්‍රියා කරන නපුරු බලයකි. ලෝකයේ ක්‍රියාත්මකවන "මාංශික ආත්මය" ඔබ ඉඩදුන් විට ඔබගේ ජීවිතය තුළද ක්‍රියා කරනු ඇත. "මාංශය" යන වචනය ශුද්ධ ලියවිල්ලේ භාවිත කර ඇති ආකාරයට මිනිසාගේත් සත්ත්වයාගේත් සැබෑ ශරීරයට යොමු කළ හැකිය. එහෙත් මෙම පාඩමේ අප "මාංශය" යන වචනය භාවිත කරන විට අදහස් කරන්නේ එය නොවේ.

මනුෂ්‍යයාගේ මූලික පාපී ස්වභාවය විස්තර කිරීමටද බයිබලය "මාංශය" යන වචනය භාවිත කර ඇත. මාංශය යනු දෙවියන්වහන්සේට එරෙහිව ඕනෑකමින්ම කෙරෙන විරෝධයේ හා කැරැල්ලේ කේන්ද්‍රස්ථානය වේ.

> **මක්නිසාද මා තුළ එනම් මාගේ මාංසය තුළ කිසි යහපතක් වාසය නොකරන බව දනිමි. මක්නිසාද, කැමැත්ත මට ඇත්තේය, නුමුත් යහපත් දෙය කිරීම මට නැත්තේය. මක්නිසාද, මම කැමති යහපත නොකර අකමැති නපුර කරමි. ඉඳින් මම කැමති නැති දේ කරම් නම්, ඒක කරන්නේ මා නොව මා තුළ වාසයකරන පාපයය. (රෝම 7:18-20)**

මාංශය, පාපය තුළින් තම කැරලිකාර ස්වභාවය පෙන්නුම් කෙරෙන අනිවාර්ය අභ්‍යන්තර බලයකි. මෙම පාඩමේ මාංශය සඳහා භාවිත කෙරෙන්නේ මෙම තේරුම වේ. මිනිසාගේ මාංශික ස්වභාවය විස්තර කිරීමට "පරණ මනුෂ්‍යයා" යන්නද භාවිත කෙරේ. සෑම මනුෂ්‍යයෙකුටම මෙම මූලික පාපී මාංශික ස්වභාවය ඇත.

**එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන් සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුණේය. (රෝම 5:12)**

**මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)**

## මාංශයේ තෘෂ්ණාව :

**නුමුත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරියල්ලා, එවිට නුඹලා මාංසයේ තෘෂ්ණා සම්පූර්ණකරන්නේ නැතැයි කියමි. (ගලාති 5:16)**

මාංශයේ තෘෂ්ණාව යනු කුමක්ද? ප්‍රථමයෙන් අපි "තෘෂ්ණාව" යන වචනයේ අර්ථය විස්තර කරමු. තෘෂ්ණාව " බලවත් ආශාව,.... හැඟීම්, නපුරු දේ කෙරෙහි මිනිසා තුළ ඇති ස්වාභාවික ළැදිකම "වේ. නපුරු දේවල් කෙරෙහි අප ආශා නොවිය යුතු බවට බයිබලය අපට අනතුරු අඟවයි.

**ඉඳින් ඔවුන් නපුරු දේවලට ආශාවුණාක් මෙන් අප විසිනුත් ආශා නොවන පිණිස මේ කාරණා අපට ආදර්ශ විය (1 කොරින්ති 10:6)**

ඔබගේ මාංශික ස්වභාවය සතුටු කරවන නපුරු දේවල් කෙරෙහි ආශාවීම "මාංශයේ තෘෂ්ණාවයි". සාතන් අභ්‍යන්තරයෙන් පහර දෙන්නේ එසේය. එය දේශයක් තුළ ඇති සිවිල් යුද්ධයක් සේය. ඔබගේ ආත්මය හා මාංශය එකිනෙකාට එරෙහිව සටන් කරන්නේය.

## තෘෂ්ණාව වර්ධනය වන්නේ කෙසේද? :

තෘෂ්ණාව හෝ පාපිෂ්ඨ ආශාවන් ප්‍රථමයෙන්ම ස්වාභාවික ඉන්ද්‍රියයන්ගෙන් ඇතුල් වෙයි. ඇස යම් නපුරු දෙයක් දකී. නැතහොත් කණ යම් දුෂ්ඨ දෙයක් අසයි. ස්පර්ශයක් රසයක් හෝ යම් සුවඳකින් පවා තෘෂ්ණාව සිතේ තැන්පත් කර ගත හැකිය. මාංශය පරීක්ෂාවට ලක්කරන පිණිස සාතන් ලෝකයේ වටා පිටාව යොදා ගන්නේ මෙසේය. මේ ස්වාභාවික ඉන්ද්‍රියයන් සිතේ නපුරු සිතිවිල්ලක් හෝ මනසේ ආශාවක් ක්‍රියාරම්භ කරයි. මෙය තෘෂ්ණාවයි. ඔබ නපුරු දේ කරන පිණිස පොළඹවන්නේ තෘෂ්ණා සිතිවිල්ලයි.

**යමෙකු පරීක්ෂා කරනු ලබන කල: මම දෙවියන්වහන්සේගෙන් පරීක්ෂා කරනු ලබමියි නොකියාවා. මක්නිසාද දෙවියන්වහන්සේ නපුරෙන් පරීක්ෂාකරනු ලබන්ට නුපුළුවන, උන්වහන්සේම කිසිවෙකු පරීක්ෂා නොකරනසේක. නුමුත් එක එක මනුෂ්‍යයා තම තමාගේ තෘෂ්ණාවෙන් අදිනු ලබන කල්හිද පොළඹවනු ලබන කල්හිද පරීක්ෂා කරනු ලබයි. (යාකොබ් 1:13-14)**

දෙවියන්වහන්සේ කිසි කලෙක ඔබ පරීක්ෂා නොකරන බව මතක තබා ගන්න. ඔබගේම පාපිෂ්ඨ, මාංශික තෘෂ්ණාවලින් අදිනු ලබන කල ඔබ පරීක්ෂා කරනු ලබයි. එහෙත් ඔබ මේ පරීක්ෂාවට යටත් විය යුතු නැත. දෙවියන්වහන්සේ සැම විටම ගැලවෙන මාර්ගය සාදා දෙන සේක.

**මනුෂ්‍යයා විසින් ඉසිලිය හැකි පරීක්ෂාවක් මිස අනිකක් නුඹලාට පැමිණුණේ නැත. නුමුත් දෙවියන් වහන්සේ විශ්වාස කෙනෙක්ය. උන්වහන්සේ නුඹලාගේ පුළුවන්කමට වඩා නුඹලා පරීක්ෂා කරනු ලබන්ට ඉඩ නොදී, නුඹලාට පරීක්ෂාව ඉවසිය හැකිවන පිණිස ඒ සමග ගැළවෙන මාර්ගයද සාදා දෙනසේක. (1 කොරින්ති 10:13)**

මාංශය පරීක්ෂා කරනු ලබන පිණිස මනස භාවිතා කරන අතර, පාවුලුතුමා අනතුරු අඟවයි:

**මාංසයේ ඇල්ම මරණයය; නුමුත් ආත්මයේ ඇල්ම ජීවනය හා සමාදානයය. කුමක් හෙයින්ද, මාංශයේ ඇල්ම දෙවියන්වහන්සේට සතුරුකමය; ඒක දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට යටත් නැත. යටත්වෙන්ටත් බැරිය. (රෝම 8:6-7)**

මනස ආත්මික සටනේ ප්‍රධාන යුධ පිටිය බව පසුව ඉගෙන ගන්නවා ඇත.

## මාංශික තෘෂ්ණාවේ ප්‍රතිඵල :

ඔබ මාංශික තෘෂ්ණාවට ඉඩදුනහොත් ප්‍රතිඵලය පරීක්ෂාවයි. ඔබ පරීක්ෂාවට ඉඩ දුනහොත් එහි ප්‍රතිඵලය මරණයට තුඩු දෙන පාපය වේ.

**එවිට තෘෂ්ණාව පිළිසිඳගත් කල්හි පාපය වදන්නිය. පාපයද සම්පූර්ණවූ කල්හි මරණය උපදවයි (යාකොබ් 1:15)**

මාංශික තෘෂ්ණාව නිසා ලෝකයා දූෂ්‍ය වී ඇත.

**ඒ කරණකොටගෙන උන්වහන්සේ තමන් අනර්ඝවූ ඉතා උතුම්වූ පොරොන්දු අපට දී තිබේ. එසේ කළේ තෘෂ්ණාව නිසා ලෝකයේ තිබෙන දූෂ්‍යකමෙන් නුඹලා ගැළවී, ඒ පොරොන්දු කරණකොටගෙන දේව ස්වභාවට පංගුකාරයන් වන පිණිසය. (2 පේත්‍රුස් 1:4)**

මාංශික තෘෂ්ණාව නිසා මාංශය දූෂ්‍ය වී ඇත.

**නුඹලාගේ ජීවිතයේ පළමු හැසිරීම ලෙස රැවටිල්ලේ තෘෂ්ණාවල් අනුව දූෂ්‍යවන්නාවූ පරණ මනුෂ්‍යයා පහ කර දමා, (එපීස 4:22)**

# මාංශය, ආත්මයට දක්වන සම්බන්ධතාව

**මක්නිසාද මාංසය ආත්මයාණන්වහන්සේට විරුද්ධව ද ආත්මයාණන්වහන්සේ මාංසයට විරුද්ධවද ආශා කරයි. නුඹලා කැමති වන දේ නොකරන ලෙස මොවුහු එකිනෙකාට විරුද්ධ වෙති. (ගලාති 5:17)**

ඔබ ගැළවීම ලබා ශුද්ධාත්මයෙන් පූර්ණ වූ විට, එම ශුද්ධාත්මය ඔබ තුළ වාසය කරනු ඇත. ඔබගේ ආත්මය තුළ ඇති ශුද්ධාත්මය මාංශයේ තෘෂ්ණාවට විරුද්ධ වේ. ඔබගේ මාංශය ඔබගේ ආත්මයටත්, ඔබ තුළ වෙසෙන දෙවියන්වහන්සේගේ ආත්මයටත් එරෙහිව සටන් කරනු ඇත. මාංශය ඔබව මාංශික තෘෂ්ණාවලට පොළඹවනු ඇත. බොහෝ අවස්ථාවල ඔබට, ඔබ කැමති ආකාරයට ජීවත්විය නොහැක්කේ එබැවිනි.

පාවුලුතුමා රෝම 7 පරිච්ඡේදයෙන් මාංශය හා ආත්මය අතර ඇති මෙම සටන විස්තර කරයි.

**එබැවින් යහපත කරන්ට කැමති වූ මා හට නපුරු තිබීම යන ව්‍යවස්ථාව ඇති බව මට පෙනේ. මක්නිසාද අභ්‍යන්තර මනුෂ්‍යයාගේ ප්‍රකාරයට මම දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට ප්‍රිය වෙමි. නුමුත් මාගේ සිතේ ව්‍යවස්ථාවට විරුද්ධව යුද්ධ කරන්නාවූ මාගේ අවයව තුළ තිබෙන පාපයාගේ ව්‍යවස්ථාව යටතෙහි මා වහල් කමට පමුණුවන්නාවූ අන්‍ය ව්‍යවස්ථාවක් මාගේ අවයව තුළ තිබෙන බව මට පෙනේ. (රෝම 7:21-23)**

## මාංශයේ කාර්යයන්:

මාංශයේ තෘෂ්ණාවන්, පරාජය නොකළහොත්, මාංශයේ පාපී ක්‍රියාවනට මග පෙන්වනු ඇත. එහි ප්‍රතිඵලය ආත්මික මරණය වේ.

**ඉඳින් මාංශයේ ක්‍රියා ප්‍රකාශව තිබේ. එනම්, වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදීකම, භේද, ලබ්ධි භේද, වෛර. බීමත්කම, මංගල්‍යය ඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. මෙබඳු දේ කරන්නට**

**දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම නුඹලාට ප්‍රථම කී ලෙසම, දැනුත් කලින් නුඹලාට කියමි.** (ගලාති 5:19-21)

මෙම ලයිස්තුව, පාප වර්ග හතරකට බෙදිය හැකිය.

| | |
|---|---|
| • නමස්කාර පාපය | පිළිමපූජා හා හූනියම් |
| • ලිංගික පාපය | කාමමිථ්‍යාචාරය, වෛශ්‍යාකම, අපවිත්‍රකම, හිරිඔතප් නැතිකම |
| • පෞද්ගලික පාපය | බීමත්කම හා ඝෝෂා සහිත උත්සව |
| • සම්බන්ධතා පාප | වෛරය, භේදය, උසස් වීමට උත්සාහ කිරීම, කෝපය, කලහ කිරීම, රාජ්‍යද්‍රෝහී වීම, ඊර්ෂ්‍යාව හා මිනී මැරීම |

මේ සෑම පාපතර ක්‍රියාවක්ම විස්තරාත්මකව භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ , ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය, නමැති පාඩමාලාවේ අර්ථ විග්‍රහ කර ඇත. එය ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලවලට වඩා වෙනස් වන අකාරය පෙන්වා ඇති අතර මේ ඵල ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය වර්ධනය කරගත යුතුය.

## ප්‍රබල නපුරු බලවේග

ලෝකයත්, මාංශයත්, සාතන් හා ඔහුගේ යක්ෂයන් සමග එක් වී ඇදහිලිවතුන්ට එරෙහිව යුද්ධ කරනු ඇත. මේවා නපුරාගේ ආත්මික බලවේග වේ. ඊළඟ පාඩමෙන් ඔබ ඉගෙන ගන්නේ නපුරාගේ මෙම ප්‍රබල ආත්මික බලවේග හා සටන් කරන උපක්‍රම වේ.

## පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ප්‍රධාන පදය ලියන්න

2. මෙම පාඩමේ භාවිතය අනුව "මාංශය" යන වචනයෙන් අදහස් වන්නේ කුමක්ද?

3. මෙම පාඩමේ භාවිතය අනුව "ලෝකය" යන වචනයෙන් අදහස් වන්නේ කුමක්ද?

4. මේ ලෝකයේ අධිපතියා කවුද?

5. වර්තමාන ලෝක පද්ධතියේ ගති ලක්ෂණ සාරාංශගත කරන්න

6. වර්තමාන ලෝක පද්ධතියේ පාපී තත්ත්වයට හේතු මොනවාද?

7. ඇදහිලිවතුන් වෙත ලෝකය දක්වන ආකල්පය කුමක්ද?

8. "මාංශයේ තෘෂ්ණාව" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

9. මාංශික තෘෂ්ණාව වර්ධන වන්නේ කෙසේද?

10. මාංශික තෘෂ්ණාව පාලනය නොකළහොත් කුමක් සිදුවේද?

11. මාංශයේ ක්‍රියාවන් හඳුන්වනු ලබන ශුද්ධ ලියවිලි පාඨ දෙන්න

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. මාංශයේ ක්‍රියාවන් පිළිබඳව තවදුරටත් ගලාති 5:19-21න් අධ්‍යයනය කරන්න.

2. මෙම නපුරු ක්‍රියාවන් ගලාති 6:22-23 හි සඳහන් ආත්මයේ ඵල හා ඇති වෙනස සමග සන්සන්දනය කරන්න.

3. යොහන් 1:1-15 හා 3 පරිච්ඡේද කියවන්න. ලෝකයාගේ පාපී, මාංශික තත්ත්වයන් තිබියදීත් ලෝකය වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය දෙස බලන්න. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමය පෙන්වීමට කුමක් කළ සේක්ද? ඊට ලෝකයා දැක්වූ ප්‍රතිචාරය කුමක්ද?

4. පරීක්ෂාව පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන්න.

   - සාතන් පරීක්ෂාකරු ලෙස හැඳින්වේ. මතෙව් 4:3, 1 තෙසලෝනික 3:15
   - නපුර කිරීම සඳහා දෙවියන්වහන්සේ මිනිසුන්ව පරීක්ෂා නොකරන සේක. යාකොබ් 1:13-14

   ඔබ පරීක්ෂා කරනු ලබන්නේ :

   - මනුෂ්‍යයන් විසිනි : මතෙව් 16:1, 19:3, 22:35, මාක් 8:11, 10:2, ලූක් 11:16, යොහන් 8:6
   - සාතන් විසිනි : මතෙව් 4:1, මාක් 1:13, ලූක් 4:2, 1 කොරින්ති 7:5
   - ඔබගේ තෘෂ්ණාවන් මගිනි : යාකොබ් 1:13-14
   - ඔබගේ වස්තුව මගිනි : 1 තිමෝති 6:9
   - පරීක්ෂාවට නොවැටෙන ලෙස ඔබ යාච්ඤා කළ යුතුය: මතෙව් 26:41, ලූක් 11:4, මාක් 14:38, 22:46
   - යේසුස්වහන්සේ පරීක්ෂා කරනු ලැබුවද පාපයක් නොමැති විය: හෙබ්‍රෙව් 2:18, 4:15
   - ඔබ පරීක්ෂාවෙන් ඉවසා දරා ගන්නෙහි නම් ඔබ ආශිර්වාද ලබන්නෙහිය : යාකොබ් 1:12
   - ඔබ පාපයෙන් ගළවා ගැනීමට දෙවියන්වහන්සේට පුළුවන : හෙබ්‍රෙව් 4:15, 2 පේත්‍රුස් 2:9, 1 කොරින්ති 10:13
   - පරීක්ෂාවන් ඔබ අසීරුතාවට පත් කරයි. එහෙත් සෑම පරීක්ෂාවක්ම ප්‍රීති දෙන්නක් ලෙස ඔබ සැලකිය යුතුය : යාකොබ් 1:2, 1 පේත්‍රුස් 1:6

5. ඔබ පරීක්ෂාවට හා ඉන්පසු පාපය වෙතට ගෙන ගිය මාංශික තෘෂ්ණාවන් ඔබ අත් දකින්නෙහිද? 1 යොහන් 1:8-9 හි ඇති උපක්‍රම අනුගමනය කරන්න.

6. ඇදහිලිවතුන් තුළ මාංශයේ ක්‍රියාවන් හා කෙරෙන සටන පාවුලු තුමා හැඳිනගන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ හා මාංශය අතර කෙරෙන සටන විස්තර කෙරෙන සන්දර්භය තුළය. ගලාති 5:16-26 බලන්න.

# අටවන පරිච්ඡේදය

## සතුරාගේ උපක්‍රම

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දෙවියන්වහන්සේ හා සම්බන්ධව සතුරාගේ උපක්‍රම සාරාංශගත කිරීමට
- ජාතින් හා සම්බන්ධව සතුරාගේ උපක්‍රම සාරාංශගත කිරීමට
- නොඇදහිලිවතුන් හා සම්බන්ධව සතුරාගේ උපක්‍රම සාරාංශ ගත කිරීමට
- ඇදහිලිවතුන් හා සම්බන්ධව සතුරාගේ උපක්‍රම සාරාංශගත කිරීමට
  හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ගත් ප්‍රධාන පදය

**සිහි ඇතිව, අවදිව ඉඳිල්ලා. නුඹලාගේ විරුද්ධකාරයා වූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. ලෝකයෙහි සිටින නුඹලාගේ සහෝදරයන් කෙරෙහි එම දුක්ම පැමිණෙන බව දැන, නුඹලාගේ ඇදහිල්ලෙහි ස්ථිරව සිට, යක්ෂයාට විරුද්ධව සිටපල්ලා.** (1 **පේත්‍රුස්** 5:8-9)

## හැඳින්වීම

මෙම පාඩමෙන් අපගේ සතුරාගේ එනම් සාතන්ගේ පොදු උපක්‍රම පිළිබඳව සමස්ත දැක්මක් ඉදිරිපත් කෙරේ. ඊළඟ පරිච්ඡේදයෙන් ඔබට ඉදිරිපත් කෙරෙන්නේ දෙවියන්වහන්සේගේ “සටනේ සැලැස්ම”, පිළිබඳ සමස්ත දැක්මකි. ඉන් පසුව ඇති පාඩම්වලින්, ඔබ ආත්මික යුද්ධායුධ මගින් සන්නද්ධ වූ පසු, සතුරාගේ සියලු නපුරු සැලසුම් පරාජය කිරීමේ සුවිශේෂ ප්‍රති උපක්‍රම ඔබට සපයනු ලැබේ. එහෙත් පළමුවෙන් දෙවියන්වහන්සේ, ජාතින්, නොඇදහිලිවතුන් හා ඇදහිලිවතුන් හා සම්බන්ධව සතුරාගේ පොදු උපක්‍රම ඔබ අවබෝධ කර ගත යුතුය.

## සතුරා සහ දෙවියන්වහන්සේ

සාතන්ගේ මුල් පාපය වූයේ. ඔහු දෙවියන්වහන්සේ මෙන් වීමට උත්සාහ කිරීමය. එබැවින් ඔහුගේ වර්තමාන බලය හා කාර්යයන් එල්ල කොට ඇත්තේ මූලිකවම දෙවියන්වහන්සේට එරෙහිව වේ. මේ නිසා ඔහුගේ අනෙකුත් සියලුම කාර්යයන් හා ඔහුගේ ස්වභාවයම දකින්නේ ඔහුගේ මුල් කැරලිකාර තෘෂ්ණාවෙන් පැන නැගුණු දෙයක් ලෙසය.

නිදසුනක් වශයෙන්, මුල්ම පුරුෂයා හා ස්ත්‍රිය, එනම් ආදම් සහ ඒව, වෙත එල්ලවූ සාතන්ගේ පහරදීම, සැබවින්ම දෙවියන්වහන්සේගේ චරිතය හා පාලනය වෙත එල්ල වූ ප්‍රහාරයකි (උත්. 3:1-5). එමෙන්ම සාතන් දෙවියන්වහන්සේට එරෙහිව ආබෙල් මැරීමට කායින්ව පෙළඹවීය (1 යොහාන් 3:10-12). ශුද්ධ ලියවිල්ලේ වාර්තාකර ඇති සාතන්ගේ සියලුම පහරදීම් ඔබට අධ්‍යයනය කළ හැකිය. එමගින් මේ පහරදීම් සැබවින්ම දෙවියන්වහන්සේටත් උන්වහන්සේ ක්‍රියාකාරකම්වලට හා ස්වභාවයටත් කළ පහරදීම් බව ඔබට පෙනෙනු ඇත.

සාතන්, සෑම ක්‍රියාකාරකමකින් හා ස්වභාවයේ ගුණාත්මක බවින් දෙවියන්වහන්සේට සෘජුවම විරුද්ධය. නිදසුනක් වශයෙන් දෙවියන්වහන්සේ ප්‍රේමය වන අතර සාතන් වෛර කරමින් වෛරය පතුරුවයි (1 යොහාන් 3:7-15) දෙවියන්වහන්සේ ජීවිනය වන අතර ජීවිතය මවන සේක. එහෙත් සාතන් මරණයට හා විනාශයට අනුබල දෙයි. (හෙබ්‍රෙව් 2:14)

සාතන් දෙවියන්වහන්සේට හා උන්වහන්සේගේ ස්වභාවයට විරුද්ධවන පමණක් නොව උන්වහන්සේගේ වැඩ සැලැස්මද විරුද්ධ වේ. ඔහු දෙවියන්වහන්සේට නැතැයි කියයි (ගීතා. 14:1-3) බොරුවට අනුබල දෙයි (එපීස 2:2, 2 තෙස, 2:8-11). එමෙන්ම ව්‍යාජ ආගම්, ගුප්ත වැඩ හා

විවිධ ඇදහිලිද ඒවායේ ධර්මයන් හා ක්‍රියාවන් පසුපස සිටී. සාතන්ගේ ආගමික පද්ධතියේ ප්‍රතිඵලය වන්නේ ව්‍යාජ ගුරුවරුන්, දිවැසිවරුන් හා "ක්‍රිස්තුස්" වරුන් ඇති වීමය. ඔබ "උස් තැන්වල ආත්මික දුෂ්ටකම" අධ්‍යයනය කරන විට මේ පිළිබඳව වැඩිදුරටත් ඉගෙන ගන්නෙහිය.

සාතන්, දෙවියන්වහන්සේට හා උන්වහන්සේගේ සැලසුම්වලට එරෙහිව ඇතිකරන කැරැල්ලේ උච්චම ස්ථානයට පැමිණෙන්නේ. මෙම පාඨමාලාවේ අවසාන පරිච්ඡේදයේ සඳහන් "අවසාන සටන" සාකච්ඡා කරන විට වේ. මෙම නපුරු උපක්‍රම තිබියදීත් සාතන් හා ඔහුගේ මහත්වූ යක්ෂ බලය, සර්වබලධාරී දෙවියන්වහන්සේට තර්ජනයක් නොවේ.

## සතුරා සහ ජාතීන්

සාතන් "මේ ලෝකයේ දෙවියා" ලෙස හැඳින්වෙන අතර ඊට ඇදහිලිවතුන් නොවන මනුෂ්‍යයන් හා යක්ෂයාගේ දූතයන්ද ඇතුළත්ය (2 කොරි. 4:4). ක්‍රිස්තුස් වහන්සේ පරීක්ෂා කරන අවස්ථාවේදී ඔහු යේසුස්වහන්සේගෙන් ජාතිය බාරගන්නා ලෙස ඉල්ලීය. උන්වහන්සේ එම ඉල්ලීමෙහි නිත්‍යානුකූල භාවය ගැන තර්ක කළේ නැත. උන්වහන්සේ ප්‍රතික්ෂේප කළේ දෙවියන්වහන්සේට එරෙහිවී සාතන්ගේ ක්‍රමයට යටත්වී ජාතීන්ගේ පාලනය ලබාගැනීමය (මතෙ. 4:8-10).

සාතන් තම යක්ෂයන් යොදා ගනිමින් ජාතීන් කෙරෙහි බලපෑම් ඇතිකර රවට්ටන අතරම නායකයන් හා සෙනග දෙවියන්වහන්සේ වෙතින් ඈත් කරයි. බොහෝ දේශයන්හි අභක්තික දේශපාලන පද්ධති හා නපුරු ඒකාධිපතීන් සිටින්නේ එබැවිනි. ජාතීන් අතර බෙදීම් හා සටන් ඇතිවන්නේද ඒ නිසාමය. සභාවටත් දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනග වන ඉශ්‍රායෙලටත් එරෙහිව සාතන් විශේෂයෙන්ම බලපෑම් ඇති කරයි. එමෙන්ම ශුභාරංචිය පැතිරවීමට බාධා ඇතිකිරීමට රජයයන් තුළින්ද ඔහු ක්‍රියා කරයි.

පීඩා සමයේදී සාතන් සැබැවින්ම ජාතීන් දහයක කණ්ඩායමක කටයුතු ක්‍රිස්තු විරෝධියා මගින් මෙහෙයවනු ඇත. ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊමෙන් පසු සාතන්ව වසර දහසකට බැඳ තබනු ලැබේ. (එළිදරව් 20:3) ඔහුව නිදහස් කළ පසු නැවත එක් වතාවක් ජාතීන් රවටා ඔවුන් දෙවියන්වහන්සේට හා යෙරුසලමට එරෙහිව එක්රැස්වීමට සලස්වනු ඇත (එළිදරව් 20:7-10). අවසානයේදී පොළොවේ සියලුම රාජ්‍යයන් හා සාතන්ගේ රාජ්‍යය අපගේ ස්වාමීන් හා ගැළවුම්කාරයාණන් වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රාජ්‍යයන් බවට පත්වන්නේය.

## සතුරා හා නොඇදහිලිවන්තයෝ

නොඇදහිලිවතුන්ට එරෙහිව ක්‍රියාත්මකවන මහා බලවත් උපක්‍රමයක් සතුරාට තිබේ. ඔහු ශුභාරංචියට ඔවුන්ව අන්ධකොට (2 කොරි. 4:3-4) ශුභාරංචිය ඔවුන්ට ඇසෙන විට කිසිදු ප්‍රතිචාරයක් ඇති නොවන පිණිස (ලූක් 8:12) එහි සත්‍යය උදුරා ගනු ලැබේ. එවිට එහි ප්‍රතිඵලයක් වශයෙන් පාපයේ නැතිවූ අයට ශුභාරංචිය මෝඩකමක් හා අදාළ නොවන දෙයක් ලෙස හැඟෙනු ඇත. (1 කොරි. 1:18)

සාතන් බොහෝ නොඇදහිලිවන්තයන්ව ව්‍යාජ ආගම් නමැති උගුලට අසුකරගන්නා අතර (1 තිමෝති 4:1-3) මෙම යුගයේ දර්ශනය වන "ලෝකයේ මාර්ගය" අනුව ගමන් කිරීමට මග පෙන්වනු ඇත. එම දර්ශනය පරම්පරාවෙන් පරම්පරාවටත්, සංස්කෘතියෙන් සංස්කෘතියටත් වෙනස් විය හැකිය. එහෙත් එය සෑම අවස්ථාවකම මනුෂ්‍ය-කේන්ද්‍රීය හා මනුෂ්‍යයන්ට අනුබල දෙන්නක් මිස දේව-කේන්ද්‍රීය නොවේ. සාතන් නිරන්තරයෙන්ම කැරැල්ලේ (පාපයේ) බීජ නොඇදහිලිවතුන්ගේ හදවත්වල හා සිත්වල වපුරයි.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ එක් පරමාර්ථයක් වන්නේ නොඇදහිලිවතුන්ගේ ආත්මයන් වෙනුවෙන් සාතන්ට එරෙහිව සටන් කිරීම වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට දෙවියන්වහන්සේට එරෙහිව ඔවුන්ගේ පාපී කැරැල්ල පිළිබඳව ඒත්තුගන්වන්නට ක්‍රියා කරන සේක (යොහාන් 16:7-11)

# සතුරා සහ ඇදහිලිවන්තයෝ

ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ ගැළවුම්කරු වශයෙන් පිළිගත් විට, සටන අවසන් බව කොහෙත්ම ඉන් අදහස් නොවේ. ඔබ ගැළවීම ලද විට එක් ප්‍රධාන ගැටුමකින් ඔබ ජයගෙන ඇත. එහෙත් සැබවින්ම ඔබේ ප්‍රබල සටන ඇරඹුනා පමණි.

ඔබ මෙම පාඨමාලාව අධ්‍යයනය කරන විට සාතන්ගේ සුවිශේෂී උපක්‍රම බොහෝමයක් ඉගෙන ගනු ඇත. එමෙන්ම ඔබ ආත්මික ආයුධවලින් සන්නද්ධ වන අතර සතුරාගේ බල ප්‍රදේශයට ඇතුළුවීමට සූදානම්ව සිටිනු ඇත. එසේ වුවද මේ සියලූ පහරදීම් ප්‍රධාන ක්ෂේත්‍ර හතරකට සාරාංශගත කළ හැකිය. ඇදහිලිවන්තයෙකුගේ ජිවිතය තුළ සාතන් පහර දෙන්නේ :

## දේව වචනයටය:

දේව වචනය පිළිබඳව ප්‍රශ්න ඇසීමට සාතන් ඔබව පොළඹවනු ඇත. එමෙන්ම ඔහු ශුද්ධලියවිල්ලට නොයෙකුත් දේ එකතු කිරීමට හෝ ඉන් අඩු කිරීම හෝ එය විකෘති කිරීම හෝ කරනු ඇත. ප්‍රථම පරීක්ෂාවට ඒව භාජනය කිරීමේදී මෙය සිදු වූ බව මතක තබා ගන්න. දේව වචනය ඉතා හොඳින් අධ්‍යයනය කර වටහා ගැනීම වැදගත් වන්නේ එබැවිනි. එවිට මෙම පහරදීම් වලින් ඔබ නොරැවටෙනු ඇත.

## ඔබගේ දේව නමස්කාරයටය:

සාතන්ගේ මුල් කරුල්ලට හේතු වුයේ නමස්කාර ලැබීමට ඇති ඔහුගේ ආශාවයි. එබැවින් ඔහු විශේෂයෙන්ම ඉලක්ක කර ගන්නේ ඇදහිලිවතුන්ගේ නමස්කාරය වේ. ඔබ නමස්කාරයෙන් වළක්වාලීමට හෝ ව්‍යාජ හෝ මාංශමය හෝ නමස්කාර ක්‍රමවලට ඔබ ඇද දැමීමට හෝ ඔහු උත්සාහ කරනු ඇත.

## දෙවියන්වහන්සේ සමග ඔබ යන ගමනටය:

දෙවියන්වහන්සේ සමග ඔබ පෞද්ගලිකවම යන ගමනට සාතන් පහර දෙයි. ඔහු ඔබට චෝදනා කරයි, අපහාස කරයි, මාංශමය ක්‍රියාවල නිරත වීමටත්, ලෞකික දේවල ඇලී සිටීමටත්, ඔබගේම මානුෂික ප්‍රඥාව හා ශක්තිය කෙරෙහි විශ්වාසය තැබීමටත් ඔබව පොළඹවයි. ඔබ දෙවියන්වහන්සේ හා යන ගමනේ බලප්‍රදේශය සාතන්ට ජයගත හැකිනම් පහත දැක්වෙන ඊළඟ ක්ෂේත්‍රයේ ඔබ පරාජය කිරීමට ඔහුට පහසු වනු ඇත.

## ඔබ දෙවියන්වහන්සේ උදෙසා කරන කාර්යයටය:

ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් කරන සේවයටද සාතන් පහර දෙයි. ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම, පීඩාවන්, ව්‍යසනයන්, අධෛර්යකිරීම්, යාච්ඤා නොකිරීම් හා වැඩ අධිකකම් ආදියෙන් වැළැක්වීමට ඔහු උත්සාහ කරයි. එමෙන්ම ඔබ දෙවියන්වහන්සේට කරන වැඩ කෙරෙහි ව්‍යාජ ගුරුවරුන් හා ශ්‍රාවකයන් සභාව තුළට රිංගවීමෙන් බලපෑම් ඇති කිරීමට උත්සාහ කරයි (2 කොරි 11:13-15, 2 පේත්‍රුස් 2:1-19, මතෙව් 13:38-39).

දෙවියන්වහන්සේ ඔබගේ සේවය තුළින් හොඳ බීජ වපුරන අතර සතුරා කිරිඳි වපුරයි. එනම් "නපුරාගේ පුත්‍රයන්" වේ. ඔහු ක්‍රිස්තුස්වහන්ස්ගේ ශරීරයේ භේද ඇති කිරීමට අනුබල දෙමින් දෙවියන්වහන්සේගේ කාර්යයටත් ඔබගේ ජිවිතයේ හා සේවයේ උන්වහන්සේගේ අභිප්‍රායටත් බලපෑම් ඇති කරන්නට උත්සාහ කරයි.

# එසේ නම් --- ඔබට කළ හැක්කේ කුමක්ද?

සාතන් දෙවියන්වහන්සේටත්, ජාතීන්ටත්, නොඇදහිලිවතුන්ටත්, ඇදහිලිවතුන්ටත් එරෙහිව ක්‍රියා කරන අතර ඔහුගේ උපක්‍රම සැබැවින්ම විවිධය, ප්‍රබලය.

ඔබ පසුගිය පාඩම් හතරින්, සතුරාත්, නපුරු ආත්මික බලවේගත්, සතුරාගේ බලප්‍රදේශයත් හා උපක්‍රමත් ගැන අධ්‍යයනය කර ඇති හෙයින් මේ අවස්ථාවේ ඔබට වෙහෙසක් මෙන් දැනෙන්නට ඉඩ තිබේ. එහෙත් ඊළඟ පරිච්ඡේදයෙන් ඔබ , සතුරාගේ ඕනෑම වැඩ පිළිවෙලකට වඩා ශ්‍රේෂ්ඨ “සටන් සැලැස්මක්” දෙවියන්වහන්සේට ඇති බව ඉගෙන ගන්නවා ඇත.

ඔබ දැන් ඒ සැලැස්ම අධ්‍යයනය කිරීමට සූදානම්ය. ඔබගේ ආත්මික යුද්ධායුධවලින් සන්නද්ධව සටනට සූදානම් වන්න.

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපි වලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. දෙවියන්වහන්සේ හා සම්බන්ධව සතුරාගේ උපක්‍රම සාරාංශගත කරන්න.

3. ජාතීන් හා සම්බන්ධව සතුරාගේ උපක්‍රම සාරාංශගත කරන්න.

4. නොඇදහිලිවතුන් හා සම්බන්ධව සතුරාගේ උපක්‍රම සාරාංශගත කරන්න.

5. ඇදහිලිවතුන් හා සම්බන්ධව සතුරාගේ උපක්‍රම සාරාංශගත කරන්න.

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. ඔබ ජීවත්වන දේශය විශ්ලේෂණය කරන්න. ඔබගේ දේශයේ සතුරා ක්‍රියාත්මක කරන උපක්‍රම මොනවාද?

2. ඔබ යාච්ඤා කරන ඔබ වටා සිටින නොඇදහිලිවතුන් විශ්ලේෂණය කරන්න. සතුරා ශුභාරංචිය උදෙසා ඔවුන්ගේ ඇස් අන්ධකර තිබේද? ඔවුන්ට ඉදිරිපත් කරන ශුභාරංචි පණිවුඩය ඔහු උදුරා ගන්නේද? ව්‍යාජ ආගම් ඔවුන්ගේ සිත්වලට කා වද්දන්නේද? ඔවුන් ජීවත් වන්නේ "ලෝකයේ ආකාරයට" හා එහි ජීවන රටාව අනුවද? මේවා ඔබගේ යාච්ඤාවට ඇතුළු කර ගන්න.

3. සාතන්ගේ සිවු වැදෑරුම් චෝදනා දෙස බලන්න.

   - ඔහු ඇදහිලිවතුන් ඉදිරියේ දෙවියන්වහන්සේට චෝදනා කරයි. උත්. 3:1-5
   - ඔහු දෙවියන්වහන්සේ ඉදිරියේ ඇදහිලිවතුන්ට චෝදනා කරයි. යෝබ් 1-2, එළිදරව් 12:9-10
   - ඔහු ඇදහිල්වන්තයෙකුගේ හෘද සාක්ෂිය ඉදිරියේ ඔහුට චෝදනා කරයි. යෙරමියා 31:34, රෝම 8:33-39
   - ඔහු අනෙකුත් ඇදහිලිවන්තයන් ලවා ඇදහිලිවන්තයින්ට චෝදනා කරයි. මතෙ. 16:13-23, රෝම 8:33-39

4. ඔබගේ ජීවිතය ගැන සිතන්න. දේව වචනය, ඔබගේ නමස්කාරය, දෙවියන්වහන්සේ සමග ගමනේ හා දෙවියන්වහන්සේ වෙනුවෙන් කරන සේවය යන මේවා පිළිබඳව සාතන් ඔබට පහර දී ඇති ආකාරය විශ්ලේෂණය කරන්න

**දේව වචනය :**

______________________________

**දේව නමස්කාරය :**

______________________________

**දෙවියන්වහන්සේ සමග ගමන :**

______________________________

**දෙවියන්වහන්සේ වෙනුවෙන් සේවය :**

______________________________

මීලඟ පාඩමෙන්, මේ සෑම ක්ෂේත්‍රයකම සටන ජය ගැනීම සඳහා යෙදිය හැකි ප්‍රති උපක්‍රම ඔබ ඉගෙනගන්නෙහිය.

# නවවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේගේ සටන් සැලැස්ම

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දෙවියන්වහන්සේගේ අභිප්‍රාය හැඳිනගැනීමට
- යේසුස්වහන්සේ මෙලොවට වැඩිය පරමාර්ථය හැඳිනගැනීමට
- ආත්මික සටන සඳහා ඇති සය ආකාරයේ සටන් සැලැස්ම පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ගත් ප්‍රධාන පදය

**පව් කරන තැනැත්තේ යක්ෂයාගෙන්ය. මක්නිසාද යක්ෂයා පටන් ගැන්මේ සිට පව්කරන්නේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශ කරනු ලැබුවේ. මේ පිණිසය, එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශ කරන පිණිසය.** (1 යොහන් 3:8)

## හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් ආත්මික යුද්ධයේ මූලික සටන හඳුන්වාදෙයි. එය යාච්ඤාවෙන්, නිරාහාරව සිටීමෙන් හා ලිඛිත දේව වචනයේ පදනම මත අපගේ අණ දෙන නිලධාරියා සමග සන්නිවේදනය කරමින් හා අපගේ යුද්ධයේ පරමාර්ථය අවබෝධ කරගැනීම මත රඳා පවතින උපක්‍රමයකි.

ඔබට දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා සැලසුම් අවබෝධ නුවූ විට, ජීවිතයේ ගැටුම් නිසා අධෛර්ය වීමට ඔබ පෙළඹෙනු ඇත. බොහෝ කිතුනු භටයන් අසාර්ථක වීමට හේතුව මෙය වේ. සටන පිටුපස ඇති දිව්‍යමය පරමාර්ථය ඔවුහු අවබෝධ කර නොගනියි.

**ඉදින් මා නුඹලාට කියන්නේ නම්, මේ මනුෂ්‍යයන්ගෙන් වැළකී ඔවුන්ට කිසිවක් නොකරන ලෙසය. මක්නිසාද මේ මන්ත්‍රණය හෝ මේ ක්‍රියාව මනුෂ්‍යයන්ගෙන් වී නම්, ඒක පෙරළා දමනු ලබන්නේය. නුමුත් ඒක දෙවියන්වහන්සේගෙන් වී නම්, ඔවුන් පරාජය කරන්ට නුඹලාට බැරිය. එසේ උත්සාහ කළොත් සමහර විට නුඹලා දෙවියන්වහන්සේට විරුද්ධව පවා යුද්ධකරන්නහු වන්ට පුළුවනැයි කීවේය.** (ක්‍රියා 5:38-39)

## යුද්ධයේ පරමාර්ථය

ආරම්භයේ සිටම, සැම ස්වභාවික සටනකටම, එසේ සටන් කිරීමට හේතුවක් තිබිණි. දෙවියන්වහන්සේගේ යුද සැලැස්ම විභාග කිරීමට පෙර ආත්මික සටනේ පරමාර්ථය අවබෝධ කරගැනීම වැදගත් වේ. මේ සඳහා පියවූ දෙවියන්වහන්සේගෙත් පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙත් අභිප්‍රායන් අවබෝධ කර ගැනීම කළ යුතුය.

### දෙවියන්වහන්සේගේ අභිප්‍රාය :

දෙවියන්වහන්සේගේ අභිප්‍රාය වන්නේ :

**එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය.**
**(එපීස 1:9-10)**

ආරම්භයේ සිටම මෙම පරමාර්ථය ඉටු කිරීමට එරෙහිව සාතන් සටන් කර ඇත. ආත්මික ලෝකයේ ඔබගේම ආත්මික සටන දෙවියන්වහන්සේගේ මෙම පරමාර්ථයට සම්බන්ධය. සාතන් සටන් කරන්නේ ඔබගේ හදවත, මනස, ආත්මය හා ප්‍රාණය, ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට නොව ඔහු වෙතට පක්ෂපාත වීමට සැලැස්වීමට වේ.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට ඔබ තුළ ක්‍රියා කරන සේක.

> **මක්නිසාද, තමන්වහන්සේගේ යහපත් කැමැත්ත නිසා, කැමති වෙන්ටත්, වැඩ කරන්ටත්, නුඹලා තුළ ක්‍රියා කරන්නේ දෙවියන්වහන්සේමය. (පිලිප්පි 2:13)**

එමෙන්ම උන්වහන්සේගේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට දෙවියන්වහන්සේ ඔබ ජීවිතය තුලින් ක්‍රියාකරන සේක.

> **නුඹලාගේ අවයවයන් අධර්මිෂ්ටකමේ ආයුධ කොට පාපයට භාර නොදී, නුඹලාම මළවුන්ගෙන් ජීවත්ව සිටින්නන් මෙන් දෙවියන්වහන්සේට භාර වී නුඹලාගේ අවයවයන් ධර්මිෂ්ඨ කමේ ආයුධ කොට උන්වහන්සේට භාර දෙන්න. (රෝම 6:13)**

ඔබ ඔබවම "ධර්මිෂ්ඨකමේ ආයුධ කොට උන්වහන්සේට භාර දුන් විට" ඔබගේ ජීවිතය හා සේවය දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සැලසුම් සමග සුසංගත වේ. එසේ කිරීමෙන් ඔබ දෙවියන්වහන්සේගේ සතුරාවූ සාතන්ගේ ඉලක්කයක් බවට පත්වේ.

## යේසුස්වහන්සේගේ අභිප්‍රාය :

යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **පව්කරන තැනැත්තේ යක්ෂයාගෙන්ය. මක්නිසාද යක්ෂයා පටන්ගැන්මේ සිට පව්කරන්නේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිණිසය. එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශ කරන පිණිසය. (1 යොහන් 3:8)**

යේසුස්වහන්සේ මෙලොවට පැමිණියේ සාතන්ගේ ක්‍රියාවන් විනාශ කිරීමට වේ. මේ නිසා සතුරා උන්වහන්සේට විරුද්ධ විය.

> **සොරා එන්නේ සොරකම් කරන්නටත් මරන්නටත් විනාශ කරන්නටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහාන් 10:10)**

තමන්වහන්සේ මෙලොව මෙහෙය ආරම්භයේ සිටම, සාතන්ගේ ක්‍රියා විනාශ කිරීමට යේසුස් වහන්සේ පටන්ගත් සේක.

- පාපයේ වහල්කම උන්වහන්සේ එළිදරව් කළ සේක (යොහාන් 8:34)
- උන්වහන්සේ පාපය කමා කළ සේක (මතෙ. 9:1-8, මාක් 2:1-12, 17, ලූක් 4:17-32)
- රුවටිලිකාර බාහිර පෙනුමට වඩා හදවතේ අභ්‍යන්තර තත්ත්වය උන්වහන්සේ අවධාරණය කළ සේක. (මතෙව් 15:16-20, මාක් 7:20-23, ලූක් 6:45, 11:39)
- උන්වහන්සේ රෝගීන් සුවකළ සේක (මතෙව් 11:5)
- උන්වහන්සේ මිනිසුන් මලවුන්ගේ නැගුටවූ සේක (මාක් 5:35-43, ලූක් 8:49-56, යොහාන් 11)
- උන්වහන්සේ යක්ෂාවේශ බලවේගවලින් මිනිසුන් නිදහස් කළ සේක. (මතෙ. 8:16)

කෙටියෙන් පැවසුවහොත්, උන්වහන්සේ පුරුෂයන් හා ස්ත්‍රීන්ගේ හදවතෙහි, ප්‍රාණයේ , මනසෙහි හා ශරීරයෙහි ඇති සාතන්ගේ ක්‍රියා සියල්ල විනාශ කළ සේක.

> **අන්ධයෝ පෙනීම ලබති, කොරු ඇවිදිති, කුෂ්ට රෝගීහු පවිත්‍ර කරනු ලබති. බිහිරන්ට ඇසෙයි, මළාහු නැගිටුවනු ලබති, දිළිඳුන්ට ශුභාරංචිය ප්‍රකාශ කරනු ලැබේ. (මතෙව් 11:5)**

යේසුස්වහන්සේ සාතන්ගේ ක්‍රියා විනාශ කළා පමණක් නොව, උන්වහන්සේ සතුරාගේ කූට උපක්‍රම හෙළි කළ සේක.

- අන්තිම දවස්වල මෙලොවේ වර්ධනය වන්නාවූ සාතන්ගේ රැවටිලිකාරකම් ගැන උන්වහන්සේ ඉගැන්වූ සේක. (මතෙව් 24-25, මාක් 13, ලූක් 17:22-27, 21:8-36)
- ප්‍රාණය විනාශ කිරීමට හැකියාවක් ඇති සාතන් පිළිබඳව උන්වහන්සේ අනතුරු ඇඟවූ සේක. (මතෙව් 10:28)

- බලවන්තයාගේ (සාතන්ගේ) වස්තු කොල්ලකෑමට පෙර ඔහු බැඳතැබීමේ අවශ්‍යතාව ගැන උන්වහන්සේ කතා කළ සේක. (මතෙව් 12:26-30, මාක් 3:23-27, ලූක් 11:17-24)
- දේව වචනය පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ හදවත් තුළ ඵලදායි වීම වැළැක්වීමට සාතන් ක්‍රියා කරන ආකාරය උන්වහන්සේ එළිදරව් කළ සේක. (මතෙව් 13:38. මාක් 4:15, ලූක් 8:12)
- දෙවියන්වහන්සේ සමග නිවැරදි සම්බන්ධතාවක් නැති අය “පියාවූ යක්ෂයාගේ” අය බව උන්වහන්සේ එළිදරව් කළ සේක (යොහන් 8:44-47)
- සාතන් “ලෝකයේ අධිපතියා” ලෙස උන්වහන්සේ පෙන්වූ සේක (යොහන් 14:30)

## මහා බෙදුම

යේසුස්වහන්සේ මෙලොවට වැඩියේ දෙවියන්වහන්සේගේ සමාදානයත් (යොහන් 14:27 පිලිප්පි 4:7) දෙවියන්වහන්සේ සමග සමාදානයත් (රෝම 5:1) ගෙන ඒම පිණිස වුවද, උන්වහන්සේ බෙදීමද ගෙන ආ සේක.

> **පොළොවෙහි සමාදානය දෙන්ට මම ආවෙමියි. නොසිතන්න. සමාදානය නොව කඩුවක් දෙන්ට ආවෙමි. මක්නිසාද මනුෂ්‍යයෙකු තමාගේ පියා සමගද දුව ඇගේ මව් සමගද යෙහෙළි ඇගේ නැන්දා සමගද භේද කරවන පිණිස ආවෙමි. මනුෂ්‍යයෙකුගේ සතුරෝ නම් ඔහුගේම ගෙයි වැසියෝය. (මතෙව් 10:34-36)**

යේසුස්වහන්සේ සියලුම මිනිසුන් කඳවුරු දෙකකට බෙදූ සේක. පැත්තක් නොගෙන සිටිය නොහැකිය.

> **ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවයකරන්ට කිසිවෙකුට නුපුළුවන. මක්නිසාද ඔහු එක්කෙනෙකුට වෛරව් අනික් අයට ප්‍රියවන්නේය. නොහොත් එක්කෙනෙකුට ඇලුම්ව් අනික් අය හෙළාදකින්නේය. දෙවියන්වහන්සේට සහ වස්තුවටත් සේවයකරන්ට නුඹලාට නුපුළුවන. (මතෙව් 6:24)**

> **මාගේ පක්ෂයට නොසිටින්නා මට විරුද්ධය, මා සමඟ රැස් නොකරන්නා විසුරුවන්නේය. (ලූක් 11:23)**

යේසුස්වහන්සේ මේ මහා බෙදීම පිළිබඳව මාර්ග දෙකේ කතාවෙන් පෙන්වූ සේක. එකක් සෘජුය පටුය, අනෙක පළල්ය. බොහෝ දෙනෙක් ගමන් ගන්නාවූ සාතන්ගේ රැවටිලිකාර පළල් මාර්ගය ගැන උන්වහන්සේ අනතුරු ඇඟවූ සේක (මතෙ. 7:13-14). පොහොසත් මිනිසා හා ලාසරස් අතර කතාව මගින් (ලූක් 16:19-31) යේසුස්වහන්සේ ජීවිතය හා මරණය අතර ඇති කඩතුරාව ඉවත් කළ සේක. වැරදි මාර්ගය තෝරා ගැනීමේ අවසාන ප්‍රතිඵලය මිනිසුන්ට දැක ගැනීමට උන්වහන්සේ සැලසූ සේක.

උන්වහන්සේ සාතන්ගේ ක්‍රියා එළිදරව් කර විනාශ කළ බැවින්, යේසුස්වහන්සේ සිය ජීවිතය මුළුල්ලේම සාතන්ගේ ප්‍රහාරයන්ට ලක් වූ සේක. නිරන්තරයෙන්ම උන්වහන්සේ විනාශ කිරීමට හෝ උන්වහන්සේ මෙලොවට පැමිණි මෙහෙය කඩා කප්පල් කිරීමට හෝ සතුරා උත්සාහ කළේය. උන්වහන්සේ උපන් විගස උන්වහන්සේගේ ජීවිතය විනාශ කිරීමට උත්සාහයක් දැරීය. උන්වහන්සේ ප්‍රසිද්ධ සේවයේ යෙදෙන අතරතුර උන්වහන්සේගේ ජීවිතය විනාශ කිරීමට බොහෝ කුමන්ත්‍රණ තැබූ අතර අවම වශයෙන් උන්වහන්සේව ඝාතනය කිරීමට උත්සාහ කළ එක් අවස්ථාවක් අසාර්ථක විය. යක්ෂාවේශ බලවේග වලින්ද ආගමික නායකයන්, තමන් වහන්සේගේම අනුගාමිකයන් හා සාතන් ගෙන්ද පැමිණි විරෝධතාවලට උන්වහන්සේ මුහුණ දුන් සේක.

ඔබ යේසුස්වහන්සේ තමාගේ ගැළවුම්කරු ලෙස පිළිගැනීමෙන් උන්වහන්සේගේ සැලැස්ම හා අභිප්‍රාය සමග එකඟ වන අතර ඔබ සාතන්ට එරෙහි යුද හමුදාවේ භටයෙකු වන්නේය. එවිට ඔබගේ පරමාර්ථයන් යේසුස්වහන්සේගේ පරමාර්ථයන්ම වන අතර එමගින් සතුරාට එරෙහි සෘජු උපායශීලි මගක ඔබ සිටිනු ඇත.

## සටන් සැලැස්ම

ආත්මික සටනට භාවිත කළ හැකි විවිධ ශුද්ධ ලියවිලි උපක්‍රම බොහෝමයක් තිබේ. එහෙත් ඇදහිලිවතුන් අනුගමනය කළ යුතු සටන් සැලැස්ම යේසුස්වහන්සේ සතුරා සමග කටයුතු කළ ආකාරය නිරීක්ෂණය කිරීමෙන් දැකගත හැකිය. ආත්මික මූලික සටන් සැලැස්ම ප්‍රධාන කරුණු හයක් මත රඳා පවතී. ඒවා මෙසේය.

- දේව වචනය
- පවරන ලද බලය හා අධිකාරී බලය
- යාච්ඤාව
- නිරාහාරව සිටීම
- දේව රාජ්‍යයේ යතුරු
- යේසුස් යන නාමය

## දෙවියන්වහන්සේගේ වචනය

යේසුස්වහන්සේ හා සාතන් මුහුණට මුහුණ ලා සම්මුඛ වූයේ සතුරා විසින් උන්වහන්සේව පරීක්ෂා කරනු ලැබූ විශේෂ අවස්ථාවේදී වේ. මෙම සමුවීමේදී අපගේ ආත්මික සටන් සැලැස්මේ ප්‍රධාන කොටසක් එළිදරව් විය. මෙම පාඩම අධ්‍යයනය කිරීමට පෙර මතෙව් 4:1-11, මාක් 1:12-13 හා ලූක් 4:1-13 හි වාර්තා කර ඇති මෙම පරීක්ෂාව පිළිබඳ විස්තරය කියවන්න.

පළමුව සාතන් උත්සාහ කළේ යේසුස්වහන්සේ ලවා ගල්, රොටි කිරීමටය. වතුර මිදියුෂ බවට පත් කළ යේසුස්වහන්සේගේ බලයට සැබැවින්ම ගල්, රොටි බවට හැරවිය හැකිය. එහෙත් මේ අවස්ථාවේ එය කිරීමෙන් සිදුවන්නේ දෙවියන්වහන්සේගෙන් ස්වාධීනව ක්‍රියා කිරීමක් හා තම ප්‍රයෝජනය උදෙසා බලය භාවිත කිරීමක් වේ.

ඊළඟට සාතන් උත්සාහ කළේ යේසුස්වහන්සේට දේව මාලිගාවේ මුදුනේ සිට බිමට පැනීමට සැලැස්වීමය. "පහතට පනින්න" යයි සාතන් කියූ වදන් බලන්න. සාතන්ට උන්වහන්සේව පහතට හෙළීමට නොහැකිය, මක්නිසාද සාතන්ගේ බලය සීමිත බැවිනි. පව්කිරීම සඳහා ඔබ පෙළඹවීමට සාතන්ට පුළුවන. එහෙත් ඔබ පහතට හෙළීමට ඔහුට නොහැකිය. ඔබ උගත් පරිදි සෑම මිනිසෙක්ම තමාගේම තෘෂ්ණාව නිසා පරීක්ෂාවනට ඇද දමයි. ඔහුට බලකිරීමක් නැත. ඇත්තේ පෙළඹවීමක් පමණි. මෙම පරීක්ෂාවේදී තම ඉල්ලීමට තල්ලුවක් ලබාදීමට සාතන් දේව වචනය භාවිත කළේය. එහෙත් එය භාවිත කළේ වැරදි ආකාරයෙනි (මතෙ. 4:6) දේව වචනය වැරදි ලෙස ව්‍යවහාර කිරීම සාතන්ගේ එක් ප්‍රබල උපක්‍රමයකි.

ඉහත පරීක්ෂා දෙකෙහිම සාතන් පැවසුවේ "ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම්" මේ දේ කරන්න යනුවෙනි. යේසුස්වහන්සේ මීට එකඟවූයේ නම් ඉන් හැඟෙන්නේ දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේගේ පුත්‍රභාවය සනාථ කිරීම ප්‍රමාණවත් නොවන බවකි. දෙවියන්වහන්සේ මේ වන විට ස්වර්ගයේ සිට කතා කරමින් මේ සම්බන්ධතාවය සනාථ කර තිබිණි (මතෙ. 3:17). සාතන් සෑම විටම පහරදීමට කේන්ද්‍ර කරගන්නේ දෙවියන්වහන්සේ සමග ඔබගේ ඇති සම්බන්ධතාව වේ. අවසාන පරීක්ෂාව තමාට නමස්කාර කරන ලෙස සාතන් කරන ඉල්ලීමකි. ඒ වෙනුවට ලෝකයේ සියලුම රාජ්‍යයන් සාතන් විසින් උන්වහන්සේට දෙනු ඇත.

ලෝකයේ නපුරු බලවේග, මාංශය හා යක්ෂයා යේසුස්වහන්සේට එරෙහිව යුද වදින බව මෙම පරීක්ෂා තුනෙන්ම ඔබට දැකගත හැකිය. යේසුස්වහන්සේ සාතන්ගේ පරීක්ෂාවනට මුහුණ දුන්නේ දේව වචනය භාවිත කිරීමෙනි. බයිබලය ඉතා හොඳ ආත්මික ආයුධයක්ද දෙවියන්වහන්සේගේ යුද ඇඳුමේ කොටසක්ද වේ. මේ පිළිබඳව ඔබ පසුව ඉගෙන ගන්නෙහිය. එය "ආත්මයේ කඩුව" ලෙස හැඳින්වේ. ආත්මික සටන පිළිබඳ දිව්‍යමය ආභාෂයෙන් ලියන ලද එකම අත්පොත බයිබලය වේ. අනෙක් පොත් ප්‍රයෝජනවත් වන්නේ ඒවා දේව වචනය සමග සුසංගත වන්නේ නම් පමණි.

සාතන්ගේ පරීක්ෂාවනට මුහුණ දීමට යේසුස්වහන්සේ භාවිතා කළේ දේව වචනය පමණි. යේසුස්වහන්සේ ඒ අවස්ථාවේ වූ සටනට අදාළ ශුද්ධ ලියවිලි පාඨ උපුටා දැක්වූ සේක. උන්වහන්සේ පැරණි ගිවිසුමේ ඉතිහාසයෙන් හෝ කාල නිර්ණයෙන් හෝ කොටස් උපුටා දැක්වූයේ නැත. උන්වහන්සේ පැවසුවේ “එසේ ලියා තිබේ” යනුවෙනි. ඔබ සුවිශේෂ ශුද්ධ ලියවිලි පාඨ භාවිත කරන විට, ඒවා දේව වචනයේ ඉතිරි කොටස් සමග සමබරදැයි බලන්න. ඒවා ඊට අදාළ සන්දර්භය සමග සසඳා බැලිය යුතු අතර එළිදරව් වී ඇති පූර්ණ දේව වචනය සමග සුසංගත විය යුතුය.

ආත්මික සටනේදී දේව වචනය ඵලදායීව යොදා ගැනීමට, ඔබ දේව වචනය හොඳින් දැන ගත යුතු වේ. ඔබ එය අධ්‍යයනය කර, කටපාඩම් කළ යුතු අතර ඒවා භාවනා කළ යුතුය. ජීවිතයේ බොහෝ පරාජයන් ඇතිවන්නේ දේව වචනය හොඳින් නොදැන්නා නිසා වේ.

> **යේසුස්වහන්සේ උත්තර දෙමින්: නුඹලා ශුද්ධ ලියවිලිවත් දෙවියන්වහන්සේගේ බලයවත් නොදැන, වරද්දා ගනිහුය. (මතෙව් 22:29)**

දේව වචනය යුද්ධය සඳහා අපගේ අත්පොත වේ. එය දෙවියන්වහන්සේගේ ආත්මික සටන් සැලැස්ම එළිදරව් කරයි.

## පවරන ලද බලය හා අධිකාරී බලය

සටන් සැලැස්මේ දෙවන කොටස පදනම් වී ඇත්තේ, යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට පවරන ලද සාතන්ට එරෙහි බලය හා අධිකාරී බලය මත වේ.

> **එකල උන්වහන්සේ දොළොස් දෙනා කැඳව සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී, (ලූක් 9:1)**

අධිකාරී බලය හා බලය එකිනෙකට වෙනස්ය. පොලිස් භටයෙකු නිදසුනක් ලෙස ගෙන බලමු. ඔහුට ලාංඡනයක් හා නිල ඇඳුමක් ඇත. ඒවා ඔහුගේ අධිකාරී බලයේ සංකේත වේ. ඔහුට අධිකාරී බලයක් ලැබෙන්නේ ඔහු උසුලන රාජ්‍ය පදවිය නිසාය. එහෙත් සියලු දෙනාම මෙම අධිකාරී බලයට ගරු නොකරන බැවින් ඔහු ආයුධයක් ගෙන යයි. ආයුධය ඔහුගේ බලය වේ.

සතුරාට එරෙහි ඔබගේ අධිකාරී බලය ලැබෙන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් හා ඇදහිලිවන්තයෙකු ලෙස උන්වහන්සේ තුළ ඇති තත්ත්වයෙනි. සතුරාට එරෙහි බලයක් ඔබට ලැබෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළිනි.

> **බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක. (ලූක් 24:49)**

පොලිස් භටයාට මෙන් ඵලදායී වීමට ඔබටද බලය අධිකාරී බලය යන දෙකම තිබිය යුතුය. ඇදහිලිවතුන්ට ඔවුන්ගේ අධිකාරී බලය ලැබෙන්නේ නැවත ඉපදීමේ අත්දැකීමෙන් හා ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔවුන්ට ඇති තත්වයෙනි. එහෙත් සමහරු ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ලබා ගැනීමට උත්සාහ නොකරති. යුද්ධය සඵල වීමට එය අධිකාරී බලය සමග සම්බන්ධ විය යුතුය.

යේසුස්වහන්සේ දෙනු ලැබූ බලය සුවිශේෂී කාර්යයන් සඳහා වේ. ඊට පහත දැක්වෙන දේ අන්තර්ගතය.

### සතුරාට එරෙහි බලය :

> **එකල උන්වහන්සේ දොළොස් දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී, (ලූක් 9:1)**

**පාපයට එරෙහි බලය :**

> **උන්වහන්සේ මෙසේ කියා, ඔවුන් දෙසට හුස්ම හෙළා: ශුද්ධාත්මයාණන් පිළිගන්න යමෙකුගේ පව් නුඹලා කමා කරවුද ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ., යමෙකුගේ පව් නුඹලා කමා නොකරවුද ඒවා කමා කරනු නොලැබේ යැයි ඔවුන්ට කී සේක. (යොහන් 20:22-23)**

**ශුභාරංචිය පැතිරවීම සඳහා බලය :**

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නාහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද, සමාරයෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂි කාරයෝ වන්නහුයයි කී සේක. (ක්‍රියා 1:8)**

# යාච්ඤාව

මූලික සටන් සැලැස්මේ තෙවැනි කොටස යාච්ඤාව වේ. යාච්ඤාව පිළිබඳව අධ්‍යයනය කිරීමට ඔබට උපකාරී වීම සඳහා විස්තරාත්මක සැකිල්ලක් පහත දැක්වේ.

## යාච්ඤාව අර්ථ දක්වීම

යාච්ඤාව යනු දෙවියන්වහන්සේ හා සමග කෙරෙන සංවාදය වේ. එය විවිධ ආකාර ගනී. එහෙත් මූලිකවම එය මිනිසා හා දෙවියන්වහන්සේ කතා බහකි. යාච්ඤාව මෙසේ විස්තර කර ඇත.

| | |
|---|---|
| ස්වාමින්වහන්සේගේ නාමය කියා කතා කිරීම | උත්පත්ති 12:8 |
| දෙවියන්වහන්සේට හඬනගා කතා කිරීම | ගීතා 27:7, 34:6 |
| දෙවියන්වහන්සේ වෙතට ළඟාවීම | ගීතා 73:28, හෙබ්‍රෙ 10:22 |
| ඉහළ බැලීම | ගීතා 5:3 |
| ආත්මය එසවීම | ගීතා 25:1 |
| සිත් එසවීම | විලාප ගී 3:41 |
| සිත් වැගිරවීම | ගීතා 62:8 |
| ආත්මය වැගිරවීම | 1 සාමු 1:15 |
| ස්වර්ගයට හඬ නැගීම | 2 ලේකම් 32:20 |
| ස්වාමින් වහන්සේට කන්නලව් කිරීම | නික්මයාම 32:11 |
| දෙවියන්වහන්සේ සෙවීම | යෝබ් 8:5 |
| ස්වාමින් වහන්සේගේ මුහුණ සෙවීම | ගීතා 27:8 |
| කන්නලව් කිරීම් | යෝබ් 8:5, යෙර. 36:7 |

## යේසුස්වහන්සේගේ යාච්ඤා ජීවිතය

යාච්ඤාව ස්වාමි වූ යේසුස්වහන්සේගේ වැදගත් උපක්‍රමයක් විය.

**යේසුස්වහන්සේ යාච්ඤාවට ප්‍රමුඛස්ථානයක් දුන් සේක :**

- උන්වහන්සේ දිවා රාත්‍රි ඕනෑම වේලාවක යාච්ඤා කළ සේක. ලූක් 6:12-13
- කෑමට වඩා යාච්ඤාවට ප්‍රමුඛස්ථානයක් දුන් සේක. යොහන් 4:31-32
- වැඩවලට වඩා යාච්ඤාවට ප්‍රමුඛත්වයක් දුන් සේක. යොහන් 4:31-32

**යාච්ඤාව ඕනෑම වැදගත් සිද්ධියක් හා සමග විය :**

- උන්වහන්සේ බව්තීස්මයේදී ලූක් 3:21-22
- සේවය සඳහා ගිය පළමු ගමනේදී මාක් 1:35, ලූක් 5:16

- ගෝලයන් තෝරා ගැනීමට පෙර ලූක් 6:12-13
- 5000 කට කන්න දීමට පෙර හා පසු : මතෙ. 14:19,23 මාක් 6:41, 46, යොහන් 6:11 14-15
- 4000 කට කන්න දුන් අවස්ථාවේ. මතෙ. 15:36, මාක් 8:6,7
- පේත්‍රුස්ගේ පාපෝච්චාරණයට පෙර. ලූක් 9:18
- අන්වෙසක් වීමට පෙර. ලූක් 9:28, 29
- සැත්තෑ දෙනා ආපසු පැමිණි පසු. මතෙ. 11:25, ලූක් 10:21
- ලාසරස්ගේ සොහොන අසළ : යොහන් 11:41-42
- ළමයින්ට ආශිර්වාද කරන අවස්ථාවේ : මතෙ. 19:13
- ග්‍රීකයින් සමහරක් පැමිණි අවස්ථාවේ: යොහන් 12:27-28
- මහත් සන්තාපයෙන් සිටීමට පැයකට පෙර: මතෙ. 26:26-27, මාක් 14:22-23 ලූක් 22:17-19
- පේත්‍රුස් වෙනුවෙන් : ලූක් 22:32
- ශුද්ධාත්මයාණන්වහන්සේ දීම වෙනුවෙන් : යොහන් 14:1-6
- එම්මාවුස්ට යන අතර : ලූක් 24:30-31
- ස්වර්ගාරෝහණයට පෙර : ලූක් 24:50-53
- තම අනුගාමිකයන් වෙනුවෙන් යොහන් 17
- යේසුස්වහන්සේ ඉගැන්වූ යාච්ඥාව මතෙ. 6:9-13 හි වාර්තා කර ඇත.

## යාච්ඥා වර්ග

සැම වේලෙහිම "සියලු යාච්ඥාවලින්" යාච්ඥා කරන ලෙස පාවුලුතුමා ඇදහිලිවතුන්ගෙන් ඉල්ලා සිටියේය (එපිස 6:18). තවත් බයිබල් පරිවර්තනයක් දැක්වෙන්නේ "සැම වර්ගයකම යාච්ඥාවකින් යාච්ඥා කරන්න" යනුවෙනි. මින් අදහස් වන්නේ යාච්ඥා වර්ගවල විවිධ මට්ටම් වේ.

## යාච්ඥා මට්ටම්

යාච්ඥා කිරීමේ තිව්‍රතාවයේ මට්ටම් තුනක් ඇත. ඉල්ලීම්, සෙවීම හා තට්ටු කිරීම වේ.

> **ඉල්ලන්න, එවිට නුඹලාට දෙනු ලැබේ., සොයන්න, එවිට නුඹලාට සම්බ වේ., තට්ටු කරන්න, එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද, ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ., සොයන්නාට සම්බ වේ, තට්ටු කරන්නාට දොර හරිනු ලැබේ. (මතෙව් 7:7-8)**

යාච්ඥාවේ පළමු මට්ටම ඉල්ලීම වේ. සරලවම පැවසුවහොත්, ඔබ දෙවියන්වහන්සේ ගෙන් ඉල්ලීමක් කර ඊට පිළිතුරක් එවෙලෙහිම ලබා ගැනීම වේ. පිළිතුර ලබා ගැනීම සඳහා අවශ්‍යතාව ඉල්ලීම වේ.

> **නුඹලා නොඉල්ලන බැවින් නුඹලාට නොලැබෙන්නේය. (යාකොබ් 4:2)**

අපට ඉතා ප්‍රබල ආත්මික යුද්ධායුධයක් ඇත. ඒ යාච්ඥාව වේ. එහෙත් බොහෝ දෙනෙක් එය භාවිත නොකරති. ඔවුන් ඉල්ලන්නේ නැත. ඒ නිසා ඔවුන්ට නොලැබේ.

සෙවීම යාච්ඥාවේ ඊට වඩා ගැඹුරු මට්ටමකි. මෙම යාච්ඥා මට්ටමේදී ඇසීමේදී මෙන් ක්ෂණික පිළිතුරක් නොලැබේ. උඩුමහල් මැදුරේ රැස්ව සිටි 120 දෙනා යාච්ඥාවේ "දිගටම නිරතවීම" සෙවීම සඳහා නිදසුනකි. මෙම පුරුෂයෝද ස්ත්‍රීහුද ශුද්ධාත්මය දෙන බවට වූ පොරොන්දුව ඉටුවන තෙක් හා ඊට පිළිතුරක් ලැබෙන තෙක් දිගටම "සෙවීමේ" නිරත වූහ (ක්‍රියා 1-2)

තට්ටු කිරීම ඊටත් වඩා ගැඹුරු මට්ටමකි. මෙය පිළිතුරු ලැබීමට දිගු කලක් යන විට නොනවත්වාම කරන යාච්ඥාව වේ. එය ලූක් 11:5-10 දී ඇති යේසුස්වහන්සේ පැවසූ උපමාවෙන් පැහැදිලි වේ. තට්ටුකිරීමේ මට්ටම යාච්ඥාවේ ආත්මික සටනෙහි ගැඹුරුම මට්ටම වේ. මෙය පිළිතුරක් පෙනෙන තෙක් මානයේ නොතිබියදීත් දානියෙල් නොනවත්වාම තට්ටුකළ අවස්ථාවෙන්

පෙන්නුම් කෙරේ. පිළිතුර ප්‍රමාද වූයේ දෙවියන්වහන්සේගෙන් ලැබෙන පිළිතුරට සාතන් බාධා කළ බැවිනි. (දානියෙල් 10)

## යාච්ඤා වර්ග

විවිධ වර්ගයේ යාච්ඤා ඇති අතර ස්වාමීන්වහන්සේ විසින් දෙන ලද ආදර්ශ යාච්ඤාවෙන් ඒවා පෙන්නුම් කෙරේ (මතෙව් 6:9-13). යාච්ඤා වර්ග අතර මේවාද වේ :

### 1. නමස්කාරය හා ප්‍රශංසාව

ඔබ දෙවියන්වහන්සේ අභිමුඛයට පැමිණෙන්නේ නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙනි.

> **ස්තුතිකරමින් උන්වහන්සේගේ දොරටුවලින් ඇතුල්ව, ප්‍රශංසා කරමින් උන්වහන්සේගේ මණ්ඩප වලට පැමිණෙව්. උන්වහන්සේට ස්තුති කරමින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසා කරව්. (ගීතාවලිය 100:4)**

නමස්කාරය යනු ගෞරවය හා භක්තිය ප්‍රදානය කිරීම වේ. ප්‍රශංසා කිරීම යනු ස්තුති දීම හා කෘතඥතාව පල කිරීම වේ. ඒ දෙවියන්වහන්සේ කළ දේට පමණක් නොව උන්වහන්සේ දෙවියන්වහන්සේ නිසාය. ඔබ දෙවියන්වහන්සේට ආත්මයෙන්ද සැබෑ කමෙන්ද යාච්ඤා කළ යුතුය.

> **නුමුත් සැබෑ නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද පියාණන්වහන්සේට නමස්කාර කරන කාලය පැමිණෙන්නේය, දැනටම පැමිණ තිබේ. මක්නිසාද පියාණන්වහන්සේ තමන්ට නමස්කාර කරන්නන් වන පිණිස එබඳුවුවන් සොයන සේක. දෙවියන්වහන්සේ ආත්මයක්ය උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කළ යුතු යැයි කී සේක. (යොහන් 4:23-24)**

ප්‍රශංසා කිරීමට හා යාච්ඤා කිරීමට මේවා ඇතුළත් විය හැකිය :

| | |
|---|---|
| ගිතිකා කිරීම | ගීතාවලිය 9:2, 11, 40:3, මාක් 14:26 |
| ශ්‍රව්‍ය ප්‍රශංසා කිරීම් | ගීතාවලිය 103:1 |
| කෑගැසීම | ගීතාවලිය 47:1 |
| දෑත් එසවීම | ගීතාවලිය 63:4, 134:2, 1 තිමෝති 2:8 |
| අත්පුඩි ගැසීම | ගීතාවලිය 47:1 |
| සංගීත භාණ්ඩ | ගීතාවලිය 150:3-5 |
| සිටගෙන සිටීම | 2 ලේකම් 20:19 |
| වැඳ වැටීම | ගීතාවලිය 95:6 |
| නැටීම | ගීතාවලිය 149:3 |
| දණ ගැසීම | ගීතාවලිය 95:6 |
| බිම දිගා වීම | ගීතාවලිය 149:5 |

ආත්මික ලෝකයේ දෙවියන්වහන්සේගේ රණශූරයා පෙන්වා ඇත්තේ මේ සමගය

> **ඔවුන්ගේ මුඛවල දෙවියන්වහන්සේට උතුම් ප්‍රශංසාද අතෙහි දෙමුවහත් කඩුවක්ද වේවා, (ගීතාවලිය 149:6)**

### 2. කැපවීම

මෙය ඔබගේ ජීවිතය හා කැමැත්ත දෙවියන්වහන්සේට කැපකරන යාච්ඤාවකි. ඊට කැපවීමේ මෙන්ම පිළිගැනීමේ යාච්ඤාද ඇතුළත්ය.

### 3. ඉල්ලීම

ඉල්ලීමේ යාච්ඤා අයැදීම් වේ. අයැදීම් කළ යුත්තේ දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයේ දක්වා ඇති පරිදි උන්වහන්සේගේ කැමැත්ත අනුවය. ඉල්ලීම්, ඉල්ලීමේ, සෙවීමේ හා තට්ටු කිරීමේ මට්ටම්වල තිබිය හැකිය. යැදීම් යනු මේ ආකාරයෙන් යාච්ඤාවලට තවත් වචනයකි. යැදීම යන

වචනයේ තේරුම "දෙවියන්වහන්සේට යාච්ඤා කිරීම හෝ අවශ්‍යතාවක් වෙනුවෙන් උන්වහන්සේගෙන් ප්‍රබල ලෙස ඉල්ලීම" වේ.

## 4. පාපෝච්චාරණය හා පසුතැවිලිවීම

පාපොච්චාරණයේ යාඥාවක් යනු පසුතැවිලිවීම හා පාපය වෙනුවෙන් කමාව ඉල්ලීම වේ.

> **අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක.** (1 යොහන් 1:9)

## 5. මැදිහත්වීම

මැදිහත්වීම යනු අන් අය වෙනුවෙන් කරන යාච්ඤාවකි. මැදිහත් කරුවෙකු යනු තවත් කෙනෙකුගේ තැනක් ගන්නෙකි. නැතහොත් වෙනත් කෙනෙකු වෙනුවෙන් අයැදින්නෙකි. දෙවියන්වහන්සේ එක්තරා අවස්ථාවක ලෝකය දෙස බැලූ විට මැදිහත් කාරයෙකු නුදුටු බව බයිබලයේ සඳහන් වේ.

> **උන්වහන්සේද කිසිවෙක් නැති බව දැක, මැදහත්කාරයෙක් නැති බැවින් පුදුම වූ සේක. ඒ නිසා උන්වහන්සේගේම බාහුව තමන්වහන්සේට ගැළවීම ගෙනායේය., උන්වහන්සේගේම ධර්මිෂ්ඨකම උන්වහන්සේව ඉසිලූවේය.** (යෙසායා 59:16)

දෙවියන්වහන්සේ මැදිහත්කරුවෙකු නුදුටු විට උන්වහන්සේ අවශ්‍යතාව සපුරාලීය. උන්වහන්සේ යේසුස්වහන්සේ එවූ සේක.

> **මක්නිසාද ඇත්තේ එක දෙවිකෙනෙක් සහ දෙවියන්වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදහත් කාර කෙනෙකුත්ය.** (1 තිමෝති 2:5)

> **මැරුණෙත් ඒ ඇර මළවුන්ගෙන් නැගිටුවනු ලැබුවේත් දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කම් කරන්නේ ක්‍රිස්තුස්වහන්සේය.** (රෝම 8:34)

> **එබැවින්, උන්වහන්සේ කරණකොට ගෙන දෙවියන වහන්සේ වෙතට ළඟා වෙන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරතුරුම ජීවත් වන හෙයින්, ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන.** (හෙබ්‍රෙව් 7:25)

> **මාගේ ප්‍රිය දරුවෙනි, මේ කාරණා නුඹලාට ලියා එවන්නේ නුඹලා පව් නොකරන පිණිසය. යමෙක් පව් කලොත් ධර්මිෂ්ඨ වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන මැදහත් කාරයෙක් පියාණන්වහන්සේ වෙත අපට සිටින සේක.** (1 යොහාන් 2:1)

විනිශ්චයශාලාවක නීතිඥයෙක් තවත් කෙනෙකු වෙනුවෙන් ආයාචනා කරන නීති සහායකයෙකි. නැතහොත් උපදේශකවරයෙකි. ආත්මික සටනකදී මැදිහත්වීම යනු තවත් කෙනෙකු වෙනුවෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කිරීමය. ඇතැම්විට මෙම මැදිහත්වීම සිදු කෙරෙන්නේ අවබෝධයක් ඇතිවය. ඔබ මැදිහත් වන්නේ ඔබේම භාෂාවෙනි.

> **ඉතින් අප විසින් සියලූ ආකාර භක්තියෙන් සහ සත්පුරුෂකමින් සමාදානවූ නිශ්චල ජීවිතයක් ගතකරන පිණිස, රජවරුන් හා උසස් තනතුරු දරන සියල්ලන් ඇතුළුව, සියලු මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද යාච්ඤාද මැදහත්කම්ද ස්තුතිදීම්ද පවත්වන්ට සියල්ලට පළමුවෙන් අවවාදකරමි.** (1 තිමෝති 2:1-2)

තවත් අවස්ථාවල මැදිහත්වීම සිදු කෙරෙන්නේ ශුද්ධාත්මයාණන් විසිනි. එය ඇතැම් විට මහා ආත්මික බරක් ඉසිලීමේ ප්‍රතිඵලයක් වශයෙන් කෙඳිරිගෑම සමග සිදුවිය හැකිය. එය නොදන්නා භාෂාවකින් විය හැකිය. එය තවත් කෙනෙකු වෙනුවෙන් කෙරෙන මැදිහත්මක් හෝ ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ වෙනුවෙන් කරන මැදිහත්මක් හෝ විය හැකිය. මෙය සිදුවන විට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළින් දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව සෘජුවම දෙවියන්වහන්සේට කතා කරමින් උන්වහන්සේට යාච්ඤා කරන සේක. ඔබට මේ ආකාරයේ මැදිහත්වීමක් තේරෙන්නේ නැත.

> **එලෙසම ආත්මයාණන්වහන්සේත් අපගේ දුර්වල කම් වලදී උපකාර කරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම් වලින් අප උදෙසා මැදහත් කම් කරන සේක. (රෝම 8:26)**

මෙය ගැඹුරුම මැදිහත් යාච්ඤාව වන අතර ආත්මික සටනේදී වඩාත්ම ඵලදායි වේ.

## ආදර්ශ යාච්ඤාව :

යේසුස් වහන්සේ මෙලොව සේවය කරද්දී වරක් උන්වහන්සේගේ ගෝලයෝ පුදුමාකාර ඉල්ලීමක් උන්වහන්සේ වෙතට ගෙන ආහ.

> **තවද උන්වහන්සේ එක් තැනක යාච්ඤා කරමින් සිට නිමවූ පසු උන්වහන්සේගේ ගෝලයන්ගෙන් එක්කෙනෙක් කථා කොට: ස්වාමීනි, යොහන් තමාගේ ගෝලයන්ට ඉගැන්නුවාක් මෙන් අපටත් යාච්ඤා කරන්ට ඉගැන්නුව මැනවයි කිවේය. (ලූක් 11:1)**

දේශනා කරන හෝ භාස්කම් කරන ආකාරය ගෝලයන් ඇසුවේ නැත. සදාකල් පවතින සම්බන්ධතා ගොඩනැගීම පිළිබඳ පාඩමක් ඔවුන් ඉල්ලුවේ නැත. ශාරීරික සුවකිරීමේ විශ්මයජනක දේ ඔවුන් විමසුවේ නැත. ඔවුන් ඉල්ලා සිටියේ යාච්ඤා කරන හැටි උගන්වන ලෙසය.

මෙම ආශාව ඇතිවූයේ කෙසේද ? එය යේසුස්වහන්සේගේ ජීවිතයේ හා සේවයේ යාච්ඤාව නිසා ඇති වූ දෘශ්‍ය ප්‍රතිඵලයකි. මෙම ආත්මික උපක්‍රමය ක්‍රියාත්මක වන විට ගෙනදුන් ප්‍රබල ප්‍රතිඵල ගෝලයෝ දුටුවෝය.

ආදර්ශ යාච්ඤාව කියවා අප සාකච්ඡා කළ විවිධ වර්ගයේ යාච්ඤාවන් එහි නිරීක්ෂණය කරන්න.

| | |
|---|---|
| සවර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණෙනි,<br>ඔබගේ නාමයට ගෞරව වේවා | ප්‍රශංසාව හා නමස්කාරය |
| ඔබගේ රාජ්‍යය ඒවා,<br>ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද<br>කරනු ලැබේව. | කැපවීම |
| අපගේ දවස්පතා භෝජනය අපට දුන මැනව | ඉල්ලීම |
| අපේ ණය කාරයන්ට අප කමා කළාක් මෙන්<br>අපේ ණයත් අපට කමා කළ මැනව | පාපොච්චාරණය හා<br>මැදිහත්වීම |
| අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප<br>ගැළවුව මැනව. | ඉල්ලීම |
| මක්නිසාද රාජ්‍යයත් බලයත් මහිමයත්<br>ඔබවහන්සේගේය. ආමේන්<br>(මතෙව් 6:9-13) | ප්‍රශංසාව හා නමස්කාරය |

## යාච්ඤා කරන්නේ කෙසේද?

ඔබ යාච්ඤා කළ යුතු අන්දම ඉගෙනීමට පහත දැක්වෙන සෑම යොමුවක්ම බයිබලයේ බලන්න.

- යාච්ඤාව දෙවියන්වහන්සේට කළ යුතුය ගීතාවලිය 5:2
- නිරර්ථක වචන නැවත, නැවත නොකියන්න. එහෙත් උනන්දුවෙන් කෙරෙන පුනරුත්තියට ඉඩ ඇත. මතෙව් 6:7, දානියෙල් 6:10, ලූක් 11:5-13, 18:1-8
- අන් අය වෙනුවෙන් යාච්ඤා කිරීම අතපසු කිරීම පාපයකි. 1 සාමුවෙල් 12:23
- අවබෝධයෙන් යුතුව යාච්ඤා කරන්න (තමාගේම භාෂාවෙන්) එපීස 6:18
- ආත්මයෙන් යුතුව යාච්ඤා කරන්න. රෝම 8:26, යුද් 20

- දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව යාච්ඤා කරන්න. 1 යොහාන් 5:14-15
- රහසේ යාච්ඤා කරන්න. මතෙව් 6:6
- ප්‍රමාණය නොව ගුණාත්මක භාවය ගැන සැලකිලිමත්වන්න. “බොහෝ කතා කිරීම” නිසා යාච්ඤාව සාර්ථක වන්නේ නැත. මතෙව් 6:7
- නිරන්තරයෙන්ම යාච්ඤා කරන්න. ලූක් 21:36, එපීස 6:18
- අඛණ්ඩව යාච්ඤා කරන්න. රෝම 12:12
- නොනවත්වා යාච්ඤා කරන්න. 1 තෙසලෝනික 5:17
- යේසුස්වහන්සේගේ නාමයෙන් පියාණන්වහන්සේට යාච්ඤා කරන්න. යොහාන් 15:16
- පිබිද සිට යාච්ඤා කරන්න. 1 පේතෘස් 4:7
- ආදර්ශ යාච්ඤාව අනුව යාච්ඤා කරන්න. මතෙව් 6:9-13
- කමාවදීමේ ආත්මයකින් යුතුව යාච්ඤා කරන්න. මාක් 11:25
- නිහතමානිව යාච්ඤා කරන්න. මතෙව් 6:7
- ඇතැම් අවස්ථාවල නිරාහාරව යාච්ඤා කරන්න. මතෙව් 17:21
- උද්යෝගයෙන් යාච්ඤා කරන්න. යාකොබ් 5:16, කොලොස්සි 4:12
- දෙවියන්වහන්සේට යටහත්ව යාච්ඤා කරන්න. ලූක් 22:42
- බඳිනු ලබන හා මුදනු ලබන උපක්‍රම යාච්ඤාවේදී භාවිත කරන්න. මතෙව් 16:19

## ඔබ කුමක් උදෙසා යාච්ඤා කළ යුතුද?

- යෙරුසලමේ සාමය : ගීතාවලිය 122:6
- ගොයම් කපන ගොවියන් : මතෙව් 9:38
- පරීක්ෂාවට නොවැටෙන පිණිස : ලූක් 22:40-46
- ඔබට වෛර කරන්නන් (ඔබේ සතුරන්) ලූක් 6:28
- සියලු ශාන්තුවරයන් : එපීස 6:18
- රෝගීන් වෙනුවෙන් : යාකොබ් 5:14
- එකිනෙකා වෙනුවෙන් (එකිනෙකාගේ බර ඉසිලීම) යාකොබ් 5:16
- සියලු මනුෂ්‍යයන්, රජවරුන් හා අධිකාරී බලයෙන් යුක්ත වූවන් : 1 තිමෝති 2:1-4
- දෛනික අවශ්‍යතා : මතෙව් 6:11
- ප්‍රඥාව : යාකොබ් 1:5
- සුවකිරීම : යාකොබ් 5:14-15
- කමාවදීම : මතෙව් 6:12
- දේව කැමැත්ත හා දේවරාජ්‍යය පිහිටුවීම : මතෙව් 6:10
- පීඩාවලින් මිදීම : යාකොබ් 5:13

## පොරොන්දු භාවිතා කර යාච්ඤා කරන්න

> **නුඹලා ඉල්ලන නුමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම්කරණ පිණිස වැරදි ලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත. (යාකොබ් 4:3)**

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දු ප්‍රකාරයට යාච්ඤාවලට පිළිතුරු දෙන සේක. මෙම පොරොන්දුවල පදනම මත ඔබ නොඉල්ලුවහොත් ඔබගේ යාච්ඤාවලට පිළිතුරු නොලැබෙනු ඇත. මෙය පියෙකු හා ඔහුගේ දරුවන් අතර සබඳතාවට සමානය. කිසිදු දෙමවුපියෙකු තම දරුවන් ඉල්ලන ඕනෑම දෙයක් හෝ ආශා නොකරන දෙයක් හෝ නොදෙනු ඇත. ඇතැම් දේ ඔහු කරන බවත් ඇතැම් දේ ඔහු නොකරන බවත් ඔහු පැහැදිලිව ප්‍රකාශ කරනු ඇත. මේ සීමාවන් අතරේ පියෙක් තම දරුවන්ගේ ඉල්ලීම් ඉටු කරයි.

දෙවියන්වහන්සේ හා සමගද එසේමය. උන්වහන්සේ පොරොන්දු දී ඇති අතර ඒවායින් යාච්ඤාවට පදනම සකස් වී ඇත. දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇති දේ ඉගෙන ඒ පොරොන්දුවලට අනුකූලව යාච්ඤා කරන්න. මෙය කිරීමට එක් ක්‍රමයක් නම් බයිබලය කියවමින් එහි දී ඇති

පොරොන්දු සලකුණු කිරීම වේ. ඔබ යාච්ඥා කරන විට බයිබලය භාවිත කරන්න. යාච්ඥා මෙම පොරොන්දු මත පිහිටුවන්න.

## යාච්ඥාවට ඇතිවන බාධා

- ඕනෑම ආකාරයේ පාප : යෙසායා 59:1-2, ගීතාවලිය 66:18, යෙසායා 1:15, හිතෝ. 28:9
- සිත්වල පිහිටුවා ගත් දේවරූප : එසකියෙල් 14:1-3
- සමාව නොදෙන ආත්ම : මාක් 11:25, මතෙව් 5:23
- ආත්මාර්ථකාමීත්වය, සාවද්‍ය චේතනා : හිතෝපදේශ 21:13, යාකොබ් 4:3
- බලයට ඇති කැදරකම, යාච්ඥාවන් සූක්ෂම ලෙස හැසිරවීම : යාකොබ් 4: 2-3
- විවාහක සහකාරියට / සහකරුට වැරදි ලෙස සැලකීම : 1 පේත්‍රුස් 3:7
- තම ධර්මිෂ්ඨකම : ලූක් 18:10-14
- අවිශ්වාසය : යාකොබ් 1:6-7
- ක්‍රිස්තුස්වහන්සේ හා උන්වහන්සේගේ වචනය තුළ නොපැවතීම : යොහාන් 15:7
- අනුකම්පාවක් නොමැති කම : හිතෝපදේශ 21:13
- කුහකකම, අහංකාරය, තේරුමක් නැති පුනරීක්තය : මතෙව් 6:5, යෝබ් 35:12-13
- දෙවියන්වහන්සේගේ කැමැත්ත ප්‍රකාර නොඉල්ලීම : යාකොබ් 4:2-3
- යේසුස්වහන්සේගේ නාමයෙන් නොඉල්ලීම : යොහාන් 16:24
- සාතන්ගෙන් හා යක්ෂයන්ගෙන් ඇතිවන බාධා : දානියෙල් 10:10-13, එපීස 6:12
- පළමුව දේවරාජ්‍යය නොසෙවීම, ඔබ පළමුව දේව රාජ්‍යය සෙවිය යුතුය. “අනෙක් දේ” දීමට පොරොන්දු වන්නේ ඉන්පසුවය. මතෙව් 6:33
- ඔබගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කෙරෙන්නේ දෙවියන්වහන්සේට ඊට වඩා උසස් අභිප්‍රායක් ඇති බැවිනි: 2 කොරින්ති 12:8-9
- ඔබ යාච්ඥා කිරීමට නොදන්නෙහි නම්, යාච්ඥාවට බාධා ඇතිවේ. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළින් යාච්ඥා කිරීම වැදගත් වන්නේ එබැවින : රෝම 8:26

## යාච්ඥා නොකළ යුත්තේ කුමන වේලාවන්හිදීද

ස්වාමීන්වහන්සේ ඉදිරියේ, ක්‍රියා කිරීමට පෙර උන්වහන්සේගේ මග පෙන්වීම ලැබෙන තෙක්, යාච්ඥාවෙන් සිටිය යුතු ආකාරය ඉගෙනීම වැදගත් වේ. එමෙන්ම යාච්ඥා නොකළ යුතු අවස්ථාවන් දැන ගැනීමද ඒ හා සමානව වැදගත්ය. යේසුස්වහන්සේ ඔබට ක්‍රියා කිරීමට කැඳවූ විට, යාච්ඥා කරමින් නොසිට, ක්‍රියා කළ යුතුය.

නිදසුනක් ලෙස මාරාහි තිත්ත ජලය තිබියදී, මොසෙස් ස්වාමීන්වහන්සේට මොර ගැසූ විට ජලය රස කිරීමට කළ යුතු දේ දෙවියන්වහන්සේ පෙන්වූ සේක. තවදුරටත් ස්වාමීන් වහන්සේට යාච්ඥා කරමින් සිටීම අවශ්‍ය නොවිය. දෙවියන්වහන්සේ එළිදරව් කළ දේ මත ක්‍රියා කිරීම මෝසෙස් කළ යුතුවිය. අයි හිදී ඉශ්රායෙලය භයානක ලෙස පරාජය වීම ගැන යොෂුවා යාච්ඥාකළ අවස්ථාවේදීද මෙය සත්‍යයකි. ඉශ්රායෙල් සෙනග අතර පාපය ඇති බව දෙවියන්වහන්සේ එළිදරව් කළ සේක. උන්වහන්සේ සැබවින්ම යොෂුවාට පැවසුවේ :

> **එවිට ස්වාමීන්වහන්සේ යෝෂුවාට කථාකොට: නැගිටියන්න, මක්නිසාද මෙසේ මුහුණින් වැතිර ඉන්නෙහිද?**
>
> **එබැවින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට තමුන්ගේ සතුරන් ඉදිරියෙහි සිටින්ට බැරිය, ඔව්හු ශාපයට අසුවුණ බැවින් තමුන්ගේ සතුරන්ට පිටපාති. ඒ කැපවූ දේ නුඹලා අතරෙන් නාස්තිකර නොදැමුවොත් මම තවත් නුඹලා සමඟ නොසිටින්නෙමි.**
>
> **නුඹ නැගිට සෙනඟ පවිත්‍රකරපන්න, ඔවුන්ට කථාකොට: නුඹලා හෙට දවසට පවිත්‍රවෙයල්ලා. මක්නිසාද ඉශ්‍රායෙල්වරුනි, නුඹලා අතරේ කැපවූ දෙයක් තිබේ, කැපවූ දෙය නුඹලා අතරෙන්**

**පහකරන තුරු නුඹලාගේ සතුරන් ඉදිරියෙහි සිටින්ට නුඹලාට බැරිවේයයි ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමින්වහන්සේ කියනසේක. (යොෂුවා 7:10, 12, 13)**

එය යාච්ඤා කිරීමේ අවස්ථාව නොවීය. එය යාච්ඤාවට දුන් මගපෙන්වීම අනුව ක්‍රියාකළ යුතු අවස්ථාව විය. සමහරු වැඩ කිරීම මගහැරීම සඳහා යාච්ඤාව භාවිත කරති.

සමහරු දෙවියන්වහන්සේ පිළිතුරු දී තිබියදීත් යාච්ඤා කරති. ඒ ඔවුන් එම පිළිතුරට අකමැති බැවිනි. ගණන් කථාව 22 හි ඇති බාලාම් පිළිබඳ කතන්දරය නැවත බලන්න. විශේෂයෙන්ම 18-19 පද කෙරෙහි අවධානය යොමු කරන්න. එකම දේ පිළිබඳව දෙවියන්වහන්සේ ළඟට යෑමට බාලාම්ට කිසිදු අයිතිවාසිකමක් නැත. දෙවියන්වහන්සේ බාලාම්ට ඒ දේ සමග කිසිවක් කිරීම පැහැදිලිවම තහනම් කර තිබිණි. (12 පදය බලන්න)

# නිරාහාරව සිටීම

අපගේ සටන් සැලැස්මේ හතරවැනි කොටස නිරාහාරව සිටීම වේ. ආත්මික ලෝකයේ සාර්ථක සටනක් මෙහෙයවීමට එය යාච්ඤාව සමග සම්බන්ධ කරනු ලැබේ.

## නිරාහාරව සිටීමේ අර්ථ දක්වීම :

නිරාහාරව සිටීම යන්නෙහි සරලතම අර්ථ විග්‍රහය, ආහාර නොගෙන සිටීම වේ.

## නිරාහාරව සිටීමේ ආකාර :

බයිබලය අනුව ක්‍රම දෙකක නිරාහාරව සිටීම ඇත. පූර්ණ නිරාහාරව සිටීම යනු ඔබ කිසිවක් නොකා නොබී සිටීම වේ. මේ සඳහා උදාහරණයක් ක්‍රියා 9:9 හි ඇත. අර්ධ වශයෙන් නිරාහාරව සිටීම යනු ආහාර ගැනීම පාලනය කිරීම වේ. මේ සඳහා උදාහරණයක් දානියෙල් 10:3 හි ඇත.

## ප්‍රසිද්ධ හා පෞද්ගලික නිරාහාරව සිටීම් :

නිරාහාරව සිටීම දෙවියන්වහන්සේ හා පුද්ගලයෙකු අතර කෙරෙන පෞද්ගලික දෙයකි. එය පුද්ගලිකව කළ යුතු අතර එය පුරසාරම් කීමට දෙයක් නොවේ.

**තවද නුඹලා නිරාහාරයෙන් ඉන්න කල්හි වංචාකාරයන් මෙන් දුක්ඛිත මුහුණක් ඇතුව නොසිටින්න. ඔව්හු නිරාහාරයෙන් ඉන්න බව මනුෂ්‍යයන්ට පෙනෙන පිණිස තමුන්ගේ මුහුණු විරූපි කරගනිති. සැබැවක් නුඹලාට කියමි : ඔවුන්ගේ විපාකය ඔවුන්ට ලැබී ඇත. නුමුත් නුඹ නිරාහාරයෙන් ඉන්න බව මනුෂ්‍යයන්ට නොපෙණෙන පිණිස නුඹේ හිසේ තෙල් ගා මුහුණ සෝදා ගන්න, එවිට රහසින් දකින නුඹේ පියාණන්වහන්සේ නුඹට විපාක දෙන සේක. (මතෙව් 6:16-18)**

ප්‍රසිද්ධ නිරාහාරව සිටීමේ අවස්ථාවකට කැඳවීමට නායකයන්ට පුළුවන. එවිට මුළු සභාවම එක්ව නිරාහාරව සිටිනු ඇත.

**සියොන්හි හොරණෑව පිඹ, ශුද්ධවූ උපවාසයක්ද රැස්වීමක්ද ප්‍රසිද්ධ කරන්න. (යොවෙල් 2:15)**

## නිරාහාරව සිටීමේ පරමාර්ථය :

නිරාහාරව සිටීම සඳහා සුවිශේෂී ආත්මික පරමාර්ථ ඇත. මේවා අවබෝධ කරගැනීම වැදගත්ය. මන්ද වැරදි දෙයකට ඔබ නිරාහාරව සිටියහොත් ඉන් පලක් නොවන බැවිනි.

නිරාහාරව සිටීමේ පරමාර්ථ පිළිබඳව පහත දැක්වෙන සෑම යොමු කිරීමක්ම බලන්න. ආත්මික සටනේදී නිරාහාරව සිටීමෙන් ලැබෙන මහත් වූ බලය ඒවායින් එළිදරව් වේ. ඔබ නිරාහාරව සිටින්නේ

- ඔබට නිහතමානී වීමට : ගීතාවලිය 35:13, 69:10
- පාපය වෙනුවෙන් පසුතැවිලි වීමට : යෝවෙල් 2:12
- එළිදරව්වීම සඳහා : දානියෙල් 9:2, 3:21-22
- දුෂ්ට කමේ පටි ලිහිල් කර, මහත් බර උසුලා. පීඩාවට පත්වූවන් නිදහස් කර, සියලු වහල් බැමි කඩා දැමීමට : යොසායා 58:6
- ආත්මිකටත් ශාරීරිකවත් දුප්පතුන්ට ආහාර දීමට : යොසායා 58:7
- දෙවියන්වහන්සේ ගැන සවන් දීමට : 2 සාමුවෙල් 12:16, 22. යෝනා 3:5, 10

නිරාහාරව සිටීමෙන් දෙවියන්වහන්සේ වෙනස් නොවේ. එය ඔබ වෙනස් කරයි. දෙවියන්වහන්සේ ඔබ හා සම්බන්ධ වන්නේ ඔබ උන්වහන්සේ හා සමග පවත්වන සබඳතාව පදනම් කරගෙන වේ. ඔබ වෙනස් වූ විට, දෙවියන්වහන්සේ ඔබ සමග කටයුතු කරන ආකාරයට ඉන් බලපෑමක් ඇති වන්නේය. ඔබ නිරාහාරව සිටින්නේ දෙවියන්වහන්සේ වෙනස් කිරීමට නොවේ. මන්ද දෙවියන්වහන්සේ වෙනස් නොවන බැවිනි. උදාහරණයක් සඳහා නිනවා නගරයේ මෙය සිදුවූ ආකාරය පිළිබඳව යෝනා පොතේ කියවන්න.

### නිරාහාරව සිටීමේ කාලය :

ඔබ කොතරම් කාලයක් නිරාහාරව සිටිය යුතුද යන්න රඳා පවතින්නේ ඔබගේ ආත්මයට දෙවියන්වහන්සේ කතා කරන දේ අනුවය. කෙටි හෝ දිගු කලක් නිරාහාරව සිටීමට උන්වහන්සේ ඔබට මගපෙන්වනු ඇත. ඒසව් හා යාකොබ් පිළිබඳ කථාව ඔබට මතකද? යාකොබ් මුලින් තමාටම ආහාර වේලක් පිළියෙල කරගත්තේය. එහෙත් කුළුඳුල් කමේ උරුමය ලබාගැනීමට ආහාර ගත්තේ නැත. එම වේල එසව් නිරාහාරව සිටියේ නම් කොතරම් අගනේද?

## දේව රාජ්‍යයේ යතුරු

යේසුස් වහන්සේ ඇදහිලිවතුන්ට දේව රාජ්‍යයේ යතුරු දුන් සේක. මෙම යතුරු අතර බඳිනු ලබන බලයද මුදනු ලබන බලයද ඇති අතර ඒවා අපගේ මූලික සටන් සැලැස්මේ පස්වන කොටස වේ.

> **ස්වර්ගරාජ්‍යයේ යතුරු නුඹට දෙන්නෙමි. නුඹ පොළොවෙහිදී යමක් බඳින්නේහිද එක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය. නුඹ පොළොවෙහිදී යමක් මුදන්නෙහිද එක ස්වර්ගයේහිදී මුදනු ලබන්නේයයි ඔහුට කී සේක (මතෙව් 16:19)**

දුෂ්ටාත්ම පලවා හැරීමට පෙර බැඳ තැබීමේ වැදගත්කම යේසුස්වහන්සේ ඉගැන්වූ සේක. එහෙත් බැඳ තැබීමේ හා මුදනු ලැබීමේ මූල ධර්මය යක්ෂයන් පලවා හැරීමට වඩා වැඩිමනක් දෙයකි. ඔබගේ ජීවතයේත්, නිවසේත්, සමාජයේ සහ සභා සහභාගිකත්වයේත් වැඩ කිරීම සඳහා සතුරාගේ බලය බැඳ තැබීමට ඔබට පුළුවන. ඔබට පුරුෂයන් හා ස්ත්‍රීන් පාපයේ, පීඩාවේ, හා සතුරා නිසා අධෛර්යට පත්වීමේ බන්දනවලින් මුදන්නට පුළුවන.

බැඳ තැබීමේ හා මුදනු ලැබීමේ මූලධර්මය, සතුරාගේ බලය අභිබවා යෑමට වැදගත් උපක්‍රමයක් වේ. එය දේව රාජ්‍යයට ඇතුළු විය හැකි යතුරකි. ඔබට මුහුණදීමට සිදුවන සෑම අවස්ථාවකටම,.... සෑම ගැටලුවකටම,.... සෑම අභියෝගයකටම,,. ආත්මික යතුරක් ඇත.. බැඳ තැබීමේ හා මුදනු ලැබීමේ මූල ධර්මය පාවිච්චි කිරීම සඳහා යතුරකි. බැඳ තැබිය යුතු දෙයක් මුදනු ලැබිය යුතු දෙයක් ඔබ හඳුනාගෙන මේ සොයා ගැනීම මත ක්‍රියා කළ විට සතුරා පරාජය වනු ඇත.

## යේසුස්වහන්සේගේ නාමය

මූලික සටන් සැලැස්මේ අවසාන කොටස යේසුස්වහන්සේගේ නාමයේ ඇත. දේව වචනය උන්වහන්සේගේ නාමය තුළ ව්‍යවහාර කිරීම සඳහා අපි යාච්ඤා කරමු, නිරාහාරව සිටිමු. එමෙන්ම අපට පවරා ඇති බලය හා අධිකාරි බලයත් දේව රාජ්‍යයේ යතුරුත් උන්වහන්සේගේ නාමයෙන් භාවිත කරමු.

**නුඹලා විසින් මාගේ නාමයෙන් කොයි දෙයක් ඉල්ලුවත්, මම ඒක ඉෂ්ට කරන්නෙමි. (යොහන් 14:14)**

**ඒ දවසේදී නුඹලා මගෙන් කිසිවක් අසන්නේ නැත. සැබැවක් සැබවක් නුඹලාට කියමි, පියාණන් වහන්සේගෙන් නුඹලා යමක් ඉල්ලුවොත්, උන්වහන්සේ මාගේ නාමයෙන් ඒ දේ නුඹලාට දෙන සේක. (යොහන් 16:23)**

**අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය, අන්භාෂාවලින් කථාකරන්නෝය, සර්පයන් අල්ලා ගන්නෝය, යම් මරණීය වස, ජාතියක් බිවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය, ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කී සේක. (මාක් 16:17-18)**

**යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට : ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තීස්ම කරන්න. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්නට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමියි කී සේක. (මතෙව් 28:18-20)**

ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් ඉගැන්වීම්, බව්තීස්ම කිරීම, යක්ෂයන් පලවා හැරීම, රෝගීන් සුව කිරීම, හා සතුරාගේ සියලු බලය පරාජය කිරීම කළ යුතුය. එය වෙනත් කිසිදු නමකට වඩා බලවත්ය.

**සියලු අධිපතිකමටත් බලයටත් පරාක්‍රමයටත් ස්වාමිකමටත් මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන් කරන ලද සියලු නම්වලටත් වඩා උසස් කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා (එපීස 1:21)**

**එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස් කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන් සේක. එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තුගන්න පිණිසත්ය. (පිලිප්පි 2:9-11)**

## ජයග්‍රාහී උපක්‍රමයක්

අප මුහුණ පාන සියලුම පරීක්ෂාවනට යේසුස්වහන්සේද මුහුණ පෑ සේක. එහෙත් උන්වහන්සේ ඒ සියල්ල පාපයක් නොමැතිව ජයග්‍රහණය කළ සේක. උන්වහන්සේද ආත්මික යුද භූමියට ඇතුළු වූ බැවින් ඔබ මුහුණ දෙන සටන් දන්නා අතර උන්වහන්සේ ඔබව ශක්තිමත් කරන සේක.

**මක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමත් නැතුව, සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයෙක්ය. (හෙබ්‍රෙව් 4:15)**

උන්වහන්සේ ජයග්‍රාහියෙකු වූ බැවින් ඔබටත් ජයග්‍රාහිකයෙක් විය හැකිය.

**මක්නිසාද උන්වහන්සේම පරීක්ෂාකරනු ලැබ දුක්වින්ද බැවින්, පරීක්ෂාකරනු ලබන්නන්ට පිහිටවෙන්ට උඃන්වහන්සේට පුළුවන. (හෙබ්‍රෙව් 2:18)**

මතෙ. 26-28, මාක් 14-16, ලූක් 22-24 හා යොහාන් 18-21 හි සඳහන් යේසුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම පිළිබඳ කතාව කියවන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම, දෙවියන්වහන්සේගේ බලය හා සාතන්ගේ බලය අතර මෙතෙක් සිදු නුවූ විරූ මහත්ම ඝට්ඨනය වේ.

යේසුස්වහන්සේගේ මරණය නිසා දෙවියන්වහන්සේගේ සැලැස්ම විනාශවූයේ යයි සාතන් සිතිය. ඔහු දෙවියන්වහන්සේගේ එකම පුත්‍රයා මරා දැම්මේය. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ රජ කිරීමට සිටි රජතුමා ඔහු වනසා දැම්මේය. එහෙත් යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

**දේවදූතයන් ලෙගියොන් දොළොසකට වඩා මා ළඟට මේ දැන් එවන ලෙස මාගේ පියාණන්ගෙන් ඉල්ලන්ට මට බැරියැයි. නුඹ සිතනවාද? එසේ ඉල්ලුවොත්, මේ ආකාරවෙන්ට ඕනෑයයි කියන ලියවිලි සම්පූර්ණවෙන්නේ කොහොමදැයි ඔහුට කී සේක. (මතෙව් 26:53-54)**

**යේසුස්වහන්සේ උත්තර දෙමින් මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධව නොවේ. මාගේ රාජ්‍යය මේ ලෝකය සම්බන්ධ වී නම්, යුදෙව්වරුන්ට මා භාරදෙනු නොලබන පිණිස මාගේ සේවකයන් සටන්කරනවා ඇත. නුමුත් දැන් මාගේ රාජ්‍යය මෙලොවින් නොවේයයි කී සේක (යොහන් 18:36)**

**යේසුස්වහන්සේ ඔහුට උත්තරදෙමින්: ඉහළින් එය නුඹට නොදෙනලද්දේ නම් මට විරුද්ධව නුඹට කිසි බලයක් නැත. එහෙයින් මා නුඹට පාවා දුන් තැනැත්තාගේ පාපය වඩා මහත් යයි කී සේක. (යොහන් 19:11)**

යේසුස්වහන්සේ මරණයට පත්වූයේ උන්වහන්සේගේ බලය සතුරාගේ බලයට වඩා අඩු නිසා නොවේ. දේව රාජ්‍යයේ සැලැස්ම උන්වහන්සේගේ මරණයෙන් අවසන් නොවීය. උන් වහන්සේගේ රාජ්‍යය දෘශ්‍යමාන ලෙස මෙලොව පිහිටුවීමේ කාලය එය නොවීය. යේසුස් වහන්සේ ගේ මරණය සැබවින්ම දෙවියන්වහන්සේගේ සැලැස්ම සම්පූර්ණ කළේය. පාපයේ වහල් බවින් හා “දෙවැනි මරණයෙන්” (පාපය නිසා දෙවියන්වහන්සේ වෙතින් සදාකාලයටම වෙන්වීම දඬුවමින්) දැන් මිනිසුන් ගළවාගත හැකිය.

මෙය කෙතරම් ශ්‍රේෂ්ඨ වුවත්, කුරුසිය මත යේසුස්වහන්සේගේ මරණයෙන් ලද එකම ජයග්‍රහණය පාපයෙන් ගැළවීම පමණක් නොවේ. උන්වහන්සේගේ මරණයෙන් හා නැවත නැගිටීමෙන් යේසුස්වහන්සේ සාතන්ගේ සියලු බලය පරාජය කළ සේක.

**එහෙයින් උන් වහන්සේ කථා කොට: උන්වහන්සේ උසස් තැනට නැගුණු කල්හි වහල්කමට ගත්තවුන් වහල්කොට ගෙනගොස්, මනුෂ්‍යයන්ට තෑගි දුන්සේකැයි කියනසේක, (ඉතින්: නැගුටුණුසේකැයි කී බැවින් උන්වහන්සේ පොළොවේ පහත් තැන්වලට බැස්ස බවත් මිස වෙන කුමක් හැඟේද ? බැස්සාවූ උන්වහන්සේ නම් සියල්ල පූර්ණ කරන පිණිස සියලු ස්වර්ගවලින් ඉහළට නැගුණාවූ තැනැත්වහන්සේමය.) (එපීස 4:8-10)**

**උන්වහන්සේ තමන් කෙරෙන් අධිපතීන්ද බලයලත්තන්ද පහකොට, ප්‍රසිද්ධයෙන් ඔවුන් දක්වා, කුරුසිය කරණකොටගෙන ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශ කළ සේක. (කොලොස්සි 2:15)**

යේසුස්වහන්සේ සතුරාගේ සියලු බලය, මරණය ඇතුළුව, පරාජය කළ සේක. උන්වහන්සේ සාතන්ව විනිශ්චය කළ සේක.

**මේ ලෝකයේ විනිශ්චය දැන්ය. මේ ලෝකයේ අධිපතියා දැන් පිටත දමනු ලබන්නේය (යොහන් 12:31)**

යේසුස්වහන්සේ ගැළවීම උදෙසා මාර්ගයක් සකස් කළ සේක.. උන්වහන්සේ මරණයත්, සතුරු අධිපතීන්ගේ හා බලධාරීන්ගේ බලයත් පරාජය කළ සේක. උන්වහන්සේ සියල්ලෙහි අධිපත්‍යය නැවත මිනිසාට ලබාදුන් සේක. උන්වහන්සේ සාතන්ගේ විනිශ්චය ප්‍රකාශ කළ අතර එය අනාගතයේදී සපිරෙනු ඇත.

ඔබ උගත් පරිදි, වර්තමාන තත්ත්වය ස්වභාවික ලෝකයේ ඇතැම් රටවල පැවති තත්ත්වයට සමාන වේ. කැරලිකාර බලවේගයන් රජය විසින් පරාජය කරනු ඇත. කැරලි නායකයා විනිශ්චය යටතේ සිටියදී තවමත් නිදහසේ සිටී. ඔහුගේ මග පෙන්වීම යටතේ කෙරෙන සටන් තවමත් මෙලොව පවතී.

යේසුස්වහන්සේ සාතන්ට පරාජය කර, ඔහුව විනිශ්චය කළද ඔහු තවමත් නිදහසේ සිටී, එමෙන්ම යක්ෂාවේශ බලවේග, මාංශය හා ලෝකය තවමත් පොළෙවේ සටන් වදී. ඔවුහු ජයග්‍රාහකයාට නීත්‍යානුකූලව අයත් භූමි ප්‍රදේශය පාලනය කිරීමට උත්සාහ දරති. සාතන් පරාජය වී ඇති අතර ඔහු විනිශ්චය යටතේ සිටින බව පෙනීම වැළැක්වීමට ඔවුහු උත්සාහ කරති. ඔවුහු නිවෙස්, සභාවන් හා ජාතීන් පාලනය කිරීමටද උත්සාහ කරති.

ඇදහිලිවන්තයාගේ යුධසටන කෙරෙහි අවධානය යොමු වන්නේ මේ අවස්ථාවේය. යේසුස් වහන්සේ සතුරාව පරාජය කර ඇත. එහෙත් සාතන් තවමත් නිදහසේ සිටී. පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ දෙනෙත් විවෘත කර ඔහුගේ රැවටිලිකාර කම් පෙන්වා නිත්‍යානුකූලව අපට අයත් බල ප්‍රදේශයේ පාලනය අප අතට ගැනීම අපගේ කාර්යය වේ. සාතන්ට දී ඇති විනිශ්චය ක්‍රියාත්මක වන තෙක් හෝ ඔබ මරණයෙන් පසු යේසුස්වහන්සේ වෙතට යන තෙක් හෝ ඔබගේ පෞද්ගලික සටන පැවතෙනු ඇත.

**එසේ කළේ අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරන ලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයට, ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්ට ලැබෙන පිණිසය. (එපීස 3:10,11)**

## ජයග්‍රාහකයා මිස ගොදුරුවන තැනැත්තා නොවේ.

යේසුස්වහන්සේ තුළින් ඔබ සතුරාට එරෙහි ජයග්‍රාහකයා මිස සතුරාගේ ගොදුරක් නොවනු ඇත.

**සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත්කොට, සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළ සේක. ඒ සභාව නම් සියල්ලන් තුළ සියල්ල සම්පූර්ණ කරන තැනන්වහන්සේගේ පූර්ණකම වන උන්වහන්සේ ශරීරයය. (එපීස 1:22-23)**

සියල්ල යේසුස්වහන්සේ "පාදවලට යටත්කොට" ඇත. මින් අදහස් වන්නේ උන්වහන්සේ ඔවුන්ව පරාජය කර ඇති බවය. උන්වහන්සේ සභාවේ හිස වන අතර අපි ශරීරය වෙමු. සියල්ල උන්වහන්සේගේ පාදවලට යටත් කොට ඇතැයි පැවැසේ. මින් අදහස් වන්නේ උන්වහන්සේගේ ශරීරය, එනම් සභාව යටත් කොට ඇති බවය. එහි අදහස අප ජයග්‍රහකයෝ මිස ගොදුරක් නොවන බවය. ඔබ සාතන්ගේ බලයෙන් ඈත්කොට තැබිය හැකිය. අප සතුරාගේ බලයෙන් ඈත් කොට තබන ලෙස යේසුස්වහන්සේද යාච්ඤා කළ සේක.

**ඔබ ලෝකයෙන් ඔවුන් අහක්කරන පිණිස නොව, නපුරාගෙන් ඔවුන් ආරක්ෂාකරන පිණිස යාච්ඤා කරමි. මොවුන් ගැන පමණක් නොව, මොවුන්ගේ වචනය කරණකොටගෙන මා කෙරෙහි විශ්වාසකරන්නාවුත් ගැනත් ... යාච්ඤා කරමි. (යොහන් 17:15, 20)**

ඔබ ජයග්‍රහකයෙකි. ඒ ඔබගේම බලයෙන් නොවේ. ශ්‍රේෂ්ඨ තැනැත්වහන්සේගේ බලයෙනි.

**නුමුත් අපට ප්‍රේම කළාවූ තැනැත්වහන්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේදී අතිශයින්ම ජයගන්නෝ වමුව. (රෝම 8:37)**

ආත්මික සටන අවසන් වූ පසු, දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් සාක්ෂාත් වන බව බයිබලය සහතික කොට ඇත. මෙය මතක තබා ගන්න

**සේනාවල ස්වාමින්වහන්සේ දිවුරා කථාකොට: මා යෝජනා කළ ලෙසම සිදුවන්නේය, මා අදහස් කළ ලෙසම ස්ථිර වන්නේය. (යෙසායා 14:24)**

**මුළු පොළොව කෙරෙහි අදහස්කර තිබෙන අදහස මේය. සෑම ජාතීන් කෙරෙහි දිගුකර තිබෙන හස්තයත් මේය. මක්නිසාද, සේනාවල ස්වාමින්වහන්සේ අදහස් කළසේක, එය අවලංගුකරන්නේ කවුද? උන්වහන්සේගේ අත දිගුකර තිබේ, එය ආපසු හරවන්නේ කවුද? (යෙසායා 14:26-27)**

සේනාවල ස්වාමින්වහන්සේට පරමාර්ථයක් ඇති අතර එය ලෝකයේ කිසිදු බලයකට, මාංශයට, යක්ෂයන්ට, නිරයට හෝ සාතන්ට හෝ නිෂ්ප්‍රභා කළ නොහැකිය.

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ගත් ප්‍රධාන පදය ලියන්න.

2. දෙවියන්වහන්සේගේ පරමාර්ථය කුමක්ද?

3. යේසුස්වහන්සේ මෙලොවට වැඩිය පරමාර්ථය කුමක්ද?

4. ආත්මික සටන සඳහා දෙවියන්වහන්සේගේ කරුණු භයේ යුධ සැලැස්ම කුමක්ද?

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. ඔබ මෙම පාඩමෙන් ආත්මික සටනේදී දේව වචනයේ ඇති වැදගත්කම උගත්තෙහිය. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය දේව වචනය දැනගැනීමේ ඔබගේ හැකියාව වර්ධනය කෙරෙන පාඩමාලා දෙකක් සපයා ඇත. *"බයිබල් අධ්‍යයනයේ නිර්මාණාත්මක ක්‍රමවේද"* හා *"බයිබලයේ මූලික සමීක්ෂණය"* පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා විමසන්න.

2. සාතන්ගේ ක්‍රියාවන් විනාශ කිරීමට යේසුස්වහන්සේ වැඩිය බව ඔබ මෙම පාඩමෙන් උගත්තෙහිය. යේසුස්වහන්සේගේ පරමාර්ථ පිළිබඳව තව දුරටත් පහත දැක්වෙන පද මගින් කියවන්න. ලූක් 4:18-19, 4:43, 19:10, 24:46-49, යොහාන් 6:38, 9:4, 12:46, 18:37 දෙවියන්වහන්සේගේ පරමාර්ථය යේසුස් වහන්සේටසම්බන්ධවන ආකාරය පිළිබඳ ප්‍රකාශ කියවන්න. යොහාන් 3:16-18, එපිස 1: 9-10

3. නපුරු ආත්ම සමග සම්මුඛ වීම් බොහෝමයක් යේසුස්වහන්සේට තිබිණි. එහෙත් යේසුස් වහන්සේ මුහුණ දුන් සටන් දුෂ්ටාත්ම හා සාතන්ගේ පරීක්ෂාවන් පමණක්ම නොවේ. සාතන්, යේසුස්වහන්සේට සමීපව සිටියවුන්ද උන්වහන්සේට එරෙහිව සටන් කිරීමට යෙදවීය.

**පේත්‍රුස් :**

සිමියොන් පේත්‍රුස් යේසුස්වහන්සේ විසින් තෝරාගත් ගෝලයන් දොලොස් දෙනා ගෙන් එක් කෙනෙකි. එසේ වුවද ඇතැම් අවස්ථාවල යේසුස්වහන්සේට විරුද්ධව සටන් කිරීමට සාතන් පේත්‍රුස්ව යෙදවීය. යේසුස්වහන්සේ තමන්වහන්සේට නියමිත ඉදිරි මරණය ගැන පැවසූ විට, එවැනි දේ කීම ගැන පේත්‍රුස් උන්වහන්සේට තරවටු කිරීමට පටන් ගත්තේය. (මාක් 8:32) එවිට යේසුස්වහන්සේ පේත්‍රුස්ට මෙසේ පැවසූ සේක.

**නුමුත් උන්වහන්සේ හැරී, තමන් ගෝලයන් දැක පේතෘස්ට සැරකරමින් : සාතන් මා පස්සට යව මක්නිසාද නුඹ මනුෂ්‍යයන්ගේ කාරණා මිස දෙවියන්වහන්සේගේ කාරණා කල්පනාවට ගන්නේ නැතැයි කී සේක. (මාක් 8:33)**

පේත්‍රුස් සැබවින්ම සාතන් යයි යේසුස්වහන්සේ ඉන් අදහස් කළේ නැත. මේ මොහොතේ සිදුවූයේ සාතන්, පේත්‍රුස්ව භාවිත කිරිම වේ.

සාතන්ගේ ප්‍රධාන උපක්‍රමයක් වන්නේ ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමෙන් වැළැක්වීමට ඔබට ඉතා සමීප අය යොදා ගැනීම වේ. යේසුස්වහන්සේ මෙන් ඔබද ඔවුන්ගේ බල කිරීම පසෙක ලා යුතුය. ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීම වැළැක්වීමට, සාතන් ඔබට ඉතා සමීප අය භාවිත කරන්නේද?

මීට පසු දවසක, පේත්‍රුස් ස්වාමීන්වහන්සේට තම පක්ෂපාත කම පෙන්වූ විට, යේසුස් වහන්සේ මෙසේ කී සේක.

**සීමොන්, සීමොන් බලව, නුඹලා ගෝධූම මෙන් පොළන්ට සාතන් ඉල්ලුවේය. නමුත් නුඹේ ඇදහිල්ල නැති නොවන පිණිස නුඹ උදෙසා මම යාච්ඤා කළෙමි. නුඹ නැවත හැරුණායින් පසු නුඹේ සහෝදරයන් ස්ථිර කරන්නැයි කී සේක. (ලූක් 22:31-32)**

කුරුසිපත්වීමේ අවස්ථාව ළං වූ විට පේත්‍රුස් යේසුස්වහන්සේ නාඳුනන්නේ යයි කියන බව උන් වහන්සේ දැන සිටි සේක. සතුරා පේත්‍රුස්ගේ ජීවිතයෙන් යහපත් දේ සියල්ල ඉවත් කිරීම උත්සාහගන්නා බව උන්වහන්සේ දුටු සේක. එහෙත් පේත්‍රුස් තුළ ඇති මහත් හැකියාවන්ද යේසුස්වහන්සේ දිටිය. යම්කිසි දවසක පේත්‍රුස්, මුල් සභාවේ ශ්‍රේෂ්ඨ නායකයෙකු ලෙස පෙනී සිටින බව උන්වහන්සේ දැනගත් සේක.

**යුදස් :**

යුදස්, යේසුස්වහන්සේ තෝරාගත් මුල් ගෝලයන් දොළොස් දෙනාගෙන් එක් කෙනෙකි. සතුරා මේ මිනිසාව භාවිත කරන ආකාරය මුල් සිටම යේසුස්වහන්සේ දැන සිටි සේක.

**යේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් : මා විසින් නුඹලා දොළොස් දෙනා තෝරාගත්තා නොවේද? නුමුත් නුඹලාගෙන් එක්කෙනෙක් යක්ෂයෙක්යයි කී සේක. මෙසේ කීවේ සීමොන් ඉස්කාරියොත්ගේ පුත්‍රවූ යුදාස් ගැනය. මක්නිසාද දොළොස්දෙනාගෙන් එක්කෙනෙක් වූ ඔහු උන්වහන්සේ පාවාදෙන්ට සිටියේය. (යොහාන් 6:70-71)**

ජුදස් විසින් යේසුස්වහන්සේව පාවාදීම පිළිබඳව මතෙව් 26:20-25 න් හා යොහාන් 13:21-30 කියවන්න. ඔබව පාවාදීමට හා ඔබට තුවාළ කිරීමට සාතන් ඔබගේ සමීපතම අය යොදාගෙන තිබේද? එනමුත් යේසුස්වහන්සේ මෙන් ඔබද ඔබට පවරා ඇති කාර්යයන් මග හැරීමට ඊට ඉඩ නොදෙන්න.

4. මලාකි 1:13 කියවන්න. දිවැසිවරයා වාර්තා කරන්නේ ඔහුගේ කාලයේ මිනිසුන් ආගමික කටයුතු පිලිබඳව කෙතරම් කම්මැලිකමක් දැක්වූයේද යත් ඔවුහු "මෙය කොපමණ මහත් වෙහෙසක්ද"යි පැවසූහ. ඇතැම් විට මේ අය කෙදිනකවත් නමස්කාර කරන ආකාරය නොදැන සිටින්නට ඇත.

නමස්කාරය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන්න. ගීතා 5:7, 22:27, 29:2, 45:11, 66:4, 86:9, 95:6, 96:9, 97:7, 99:5, 9, නික්. 34:14, 1 ලේකම් 16:29, මතෙ. 15:9, මාක් 7:7, යොහාන් 4:23-24, පිලිප්පි 3:3

සේවයට බඳවා ගැනීමේ ක්‍රම, නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඩමාලාවේ නමස්කාරය නම් විෂය පිළිබඳව තවදුරටත් උපදෙස් අඩංගු වේ.

5. ප්‍රශංසා කිරීම පිළිබඳව තවදුරටත් ගීතාවලියෙන් අධ්‍යයනය කරන්න. "ප්‍රශංසාව" යන වචන සියල්ල ලකුණු කරන්න. ඉන්පසු ඒ වචනය ඇති සියලුම පද අධ්‍යයනය කරන්න.

6. යාච්ඥාව පිළිබඳව තවත් කරුණු සමහරක් මෙසේය :

**යාච්ඥාවලට පිළිතුරු ලැබෙන්නේ**

| | |
|---|---|
| සමහර විටෙක එවේලෙහිමය | යෙසායා 65:24, දානියෙල් 9:21-23 |
| සමහර විටෙක ප්‍රමාදවීය | ලූක් 18:7 |
| සමහර විටෙක අපගේ අභිලාෂයන්ට පටහැනිවය. | 2 කොරි. 12:8-9 |
| සමහර විටෙක අප බලාපොරොත්තුවටත් වැඩියෙන්ය | යෙරමියා 33:3, එපීස 3:20 |

**යාච්ඥා කිරීමේදී විවිධ ඉරියව් යොදාගත හැකිය.**

| | |
|---|---|
| සිටගෙන | 1 රාජාවලිය 8:22, මාක් 11:25 |
| වැඳවැටෙමින් | ගීතාවලිය. 95:6 |
| දණ ගසාගෙන | 2 ලේකම් 6:13, ගීතාවලිය 95:6, ලූක් 22:41, ක්‍රියා 20:36, |
| මුහුණින් වැටී | ගණන් කථාව 16:22, යොෂුවා 5:4, 1 ලේකම් 21:16, මතෙව් 26:39 |
| අත් විදහා | යෙසායා 1:15, 2 ලේකම් 6:13 |
| අත් ඔසවමින් | ගීතාවලිය 28:2, විලාප ගී 2:19, 1 තිමෝති 2:8 |

**යාච්ඥා කිරීම සඳහා ඔබ ජයග්‍රහණය කළ යුතු පොදු ගැටළු**

කාලයේ හිඟකම
සිත වෙනතකට යොමුවීම
වෙහෙස
ආශාවක් නොමැති කම

**යාච්ඥා බල සංවිධානය කිරීම**

යාච්ඥාව ආත්මික සටනේ ප්‍රබල ආයුධයකි. වඩාත් ඵලදායි ලෙස යුද්ධ කිරීම සඳහා යාච්ඥා සංවිධානය කළ යුතු ආකාරය නව ගිවිසුමේ සඳහන් වේ.

පෞද්ගලික යාච්ඤා : යාච්ඤා කළ යුත්තේ පෞද්ගලිකව රහසිගතවය. ගීතාවලිය 6:6

දෙදෙනෙක් එක්ව යාච්ඤා කිරීම : සාමුහික යාච්ඤාවේ කුඩාම ඒකකය දෙදෙනෙකු එක්වීම වේ. මතෙව් 18:19

කුඩා කණ්ඩායම් : කුඩා කණ්ඩායම් සෛලවල දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් ඇත. දෙදෙනෙකු හෝ තිදෙනෙකු මේ පරමාර්ථයට එක් වූ විට විශාල බලයක් තිබේ. මතෙව් 18:20

සම්පූර්ණ සමුහ යාච්ඤා: සාමුහික යාච්ඤා වලදී මුළු සභාවම එක්විය යුතුය. ක්‍රියා. 1:14-15

### යාච්ඤා පොරොන්දු :

යාච්ඤාව පිළිබඳව පහත දැක්වෙන පොරොන්දු කියවන්න. ආත්මික සටනේදී මේ ආයුධයේ ප්‍රබල බලය ඒවායින් පැහැදිලි වේ.

- ඔබ ඉල්ලීමටත් පෙර ඔබට අවශ්‍ය දෙය පියාණන් වහන්සේ දන්නා සේක. මතෙ. 6:8
- යාච්ඤාවේදී දෙදෙනෙකු එකඟ වුවහොත් ඊට පිළිතුරු ලැබේ. මතෙ. 18:19
- දෙවියන්වහන්සේට සියල්ල පුලුවන. මතෙ. 19:26, ලූක් 18:27
- ඇදහිල්ල ඇතුව කරන යාච්ඤාව ඵලදායකය මතෙ. 21:22, මාක් 11:24
- ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඕප්පු කරන කන්නලව්ව කරණකොටගෙන මහත් දේ ඉෂ්ට වෙයි. යාකොබ් 5:16
- යේසුස්වහන්සේගේ නාමයෙන් ඉල්ලුවොත් එය ලැබේ. යොහාන් 14:14

7. නිරාහාරව සිටීම ගැන තවදුරටත් අධ්‍යයනය කරන්න.

   - අප දෙවියන්වහන්සේගේ සේවකයන් වශයෙන් අනුමත කරන එක් දෙයක් නිරාහාරව සිටීම වේ. 2 කොරි. 6:3-10

   - සභාව සංවිධානය කිරීමේදී යාච්ඤාව සමග නිරාහාරව සිටීම යොදා ගත්තේය. ක්‍රියා 14:23

   - නිරාහාරව සිටීම සඳහා “අප කැමති විය යුතුය” 1 කොරි. 7:5

8. “සර්පයන් හා ගොණුස්සන්” පෑගීමේ බලය ඔබට තිබේයයි යේසුස් වහන්සේ පැවසූ සේක. පස්වන පරිච්ජේදයෙන් ඔබ සර්පයෙකුගේ ආත්මික හා ස්වභාවික සමානකම් දෙස බැලුවෙහිය. ගොනුස්සන් පිලිබඳව ආත්මිකව ව්‍යවහාර කළ හැකි කරුණු සමහරක් පහත දැක්වේ.

   ගෝනුස්සෝ අනෙක් අයව මගහරිති : ගෝනුස්සෙක් මැරෙන තෙක් සටන් කරයි. ඌ උගේ ගොදුර අල්ලාගෙන, පොඩිකර, ඉන්පසු උගේ දළ වලින් මාරාන්තික විෂ විදිනු ලබයි. ගෝනුස්සෙක් ඔබව දෂ්ඨ කළහොත් ඔබට වේදනාව දැනෙනු ඇත. කතා කිරීමේ අපහසුතාවක් ඇතිවිය හැකිය. දුර්වල වේ. හිරි වැටේ.

   ගෝනුස්සන් ජිවත් වන්නේ අඳුරු ස්ථානවලය, උණුසුමට (ආලෝකයට) අනාවරණය වූ විට මියයයි. ගෝනුස්සා පළමුව බේරී යෑමට උත්සාහ කරයි. ඉන්පසු උමතුවෙන් මෙන් වලිගයෙන් පහර දෙයි. ස්වාභාවික ලෝකයේ ගෝනුස්සන්ගේ සතුරන් වන්නේ විශාල කුහුඹු වර්ගයකි.

   ඔබට මෙම කරුණු, අප පස්වන පරිච්ජේදයෙන් සර්පයාට යෙදු ආකාරයට, ආත්මිකව යෙදිය හැකිද?

# හමුදා සේවයට කැඳවීම

## දෙවියන්වහන්සේගේ හමුදාවේ ක්‍රියාකාරී හමුදා සේවය

"හමුදා සේවයට කැඳවීම" යනු ක්‍රියාකාරී හමුදා සේවයට සූදානම්ව සිටීම වේ. මෙසේ "කැඳවීමේදී" දෙවියන්වහන්සේ හමුදාවේ ආත්මික බලවේගවලින් කොටසක් ක්‍රියාකාරී වීමේ ක්‍රියාවලියක් ඇත.

# දසවන පරිච්ඡේදය

## පහරදීමේ හා ආරක්ෂාකාරී සටන් කිරීම්

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "පහරදීමේ සටන" යන්න අර්ථවිග්‍රහ කිරීමට
- "ආරක්ෂාකාරී සටන" යන්න අර්ථවිග්‍රහ කිරීමට
- පහරදීමේ හා ආරක්ෂාකාරී සටන්වල පොදු සාධකය හඳුනා ගැනීමට
- පහරදීමේ හා ආරක්ෂාකාරී සටන්වල ශුද්ධාත්මයාණන්වහන්සේගේ භූමිකාව සාරාංශගත කිරීමට
- පොරබැඳීම පිළිබඳ ස්වභාවික උදාහරණයන් පහරදීමේ හා ආරක්ෂාකාරී සටන්වල උපක්‍රම පැහැදිලි කිරීමට යොදා ගැනීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ගත් ප්‍රධාන පදය

**යක්ෂයාට ඉඩ නොදෙන්න. (එපීස 4:27)**

## හැඳින්වීම

ස්වාභාවික ලෝකයේ සටන් ක්‍රම දෙකක් ඇත. ඒ පහරදීමේ හා ආරක්ෂාකාරී වශයෙනි. බයිබලයද පහරදීමේ හා ආරක්ෂාකාරී ආත්මික උපක්‍රම දෙකම අපට උගන්වයි. ඔබ පහරදීමේ හා ආරක්ෂාකාරී ලෙස සටන් කිරීමට උගත යුතුය. මීට විකල්ප එකම ක්‍රමය පැනයාම වේ. එය පිළිගත නොහැකිය.

මෙම පාඩම පහරදීමේ හා ආරක්ෂාකාරී සටන් ක්‍රම දෙකටම හැඳින්වීමක් සපයයි. මීළඟ පාඩම් දෙකෙන් පහරදීමේ හා ආරක්ෂාකාරී ආත්මික යුද්ධායුධ, විස්තරාත්මකව විමසා බලනු ලැබේ.

## ආරක්ෂාකාරී සටන් කිරීම

ආරක්ෂාකාරී සටන් කිරීම යනු තම බලප්‍රදේශය රැකගැනීමට කරන සටනකි. මෙහිදී සතුරා පහර දෙන තුරු බලා සිට, ඉන්පසු ආරක්ෂාවීම සඳහා තම බලඇණි කැඳවනු ලැබේ. ආරක්ෂාවන තැනැත්තා ප්‍රතිවාදියාට ප්‍රතිචාර දැක්විය යුතුය. ඔහුගේ තීරණය ආක්‍රමණිකයා විසින් ඔහු මත

බලෙන් පැටවුවකි. මේ සටන් ක්‍රමය මගින් සතුරාගේ බල ප්‍රදේශය ආක්‍රමණය කරනු නොලැබේ. එය තමාට අයත් බලප්‍රදේශය ආරක්ෂා කර ගනී. කෙසේ වුවද මෙය වැදගත්ය, මක්නිසාද නපුරු ආත්මික බලවේග නිරන්තරයෙන්ම, ඔබ ඇදහිලිවන්තයෙකු නිසා පහරදෙන බැවිනි. ඔබ ඔබව ආරක්ෂා කර ගැනීමට නොදන්නෙහි නම්. ඔබ මේ පහරදීම් වලට ගොදුරු වනු ඇත.

## පහරදීමෙන් සටන් කිරීම

පහරදීමේ සටන කලහකාරී සටනකි. එය බලාසිට ආරක්ෂාවීම සඳහා කරන සටනක් නොවේ. එය පහරදීම අරඹන්නේය. සතුරාව හඳුනාගෙන, සතුරාගේ උපක්‍රම සොයා බලා, ඔහුට විරුද්ධව ආත්මික ලෝකයේ පහරදීමෙන් ඉදිරියට ගමන් කරනු ලැබේ. පහරදීමේ සටන් ක්‍රමයේ පළමු තීරණ ගැනීමේ වාසිය ආක්‍රමණිකයාට ඇත. පහරදීමේ සටන්වලින් බල ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට වඩා අයත් කර ගැනීම සිදුවේ.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය සමග ලෝකයා වෙතට යෑමේ එකම ආත්මික සටන් ක්‍රමය පහරදීමෙන් ඉදිරියට යෑම වේ. අපට අපගේ සැප පහසු නිවෙස්වල හා දේවස්ථානවල ආරක්ෂාකාරී උපක්‍රම පමණක් භාවිත කරමින් නැවතී සිටිය නොහැකිය. දෙවියන්වහන්සේගේ හමුදාව සතුරාගේ බලප්‍රදේශවලට ඇතුළු විය යුතුය. එය ශුභාරංචි පණිවුඩයේ බලය ඇතිව සාතන්ගේ බලකොටු වෙත යා යුතුය. අපි කලහකාරී, පහරදීමේ ආත්මික සටන්වල නියැලිය යුතු වෙමු.

## පොදු සාධකය

පහරදීමේ හා ආරක්ෂාකාරී සටන් ක්‍රම දෙකටම පොදු වූ එක් දෙයක් ඇත. මේ දෙකෙහිම ඇදවන්තයාගේ පෞද්ගලික සහභාගිත්වය ඇත. ස්වභාවික යුද්ධයකදී භාවිත නොකළ යුද්ධායුධ සතුරාට තුවාළ කරන්නේ හෝ යුද්ධය දිනවන්නේ හෝ නැත. ආත්මික ලෝකයටද මෙය සැබෑවකි. ඔබගේ ආත්මික යුද්ධායුධ ඒවා භාවිත කිරීමේ ඔබගේ කැමැත්ත මගින් ක්‍රියාකාරී වේ. සටන් කිරීම සඳහා දෙවියන්වහන්සේ ඔබව බලවත් කරන බව සැබෑය. එහෙත් ඔබට පහරදීමේ හා ආරක්ෂාකාරී යන උපක්‍රම දෙකම පිළිබඳව වගකීමක් ඇත.

පැරණි ගිවිසුමේ සටන්වලදී ස්වාමින්වහන්සේ, උන්වහන්සේගේ සෙනග වූ ඉශ්‍රායෙල් වරුන් සමගද ඔවුන් වෙනුවෙන්ද සටන් කළ සේක. එහෙත් පළමුව යුද භූමියේදී ඔවුන් ඔවුන්ගේ තැන ගත යුතු විය. තමන් වහන්සේගේ නාමයෙන් ආත්මික යුද්ධායුධයක් භාවිත කරන බව දෙවියන්වහන්සේ දුටු විට හා කළ නොහැකි දෙයක් යුද භූමියේදී කිරීමට පුරුෂයෙකු හෝ ස්ත්‍රියක උත්සාහ කරන විට, සේනාවල ස්වාමින්වහන්සේ ක්‍රියාත්මක වන සේක.

2 රාජාවලිය 13:14-19 යෙහි එලිෂා පිළිබඳ කතාන්දරය කියවන්න. දුන්න හා ඊතල භාවිත කරන මෙම පාඩමේදී සටන් භූමියේ ඔබගේ කොටස අවබෝධ කරගැනීමට උපකාරී වන ඇතැම් ආත්මික සමානකම් ඇත.

### 1. සටන් කිරීම සඳහා ඔබගේ ඇති අභිප්‍රාය ප්‍රදර්ශනය කරන්න.

"ඔබගේ දුනු හා ඊතල ගන්නැ" යි එලිෂා යෝවාෂ් රජුට පැවසිය "ආත්මික කඩුව ගෙන" යුද්ධය ප්‍රකාශ කරන්නැයි පාවුලුතුමා පැවසීය. පහරදීමේ හා ආරක්ෂාකාරී යුද්ධායුධ අතට ගැනීමෙන් සටන් කිරීමට ඇති ඔබගේ අභිප්‍රාය ප්‍රදර්ශනය කෙරේ.

### 2. යුද්ධායුධය මත ඔබගේ අත තබන්න.

දුන්නට අත තබන ලෙස එලිෂා රජතුමාට පැවසීය, ඉන්පසු එලිෂා තම අත් රජුගේ අත් මත තැබීය. ජයග්‍රහණය සඳහා උපක්‍රමය වන්නේ ඔබගේ අත යුද්ධායුධය මත තිබීම හා උන්වහන්සේගේ අත ඔබ මත තිබීම වේ.

## 3. ජනේලය විවෘත කරන්න

සතුරා ජයග්‍රහණය කළ ස්ථානයේ ජනේලය විවෘත කරන්න. ඉශ්රායෙල්හි සතුරා සිටියේ නැගෙනහිර පෙදෙසේය. එබැවින් ජනේලය නැගෙනහිර පැත්තට විවෘත කරන ලෙස එලිෂා, රජුට දැන්වීය. ඔබගේ අසාර්ථකවීම්, පරාජයන්, බැඳීම් අනාවරණය වන ලෙස ඔබගේ ජීවිතයේ සියලුම ක්ෂේත්‍රවල "ජනෙල්" විවෘත කිරීම දෙවියන්වහන්සේට අවශ්‍යය

## 4. විදින්න

"විදපන්නැ" යි එලිෂා රජතුමාට කී විට ඔහු විද්දේය. එවිට එලිෂා "ඒ සිරියන්වරුන්ගෙන් ජය ගැනීමේ ස්වාමීන්වහන්සේගේ ඊගස" යයි කීවේය. විවෘත කළ ජනේලය ප්‍රමාණවත් නොවේ. ආයුධය ඔබ අතේ තිබීම ප්‍රමාණවත් නොවේ. දෙවියන්වහන්සේගේ අත ඔබ අත මත තිබීම වුවද සටන ජය ගැනීමට ප්‍රමාණවත් නැත. සේනාවල ස්වාමීන්වහන්සේගේ අණ "විදපන්න" යන්න ඔබ පිළිපැදිය යුතුය. මෙය සංග්‍රාමයේ ඔබේ කොටස වේ. එනම් ස්වාමීන් වහන්සේගේ අත මගින් මග පෙන්වන ලද ඔබ අත ඇති ආයුධය සැබැවින්ම භාවිත කිරීමය.

## 5. අරමුණු දැනගන්න.

සිරියාව කෙරෙහි ජයග්‍රහණයේ සංකේතයක් වශයෙන් ඊගස් ගෙන බිම ගසන්න යයි එලිෂා රජතුමාට කීවේය. ඔහු එසේ කළේය. එහෙත් ඔහු "තුන්වරක් ගසා නැවතුණේය". ඔහු තුන්වරක් බිම ගැසීමෙන් දෙවියන්වහන්සේව සීම කළ බැවින් ඔහුගේ යුද්ධ ජයග්‍රහණද සීමා වනු ඇතැයි එලිෂා ඔහුට පැවසීය. මෙය සිදුවූයේ රජතුමා යුද්ධයේ අරමුණ නොදැන සිටි බැවිනි. සතුරා සම්පූර්ණයෙන් පරාජය කිරීම ස්වාමීන්වහන්සේට අවශ්‍ය බව එලිෂා පවසා තිබුණි. (17 පදය) එහෙත් බිම තෙවරක් පමණක් ගැසීමෙන් රජතුමාට අයත් වූයේ. අර්ධ ජයග්‍රහණයක් පමණි.

ඔබ වෙනුවෙන් ස්වාමීන්වහන්සේගේ අරමුණ වන්නේ ඔබගේ ජීවිතය හා සේවයේ සියලු ක්ෂේත්‍ර වල පූර්ණ ජයග්‍රහණය වේ. ඔබට මෙම අරමුණ අවබෝධ කර ගැනීමට නොහැකි වුවහොත් ඔබගේ ජයග්‍රහණය සීමාසහිත වනු ඇත.

## 6. රහස් කුටියේදී පළමුව ජයග්‍රහණය ලබාගන්න.

එදින එලිෂා හා යෝවාෂ් රජතුමා අතර රහස් කුටියේදී සිදුවූ දේ සිරියාව සමග කළ සටන් ප්‍රතිඵල තීරණය කෙරිනි. ඔබ හා ස්වාමීන්වහන්සේ අතර රහස් කුටියේදී සිදුවන දේ ජීවිතයේ සැබෑ සටන්වල ජයග්‍රහණයෙන් තීරණය කෙරේ.

## සාතන්ගේ උපායයන් :

ආක්‍රමණික හා ආරක්ෂක සටන් දෙකටම පදනම වන්නේ සාතන්ගේ උපක්‍රම පිළිබඳ දැනුම වේ.

> **... ක්‍රිස්තුස්වහන්සේ ඉදිරියෙහි නුඹලා උදෙසාය. මක්නිසාද ඔහුගේ උපායවල් අප විසින් නොදැන සිටිනවා නොවේ. (2 කොරින්ති 2:11)**

"උපාය" යන වචනයෙහි තේරුම සැලැස්ම, ව්‍යාපෘතිය, කුමන්ත්‍රණය හෝ රහස් සැලැස්ම විය හැකිය. ඔබ සාතන්ගේ උපායයන් නොදන්නා විට හා ඒවාට ආක්‍රමණශීලිව හා ආරක්ෂාකාරීව ප්‍රතිචාර දැක්වීමට අසමත් වූ විට සාතන්ට ඔබ අභිබවා යා හැකිය.

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය

ශුද්ධාත්මයාණන්වහන්සේ ලෙස හැඳින්වෙන යහපත් ආත්මික බලවේගය පිළිබඳව ඔබ මීට කලින් ඉගෙන ගෙන ඇත. පහරදීමේ හා ආරක්ෂක යන සටන් ක්‍රම දෙකටම ශුද්ධාත්මයාණන්වහන්සේ

වැදගත් වේ. සාතන්ගේ උපක්‍රම සාතන් දන්නා අතර සටනේ නිරතව සිටින ඇදහිලිවතුන් වෙනුවෙන් උන්වහන්සේ මැදිහත් වනු ඇත.

> **එලෙසම ආත්මයාණන්වහන්සේත් අපගේ දුර්වලකම් වලදී උපකාර කරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤාකරන්ට අපි නොදනිමුව, නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම් වලින් උප උදෙසා මැදහත්කම්කරන සේක. ඒ ආත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන බැවින්. සිත් විමසන තැනන්වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නා සේක. (රෝම 8:26-27)**

සතුරාගේ බල ප්‍රදේශ අල්ලා ගැනිමට ශුද්ධාත්මයාණන් වහන්සේ බලය දෙන සේක.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සාමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය කී සේක. (ක්‍රියා 1:8)**

ආක්‍රමණික හා ආරක්ෂක සටන්වලදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා අගනා යුද්ධායුධ වේ. දැනගැන්මේ දීමනාව හා ප්‍රඥාවේ දීමනාව ආත්මික සටන සඳහා අධි ස්වභාවික එළිදරව් සපයයි. ආත්ම විමසීමේ දීමනාවෙන් සතුරාගේ රැවටිලිකාරකම් එළිදරව් වේ.

පූජකවරුන්ගේ, දිවැසිවරුන්ගේ, ප්‍රේරිතයන්ගේ, එවැන්ජලිස්තවරුන්ගේ හා ගුරුවරුන්ගේ **විශේෂ** දීමනා, සටන සඳහා අපව සන්නද්ධ කිරීමට උපකාරී වේ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ **කතාකිරීමේ** දීමනාව දෙවියන්වහන්සේගෙන් විශේෂ උපදෙස් සපයයි. එමෙන්ම ආත්මයේ සේවය කිරීමේ දීමනාව, දෙවියන්වහන්සේගේ හමුදාවට ආත්මික ඉදිරි ගමනට හැකියාව ලබා දෙයි.

## පොර බැඳීම : ආත්මික සත්‍යයේ ස්වභාවික සමානතාවක්

පහරදීමේ ආත්මික සටනෙහිදී බොහෝ සේ වැදගත් වන දෙයක් වන්නේ :

> **මක්නිසාද අපේ පොරබැඳීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටි දුෂ්ටකමේ ආත්ම සේවාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

“පොර බැඳීම“ යන වචනය දෙවියන්වහන්සේ තෝරා ගැනිම වැදගත්ය. පොර බැඳීම ශ්‍රේෂ්ඨ ආත්මික සත්‍යයක ස්වාභාවික සමාන්තරයකි. පොර බැඳීම, ස්වාභාවික ලෝකයේ ශක්තිය පෙන්වන ක්‍රීඩාවක් වේ. පොර බැඳීම යන්නෙන් අදහස් වන්නේ, “විරුද්ධවාදියෙකු හා සමග බලය වෙනුවෙන් කරන සටන” යන්න වේ.

ඔබගේ ආත්මික සටනට යෙදෙන ආකාරයට ස්වාභාවික ලෝකයේ පොර බැඳීම පිළිබඳව පහත දැක්වෙන කරුණු සලකා බලන්න.

### 1. සූදානම්වීම හා පුහුණුව

ස්වභාවික ලෝකයේ මල්ලව පොරකරුවෙකු තම ක්‍රීඩාව සාර්ථක කර ගැනිම සඳහා පුහුණුවිය යුතුය. ඔහු සුදුසු ආහාර ගත යුතුය. මල්ලව පොර පිළිබඳ නීති ඔහු හොඳින් ඉගෙන ගෙන, සටන ජයගැනිම සඳහා ඒවා ප්‍රවේසමෙන් අනුගමනය කළ යුතුය.

ඇදහිලිවන්තයෙකුද ජයග්‍රහණය සඳහා ආත්මික සටනේ නීති උගත යුතුය. සාර්ථක ආත්මික පොරබැඳීමක් සඳහා දේව වචනයේ හා යාච්ඤාවේ උචිත “ආහාර” අවශ්‍යය. ස්වාභාවික ලෝකයේ මල්ලව පොර සඳහා දක්ෂතා පුහුණුවෙන් ලබාගන්නාක් මෙන්, මෙහිදීද දක්ෂතා ලැබෙන්නේද පුහුණුවෙනි.

ස්වභාවික ලෝකයේ පුහුණුවේ මූලික පරමාර්ථය නම් ක්‍රීඩකයාට අවම මහන්සියකින් උපරිම දක්ෂතාවයකින් ක්‍රීඩා කිරීමටය. මෙය ආත්මික ලෝකයේද මේය සැබෑවකි. සමහරක් ඉක්මනින් වෙහෙස මහන්සිවී ආත්මිකව පරාජය වන්නේ ආත්මික සටනට පුහුණුවී නොමැති නිසාය.

## 2. සටනේ ස්වභාවය

පෞද්ගලික මල්ලව පොර ශූරතාව කණ්ඩායම් ක්‍රීඩාවක් නොවේ. මල්ලව පොර බදන්නෙකු වෙහෙසට පත් වූ විට ඒ වෙනුවට ආදේශකයෙකු යැවිය නොහැකිය. මල්ලව පොර බැදීමේදී ප්‍රතිවාදියා හා සමග සමීප, මුහුණට මුහුණ ලා කෙරෙන පෞද්ගලික හමුවක් වේ.

ආත්මික ලෝකයටද මේය සැබෑවකි. ඇදහිලිවන්තයෝ සතුරා සමග සමීපව මුහුණට මුහුණලා සටන් කරති. ආත්මික සටනේදී ඔබ වෙනුවෙන් සටන් කිරීමට වෙනත් ඇදහිලිවන්තයෙකුට ඔබගේ තැන දිය නොහැකිය. පොරබැදීමේදී අනෙකුත් ක්‍රීඩාවල මෙන් "විවේක සෙවීමක්" නොමැත. මෙම සටනෙන් කිසිම දාක සාතන් විවේක නොගනී. ඇදහිලිවන්තයින් සැම විටම සූදානමෙන් සිටිය යුතුය.

## 3. උපක්‍රම

ස්වභාවික මල්ලව පොර ක්‍රීඩාවේ පහරදීම මෙන්ම ආරක්ෂක උපක්‍රම ද ඇත. මේවා ආත්මික ලෝකයේද ව්‍යවහාර කළ හැකිය. මගහැරීම, මල්ලව පොර බැදීමේදී යොදාගන්නා එක් ශිල්පීය ක්‍රමයකි. මෙහිදී ප්‍රතිවාදියාගේ අභිමුඛයට පැමිණීම මග හරිනු ලැබේ. මෙහි විනිශ්චය කරන ක්‍රමය අනුව මගහැරිය විට ලකුණු කැපේ. ආත්මික සටනේදීද ඔබ "මග හරින" ක්‍රමය භාවිත කළහොත් ඔබට "ලකුණු කැපේ". ඔබ සතුරා සමග ආක්‍රමණශීලිව පොර බැදිය යුතුය. ඇතැම් ඇදහිලිවන්තයෝ තම මුළු ජීවිත කාලයම සතුරා අභිමුඛයට නොපැමිණී ඔවුන් මගහරිමින් සිටිති. ඔවුහු කෙදිනකවත් ආක්‍රමණශීලිව පොර බදින්නේ නොමැති බැවින් ජයග්‍රහණ නොලබති.

## 4. සමබරතාව නැතිකිරීම

සාමාන්‍ය මල්ලව පොර ක්‍රීඩාවේ තවත් උපක්‍රමයක් වන්නේ සතුරාගේ සමබරතාව නැති කිරීම වේ. සතුරාගේ සමබරතාව බිඳ දැමූ විට, ඔහු නැවත එය ලබා ගැනීමට යත්න දරයි.

සමබරතාව තබා ගැනීම හෙවත් "පමණ නොඉක්මවා ක්‍රියා කිරීමේ" වැදගත්කම පිළිබඳව බයිබලය බොහෝ අවස්ථාවල කතා කරයි. ආත්මික ක්ෂේත්‍රයේ සාතන්ගේ එක් උපක්‍රමයක් වන්නේ සමබරතාව නැති කිරීම වේ. බොහෝ ලබ්ධීන් බිහිවී ඇත්තේ දේවධාර්මික ගැටළුවල සමබරතාවක් නොමැති වීම නිසාය. නිවෙස්, සභා සහභාගිත්වය, හා ජාතීන් වුවද පරාජය වන්නේ උචිත සමබරතාවක් නොමැතිවීම හෝ අතැම් ක්ෂේත්‍ර කෙරෙහි අවධාරණයක් නොමැතිවීම නිසාය.

මල්ලව පොර බැදීමේදී සමබරතා වර්ග දෙකක් තිබේ. මානසික හා ශාරීරික සමබරතාවයය. ශාරීරික සමබරතාව නැති කිරීමට පෙර මානසික සමබරතාවට පහරදිය යුතුය. මෙය සාක්ෂාත් කරගැනීමට විස්මිත කිරීමේ උපක්‍රමයක් යොදා ගනු ලැබේ. වික්ෂිප්ත කෙරෙන හා විස්මිත කෙරන උපක්‍රමයක් යොදනු ලැබේ. එම උපක්‍රමය මත පොර බදන්නාගේ අවධානය යොමු වූ විට අදාළ ශිල්පීය ක්‍රමය ව්‍යවහාර කෙරේ. යම් උපක්‍රමයක් භාවිත කිරීමට යන බව විශ්වාස කිරීමට සැලැස්වූ විට ප්‍රතිවාදියා ඒ අනතුරෙන් බේරීමට උත්සාහ කරනු ඇත. එවිට ඇත්තෙන්ම එන්නාවූ පහර කැමට ඔහු ලක්වේ.

ආත්මික ලෝකයටද මෙය සැබෑය. විස්මිත කිරීමේ උපක්‍රමය මගින් සාතන් අපගේ සමබරතාව නැති කරයි. සිත වෙන අතකට යොමු කිරීමේ ක්‍රම මගින් ඔහු ඔබගේ මානසික සමබරතාව නැති කරයි. ඔබ බියවී ඔබේ අවධානය ඒ වෙතට යොමු කළ විට ඔහු බලාපොරොත්තු වූ ප්‍රහාරය ඔබගේ ජීවිතයේ වෙනත් ක්ෂේත්‍රයකට යොමු කරනු ඇත.

## 5. බලාපොරොත්තුව

සාමාන්‍ය මල්ලව පොරවලදී බලාපොරොත්තුවෙන් සිටීම වැදගත් වේ. යම් චලනයක් කිරීමට යන බවත් නිර්ණය කිරීමට හැකි මල්ලව පොර කරුවෙකුට ප්‍රතිවාදියා පහරක් වැළැක්වීමට පහසුය.

ප්‍රතිවාදියා පහර දෙනු විට, මල්ලව පොර කරු එය බලාපොරොත්තු වෙන් සූදානම්ව සිටි බැවින් එම පහර බොහෝ දුරට සාර්ථක වන්නේ නැත.

ආත්මික ලෝකයටද මෙය සැබෑය. සාතන්ගේ උපක්‍රම ඔබ දන්නෙහි නම් හා ඔබ ඒවා බලා පොරොත්තු වන්නෙහි නම් ඔබ ඊට සූදානම්ය. ඔබ පහරට ලක්වූ විට ඔබේ සමබරතාව නැති නොවන්නේය.

## 6. ඇමක් දෑමීම

ප්‍රතිවාදියාව "ඇමක්" වන චලනයන්ද මල්ලව පොරවල ඇත. එමගින් ඔහුව යම් චලනයකට පොළඹවා ඔහුව දුර්වල කළ හැකිය. ආත්මික ලෝකයේදී ඔබව දුර්වල කෙරෙන චලනයක් කිරීමට සාතන් නිතරම ඔබව පොළඹවයි.

සාමාන්‍ය මල්ලව පොරවලදී, චලනයන් සැලසුම් කරන්නේ ප්‍රතිවාදියාට පහර කෑම්වලට විවෘත වන පරිදිය. මේ සඳහා අවස්ථා ඕනෑකමින්ම නිර්මාණය කෙරේ. එමගින් ප්‍රතිවාදියා දුර්වල වූ අවස්ථාවෙහිම එය ප්‍රයෝජනයට ගැනේ.

ආත්මිකව, ප්‍රහාරවලට ඔබ විවෘත කෙරෙන අවස්ථාවන් සාතන් නිර්මාණය කරනු ඇත. එවිට ඔබේ දුර්වල අවස්ථාව ඔහු ප්‍රයෝජනයට ගනී. එහෙත් ඔබ මතක තබා ගත යුත්තේ දුර්වල අවස්ථාවේ සිටින්නේ සාතන් බවය. ඔබ තුළ ඇති බලය ඔහුගේ බලයට වඩා වැඩිය. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් දැනටමත් ඔහු දුර්වල කෙරෙන අන්තිම පහර ඔහුට දී ඇත. එහෙත් මෙම තරඟය ජයග්‍රහණය කිරීමට ස්වාමීන්වහන්සේ ඔබට දී ඇති අවස්ථාවෙන් ප්‍රයෝජන ගත යුතුය.

## 7. ප්‍රහාර හා ප්‍රතිප්‍රහාර දෙන්න

සාමාන්‍ය මල්ලව පොරවලදී, ඔබ කරන සෑම චලනයක්ම ප්‍රතිවාදියාගෙන් ප්‍රතිචාරයක් ලැබෙන පරිදි සිදුවේ. ආත්මික ලෝකයේද මෙය සත්‍යයකි. ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් කරන ඕනෑම කාර්යයකට ප්‍රතිවිරුද්ධ කාර්යයක් සාතන් කරයි.

## 8. චංචලත්වය (එහා මෙහා යන)

මල්ලව පොරවලදී එහා මෙහා යන (චංචල වන) ප්‍රතිවාදියා භයානක කෙනෙකු ලෙස සලකනු ලැබේ. ඔබගේ ප්‍රතිවාදියා යටපත් කිරීමට ඔබ අවශ්‍ය ඒ නිසාය. ආත්මික ලෝකයේ සාතන් චලනය වන ප්‍රතිවාදියෙකි. ඔහු ගොදුරක් ගිලින්නට සූදානම් සිංහයෙකු සේ "ඔබ-මොබ" ගමන් කරයි. ඔහුගේ නිරන්තර චලනයට ඔබ සූදානමින් සිටිය යුතුය. එමෙන්ම ඔබගේ චංචලත්වයේ සචලත්වය ගැනද ඔහු විමසිල්ලෙන් සිටී. ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් වැඩෙහි යෙදීම වැළැක්වීමට ඔහුට අවශ්‍යය. ඔබ ආත්මිකව බිම වැට්ටීමට ඔහු උත්සාහ කරන්නේ එබැවිනි.

## 9. ආපසු ලබාගැනීම

මල්ලව පොරයකදී වරදක් සිදුවුවහොත් එය ප්‍රතිවාදියාට වාසියක් වේ. ආත්මිකවද මෙය කෙතරම් සත්‍යයක්ද? ආත්මික පොරයකදීද ඔබ කරන ඕනෑම වරදක් සතුරා විසින් වාසියකට හරවා ගනු ලැබේ. වැටීනාවූ ස්ථානයෙන් ඉකමනින් නැගිටන ආකාරය ඉගෙනීම මල්ලවපොරවලට ඉතා වැදගත් වේ. පහත් තත්ත්වය වාසියකට හරවා ගැනීමද අවශ්‍ය වේ. මෙය කිරීමට හැකිවන ගැළවීමේ හා ප්‍රතිවර්තනයේ මාර්ග ඇත.

ආත්මික පොරබැදීමේදී ඇතැම් අවස්ථාවල ඔබ වැටී ඇති බවට හා සතුරා විසින් තාවකාලිකව යටත්කර ඇති බවට හැඟීමක් ඔබ තුළ ඇතිවිය හැකිය. එහෙත් ඔබ ඒ තත්වයේම සිටිය යුතු නැත. ඔගේ අවාසි අවස්ථා වාසි අවස්ථාවන් බවට හරවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි උපක්‍රම දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් සපයා ඇත. සාමාන්‍ය මල්ලව පොර වලදී භාවිත කරන ගැළවීමේ හා ප්‍රතිවර්තනයේ උපක්‍රම හා සමාන ඒවා උන්වහන්සේ ආත්මික අවස්ථාවලටද දී ඇත.

යෝසෙප්ගේ ජීවිතය මේ සඳහා කදිම උදාහරණයකි. වහල්භාවයට විකුණා සිරයට දැමීමේ අවාසිය ඔහුට තිබිණි. එහෙත් ඔහු අවාසිය, වාසියට හරවා ගත්තේය. අවසානයේදී ඔහු සතුරා පරාජය කර ජය ලැබීය.

ප්‍රතිවාදියා පසුපසින් ගැනීම, ඇදගෙන යෑම, බිමට තද කිරීම, විසි කිරීම, හා ඇද දැමීම වැනි ක්‍රම ද මල්ලව පොරවල ඇත. ආත්මිකව සතුරා භාවිත කරන උපක්‍රම ඔබට හඳුනාගත හැකිද ?

## 10. අරමුණ

සාමාන්‍ය ලෝකයේ මල්ලව පොර වලට සහභාගී වීමේ අරමුණ වන්නේ, සතුරාව වට්ටා ඔහු බිමට තදකරගෙන සිටීමෙන් සතුරා පරාජය කිරීම වේ. මෙම ප්‍රතිඵලය ලැබෙන්නේ උපක්‍රමිකව චලනය වීමෙන් හා/හෝ ප්‍රතිවාදියා බිමට හෙලීමෙනි.

සාතන් නිරන්තරයෙන්ම ඇදහිලිවන්තයන්ට එරෙහිව සාමාන්‍ය ලෝකයේදී සටන් කරයි. එමගින් ඔවුන්ව වෙහෙසට පත් කරයි. ඔහුගේ අරමුණ ඇදහිලිවතුන්ව වැටෙන්නට සලස්වා, ඔවුන්ව බිමට ඇද දමා, පාපයේ උගුලට අසු කිරීම වේ. සාමාන්‍ය ලෝකයේ මල්ලව පොර කාරයෙකුගේ ඉලක්කය තම ප්‍රතිවාදියාගේ ආධාරක විනාශ කිරීම වන අතර සාතන්ගේ ඉලක්කයද එයම වේ. එනම් ඔහුගේ ඉලක්කය ඔබ ආත්මිකව මුනින් අතට වැට්ටීමය.

## 11. ලකුණු ගැනීම

සාමාන්‍ය ලෝකයේදී මල්ලව පොරයකින් ජයග්‍රහණය ලබා ගන්නේ විනිශ්චයකාරයෝ දෙනු ලබන ලකුණු දීමේ ක්‍රියාවලියෙනි. ඵලදායි උපක්‍රම වැඩියෙන්ම භාවිත කළ තැනැත්තා තරගයෙන් ජය ගනු ලැබේ.

ඔබගේ ආත්මික සතුරා දැනටමත් විනිශ්චය කර ඇත. සාතන් පරාජය කරනු ලැබුවේ ඉතිහාසයේ ඇති වඩාත්ම ඵලදායි මාර්ගයෙනි, එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම වේ. ඔබ පොර බදන්නේ දැනටමත් විනිශ්චය කරනු ලැබ ඇති තරගය පරාජය වූවෙකු සමගය. මේ නිසා ඔබ යෙදී සිටින මල්ලව පොරයේ ඔහුගේ බලය හෝ උපක්‍රම හෝ ගැන බිය විය යුතු නැත. ඔබ වැටීමට හෝ පාපයේ බරින් මිරිකී සිටීම හෝ අවශ්‍ය නැත. ආත්මික සටන නමැති මල්ලව පොරයේ ඔබට ආත්ම විශ්වාසයකින් යුතුව සිටගෙන සිටිමින් ඇදහිල්ලෙන් ඔහුට බලවත්සේ ප්‍රතිවිරෝධය දැක්විය හැකිය.

## 12. මානසික ආකල්ප

මල්ලව පොරවලදී මානසික ආකල්ප ඉතා වැදගත් වේ. සාමාන්‍ය ලෝකයේ මල්ලව පොර ශූරතාවක් සඳහා පහත දැක්වෙන ආකල්ප අවශ්‍යයයි පැවසේ. මෙම ආකල්ප ආත්මික ලෝකයටද අදාළය.

**ආශාව :** ජයගැනීම සඳහා සුභපැතුම් පමණක් ප්‍රමාණවත් නොවේ. ශූරතාව දිනාගැනීම සඳහා (අභිලාෂයක්ද) කැමැත්තක්ද තිබිය යුතුය.

**නොනැවති කරන උත්සාහය :** මල්ලව පොර ශූරතාව සඳහා තිරසාර ආයාසයත් අවශ්‍යය. මල්ලව පොර ශූරයෙක් කවදාවත් පරාජයක් පිළිගන්නේ නැත.

**පරමාර්ථය :** මල්ලව පොර තරගයක පරමාර්ථය හා ඉලක්කය ජයග්‍රහණය වේ. මේ ඉලක්කය සපුරාලීමට, මේ අවස්ථාවේ ස්වාමියා ඔහු බව ඔහු දැනගත යුතු අතරම, ඒ බව සතුරාද දැන ගැනීමට ඉඩ සැලසිය යුතුය.

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. ආරක්ෂාකාරී සටන යන්න අර්ථවිග්‍රහ කරන්න.

3. පහරදීමේ සටන යන්න අර්ථවිග්‍රහ කරන්න.

4. පහරදීමේ හා ආරක්ෂාකාරී සටන්වල පොදු සාධකය කුමක්ද?

5. පහරදීමේ හා ආරක්ෂාකාරී සටන්වල, ශුද්ධාත්මයාණන්වහන්සේගේ භූමිකාව සාරාංශගත කරන්න.

6. පොරබැදීම පිළිබඳ ස්වාභාවික උදාහරණයෙන් පහරදීමේ හා ආරක්ෂාකාරී සටන් ගැන ඔබ උගත් දේ සාරාංශගත කරන්න.

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. මිනිසුන්ගේ "රථ" (යුද්ධායුධය) කෙරෙහි ඔබ විශ්වාසය නොතැබිය යුතුය : ගීතාවලිය 20:7 දෙවියන්වහන්සේට ආත්මික "රථ" ඇත. මේ පිළිබඳව ඇති දේ මේ පදවලින් කියවන්න. ගීතාවලිය 68:17, 104:3, යෙසායා 19:1 හා 2 රාජාවලිය 2:11

2. සාතන් විනාශකයා බැවින් ඔබ පහරදීමේ හා ආරක්ෂාකාරී සටන් ක්‍රම දෙකම යොදා ගැනීමට සිදුවේ. යොහන් 10:10, 1 කොරින්ති 10:10, මතෙව් 10:28

    - ඔබ දෙවියන්වහන්සේට කීකරු වුවහොත් විනාශයකට පැමිණීමට උන්වහන්සේ ඉඩ නොදෙනසේක. නික්මයාම 12:23
    - සාතන්ගේ විනාශ කිරීමෙන් දෙවියන්වහන්සේ ඔබ බේරාගන්න සේක. ගීතාවලිය 17:14
    - ඔබගේ විරුද්ධකාරයා, සාතන් වේ. ඔබ ඔහුට විරුද්ධව සටන් කරන්නෙහිය. 1 පේත්‍රුස් 5:8, ඔබට විරුද්ධව ක්‍රියා කිරීමට ඔබ ඔහුට ඉඩ නොදිය යුතුය. 1 තිමෝති 5:14. ඔබ දෙවියන් වහන්සේට කීකරුවන්නෙහි නම්, උන්වහන්සේ ඔබේ සතුරන්ට විරුද්ධකාරයෙක් වන සේක. නික්මයාම 23:22

3. ඔබ සාතන්ට පරාජය විය යුතු නැත. පහත දැක්වෙන යොමුවන් අධ්‍යයනය කරන්න.

    **ඔබට සතුරාව පළවා හැරීමට පුළුවන :** ලෙවීකථාව 26:7-8, ද්විතීය කථාව 32:30, යොෂුවා 23:10

    **ඔබට ජයග්‍රහණය කළ හැකිය :** ද්විතීය කථාව 7:21, 1 ලේකම් 29:11, ගීතාවලිය 5:11, 18:29, 24:8, 91:1, යෙසායා 49:19, 1 කොරින්ති 15:57, 1 යොහන් 5:4

    **ස්වාමීන්වහන්සේ ඔබගේ බලකොටුවය :** 2 සාමුවෙල් 22:2, ගීතාවලිය 18:2, 31:3, 71:3, 91:2, 144:2, යෙරමියා 16:19

    **සතුරාව අභිබවන අධිකාරී බලය ඔබට ඇත. :** ගීතාවලිය 8:6, 49:14, 72:8, 119:133, දානියෙල් 7:27, එපීස 1:21

    **ආරක්ෂාව ලැබෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය :** හිතෝපදේශ 18:10, 21:31, 29:25, ගීතාවලිය 91, ආරක්ෂාවේ ගීතිකාව වේ.

    **දෙවියන්වහන්සේ ඔබව සිත්තැවුලෙන් මුදවන සේක :** ගීතාවලිය 25:17, 107:6, 13, 19:28

    **සතුරාගේ සිතවිලි ඔබට අල්ලාගත හැකිය :** 2 කොරින්ති 10:5

    **දෙවියන් වහන්සේ සතුරාගේ බැඳුම් මුදන සේක :** ගීතාවලිය 116:16, රෝම 8:15-21, ගලාති 5:1

4. පාවුලුතුමා පොරබැදීම ගැන කතා කරන විට, ඔහු කතා කරන්නේ සතුරා සමග කරන පොර බැදීමක් මිස යාකොබ් මෙන් දෙවියන්වහන්සේ සමග නොවේ. ඔබ පොර බදින විට, ඔබව "යාකොබ්" ගෙන් "ඉශ්රායෙලයට" පරිවර්තනය කිරීම සඳහා ස්වයං පෝෂණ ආත්මය බැදී දැමීම පිණිස දෙවියන්වහන්සේ සමග පොර නොබදින බව සහතික වන්න.

5. මෙම අත්පොතේ තුන්වන පරිච්ඡේදය නැවත බලන්න. අනතුරුව පහරදීමේ හා ආරක්ෂාකාරී සටන්ක්‍රම දෙකෙහිම ශුද්ධාත්මයාණන්ගේ කාර්යයන් ලැයිස්තුගත කරන්න.

# ශුද්ධාත්මයාණන් වහන්සේ සේවය

**පහරදීමේ සටන** **ආරක්ෂක සටන**

# එකොළොස්වන පරිච්ඡේදය

## ආරක්ෂක යුද්ධායුධ

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආරක්ෂක ආත්මික යුද්ධායුධ විස්තර කිරීමට
- දෙවියන්වහන්සේගේ යුද්ධායුධ ලැයිස්තුගත කර ඇති ශුද්ධ ලියවිලි කොටස් දැක්වීම
- දෙවියන්වහන්සේගේ යුද්ධායුධවල සෑම කොටසක්ම හැඳිනගැනීමට
- සෑම යුද්ධායුධයකම ක්‍රියාව පැහැදිලි කිරීමට

හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබා ගත් ප්‍රධාන පදය

> **යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන්වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගන්න. (එපීස 6:11)**

## හැඳින්වීම

ඔබ යෙදී සිටින මහා ආත්මික යුද්ධය සාමාන්‍ය ආයුධ වලින් සටන් කිරීමට නොහැකි බව ඔබ උගත්තෙහිය. එය සටන් කළ යුත්තේ පහරදීමේ හා ආරක්ෂාකාරී යුද්ධායුධ වලිනි. ඔබ දැනටමත් නවවන පරිච්ඡේදයෙන් "දෙවියන්වහන්සේගේ සටන් සැලැස්ම" උගත්තෙහිය. මූලික ආත්මික උපක්‍රමවල පහත දැක්වෙන දේ ද අඩංගු බව ඔබ දන්නෙහිය.

- දේව වචනය
- පවරන ලද බලය හා අධිකාරී බලය
- යාච්ඤාව
- නිරාහාරව සිටීම
- දේව රාජ්‍යයේ යතුරු
- යේසුස්වහන්සේ යන නාමය

මෙම මූලික ආත්මික උපක්‍රමවලට අමතරව ඔබට ආත්මික යුද්ධායුධ ගබඩාවක්ම ඇති බව බයිබලය එළිදරව් කරයි. මෙම පරිච්ඡේදයෙන් ඔබ ඉගෙන ගන්නේ ඔබගේ ආරක්ෂක ආත්මික යුද්ධායුධ පිළිබඳව වේ. ඊලඟ පරිච්ඡේදයෙන් ඔබ ඉගෙන ගන්නේ ඔබගේ පහරදීමේ ආත්මික යුද්ධායුධ පිළිබඳව වේ.

## ආරක්ෂාකාරී උපක්‍රම

ඇදහිලිවන්තයෙකු විසින් ක්‍රියාත්මක කළ යුතු පහත දැක්වෙන ආරක්ෂාකාරී ක්‍රියාවන් බයිබලය අපට උගන්වයි.

### යටත්වන්න, විරුද්ධවන්න :

> **එබැවින් දෙවියන්වහන්සේට යටත්ව සිටින්න, නුමුත් යක්ෂයාට විරුද්ධව සිටින්න, එවිට ඔහු නුඹලා වෙතින් පලා යනවා ඇත. (යාකොබ් 4:7)**

මෙම පදයේ අනුපිළිවෙල බලන්න. පළමුව යටත්වන්න. පසුව විරුද්ධවන්න. බොහෝ දෙනෙක් යටත්වීමේ පළමු පියවර අත්හැර යක්ෂයාට විරුද්ධවීමට උත්සාහ කරති. එය ක්‍රියාත්මක නොවන බව පසුව ඔවුහු දැනගනිති. ඔබ දෙවියන්වහන්සේගෙන් ස්වාධීනව ක්‍රියා කරන විට ප්‍රතිඵලය

වන්නේ පරාජයයි. සතුරා පරාජය කරන්නේ උද්ධච්ඡ, ආත්ම විශ්වාසයෙන් යුත් අය නොව නිහතමානී අය වේ. ඔබට සාතන්ට විරුද්ධව යා හැක්කේ ඔබ දෙවියන්වහන්සේට යටත් වුවහොත් පමණි. "යටත්වීම" යන්නෙහි තේරුම "නොසැලී සිට සෑම අවස්ථාවකම සතුරාට විරුද්ධ වන්න" යන්න වේ. යක්ෂයන් සොය සොයා යෑමට බයිබලය අපට උගන්වන්නේ නැත. අප කළ යුත්තේ ඔවුන් හමුවූ විට විරුද්ධ වීම වේ.

## ඇදහිල්ලෙහි ස්ථිරව සිට යක්ෂයාට විරුද්ධවන්න :

> **සිහි ඇතිව, අවදිව ඉන්න, නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. ලෝකයෙහි සිටින නුඹලාගේ සහෝදරයන් කෙරෙහි එම දුක්ම පැමිණෙන බව දැන, නුඹලාගේ ඇදහිල්ලෙහි ස්ථිරව සිට යක්ෂයාට විරුද්ධව සිටින්න. (1 පේත්‍රුස් 5:8-9)**

"ඇදහිල්ලෙහි සිට" විරුද්ධවන්න යන්නෙහි තේරුම දේව වචනයේ ආධිපත්‍යය ඇතිව විරුද්ධ වන්න යන්න වේ.

## යක්ෂයාට ඉඩ නොදෙන්න :

ඔබගේ ජීවිතයේ ක්‍රියා කිරීමට යක්ෂයාට ඉඩක් නොදෙන්න.

> **යක්ෂයාට ඉඩ නොදෙන්න (එපීස 4:27)**

## සාතන්ගේ මලපතෙන් ඔබ මිදෙන්න :

බයිබලීය උපක්‍රම භාවිත කිරීමෙන් ඔබම සාතන්ගේ මලපතෙන් මිදිය යුතුය.

> **ඔහුගේ මලපතෙන් මිදෙන පිණිසද, දෙවියන්වහන්සේ ඔවුන්ට පසුතැවිල්ල දෙනසේකදෝයි බලමින් මෘදුකමින් ඔවුන්ට තරවටු කරන්ට ඕනෑය. (2 තිමෝති 2:26)**

## මාංසික තෘෂ්ණාවලින් වැලකී සිටින්න :

"වැලකී සිටින්න" යන්නෙහි තේරුම යම් කිසි දෙයකින් ඉවත්ව එය ප්‍රතික්ෂේප කිරීම වේ.

> **ප්‍රේමවන්තයෙනි, නුඹලා ආගන්තුකයන්ද විදේශීන්ද මෙන්, ආත්මයට විරුද්ධව යුද්ධකරන මාංසික තෘෂ්ණාවලින් වැලකී සිටින ලෙස නුඹලාගෙන් ඉල්ලමි. (1 පේත්‍රුස් 2:11)**
>
> **දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, නුඹලා ශුද්ධව සිටීමය. නුඹලා වේශ්‍යාකමින් වැලකී. (1 තෙසලෝනික 4:3)**
>
> **සියලු අන්දම්වල නපුරෙන් වැලකෙන්න. (1 තෙසලෝනික 5:22)**

## ස්ථිරව සිටින්න :

> **එබැවින් නපුරු දවසේදී විරුද්ධව සිටින්ටත් සියල්ල සම්පූර්ණකරගෙන ස්ථිරව සිටින්ටත් පුළුවන් වෙන පිණිස, දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගන්න. එබැවින් නුඹලාගේ ඉඟටි සැබෑකම නැමති පටියෙන් බැඳගෙන, ධර්මිෂ්ඨකම නැමති ළය වැස්ම පැළඳගෙන ... (එපීස 6:13-14)**

ඔබ "ස්ථිරව සිටින" විට ඔබ ආරක්ෂා කරන්නේ ඔබට නීත්‍යානුකූලව අයත් දේ වේ.

## නපුරෙන් පරෙස්සම්වන්න, එය ප්‍රතික්ෂේප කර ඉවත් කරන්න :

එපීස 4:17-32 අධ්‍යයනය කරන්න. එතැන ලයිස්තුගත කර ඇති සියලු චර්යාවන් "අත්හැර දැමීම" ආරක්ෂාකාරී සටනකි.

දුෂ්ටයන්ගේ මුළාවෙන් ඇදී නොයන්න.

> **එබැවින්, ප්‍රේමවන්තයෙනි, නුඹලා මේ දේවල් කලින් දැනගෙන සිටින බැවින්, දුෂ්ටයන්ගේ මුළාවෙන් ඇදී ගොස් නුඹලාගේම ස්ථිරභාවයෙන් නොවැටෙන පිණිස පරෙස්සම්වෙන්න. (2 පේත්‍රැස් 3:17)**

> **නුමුත් අපභාසිකවූ හිස් දෙඩව්ලිවලින් අහක්ව සිටින්න. ඔවුන් අභක්තියේ තව දුරට ගමන්කරනවා ඇත. (2 තිමෝති 2:16)**

"අහක්ව සිටින්න" යන්නෙහි තේරුම ප්‍රතික්ෂේප කරන්න හෝ මගහරින්න හෝ වේ. සතුරා හා සම්බන්ධ සියලු දුෂ්ටකම් ඔබ මගහැරිය යුතුය.

## ආත්ම පරීක්ෂා කරන්න :

ආත්ම පරීක්ෂා කර බැලීමෙන් රැවටිල්ල මග හැරේ.

> **ප්‍රේමවන්තයෙනි. බොහෝ බොරු ප්‍රොපේතවරු ලෝකයට පැමිණී සිටින බැවින් සියලු ආත්ම විශ්වාස නොකොට ඒ ආත්ම දෙවියන්වහන්සේගෙන්දැයි පරීක්ෂා කරන්න. (1 යොහන් 4:1)**

"පරීක්ෂා කරන්න" යන්නෙහි තේරුම "සොයා බලන්න" යන්න වේ. ඔබ හමුවට එන හෝ ඔබ අවට ක්‍රියාත්මක වන හෝ "ආත්මයන්" පරීක්ෂා කර බලන විට ඔබ නොඇදහිල්ලෙන් ක්‍රියා නොකරන්නෙහිය. ඒවා සත්‍යය නම් ඒවා පරීක්ෂණයෙන් සමත් වනු ඇත.

## ව්‍යාජ ගුරුවරුන්ගෙන් අහක්ව සිටින්න :

ඔබ ව්‍යාජ ගුරුවරුන් ඔබගේ නිවසට පිළිගත්විට ඔබ ඔවුන්ගේ නපුරට සහභාගී වන්නාක් වේ. සතුරාගේ ප්‍රහාරයෙන් ඔබේ නිවස ආරක්ෂා කර ගන්න.

> **නුඹලා වෙතට එන යමෙක් මේ ඉගැන්වීම නොගෙනෙනවා නම්. ඔහු ගෙදරට පිළිනොගන්න, ඔහුට ශුභ සිද්ධවේවයි නොකියන්න, මක්නිසාද ශුභ සිද්ධවේවයි ඔහුට කියන්නා ඔහුගේ නපුරු ක්‍රියාවලට පංගුකාරයෙක් වන්නේය. (2 යොහාන් 10-11)**

## ලෞකික දේ පැත්තකින් තබන්න :

ඔබ යහපත් හමුදා භටයෙකු වීමෙන් වලකන ලෞකික දේ පැත්තකින් තබන්න. "පැත්තකින් තැබීම" ඔබ ගන්නා ආරක්ෂක පියවරකි.

> **ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ යහපත් භේවායෙකුමෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙන්න. භේවාකම් කරන්නාවූ කිසිවෙක්, ඔහු භේවායෙකුමෙන් ලියාගත් දෙය අය සතුටු කරන පිණිස, මේ ජීවිතයේ කාරණාවලට පටලැවෙන්නේ නැත. (2 තිමෝති 2:3-4)**

> **එබැවින් මෙපමණ මහත් සාක්ෂිකාර සේනාවකින් අප වටව සිටින නිසා, සියලු බරද පහසුවෙන් අප අසුකරන පාපයද අහක දමා, ඇදහිල්ලේ කර්තෘවරයාද සම්පූර්ණකරන්නාද වූ යේසුස්වහන්සේ දෙසම බලමින්, අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු. (හෙබ්‍රෙව් 12:1)**

> **එහෙයින් සියලු කිලුටුකම්ද, අධික දුෂ්ටකම්ද පහකොට, නුඹලාගේ ප්‍රාණ ගළවන්ට පුළුවන්වූ, පිහිටුවන ලද වචනය මෘදුකමින් යුක්තව පිළිගන්න. (යාකොබ් 1:21)**

## දෙවියන්වහන්සේගේ යුද්ධායුධ පැළඳගන්න :

> **යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන් වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගන්න. (එපීස 6:11)**

"පැළඳගන්න" යන්නෙන් ඔබ කළ යුතු ක්‍රියාව පෙන්වයි. දෙවියන්වහන්සේගේ යුද්ධායුධ වල මූලික විස්තරය, එපිස 6:10-17 හි දී ඇත. බයිබලයේ මෙම කොටස කියවන්න.

යුද්ධය පිළිබඳ විෂය පාවුලු තුමා හඳුන්වා දෙන්නේ, සටන ස්වාභාවික දෙයක් නොවන බවත් ස්වාභාවික ආයුධ එල රහිත බවත් අවධාරණය කරමිනි. ආත්මික යුද්ධය සටන් කළ යුත්තේ ආත්මික ආයුධවලිනි. ආත්මික සටනෙහිදී භාවිත කරන යුද්ධායුධ පාවුලු තුමා විස්තර කරයි.

> **එබැවින් නපුරු දවසේදී විරුද්ධව සිටින්ටත් සියල්ල සම්පූර්ණකරගන ස්ථිරව සිටින්ටත් පුළුවන්වෙන පිණිස, දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගනිල්ලා. එබැවින් නුඹලාගේ ඉඟටි සැබෑකම නමැති පටියෙන් බැඳගෙන, ධර්මිෂ්ඨකම නමැති ළයවැස්ම පැළඳගෙන, සමාදානයේ ශුභාරංචියේ සූදානම නැමැති වහන් පය ලා සිටපල්ලා. ඒ සියල්ල ඇර, ඇදහිල්ල නමැති පලිහ අරගනිල්ලා. එයින් නපුරාගේ සියලු ගිනිහෙල්ල නිවන්ට නුඹලාට පුළුවන් වන්නේය. ගැළවීම නමැති ආරක්ෂා තොප්පියද දෙවියන්වහන්සේගේ වචනය නමැති ආත්මයාණන්වහන්සේගේ කඩුවද ගනිල්ලා. (එපිස 6:13-17)**

යුද්ධායුධ තිබිය යුත්තේ සතුරාගේ ප්‍රයෝග කම් (රැවටිල්ල, කපටිකම, සටකපටකම්) වලට එරෙහිව ස්ථිරව සිටීමට වේ. යුද්ධායුධ පැළඳගැනීම ඔබගේ වගකීමකි.

> **යක්ෂයාගේ උපායවල විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන් වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගන්න. (එපිස 6:11)**
>
> **නුමුත් තෘෂ්ණා පූර්ණකරන පිණිස මාංසයට පංගාඩමක් නොකොට, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැළඳගන්න. (රෝම 13:14)**
>
> **රාත්‍රිය බොහෝසේ ඉකුත්ව ගියේය, දවාල ළඟය. එබැවින් අන්ධකාරයේ ක්‍රියා අහකදමා, ආලෝකයේ ආයුධ පැළඳ ගනිමු. (රෝම 13:12)**

"පැළඳගන්න" යන්නෙහි තේරුම "සදහටම පැළඳගන්න" යන්නය. ඔබගේ ආත්මික යුද්ධායුධ මලල ක්‍රිඩකයෙකුගේ නිල ඇඳුමක් මෙන් අවශ්‍ය වේලාවට පමණක් පළඳන දෙයක් නොවේ. ඔබ යුද්ධායුධ පැළඳගත් විට එය ඔබ ජීවිතය මුළුල්ලෙහිම සදහටම තිබෙන දෙයක් වේ. යුද භූමියේ සිටින හමුදා භටයෙකු නිතරම යුද්ධායුධ පැළඳ ගනිමින් හා ඉවත් කරමින් නොසිටින්නා සේ ඔබද, ස්වාමීන්වහන්සේ වෙතට යනතුරු යුද්ධායුධ බිම තබන්නේ නැත. සෑම වේලෙහිම ඔබ යුද්ධායුධ පැළඳ නොසිටියහොත් සතුරාගේ පහරදීම් වලට ඔබ ගොදුරු විය හැකිය. ඔබගේ යුද්ධායුධවල හැම කොටසක්ම නියම තැන්වල ඇත්දැයි නිරන්තරයෙන්ම පරීක්ෂා කර බැලීම ඥාණාන්විතය.

යුද්ධායුධවල පළමු බෙදුමෙන් ඔබ අතීතයේ කළ තුනක් ගැන සඳහන් වේ. "පැළඳගෙන" යන්නෙන් අදහස් වන්නේ, ඔබ ඇදහිලිවන්තයෙකු නම් ඔබ කර ඇති යම් දෙයකි.

- නුඹලාගේ ඉඟටි සැබෑකම නමැති පටියෙන් බැඳගෙන (14 පදය)
- ධර්මිෂ්ඨකම නැමැති ළය වැස්ම පැළඳ ගෙන (14 පදය)
- සමාදානයේ ශුභාරංචියේ සූදානම නමැති වහන් පයලාගෙන (15 පදය)

දෙවන බෙදුමේ අන්තර්ගත වන්නේ ඔබ වර්තමානයේ පැළඳිය යුතු ඒවාය.

- ඇදහිල්ල නමැති පලිහ ගනිමින් (16 පදය)
- ගැළවීම නමැති ආරක්ෂා තොප්පිය පැළඳ ගනිමින් (17 පදය)
- වචනය නමැති ආත්මයාණන්වහන්සේගේ කඩුව ගනිමින් (17 පදය)

දෙවියන්වහන්සේගේ සම්පූර්ණ යුද්ධායුධ පැළෑඳගැනීම පිළිබඳව එපිස 6:11හි පාවුලු තුමා අවධාරණය කරයි. අපි සමහරක් යුද්ධායුධයේ එක් අංගයක් ගැන පමණක් කෙතරම් සැලකිල්ලක් දක්වන්නේද යත් අනෙක්වා අමතක කර ඇත්තෙමු. සියලුම යුද්ධායුධ ඔබ පැළඳ සිටිය යුතුමය. ඔබ "ආත්මයාණන්වහන්සේගේ කඩුව" පිළිබඳව විශේෂඥයෙකු වී ඇති බව ඇතැම් විට ඔබට හැඟෙනු ඇත. එහෙත් ඔබ පරාජය වන්නට පුළුවන. ඊට හේතුව ඔබ ඇදහිල්ල නමැති පලිහ අමතක කිරීම වේ.

## ඉඟ පටිය :

පැළඳගත යුතු පළමු යුද්ධායුධ අංගය සැබෑකම නමැති පටිය වේ. ස්වභාවික ලෝකයේ යුද්ධායුධ සියල්ල එකට බැඳ තැබූ අංගයක් බඳ පටියට සම්බන්ධ කර තිබිණි. දේව වචනයේ සැබෑකම, යුද්ධායුධයේ සියලු කොටස් එකට බැඳ තැබූ ආත්මික පටිය වේ. මිනිසා වෙත සාතන් එල්ල කළ පළමු ප්‍රහාරය සැබෑකම ගැනය.

> **ස්ත්‍රීද, උයනේ ගස්වල ගෙඩිකන්ට අපට පුළුවන, එහෙත් දෙවියන්වහන්සේ නුඹලා නොනසින පිණිස උයන මැද තිබෙන ගසේ ගෙඩි කන්ටවත් ඊට අත ගසන්ටවත් එපායයි කී සේකැයි සර්පයාට කීවාය. සර්පයාද, නුඹලා ඇත්තටම නසින්නේ නැත. (උත්පත්ති 3:2-4)**

සතුරාගේ බොරුවලින් හා ධර්මයේ වැරදි තැන්වලින් ඔබ ආරක්ෂා කරගන්නේ සැබෑකමය. ඔබගේ ආත්මික යුද්ධායුධයේ බඳපටිය සැබෑකම වේ. ඔබගේ ඉඟටිය (ඔබගේ වැදගත් ආත්මික අංගෝපාංග) සැබෑකමෙන් බැඳ ගත යුතුය. (වසාගන්නේ)

> **එබැවින් නුඹලාගේ ඉඟටි සැබෑකම නමැති පටියෙන් බැඳගෙන ධර්මිෂ්ඨකම නැමැති ළය වැස්ම පැළඳ ගෙන  (එපීස 6:14)**

සැබෑකම යනු කුමක්ද?

- "සැබෑව... මමය" යි යේසුස්වහන්සේ පැවසූ සේක (යොහන් 14:6)
- ශුද්ධාත්මයාණන්වහන්සේ "සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය." යොහාන් 14:17
- දෙවියන්වහන්සේ සැබෑ වේ. රෝම 3:4
- දෙවියන්වහන්සේගේ වචනය සත්‍යයය. ගිතාවලිය 119: 151
- ඔබගේ සියලු ආඥා සත්‍යය. ගිතාවලිය 119:15

## ළයවැස්ම :

ස්වභාවික ලෝකයේ ළය වැස්මෙන්, හදවත, පෙණහළු ආදි ශරීරයේ ඉහළ කොටස් අත්‍යාවශ්‍ය ඉන්ද්‍රියයන් ආවරණය කෙරේ. ධර්මිෂ්ඨකම නමැති ආත්මික ළය වැස්මෙන් ඔබගේ ධර්මිෂ්ඨකමක් අදහස් නොකෙරේ. ඉන් අදහස් වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මිෂ්ඨකමේ ආවරණය ගැන වේ.

> **ව්‍යවස්ථාවෙන් පැමිණෙන මාගේම ධර්මිෂ්ඨකම නොව, ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන, ඇදහිල්ල නිසා දෙවියන්වහන්සේගෙන් පැමිණෙන ධර්මිෂ්ඨකම ඇතුව ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින පිණිසත්. (පිලිප්පි 3:9)**

ඔබ නැගිට සිටින්නේ ඔබගේම යහපත්කම් මත නොව ක්‍රිස්තුස්වහන්සේගේ යහපත්කම් මතය. ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකම් ආරක්ෂාව නොමැතිව ඔබට සතුරාට මුහුණ දිය නොහැකිය.

> **සත්‍යතාවේ වචනයෙන්ද දෙවියන්වහන්සේගේ බලයෙන්ද දකුණෙහිත් වමෙහිත් ධර්මිෂ්ඨකම නමැති සන්නාහය කරණකොටගෙනද, (2 කොරින්ති 6:7)**

ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඔබගේ "අත්‍යාවශ්‍ය ඉන්ද්‍රියයන්" සාතන්ගේ පහරවලින් හා අධර්මිෂ්ඨකමින් ඔබව ආරක්ෂා කෙරේ. ධර්මිෂ්ඨකමේ ළයවැස්ම සැබෑකම නමැති බඳපටියට බැඳගත යුතුය.

## පාවහන් :

විවිධ දේ සඳහා විවිධාකාර පාවහන් තිබේ. ඇතැම් ඒවා ඇවදීමටය, ඇතැම් ඒවා නොයෙකුත් ක්‍රීඩාවන් සඳහාය. හමුදා භටයෙකුගේ පාවහන් තවත් ආකාරයකි. ඒවා යුද්ධය සඳහා සැලසුම් කර ඇත. යුධ භූමියේ ඉදිරියට යා නොහැකි භටයෙක් යුද භූමියට ආබාධිතයෙකු වේ.

"සමාදානයේ ශුභාරංචියේ සූදානම නමැති පාවහන් පයලා සිටින්න" යන්නෙන් හැඟෙන්නේ ආත්මික ක්ෂේත්‍රයේ ඉදිරියට යෑමට ඇති සූදානම වේ. මේ ආත්මික පාවහන්, ඔබව වැරදි මාර්ග වල ගෙන යන සතුරාගේ පරීක්ෂා වලින් හා ඔබගේ කැමැත්තෙන් ආරක්ෂා කෙරේ. ඒවායින් පෙන්නුම්

කෙරෙන්නේ යහපත් දේ කිරීමටත් ශුභාරංචිය සියලු ජාතීන් වෙත ගෙනයාමටත් ඔබගේ ඇති කැමැත්තය. එමෙන්ම මේ ආත්මික පාවහන්, පාවුලු තුමා ඔබව ධෛර්යමත් කරන පරිදි, සතුරාට එරෙහිව සිටීමට හැකියාව ගෙන දෙනු ඇත. (එපිස 6:14)

## පලිහ :

ස්වභාවික ලෝකයේ, පලිහ මගින් යුද භටයාගේ මුළු ශරීරයටම ආරක්ෂාව සපයයි. ඔබගේ ආත්මික පලිහ, "ඇදහිල්ලේ පලිහ" ලෙස හැඳින්වේ.

විවිධාකාර ඇදහිලි වර්ග බයිබලයේ සඳහන් වේ. ගැළවීමේ ඇදහිල්ල, ඇදහිල්ලේ දීමනාව හා ඇදහිල්ලේ ආත්මික ඵල තිබේ. එහෙත් "ඇදහිල්ල" යන වචනය "ඇදහිල්ලේ පලිහ" හා සම්බන්ධව භාවිත කරන විට පැවසෙන්නේ ආරක්ෂක ඇදහිල්ල ගැන වේ. මෙම ඇදහිල්ල ඔබව සම්පූර්ණයෙන් ආරක්ෂා කෙරෙන දෙවියන්වහන්සේ තුළ ඇති ස්ථිර විශ්වාසය වේ. එය ඔබව සතුරා විසින් එවන්නාවූ අවිශ්වාසය හා දෙසිත් නමැති දැල්වෙන මිසයිලවලින් ආරක්ෂා කෙරේ. ඇදහිල්ලේ පලිහ යනු සතුරා විසින් එවනු ලබන සියලුම ගිනියම් ඊතල වෙනත් පැත්තකට හරවන, දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රබල විශ්වාසයක් ඇති ඇදහිල්ලය.

දේව වචනය ජීවිතයේ ගැටළුවලට නිරන්තරයෙන්ම ව්‍යවහාර කෙරෙන්නේ ඇදහිල්ලේ පලිහෙනි. එය ලෝකයේ නපුරු බලවේග පරාජය කිරීමට හැකි ඇදහිල්ලකි.

> **මක්නිසාද දෙවියන්වහන්සේගේ උපන් යමක් ඇද්ද එය ලෝකයෙන් ජයගන්නේය. ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය. (1 යොහන් 5:4)**

දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා සම්බන්ධ කළ විට ඇදහිල්ල වඩාත් ඵලදායි වේ.

> **නුමුත් දවාලට අයිතිවූ අපි ඇදහිල්ල සහ ප්‍රේමය නැමැති ළයවැස්මත් ගැළවීමේ බලාපොරොත්තුව නමැති ආරක්ෂා තොප්පියත් පැළඳගෙන මත්නොවී සිටිමු.**
> **(1 තෙසලෝනික 5:8)**

එය සත්‍යය පදනම් වූ ඇදහිල්ලකි

> **උන්වහන්සේ ස්වකීය පියාපතින් නුඹ වසනසේක, නුඹ උන්වහන්සේගේ පියාපත් යට ආරක්ෂාවන්නෙහිය. උන්වහන්සේගේ සත්‍යවාදිකම පලිහක්ය, මහා පලිහක්ය.**
> **(ගීතාවලිය 91:4)**

එය ගැළවීම පදනම් වූ ඇදහිල්ලකි

> **තවද ඔබගේ ගැළවීම නැමති පලිහ ඔබ මට දුන්සේක. ඔබගේ දකුණත මා දැරුවේය, ඔබගේ මෘදුකම මා උසස් කළේය. (ගීතාවලිය 18:35)**

ඇදහිල්ල නොමැතිව ඔබට සත්‍යය අල්ලාගත නොහැකිය. ඇදහිල්ල නොමැතිව ඔබට ගැළවීම ලබාගත නොහැකිය. ඇදහිල්ල නොමැතිව ඔබට සමාදානයේ ශුභාරංචිය සමග ඉදිරියට යා නොහැකිය. ඇදහිල්ල නොමැතිව ඔබට ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකම ලබා ගත නොහැකි අතර ආත්මික කඩුව වූ දේව වචනය ඵලදායි ලෙස භාවිත කළ නොහැකිය.

ඇදහිල්ල සිතුවිල්ලක් හෝ විශ්වාසයක් හෝ නොවේ. එය දේව වචනය මත පදනම් වූ සත්‍යයකි. දේව වචනයට සවන් දීමෙන්ද (රෝම 10:17) ඔබගේ වර්තමාන ඇදහිල්ල මත ක්‍රියා කිරීමෙන්ද (රෝම 1:17) දෙවියන්වහන්සේව සෙවීමෙන්ද (හෙබ්‍රෙව් 12:2) ඔබට ඔබගේ ඇදහිල්ල වර්ධනය කරගත හැකිය.

## ආරක්ෂා තොප්පිය :

ගැලවීම නමැති ආරක්ෂා තොප්පිය ඔබ ගැළවීම ලැබූ පසු පළඳන දෙයක් නොවේ. මෙහිදී අප ආත්මික යුද ඇඳුම් සමග කටයුතු කරන බව මතක තබාගන්න. ඔබ මේ යුද ඇඳුම් ඇඳ

ගැනීමට පෙර ඔබ ඇදහිලිවන්තයෙකු හා දෙවියන්වහන්සේගේ යුද හමුදාවේ සාමාජිකයෙකු බව සිතිය යුතු වේ.

ගැළවීම නමැති ආරක්ෂක තොප්පියෙන් නව පණක් ලද සිතක් නියෝජනය කෙරේ. එය වෙනස් කළ හා අලුත් කළ සිතුවිලි ජීවිතයක් ද නියෝජනය කෙරේ. සතන් සිතේ පාලනය ලබා ගැනීමට සටන් කරන බව ඔබ ඉදිරියේදී මෙම පාඨමාලාවෙන් ඉගෙන ගන්නෙහිය. කිතුනු යුධභටයා සතුරාගේ පාපී රැවටිල්ලට පහසුවෙන්ම ගොදුරු වන්නේ නොහික්මුනු මනසක් ඇති විටය.

පාවුලු තුමා ගැළවීමේ තොප්පිය ගැන 1 තෙසලෝනික 5:8න් පවසන්නේ එය "ගැළවීමේ බලාපොරොත්තුව" ලෙසය. ගැළවීම, නියමාකාරයෙන් අත්දැක අවබෝධකරගත් විට ඔබේ මනස ආරක්ෂා කරයි. ගැළවීම අතීතයත්, වර්තමානයත්, අනාගතයේ වැළඳ ගනී. ඔබ අතීතයේ පාපයේ වරදින් හා දඬුවමින් ගැළවීම ලබා ඇත. ඔබ වර්තමානයේ පාපයේ බලයෙන් ගැළවීම ලබා ඇත. "ගැළවීමේ බලාපොරොත්තුව" අනාගත කාල ගැළවීමකට යොමු කරයි. එය යේසුස් වහන්සේ පැමිණි කල සහමුලින්ම පාපයෙන් මිදීමෙන් ලැබෙන්නාවූ ගැළවීම වේ. මෙම අනාගත ගැළවීම ගැන ඇති බලාපොරොත්තුව සාතන්ගේ ප්‍රහාරවලට එරෙහිව ඔබේ මනස ශක්තිමත් කරයි. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පරමාර්ථය පිලිබඳව ක්‍රියා කරන නිසා අනාගතය පිළිබඳව ඔබට නොසැලෙන බලාපොරොත්තුවක් ඇත.

> **එසේ කළේ කාලවල සම්පූර්ණ කමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකරාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපීස 1:9-10)**

## ආත්මයාණන් වහන්සේගේ කඩුව :

"ආත්මයාණන් වහන්සේගේ කඩුව" යනු දේව වචනය වේ. එය පහරදීමේ මෙන්ම ආරක්ෂාකාරී ආයුධයකි. සාතන්ගේ ප්‍රහාරවලින් ආරක්ෂාවීමට යේසුස්වහන්සේ වචනය භාවිත කල ආකාරය ඔබ දැනටමත් උගත්තෙහිය. ඊළඟ පාඩමේදී මෙම ආයුධය පහරදීමට යොදාගන්නේ කෙසේදැයි ඔබ ඉගෙනගන්නවා ඇත.

## යාච්ඤාව :

කිතුනු හමුදා භටයාගේ යුද්ධායුධ විස්තර කිරීමෙන් පසු පාවුලුතුමා මෙසේ පවසයි :

> **සියලු යාච්ඤාවලින්ද ඉල්ලීම්වලින්ද සියලු කාලවලදී ආත්මයාණන් කරණකොටගෙන යාච්ඤා කරන්න. (එපීස 6:18)**

ඔබ "දෙවියන්වහන්සේගේ සටන් සැලැස්ම" අධ්‍යයනය කරන විට ඉගෙනගත්තාක් මෙන් යාච්ඤාව හා ඒ හා සම්බන්ධ නිරාහාරව සිටීමද ප්‍රබල ආත්මික ආයුධ වේ. මේ ආයුධ දෙකම ආක්‍රමණශීලීව මෙන්ම ආරක්ෂාකාරීවද භාවිත කළ හැකිය. පහත දක්වා ඇති දෙවියන් වහන්සේගේ හා ඒවායේ පරමාර්ථය පිළිබඳ සාරාංශය විමසා බලන්න.

## දෙවියන්වහන්සේගේ යුධආයුධ

එපීස 6:10-18

**සැබෑකම** (ඉඟපටිය)
**රැවටීමෙන්** ... ආරක්ෂා කෙරේ.

ආත්මයාණන් වහන්සේ කඩුව

**ධර්මිෂ්ඨකම** (ළය වැස්ම)
**අධර්මිෂ්ඨකමෙන්** ... ආරක්ෂා කෙරේ

**සමාදානය** (පාවහන්)
**ව්‍යාකූලභාවයෙන්** ... ආරක්ෂා කෙරේ

**ඇදහිල්ල** (පලිහ)
**අවිශ්වාසයෙන්** ... ආරක්ෂා කෙරේ

**ගැළවීම** (ආරක්ෂක තොප්පිය)
**බැඳීම්වලින්** ... ආරක්ෂා කෙරේ

- සැබෑකම නමැති පටිය ඔබ අධර්මිෂ්ඨකම (පාපයට) ගෙන යන සාතන්ගේ රැවටිලි වලින් ඔබ ආරක්ෂා කෙරේ
- ධර්මිෂ්ඨකම නමැති ළයවැස්ම ඔබ ව්‍යාකූලත්වයට ගෙන යන අධර්මිෂ්ඨකමින් (පාපයෙන්) ඔබ ආරක්ෂා කෙරේ.
- සමාදානයේ ශුභාරංචියේ සූදානම නමැති පාවහන් පය ලා සිටිමෙන් ආත්මික ව්‍යාකූලත්වයේ ප්‍රතිඵලය වන අධර්මිෂ්ඨකමෙන් (පාපය) ආරක්ෂා කෙරේ.
- ඇදහිල්ල නමැති පලිහ වහල්බවේ ප්‍රතිඵලය වන නොඇදහිල්ලෙන් ඔබ ආරක්ෂා කෙරේ. ගැළවීම නමැති ආරක්ෂා තොප්පිය වහල් බවින් ආරක්ෂා කෙරේ.
- දෙවියන්වහන්සේගේ වචනය නමැති ආත්මයාණන්වහන්සේගේ කඩුව පහරදීමේ මෙන්ම ආරක්ෂක ආයුධයක් වශයෙන්ද භාවිත කෙරේ.

දෙවියන්වහන්සේගේ යුද්ධායුධ මගින් ආරක්ෂා නොවන විට පහළට ඇද වැටීම බලන්න. රැවටිල්ල, අධර්මිෂ්ඨකම (පාපය) ඇති කරන අතර එහි ප්‍රතිඵලය වන්නේ අවුල් ස්වභාවයක් ඇති වීමය. නොඇදහිල්ලේ ප්‍රතිඵලය අවුල් ස්වභාවයක් වන අතර ආත්මික වහල්බවේ ප්‍රතිඵලය නොඇදහිල්ල වේ.

## පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ප්‍රධාන පදය ලියන්න.

2. ආරක්ෂක ආත්මික යුද්ධායුධ පිළිබඳව ඔබ උගත් දේ සාරාංශගත කරන්න.

3. දෙවියන්වහන්සේගේ යුද්ධායුධ ලැයිස්තුගත කෙරෙන ශුද්ධලියවිලි යොමුවක් දෙන්න.

4. දෙවියන් වහන්ස්ගේ යුද්ධායුධ සෑම කොටසක්ම ලැයිස්තුගත කර ඒ එක් එක් කොටසේ කාර්යයන් කෙටියෙන් අර්ථ විග්‍රහ කරන්න.

**යුද්ධායුධ කොටස** | **එහි කාර්යය**

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. ගීතාවලිය 45:3 හා යෙසායා 59:17 කියවන්න. මෙම කොටස් දෙකෙන්ම විස්තර කෙරෙන්නේ දෙවියන්වහන්සේ ආත්මික යුද්ධායුධ පැළඳගැනීම පිළිබඳවය. අපගේ ආත්මික යුද්ධායුධවලට ඇතුළත් නොවන කුමන යුද්ධායුධ කොටස් දෙක දෙවියන්වහන්සේ පැළඳගන්න සේක්ද?

2. දෙවියන්වහන්සේ තමාට සටනේදී උපකාර කළ ආකාරය මතක් කරමින් දාවිත් ආත්මික යුද්ධායුධ සඳහන් කරයි. ගීතාවලිය 18:29-50 අධ්‍යයනය කරන්න.

3. ආත්මික යුද්ධායුධ භාවිත කිරීමේ අත්දැකීම ඔබට තිබීම වැදගත් වේ. තමාට හුරුපුරුදු නැති යුද්ධායුධ භාවිත කිරීමට දාවිත් උත්සාහ කිරීමේදී සිදුවූ දෙය 1 සාමුවෙල් 17 කියවන්න.

4. සතුරාගෙන් ඔබ ආරක්ෂා කිරීමට ස්වාමීන්වහන්සේ ආත්මික යුද්ධායුධ භාවිත කරන සේක. ගීතාවලිය 35:1-3

   තම සතුරන් පිළිබඳව බොහෝ දේ කීමට දාවිත්ට තිබේ. ගීතාවලිය 5:8, 6:10, 8:2, 9:3, 11:2, 15:5, 17:9, 18:3, 17, 20, 26, 34, 37, 27:2, 30:1, 31:23, 44:5-6, 56:9, 60:12, 61:3, 95,6, 108:13

   ඔබගේ සතුරන් පිළිබඳව දෙවියන්වහන්සේ කියන දේ කියවන්න. නික්මයාම 15:6, මතෙව් 10:36, 13:39, ලූක් 1:11, 10:19, ක්‍රියා 2:35, 1 කොරින්ති 15:25-26, කොලොස්සි 1:21

5. දෙවියන්වහන්සේ ඔබගේ පලිහ වේ. උත්පත්ති 15:1, ගීතාවලිය 3:3, 5:12, 28:7, 33:20, 59:11, 84:9, 11, 115:9-11, 119:114, 144:2

6. නික්මයාම 17 කියවන්න. ඉශ්‍රායෙලය ප්‍රහාරයට ලක් වී සිටියේය. එවිට තම සැරයටිය දික් කරන්න යයි දෙවියන්වහන්සේ මොසෙස්ට කී සේක. මීට පෙර මොසෙස් තම සැරයටිය එඬේරෙකුගේ කෙවිට ලෙසත් දෙවියන්වහන්සේගේ සෙනගට ජලය සැපයීමටත් භාවිත කර තිබිණි. දැන් ඔහු පළමු වතාවට අමෙලෙක්වරුන්ට පහරදීම ගැන වගකීම යුතු නපුරු ආත්ම සේනාවන්ගේ අධිපතිකමට හා බලපරාක්‍රමයට එරෙහිව තම සැරයටිය දික් කරයි. මෙම කතාවේ ඉතා වැදගත් ආත්මික පාඩමක් ඇත. දෙවියන්වහන්සේගේ සෙනගගේ නායකයන්ගේ වගකීම වන්නේ එඬෙරෙකම් කිරීම, ආහාර සැපයීම, හා තම රැළට ජලය සැපයීම පමණක්ම නොවේ. සතුරාගෙන් ආක්‍රමණයක් පැමිණි කල දෙවියන්වහන්සේගේ සෙනග ආරක්ෂා කර ගැනීම සඳහා "දෙවියන්වහන්සේගේ සැරයටිය" භාවිත කිරීමද ඔවුන්ගේ වගකීම වේ.

7. සාතන්ගේ මෙම ගිනි හෙල්ලයන්ට ඔබ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? මෙම සෑම ප්‍රහාරයකින්ම බේරීමට ඔබ ඇදහිල්ලේ පලිහ භාවිත කරන්නේ කෙසේදැයි සිතා බලන්න. ඊළඟ ප්‍රහාරයේදී භාවිත කිරීමට ඔබේ පිළිතුරු වාර්තා කර තබන්න.

ආත්මාර්ථකාමීත්වය:

තෘෂ්ණාව:

අහංකාරය:

අවිශ්වාසය:

බිය:

දොම්නස:

අධෛර්යවීම:

කාමාශාව:

ලෝභකම:

කෝපය:

8. ඔබ ඔබවම පරීක්ෂාකර බලන්න. ඔබගේ යුද්ධායුධ නියම ස්ථානවල තිබේද?

9. ගීතාවලියේ ස්වාමීන්වහන්සේ පලිහක් ලෙස පෙනී සිටි ආකාරය අධ්‍යයනය කරන්න

| | |
|---|---|
| උන්වහන්සේ වටකරන්නාවූ පලිහකි. | ගීතාවලිය 5:12 |
| උන්වහන්සේ ගැළවීම ගෙන දෙන්නාවූ පලිහකි | ගීතාවලිය 18:35 |
| උන්වහන්සේ පෞද්ගලික පලිහකි | ගීතාවලිය 3:3 |
| උන්වහන්සේ සරණකොට ගන්න සියල්ලන්ට පලිහකි. | ගීතාවලිය 18:30 |
| උන්වහන්සේ පලිහ ත්‍යාගයකි | ගීතාවලිය 18:35 |
| උන්වහන්සේ පරීක්ෂා කරන ලද පලිහකි | ගීතාවලිය 28:7 |
| උන්වහන්සේ විශ්වාසය තැබිය හැකි පලිහකි | ගීතාවලිය 144:2 |
| උන්වහන්සේ ජයග්‍රාහී පලිහකි | ගීතාවලිය 59:11 |
| උන්වහන්සේ ආරක්ෂාකාරී පලිහකි | ගීතාවලිය 84:11 |
| උන්වහන්සේ අභිෂේක ලත් පලිහකි | ගීතාවලිය 84:9 |
| උන්වහන්සේ සැඟවෙන්නට හැකි පලිහකි | ගීතාවලිය 119:114 |
| උන්වහන්සේ සත්‍යය අපගේ පලිහ වේ. | ගීතාවලිය 91:4 |
| උන්වහන්සේ උපකාර කරන පලිහකි. | ගීතාවලිය 116:11 |

# දොළොස්වන පරිච්ඡේදය

## පහරදීමේ යුද්ධායුධ

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඔබගේ පහරදීමේ යුද්ධායුධ හඳුනා ගැනීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **ස්වාමීන්වහන්සේ තමන්ගේ ගබඩාව ඇර, තමන්ගේ කෝපයේ ආයුධ එළියට ගත් සේක. මක්නිසාද ... ස්වාමිවූ සේනාවල ස්වාමීන්වහන්සේ විසින් කරන්ට වැඩක් තිබේ. (යෙරෙමියා 50:25)**

## හැඳින්වීම

ඔබ දැන් ඔබව ආත්මිකව ආරක්ෂා කර ගැනීමට ඉගෙන ගත් බැවින් සාතන්ගේ බල ප්‍රදේශයට ඇතුළු වී ආක්‍රමණශීලීව සටන් කරන ආකාරයද උගත යුතුය. පහරදීමේ යුද්ධායුධ ඇසුරෙන් ඔබ ශුභාරංචිය අලුත් ප්‍රදේශවල පතුරවමින් සතුරාගේ වහල්බවේ සිටින අයට මිදීම ලැබෙන්නට සැලැස්වූ විට අලුත් ප්‍රදේශ අල්ලා ගන්නවා ඇත.

"සාර්ථක යුද්ධයක් මෙහෙයවීමට" ඔබ පහරදීමේ ආයුධ අතට ගත යුතුය

> **මාගේ පුත්‍රවූ තිමෝතියස්නි, නුඹ ගැන කලින් කීවාවූ අනාගතවාක්‍ය ලෙස මේ ආඥාව නුඹට භාරදෙමි. එනම් නුඹ ඇදහිල්ල සහ යහපත් හෘදයසාක්ෂියක් ඇතුව සිට, ඒ වාක්‍යවලින් යහපත් යුද්ධය කරන ලෙසය. සමහරු ඒ හෘදයසාක්ෂිය අත්හැරදමා, ඇදහිල්ල නමැති නැව බිඳගත්තෝය. (1 තිමෝති 1:18,19)**

> **ඇදහිල්ලේ යහපත් සටනෙන් සටන්කොට සදාකාල ජීවනය අල්ලාගනින්න. ඊට නුඹ කැඳවනු ලැබ, බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි යහපත් ප්‍රකාශනය කර සිටියෙහිය. (1 තිමෝති 6:12)**

ඔබ මෙම සටන බුද්ධිමත්ව, පරමාර්ථයක් ඇතිව කළ යුතුය.

> **එබැවින් මා දුවන්නේ සැකයෙන් මෙන් නොවේය, පහරදෙන්නේ හුළඟට පහර දෙන්නාක් මෙන් නොවේය. (1 කොරින්ති 9:26)**

ඔබගේ පහරදීමේ ආයුධ පිළිබඳව ඔබ දැනගත් කල ඔබ ඔබගේ සටන අවිනිශ්චිත බව වෙනුවට පරමාර්ථයක් ඇතිව කළ හැකිය.

## පහරදීමේ උපක්‍රම

පහරදීමේ ආත්මික යුද්ධයක් කිරීමට අවශ්‍ය යුද්ධායුධ මේවා වේ :

### යාච්ඤාව :

"දෙවියන් වහන්සේ සටන් සැලැස්මේ" කොටසක් ලෙස ඔබ දැනටමත් දසවැනි පරිච්ඡේදයෙන් යාච්ඤාව හා නිරාහාරව සිටීම අධ්‍යයනය කර ඇති අතර පසුගිය පාඩමෙන් එය ආරක්ෂක ආයුධයක් ලෙස අධ්‍යයනය කෙළෙහිය. යාච්ඤාව ප්‍රබල පහරදීමේ ආයුධයක්ද වේ. ඔබ එය

පහරදීමේ සටනකට භාවිත කරන විට. ඔබගේ පෞද්ගලික අවශ්‍යතාවන් හා ගැටලු සඳහා පමණක් යාච්ඤා කරන්නේ නැත. ඔබ සෙනග, නායකයන්, හා ජාතීන් වෙනුවෙන් මැදිහත්කාරකම් කරන අතර සාතන්ගේ බලකොටු හා යක්ෂයාගේ බලවේග බිමට ඇද දමන්නෙහිය.

සෑම කිතුනුවෙක්ම ඇතැම් අවස්ථාවලදී මැදිහත්කාරකම් කළ යුතුය. එහෙත් ඇතැමුන්ට මැදිහත්කාරකම් කිරීම සඳහා විශේෂ කැඳවීමක් ඇත. මෙම බලවත් සේවය, නොපෙනෙන ක්ෂේත්‍රවල ප්‍රබල සටන් මෙහෙයවීමට ස්වාමීන්වහන්සේ අභිමුඛයට මැදිහත්කරුවන් ගෙන එනවා ඇත.

ප්‍රශංසාවේ හා නමස්කාරයේ වටිනාකම ගැන දසවැනි පරිච්ඡේදයේ සඳහන් විය. ප්‍රශංසාව හා නමස්කාරය ඉතා බලවත් පහරදීමේ ආයුධ වේ. 2 ලේකම් 20 හි සඳහන් පරිදි ඉශ්රායෙලය ප්‍රබල හමුදාවකට මුහුණ දුන් අවස්ථාවේ, ඔවුහු දෙවියන්වහන්සේට ගීතිකා ගැයීමට හා ප්‍රශංසා කිරීමට පටන් ගත්හ. උන්වහන්සේ ඔවුන්ට සැඟවී සිට පහරදීමට සලස්වා ඔවුන්ව පරාජය කළ සේක. ඔබ දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් නමස්කාර කරන විට ඔබ සැබැවින්ම ආත්මික ලෝකයේ "සැඟවී පහර දෙන කණ්ඩායම" පිහිටුවයි.

## ආත්මයාණන්වහන්සේගේ කඩුව :

> **එබැවින් නපුරු දවසේදී විරුද්ධව සිටින්ටත් සියල්ල සම්පූර්ණකරගෙන ස්ථිරව සිටින්ටත් පුළුවන්වෙන පිණිස, දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගන්න. (එපීස 6:13)**

යමක් "අරගැනීම" යනු එය අල්ලා ගැනීමය, තමා වෙත තබා ගැනීමය. දෙවියන්වහන්සෙගේ සියලු යුද්ධායුධ අරගැනීම යන්නෙන් හැඟෙන්නේ ඇදහිලිවන්තයන් ආක්‍රමණශීලීව ක්‍රියාකිරීම වේ.

ඔබ පසුගිය පාඩමෙන් යුද්ධායුධවල ආරක්ෂාකාරී කොටස් ගැන උගත්තෙහිය. මේවා අතර සැබෑකම නමැති පටිය, ධර්මිෂ්ඨකම නමැති ළයවැස්ම, ගැළවීම නමැති ආරක්ෂක තොප්පිය, සමාදානයේ ශුභාරංචියේ සූදානම නමැති පාවහන් හා ආත්මයාණන් වහන්සේගේ කඩුවද විය.

දේව වචනය නමැති "ආත්මයාණන් වහන්සේගේ කඩුව" ආරක්ෂක මෙන්ම පහරදීමේ ආයුධයක් ලෙසද භාවිත කළ හැකිය. වචනය, සාතන්ගේ ප්‍රහාරවලින් ආරක්ෂාවීමට භාවිත කරන විට එය ආරක්ෂක ආයුධයක් වේ. ඔබ ශුභාරංචි පණිවුඩය බෙදා ගනිමින් හා අන් අයට ගැළවීම ගෙන දෙමින් ස්වාමින්වහන්සේ වෙනුවෙන් බල ප්‍රදේශ අල්ලා ගන්නා විට එය පහරදීමේ ආයුධයකි.

"දේව වචනය" යන්නට ශුද්ධ ලියවිල්ලේ වචන දෙකක් භාවිත කර ඇත. එකක් "ලෝගොස්" වේ. ඉන් යොමු වන්නේ දෙවියන්වහන්සේගේ සම්පූර්ණ ප්‍රකාශයන්ට වේ. ඉන් දෙවියන්වහන්සේ ප්‍රකාශ කල දෙය පූර්ණ ලෙස එළිදරව්වීම අදහස් කෙරේ. දෙවන වචනය "රෙහ්මා" වේ. එය විශේෂිත අවස්ථාවකට විශේෂයෙන්ම ව්‍යවහාර කෙරෙන දෙවියන්වහන්සේගේ සුවිශේෂී ප්‍රකාශයක් වේ. මෙම කොටසෙහි භාවිත කෙරෙන "ආත්මයාණන්වහන්සේගේ කඩුව" ලෙස හැඳින්වෙන දේව වචනය මෙය වේ.

යේසුස්වහන්සේ ඒ ඒ අවස්ථාවේ මුහුනදුන්නාවූ පරීක්ෂාවලට අදාල දෙවියන්වහන්සේගේ සුවිශේෂී ප්‍රකාශ (රෙහ්මා) භාවිත කළ බව ඔබට මතක ඇත. මෙසේ කිරීමට හැකිවීමෙන් හැඟී යන්නේ දේව වචනය පිළිබඳව ඇති සමීපතාවයය. ඒ ඒ සටන්වලට අදාළ සුවිශේෂී ශුද්ධ ලියවිලි පාඨ භාවිත කිරීමට ඔබට හැකි වීමට, ඔබට දෙවියන්වහන්සේගේ පූර්ණ එළිදරව් වීම පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

## ක්‍රිස්තුස්වහන්සේගේ මනස :

> **ඉතින් ක්‍රිස්තුස්වහන්සේ මාංසයෙන් (අප උදෙසා) වදවින්ද බැවින්, මාංසයේ ඉතිරිව තිබෙන කාලයෙහි තවත් මනුෂ්‍යයන්ගේ තෘෂ්ණා ලෙස නොව, දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ජීවත්වෙන පිණිස එම සිත ආයුධයක් කොට පැළඳගනිල්ලා. මක්නිසාද මාංසයෙන් වධවින්ද තැනැත්තේ පාපයෙන් නිදහස්වී සිටියි. (1 පේත්‍රුස් 4:1,2)**
>
> **ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා. (පිලිප්පි 2:5)**

"තිබේවා" යන්නෙහි තේරුම වැළඳගැනීමට ඉඩදෙන්න යනුය. ඔබගේ ඔබගේ සිත යේසුස් වහන්සේගේ මෙන් කරගත යුතුය. එය ප්‍රබල සටනක් කිරීමට සකස් වූ මනසකි.

> **පව් කරන තැනැත්තේ යක්ෂයාගෙන්ය, මක්නිසාද යක්ෂයා පටන්ගැන්මේ සිට පව්කරන්නේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිණිසය, එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශකරන පිණිසය. (1 යොහන් 3:8)**

ඔබ එවැනි "මනසක්" දියුණු වීමට ඉඩ දිය යුතුය. ඒ හා සමාන මානසික ආකල්පයකින් ප්‍රබල ලෙස ක්‍රියා කිරීමට "ඔබ සන්නද්ධ" විය යුතුය.

> **නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැන ගන්නා පිණිස, සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙන්න. (රෝම 12:2)**

මෙහි "අන්‍යකාර" යන්නෙහි තේරුම ගති ලක්ෂණ වලින් හෝ චර්යාවෙන් හෝ පෙන්නුම් කෙරෙන සම්පූර්ණ වෙනසක් අත්දැකීම වේ. සිත අලුත් කරගැනීමේ හා ක්‍රිස්තුස්වහන්සේගේ ආකාර වීමේ ප්‍රතිඵලය, එවැනි වෙනස් වීමකි.

## බිඳ හෙළීම හා අහක දැමීම :

පහරදීමේ සටනෙහි ඉලක්කය සතුරාගේ බලකොටු බිඳ හෙළීම වේ.

> **මක්නිසාද අපේ යුද්ධායුධ මාංසික නොවේය, එහෙත් ඒවා බලකොටු බිඳහෙළීමට දෙවියන් වහන්සේ ඉදිරිපිට බලසම්පන්නය. අපි විවාදයන්ද දෙවියන්වහන්සේ ගැන දැනගැනීමට විරුද්ධව උසස් වන්නාවූ සියලූ උසස් දේවල්ද බිඳ හෙළා, සියලූ සිතිවිලි ක්‍රිස්තුස්වහන්සේට කීකරු වීමට වහල්කර දෙමුව. (2 කොරින්ති 10:4-5)**

"බිඳ හෙලීම" යනු බලය යොදා කඩා බිඳ දැමීම වේ. "අහක දැමීම" යනු ඈතට විසි කිරීමය. අන්ධකාරයේ ක්‍රියා අහක දැමීමට ඔබට පවසා ඇත. (රෝම 13:12) එමෙන්ම යක්ෂයන් දුරු කරන ලෙසද පවසා ඇත. (මතෙව් 10:8)

ඔබ සාතන්ගේ බලකොටු බිම හෙළා ඒවා අහකට විසි කළ විට ඔබ පහරදීමේ සටනක නියැලෙයි. ඔබ සාතන්ගේ පහරදීම් වලින් ආරක්ෂා වීමට බලා නොසිටින්නාහුය. එහෙත් ඔබ සතුරාගේ බලකොටුවලට පහර දෙන්නෙහිය.

## බඳිනු ලැබීම හා මුදනු ලැබීම :

ඔබට නපුරු බලවේග බඳිනු ලබන්ටත් යහපත් බලවේග මුදනු ලබන්ටත් බලය තිබේ.

> **ස්වර්ගරාජ්‍යයේ යතුරු නුඹට දෙන්නෙමි. නුඹ පොළොවෙහිදී යමක් බඳින්නෙහිද ඒක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය. නුඹ පොළොවෙහිදී යමක් මුදන්නෙහිද ඒක ස්වර්ගයෙහිදී මුදනු ලබන්නේයයි ඔහුට කී සේක. (මතෙව් 16:19)**

ඔබට බලය හා අධිකාරී බලය යේසුස් වහන්සේ විසින් පවරනු ලැබූ විට ඔබට ආත්මික බලවේග බඳින්ටද මුදන්ටද හැකිය. මෙම ආයුධය එකට වැඩ කරන බව ඔබට පෙනෙනු ඇත. එය බඳිනු ලැබීම හා මුදනු ලැබීම වේ. ඔබ යම්කිසි දෙයක් බඳිනු ලබන විට තවත් දෙයක් මුදනු ලැබිය යුතුය. නිදසුනක් වශයෙන් ඔබ අසත්‍යයේ ආත්මය බඳිනු ලබන්නේ නම්. ඒ තැන ගැනීමට සත්‍යයේ ආත්මය මුදනු ලැබිය යුතුය.

## යේසුස්වහන්සේගේ රුධිරය :

යේසුස්වහන්සේ කුරුසියෙහි මැරුණු විට, උන්වහන්සේ අපව පාපයේ හා සතුරාගේ බලයේ ආධිපත්‍යයෙන් මුදනු ලැබූ සේක. උන්වහන්සේගේ රුධිරය දෙවියන්වහන්සේ වෙතට ප්‍රවිෂ්ඨ වීමට ඉඩ සලසන අතර සාතන්ගේ බන්ධනයෙන් අපව මුදවා ගන්නා සේක. දේව වචනයේ සඳහන්

වන්නේ "ඔවුහු (ඇදහිලිවන්තයෝ) බැටළු පැටවාණන්ගේ (යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ) ලේ නිසා,,, ඔහුගෙන් (සාතන් ගෙන්) ජය ගත්තේය" යනුවෙනි (එළිදරව් 12:11)

ගැළවීමත්, සුවවීමත්, මිදීමත් යන මේ සියල්ල අපට ලැබෙන්නේ යේසුස්වහන්සේගේ රුධිරය නිසාය. උන්වහන්සේගේ රුධිරය පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ ආත්මය වෙනුවෙන් පහරදීමේ සටනෙහි යෙදී යේසුස්වහන්සේගේ නාමයෙන් මිදීම හා සුවය ගෙන ඒමට හැකියාව ලබා දෙන්නේය. සතුරා "ජය ගැනීමට" ඔබට බලය ඇත්තේ "බැටළුවාණන්ගේ ලේ" නිසාය

## ඔබගේ සාක්ෂිය :

එළිදරව් 12:11 න් පෙන්වන්නේ සතුරා පරාජය වන්නේ "තමුන්ගේ සාක්ෂියේ වචනය" නිසා බවය. "සාක්ෂිය" යන වචනයෙහි තේරුම අධිකරණ ශාලාවේ නීති කටයුතුවලදී භාවිත කෙරෙන "ලිඛිත සාක්ෂි" වැනි දෙයකි.

යේසුස්වහන්සේ බොහෝ අවස්ථාවල, ගැළවීම ලැබුවන්ට නියෝග කළේ දෙවියන්වහන්සේ ඔවුන්ට කළ දෙය අන් අයට පවසන මෙන්ය. ඔබ දෙවියන්වහන්සේගේ බලය ගැන සාක්ෂි දරණ විට ඔබ පහරදීමේ සටනක යෙදෙන්නෙහිය. එය ඵලදායි වන්නට නම් ඔබගේ සාක්ෂිය දේව වචනයේ සාක්ෂිය මත පදනම් විය යුතුය. එය අධිකරණයේ නීතිඥයෙක් තම තර්ක, දේශයේ ව්‍යවස්ථාව මත පදනම් කරගන්නාක් මෙනි.

## යේසුස් යන නාමය :

යේසුස් යන නාමය, දෙවියන්වහන්සේගේ මූලික සටන් සැලැස්මේ කොටසක් බව ඔබ ඉහත ඉගෙන ගත්තෙහිය. යේසුස් යන නාමය ප්‍රබල පහරදීමේ ආයුධයක්ද වේ. "මාගේ නාමයෙන්" ඔබ යක්ෂයන් දුරු කරන්නේය, රෝගීන් සුව කරන්නේය, හා සතුරාගේ බලය පරාජය කරන්නේ යි යේසුස් වහන්සේ කී සේක. (මාක් 16:17)

මෙම අත්පොතේ තෙවෙනි පරිච්ඡේදයේ සඳහන් යේසුස්වහන්සේගේ විවිධ නම් නැවත බලන්න. එම නම් වලින් කොපමණ එළිදරව් වීමේ කාර්යයන් පෙන්වන්නේදැයි බලන්න. තවද ක්‍රියා පොත සම්පූර්ණයෙන්ම කියවන්න. "යේසුස්වහන්සේගේ නාමයෙන්" කර ඇති විස්කම් ප්‍රමාණය කොපමණද?

යේසුස්වහන්සේගේ නාමය, යාච්ඤාවකින් අවසන් වන විශ්මය ජනක වාක්‍ය ඛණ්ඩයක් නොවේ. එය උන්වහන්සේ අපට දී ඇති අධිකාරී බලයේ හා අධිපත්‍යයේ සංකේතයකි. සාතන්ගේ බලවේගවලට එරෙහිව යුද වැදීමට උන්වහන්සේගේ නාමය භාවිත කිරීමට පෙර උන්වහන්සේගේ බලය හා ආධිපත්‍යය භාවිත කිරීමේ. අනුමැතිය ඔබ ලබා ගැනීම අවශ්‍ය වේ. ක්‍රියා 19:13-17 හි කතාව නැවත බලන්න. ස්කේවාගේ පුත්‍රයන්ට වූ දේ විමසන්න.

## පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. ඔබගේ පහරදීමේ යුද්ධායුධ පිළිබඳව ඔබ උගත් දේ සාරාංශගත කරන්න

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. "පහකිරීම්" පහරදීමේ ක්‍රියාව පිළිබඳව ඇති යොමු කිරීම් අධ්‍යයනය කරන්න.
   මතෙව් 5:29-30, 7:5, 8:16, මාක් 16:17, රෝම 13:12, 2 කොරින්ති 10:5, 1 පේත්‍රුස් 5:7

2. "පැළඳ ගැනිම" පහරදීමේ ක්‍රියාව පිළිබඳ මෙම යොමුකිරීම් අධ්‍යයනය කරන්න.
   රෝම 13:12, 14, 1 කොරින්ති 5:13, 13:11, ගලාති 3:27, එපීස 4:22-24, 6:11,
   කොලොස්සි 3:8-14

3. "ලබාගැනීමේ" පහරදීමේ ක්‍රියාව පිළිබඳව මෙම යොමුකිරීම් අධ්‍යයනය කරන්න.
   1 කොරින්ති 3:10, 8:9, 10:12, ගලාති 5:15, එපීස 6:13, 17, 1 තිමෝති 4:16, හෙබ්‍රෙව් 3:12

4. ඔබ මෙම පරිච්ඡේදයෙන් උගත් ආකාරයට, සතුරා පරාජය කිරීමට පහරදීමේ සටනකට ඔබ සහභාගි විය යුතුය. ඔබ ජයග්‍රහණය කිරීමට නම් ඔබගේ ජීවිතයේ යම් යම් දේ සිදුවීමට ඉඩ හැරිය යුතුය. ඒ දේ "වේවා" යි කිව යුතුය. පහත දැක්වෙන යොමුවන් අධ්‍යයනය කර, බයිබලය සඳහන් කරන පරිදි ඔබගේ ජීවිතයේ සිදුවීමට ඉඩ දෙන නැතහොත් ඒ දේ "වේවා" යි කිව හැකි දේ සටහන් කිරීමෙන් මෙම සටහන සම්පූර්ණ කරන්න.

| **යොමුව** | **අප ඉඩදිය යුතු දේ (වේවා)** |
|---|---|
| මතෙව් 5:16 | |
| යොහන් 4:1, 27 | |
| රෝම 13:1, 12-13 | |
| රෝම 14:5, 13, 16, 19 | |
| 1 කොරින්ති 3:18-21 | |
| 1 කොරින්ති 10: 8-9 | |
| 2 කොරින්ති 7:1 | |
| 2 කොරින්ති 10:17 | |
| ගලාති 5:26 | |
| එපීස 4:26-31 | |
| එපීස 5:3, 6, 33 | |
| පිලිප්පි 1:27 | |
| පිලිප්පි 2:3, 5 | |
| පිලිප්පි 3:15-16 | |
| පිලිප්පි 4:5-6 | |
| කොලොස්සි 3: 15-16 | |
| කොලොස්සි 4:6 | |
| 1 තෙසලෝනික 5:6-8 | |
| 11 තිමෝති 2:19 | |
| හෙබ්‍රෙව් 4:1, 14, 16 | |
| හෙබ්‍රෙව් 6:1 | |
| හෙබ්‍රෙව් 10:22-24 | |
| හෙබ්‍රෙව් 12:1 | |
| හෙබ්‍රුව් 13:1, 5, 15 | |
| යාකොබ් 1:5-9 | |
| යාකොබ් 3:13 | |
| යාකොබ් 4:9 | |
| යාකොබ් 5:13 | |
| 1 පේත්‍රුස් 3:3-4, 10-11 | |
| 1 පේත්‍රුස් 4:11, 15, 16, 19 | |
| 1 යොහන් 2:24 | |
| 1 යොහන් 3:7, 18 | |
| 1 යොහන් 4:7 | |

# දහතුන් වන පරිච්ඡේදය

## ආත්මික සටනේ ස්වභාවික සමාන්තරයන්

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීම
- යහපත හා නපුරු අතර ගැටුම විස්තර කිරීම සඳහා "යුද්ධය" භාවිත කිරීමට හේතුව පැහැදිලි කිරීමට
- ආත්මික යුද්ධයට යෙදිය හැකි සටනක ස්වභාවික මූලධර්ම සාරාංශගත කිරීමට
- ආත්මික ක්ෂේත්‍රයේ කෙරෙන සටනෙහි ස්වභාවික මූලධර්ම ව්‍යවහාර කිරීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **මාගේ පුත්‍රවූ තිමෝතියස්නි, නුඹ ගැන කලින් කීවාවූ අනාගතවාක්‍ය ලෙස මේ ආඥාව නුඹට භාරදෙමි. එනම් නුඹ ඇදහිල්ල සහ යහපත් හෘදයසාක්ෂියක් ඇතුව සිට, ඒ වාක්‍යවලින් යහපත් යුද්ධය කරන ලෙසය. සමහරු ඒ හෘදයසාක්ෂිය අත්හැරදමා, ඇදහිල්ල නමැති නැව බිඳගත්තෝය.** (1 තිමෝති 1:18,19)

## හැඳින්වීම

මුල් සභාව ඔවුන්ගේ ආත්මික අත්දැකීම් දුටුවේ යුද්ධය ඇසුරෙනි. ආරක්ෂාවීම විස්තර කර ඇත්තේ "දෙවියන් වහන්සේගේ යුද්ධායුධ" ලෙසය. දේව වචනය "කඩුවකට" සසඳා ඇත. සාතන්ගේ ප්‍රහාරයන් ගිනිහෙල්ල වන අතර ඇදහිල්ල "යහපත් සටනක්" වේ. ඇදහිලිවතුන්ට "යහපත් යුද්ධයක්" කරන ලෙස පවසා ඇත.

යහපත් හා නපුරු බලවේග අතර ආත්මික ලෝකයේ සිදුවන දේ විස්තර කිරීමට දෙවියන් වහන්සේ ස්වභාවික යුද්ධය පිළිබඳ නිදසුන තොරාගත්තේ මන්ද? මීට පිළිතුරු මූලික බයිබල් මූලධර්මයක තිබේ. එය ආත්මික සත්‍යයයේ ස්වභාවික මූලධර්මයකි. ආත්මික ලෝකයේ සිදුවන දේ පැහැදිලි කිරීමට දෙවියන්වහන්සේ ස්වභාවික මූලධර්ම භාවිත කරන සේක. ස්වභාවික ලෝකයේ සිදුවන දේ අපට අවබෝධ කරගත හැකිය. ස්වභාවික ලෝකයේ යම් දෙයක් හා ආත්මික ලෝකයේ යම් දෙයක් අතර ඇති සමාන්තරතාවන් දැක්වූ විට, අපට ස්වභාවික දේ ඇසුරෙන් ආත්මික දේ අවබෝධ කරගත හැකිය.

යේසුස්වහන්සේ මෙම මූලධර්මය බොහෝ අවස්ථාවල භාවිත කළ සේක. උන්වහන්සේ සේවකයන් කැඳවන මහා ආත්මික අස්වැන්න පැහැදිලි කිරීමට ස්වභාවික අස්වැන්න පිළිබඳ නිදසුන භාවිත කළ සේක. ස්වභාවික ලෝකයේ අස්වැන්න කපාගැනීමේ හා ආත්මික ලෝකයේ අස්වැන්න කපාගැනීම අතර බොහෝ සමනතාවන් තිබේ.

යුද්ධය පිළිබඳව දේ මේ දේ සැබෑය. ස්වභාවික සටන්වල ඇති මූලධර්ම බොහෝමයක් විශේෂඥයන් විසින් අධ්‍යයනය කර ඒවා භෞතික සටන්වල ව්‍යවහාර කර ඇත. මෙම ස්වභාවික මූලධර්ම ආත්මික ලෝකයටද යොදා ගත හැකිය. මෙම පරිච්ඡේදයේදී ස්වාභාවික සටන්වල මූලධර්ම අධ්‍යයනය කර ඒවා ආත්මික ක්ෂේත්‍රයට යොදා ඇත. ඇදහිලිවතුන් නියුක්ත වී සිටින දැන් පවතින ආත්මික සටන විස්තර කිරීමට දෙවියන්වහන්සේ ස්වභාවික සටන් භාවිත කිරීමට හේතුව ඉන් එළිදරව් වේ.

## ආත්මික සටනේ ස්වභාවික සමාන්තරයන්

පහත දැක්වෙන්නේ ආත්මික සටන හා සමාන්තර යුද්ධයේ ස්වභාවික මූලධර්ම සමහරකි

## යුද්ධයේ අර්ථ විග්‍රහය :

ස්වභාවික ලෝකයේ යුද්ධය පිළිබඳ සරල අර්ථ විග්‍රහයක් මෙසේ දැක්විය හැකිය. "අපගේ කැමැත්ත කිරීමට ප්‍රතිපාක්ෂිකයාට බල කිරීම අරමුණු කරගත් ක්‍රියාවකි." මෙම අර්ථ විග්‍රහය ආත්මික ලෝකයටද ව්‍යවහාර කළ හැකිය. සාතන්ද, නිරන්තරයෙන්ම නපුරු බලවේග භාවිත කරමින් ඔහුගේ කැමැත්ත ඉටු කිරීමට ඔබට බල කරයි.

## යුදකාලයේ ජීවන රටාවක් :

ජාතියක් යුද්ධයක නිරත වී සිටින විට, එම ජාතියේ ජීවන රටාවට ඉන් බලපෑමක් ඇතිවේ. ජාතිය වෙනුවෙන් සටන් කිරීමට පුරුෂයන් තම රැකියාවෙන් ඉවත් වෙති. ඔවුහු පැය ගණනාවක් පුහුණුවීමට හා සූදානම් වීමට ගත කරති. සටනට ආධාර පිණිස ආර්ථිකයෙන් අරමුදල් ලබා ගනී. ආක්‍රමණයකට වැසියෝ සූදානම්ව සිටිති. දේශ සීමාවන්වල අතිරේක බල ඇණි තබනු ලැබේ.

ආත්මික ලෝකයේ බොහෝ ඇදහිලිවන්තයෝ තමා වටේ කෙරෙන යුද්ධය ගැන කිසිවක් නොදන්නා අතර එනිසාම යුදකාලයේ ජීවන රටාවක් අනුගමනය නොකරති. සභාවන් සංගම් විවිධ උත්සව හා වැඩසටහන් සංවිධානය කළද ඔවුන්ට යුදමය සැලැස්මක් නොමැත. ඔවුහු සුඛෝපභෝගී, ජීවිත විවේකීව ගත කරති. ඒ අතරතුර ගිණිය නොහැකි පුරුෂයන් හා ස්ත්‍රීන් සංඛ්‍යාවකගේ ආත්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නොමැති නිසා සාතන් ගිලගනී. සංගමයේ සාමාජිකයෝ අධෛර්යට පත්ව, පීඩිතව, මාංශික පාපයේ ජීවත් වෙති. ඔවුහු, ඔවුන් නොදන්නාවූ යුද්ධයක ගොදුරු බවට පත්ව සිටිති. ඔබ මෙය අවබෝධ කරගත යුතුය. අපි යුද්ධයක නිරත වෙමින් සිටිමු. ආපි ආත්මික-ලෝකයේ යුදමය ජීවන රටාවක් අනුගමනය කළ යුතු වෙමු. අපගේ ජීවිතයේ ඉලක්කය විය යුත්තේ ආත්මික සටන වේ. අපි පුහුණුවීමට හා සූදානම්වීමට කාලය ගතකල යුතු වෙමු. අප අපගේ ආත්මික ආයුධ ගැන ඉගෙන ගෙන ඒවා භාවිතයට ගත යුතුය.

සාතන් තර්ජනය කරන්නාවූ ජාතීන්ට ශුභාරංචිය පැතිරවීමට ද්‍රව්‍යමය දේ අප වෙන් කළ යුතුය. සතුරාගේ ආක්‍රමණය ගැන අප අවදිව සිටිය යුතු අතර අපගේ හදවත, මනස, දිව, ආත්මය, නිවෙස, සමාජය හා සභාවේ සහභාගිත්වයේ සීමාවන්හි අතිරේක ආරක්ෂකයන් තැබිය යුතුය. අප යුද්ධයක නියැලී සිටිමු. එය අපගේ ආත්මික ලෝකයේ ජීවන රටාවෙන් පිළිඹිබු විය යුතුය.

## යුද්ධයේ අරමුණ :

ස්වභාවික ලෝකයේ යුද්ධයේ ප්‍රධාන අරමුණු ජයග්‍රහණය වේ. ආත්මික ලෝකයේ ප්‍රධාන අරමුණද මෙයම වේ. ස්වභාවික ලෝකයේ ජයග්‍රහණය ලැබීම සඳහා සපුරාගත යුතු කෙටි කාලීන අරමුණු බොහෝමයකි. පෞද්ගලික සටන් ජයගත යුතු අතර විවිධ බලප්‍රදේශ අයත් කරගත යුතුය. මේ සෑම පෞද්ගලික සටනක්ම අවසාන ජයග්‍රහණ ඉලක්කයට දායක වේ.

ආත්මික ලෝකයේද මෙය සැබෑය. අපගේ දිගුකාලීන ඉලක්කය වන්නේ සතුරා පරදවා ජයග්‍රහණය ලැබීම වේ. එහෙත් අප මේ දිගුකාලීන අරමුණු වඩාත් සුවිශේෂී අරමුණුවලට කඩාගත යුතුය. දෙවියන්වහන්සේ අපගේ පවුල, සභා සහභාගිත්වය, ප්‍රජාව හා ජාතිය වෙනුවෙන් බලාපොරොත්තු වන අරමුණු අප දැනගත යුතුය. අප ජයග්‍රහණය කළ යුතු අපට පවරා ඇති සුවිශේෂී බල ප්‍රදේශය අප හඳුනා ගත යුතුය.

ස්වභාවික හමුදාවේ සෑම භටයෙකුටම සටනේදී නියමිත තැනක් හා වගකීමක් ඇත. මෙය ආත්මික ලෝකයටද සත්‍යයකි. අවසාන ජයග්‍රාහී ඉලක්කයට දායක වන පෞද්ගලික අරමුණු ඔබ හඳුනා ගත යුතුය. ස්වභාවික ලෝකයේ අණදෙන නිලධාරී තැන හමුදා භටයන්ට විවිධ අරමුණු පවරයි. ඔබගේ අණදෙන නිලධාරියා දෙවියන්වහන්සේ වේ. ඔබට කිතුනු භටයෙකු ලෙස සුවිශේෂී අරමුණු උන්වහන්සේ පවරා ඇත.

## මූලික පුහුණුව :

යුද්ධයක අරමුණු දැනගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. මේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ ක්‍රම පිළිබඳව ඔහු මූලික පුහුණුවක් ලැබිය යුතුය. ස්වභාවික ලෝකයේ මෙම පුහුණුවට සතුරා පිළිබඳව

දැනගැනීම, ඔහුගේ ක්‍රමෝපායයන්. යුද්ධායුධ භාවිත කරන ආකාරය හා සටන් සැලැස්ම ආදිය පිළිබඳව ඉගෙනීම ඇතුළත් වේ.

ආත්මික ලෝකයේ ඇදහිලිවතුන් බොහෝ විට සටන් භූමියට ඇතුළු වන්නේ මෙම මූලික පුහුණුව නොමැතිවය. ඔවුහු සතුරාගේ ක්‍රමෝපායයන් නොදනිති. එමෙන්ම ඔවුහු තම ආත්මික ආයුධ ගැන හෝ ඒවා භාවිත කරන ආකරය ගැන හෝ නොදනිති. ඔවුන් සටන් සැලැස්ම (දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය) අධ්‍යයනය කර නැත.

ස්වභාවික ලෝකයේ, මූලික පුහුණුවක් නොමැතිව හමුදා භටයෙකු යුද්ධයට යවන්නේ නම් ප්‍රතිඵලය වන්නේ පරාජය ය. ආත්මික ලෝකයටද මෙය සැබෑවකි. ජයග්‍රහණය අත්දැකීමට නම් ඔබ ආත්මික සටන් පිළිබඳව පුහුණුවක් ලැබිය යුතුය. හමුදා භටයෙකු ස්වාභාවික ලෝකයේ පුහුණුව ලැබීමට පැමිණෙන විට ඔහු සමාජ ජීවිතය අත්හරී. ඔහු තවදුරටත් සමාජයේ කාර්යයන් හා සම්බන්ධතාවක් පවත්වන්නේ නැත. ඒ වෙනුවට ඔහු තමා බැඳුනු හමුදාව පිළිබඳව හැඟීමකින් කටයුතු කරයි.

ආත්මික ක්ෂේත්‍රයේ, සාර්ථක යුද්ධයක නියැලීමට සමාන්‍ය ජීවිතයේ කටයුතු සමග සම්බන්ධතාවන් අප අත්හැරිය යුතුය. අපි වර්තමාන ලෝකයේ සාමාන්‍ය පුරුවැසියන් නොවෙමු. අපි දේව රාජ්‍යයේ යුද භටයෝ වෙමු.

> **ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ යහපත් භේවායෙකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙන්න. භේවාකම් කරන්නාවූ කිසිවෙක්, ඔහු භේවායෙකු මෙන් ලියාගත් අය සතුටු කරන පිණිස, මේ ජීවිතයේ කාරණාවලට පටලැවෙන්නේ නැත. (2 තිමෝති 2:3-4)**

## ප්‍රචාරය කිරීම :

සතුරු රාජ්‍යයන් එකිනෙකාට විරුද්ධව අසත්‍ය ප්‍රචාරයන් (තොරතුරු) කරනු ලැබේ. සාතන්ද ඔබ ඉඩ දුනහොත් අසත්‍ය ප්‍රචාර ඔබගේ මනසට ඇතුළු කරනු ඇත. ඔබ මේ පිළිබඳව තව දුරටත් පහලොස්වන පරිච්ඡේදයේ "මනසේ සටන" අධ්‍යයනය කරන විට හදාරනු ඇත.

## තානාපති යෝජනා :

යුද්ධයට එළඹී සිටින ජාතින්ගේ, එක් උපක්‍රමයක් වන්නේ. තානාපති යෝජනා මගින් සතුරා දුර්වල කිරීමය. මේවා යෝජනා හෝ ගිවිසුම් හෝ වේ. මෙවැනි යෝජනා මගින් එක් ජාතියක් අනෙක් ජාතියට වඩා වාසි ලබාගැනීමට උත්සාහ කරයි. ආත්මික සටනේදී සාතන් උත්සාහ කරන්නේ ඇදිහිලිවතුන් පාපය සමග එකඟතාවකට ගෙන ඒමට වේ. එවැනි "සම්බන්ධතාවක" ප්‍රතිඵලය ආත්මික දුර්වලතාව බව ඔහු දනී.

## බුද්ධිමත්බව :

ජාතීන් යුද්ධයක නියැලී සිටින විට, නිරතුරුවම බුද්ධි අංශ ක්‍රියාත්මක වේ. සෑම පැත්තකටම අනෙක් පාර්ශවය ගැන තොරතුරු එක් රැස් කරගැනීමට කැපවූ බුද්ධිමය බලසේනා ඇත. බුද්ධි අංශ, සතුරා පිළිබඳව ලබා ගත හැකි තොරතුරු එක්රැස් කර ඒවා විශ්ලේෂණය කරයි. ඉන්පසු ඔවුහු ඔවුන් උගත් දේ සටනේ නියැලී සිටින හමුදා භටයින්ට සපයති.

ආත්මික සටනේදී සතුරා හා ඔහුගේ උපායමාර්ග පිළිබඳ දැනුම ජයග්‍රහණය සඳහා අතිවැදගත්ය. සතුරා පිළිබඳ තොරතුරු එළිදරව් කරන ඔබගේ "බුද්ධිමය අත්පොත" බයිබලය වේ. ඔබ සතුරාගේ උපක්‍රම හා ශුද්ධ ලියවිලි ප්‍රතිඋපක්‍රම උගත් විට ඒවා අනෙක් කිතුනු භටයින්ට සන්නිවේදනය කළ යුතුය. ඔබ පිළිබඳ තොරතුරු සාතන්ද එක්රැස් කරයි. ඔබගේ දුර්වලතා ඔහු දැනගෙන ඔහුගේ ප්‍රහාර ඒවාට ඉලක්ක කරයි.

## පහරදීමේ හා ආරක්ෂක යුද්ධ සංග්‍රාම :

ස්වභාවික ලොකයේ යුදහමුදා පහරදීම මෙන්ම ආරක්ෂක යුද උපක්‍රම භාවිත කරති. පහරදීමේ සටනක් යනු සතුරාට එරෙහිව නොබියව ඉදිරියට යෑමක් බව ඔබ උගත්තෙහිය. ආරක්ෂක

සටනක් යනු සතුරා ප්‍රහාර එල්ල කරන විට ඔබ ඔබගේ බලප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට කරන සටන වේ.

ආත්මික ලෝකයේ පහරදීමේ හා ආරක්ෂක යුදමය තත්වයන්ගේ සමාන්තරයන් පවතින බව ඔබ ඉගෙනගෙන ඇත. සාතන් ප්‍රහාර එල්ල කරන විට ඔබ ආත්මික ආරක්ෂක සටන් ක්‍රම භාවිත කළ යුතුය. ඔබ ශුභාරංචිය කිසි දිනෙක නෑසූ අය සමග එය බෙදා ගැනීම වැනි අලුත් බලප්‍රදේශ දෙවියන්වහන්සේ වෙනුවෙන් අල්ලා ගන්නා විට ඔබ පහරදීමේ සටනක යෙදෙන්නෙහිය. ඔබ අලුත් බලප්‍රදේශ අල්ලා ගන්නේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙනි.

ස්වභාවික ලෝකයේ ශ්‍රේෂ්ඨ ජෙනරාල්වරයෙකු වරක් තම යුදහමුදා බණ්ඩයට මෙසේ පවසා ඇත. “අපි සතුරා පැමිණ අපට වෙඩි තබන තුරු නරි ගුහා සාදා ඒ තුළට විත් බලා නොසිටින්නෙමු. අපි ඉදිරියට, වේගයෙන් යන්නෙමු.” (නරි ගුහාවක් යනු හමුදා භටයෙකුට සැඟවී සිටිය හැකි ගුහාවකි). ඔහු මෙසේද පවසා ඇත. “ඔබ නරි ගුහාවක් තැනීම යනු මිනිවලක් තැනීම වේ. ඔබ නරිගුහාවේ සිට සතුරාට වෙඩි තබන විට ඔබ ඉන්නාවූ තැන ඔහු දන්නේය. අප ඉදිරියට යමින් සිටින විට ඔහු වෙඩි තබන්නේ අපි කලින් සිටි තැනට මිස දැනට සිටින තැනට නොවේ.” මෙම ජනරාල්වරයා ආරක්ෂක ක්‍රම ගැන විශ්වාසය නොතැබිය. ඔහුගේ තර්කය වූයේ සතුරා නිතරම ප්‍රහාරවලට ලක්වෙමින් සිටින්නේ නම්, ආරක්ෂාකාරී වීම අනවශ්‍ය බවය. ඔහුගේ පිළිගැනීම වූයේ ආක්‍රමණශීලිව ගමන් කරන බලඇණියකට, ආරක්ෂාවීමට උත්සාහ කරන බලඇණියකට වඩා වාසි ඇති බවය. ඔහු තවදුරටත් මෙසේ පැවසිය. “අපි අපගේ කොන්දේසි යටතේ සටන් කර දිනන්නෙමු.”

ආත්මික සටනේදී යුද්ධයේ අරමුණ, සතුරා පරාජය කිරීම ලෙස පිළිගන්නා තැනැත්තා, පහසුවෙන් ආරක්ෂා වීමේ තත්ත්වයකට පත්වන්නේ නැත. සම්පූර්ණ ජයග්‍රහණය ලැබීමට, පහරදීමේ පෙරමුණු අවශ්‍යවේ.

## යුද්ධායුධ :

ඕනෑම යුද්ධයක යුද්ධායුධ භාවිත කෙරේ. ඒවා දුන්න හා ඊතල වැනි සරල ඒවා හෝ මිසයිල පද්ධති වැනි සංකීර්ණ ඒවා හෝ විය හැකිය. භාවිත කරන්නේ කුමන ආයුධද හා ඒවා භාවිත කරන්නේ කෙසේද යන්න යුධභටයා දැනගත යුතුය. ඇතැම් ආයුධ සුවිශේෂීව ආරක්ෂක ඒවා වන අතර අනෙක්වා පහරදීමේ ආයුධ වේ.

ආත්මික ලෝකයටද මෙය සැබෑය. ඔබ කිතුනු භටයෙකු වශයෙන් ආත්මික ආයුධ පිළිබඳව හා ඒවා භාවිත කරන අන්දම දැනගත යුතුය. ඔබ උගත් පරිදි ආරක්ෂක මෙන්ම පහරදීමේ ආත්මික යුද්ධායුධ ඇත. මෙහි වෙනස වන්නේ ඔබගේ ආයුධ ආත්මික ආයුධ වීම වේ. ආත්මික සටන් සඳහා බල රහිත ස්වභාවික ආයුධ භාවිත කිරීමට තරම් සුළු නොවන්න.

## හදිසි පහරදීම් :

ත්‍රස්තවාදය, කඩාකප්පල් කිරීම් හා සැඟවී සිට පහරදීම් යන මේ සියල්ල යුද්ධයේදී ස්වාභාවික හමුදාවන් භාවිත කරන හදිසි පහරදීම් හෙවත් බලාපොරොත්තු නුවූ අවස්ථාවල කෙරෙන පහරදීම් වේ. පළමුව, ඒවා දරුණු පහරදීමේ ක්‍රමයන් වේ. දෙවනුව, ඒ සියල්ලම බලාපොරොත්තු නුවූ විටෙක කරන පහර දීම්ය. මෙම ප්‍රහාරයන්ට භාජනය වන ඉලක්ක, ඒ සඳහා සූදානම් නැති අතර නොසිතන විටෙක ප්‍රහාරය එල්ල වේ. මෙහි ප්‍රතිඵලය සාමාන්‍යයෙන් ව්‍යාකූල තත්ත්වයකට පත්වීම හා පරාජය වේ.

සැඟවී සිට පහර දෙන ත්‍රස්තවාදීන් මෙන්, සාතන්ද දරුණු, ආක්‍රමණශීලි, හදිසි ප්‍රහාර එල්ල කරයි. ඔහු පහර දෙන්නේ ඔබ ආරක්ෂා කර නොමැති, පහර දෙන්නේ යයි නොසිතන තැන්වලටය. සතුරා, ඔහු පහරදෙන බවට අනතුරු ඇඟවීමක් කරන්නේ යයි නොසිතන්න. මෙය ස්වභාවික ලෝකයේ සිදුවන්නේ නැත. ආත්මික ලෝකයේද සිදුවන්නේ නැත.

## තීරණාත්මක සටන් :

සෑම යුද්ධයකම “තීරණාත්මක සටනක්” තිබේ. මුළු යුද්ධයේම සමස්ථ ප්‍රතිඵලය තීරණය කෙරෙන්නේ මෙම සටන්වලිනි. තීරණාත්මක සටන් වැදගත් වන්නේ සටනට අයත් බලප්‍රදේශය

නිසාය. යම් හමුදාවක් වැදගත් ස්ථානයක පාලනය තම අතට ගත හොත්, ඒ වටා ඇති ප්‍රදේශද ඔවුන්ගේ පාලනයට යටත් කරගත හැකිය. ආත්මික සටනේද තීරණාත්මක සටන් තිබේ. නිදසුනක් වශයෙන් ඔබ මනස, හා දිව සමග කරන සටන පරාජය වුවහොත් එය ඔබගේ ආත්මය, හදවත හා ඇතැම්විට මුළු ශරීරයම කෙරෙහි බලපානු ඇත.

ස්වභාවික ලෝකයේ විශාල සේනාවක් යවන්නේ තීරණාත්මක සටන් ඇති තැන්වලට වේ. ආත්මික ලෝකයේද එසේමය. සාර්ථක සටනක් සඳහා වැදගත් ස්ථානවල ආත්මික සම්පත් එක්රැස් කිරීම අවශ්‍ය වේ. ශුභාරංචිය පැතිරවීම පිළිබඳවද මෙය සත්‍යයකි. ලෝකයේ ඇතැම් ස්ථානවල ආත්මික ගොයම් පැසී තිබෙන අවස්ථා ඇත. ඒ ස්ථානවලට එවැන්ජලිස්ත බලවේග එක්රැස් කළ යුතුය.

අවාසනාවකට මෙන් සැමවිටම මෙය එසේ නොවන්නේය. වර්තමානයේ සිටින දේව සේවකයන්ගේ වැඩි කොටසක් ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ වන අතර සෑම ප්‍රජාවකම සභාවක් ඇත. සෑම නිවෙසකම වාගේ ක්‍රිස්තියානි ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් ලගා කරගත හැක. ලෝකයේ ඉතිරි දේශයන් වල විශාල ජනගහනයක් ඇතත් බොහෝ කොටස් වලට ක්‍රිස්තියානි සාක්ෂි ළගා වී නැත. ඔවුන් වෙත ළගාවීම සඳහා පුහුණුවලත් දේව සේවකයින් ඇත්තේ ස්වල්ප දෙනෙකි. මේ දේශයන්හි සිටින ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ හදවත්, මනස් හා ආත්ම පිළිබඳ තීරණාත්මක සටන් සතුරා විසින් ගෙන එන්නේය. මේ අතර අපගේ ආත්මික බලය සාන්ද්‍රනය වී ඇත්තේ වෙන අතකටය.

### සන්නිවේදනය :

ස්වභාවික සටන්වල සන්නිවේදනය ඉතා වැදගත් වේ. උපදෙස් හා දිරිමත් කිරීම් ලබා ගැනීම සඳහා යුදහමුදා සේනාංකයට තම අණදන නිලධාරී සමග සන්නිවේදනයේ යෙදීම කළ යුතු වේ. සතුරා සෑම විටම උත්සහ කරන්නේ පෙරමුණේ සිටින භටයන් හා ඔවුන්ගේ නායකයා සමග ඇති සන්නිවේදන පහසුකම් බිඳ දැමීමටය. එවිට සටන අසාර්ථක වන බව ඔවුහු දනිති.

ආත්මික සටනේදීද සාතන්ට අවශ්‍ය ඔබගේ සන්නිවේදන පද්ධතිය විනාශ කිරීමට වේ. යාච්ඤා කිරීම හා දේව වචනය කියවීම ආත්මික සටන සඳහා ඔබට උපදෙස් හා ධෛර්යමත් කිරීම් සපයන බැවින් ඔබ ඉන් වැළැක්වීමට ඔහු උත්සාහ කරයි. ඔබ එතරම්ම යුදකටයුතුවල නියැලී සිටින බැවින් ඔබගේ අණදෙන නිලධාරී සමග සන්නිවේදනයේ යෙදීමටවත් කාලයක් නොමැති වුවහොත් ඔබ පහසුවෙන්ම පරාජය කළ හැකිය. කිතුනු සේවාව සතුරා සමග සටන් නිත්‍යානුකූල ක්‍රමයකි. එහෙත් ඔබගේ ආත්මික බලය හීනවුවහොත්, සටන ඵලරහිත වීමට ඉඩ තිබේ. පෙරමුණේ සිටියවුන්ට බලය ලැබෙන්නේ අණදෙන නිලධාරී සමග කෙරෙන සන්නිවේදනයකි. ඔබ නිරන්තරයෙන්ම යාච්ඤාවෙන් හා උන්වහන්සේගේ වචනය කියවීමෙන් උපදෙස් හා ධෛර්යමත් කිරීම් ලබාගත යුතුය.

### ඉලක්ක :

ස්වභාවික ලෝකයේ යුද්ධවලදී ඉලක්ක වර්ග දෙකක් තිබේ. ඒ චලනය වන ඉලක්ක (බෝට්ටුවක්, අභ්‍යාවකාශයක්, යුධ ටැංකියක් හෝ භටකණ්ඩායමක් වැනි දේ) හා ස්ථිති ඉලක්ක (යුද්ධායුධ ගබඩාව, හමුදා මූලස්ථානය ආදිය) යන මේවා වේ. ස්වාභාවික සටන්වල වඩාත්ම තර්ජනයක් වන්නේ චලනය වන ඉලක්කය. ඒ ඒවා පහරදීම් බැවිනි. බල ප්‍රදේශ අල්ලා ගැනීම සඳහා මේවා ගමන් කරමින් සිටී.

ආත්මික ලෝකයේ සාතන් වඩාත්ම සැලකිලිමත් වන්නේ චලනය වන ඉලක්ක ගැනය. සතුරු බලවේග ජයගැනීම සඳහා ආත්මික යුද බිමේ කඩිසරව එහා-මෙහා යන පුරුෂයා හා ස්ත්‍රිය ඔහු ඉලක්ක කරගනී. ස්ථිතික ඉලක්ක වෙතද සාතන් ප්‍රහාර එල්ල කරයි (පහරදීමේ සටනක නියැලී නැති ඇදහිලිවන්තයන්). එහෙත් ඔබ දෙවියන්වහන්සේ වෙනුවෙන් එහා මෙහා යන විට ඔබ සාතන්ගේ ප්‍රමුඛ ඉලක්කයක් වන බව මතක තබා ගන්න. ඔබ ඔහුගේ බලප්‍රදේශවලට ඇතුළු වීම නැවැත්වීම ඔහුට අවශ්‍යය. එයට හේතුව ඔබ සතුරාට අයුවුවන්ගේ ආත්ම දිනාගන්නා බැවිනි.

### ප්‍රහාර හා ප්‍රතිප්‍රහාර :

ස්වභාවික සටන්වලදී එක් පැත්තක් ප්‍රහාර එල්ල කරන විට අනෙක් පැත්ත ප්‍රතිප්‍රහාර එල්ල කරයි. ප්‍රතිප්‍රහාරයක් යනු, නැතිවුනු පෙදෙස් නැවත ලබාගැනීම සඳහා ඉදිරියට එන සතුරු

සේනාව නැවැත්වීමට කෙරෙන උත්සාහයකි. ඇදහිලිවතුන් විසින් කරනු ලබන සෑම පහරදීමේ ප්‍රහාරයකටම සාතන් ප්‍රතිප්‍රහාරයක් එල්ල කරයි. ඔබ වැඩිපුරු යාච්ඤා කිරීමට හෝ දේව වචනය කියවීමට හෝ දේවස්ථානයට ඇතුළුවීමට හෝ තීරණය කළ වහාම ඔබගේ ඉදිරි ගමන වැළැක්වීමට ඔහු එවෙලෙහිම ප්‍රතිප්‍රහාරයක් එල්ල කරයි ඔබ මෙම ප්‍රතිප්‍රහාර එල්ල කිරීමේ උපක්‍රමය දන්නෙහි නම්. ඔබට ඒ සඳහා සූදානම් වීමට පුළුවන. යුද කටයුතු වලදී ප්‍රහාර එල්ල කරන මූලික ක්‍රම තුනක් තිබේ. ආත්මික ලෝකයේද සතුරා විසින් මෙවැනිම ප්‍රහාර එල්ල කරනු ඇත.

**1. පෙරමුණෙන් එන ප්‍රහාර :** මේවා සෘජු මුහුණට මුහුණ ලා කෙරෙන ප්‍රහාර වේ. සාතන්ගේ පරීක්ෂාවන්, ස්වභාවික ලෝකයේ කෙරෙන පෙරමුණු ප්‍රහාර හා සමානය. සෘජු ආත්මික ප්‍රහාරයන්ට මුහන දිය යුත්තේ සාතන්ට විරුද්ධව සිටීමෙනි.

**2. වටලෑම් හෝ බාධක පැනවීම් :** ස්වභාවික ලෝකයේ වටලෑමක් හෝ බාධක පැනවීමක් හෝ කෙරෙන්නේ සතුරා, තමන්ට අයිති නැති ප්‍රදේශයක් පාලනයට ගත් විටය. ආත්මික බන්ධනයද ස්වාභාවික ලෝකයේ වටලෑමකට හෝ බාධක පැනවීමටක හෝ සමානය. සතුරා ඔබගේ ආත්මික පවුරු බිඳ දමා ඇතුළුවන අතර එමගින් ඔබගේ ජීවිතයේ කොටසක් ඔහුගේ පාලනය යටතට ගනු ඇත. ඔහුට එම ප්‍රදේශය අයත් වන්නේ නැත. එහෙත් දෙවියන්වහන්සේගේ මහිමය වෙනුවෙන් කෙරෙන ඔබගේ ක්‍රියාවන් ඔහු වළක්වයි. ආත්මික වටලෑම් හෝ බාධක හෝ සඳහා ගතයුතු ක්‍රියාමාර්ගය වන්නේ, ඔබ මෙම පාඩමාලාවෙන් උගත් බඳිනු ලබන හා මුදනු ලබන බලවේග මූලධර්ම භාවිත කිරීමය. සතුරා බැඳ දැමිය යුතු අතර ඔහුගේ පාලනය යටතේ තිබෙන ප්‍රදේශ මුදාගත යුතුය.

**3. ආක්‍රමණය හා අත්කර ගැනීම :** ස්වභාවික ලෝකයේ සතුරෙක් ආක්‍රමණය කළ විට, ඔහු එම ප්‍රදේශය අත්පත් කරගෙන පාලනය කරයි. මෙය ආත්මික ලෝකයේ යක්ෂාවේශ වීම හා සමානය. ගැළවීම නොලද හෝ පසුබටවූ පුද්ගලයෙක් ඔහුට ආවේශ වීම සඳහා ඇතුළු වූ දුෂ්ටාත්මයක පාලනය යටතේ සිටී. මෙවැනි ප්‍රහාරයක් හා සමග කටයුතු කළ යුත්තේ සතුරා බැඳ දමා පලවා හැරීමෙනි.

**චලනය වීම :**

ස්වභාවික යුද්ධයේදී සාර්ථක වීමට නම් හමුදාව එහා මෙහා යා යුතුය. පහරදීමේ ක්‍රියාවන් කළ යුතු තැනට පහසුවෙන් යැමට මෙම බලඇණිවලට හැකිවිය යුතුය. සතුරා විසින් ඔවුන්ව වටකර ඔවුන්ට එක තැනක සිරකර තැබූවහොත් ඔවුන් ඵල රහිත වනු ඇත.

"ලෝකයා වෙතට යන්න, ශුභාරංචිය දේශනා කරන්න" යැයි දෙන ලද ආඥාව ඉටු කිරීමට නම් ඔබ ආත්මික ලෝකයේ එහා මෙහා යාම අවශ්‍යය. ඔබ සතුරා විසින් අචලත්වයට පත් කර ඇති කිතුනු භටයෙක්ද නැතහොත් ශුභාරංචි පණිවුඩය රැගෙන ඉදිරියට යන ලෙස දෙන ලද ආඥාව ක්‍රියාකාරීව අනුගමනය කරන්නෙහිද?

සොල්දාදුවෙක් යුද්ධායුධ පැළඳගෙන අවි අතට ගන්නේ සැප පහසු ලෙස නිවසේ සිටීමට නොවේ. ඔහු සටනට සූදානම් වෙනවා පමණක් නොව යුදභූමියට යන්නේය. ඇතැම් කිතුනු සොල්දාදුවෝ යුද්ධයට සූදානම් වෙති. එහෙත් කිසිදු දිනෙක සිය නිවසේ හෝ සභාවේ හෝ රැකවරණය අත් හැර දමා යුද භූමියට නොයති. අපගේ මහපාරවල මෙම සටන පැවැත්වේ. එය තවමත් ශුභාරංචිය පිවිසි නැති ගම් නියම්ගම්වල පැවැත්වේ. අපි කෙතරම් ආත්මිකව සූදානම්ව සිටියත් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ඉදිරියට නොයන්නෙමු නම් කිසි දිනෙක සටන ජයගන්නේ නැත.

යුද්ධය පිළිබඳව පත-පොත අධ්‍යයනයෙන් පමණක් යුධ භටයෙකුට අවශ්‍ය දක්ෂතාවන් ඔහුට නොලැබේ. ඔහුගේ දක්ෂතාවන් දියුණු වන්නේ යුද භූමියේ ලබන අත්දැකීම් වලිනි. යුද්ධය පිළිබඳ ඔබගේ අත්පොත (බයිබලය) අධ්‍යයනය කිරීම වැදගත්ය. එහෙත් ඔබ උගත් දේ ක්‍රියාවට නැංවූයේ නැත්නම් කිසිදු දිනෙක සටන ජයගත නොහැකිය. ස්වභාවික ලෝකයේ මෙන්ම ආත්මික සටනේ දක්ෂතාවන් ලැබෙන්නේ අත්දැකීම් හා ව්‍යාවහාරයන් තුළිනි.

## සහයෝගය :

යුද්ධය කණ්ඩායම් ක්‍රියාවකි. සතුරා පරාජය කිරීම සඳහා හමුදා භටයෝ එකිනෙකා සමග සහයෝගයෙන් ක්‍රියාකළ යුත්තාහ. ඔවුන් එක් අණදෙන නිලධාරියෙකුගේ අණට කීකරු විය යුතුය. ඔවුන් ඉදිරියට යන්නේ සමගි පෙරමුණක් විලසිනි. ඔවුන් සටන් කරන්නේ ඔවුන්ගේ පෞද්ගලික නමින් නොව රට හා රටේ නාමය වෙනුවෙනි. ආත්මික සටන් ක්ෂේත්‍රයේ සහයෝගයෙන් කටයුතු කිරීමට ඇදහිලිවන්තයන් උගත යුතුය. එකිනෙකා සමග සටන් කරනු වෙනුවට අපට අවශ්‍ය සතුරාට එරෙහිව ආක්‍රමණයකට අවධානය යොමු කිරීම වේ.

ස්වභාවික ලෝකයේ සෙබලෙකු තුවාළ වූ විට ඔහුව බේරා ගැනීමට ඔහුගේ මිතුරෝ ප්‍රබල උත්සාහයක් දරති. භට කණ්ඩායම ඉදිරියට යන විට ඔවුන් ගමන් කරන්නේ එක ඒකකයක් ලෙසය. ඔවුහු දුර්වල වූ තැනැත්තාව අත්හැර නොයති. එහෙත් දුර්වල වූ තැනැත්තාගේ තුවාළ සුවවන තෙක් ශක්තිමත් භටයෝ ඔහුව මැද තබා ඔහුට ඉදිරියෙන් හා පසුපසින් යති.

කිතුනු හමුදාව ඇතැම් විට තුවාළ වූ තමාගේම සගයින්ට වෙඩි තැබීමට උත්සාහ කරති. ඇදහිලිවන්තයෙකු යුද භූමියේ ඇද වැටුනු විට අපි ඔහු පිළිබඳව කටකතා පතුරවමු, නැතහොත් ඔහුව අත්හැර දමමු. එහෙත් ඒ වෙනුවට අප කළ යුත්තේ ආත්මිකව තුවාළ ලත් අය බේරාගෙන අපගේ ශක්තියෙන් ඔහුව වට කිරීම වේ. දෙවියන්වහන්සේගේ බල ඇණි එක් පෙරමුණක් ලෙස ඉදිරියට යා යුතුය. තුවාළ වූ භටයන් මිය යෑමට මග දෙපස දමා ඉබාගාතේ ඉදිරියට නොයා යුතුය.

අප සටන් කරන්නේ අපගේම නාමයෙන් නොවේ. අප සටන් කරන්නේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්ස්ගේ නාමයෙනි. අප සටන් කරන්නේ අප වෙනුවෙන් නොවේ. අප සටන් කරන්නේ අපගේ ආත්මික ජාතිය වු දේව රාජ්‍යය වෙනුවෙනි.

## කීකරුකම :

ස්වභාවික ලෝකයේ සෙබලෙක් යුද භූමියේදී හිතු මතේ ක්‍රියා නොකරයි. ඔහු අණදෙන නිලධාරියාගේ නියෝග පිළිපදියි. සම්පූර්ණයෙන්ම කීකරු වීම අවශ්‍යය. යුද්ධයේදී කීකරුවීම තරම් වැදගත් වෙනත් දෙයක් නොමැත. ආත්මික ක්‍ෂේත්‍රයේද මෙය සත්‍යයකි. ඔබ ආත්මික සටනින් සාර්ථක වීමට නම් ඔබගේ අණදෙන නිලධාරියාගේ උපදෙස් අනුගමනය කළ යුතුය. ඔබ උන්වහන්සේට සම්පූර්ණයෙන්ම කීකරු විය යුතුය.

## ධෛර්යය :

ස්වභාවික ලෝකයේ ශ්‍රේෂ්ඨ ජෙනරාල්වරයෙක් වරක් මෙසේ පැවසීම. "ඔබ වෙඩි පහරට ලක්වීමට බිය නම්, පටන් ගැනීමට පෙර ඔබ පහර කනු ඇත.... මිනිසුන් වැඩිදනෙක්ම මැරෙන්නේ බිය නිසාය". ආත්මික සටනින් අසාර්ථක වනු ඇතැයි සිතා බිය නොවන්න. සතුරා විසින් ඔබට වෙඩිතබනු ඇතැයි කියා බියවුවහොත් ඔබ පටන් ගැනීමට පෙර ම පරාජය වී ඇත.

මෙම නිර්භීත ජෙනරාල්වරයා මෙසේද පවසා ඇත. "මිනිසා පරාජය බාර නොගන්නේ නම් ඔහුව කිසි දිනෙක පරාජය කළ නොහැකිය. අපි භූමියේදී පරාජය වීමට ප්‍රථම සිතෙන් පරාජය වන්නෙමු. කිසිදු ජාතියක් එහි සෙනග පරාජය බාර ගන්නා තෙක් පරාජය වී නැත. "

ස්වභාවික ලෝකයේ මෙන්ම, ඔබ පරාජය බාර ගැනීමට අකමැති නම් කිසි විටෙකත් පරාජය කළ නොහැකිය. ආත්මික සටන් පරාජය වන්නේ පළමුව මනසිනි. පරාජය බාර ගැනීම ඔබ මනසින් ප්‍රතික්ෂේප කරන්න.

## නායකත්වය පරාජය කිරීම :

එක් ශ්‍රේෂ්ඨ ජෙනරාල්වරයෙක් නිතරම ප්‍රකාශ කළේ තමාට උසස්ම සතුරු නායකයා සමග සටන් කළ හැකි අතර ඉන් ජයගන්නා තැනැත්තා යුද්ධය ජයගන්නා බවය. මෙය අපගේ අණ දෙන නිලධාරී තැනැන්වහන්සේ විසින් ආත්මික ලෝකයේ දැනටමත් කර තිබේ. තම මරණයෙන් හා නැවත නැගිටීමෙන් යේසුස්වහන්සේ සතුරාගේ බලය පරාජය කළ සේක. සටනේ අවසාන ප්‍රතිඵලය දැනටමත් දේව වචනයෙන් එළිදරව් වී ඇත. එහෙත් කැරලිකරුවෝ තවමත් මෙම භූමියේ

ප්‍රතිරෝධය දක්වති. යේසුස්වහන්සේ නායකත්වය දැනටමත් පරාජය කර ඇත. එහෙත් සතුරාගේ කුඩා කණ්ඩායම් පරාජය කිරීමේ කාර්යය අපට පවරා ඇත

**කැපවීම :**

කැපවීම ගැන ප්‍රසිද්ධ ජෙනරාල්වරයෙකු මෙසේ පවසා ඇත.

> "අපි වාසනාවන්ත මනුෂ්‍යයෝ වෙමු. අපි යුද්ධ කරමින් සිටින්නෙමු. යම් දෙයක් වෙනුවෙන් සටන් කර මිය යාමේ අවස්ථාව අපට ලැබී ඇත. බොහෝ දෙනෙකුට මෙවැනි අවස්ථාවක් ලැබෙන්නේ නැත. කිසිදු තේරුමක් නොමැතිව ජීවත් වී මිය ගිය බොහෝ දුප්පතුන් ගැන සිතන්න. මුළු ජීවිත කාලයම ගත කළේ කෑමට, නිදාගැනීම හා වැඩට යෑමට මිස වෙන කිසි දෙයක් සඳහා නොවේ"

ඇදහිලිවන්තයන් ලෙස අපි ආත්මික ලෝකයේ සටන් කරන්නෙමු. යම් දෙයක් වෙනුවෙන් සටන් කර මියයෑමේ අවස්ථාව අපට ඇත. අප අපගේ ජීවිතය ඒකාකාරව, කමින්, නිදා ගනිමින් හා වැඩ කරමින් ගත කළ යුතු නැත. අප සටන් කරන්නේ අවසානයක් නොදකින රාජ්‍යයක් වෙනුවෙනි. අප සටන් කරන්නේ දැනටමත් සතුරු බලවේග පරාජය කර ඇති අණදෙන නිලධාරියෙකු වෙනුවෙනි. අපගේ ජයග්‍රහණය ස්ථිරය. අපට ජීවත්වීමට, සටන් කිරීමට හා කැඳවීමක් ලදහොත් මිය යෑමට යම් අගනා දෙයක් ඇත.

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ගත් ප්‍රධාන පදය ලියන්න.

2. යහපත් හා නපුරු ආත්මික බලවේග අතර ගැටුම විස්තර කිරීමට නිදසුනක් ලෙස යුද්ධය ගෙන ඇත්තේ මන්ද?

3. ඔබ මෙම පාඩමෙන් උගත් ආත්මික සටනට අදාළ කළ හැකි ස්වභාවික සටන් මූල ධර්ම සාරාංශගත කරන්න.

යුද්ධය පිළිබඳ අර්ථ විග්‍රහය
යුද්ධ කාලයේ ජීවන රටාව
යුද්ධයේ අරමුණ
මූලික පුහුණුව
ප්‍රචාරය කිරීම
තානාපති යෝජනා
බුද්ධිය
පහරදීමේ හා ආරක්ෂක යුද සටන්ක්‍රම
යුද්ධායුධ
හදිසි පහරදීම්
තීරණාත්මක සටන්
සන්නිවේදනය
ඉලක්ක
ප්‍රහාර හා ප්‍රතිප්‍රහාර
චලනය වීම
සහයෝගය
කීකරුකම
ධෛර්යය
නායකත්වය පරාජය කිරීම
කැපවීම

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. ආත්මික ලෝකයේ යුද්ධයේ අරමුණු පිළිබඳව වැඩිදුර ඉගෙනීම සඳහා මෙම කොටස් කියවන්න.
   මතෙව් 28:18-20, මාක් 16:15-18, ක්‍රියා 1:8, එපීස 3:9-11 හා කොලොස්සි 1:24-29. මෙම ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න.

අපගේ අරමුණු නියම කර ඇත්තේ කවරෙක්ද?

___

අපගේ ප්‍රදේශයේ සහාසහභාගිත්වය සඳහා දී ඇති අරමුණු කවරේද?

___

ඔබට පෞද්ගලිකවම දී ඇති අරමුණු කවරේද?

___

2. ආත්මික ලෝකයේ යුද්ධය පිළිබඳ මූලධර්ම හා සමාන්තර යුද්ධය පිළිබඳ ස්වභාවික මූලධර්ම ඉගෙනීම පමණක් ප්‍රමණාවත් නොවේ. මේ මූලධර්ම ඔබගේ ආත්මික සටන්වලදී ව්‍යවහාර කළ යුතුය. ව්‍යවහාර නොකෙරන දැනුම ඵල රහිතය. මෙම පරිච්ජේදයේ ඔබ උගත් දේ නැවත බලන්න. ඉන්පසු ඔබ උගත් ස්වභාවික මූලධර්ම ඔබගේ ආත්මික සටන්වලදී ව්‍යවහාර කිරීමට සැලසුම් කරන්නේ කෙසේද යන්න පිළිබඳව සාරාංශයක් එක් ජේදයකින් ලියන්න.

# ආක්‍රමණය කිරීම

## යුදමය කලාපයකට ඇතුළු වීම

ස්වභාවික ලෝකයේ ආක්‍රමණයකදී හමුදාවක් යුදමය කලාපයකට ඇතුළු වන්නේ ඔවුන්ගේ සතුරන් යටත් කර එම ප්‍රදේශය අල්ලා ගැනීමටය. උගත් දේ ක්‍රියාවට නොනඟන්නේ නම් මූලික පුහුණුවෙන් පලක් නැත. ආයුධ සන්නද්ධ යුද්ධයට කැඳ වූ හමුදාව වුවද අක්‍රියව අයිනකට වී සිටින්නේ නම් ඉන් පලක් නොවේ. යුද්ධයකදී ඵලදායි වීමට නම් ඔබ සැබවින්ම යුදමය කලාපයට ඇතුළු විය යුතුය.

# දහහතරවන පරිච්ඡේදය

## යුදමය කලාපයට ඇතුළු වීම :
## ලෝකය, මාංශය හා යක්ෂයා සමග සටන් කිරීම

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "උපක්‍රමය" යන වචනය අර්ථවිග්‍රහය කිරීමට
- "ප්‍රති උපක්‍රමය" යන වචනය අර්ථවිග්‍රහ කිරීමට
- ලෝකයේ හා මාංශයේ නපුරු බලවේග එකට සම්බන්ධ කෙරෙන සාතන්ගේ උපක්‍රම පැහැදිලි කිරීමට
- ලෝකයාත් මාංශයත් ජයගැනීම සඳහා ඇති ප්‍රති උපක්‍රම හඳුනාගැනීමට හැකිවනු ඇත

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **මින්මතු අපි පාපයට සේවය නොකරන ලෙස පාප ශරීරය නැතිවන පිණිස, අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසන ලද බව දන්මුව, මක්නිසාද මැරුණාවූ තැනැත්තේ පාපය ගැන නිර්දෝෂකරනු ලැබ සිටියි. (රෝම 6:6-7)**

### හැඳින්වීම

ඔබට ආයුධ ගන්නා ලෙස කරන ලද කැඳවීමට එකඟ වී ඇති අතර දෙවියන්වහන්සේ හමුදාවට බඳවා ගෙන ඇත. ඔබ සතුරාගේ බල ප්‍රදේශ හා උපක්‍රම ගැන උගත්තෙහිය. ඔබ දෙවියන්වහන්සේගේ සටන් සැලැස්ම අධ්‍යයනය කළ අතර දැන් ආක්‍රමණශීලි හා ආරක්ෂක ආයුධ මගින් සන්නද්ධ වී ඇත. මෙම පාඩමෙන් ඔබ යුද කලාපයට ඇතුළු වී සටන ආරම්භ කරනු ඇත.

සාතන්ගේ රැවටිලිකාර උපාය මාර්ග පරාජය කිරීම සඳහා, ඔහුගේ උපක්‍රම හා ශුද්ධ ලියවිලි ප්‍රතිඋපක්‍රම කෙරෙහි අවධානය යොමු කෙරෙන පාඩම් මාලාවක පළමුවැන්න මෙම පරිච්ඡේදය වේ. "උපක්‍රම" යනු හමුදාමය මෙහෙයුම් සැලසුම් කරන හා ක්‍රියාත්මක කරන විද්‍යාවය. ඒවා ජයග්‍රහණය කරගෙන යන ක්‍රම හෝ සැලසුම් හෝ වේ.

**සාතන්ගේ උපක්‍රම :**

සාතන් ඇදහිලිවතුන් පරදවා ජය ගන්නා ක්‍රම සංවිධානය කර ඇත. යක්ෂයාගේ "උපාය" යන්න වෙත පාවුලු තුමා යොමු කරන විට ඔහු අදහස් කරන්නේ එය වේ.

> **යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන්වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගන්න. (එපීස 6:11)**

"උපාය" යන වචනයේ තේරුම ප්‍රයෝගකාර හෝ රැවටිලිකාර යන්නය. සාතන්ගේ "උපායයන්" ප්‍රයෝගකාර, රැවටිලිකාර පහර දෙනු උපක්‍රම වේ.

**දෙවියන්වහන්සේගේ ප්‍රතිඋපක්‍රම :**

සාතන්ගේ ප්‍රහාරවලට මුහුණ දෙන විට ඇදහිලිවන්තයන්ව අනාරක්ෂිතව තනිකර නැත. ආත්මික සටන සඳහා උපක්‍රම අත්පොතක් දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ ලිඛිත වචනයෙන් සපයා ඇත.

> **ක්‍රිස්තුස්වහන්සේ ඉදිරියෙහි නුඹලා උදෙසාය. මක්නිසාද ඔහුගේ උපායවල් අප විසින් නොදැන සිටිනවා නොවේ. (2 කොරින්ති 2:11)**

මෙහි "උපාය" යන්නෙහි තේරුම සිතුවිලි හෝ පරමාර්ථය යන්න වේ. සතුරාගේ සියලු බලය පරාජය කළ හැකි ප්‍රති උපක්‍රම බයිබලයේ ඇත.

"ප්‍රති" යන වචනයෙහි තේරුම "විරුද්ධව ක්‍රියා කිරීම, බාධා කිරීම, පරාජය කිරිම හෝ බලාපොරොත්තු කඩ කිරීම" වේ. ආත්මික ලෝකයේ ප්‍රති උපක්‍රමය යනු සාතන්ට එරෙහි සංවිධානාත්ම සැලැස්මක් හෝ ක්‍රමයක් හෝ වේ. එය සැලසුම් කර ඇත්තේ සතුරාගේ "උපාය" හෝ "උපක්‍රම" වලට බාධා ඇති කිරීමට, පරාජය කිරීමට හෝ බලාපොරොත්තු කඩ කිරීමටය.

ඊළඟ පරිච්ඡේද කිපය සංවිධානය කර ඇත්තේ උපක්‍රම හා ප්‍රතිඋපක්‍රම සඳහා වේ. සෑම පරිච්ඡේදයකටම මුල් කොටසේ ආත්මික සටනේ සුවිශේෂී ක්‍ෂෙත්‍ර පිළිබඳව සාකච්ඡා කර ඇත. ඉන්පසු ජයග්‍රහණය ලබා ගැනීම සඳහා සුවිශේෂී ප්‍රති උපක්‍රම ඉදිරිපත් කෙරේ. මෙම පාඩමෙන් ඔබ අධ්‍යයනය කරනු ලබන්නේ ආත්මික සටනේදී ලෝකයාත් මාංශයත් එකට ක්‍රියා කරන ආකාරය හා මෙම නපුරු බලවේග පරාජය කිරීමට භාවිත කළ හැකි ප්‍රති උපක්‍රම පිළිබඳවය.

## සාතන්ගේ උපක්‍රම : ලෝකය හා මාංශය

ලෝකයාත් මාංශයත් සතුරු බලප්‍රදේශ බව ඔබ සත්වැනි පරිච්ඡේදයෙන් උගත්තෙහිය.

**සාතන් ක්‍රියා කරන්නේ ලෝකය තුළිනි :**

> **අපි දෙවියන්වහන්සේගෙන් වන බවද මුළු ලෝකයා නපුරා තුළ බවද දනිමුව.**
> **(1 යොහන් 5:19)**

මෙම ලෝකයේ අධිපතියා සාතන් වන අතර ඔහු අධිපති බැවින් රජයයන් කෙරෙහි බලපෑම් ඇති කිරීමට ඔහුට පුළුවන. "ජාතීන් මුළාකරන්නා" ලෙස එළිදරව් 20:3 හා 8 හි ඔහු හැඳින්වේ. දානියෙල්ගේ යාච්ඤාව වැළැක්වීම සඳහා පර්සියාවේ ක්‍රියාකරන යක්ෂ
බලවේගයක්, දානියෙල් 10 පරිච්ඡේදයෙන් හඳුන්වා දී ඇත. සාතන් ලෝකයේ ගොරවන සිංහයෙකි.

> **සිහි ඇතිව, අවදිව ඉඳිල්ලා. නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. (1 පේතෘස් 5:8)**

ගොරවන සිංහයෙකුගේ පින්තූරයකින් පැහැදිලි කරන්නේ සාතන් විසින් භාවිත කරන විවෘත උපායයන්ය. එහෙත් "ආලෝකයේ දූතයෙකු" ලෙසද සාතන්ව විස්තර කර ඇත.

**මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත්නම් ඒක පුදුමයක් නොවේ., ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය. (2 කොරින්ති 11:14-15)**

මෙහි සාතන්ව විස්තර කෙරෙන්නේ ඉතා සූක්ෂම ලෙස අභියාචනා කරන හා රහසින් පහර දෙන සිත් ඇදගන්නා සුළු කෙනෙකු ලෙසය. එබැවින් සාතන් විවෘතවත්, රහසිගත ලෙසත් මේ ලෝකයේ ක්‍රියා කරයි.

මෙලොව සාතන්ගේ ක්‍රියාකාරකම් විවිධය. එහෙත් ඒ සියල්ල දෙවියන්වහන්සේටත්, උන් වහන්සේගේ සැලසුම්වලටත් හා උන්වහන්සේ සෙනගටත් එරෙහිව යොමු කර ඇත. සාතන් මෙලොව කරනු ලබන දෙවියන්වහන්සේගේ වැඩවලට විරුද්ධය. මෙය, ඔබ දැනටමත් උගත් ඔහුගේ කැරැල්ලෙන් හා ස්වර්ගයෙන් වැටීමෙන් පැහැදිලිය (එස. 28:12-19). සාතන්, යේසුස් වහන්සේගේ මෙලොව වැඩවලටද විරුද්ධය. ඔහු මෙලොව පවතින "ක්‍රිස්තු විරෝධී" ආත්ම පසුපස සිටී.

**මක්නිසාද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාංසයෙන් යුක්තව එන බව ඒත්තු නොගන්නාවූ බොහෝ රැවටිලිකාරයෝ ලෝකයට පැමිණ සිටිති. රවටන්නාද විරුද්ධ ක්‍රිස්තුස්ද මොහුය. (2 යොහන් 7)**

සාතන්, මෙලොව කෙරෙන ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩවලටද විරුද්ධය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ එක් පරමාර්ථයක් වන්නේ දේව වචනයේ සත්‍යයන්ට පුරුෂයන් හා ස්ත්‍රීන් මගපෙන්වීමට වේ. සාතන් උත්සාහ කරන්නේ මනුෂ්‍යයන්ගේ හදවත් හා ජීවිත කෙරෙහි දේව වචනයෙන් සිදුවන බලපෑම් නැති කිරීමට වේ.

**නොඇදහිලිකාරවූ ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ ස්වරූපය වූ ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ ශුභාරංචි ආලෝකය නොබැබළෙන පිණිස, මේ ලෝකයේ දෙවියා ඔවුන්ගේ සිත් අන්ධකළේය. (2 කොරින්ති 4:4)**

සාතන්, මේ ලෝකයේ සිටින ඇදහිලිවතුන්ට පීඩා ගෙන දෙමින් පරීක්ෂාවනට ලක් කරයි.

**මේ නිසා මටත් තවත් ඉවසාගන්ට නොහැකිව, පරීක්ෂකයා යම් අන්දමකින් නුඹලාව පරීක්ෂා කිරීමෙන් අපේ වීර්ය හිස්වුණාදෝ කියා නුඹලාගේ ඇදහිල්ල ගැන දැනගන්නා පිණිස එව්වෙමි. (1 තෙසලෝනික 3:5)**

**එවිට ස්වාමින්වහන්සේ සාතන්ට කථාකොට: බලව, ඔහුට ඇති සියල්ල නුඹේ අත යටතේය, නුමුත් ඔහුට විරුද්ධව නම් නුඹේ අත දිගු නොකරන්නැයි කීසේක. සාතන් ස්වාමින්වහන්සේ ඉදිරියෙන් පිටතට ගියේය. (යෝබ් 1:12)**

"උස් තැන්වල ආත්මික දුෂ්ටකම්" තුළින් සාතන් ලෝකයා රවටවයි. ඔහු ලෝකයේ ආගමික ව්‍යුහල ක්‍රියා කරන්නේ නම් මේ අයුරිනි. ඔහු ව්‍යාජ ධර්ම, සේවාවන්, ගුරුවරුන්, අපෝස්තුළුවරුන් හා ආගම් ඇසුරෙන් මිනිසුන් රවටයි.

එමෙන්ම සාතන් මේ ලෝකයේ සිටින එහෙත් මෙලොවට අයත් නොවන ඇදහිලිවතුන්ට එරෙහිවද සටන් කරයි. ඔබට මේ පිළිබඳව එපීස 6:10-18 න් කියවිය හැකිය. සාතන් ඇදහිලිවතුන්ට චෝදනා කර අපහාස කරයි.

**මුළු ලෝකයා රවටන්නා වන යක්ෂයාය. සාතන්යයි කියන ලද මහා සර්පයා නමැති ඒ පුරාණ සර්පයා පහතට හෙළනු ලැබුවේය, ඔහු පොළොවට හෙළනු ලැබුවේය, ඔහුගේ දූතයෝද ඔහු සමඟ හෙළනු ලැබුවෝය. එවිට: අපගේ දෙවියන්වහන්සේගේ ගැළවීමද බලයද රාජ්‍යයද තමන් ක්‍රිස්තුස්වහන්සේගේ ආණ්ඩු බලයද දැන් පැමුණුණේය. මක්නිසාද අපගේ දෙවියන් වහන්සේ ඉදිරිපිට රෑ දවල් අපේ සහෝදරයන්ට වරදතබන්නාවූ, ඔවුන්ගේ වරද තබන්නා පහත හෙළනු ලැබුවේය. (එළිදරව් 12:9-10)**

ඔහු ඇදහිලිවතුන්ගේ සිත් තුළ අවිශ්වාසය පැල කරයි. මෙය, ඒදන් උද්‍යානයේදී මිනිසා මුහුණ දුන් පළමු පරීක්ෂාවේ කොටසකි (උත්. 3:1-5 බලන්න)

සාතන් ලෝකය මගින් ඇදහිලිවතුන්ට පීඩා කිරීමට පොළඹවයි.

**නුඹ විඳින්ට යන දේවලට භය නොවන්න. බලව නුඹලා විමසනු ලබන පිණිස යක්ෂයා නුඹලාගෙන් සමහර දෙනෙකුන් හිරගෙයි දමන්ට යන්නේය, නුඹලා දස දවසක් පීඩා විඳින්නහුය. මරණය දක්වා විශ්වාසව සිටපන්න. එවිට මම ජීවනයේ ඔටුන්න නුඹට දෙන්නෙමි. (එළිදරව් 2:10)**

එලදායි කිතුනු සේවයක් කිරීමෙන් ඇදහිලිවතුන් වළකාලීමට සාතන් උත්සාහ කරයි.

**මක්නිසාද අපි, එනම් පාවුල් යන මම, වරක් දෙවරක් නුඹලා වෙතට එන්ට කැමතිව සිටියෙමි, නුමුත් සාතන් අපට බාධාකළේය. (1 තෙසලෝනික 2:18)**

ඇදහිලිවතුන් පාපයට පෙළඹවීමට ලෝකයේ ඇති ආකර්ෂණභාවය සාතන් භාවිත කරයි. ඔහු ලෞකික වාතාවරණය, වටපිටාව, හා ඔබ වටා ඇති පද්ධති මගින් ඔබව පරීක්ෂා කරයි. ලෝකයට ඇලුම් කිරීමට ඔහු ඔබගේ සිත දිරිමත් කරයි.

**ලෝකයටවත් ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේමනොකරන්න, යමෙක් ලෝකයාට ප්‍රේමකෙරේ නම්, පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල, එනම්, මාංසයේ තෘෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ. (1 යොහන් 2:15-16)**

සාතන් ඇදහිලිවතුන්ගේ සිතට, දිවට, ආත්මයට, ශරීරයට හා ආත්මික පවුරුවලට එරෙහිව සටන් කරයි. ඔහු පාවුල් හා ඇසුරු කරන්නන්, මුදල් හා අවස්ථාවන් ඇසුරෙන් පහර දෙයි. ඔබ පහරදීමට ලක්වන මෙම සෑම සුවිශේෂී ක්ෂේත්‍රයන් පිළිබඳවම වැඩි දුරටත් අනෙක් පරිච්ජේද වලින් ඉගෙන ගන්නවා ඇත.

සාතන්ගේ නම් වලින්ද ඔහුගේ මෙලොව උපක්‍රම එළිදරව් වේ. ඔබ මෙම පාඨමාලාවේ පස්වන පරිච්ජේදයෙන් මේ නම් අධ්‍යයනය කෙළෙහිය. මේවා නැවත බලා, මේ සෑම නමකින්ම සාතන්ගේ වර්තමාන උපක්‍රම පෙන්වන අයුරු මෙනෙහි කරන්න.

## සාතන්, මාංශය තුළින් ක්‍රියා කරයි :

මිනිසෙකුගේ ශරීරය, ප්‍රාණය හා ආත්මය එකිනෙකාට සමීප සම්බන්ධතාවක් දක්වයි. මේ නිසා සාතන් ආත්මයට ප්‍රවේශ වන්නේ මාංශය තුළිනි. මේ උපක්‍රමය මිනිසාගේ පළමු පරීක්ෂාව තුළින් පෙන්නුම් කෙරේ. ඒව, “ඒ ගහ කෑමට හොඳ බවද එය **ඇස්වලට ප්‍රිය උපදවන** බවද නුවණ ලැබීම සඳහා **ආශාවිය** යුතු ගහක් බවද **දැක**” ඉන් ගෙඩියක් ගෙන කැවාය, ඇගේ ස්වාමි පුරුෂයාටද ගෙඩියක් දුන්නාය (උත් 3:6). සාතන් මාංශික හැඟීම් හා ආශාවන් ඒවගේ ආත්මය තුළට පිවිසීමට භාවිත කළේය.

සාතන්ට, ඔබ ශුභාරංචියේ සත්‍යය පිළිගැනීම වළක්වාලීමට “ඔබගේ සිත බැඳ තැබිය” නොහැකි වුවා නම්. ඔබ ශුභාරංචිය පිළිගත් පසු ඔබව මාංශයට වහල් කිරීමට ඔහු උත්සාහ කරයි. මාංශික තෘෂ්ණාවෙන් ආත්මයට එරෙහිව සටන් කරයි.

**ප්‍රේමවන්තයෙනි, නුඹලා ආගන්තුකයන්ද විදේශීන්ද මෙන්, ආත්මයට විරුද්ධව යුද්ධකරන මාංසික තෘෂ්ණාවලින් වැලකී සිටින ලෙස නුඹලාගෙන් ඉල්ලමි. (1 පේත්‍රැස් 2:11)**

මනසට බලපෑම් කිරීම සඳහා සාතන් මාංශය යොදා ගනී.

**නුමුත් මාගේ සිතේ ව්‍යවස්ථාවට විරුද්ධව යුද්ධකරන්නාවූ, මාගේ අවයව තුළ තිබෙන පාපයාගේ ව්‍යවස්ථාව යටතෙහි මා වහල්කමට පමුණුවන්නාවූ අන්‍ය ව්‍යවස්ථාවක් මාගේ අවයව තුළ තිබෙන බව මට පෙනේ. (රෝම 7:23)**

“මාගේ අවයව” යන්නෙන් අදහස් වන්නේ මාංශය වේ. ආත්මයට බලපෑම් කිරීමට සාතන් මාංශය යොදා ගනී.

**එබැවින්. ප්‍රේමවන්තයෙනි, මේ පොරොන්දු අපට තිබෙන නිසා, මාංසයේද ආත්මයේද සියලු කිලුටුකම්වලින් අපව පවිත්‍ර කරගනිමින්, දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව, ශුද්ධකම සම්පූර්ණකරගනිමු. (2 කොරින්ති 7:1)**

සාතන්, මාංශය භාවිත කර ඔබට ඔබේ ජීවිතයේ දූෂණය (කුණුවීමේ හා හිතුවක්කාරකම්) නෙළා ගැනීමට සලස්වයි.

**ඒ හැටියට තමාගේ මාංසය සඳහා වපුරන්නා මාංසයෙන් කුණුවීම කපාගන්නේය. ආත්මයාණන්වහන්සේ සඳහා වපුරන්නා ආත්මයාණන්වහන්සේ ගෙන් සදාකාල ජීවනය කපාගන්නේය. (ගලාති 6:8)**

පැරණි මිනිසා හා අලුත් මිනිසා හා සම්බන්ධව මාංශයේ පාප ගැන පාවුළුතුමා එපීස 4 හි සඳහන් කර ඇති අතර ඔහු මෙම අනතුරු ඇඟවීම ඇතුළත් කර ඇත.

**යක්ෂයාට ඉඩ නොදෙන්න. (එපීස 4:27)**

මෙම අනතුරු ඇඟවීමෙන් පෙනී යන්නේ ඔබ මෙම මාංශික පාපයන් හි නියැලුනු විට ඔබ, ඔබගේ ජීවිතයේ තැනක් (වචනාර්ථයෙන් ඉල්ලීමක්) සාතන්ට දෙන බවය. අඛණ්ඩව තම කැමැත්තෙන්ම මාංශික පාපයන්ට ඉඩ දෙන විට එහි ප්‍රතිඵලය විය හැක්කේ සාතන්ට වහල් වීමට වේ.

**ඔහුගේ මලපතෙන් මිදෙන පිණිසද, දෙවියන්වහන්සේ ඔවුන්ට පසුතැවිල්ල දෙනසේක්දෝයි බලමින් මෘදුකමින් ඔවුන්ට තරවටු කරන්ට ඕනෑය. (2 තිමෝති 2:26)**

### සාතන් යක්ෂයන් තුළින් ක්‍රියා කරයි :

ඔබ මෙම පාඩමාලාවෙන් පසුව ඉගෙන ගන්නා පරිදි, නැවත උත්පාදනය ලැබූ ඇදහිලිවන්තයෙකුට ඔහු සැබෑ ඇදහිලිවන්තයෙකුව සිටින තාක් කල් සාතන් “ආවේශ” විය නොහැකිය. සාතන් ආවේශ වූ විට හෙවත් ආරුඪ වූ විට ශරීරය, ආත්මය, චර්යාව හා සිතුවිලි වල පාලනය ඊට අයත්ය. එහෙත් ඇදහිලිවන්තයෙකු මාංශික පාපයේ අඛණ්ඩව නියැලුනහොත් එය මාංශික පාපයේ සිට සාතන්ගේ හා යක්ෂයන්ගේ ක්‍රියාකාරකම් මගින් පාපය පාලනය කිරීම තෙක් යා හැකිය.

## ඔවුන් එක්සත්ව ක්‍රියා කරන ආකාරය

ලෝකය, මාංශය හා යක්ෂයා ඔහුගේ යක්ෂආත්ම, ඇදහිලිවතුන්ට එරෙහිව සටන් කිරීම සඳහා ඔවුන්ගේ නපුරු බලවේග එකට සම්බන්ධ කර ගනී. මේ සෑම බලයකටම ඇදහිලිවතුන්ට එරෙහිව තනිව ක්‍රියා කළ හැකිය. එහෙත් මේ නපුරු බලවේග බොහෝ අවසථාවල ඇදහිලිවතුන්ට පහර දීමට එකට එක්වේ.

සාතන් මාංශයට පිවිසීම සඳහා මායාවන්, වශීකරණයන් දර්ශනයක් හා අභක්තික ක්‍රියාවන් සමග ලෝකය භාවිත කරයි. ඔහු මනසට හා ආත්මයට පිවිසීමට මාංශය භාවිත කරයි. ඉන්පසු ඔහු, ඔබ දෙවියන්වහන්සේට නොව ලෝකයට කීකරුවීමට සැලැස්වීමට උත්සාහ කරයි.

### ආත්මික ප්‍රති උපක්‍රම : මාංශය ජයගැනීම

සැබවින්ම ලෝකයාත්, මාංශයත් යක්ෂයාත් තර්ජනාත්මක යුද කලාපයක් නිර්මාණය කරයි. එහෙත් එම බලවේග ජයග්‍රහණය කිරීමට බලවත් ශුද්ධ ලියවිලි ප්‍රති උපක්‍රම මෙහි දැක්වේ.

### ඔබගේ ශරීරය යාගයක් කොට ඔප්පු කරන්න :

ස්වභාවික ලෝකයේ හමුදාවට බැඳෙන කෙනෙක්, ඔහුගේ උසස් නිලධාරීන්ගේ පාලනයට සම්පූර්ණයෙන්ම යටත් වේ. ඔහු හැසිරිය යුතු අකාරය, ඇඳ-පැළඳිය යුතු ආකාරය හා සතුරා සමග ගැටෙන ආකාරය පිළිබඳව ඔවුහු උපදෙස් දෙති. ආත්මික සටනේදී ඵලදායි වීමටද මේ ආකාරයේම පාලනයක් තිබිය යුතුය.

**එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයත් ජීවමානවූ, ශුද්ධවූ දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතුවූ සම්පූර්ණ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙන්න. (රෝම 12:1-2)**

ඔබ දෙවියන්වහන්සේ වෙතට ඉදිරිපත් විය යුත්තේ ඔබේම කැමැත්තෙනි. පැරණි ගිවිසුමේ දෙවියන්වහන්සේට පූජාවක් ඔප්පු කළ පසු, එය පූජා කළ තැනැත්තාට තව දුරටත් එහි පාලනයක් නොතිබිණි. එය සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේට දුන් දෙයකි. ලෝකයේ හා මාංශයේ ආකාරයට සමාන නොවී ඔබගේ සිත් අලුත් කර ගැනීමෙන් ඔබ අන්‍යාකාර (වෙනස්) විය යුතුය. මනසෙහි සටන පිළිබඳව ඔබ තව දුරටත් පසළොස්වන පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නවා ඇත.

## ඔබ, ක්‍රිස්තුස්වහන්සේගේ මනසින් සන්නද්ධ කර ගන්න :

ඔබ මනස අලුත් කරගනු ලබන්නේ යේසුස්වහන්සේට සමාන මනසකින් "සන්නද්ධ" වීමෙනි.

**ඉතින් ක්‍රිස්තුස්වහන්සේ මාංසයෙන් (අප උදෙසා) වදවින්ද බැවින්, මාංසයේ ඉතිරිව තිබෙන කාලයෙහි තවත් මනුෂ්‍යයන්ගේ තෘෂ්ණා ලෙස නොව, දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ජීවත්වෙන පිණිස එම සිත ආයුධයක් කොට පැළඳගන්න. මක්නිසාද මාංසයෙන් වධවින්ද තැනැත්තෝ පාපයෙන් නිදහස්වී සිටියි. (1 පේත්‍රුස් 4:1-2)**

## ඔබගේ මාංශය කෙරෙහි නිවැරදි ආකල්පයක් ගොඩනගා ගන්න :

"මාංසය කරණකොටගෙන කැලැල් වූ වස්ත්‍රයට පවා ද්වේෂ කරන්න" (යුදස් 23) යයි අපට පවසා තිබේ. මාංශයේ තෘෂ්ණාවන් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් බව ඔබ අවබෝධ කර ගත යුතුය.

**මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල, එනම්, මාංසයේ තෘෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ. (1 යොහන් 2:16)**

අපට මාංශය තුළ විශ්වාසයක් නැත.

**මක්නිසාද චර්මඡේදිතයෝ නම් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන නමස්කාරකරන්නාවූ, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ පාරට්ටුකරගන්නාවූ, මාංසය තුළ විස්වාසයක් නැත්තාවූ අපිය. (පිලිප්පි 3:3)**

මාංශයේ ජීවිතය දූෂිත බවත්, ආත්මයේ ජීවිතය ජීවනය ගෙනෙන බවත් ඔබ අවබෝධ කරගත යුතුය.

**ඒ හැටියට තමාගේ මාංසය සඳහා වපුරාන්නා මාංසයෙන් කුණුවීම කපාගන්නේය. ආත්මයාණන්වහන්සේ සඳහා වපුරන්නා ආත්මයාණන්වහන්සේගෙන් සදාකල ජීවනය කපාගන්නේය. (ගලාති 6:8)**

## ඔබ මාංශයට වහල් විය යුතු නැති බව පිළිගන්න :

පසුගිය කාලයේ, ඔබ පව්කාරයෙකුව සිටියදී ඔබ මාංශයට වහල්ව සිටියේය.

**ඔවුන් අතරේ අප සියල්ලෝද වරක් අපේ මාංසයේ තෘෂ්ණාවල හැසිරෙමින්, මාංසයටත් සිතටත් කැමතිදේ කරමින් ස්වභාවෙන් අනික් අය මෙන් උදහසේ දරුවෝව සිටියෙමුව. (එපීස 2:3)**

**මක්නිසාද අප මාංසයෙහි සිටියදී ව්‍යවස්ථාවෙන්වූ පාප තෘෂ්ණා මරණයට ඵල උපදවනවා පිණිස අපේ අවයව තුළ ක්‍රියාකළේය. නුමුත් අපි යමකට බැඳී සිටියෙමුද, ඊට නැසී,**

**ව්‍යවස්ථාවෙන් නිදහස් කරනලදුව, පදාර්ථයේ පැරණි ආකාරයෙන් නොව ආත්මයේ අලුත් ආකාරයෙන් සේවය කරමුව. (රෝම 7:5-6)**

එපීස 2 හා රෝම 8 යන පරිච්ඡේද අධ්‍යයනය කරන්න. ඔබ තවදුරටත් මාංශයට වහල්ව සිටිය යුතු නැති බව ඔබ සොයා ගන්නවා ඇත. ඔබගේ නිදහස ලැබෙන්නේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළිනි.

**මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස්කළාය. (රෝම 8:2)**

## කීකරු වීමට ඔබගේ මාංශය පුහුණු කරන්න :

යුදමය ලෝකයේ සෙබලෙකු සියලු අණට කීකරු විය යුතුය. යුද්ධයේ නීති ඉගෙනීමට ඔහු මූලික පුහුණුවක් ලබයි. ඔහුට මේ උපක්‍රම ක්‍රියාවට නැංවීමට පුහුණු වන අවස්ථාවේදී ඉඩ සලසයි. ඔහු ඉගෙන ගන්නේ සාර්ථකවීම් හා අසාර්ථක වීම් තුළිනි. ඔහු යුද්ධය සඳහා පුහුණු වෙයි.

ආත්මික ලෝකයේද මෙය සත්‍යයකි. ඔබ ඔබගේ මාංශය කීකරු වීමට පුහුණු කළ යුතුය. ඔබ දෙවියන්වහන්සේගේ නීති උගත යුතුය. පරීක්ෂාවන් තුළින් මෙම නීති ක්‍රියාවට නැංවීමේ අවස්ථා දෙවියන්වහන්සේ ඔබට ලබා දෙන සේක.

**ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධවෙන්නාක් මෙන් පුදුම නොවෙන්න.**
**(1 පේත්‍රුස් 4:12)**

**එවිට ස්වාමීන්වහන්සේ සාතන්ට කථා කොට බලව, ඔහුට ඇති සියල්ල නුඹේ අත යටතේය. නුමුත් ඔහුට විරුද්ධව නම් නුඹේ අත දිගු නොකරන්නැයි කී සේක. සාතන් ස්වාමීන්වහන්සේ ඉදිරියෙන් පිටතට ගියේය. (යෝබ් 1:12)**

ස්වභාවික ලෝකයේ හමුදාමය උපක්‍රමවලදී සෙබලෙකු හරි හා වැරදි ප්‍රතිචාර ඉගෙන ගන්නේ නැවත නැවත කෙරෙන යුද්ධ හමුදා අභ්‍යාස වලිනි. ඔබගේ යුද්ධය පිළිබඳ අත්පොත වන බයිබලය අධ්‍යයනය කිරීමෙන් ඔබට පුහුණුව ලබාගත හැකිය. ඔබගේ ආත්මික ඉන්ද්‍රියන් පුහුණු කර විට හෝ අභ්‍යාසයේ යෙදෙන විට, හොඳ හා නරක අතර වෙනස නිර්ණය කිරීමට ඔබ ඉගෙන ගන්නෙහිය.

**ඉතින් කිරි බොන සෑම දෙනාම ළදරුවන් බැවින් ඔවුහු ධර්මිෂ්ඨකමේ වචනය ගැන අසමර්ථව සිටිති. නුමුත් දෘඪ ආහාර ඕනෑවන්නේ යහපත සහ අයහපත විමසා බලන්ට ව්‍යවහාරයෙන් පුරුදු පුහුණුවූ ඉන්ද්‍රියයන් ඇති සම්පූර්ණවූ තැනැත්තන්ටය.**
**(හෙබ්‍රෙව් 5:13-14)**

ඔබ දේව වචනයට කීකරු වීමට පුහුණු විය යුතුය. ඔබ මාංශයට අවනත වීමෙන් එය පරාජය කරන්නේ නැත. දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේ මාංශික ක්ෂේත්‍ර එළිදරව් කරන විට ඔබ ක්‍රියා මාර්ග ගත යුතුය.

**එබැවින්, ප්‍රේමවන්තෙයෙනි, මේ පොරොන්දු අපට තිබෙන නිසා, මාංසයේද, ආත්මයේද සියලු කිලුටුකම්වලින් අපම පවිත්‍රකර ගනිමින්, දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව, ශුද්ධකම සම්පූර්ණකරගනිමු. (2 කොරින්ති 7:1)**

**නුමුත් තෘෂ්ණා පූර්ණකරන පිණිස මාංසයට පංගාඩමක් නොකොට, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැළඳගන්න. (රෝම 13:14)**

**ඔබ** ක්‍රියා මාර්ග ගත යුතු බව මතක තබාගන්න. **ඔබ** මාංශික තෘෂ්ණාවලින් වැළකී සිටිය යුතුය. **ඔබම** මාංශයේ අපවිත්‍ර දේවලින් පිරිසිදු විය යුතුය. **ඔබ** මාංශයට ඉඩ නොදිය යුතුය.

## පරණ මනුෂ්‍යයා පහකරන්න :

“පරණ මනුෂ්‍යයා” යන්නෙන් අදහස් වන්නේ මාංශික ස්වභාවයට වේ. පාවුලු තුමා මෙසේ ලියයි.

**(එසේ ඉගෙනගත්තේ) නුඹලාගේ ජීවිතයේ පළමු හැසිරීම ලෙස, රැවටිල්ලේ තෘෂ්ණාවල් අනුව දූෂ්‍යවන්නාවූ පරණ මනුෂ්‍යයා පහකර දමා නුඹලා නුඹලාගේ චින්තාත්මයෙන් අලුත් කරනු ලැබ, සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද ශුද්ධකමින්ද දෙවියන්වහන්සේට සමානව මවන ලද්දාවූ අලුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය. (එපීස 4:22-24)**

## ඔබගේ මාංශය මරා දමන්න :

මාංශය කුරුසිපත් කළ යුතුය. එය ස්වාභාවික මරණයකින් මැරෙන්නේ නැත. ඔබ එය කුරුසි පත් කළ යුත්තේ එමගින් පාලනය වීමට ප්‍රතික්ෂේප කිරීමෙනි.

**මින්මතු අපි පාපයට සේවය නොකරන ලෙස පාප ශරීරය නැතිවන පිණිස, අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසන ලද බව දනිමුව. මක්නිසාද මැරුණාවූ තැනැත්තේ පාපය ගැන නිර්දෝෂකරනු ලැබ සිටියි. (රෝම 6:6-7)**

**මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි, එසේ වී නුමුත් මම ජීවත්වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත් වන ජීවිතය මට ප්‍රේම කළාවූ මා උදෙසා තමන්ම පාවාදුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි. (ගලාති 2:20)**

**තවද ක්‍රිස්තුස්වහන්සේට අයිති තැනැත්තෝ මාංසය එහි ආශා සහ තෘෂ්ණා සමඟ කුරුසියෙහි ඇණගැසුවෝය. (ගලාති 5:24)**

## ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරෙන්න :

ඔබගේ දෛනික හැසිරීම (ඔබ ජීවත්වන ආකාරය) ඔබගේ මාංශය හෝ ලෝකය හො යක්ෂ බලවේග හෝ මගින්, ඔබ ඉඩ දුනහොත්, සාතන්ට පාලනය කළ හැකිය. ඔබ ලෝකය හෝ මාංශය හෝ යක්ෂයා හෝ විසින් පාලනය කළ යුතු නැත. ඔබ ආත්මයාණන්වහන්සේ තුල ගමන් කිරීමට ඉගෙන ගත හැක.

**නුමුත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරෙන්න, එවිට නුඹලා මාංසයේ තෘෂ්ණා සම්පූර්ණ කරන්නේ නැතැයි කියමි. (ගලාති 5:16)**

**අපි ආත්මයාණන්වහන්සේ කරණකොට ජීවත් වෙමු නම් ආත්මයාණන්වහන්සේ කරණකොට හැසිරෙමු. නිෂ්ඵල පාරට්ටු නොකරමු. එකිනෙකා කෝප නොකරමු. එකිනෙකාට ඊර්ෂ්‍යා නොවෙමු. (ගලාති 5:25)**

ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරීම යනුවෙන් අදහස් වන්නේ, ඔබගේ ජීවිතය හා චර්යාව දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මය විසින් පාලනය කරනු ලැබීම වේ. මාංශය ආත්මයට වඩා බලවත් නැත. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ඔබ තුළ ක්‍රියා කිරීමට ඔබ ඉඩහැරිය විට මරණයට පත්වන මාංශය සහිත ඔබගේ ශරීරය උන්වහන්සේ ජීවත් කරවන සේක. මෙහිදී "ජීවත් කරවීම" යන්නෙන් අදහස් කෙරෙන්නේ ඔබට ජීවනය පැවරීම වේ. ඔබ පාපයේ මරණයේ ජීවත් විය යුතු නැත. ඔබගේ ආත්මය අලුත් ජීවිතයකින් ජීවත් කරවීමට දෙවියන් වහන්සේට පුළුවන.

**ඉඳින් ක්‍රිස්තුස් වහන්සේ නුඹලා තුළ සිටින සේක් නම්. පාපය නිසා ශරීරය මැරී තිබෙන නුමුත් ධර්මිෂ්ඨකම නිසා ආත්මය ජීවත් වෙයි. තවද යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන සේක් නම්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනන්වහන්සේ නුඹලා තුළෙහි වසන තමන්ගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ මරණීය ශරීරයන්ද ජීවත්කරන සේක. එබැවින් සහෝදරයෙනි, අපි ණයකාරයෝව සිටිමුව, නුමුත් මාංසික ලෙස ජීවත් වෙන්ට මාංසයට නොවේය. මක්නිසාද නුඹලා මාංසික ලෙස ජීවත්වෙනවා නම් මැරෙන්ට ඕනෑය, නුමුත් ආත්මයෙන් ශරීරයේ ක්‍රියා නසනවා නම් ජීවත්වෙනවා ඇත. මක්නිසාද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. (රෝම 8:10-14)**

ආත්මයාණන්වහන්සේ විසින් ගෙන යනු ලබන පිණිස ඔබ තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ තිබිය යුතුය. ඔබ ආත්මය කරණකොටගෙන නැවත ඉපදිය යුතුය.

> **මාංසයෙන් උපදින දේ මාංසයය. ආත්මයාණන්ගෙන් උපදින දේ ආත්මයය. නුඹලා අලුතෙන් උපදින්ට ඕනැයයි මා කිවාට පුදුම නොවන්න. (යොහන් 3:6-7)**

ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණ වීම අවශ්‍යය. ආත්මයාණන්වහන්සේ තුළ හැසිරෙන්ට ඔබට බලය දෙන්නේ මාංශය නොව ශුද්ධාත්මයාණන්වහන්සේ වේ. ඇදහිලිවන්තයෙකු ගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය පිළිබඳ පූර්ණ පාඨමාලාවක් හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ ඇත. ඔබ මෙම ආයතනයේ පාඨමාලාවන් යෝජිත පිළිවෙලට අධ්‍යයනය කරන්නෙහි නම් මෙම අත්පොත අධ්‍යයනයෙන් පසු ඊළඟට ඔබට ලැබෙන්නේ එම පාඨමාලාව වේ. ලෝකයාත්, මාංශයත්, යක්ෂයාත් ජයගැනීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැදගත්කම අවධාරණය කිරීම අපට කළ හැකි දෙයක් නොවේ. මාංශය අනුව ගමන් කරනවා වෙනුවට ආත්මයන් අනුව ගමන් කල හැක්කේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළිනි.

## ඔබගේ ආත්මයට ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් කතා කිරීමට ඉඩ දෙන්න :

ඔබගේ ආත්මය හා සමග දෙවියන්වහන්සේ සන්නිවේදනය කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ තුළිනි.

> **මක්නිසාද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබෙන යම් පමණ දෙනෙක් ඇද්ද එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. (රෝම 8:14)**

එමෙන්ම ඔබගේ ආත්මයෙන් සෘජුවම දෙවියන්වහන්සේ හා සමග සන්නිවේදනය කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේට පුළුවන.

> **මක්නිසාද අන් භාෂාවකින් කථා කරන්නා මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේට කථාකරන්නෝය. ඔහු ආත්මයෙන් රහස් කථා කරන නුමුත් කාටවත් තේරෙන්නේ නැත.**
> (1 කොරින්ති 14:2)

ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් බව්තිස්මය ලැබූ බව පෙන්වන සාක්ෂියක් වූ නොදන්නා භාෂාවකින් ඔබ කතා කරන විට (ක්‍රියා 2) ඔබගේ ආත්මය සෘජුවම දෙවියන්වහන්සේ හා සමග සන්නිවේදනයේ යෙදෙයි. මෙය සිදුවන විට, ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැදගත් එක් කාර්යයක් වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි යාච්ඤා කිරීම වේ.

> **එලෙසම ආත්මයාණන්වහන්සේත් අපගේ දුර්වලකම් වලදී උපකාරකරනසේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව, නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගැම්වලින් අප උදෙසා මැදහත් කම්කරන සේක. ඒ ආත්මයාණන්වහන්සේ දෙවියන් වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන බැවින්, සිත් විමසන තැනැන්වහනසේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නා සේක. (රෝම 8:26-27)**

## ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵල වර්ධනය කරගන්න :

මාංශයේ ක්‍රියාවනට හාත්පසින්ම වෙනස් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වර්ධනය කරගන්න. පහත දැක්වෙන දේ එහි අන්තර්ගතය.

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත.** (ගලාති 5:22-23)

ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵල විස්තරාත්මකව හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *,ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය,* යන පාඨමාලාවේ සාකච්ඡා කර ඇත.

### දෝෂාරෝපණයෙන් යුතුව ජීවත් නොවන්න :

ඔබ දෝෂාරෝපණයෙන් යුතුව ජීවත්වීමට සැලැස්වීම සඳහා සාතන් මාංශයේ දුර්වලතාවන් භාවිත කරයි. එහෙත් පාවුලුතුමා මෙසේ පවසා ඇත :

> **එහෙයින් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නන්ට දැන් දඬුවමට පත් කිරීමක් නැත (රෝම 8:1)**

ඔබ අසාර්ථක වී මාංශික චර්යාවල නියුක්ත වුවහොත්, දෝෂාරෝපණය තුළ නොපවතින්න. පාශ්චාතාප වී කමාව අයදින්න.

> **අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහන් 1:9)**

## ආත්මික ප්‍රතිඋපක්‍රම : ලෝකය ජයගැනීම

ලෝකය ජයගැනීම සඳහා මාර්ගෝපදේශ කිපයක් පහත දැක්වේ.

### ලෝකයා වෙත සුදුසු ආකල්පයක් ගොඩනගා ගන්න.

ඔබ මේ ලෝකයේ නොවන බව හඳුනාගන්න :

> **මම ඔවුන්ට ඔබගේ වචනය දුනිමි. මා ලෝකයාට අයිති නැති ලෙසම ඔවුනුත් ලෝකයාට අයිති නැති නිසා ලෝකයා ඔවුන්ට වෛරවුණෝය, ඔබ ලෝකයෙන් ඔවුන් අහක්කරන පිණිස නොව, නපුරාගෙන් ඔවුන් ආරක්ෂාකරන පිණිස යාච්ඤාකරමි. මා ලෝකයෙන් නොවන්නාක් මෙන්ම ඔව්හුද ලෝකයෙන් නොවෙති. (යොහන් 17:14-16)**

> **ලෝකයා නුඹලාට වෛරවෙනවා නම්, නුඹලාට පළමුවෙන් මට වෛරවුණ බව නුඹලා දනිහුය. නුඹලා ලෝකයාට අයිති නම්, ලෝකයා තමුන්ගේම අයට ආදරේවන්නෝය. නුමුත් නුඹලා ලෝකයාගෙන් නොවන නිසාත් මා විසින් ලෝකයෙන් නුඹලා තෝරාගත් නිසාත් ලෝකයා නුඹලාට වෛරවෙති. (යොහාන් 15:18-19)**

ඔබ මේ ලෝකයේදී පීඩාවන් අත්දකින බව අවබෝධ කරගන්න

> **මා තුළ නුඹලාට සමාදානය තිබෙන පිණිස මේ දේවල් නුඹලාට කීවෙමි. ලෝකෙයෙහි නුඹලාට පීඩා තිබේ. නුමුත් ධෛර්යවත් වෙයන්න, මම ලෝකයෙන් ජය ගතිමියි කී සේක. (යොහන් 16:33)**

ජීවිතය නැතිවී ගොස් ලෝකයම ලබා ගත්තද ඉන් පලක් නැති බව අවබෝධ කරගන්න.

> **මක්නිසාද යම් මනුෂ්‍යයෙක් මුළු ලෝකය ලබාගත්තත් තමාගේ ජීවිතය නැති වී ගියොත් ඔහුට ඇති ප්‍රයෝජනය මොකද? (මාක් 8:36)**

> **මනුෂ්‍යයෙක් මුළු ලෝකය ලබා ගත්තත් තමාම නැති කරගත්තොත් නොහොත් විනාශ කරගත්තොත් ඔහුට මොන ලාභයක්ද? (ලූක් 9:25)**

ඔබ ලෝකයාට ප්‍රේම කරන්නේ නම්, ඔබ දෙවියන්වහන්සේගේ සතුරෙකු බව වටහා ගන්න.

> **ලෝකයටවත් ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේම නොකරන්න. යමෙක් ලෝකයට ප්‍රේම කෙරේ නම්, පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල, එනම්, මාංසයේ තෘෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන් වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ. (1 යොහන් 2:15-16)**

**කාමමිථ්‍යාචාරික තැනැත්තියෙනි, ලෝකය සමඟ මිත්‍රකම දෙවියන්වහන්සේට සතුරුකම බව නුඹලා දන්නේ නැද්ද? එබැවින් කවරෙක් නුමුත් ලෝකයට මිත්‍රවෙන්ට කැමැත්තේ නම්, ඔහු දෙවියන්වහන්සේට සතුරෙක් වන්නේය. (යාකොබ් 4:4)**

## ලෝකයේ තාවාකාලික ස්වභාවය හඳුනාගන්න

**ලෝකයාත් ලෝකයේ තෘෂ්ණාවත් පහව යන්නේය. නුමුත් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන්නා සදාකාලේටම පවතින්නේය. (1 යොහන් 2:17)**

**මේ ලෝකයේ භුක්ති විඳින්නෝ අධිකලෙස භුක්ති නොවිඳින්නන් මෙන්ද සිටිය යුත්තෝයයි කියමි. මක්නිසාද මේ ලෝකයේ අන්දම පහවෙවී යන්නේය. (1 කොරින්ති 7:31)**

**මේ සියල්ල මෙසේ නාස්තිවෙන්ට තිබෙන බැවින්, නුඹලා දෙවියන්වහන්සේගේ දවස පැමිණීම බලාසිටිමින්ද ඒ ගැන උනන්දුව ක්‍රියාකරමින්ද සියලු ආකාර ශුද්ධවූ හැසිරීමෙහිත් භක්තිවන්තකමෙහිත් කොයි ආකාර අයවල්ව සිටින්ට ඕනෑද? (2 පේත්‍රුස් 3:11)**

## ඔබ මේ ලෝකයාට වහල් නොමැති බව පිළිගන්න :

ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ ලෝක පද්ධතියට වහල් විය යුතු නැත. අතීතයේදී ඔබ වර්තමාන ලෝකය මගින් පාලනය කරනු ලැබුවද (එපීස 2:2) ඔබ තවදුරටත් එම වහල් බවේ නොසිටී.

**පෙර කාලයේ නුඹලා මේ ලෝකයේ ව්‍යවහාරය ලෙසත්, අකීකරුකමේ පුත්‍රයන් තුළ දැන් ක්‍රියාකරන්නාවූ ආත්මය වන ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියටත්, ඒවායෙහි හැසුරුණුහුය. ඔවුන් අතරේ අප සියල්ලෝද වරක් අපේ මාංසයේ තෘෂ්ණාවල හැසිරෙමින්, මාංසයටත් සිතටත් කැමති දේ කරමින්, ස්වභාවෙන් අනික් අයමෙන් උදහසේ දරුවෝව සිටියෙමුව.**
**නුමුත් වරක් දුර සිටියාවූ නුඹලා දැන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ උන්වහන්සේගේ ලේ කරණකොටගෙන ළංකරනු ලැබුවහුය.**
**ඒ නිසා නුඹලා තවත් විදේශිකයෝවත් ආගන්තුකයෝවත් නොව, ශුද්ධවන්තයන් සමඟ එක නුවර වැසියෝව, දෙවියන්වහන්සේගේ පවුලේ අයවලුන්ව සිටින්නාහුය. (එපීස 2:2-3, 13, 19)**

රෝම 12:1-3න් උගන්වන්නේ අප තවදුරටත් ලෝකයේ ආකාරයට සමාන නොවන බවය. ඔබ පරිවර්තනය (වෙනස්) විය හැකිය. ඔබ දැන් අලුත් රාජ්‍යයේ කොටස් කරුවෙකි. ඔබ දේව රාජ්‍යයේ වැසියෙකි. ඔබ තවදුරටත් ලෝකයේ බලය යටතේ නොසිටී.

**නුමුත් දෙවියන්වහන්සේ විසින් අපට දෙන ලද දේ අප විසින් දැනගන්නා පිණිස ලෝකයේ ආත්මය නොව දෙවියන්වහන්සේගෙන් වූ ආත්මය ලැබීමුව. (1 කොරින්ති 2:12)**

ඔබගේ නිදහස පිළිබඳව ගලාති 4:1-7න් වැඩිපුර අධ්‍යයනය කරන්න

## ලෝකයාගෙන් ආරක්ෂාවන්න :

දැන් ඔබ ලෝකයෙන් නිදහස් වී ඇති බැවින්, ඔබගේ ජීවිතයට ලෝකයාගෙන් සිදුවන බලපෑම් වලින් ආරක්ෂා වීමට වග බලා ගන්න. ලෝකයේ මූලික සිද්ධාන්ත හෝ මූලික කරුණු හෝ අනුව ඔබගේ ජීවන රටාව සකස් කර නොගන්න.

**ක්‍රිස්තුස්වහන්සේට එකඟ නැත්තාවූ මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝග වලත් ලෝකයේ ගුරුකම් වලත් ප්‍රකාරයට තිබෙන පණ්ඩිතකමද හිස්වූ රැවටිලිකාරකමද කරණකොටගෙන නුඹලා කොල්ලයක් කරගන්න කිසිවෙක් නොසිටින හැටියට බලාගන්න. (කොලොස්සි 2:8)**

ලෝකයාට ප්‍රේම නොකරන්න.

**ලෝකයටවත් ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේම නොකරන්න. යමකේ ලෝකයට ප්‍රේම කෙරේ නම්, පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. (1 යොහන් 2:15)**

ලෝකයේ දර්ශන මගින් ඔබ දූෂ්‍ය නොවීමට වගබලාගන්න.

**ක්‍රිස්තුස්වහන්සේට එකඟ නැත්තාවූ මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝග වලත් ලෝකයේ ගුරුකම් වලත් ප්‍රකාරයට තිබෙන පණ්ඩිතකමද, හිස්වූ රැවටිලිකාරකමද කරණකොටගෙන නුඹලා කොල්ලයත් කරගන්න කිසිවෙක් නොසිටින හැටියට බලාගන්න. (කොලොස්සි 2:8)**

ලෞකික තෘෂ්ණාවෙන් ප්‍රතික්ෂේප කරන්න.

**අභක්තිකකමද ලෞකික තෘෂ්ණාද එපාකර, ආශිර්වාදලත් බලාපොරොත්තුව ගැනත් මහෝත්තම දෙවියන්වහන්සේගේද අපගේ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේද තේජසේ ප්‍රකාශවීම ගැනත් බලාසිටිමින්. (තීතස් 2:12)**

ලෝකයේ දේවලින් කිලුටු නොවන ලෙස ආරක්ෂා වන්න.

**අපගේ පියවූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි පිරිසිදුවූ නොකිලිටුවූ භක්තිය නම්, මවු පියන් නැති දරුවන්ද වැන්දඹු ස්ත්‍රීන්ද ඔවුන්ගේ විපත්තියේදී බලාගැනීමත්, ලෝකයෙන් කිලුටු නොවන ලෙස තමාම ආරක්ෂා කරගැනීමත්ය. (යාකොබ් 1:27)**

ලෝකයේ බලය කුරුසිපත් කරන්න.

**නුමුත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ගැන මිස වෙන කිසි දෙයක් ගැන පාරට්ටු කරගන්ට මට නම් සිද්ධ නොවේවා : ඒ කරණ කොටගෙන ලෝකය මට ද, මා ලෝකයටද කුරුසියෙහි ඇණගසනු ලද්දේ විය. (ගලාති 6:14)**

කුරුසිගත කිරීම ස්වභාවික මරණයක් නොවේ. එසේම ඔබගේ ජීවිතයේ ඇති ලෝකයේ බලය, මාංශය ස්වභාවික මරණයකට පත්වන්නේ නැත. ඔබ එය බලෙන්ම කුරුසිපත් කළ යුතුය.

## ඔබට ලෝකය ජයගත හැකි බව අවබෝධ කරන්න :

ඔබ ලෝකයෙන් පරාජය විය යුතු නැත. ඔබගේ ජීවිතය තුළ ඇති වචනයේ ක්‍රියාවන් විනාශ කිරීමට ලෝකයේ ආපේක්ෂාවනට ඉඩ නොදෙන්න (මතෙව් 13:22, මාක් 4:19). ලෝකයේ අපේක්ෂාවන්ගෙන් සිදුවන මෙම "ක්ෂයවීම" ක්‍රිස්තුවිරෝධි ආත්මයේ එක් උපක්‍රමයකි (දානියෙල් 7:25). යේසුස්වහන්සේ මෙසේ පවසා ඇත.

**මා තුළ නුඹලාට සමාදානය තිබෙන පිණිස මේ දේවල් නුඹලාට කීවෙමි. ලෝකයෙහි නුඹලාට පීඩා තිබේ. නුමුත් ධෛර්යවත්වෙන්න, මම ලෝකයෙන් ජයගනිමියි කී සේක. (යොහන් 16:33)**

ඔබ තුළ යේසුස්වහන්සේ ජීවත්වන නිසා ඔබට ලෝකය ජයගත හැකිය.

**මාගේ ප්‍රිය දරුවෙනි, නුඹලා දෙවියන්වහන්සේට අයිතිව, ලෝකයෙහි සිටින තැනැත්තාට වඩා නුඹලා තුළ සිටින තැනැන්වහන්සේ උතුම් බැවින්, නුඹලා ඔවුන්ගෙන් ජයගෙන සිටින්නෝය. ඔවුහු ලෝකයෙන් වෙති. (1 යොහන් 4:4)**

ඔබට ලෝකයේ තිබෙන දූෂ්‍යකමෙන් ගැළවීමට පුළුවන.

**ඒ කරණකොටගෙන උන්වහන්සේ තමන් අනර්ඝ වූ ඉතා උතුම්වූ පොරොන්දු අපට දී තිබේ, එසේ කළේ තෘෂ්ණාව නිසා ලෝකයේ තිබෙන දූෂ්‍යකමෙන් නුඹලා ගැළවී, ඒ පොරොන්දු කරණකොටගෙන දේව ස්වභාවට පංගුකාරයන් වන පිණිසය. (2 පේත්‍රැස් 1:4)**

ඔබ ලෝකය ජයගන්නේ අලුත් උපතින් හා ඔබගේ ඇදහිල්ලෙනි.

**මක්නිසාද දෙවියන්වහන්සේගෙන් උපන් යමක් ඇද්ද එය ලෝකයෙන් ජයගන්නේය. ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය. (1 යොහන් 5:4)**

**ඔබ ලෝකය ජයගන්නේ යේසුස්වහන්සේගේ ලේවලින් හා ඔබගේ සාක්ෂියෙනි :**

> **ඔවුහු බැටළුපැටවාණන්ගේ ලේ නිසාද තමුන්ගේ සාක්ෂියේ වචනය නිසාද ඔහුගෙන් ජයගත්තෝය, ඔවුහු මරණය විඳින තරමට පවා තමුන්ගේ ජීවිතයට ප්‍රේම නොකර සිටියෝය. (එළිදරව් 12:11)**

**මේ ලෝකයේ ඔබගේ මෙහෙය අවබෝධ කරගන්න :**

ඔබට ලෝකයෙන් බලපෑම් ඇති නොවිය යුතුය. ඔබ ලෝකයට බලපෑම් කළ යුතුය. ඇදහිලිවන්තයෙකු දෙවියන්වහන්සේගේ මහිමය විදහා පාමින් හා ශුභාරංචියේ ශුභ පණිවුඩ බෙදා ගනිමින් අඳුරු ලෝකයට ආලෝකයක් විය යුතුය.

> **නුඹලා ලෝකයේ ආලෝකයය. (මතෙව් 5:14)**

ලෝකයා කෙරෙහි මුල් ඇදහිලිවතුන්ගේ බලපෑම් කොතරම්ද යත් ඔවුන් "ලෝකය පෙරළුවාවූ අය" ලෙස හඳුන්වනු ලැබීය (ක්‍රියා 17:6)

විදේශ රටක සේවය කිරීමට යවනු ලැබූ හමුදාවක සොල්දාදුවන් මෙන්, ඇදහිලිවන්තයෝද මේ ලෝකයේ දෙවියන්වහන්සේගේ විශේෂ මෙහෙයක යෙදෙන්නෝ වෙති. ඔවුන්ට මෙසේ උපදෙස් දී ඇත.

> **උන්වහන්සේ ඔවුන්ට කියන සේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන්න. (මාක් 16:15)**

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. "උපක්‍රමය" යන වචනය අර්ථවිග්‍රහ කරන්න.

3. "ප්‍රතිඋපක්‍රම" යන වචනය අර්ථවිග්‍රහ කරන්න.

4. ලෝකයේ හා මාංශයේ සාතන්ගේ උපක්‍රම පිලිබඳව ඔබ උගත් දෑ සාරාංශගත කරන්න.

5. ලෝකයාත්, මාංශයාත්, යක්ෂයාත් පරාජය කිරීමට භාවිත කරන මෙම පරිච්ජේදයේදී ඇති ප්‍රති උපක්‍රම සාරාංශගත කරන්න.

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. කුරුසිපත් කර මරණු ලැබීම ඉතාමත් දරුණු ක්‍රමයක් විය. කුරුසියේ ආණගසනු ලැබීම ගැන මතෙව් 27න් කියවන්න. ආත්මිකව බලනකල ඇදහිලිවතුන්ට එරෙහිව ක්‍රියා කරන නපුරේ බල වේග වූ ලෝකයටත් මාංශයටත් කළ යුත්තේ මෙය වේ.

2. ඔබගේ ජීවිතයත් සේවයත් විමසා බලන්න. ලෝකයේ මාංශයේ හා යක්ෂයාගේ බලපෑම් ඇත්තේ කුමණ ක්ෂේත්‍රවලද? මේ ගැටලුවට මෙම පාඩමෙන් ඔබ උගත් දේ යොදා ගන්නේ කෙසේද?

3. දානියෙල් 7:25 අධ්‍යයනය කරන්න. ක්‍රිස්තු විරෝධීන් භාවිත කරන එක් ප්‍රධාන උපක්‍රමයක් නම් ලෝකයේ අපේක්ෂාවන් ගෙවී යන්නට සැලැස්වීමය. මේවා වෙහෙස ගෙන දෙන හා කුපිත කරවන කුඩා අවස්ථාවන් වන අතර, ඔබ ආත්මික දේවල නොව ලෞකික දේවල පැටලී ඒවායින් පරාජය වන තෙක් සාතන් මේවා එකින් එක ගොඩ නගයි. ඔබගේ ජීවිතයේත් මෙවන් දේ සිදුවේද? සාර්ථක භටයන් ලෝකයේ දේවල පැටලෙන්නේ නැති බව මතක තබා ගන්න. ලෝකයේ දේවල් කෙරෙහි අඩුවෙන් සම්බන්ධ විය හැක්කේ කෙසේදැයි සිතා බලා ඒ ගැන යාච්ඤා කරන්න.

4. කිතුනු ජීවිතය බයිබලය මෙසේ විස්තර කරයි :

- ජයගන්නාවූ ජීවිතයක් : රෝම 8:37
- ජය දෙන්නාවූ ජීවිතයක් : 1 කොරින්ති 15:57
- අධික ලෙස ලැබෙන ජීවිතයක් : යොහන් 10:10
- ජයට පමුණුවන්නාවූ ජීවිතයක් : 2 කොරින්ති 2:14
- ශුද්ධවන්ත ජිවිතයක් : එපීස : 1:3-5, 5:25-27, 1 පේතෘස් 1:13-16

කිතුනු හැසිරීම අඛණ්ඩව ඇගයිය යුතු පරමාදර්ශී තත්ත්වයන් මේවාය. මෙම ක්‍ෂේත්‍රවල පාවුලු තුමාගේ පෞද්ගලික අරගල බයිබලය වාර්තා කර ඇත. (පිලිප්පි 3:12-17, යාකොබ් 1:2-4, හෙබ්‍රෙව් 12:10-16)

පාපය (1 කොරින්ති. 5:1-5, 11:30-32, 1 යොහන් 2:1-2), ලෝකය (2 තිමෝති 4:10) හෝ යක්ෂ බලපෑම් (ක්‍රියා 5:1-10, 1 තිමෝති 5:9-15, 3:6-7) සමග කිතුනුවෙකු පොර බැදුවද ඔහු තවමත් ඇදහිලිවන්තයෙකු බව මතක තබා ගන්න.

5. එපීස 4:22 හා 25 පාවුලු තුමා, පහකර දැමිය යුතු පරණ මිනිසා හා පැළඳගත යුතු අලුත් මිනිසා ගැන කතා කරයි. එපීස 4:22-6:18 කියවන්න. "පහකර දැමිය යුතු" ඒවායේ ලැයිස්තුවක් පිළියෙල කරන්න. එමෙන්ම "පැළඳගත යුතු" ඒවා (එනම් ආකල්ප, චර්යාව ආදිය) ලයිස්තු

**පහකර දැමිය යුතු ඒවා** **පැළඳගත යුතු ඒවා**

# පහළොස්වන පරිච්ඡේදය

## මනස තුළ කෙරෙන සටන

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආත්මික සටනේ ප්‍රධාන යුද්ධ භූමිය හඳුනාගැනීමට
- සාතන්ගේ “ගිනිහෙල්ල” යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- මනසට පහරදීම සඳහා සාතන් භාවිත කරන මානසික උපක්‍රම තේරුම් ගැනීමට
- මෙම සාතන්ගේ “ගිනිහෙල්ලයන්” නිවාදැමීමේ ප්‍රති උපක්‍රම භාවිත කිරීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **මක්නිසාද අපි මාංසයෙහි හැසිරෙන නුමුත් මාංසයේ හැටියට යුද්ධ නොකරමුව, (මක්නිසාද අපේ යුද්ධායුධ මාංසික නොවේය. එහෙත් ඒවා බලකොටු බිඳ හෙළීමට දෙවියන්වහන්සේ ඉදිරිපිට බල සම්පන්නය) අපි විවාදයන්ද දෙවියන්වහන්සේ ගැන දැනගැනීමට විරුද්ධව උසස්වන්නාවූ සියලු උසස් දේවල්ද බිඳහෙලා, සියලු සිතිවිලි ක්‍රිස්තුස්වහන්සේට කීකරුවීමට වහල්කරදෙමුව. (2 කොරින්ති 10:3-5)**

## හැඳින්වීම

යක්ෂයාගේ “කපටිකම්” ගැන නොදැන නොසිටින ලෙස පාවුලුතුමා කොරින්තිවරුන්ට අනතුරු ඇඟවීය. මෙහි “කපටිකම” සඳහා ඇති ග්‍රීක් වචනයේ තේරුම “උපාය මාර්ග” වන අතර එය “මනස” යන්නට භාවිත කරන වචනයම වේ. මින් අදහස් වන්නේ සාතන්ගේ ප්‍රාථමික ප්‍රහාර එල්ල වන්නේ අපගේ සිතිවිලි හා ජිවිතයට බවය. ආත්මික සටනේ ප්‍රධාන යුධ භූමිය මනස වේ. සාතන්ගේ සියලුම පහරදීම් සිදුවන්නේ මනුෂ්‍ය මනසේය.

මෙම පරිච්ඡේදයෙන් අවධාරණය කෙරෙන්නේ මනස වෙනුවෙන් කරන සටන පිළිබඳවය. එහි සාතන්ගේ උපක්‍රම සාකච්ඡා කරන අතර ඔහුගේ ප්‍රහාරයන්ගෙන් ජය ගැනීමේ ආත්මික ප්‍රති උපක්‍රමද සඳහන් කර ඇත. මනස සඳහා සටන මෙසේ සාරාංශගත කළ හැකිය.

> **මාංසයේ ඇල්ම මරණයය, නුමුත් ආත්මයේ ඇල්ම ජීවනය හා සමාදානයය. කුමක් හෙයින්ද, මාංසයේ ඇල්ම දෙවියන්වහන්සේට සතුරුකමය. ඒක දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට යටත් නැත, යටත්වෙන්ටත් බැරිය. (රෝම 8:6-7)**

සාතන්ට අවශ්‍ය ඔබගේ මනස මාංශයට (පාපි, ලෞකික, මාංශික) ඇලුම් කරවීමටය. එහෙත් දෙවියන්වහන්සේට අවශ්‍ය ඔබට ආත්මික මනසක් දීමටය.

## සාතන් මනසට පහර දෙන්නේ මන්ද

ශ්‍රේෂ්ඨතම ආඥාවේ නුඹගේ මුළු බුද්ධියෙන් දෙවියන්වහන්සේට ප්‍රේම කරන්න යන්න අන්තර්ගත වේ. සාතන්, ඔබගේ මනස වෙනුවෙන් සටන් කිරීමේ එක් ප්‍රධාන හේතුවක් මෙය වේ.

> **උන්වහන්සේ ඔහුට කථාකොට: නුඹේ මුළු හෘදයෙන්ද නුඹේ මුළු ආත්මයෙන්ද නුඹේ මුළු බුද්ධියෙන්ද නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට ප්‍රේමකරව. මේක උතුම්වූ පළමුවෙනිවූ ආඥාවය (මතෙව් 22:37-38)**

සාතන් ඔබගේ මනස වෙනුවෙන් සටන් කරන්නේ එය ආත්මික ලෙස ඉතා සමීපව ඔබගේ හදවතට හා මුඛයට බැඳී ඇති බැවිනි.

> **නුමුත් කටින් පිටවෙන දේ නික්මෙන්නේ සිතින්ය, මනුෂ්‍යයා අපවිත්‍ර වෙන්නේ එයින්ය. මක්නිසාද නපුරු සිතුවිලි, මිනීමැරුම්, කාමමිථ්‍යාචාරකම්, වේශ්‍යකම්, සොරකම්, බොරු සාක්ෂිකීම් සහ අපහාස කිරීම් සිතින් නික්මෙන්නේය. (මතෙව් 15:18-19)**

සාතන් ඔබගේ මනස වෙනුවෙන් සටන් කරන්නේ ඔබ ක්‍රියා කරන්නේ ඔබ සිතන ආකාරයට බැවිනි.

> **මක්නිසාද තමාගේ සිතෙන් ගණන්ගන්නා ලෙසම ඔහු වන්නේය. (හිතෝපදේශ 23:7)**

සාතන් ඔබගේ මනස පාලනය කළහොත් ඔබගේ ශරීරයත්. ඔබගේ ක්‍රියාවනුත් එමෙන්ම අභියෝගයක් එල්ල නුවුවහොත් ඔබගේ ආත්මයත් පාලනය කළ හැකි බව සාතන් දනී.

## සතුරා එල්ල කරන ගිනිහෙල්ලයන්

පැරණි ගිවිසුම් යුගයේ යුද්ධායුධයක් ලෙස ගිනි හෙල්ල භාවිත කර ඇත. ඒවා කුහර සහිත බටගස් වූ අතර පහසුවෙන් දැවෙන ද්‍රව්‍යවලින් කුහරය පුරවා තිබිණි. ඉන්පසු ඒවාට ගිනි දල්වා දුන්නක ආධාරයෙන් විදිනු ලැබීය. පවුරු සහිත නගරවලට මේවා විශිෂ්ඨ ආයුධවිය. හේතුව ඒවා පවුරට ඉහළින්, නගරය තුළ ඇති අතු සෙවිලි කළ නිවෙස්වලට එල්ල කළ විට ඒවා ගිනිගෙන දැවෙන බැවිනි.

සාතන් සමග කෙරෙන ආත්මික සටන පාවුලු තුමා එපිස 6:11-17 හි සාකච්ඡා කර ඇත. එහි ඔහු "සතුරාගේ ගිනිහෙල්ල" ගැන කතා කරයි. ආත්මික ලෝකයේ සතුරා නිරන්තරයෙන්ම ඔබ වෙත "ගිනිහෙල්ල" එවනු ලබයි. මේ බොහෝ හෙල්ලයන්, එල්ල කරනු ලබන්නේ මනසට වේ.

"සිතින් චංචල නොවන" ලෙස (2 තෙසලෝනික 2:2) ප්‍රේරිතවූ පාවුල් තුමා ඔබට අවවාද කරයි. "චංචල" යන වචනයේ ග්‍රීක් පරිවර්තනයෙන් අදහස් කෙරෙන්නේ "කළබල වීම, කරදර කිරීම, විනාශ කිරීම සඳහා පෙරළා දැමීම" වේ. ඔබට යමක් අතට ගෙන එය සෙලවිය හැකිනම් ඔබට ඒ කෙරෙහි පාලනයක් ඇත. සාතන්ට ඔබව "චංචල කිරීමට" නැතහොත් ඔබගේ මනස පාලනය කිරීමට අවශ්‍යය.

## සාතන්ගේ උපක්‍රම : මනසේ සිදුවන සටන්

මනස මනුෂ්‍ය ශරීරයේ ඉතාමත් සංකීර්ණ හා අවම වශයෙන් අවබෝධ කරගෙන ඇති ඉන්ද්‍රියකි. එය එතරම්ම සංකීර්ණ නිසා මනසට ප්‍රහාර එල්ල කිරීමේ සූක්ෂම ක්‍රම බොහෝමයක් සාතන්ට ඇත. ඒ සියල්ල කෙසේවත් ලැයිස්තුගත කළ නොහැකි වුවද මෙහි සඳහන් ලැයිස්තුව මනස හා සමග කෙරෙන සටනේදී සාතන් භාවිත කරන උපක්‍රම වේ.

### දෙවියන්වහන්සේගේ අධිකාරී බලය ප්‍රශ්න කිරීම :

මිනිසාගේ ප්‍රථම පරීක්ෂාව ආරම්භවූයේ මනසෙහි වේ. එය ආරම්භ වූයේ මෙම උපක්‍රමය භාවිතයෙනි. එනම් දෙවියන්වහන්සේගේ අධිකාරීබලය ප්‍රශ්න කිරීමෙනි. "ඇත්තටම දෙවියන්වහන්සේ කීවාද?... යහපත හා නපුර දැනගන්නා ගසෙන් කන්ට එපාය කියා දෙවියන්වහන්සේ සැබවින්ම පැවසුවේද?" දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ වචනය ප්‍රශ්න කිරීමෙන් ඔබට සැකය, අවිශ්වාසය හා සංශයවාදය වෙත ගෙන යනු ලබයි.

### රැවටීම හා දූෂ්‍යකිරීම :

රැවටිල්ලද සතුරාගේ උපක්‍රමවලින් කොටසකි. සාතන් ඒව අභිමුඛයට එනවිට ඔහු ලස්සන සර්පයෙකු ලෙස වෙස්වලාගෙන සිටියේය. සාතන් මිනිසුන් මිලියන ගණනක් රැවටීම සඳහා බොරුව, වැරදි ඇදහිම් ක්‍රම හා " ආගමික ආත්ම " භාවිත කරයි. සාතන් භාවිත කරන ඇතැම් රැවටීම් පහත දැක්වේ.

- "ඔබට දෙවිකෙනෙක් විය හැක"
- "ඔබට අනාගතය දැන ගත හැකිය "
- "සදාතනය ඇතුළුව ඔබගේ අනාගතය කළින්ම තිරණය කර ඇත." ඒ පිළිබඳව ඔබට කළ හැකි දෙයක් නැත.
- "සෑම කෙනෙක්ම දෙවියන්වහන්සේගේ දරුවෙකි"
- "ස්වර්ගයට යෑමට යේසුස්වහන්සේ තුලින් හැර වෙනත් බොහෝ මාර්ග ඇත"
- "දෙවියන්වහන්සේ එතරම්ම යහපත් බැවින් කිසිම කෙනෙකු නිරයට යවන්නේ නැත"
- "දෙවියන්වහන්සේ ඔබෙන් බලාපොරොත්තුවෙන එකම දෙය ඔබට හැකි පමණින් යහපත් ජිවිතයක් ගතකිරීම වේ"
- "බයිබලය වචනාර්ථයෙන් පිළිගත යුතු නැත"
- "බයිබලයේ බොහෝ වැරදි තිබේ"

සාතන්ගේ දුෂ්‍ය කෙරෙන ආත්ම, දේවවචනයේ සත්‍යය විකෘති කිරීමට මනසට පහර දෙයි.

> **එහෙත් පසු කාලවලදී සමහරු මුළා කරවන ආත්මයන්ද යක්ෂයන්ගේ ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලි ලෙස කියනසේක. (1 තිමෝති 4:1)**

සාතන් යේසුස්වහන්සේට මෙසේ පහර දුන් බව ලූක් 4:9-12 හි සඳහන් වේ. යේසුස්වහන්සේව දේවමාළිගාවේ මුදුනේ සිට බිමට පැන්නවීමට සාතන් උත්සාහ කළේ දෙවියන්වහන්සේගේ මෙම පොරොන්දුව නිසාය:

> **මක්නිසාද, ඔබ ආරක්ෂාකරන පිණිස උන්වහන්සේ තමන්ගේ දූතයන්ට ඔබ ගැන අණදෙනසේක කියාත්, ඔබගේ පය යම් හෙයකින් ගලක නොවදින පිණිස ඔව්හු අත් පිට ඔබ උසුලාගන්නෝය කියාත් ලියා තිබේයයි උන්වහන්සේට කීවේය. (ලූක් 4:10-11)**

**මාංශය :**

මාංශය, නපුරු ආත්මික බලවේගයක් ලෙස ඔබ කලින් උගත්තෙහිය. මනසට එරෙහිව සටන් කිරීම සඳහා සාතන් මාංශය යොදා ගනී.

> **නුමුත් මාගේ සිතේ ව්‍යවස්ථාවට විරුද්ධව යුද්ධකරන්නාවූ, මාගේ අවයව තුළ තිබෙන පාපයාගේ ව්‍යවස්ථාව යටතෙහි මා වහල්කමට පමුණුවන්නාවූ අන්‍ය ව්‍යවස්ථාවක් මාගේ අවයව තුළ තිබෙන බව මට පෙනේ. (රෝම 7:23)**

සාතන් ඔබේම මුඛය, දෙනෙත්,කන් හා ස්පර්ශය හා සුවඳ, දැනීම වැනි සංවේදිතාවන් ඔබගේ සිත තුළ නපුරු සිතිවිලි පෝෂණය කිරීමට භාවිත කරයි.

## නොඇදහිලිවතුන්ගේ මනස් අන්ධකිරීම :

> **නොඇදහිලිකාරවූ ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ ස්වරූපයවූ ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ ශුභාරංචි ආලෝකය නොබැබළෙන පිණිස, මේ ලෝකයේ දෙවියා ඔවුන්ගේ සිත් අන්ධකළේය. (2 කොරින්ති 4:4)**

**දොම්නස :**

දොම්නසට පත්වීම යනු දුක් වීම, අධෛර්යයට පත්වීම, හෝ බෙලහින ආත්මයකින් සිටීම වේ. ඊට බලාපොරොත්තු රහිත බව, කලකිරුණු ස්වාභාවය හා සියල්ල එපාවීමද ඇතුළත් වේ. දොම්නස, සිය දිවි නසා ගැනීමේ සිතිවිලිවලට මෙන්ම සැබවින්ම සියදිවි නසා ගැනීමටද හේතුවේ. ඊට හේතුව එමගින් පාලනය කළ නොහැකි මානසික ශෝකයක්, කණගාටුවක්, සිත්තැවුලක් හා ඇඩීමක් ඇතිකල හැකි බැවිනි.

ඇතැම්විට දොම්නස ගෙන ඒමට ජිවිතයේම අවස්ථාවන් සාතන් යොදා ගනී. නිදසුනක් ලෙස බලවත් හානියක් හෝ හානිවීමේ බියක්, මැඩ පවත්වාගත් කෝපය, තමා ගැන සුළු කොට සිතීම,

බලාපොරොත්තු කඩවීම හා සෘණාත්මක ආකල්ප දොම්නසට හේතු විය හැකිය. " විපත්ති දවසේදී කලකිරීම " පිළිබඳව හිතෝපදේශය 24:10 අපට අවවාද කෙරේ.

ඇතැම්විට දොම්නස ඇතිවන්නේ, අප වටා සිටින අයගේ සෘණාත්මක ආකල්ප තුළිනි. සාතන් ඔවුන් තුලින් ක්‍රියා කරයි. " අපේ සහෝදරයෝ.... අපේ සිත් මලානික වෙන්ට සැලැස්සුවෝය". යනුවෙන් ද්විතිය කථාව 1:28 හි දෙවියන්වහන්සේගේ සෙනග පිළිගෙන ඇත.

දෙවියන්වහන්සේගේ සෙනගගේ ආත්මය බොහෝසේ අධෛර්යයට පත් වූ බව ගණන් කථාව 21:4 හි සඳහන් වේ. දාවිත් රජතුමා බොහෝ අවස්ථාවල තමා අධෛර්යට පත්වීම පිළිබඳව සිය ගිතිකාවලින් (උදා ගිතා 69) පෙන්වා ඇත. ප්‍රේරිතවූ පාවුල් තුමාද දොම්නසට පත්වූ අවස්ථා ඇත.

> **එබැවින් සහෝදරයෙනි, ආසියාවේදී අපට පැමිණි පීඩාව ගැන නුඹලා නොදැන සිටිනවාට නොකමැත්තෙමුව. එනම් ජීවිතය ගැන පවා අපට බලාපොරොත්තුවක් නැති තරමට, උසුලන්ට බැරි පමණ, අප පිටට බර පැමුණුණ බවය. (2 කොරින්ති 1:8)**

ඔබ දොම්නස ජයග්‍රහනය නොකළහොත් එය සාතන්ගේ ආත්මය මගින් ඇතැම් විට ඔබව බලවත් පීඩාවකට භාජනය කෙරෙනු ඇත. මෙය දොම්නසට පත්වීමේ ගැඹුරු ආකාරයකි. මෙහිදී සාතන් මනස කෙරෙහි වඩාත් බලවත් සීමාකිරීම් ඇතිකරයි.

## අධෛර්යට පත්වීම :

අධෛර්යය යන්නෙහි තේරුම "ධෛර්යයක් නොමැති වීම" යන්නය. ඔබ අධෛර්යයට පත්වීම සාතන්ට අවශ්‍ය වන්නේ ඔබට "ධෛර්යයක් නොමැති වූ විට" සටනේ දී ඔබ ජයග්‍රාහී නොවන බැවිනි.

## පසුබැසීම :

පසුබැසීමට සැලැස්වීමෙන්ද සාතන් මනසට පහර දෙයි. මෙහි පරමාර්ථය වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ අනෙක් කොටස් වලින් ඔබ තනි කිරීම වේ. සේවය කිරීමේදී ඇදහිලි වන්තයෝ ඒකකයක් වශයෙන් ක්‍රියා කරන බැවින් පසුබැසීම නිසා ඔබ අක්‍රියවේ. සාතන්, මනසට පහරදී පසුබැසීමට සැලැස්වූ දෙවියන් වහන්සේගේ මිනිසුන් සඳහා නිදසුන් වන්නේ එලියා (1 රාජාවලිය 19) හා යෝනා (යෝනා 4:5-11) .

## නොහොබිනා චේතනාවන් :

චේතනාවක් යනු ඔබ යමක් කිරීමට හේතුවයි. චේතනාවන් වැදගත්ය, මක්නිසාද මිනිසා බාහිර පෙනුම දෙස බැලුවත් (ක්‍රියාවන්), දෙවියන්වහන්සේ හදවත දෙස බලන බැවිනි.

> **නුමුත් ස්වාමින්වහන්සේ සාමුවෙල්ට කථාකොට : ඔහුගේ පෙනීම දෙසවත් ශරීරයේ උස දෙසවත් නොබලන්න, මක්නිසාද මම ඔහු එපා කෙළෙමි. ස්වාමින්වහන්සේ මනුෂ්‍යයා බලන්නාක් මෙන් නොබලනසේක. මනුෂ්‍ය තෙමේ පිටාතර පෙනීම බලන්නේය. නුමුත් ස්වාමින්වහන්සේ සිත බලනසේකැයි කීසේක. (1 සාමුවෙල් 16:7)**

යේසුස් වහන්සේ තමන්වම ඔවුන් අතට බාර වූයේ නැත, ඒ උන්වහන්සේ සියලුම මිනිසුන් දැන සිටි බැවිනි.

> **නුමුත් යේසුස්වහන්සේ සියල්ලන් දන්නා බැවින්ද මනුෂ්‍යයා තුළ තිබෙන්නේ කුමක්දැයි දන්න නිසා, මනුෂ්‍යයා ගැන යමෙකුගේ සාක්ෂියෙන් උන්වහන්සේට ඕනෑකමක් නැති බැවින්ද තමන්ම ඔවුන්ට භාර නුවූසේක. (යොහන් 2:24-25)**

බොහෝ දෙනෙකු කිතුනු සේවයට ඇතුළු වන්නේ වැරදි චේතනාවෙනි. සේවයට වඩා චේතනාව කෙරෙහි දෙවියන්වහන්සේ වැඩි සැලකිල්ලක් දක්වන සේක. ඔබද ඔබගේ අවධානය යොමු කළ යුත්තේ මේ ගැන වේ, ඊට හේතුව චේතනාවන් නිවැරදි වූ විට සේවයද ස්වභාවයෙන්ම ඒ අනුව ගමන් කරයි. සේවය පිළිබඳ ඔබගේ චේතනාවන් නිවැරදි විය යුතුය.

**නුඹලා අතරෙහි සිටින දෙවියන්වහන්සේගේ රැළ බලා ගනිමින්, බලහත්කාරය නිසා නොව දේව කැමැත්ත ලෙස සතුටු සිතින්ද, නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද, නුඹලාගේ භාරයට දෙනලද්දවුන් කෙරෙහි අධිපතිකම්කරන්නාක්මෙන් නොව නුඹලාම රැළට ආදර්ශව සිටිමින්ද එය රැකබලාගනිල්ලා. (1 පේතෘස් 5:2-3)**

ඔබ සේවයට ඇතුළු විය යුත්තේ ඔබගේම කැමත්තෙනි. එම තනතුරේ ඇති ප්‍රතිලාභ නිසා නොවේ, ඒකාධිපතියෙකු ලෙසද නොවේ, එහෙත් ආදර්ශයක් ලෙස විය යුතු වේ. කිතුනු සේවය පිළිබඳ වැරදි චේතනා ඇති කිරීමට සාතන් උත්සාහ දරනු ඇත. ඔහු ඒවා සූක්ෂම ලෙස ඔබ මනස තුළට රිංගවීමට ක්‍රියා කරයි. දෙවියන්වහන්සේගේ බලය ලබා ගැනීමේ ආශාවන් සාතන් වැරදි චේතනා ඇති කරයි. ඔබ මේ පිළිබඳ නිදසුනක් ක්‍රියා 8:18-23 හි සඳහන් සිම්යොන් නම් මිනිසෙකු පිළිබඳ කතාවෙන්, බලාගත හැකිය.

පළිගැනීම් චේතනාවන් ඇතැම් විට ඔබගේ ක්‍රියාවන්ට මුල්විය හැකිය (පළිගැනීම යනු ඔබට යම් වරදක් කළ කෙනෙකුට ඔබද එම වරදම කිරීම හෝ ඔබ අකමැති කෙනෙකුට වරදක් කිරීම වේ) මේ පිළිබඳව බයිබලයේ ඇති උදාහරණ අතර ස්වර්ගයෙන් ගිනි ගෙන්වීමට ගෝලයන්ට අවශය වීම (ලූක් 9:54) හා නිනවා නගරය විනාශ කිරීමට යෝනා ට අවශ්‍ය වීම (යෝනා 4) අන්තර්ගත වේ.

සෙනග ගණන් කිරීමේදී දාවිත්ටද වැරදි චේතනාවක් තිබුනේය .

**සාතන් ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව නැගිට ඔවුන් ගණන්කරන්ට දාවිත් පෙළඹුවේය. (1 ලේකම් 21:1)**

## වැරදි ආකල්ප හා හැඟීම් :

සාතන්, අන් අය කෙරෙහි වැරදි ආකල්ප ඇති කරයි. ඔහු වෛරය, ඊර්ෂ්‍යයාව, අවිශ්වාසය කමා නොදීම, සැකය, කෝෂය, ද්වේශය, පක්ෂපාතකම්, තරහය, නොඉවසිල්ල, විනිශ්චය කිරීම, විවේචනය, තෘෂ්ණාව හා ආත්මාර්ථය වැනි ගිනිහෙල්ලයක් ඇතුළුකරයි.

එමෙන්ම තණ්හාව, අතෘප්තිමත්බව, අහංකාරය, පුහු ආටෝපය, තමකම, වැදගත්කම, මානය බුද්ධිමත්භාවය, හා තමා ධර්මිෂ්ඨයයි සිතීම වැනි වැරදි ආකල්ප ඇති කිරීමට සාතන් උත්සාහ කරයි. වැරදි ආකල්ප වැරදි හැඟීම් වලට තුඩු දෙන අතර ඒ දෙකම පැන නඟින්නේ ඔබගේ සිතිවිලි වලිනි.

මෙම ආකල්ප හා හැඟීම් ඔබ ආත්මික සටනේදී බලරහිත කරයි. නිදසුනක් ලෙස "දෙවියන්වහන්සේ උඩඟුවුවන්ට විරුද්ධව සිටින" බව යාකොබ් 4:6 හි සඳහන් වේ. ඔබ අහංකාරයෙන් පිරුණු විට ඔබ සැබවින්ම දෙවියන්වහන්සේ එරෙහිව සටන් කිරීමට සූදානම් වන්නෙහිය.

## කැරැල්ල :

සාතන්, කැරලිකාර සිතිවිලිද ඔබගේ මනසට ඇතුළු කරයි. කැරලිගැසීම යනු ඕනෑකමින්ම දෙවියන්වහන්සේගේ අධිකාරී බලය අකීකරු වීම වේ. කැරලි ගැසීමට තමකැමැත්ත, මුරණ්ඩුකම හා අකීකරුකම අන්තර්ගතය. සාතන්ගේ මුල් පාපය කැරලි ගැසීම බව ඔබ මතක තබා ගන්න. "මම ... වෙමි" යන ප්‍රකාශ වලින් (යෙසායා 14:12-14) ඔහුගේ කැරලිකාර ස්වභාවය පෙන්නුම් කෙරේ. කැරැල්ලක් තුළින් සාතන් ක්‍රියාකරන ආකාරය හැඳිනගැනීමට "මම .. වෙමි" යන ආත්මය, මාර්ගයක් වේ.

## චෝදනා කිරීම හා හෙළා දැකීම :

"සහෝදරයන්ට වරද තබන්නාවූ" (එළි 12:10) තැනැත්තා ලෙස සාතන් හඳුන්වනු ලැබේ. ඔහු ගිනිහෙල්ලයන් ඔබගේ සිතට ඒවා ඔබ ඉතා පහත් කෙනෙකු සේ හැඟෙන්නට හැර ඔබව හෙළා දක්වනු ලැබේ, ඔහු ඔබට ලැජ්ජාවේ, නොවටිනාකමේ හා අපහසුතාවයේ හැඟීම් ඔබට දෙයි.

ශුද්ධාත්මයාණන්වහන්සේ වරද පෙන්වා දීම හා සාතන්ගේ හෙළා දැකීම අතර වෙනස දැක්වීමට එක් උචිත ක්‍රමයක් නම්, සාතන් සැමවිටම පොදුවේ කතා කරන බව සිහි කිරීමය. නිදසුනක් ලෙස සාතන් මනසට කතා කරන්නේ මෙසේය : "ඔබ යහපත් නැත", "ඔබට කෙදිනකවත් කිතුනු ජීවිතයක් ගත කළ නොහැකිය", "ඔබ මහත් පව්කරුවෙකු බැවින් ඔබට ප්‍රේම කිරීමට දෙවියන් වහන්සේට නොහැකිය".

ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ වරද පෙන්වා දෙන විට එය සුවිශේෂීය. නිදසුනක් ලෙස, ඔබට කෝපය හෝ වංකකම හෝ ආදිය පිළිබඳව ගැටළුවක් ඇති බවට උන්වහන්සේ ඔබගේ අවධානයට ගෙනෙන සේක.

## ලිංගික අපවිත්‍රතාවය :

ලිංගික අපවිත්‍රතාව, තෘෂ්ණාව හා මනසින් මවාගත් කාමුක අදහස් පිළිබඳව සිතිවිලි සාතන් ඔබ සිතට ඇතුළු කරනු ඇත. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **නුමුත් මම නුඹලාට කියමි : ස්ත්‍රියෙකු දෙස රාගයෙන් බලන කවරෙක් නමුත් එවේලේම ඈ සමඟ සිතින් කාමමිථ්‍යාචාරය කළේය. (මතෙව් 5:28)**

## වියවුල් ස්වභාවය :

සාතන්, ඔබ සිතෙහි අවිනිශ්චිතභාවය, වියවුල් ස්වභාවය හා බලාපොරොත්තු රහිත බව ඇති කරයි. ඔබ වියවුල් ස්වභාවයට, අවිනිශ්චිතභාවයට හා බලාපොරොත්තු රහිත බවට පත්වූ විට ඔබට යහපත් කිතුනු සෙබලෙකු බවට පත්විය නොහැකිය.

## වදහිංසා සහිත සිතිවිලි :

සාතන් ඔබේ සිතට බොහෝ වදහිංසා සහිත සිතුවිලි ඇතුළු කරයි. ඒවා අතර කනස්සල්ල, කාන්සාව, භීතිය, සැකසහිතබව හා බයාදුකම ආදිය වේ. "වැසී" නොයන අධික්‍රියාකාරී මනසකින්ද හෝ සාර්ථකව ක්‍රියා නොකරණ අඩු ක්‍රියාකාරී මනසකින්ද මනසට වදහිංසා පැමිණිය හැකිය. වදහිංසා සහිත සිතක බිය ද අන්තර්ගතය. පාවුළුතුමා 2 තිමෝති 1:7 හි "බයාදුකමේ ආත්මයන්" ගැන හා හෙබ්‍රෙව් 2:15 හි "මරණයට භය" ගැන පවසා ඇත. වදහිංසා සහිත සිතිවිලිවල, කමාව දී අමතක කළ යුතු තිත්ත මතකයන්ද අන්තර්ගතය.

## එකඟතාවයකට පැමිණීම :

"එකඟතාවකට පැමණීම" යනු ගැටුම් සහිත අදහස් හා මූලධර්මයන් වෙනස් කර ගැනීමෙන් විසඳුමකට පැමිණීම වේ. දෙවියන්වහන්සේගේ හා සාතන්ගේ මූලධර්ම එකිනෙකට ප්‍රති විරුද්ධය. එබැවින් සාතන් උත්සහ කරන්නේ ඔබගේ ආත්මික මූලධර්ම වෙනස්කර ඒවා පහත් තත්ත්වයකට ගෙනැවිත් ඔබ සමග එකඟතාවකට පැමිණීම වේ. නිදසුනක් ලෙස, ඔබ ශුද්ධව සිටිය යුතු නැති බවත්, බයිබලය වචනාර්ථයෙන්ම විශ්වාස කිරීම අනවශ්‍ය බවත් ආදිය ඔහු පවසනවා ඇත.

## වැරදි මානසික අවධාරණය :

සාතන්, ඔබේ අවධානය සදාතනික දේ කෙරෙහි නොව ලෞකික දේ කෙරෙහි යොමු කිරීමට නිතැතින්ම උත්සාහ කරනු ඇත.

> **ලෝකයටවත් ලෝකයේ තිබෙන දේවලටවත් ප්‍රේම නොකරන්න. යමෙක් ලෝකයට ප්‍රේම කෙරේ නම් පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. (1 යොහන් 2:15)**

ලෝකය කෙරෙහි සැලකිල්ල දැක්වීමේ හේතුවෙන් ඔබේ ජීවිතය තුළ සැබවින්ම දේව වචනය ඵල රහිත විය හැකිය (වපුරන්නා පිළිබඳ උපමා මතෙව් 13, මාක් 4 හා ලූක් 8 හි කියවන්න) ඔබ ලෝකය කෙරෙහි සැලකිල්ල දක්වන නිසා යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමට ඇති කාලය කෙතරම් කෙටිදැයි නොදැකීමට ඉඩ තිබේ.

**එහෙත් ඒ දවස මළපතක් මෙන් හදිසියෙන් නුඹලා කෙරෙහි නොපැමිණෙන පිණිස අධික කෑමෙන්ද, බීමත් කමෙන්ද, මේ ජීවිතයේ වෙහෙසින්ද, නුඹලා සිත් බර නොවෙන හැටියට බලා ගන්න. (ලූක් 21:34)**

සාතන් ඔබගේ සිතුවිලි සදාකාලික අගයන් ඇති දේවලින් නොව ද්‍රව්‍යමය දේවලින් පුරවනු ඇත. පොහොසත් මෝඩයාගේ උපමාව ලූක් 12:16-21 න් කියවන්න.

**මක්නිසාද, වස්තු තෘෂ්ණාව සියලු ආකාර නපුරේ මුලක්ය. සමහරු ඊට ආලය වී ඇදහිල්ලෙන් මුළාව ගොස් බොහෝ වේදනා වලින් තුමුම ඇන ගත්තෝය. (1 තිමෝති 6:10)**

"ලෝකයේ දේවල් ගැන සිතන" බොහෝ දෙනෙකු සිටින බවට පාවුල් තුමා අනතුරු අගවා ඇත (පිලි 3:18-19).

### මානසික තත්ත්වයන් :

ඔබ සාතන්ට අසහනය. සිය දිවි නසාගැනීම, හිරිහැර, චෝදනා ආදී සිතිවිලි අඛණ්ඩව ඔබ සිතට ඇතුළු කිරීමට ඉඩ ඇරියහොත් ඔබ මානසික රෝගියෙකු වීමට ඉඩ තිබේ. මේවා අතර ස්නායු පද්ධතියේ හෝ මනසේම හෝ කඩා වැටීමකට තුඩුදිය හැකි සහ මානසික විද්‍යාවේ පිළිගැනෙන විවිධ රෝගී තත්ත්වයන් තිබිය හැකිය. නොඇදහිලිවතුන්ගේ හා ඇදහිල්ලෙන් පසුබැස්සන්ගේ මනස්වලට ආවේග වීමට සාතන්ට හැකිය. ඔවුන් කලක් දෙවියන්වහන්සේව දැන හැඳිනගෙන සිට පසුව ඉවත්වූවෝ වෙති ( ඔබ මේ පිළිබඳව වැඩිදුරටත් විසි-එක්වන පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නවා ඇත)

## ආත්මික ප්‍රති උපක්‍රම : මනසෙහි ජයග්‍රහණය

මනස ඉලක්ක කෙරෙන සාතන්ගේ යුධායුද්ධ ගබඩාව බලන්න. මෙම සිතිවිලි, පරාජය නොකළහොත් පාපී ක්‍රියාවන් කරා ඔබ ගෙනයනු ඇත. නිදසුනක් ලෙස කෝපය, මනුෂ්‍ය ඝාතනයකට ඔබ ගෙන යා හැකිය. කාමුක සිතිවිලි, කාමමිථ්‍යාචාරයට පොළඹවනු ඇත. දික්කසාදය ආරම්භ වන්නේ මනසෙහි වේ. තෘෂ්ණාව, සොරකමට මඟ පෙන්වනු ඇත

ආත්මික සටනෙහි, විශාලතම භූමි ප්‍රදේශය මනස බව සැකයක් නැත. එහෙත් භය නොවන්න ! මනසට දෙනු ලබන සාතන්ගේ ප්‍රහාරයන් පරාජය කිරීමට දෙවියන්වහන්සේ පුදුමාකාර ලෙස ප්‍රති උපක්‍රම රැසක් දී ඇත

### ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ මනස විමසා බැලීමට ඉඩ දෙන්න :

පළමුව, ඔබගේ මනස විමසා බලා යම් වැරදි ආකල්ප, චේතනා හා සතුරා විසින් ඇතුළුකර ඇති සිතිවිලි තිබේ නම් ඒවා එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

**දෙවියන්වහන්ස, මා විමසා බලා, මාගේ සිත දැන ගත මැනව. මා පරීක්ෂා කොට, මාගේ සිතුවිලි දැන ගත මැනව. යම් නපුරු මාර්ගයක් මා තුළේ ඇත්දැයි බලා, සදාකාල මාර්ගයෙහි මා ගෙන ගිය මැනව. (ගීතාවලිය 139:23-24)**

ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට නොයෙකුත් දේ එළිදරව් කරන විට, ඒවා මත ක්‍රියා කරන්න. වැරදි සිතිවිලි රටාවන් උදෙසා කමාව ඉල්ලා අලුත් සිතිවිලි රටාවන් වර්ධනය කර ගැනීමට දේව වචනය භාවිත කරන්න.

### ඔබගේ යුද්ධායුධ ගබඩාව භාවිත කරන්න :

මනසෙහි කෙරෙන සටන්වලින් ඔබ මුදා ගැනෙන ආත්මික යුද්ධායුධ කට්ටලයෙහි කොටස් දෙකක් ඇත. මේවා එපීස 6:16-17 හි ලැයිස්තුගත කර ඇත. ඉන් එකක් ගැළවීම නමැති ආරක්ෂක තොප්පිය වේ. ආරක්ෂක තොප්පිය හිසෙහි පළඳින අතර ඉන් මනස ආරක්ෂා කෙරෙන බවක් අදහස් වේ.

පාවුළුතුමා කතා කරන්නේ ඔබගේ සිත පිරිසිදු කෙරෙන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කළාවූ ඔබගේ වර්තමාන ගැළවීම ගැන පමණක්ම නොවේ. ඔහු අනාගත ගැළවීම ගැනද කතා කරයි

> **තවද කාලය දැන, එනම් දැන් නුඹලා නින්දෙන් පිබිද සිටින්ට හරි වේලාව යැයි දැන, එසේ කරන්න. මක්නිසාද අප අදහාගත් කාලයේදී තිබුනාට වඩා දැන් ගැළවීම අපට ළංව තිබේ. (රෝම 13:11)**

ඔබගේ අනාගතය සඳහා බලාපොරොත්තුව ද ගැළවීමය. "ගැළවීම නමැති ආරක්ෂා තොප්පිය" ඇති ඇදහිලිවන්තයෙකු ඔහුගේ සදාතනික පරමාර්ථය වන ගැළවීම වෙනුවෙන් දෙවියන්වහන්සේ ක්‍රියාකරන බව අවබෝධ කරගනු ඇත. සතුරාගේ ප්‍රහාරවලින් ඔහු කලබලයට පත් නොවෙයි. ඔහුට වර්තමානය පිළිබඳව පමණක් නොව අනාගතය ගැනද බලාපොරොත්තුවක් ඇත.

මනස ආරක්ෂා කෙරෙන අනෙක් යුද්ධායුධ කොටස වන්නේ ඇදහිල්ල නමැති පලිහය. ඔබගේ යුද්ධායුධ ගැන ඉගෙන ගන්නා විට ඔබ උගත් පරිදි පලිහක් යනු ඊතලවලින් ආරක්ෂා වීමට තමා ඉදිරිපිටින් තබා ගන්නා ඝන ලෝහ කැබැල්ලකි. ඊතල පලිහේ වැදුනු විට ආපසු විසිවී යයි. පුද්ගලයාට අනතුරක් සිදු නොවේ.

කිතුනු සෙබලෙකුට ඇති පලිහ "ඇදහිල්ල නමැති පලිහ" ලෙස හැඳින්වේ. "ඇදහිල්ල" යන වචනය කිතුනු ශුභාරංචියේ මූලික සත්‍යයනට පමණක් නොව දෙවියන්වහන්සේ කෙරෙහි ඇති විශ්වාසයටද යොමු කෙරේ. තවත් ආත්මික යුද්ධායුධයක් වන්නේ සැබෑ කම නැමැති පටියය. (එපීස 6:14). දේව වචනයේ සත්‍යය, සතුරා ඔබගේ සිතට ගෙන එන ඕනෑම ව්‍යාජ චෝදනාවක් පරාජය කරනු ඇත.

## දේව වචනය භාවිත කරන්න :

යේසුස්වහන්සේව පරීක්ෂා කරද්දී සාතන් දේව වචනය වැරදි ආකාරයෙන් භාවිත කළ විට යේසුස්වහන්සේ ඒ ප්‍රහාරයට මුහුණ දුන්නේ ද දේවවචනයෙනි. ඔබ වරදකාරයෙකු ලෙස සාතන් චෝදනා කරන විට මෙම ශුද්ධ ලියවිලි පාඨය භාවිත කරන්න.

> **එහෙයින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින්නන්ට දැන් දඬුවමට පත් කිරීමක් නැත. (රෝම 8:1)**

බිය වැනි කරදරකාරී හැඟීම් සාතන් ගෙන එන විට පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨය භාවිත කරන්න.

> **ප්‍රේමයෙහි භය ඇත්තේ නැත. සම්පූර්ණ ප්‍රේමය භය දුරු කරයි, මක්නිසාද භය දඬුවමෙන් යුක්තය: භයවන තැනැත්තේ ප්‍රේමයෙහි සම්පූර්ණ නොවී සිටී. (1 යොහන් 4:18)**
>
> **මක්නිසාද දෙවියන් වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මයක් නොව බලයේත් ප්‍රේමයේත් හික්මවීමේත් ආත්මයක්ය. (2 තිමෝති 1:7)**

සාතන් ඔබ අධෛර්යයට පත් කිරීමට උත්සාහ කරන විට මෙම වචන භාවිත කරන්න.

> **මා විසින් නුඹට අණ කර තිබෙනවා නොවේද? ශක්තිමත්ව ධෛර්යවත්ව සිටපන්න, තැති නොගන්න, නොකැළඹෙන්න. මක්නිසාද නුඹ යන සෑම තැන්හිම නුඹේ දෙවි වූ ස්වාමින් වහන්සේ නුඹ සමඟ සිටින සේකැයි කීසේක. (යෝෂුවා 1:9)**

සාතන් ඔබගේ සිතට, ඔබ වැරදිකරුවෙකු බව ව්‍යාජ ලෙස පෙන්වන විට මෙය මතක තබාගන්න.

> **අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක. (1 යොහන් 1:9)**

එමෙන්ම, සාතන් ඔබගේ මනසට ප්‍රහාර එල්ල කරන විට, ඒවාට විරුද්ධව සටන් කිරීම සඳහා මෙම පාඩමේ මනස පිළිබඳ ඇති අනෙකුත් සියලුම බයිබල් පද ඔබ භාවිත කරන්න.

## ප්‍රබල මනසක් ඉල්ලන්න :

ඔබ සඳහා වූ දේව කැමැත්ත ලෙස ප්‍රබල මනසක් ඉල්ලන්න. වේදනා ගෙන දෙන්නාවූ සිතිවිලි ඉවත් කිරීමට, ඔබට නිත්‍යානුකූලව අයත් සාමය ඉල්ලන්න.

> **නුඹලා වෙත සමාදානය තබා යමි, මාගේ සමාදානය නුඹලාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. නුඹලාගේ සිත් කැළඹෙන්නටවත් භයවෙන්නටවත් නොදෙල්ලා. (යොහන් 14:27)**

> **එවිට කිසි නුවණකින් දැන ගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ නුඹලාගේ සිත් ද සිතුවිලිද ආරක්ෂා කරනවා ඇත. (පිලිප්පි 4:7)**

සාතන්ගේ විවිධ මානසික ප්‍රහාරයන්ට යොදා ගත හැකි ශුද්ධ ලියවිලි "ආයුධ ගබඩාවක්" ගොඩනගා ගත හැකි ක්‍රම සඳහා මේ නිදසුන් වේ. ඔබ ශුද්ධ ලියවිල්ල අධ්‍යයනය කරන අතර සතුරාගේ ආක්‍රමණවලින් ඔබගේ මනස ආරක්ෂා කර ගැනීම සඳහා සුවිශේෂී බයිබල් පද හඳුනාගන්න.

## ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවති මනසම ඔබ තුළ ඇති කර ගන්න :

පාවුලුතුමා ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආභාෂය යටතේ මෙසේ ලියා ඇත.

> **ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා. (පිලිප්පි 2:5)**

"තිබේවා" යන වචනයෙහි තේරුම ඉඩ දෙන්න හෝ වැළඳගන්න හෝ වේ. ඔබ ඔබගේ සිත යේසුස්වහන්සේගේ සිත මෙන් වන්නට ඉඩ හැරිය යුතුය. යේසුස්වහන්සේගේ මනස කුමන ආකාරයේ වුයේද? මෙම ප්‍රශ්නය අධ්‍යයනය කිරීම සඳහා ව්‍යාපෘතියක් මෙම පරිච්ජේදයේ "දක්ෂ ලෙස හැසිරවූ උපාය මාර්ග" කොටසේ ඇත. පාවුලුතුමා මෙසේ ලියා ඇති බැවින් එය ලබාගැනීමට හැකිද?

> **... නුමුත් අපට ක්‍රිස්තුස්වහන්සේගේ සිත ඇත්තේය. (1 කොරින්ති 2:16)**

## නුඹලාගේ මනස ක්‍රියාකිරීම සඳහා පිළියෙල වන්න :

> **ඉන්නිසා නුඹලාගේ සිත් නමැති කටි බැඳගෙන සිහි ඇතිව සිට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීමේදී නුඹලා වෙතට පමුණුවනු ලබන්ට තිබෙන අනුග්‍රහය පිට නුඹලාගේ බලාපොරොත්තුව සම්පූර්ණ ලෙස පිහිටුවාපල්ලා. (1 පේත්‍රුස් 1:13)**

ස්වභාවික ශරීරයේ කටි යනු ඉඟටියට පහතින් පිහිටි ශරීරයේ මධ්‍ය කොටස වේ. ශරීරයේ ශක්තිමත්ම කොටස කටී ය. ඔබගේ මනස ශක්තිමත් කරගත යුතු බව පේත්‍රුස්තුමා පවසයි. නැවතත් එය **ඔබ** විසින් කළ යුතු දෙයකි.

## වැරදි සිතිවිලි වහල් කර ගන්න :

"සියලු සිතිවිලි ක්‍රිස්තුස්වහන්සේට කීකරු වීමට වහල් කර දෙන්න" (2 කොරි 10:5) යැයි අපට පවසා තිබේ. සිතිවිලි සතුරෝ නොවෙත් නම්, ඒවා වහල්භාවයට ගැනීමේ අවශ්‍යතාවයක් නැත. ස්වාභාවික ලෝකයේ සෙබලෙක් සතුරෙකු අත් අඩංගුවට ගන්නා ආකාරය සිතන්න. ඔබ සෑම සිතිවිල්ලක්ම "වහල් කර ගන්නා" විට මෙම අදහස් ආත්මිකව යොදන්න.

## වැරදි සිතිවිලි ඉවත් කරන්න :

මනස ආරක්ෂා කර ගැනීමේ එක් ප්‍රධාන ප්‍රතිඋපක්‍රමයක් වන්නේ, ඉවත් කිරීම ය. යමක් ඉවත් කිරීම යනු මහත් වූ බලයකින් විසි කිරීම වේ. පාවුලු තුමා මෙසේ ලියා ඇත.

> **මක්නිසාද අපි මාංශයේ හැසිරෙන නුමුත් මාංශයේ හැටියට යුද්ධ නොකරමුව. (මක්නිසාද අපේ යුද්ධායුධ මාංසික නොවේය, එහෙත් ඒවා බලකොටු බිඳ හෙළීමට දෙවියන් වහන්සේ**

**ඉඳිරිපිට බලසම්පන්නය.) අපි විවාදයන්ද දෙවියන්වහන්සේ ගැන දැන ගැනීමට විරුද්ධව උසස් වන්නාවූ සියලු දේවල්ද බිඳහෙළා, සියලු සිතුවිලි ක්‍රිස්තුස්වහන්සේට කීකරුවීමට වාල්කරදෙමුව. (2 කොරින්ති 10:3-5)**

සාතන් ඔබගේ මනසට ඇතුළු කරන දුෂ්ඨ මනඃකල්පිත දේ ඉවත් කළ යුතුය. දෙවියන්වහන්සේට විරුද්ධව උසස් වන්නාවූ සිතිවිලි ඔබ ඉවත් කළ යුතුය. ඔබ සෑම සිතිවල්ලක්ම ස්වාමීන්වහන්සේගේ වහල්භාවයට හා කීකරුකම යටතට ගෙන ආ යුතුය.

ඔබ "ඉවත් කරන්නේ" ඕනෑම කමින්ම ඔබගේ මනස පාලනය කර ගැනීමෙන් හා සාතන් ඇතුළු කරන සිතිවිලිවල පැවතිම ප්‍රතික්ෂේප කිරීමෙනි. **ඔබට** ඒවා ඉවත් කිරීමට පවසා ඇති බව මතක තබා ගන්න. එය දෙවියන්වහන්සේ ඔබ වෙනුවෙන් කරන දෙයක් නොවේ.

## මේ දේවල් ගැන සිතන්න :

මනස නමැති "කටි" බැඳ ගැනීමේ එක් ක්‍රමයක් නම් නිවැරදි විෂය කරුණු ගැන සිතිම වේ. පාවුලු තුමා මෙසේ පවසයි.

**ඉතින්, සහෝදරයෙනි, යම් පමණ දේ සැබෑද, යම් පමණ දේ ගරු කටයුතුද, යම් පමණ දේ සාධාරණද යම් පමණ දේ පිරිසිදුද, යම් පමණ දේ ආදරණීයද, යම් පමණ දේ යහපත් කීර්තියක් ඇතුව තිබේද, යම් ගුණයක්, යම් ප්‍රශංසාවක් ඇද්ද, ඒ දේවල් මෙනෙහි කරන්න. (පිලිප්පි 4:8)**

## ඔබගේ මනස අලුත් කර ගන්න :

**නුඹලා නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත් කරනු ලැබ, සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද ශුද්ධකමින්ද දෙවියන්වහන්සේට සමානව මවන ලද්දාවූ අලුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය. (එපීස 4:23-24)**

**නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතු සම්පූර්ණ දෙය කුමක්ද කියා දැන ගන්නා පිණිස, සිත අලුත් කර ගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙන්න. (රෝම 12:2)**

ඔබ ඔබගේ මනස අලුත් කර ගන්නේ යාච්ඤාවෙන් හා දේවවචනය මෙනෙහි කිරීමෙනි.

## ස්වාමීන්වහන්සේ තුළ ධෛර්යමත් වන්න :

දාවිත් ස්වාමීන්වහන්සේ තුළ තමන්වම ධෛර්යමත් කරගත්තේය.

**දාවිත් තද අමාරුවකට පත්විය: මක්නිසාද මුළු සෙනගගේ සිත් තම තමුන්ගේ පුත්‍රයන්ද දූවරුන්ද ගැන ශෝකවුණ බැවින් ඔහුට ගල්ගසන්ට සෙනඟ කථා කළෝය. නුමුත් දාවිත් තමාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තුළ ශක්තිය උපදවා ගත්තේය. (1 සාමුවෙල් 30:6)**

නැවතත්, **ඔබ** ක්‍රියාත්මක විය යුතුය. ඔබ දෙවියන්වහන්සේ තුළ ඔබවම දිරිමත් කරගත යුතුය. එය අනෙක් අය කරන තෙක් බලා නොසිටින්න. දෙවියන්වහන්සේගේ උපකාරය ඇතිව එය ඔබම කරන්න.

## වියවුලේ මූලය (ප්‍රභවයන්) හඳුනාගන්න :

වියවුල දෙවියන්වහන්සේගෙන් නොවන බව හඳුනාගන්න.

**මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල්කමේ නොව සමාදානයේ දෙවියන්වහන්සේය... (1 කොරින්ති 14:33)**

වියවුල දෙවියන්වහන්සේගෙන් නොවන බැවින්. ඔබගේ සිතින් වියවුලේ ආත්මය පිළිගැනීම ප්‍රතික්ෂේප කරන්න.

## දොරටු පාලනය කර ගන්න :

පැරණි ගිවිසුම් යුගයේ සතුරු බලවේගවලින් ආරක්ෂා වීම සඳහා නගර, පවුරුවලින් වට කර තිබිණි. පවුරුවලට දොරටු තිබූ අතර ඒවායින් ඇතුලුවීම පාලනය කිරීමට මුර සෙබලුන් භාවිත කෙරිණි. නගරයේ දොරටු පාලනය කළ යමෙක් වේද ඔහු නගරය පාලනය කළේය.

මනස පාලනය කිරීමේදීද මෙවැනි අවස්තාවක් ඇති වේ. ඔබගේ ඇතුලාන්තයට "දොරටු" වන්නේ පංචේන්ද්‍රියයන්ය. අභ්‍යන්තරයෙන් විනාශය ගෙන දීමට හැකියාව ඇති යමක් ඇතුළුවීමට ඉඩ නොදීම ඔබගේ වගකීමකි. මින් අදහස් වන්නේ ඔබගේ මාංශික ස්වභාවය ඔබම පාලනය කළ යුතු බවය.

ඔබගේ මනසේ දොරටු විවෘත වන දේ මගහරින්න. මේවා අතර මත්ද්‍රව්‍ය හා මත් පැන් වේ. මේවායින් ඔබගේ සිතීමේ හා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව අවම කරයි. අපවිත්‍ර පොත්පත්, පාපි සම්බන්ධතාවනට හා ලිංගික අපරාධවලට අභාෂය ලබා දෙයි. ඇතැම් සංගීත වර්ග, ජේනකීම්, සමහර ඇදහීම් ක්‍රම, හා මනස පාලනය කිරීම්, ඔබගේ මනසේ "දොරටු" විවෘත කෙරේ.

මාංශික සියලු දේ ඉවත දමන්න. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල ඔබ තුළ වර්ධනය වීමට ඉඩහරින්න ( ගලාති 5:19-26 බලන්න). සතුරාගේ මානසික පහරදීම්වලට **කිසි දිනෙක ඉඩ නොදන්න.** ඔබ එසේ ඉඩදුනහොත් දෙවියන්වහන්සේ ඔබව අත්හරිනු ඇත. රෝම 1 බලන්න... ඇතැම් විට දෙවියන්වහන්සේ මිනිසුන් ඉඩ දී ඇති දේ වෙනුවෙන් ඔවුන්ව අත්හරිනු ඇත. ඔබට උපකාර කිරීමට යේසුස්වහන්සේගෙන් ඉල්ලා සිටින්න යේසුස්වහන්සේ පිළිබඳ පැරණි ගිවිසුමේ සඳහන් එක් දිවැසි වැකියකින් මෙසේ කියවේ. උන්වහන්සේ "සතුරාගේ දොරටු පාලනය කරයි". ඔබගේ ආත්මික "දොරටු" කෙරෙහිද උන්වහන්සේගේ එම පාලනය භාවිත කිරීමට ඉඩ දෙන්න.

## ඔබගේ මනස දෙවියන්වහන්සේ වෙත තබන්න :

ඔබගේ මනස දෙවියන්වහන්සේ "වෙත" හෝ දෙවියන්වහන්සේ කෙරෙහි කේන්ද්‍ර කොට තබන්න.

> **ඔබ කෙරෙහි සිත තබා සිටින තැනැත්තා ඔබ කෙරෙහි විශ්වාස කරන බැවින්, ඔබ ඔහු ශාන්ත සමාදානයෙන් ආරක්ෂා කරන සේක. (යෙසායා 26:3)**

මෙය ශ්‍රේෂ්ඨ පොරොන්දුවකි! ඔබ ඔබගේ සිත දෙවියන්වහන්සේ කෙරෙහි කේන්ද්‍රකොට තැබුවෙහිනම්, සතුරාගේ සියලු පහර මැද ඔබට සමාදානයෙන් සිටිය හැකිය.

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න

2. ආත්මික සටනෙහි ප්‍රධාන යුද භූමිය ඇත්තේ කොතැනකද ?

3. “ගිනිහෙල්ලයන්” යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

4. මනසට එරෙහිව සටන් කිරීමට සාතන් භාවිත කරන උපක්‍රම සාරාංශ ගත කරන්න.

5. සාතන්ගේ මානසික ප්‍රහාරයන් පරාජය කළ හැකි, මෙම පරිච්ඡේදයේ සඳහන් ආත්මික ප්‍රතිඋපක්‍රම සාරාංශගත කරන්න.

(මෙම පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. මනස සඳහා කෙරෙන සටනේදී සාතන් උත්සාහ කරන්නේ පහත දැක්වෙන ඒවා ඇති කිරීමටය :

    - මාංශයේ මනසක් : රෝම 8:6-7
    - නපුරු ක්‍රියාවන් මගින් දෙවියන්වහන්සේගෙන් වෙන් කළ මනසක් : කොලොස්සි 1:21
    - කිලිටුවූ මනසක් : තීතස් 1:15
    - මාංසික මනසක් : එපීස 2:3
    - තද වූ මනසක් : දානියෙල් 5:20
    - සැක සහිත මනසක් : ලූක් 12:29
    - නිශ්චල මනසක් : එපීස 4:17
    - අන්ධවූ මනසක් : 2 කොරින්ති 3:14
    - සංවේදී නොවූ මනසක් හා හෘද සාක්ෂියක් : තීතස් 1:15
    - ක්‍රෝධ වූ මනසක් : එසකියෙල් 36:5
    - නපුරු මනසක් : ක්‍රියා 14:2
    - නොඇදහිලිවන්ත මනසක් : 2 කොරින්ති 4:4
    - ක්ලාන්ත වූ මනසක් : හෙබ්‍රෙව් 12:3
    - දූෂ්‍ය වූ මනසක් : 2 තිමෝති 3:8
    - දෙසිත් ඇත්තෙක් : යාකොබ් 1:8, 4:8
    - දූෂිත මනසක් : 1 තිමෝති 6:5, 2 තිමෝති 3:8, 2 කොරින්ති 11:3

2. ඔබ වර්ධනය කරගත යුතු ධනාත්මක මානසික ගුණ :

    - සූදානම් මනසක් 2 කොරින්ති 8:19, 1 පේත්‍රුස් 5:2, ක්‍රියා 17:11
    - පවිත්‍ර මනසක් : 2 පේත්‍රුස් 3:1
    - පවතින මනසක් : යෙසායා 26:3
    - අලුත් වූ මනසක් : එපීස 4:23, රෝම 12:2
    - නිහතමානී මනසක් : කොලොස්සි 3:12, ක්‍රියා 20:19
    - සන්සුන් මනසක් : තීතස් 2:6
    - හික්මවීමේ මනසක් : 2 තිමෝති 1:7
    - ප්‍රේමයේ මනසක් : මතෙව් 22:37
    - සේවයේ මනසක් : රෝම 7:25
    - පෙළඹවූ මනසක් : රෝම 14:5
    - උද්යෝගී මනසක් : 2 කොරින්ති 7:7
    - අධිෂ්ඨානයේ මනසක් : 2 කොරින්ති 8:12

3. නිරන්තර පාපය නිසා මිනිසා ශාපලත් මනසක් ඇත්තෙකු බවට පත්විය හැකිය. රෝම 1:28-31 බලන්න. ඔබට තිබිය හැකි ඉතාමත් නපුරුම මනස ශාපලත් මනස වේ.

4. ඔබ මෙම පරිච්ඡේදයෙන් උගත් පරිදි, මනසේ ජයග්‍රහණය සඳහා එක් උපක්‍රමයක් වන්නේ යේසුස්වහන්සේට තිබූ මනසම ඔබ තුළත් ඇති කර ගැනීමය. යේසුස්වහන්සේගේ මනස කවර ආකාරයේදැයි තව දුරටත් ඉගෙනීම සඳහා අලුත් ගිවිසුම අධ්‍යයනය කරන්න. උන්වහන්සේගේ ක්‍රියාවන්වල ප්‍රදර්ශනය වූ මානසික ආකල්ප කවරේද ? උන්වහන්සේගේ සේවය තුලින් උන්වහන්සේගේ සිතිවිලි රටාවන් ප්‍රදර්ශනය වූයේ කෙසේද ? උන්වහන්සේගේ වචන වලින් උන්වහන්සේගේ සිතිවිලි ප්‍රදර්ශනය වූයේ කෙසේද ?

5. ඔබගේ මනසේ ඇති සිතිවිලි වුවද යේසුස්වහන්සේ දන්නා සේක. ලූක් 5:22, 6:8 11:17 බලන්න.

6. 2 සාමුවෙල් 13:28 හා යෝෂුවා 1:9 හා සසඳන්න. යෝෂුවාගේ සඳහන් දෙවියන්වහන්සේගේ කතාව සාමුවෙල්හි ඇති එම කොටසට සමානය. එහෙත් සාමුවෙල්ගේ කොටස වැරදි ලෙස ව්‍යවහාර කර ඇත. අබ්සොලම් එම වචන කතා කළේ තම සහෝදරයාගේ ඝාතකයා වූ අම්නොන්ටය. යක්ෂයා ශුද්ධ ලියවිල්ල වැරදි ලෙස භාවිත කරන විට හා වැරදි ලෙස ව්‍යවහාර කරන විට ඇතැම් ශ්‍රේෂ්ඨ බයිබලීය වචන භාවිත කරයි. සාතන් බයිබලය උපුටා දක්වන අවස්ථාවන්හිදි තරම් භයානක වෙනත් අවස්ථාවන් නැත. මනසට පහර එල්ල කිරීම සඳහා ඔහු යොදා ගන්නා ප්‍රධාන උපක්‍රමයක් මෙය වේ.

# දහසයවන පරිච්ඡේදය

## දිව සමග කෙරෙන සටන

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආත්මික සටනේ වැදගත් සටන් භූමියක් ලෙස දිව හැඳින ගැනීම
- දිව පාලනය කිරීම සඳහා සාතන් භාවිත කරන උපක්‍රම සාරාංශගත කිරීමට
- දිව ජයගැනීම සඳහා වූ ආත්මික ප්‍රතිඋපක්‍රම සාරාංශගත කිරීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

**නුමුත් දිව දමනය කරන්ට කිසි මනුෂ්‍යයෙකුට නුපුළුවන. ඒක කැරලිකාර වූ, මරණීය විෂයෙන් පූර්ණ වූ, නපුරු දෙයක්ය. (යාකොබ් 3:8)**

## හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙන් ඔබ ආත්මික සටනේ ප්‍රධාන යුද භූමියක් වූ මනස ගැන උගත්තෙහිය. මනසෙහි සිදුවන දෙයින් දිවට බලපෑමක් ඇතිවන අතර දිව ආත්මයද, හදවත හා ශරීරය කෙරෙහිද බලපෑම් ඇති කරයි. ආත්මික සටනේ තවත් ප්‍රධාන යුද භූමියක් වන දිව පිළිබඳව මෙම පරිච්ඡේදය සැලකිලිමත් වේ.

## දිව පිළිබඳව බයිබලය ප්‍රකාශ කරන දෑ

දිව පාලනය කිරීමේ සාතන්ගේ උපක්‍රම විමසා බැලීමට පෙර, දිව පිළිබඳව බයිබලය ප්‍රකාශ කරන දේ යාකොබ් 3:1-13 හි කියවන්න. දිව ඔබගේ ශරීරයේ ඉතා කුඩා අවයවයක් වුවද එය ඉතා බලවත් බව මෙම පද එළිදරව් කරයි. දිව මගින් මුළු ශරීරයම අපවිත්‍ර විය හැකිය. කිසිදු දිනක මිනිසාට දිව පාලනය කළ නොහැකිය. ඔබ, ඔබගේ දිව දෙවියන් වහන්සේගේ පාලනයට යටත් කළහොත් පමණක් ඔබට එය පාලනය කළ හැකිය. එසේ වුවද එය කෙදිනකවත් දමනය කළ නොහැකිය. ඔබ දිව සම්පූර්ණයෙන්ම දැන් යටත් කර ඇතැයි සිතා ඒ ගැන නොසැලකිලිමත් විය නොහැකිය.

බයිබලයේ දිව සසඳා ඇති දේ බලන්න :

ගින්නක්: යාකොබ් 3:5
ඇවිළෙන ගින්නක් : හිතෝපදේශ 16:27
අධර්මිෂ්ඨකමේ ලෝකයක් : යාකොබ් 3:6
දමනය කළ යුතු මෘගයෙක් : යාකොබ් 3:7-8
මිහිරි දිය හා තිත්ත දිය නිකුත් කරන උල්පතක් : යාකොබ් 3:11
යහපත් හෝ අයහපත් එල දරන ගසක් : යාකොබ් 3:12
කැරලිකාර නපුරු දෙයක් : යාකොබ් 3:8
මරණීය විෂයෙන් පූර්න වුවක් : යාකොබ් 3:8
තියුණු දැළිපිහියක් : ගීතාවලිය 52:2
තියුණු කඩුවක් : ගීතාවලිය 57:4, 59:7
විෂ සහිත සර්පයෙක් : ගීතාවලිය 140:3
ගැඹුරු වළක් : හිතෝ 22:14

බයිබලය දිව බලවත් බව පවසන්නේ අන් අය කෙරෙහි ඉන් ඇතිවන බලපෑම නිසාය. ඇත්තෙන්ම දිවට මරණය හෝ ජීවනය හෝ දීමේ බලය ඇත.

> **මරණයත් ජීවනයත් දිවේ වසඟයෙහි ඇත්තාහ, ඊට ප්‍රිය වන්නෝ එහි පල භුක්ති විඳින්නෝය. (හිතෝපදේශ 18:21)**

දිව බලවත් වන්නේ ඔබ කෙරෙහි ඉන් ඇති බලපෑම නිසාය. ඔබට ඔබගේම වචන වලින් ඔබටම උගුලක් අටවා ගත හැකිය.

> **නුඹේ මුඛයේ කීම් වලින් පටලැවී, නුඹේ මුඛයේ කීම් වලින් අසුවී සිටින්නෙහි නම්, (හිතෝපදේශ 6:2)**

දිව බලවත් වන්නේ දෙවියන්වහන්සේගෙන් ඔබ වෙන් කිරීමට ඔබගේ වචන වලට හැකි බැවිනි.

> **චාටු සහිත මුඛ සහ මහත් කාරණා කියන දිවද ස්වමීන්වහන්සේ කපා හරින සේක. (ගීතාවලිය 12:4)**

## සාතන්ගේ උපක්‍රම: දිව වෙනුවෙන් කෙරෙන සටන

ඔබගේ දිව, ඔබගේ හදවතටද, ශරීරයටද, ආත්මයටද කිට්ටුවෙන් සම්බන්දවී පවතී. නිදසුනක් ලෙස සාතන් ඔබගේ හදවත පාලනයකරන්නේ නම් ඔබගේ දිවද පාලනය කරනු ඇත.

> **නුමුත් කටින් පිටවෙන දේ නික්මෙන්නේ සිතින්ය, මනුෂ්‍යයා අපවිත්‍ර වෙන්නේ එයින්ය. මක්නිසාද නපුරු සිතුවිලි, මිනීමැරම්, කාමමිථ්‍යාචාරකම්, වේශ්‍යාකම්, සොරකම්, බොරු සාක්ෂි කීම් සහ අපහාස කිරීම් සිතින් නික්මෙන්නේය. මනුෂ්‍යයා අපවිත්‍ර වන්නේ මේ දේවලින්ය. නුමුත් නොසේදූ අත් වලින් කෑවාට මනුෂ්‍යයා අපවිත්‍ර වෙන්නේ නැතැයි කී සේක. (මතෙව් 15:18-20)**
>
> **යහපත් මනුෂ්‍යයා තමාගේ සිතෙහි වූ යහපත් සම්පතෙන් යහපත් දේද නපුරු මනුෂ්‍යයා නපුරු සම්පතෙන් නපුරු දේද පිටතට ගෙනෙන්නේය. මක්නිසාද මුඛය කථා කරන්නේ සිතේ පූර්ණ කමින්ය. (ලූක් 6:45)**

සාතන්, ඔබ පවසන දේ ඔබගේ ආත්මයේ බිඳීමක් (විවරයක්) ඇති කිරීමට සලස්වයි.

> **ශාන්තිදායක දිව ජීවන වෘක්ෂයක්ය, එහෙත් එහි වංචාව ආත්මය පොඩි කිරීමක්ය. (හිතෝපදේශ 15:4)**

ඔබගේ දුෂ්ට වචන මගින් ඔබ තුල විවරයක් ඇති කරන අතර සාතන් සටන් කිරීම සඳහා ඒ තුලින් ඔබගේ ආත්මයට ඇතුලු වේ.

එමෙන්ම සාතන් ඔබගේ තොල්, ඔබගේ ප්‍රණායට බලපෑමක් ඇති කිරීමට භාවිත කරයි.

> **අඥානයාගේ මුඛය ඔහුට විනාශයක්ය, ඔහුගේ තොල්ද ඔහුගේ ප්‍රාණයට මලපතක්ය. (හිතෝපදේශ 18:7)**
>
> **තමාගේ මුඛයත් දිවත් රැකවල් කරගන්නා තමාගේ ප්‍රාණය විපත්ති වලින් රැකගන්නේය. (හිතෝපදේශ 21:23)**

දිව තුලින්, සාතන් ඔබගේ මුළු ශරීරයටම බලපෑමක් ඇති කරයි.

> **එය අපේ අවයවයන් අතරේ අධර්මිෂ්ඨ කමේ ලෝකයක්ය. ඒක මුළු ශරීරය කිලිටු කොට සකල ලෝකයට ගිනි අවුලවයි, ඒකට ගිනි ඇවිලෙන්නේ නිරයෙන්ය. (යාකොබ් 3:6)**

දිව, ඔබගේ මුළු ජීවිතයටම බලපෑමක් ඇති කරයි.

කට රැකගන්නා තමාගේ ජීවිතයද රැකවල් කරගනී, එහෙත් බොහෝසෙයින් කට අරින්නා විනාශයට පැමිණේ. (හිතෝපදේශ 13:3)

ඔබට කතා කිරීමට සැලසීමෙන්, සාතන් ඔබගේ දිව පාලනය කිරීමට මාන බලයි.

## තෘෂ්ණාව සහිත වචන :

නුඹලාට ඇති දෙයින් සතුටු වී, වස්තු තෘෂ්ණාවෙන් තොරව සිටින්න. මක්නිසාද: මම කිසි සේත් නුඹෙන් අහක්ව නොයමි, කිසි අන්දමකින් වත් නුඹ අත් නොහරිමියි උන්වහන්සේම කියා තිබේ. (හෙබ්‍රෙව් 13:5)

## නිශ්ඵල වචන :

තවද මනුෂ්‍යයන් කියන්නාවූ සියලු නිෂ්ඵල වචන ගැන විනිශ්චය දවසේදී උත්තර දෙන්ට වෙන්නේ යැයි නුඹලාට කියමි. (මතෙව් 12:36)

## අඥාන වචන :

නුවණ ඇත්තාගේ සිත දැනගන්ම සොයයි, එහෙත් ආඥාණයන්ගේ මුඛය මෝඩකම අනුභව කරයි. (හිතෝපදේශ 15:14)

## නිශ්ප්‍රයෝජන වචන :

මේ දේවල් සිහි කරවමින්, කිසි ප්‍රයෝජනයක් නැතුව, අසන්නන්ට හානිය සිදුවන ලෙස වචනය ගැන තරඟ නොකරන්ට ස්වාමින්වහන්සේ ඉදිරියෙහි ඔවුන්ට අණ කරන්න. (2 තිමෝති 2:14)

## මනුෂ්‍යයන්ගේ ප්‍රබන්ධ හා ආඥා :

ඇදහිල්ලෙහි හරි ලෙස සිටින පිණිස ඔවුන්ට තදින් තරවටු කරන්න. (තීතස් 1:14)

## ඔබ නොදන්නා දේවල් පිලිබඳ නපුර කතාකිරීම :

නුමුත් මොවුහු තමුන් නොදන්නා කොයි දේටත් නින්දාකරති. නුවණ නැති තිරිසනුන් ලෙස ජම්ම ගතියෙන් ඔවුන්ට තේරෙන මේ දේවලින් තුමුම විනාශ කරනු ලබන්නෝය. (යූද් 10)

නුමුත්, අල්ලා විනාශකරනු ලබන්ට උපන්, ජම්මයෙන් නුවණ නැත්තා වූ තිරිසනුන් මෙන්, මොව්හු, නොදන්නා දේට අපහාස කරමින්, අධර්මිෂ්ඨකමේ කුලිය ලබමින්, තමුන්ගේම කිලුටු කමින් සැබැවින් විනාශවන්නෝය. (2 පේත්‍රුස් 2:12)

## ඉච්ජා වචන :

මක්නිසාද නුඹලා දන්නා හැටියට අප විසින් කිසි කලෙක. ඉච්ජා වචනවත් තණ්හාවේ උපායක්වත් ව්‍යවහාර කළේ නැත, දෙවියන් වහන්සේ සාක්ෂිය. (1 තෙසලෝනික 2:5)

## ප්‍රසන්න වචන :

මෙසේ මා කියන්නේ සිත් ප්‍රසන්න කරන කටාවෙන් කිසිවෙකු විසින් නුඹලා මුළා නොකරන පිණිසය. (කොලොස්සි 2:4)

**මැසිවිලි, කෙඳිරිලි හා අහංකාර වචන :**

මොවුහු මැසිවිලි කියන්නෝය, කොඳුරන්නෝය, තමුන්ගේ තෘෂ්ණාවල් අනුව හැසිරෙන්නෝය. (ඔවුන්ගේ කටින් මහත් උඩගු වචන කියමින්,) ප්‍රයෝජනය පිණිස මනුෂ්‍යයන්ගේ තරාතිරම් සළකන්නෝය. (යුද් 16)

මක්නිසාද ඔවුහු නිෂ්ඵල කමේ මහත් ආඩම්බර වචන කථා කරමින්, වරදෙහි වසන්නන් කෙරෙන් යන්තම් ගැළවී යන්නන් මාංශයේ තෘෂ්ණාව වන සල්ලාල කමෙන් ඇද ගනිති. (2 පේත්‍රුස් 2:18)

**නිෂ්ඵල වචන :**

ඔවුන් සැම දෙන තමුන්ගේ අසල්වාසියා සමඟ නිෂ්ඵල දේ කතා කරති. ඔවුහු චාටු සහිත මුඛයෙන් හා දෙසිතින් කථා කෙරෙති. (ගීතාවලිය 12:2)

**උඩඟු වචන :**

ඔවුහු තමුන්ගේම තෙලින් තර වී සිටිති. කටින් උඩඟු ලෙස කතා කරති. (ගීතාවලිය 17:10)

**පාරට්ටු කෙරෙන වචන :**

ඔවුහු දොඩවති, අහංකාර ලෙස කථා කෙරෙති. අයුතුකම් කරන සියල්ලෝම පාරට්ටු කර ගනිති. (ගීතාවලිය 94:4)

**දෙවියන්වහන්සේගේ නාමය නිකරුණේ ව්‍යවහාර කෙරෙන වචන :**

නුඹේ දෙවි වූ ස්වාමින්වහන්සේගේ නාමය නිකරුනේ ව්‍යවහාර නොකරව, මක්නිසාද ස්වාමින්වහන්සේ තමන් නාමය නිකරුනේ ව්‍යවහාර කරන තැනැත්තා නිවැරදි කාරයෙකු කොට ගණන් නොගන්නා සේක. (නික්මයාම 20:7)

**ශාප කරන හා තිත්තකමේ වචන :**

ඔවුන්ගේ මුඛය ශාපයෙන්ද තිත්තකමෙන්ද පූර්ණය. (රෝම 3:14)

**බොරුව :**

දුෂ්ඨයෝ මව් කුස පටන් නොමග යති. ඔවුහු උපන් තැන් පටන් බොරු කියමින් මුළාව යති. (ගීතාවලිය 58:3).

ආඩම්බරයෙන් හා හෙළා දැක්මෙන් ධර්මිෂ්ඨයාට විරුද්ධව උඩගු ලෙස කථා කරන්නාවූ බොරු කියන තොල් නිශ්ශබ්ද වේවා. (ගීතාවලිය 31:18)

**කේලාම් වචන :**

නුඹ ඉඳගෙන නුඹගේ සහෝදරයාට විරුද්ධව කතා කෙරෙහිය, නුඹේම මෑණියන්ගේ පුත්‍රයාට විරුද්ධව කේලම් කියන්නෙහිය. (ගීතාවලිය 50:20)

**අන් අයට විරුද්ධව කතා කරන දුෂ්ඨ වචන :**

ඉන් නිසා මම ආවොත් ඔහු අපට විරුද්ධව දුෂ්ට වචන දොඩමින් කරන ක්‍රියාව සිහිකරවන්නෙමි. ඔහු එයිනුත් තෘප්තියට නොපැමිණ සහෝදරයන් පිළිනොගෙන, පිළිගන්ට කැමති වුවන් වළක්වා, සභාවෙන් ඔවුන් පහ කරන්නේය. (3 යොහන් 10)

**කොඳුරන වචන (ඕපා දූප) :**

ප්‍රයෝගකාර මනුෂ්‍යයා තරඟ පතුරුවන්නේය, කේලම් කියන්නාද හිත මිත්‍රයන් වෙන් කරන්නේය. (හිතෝපදේශ 16:28)

## කේලාම් කියමින් ඇවිදීම :

කේලම් කියමින් ඇවිදින්නා රහස් එළිදරව් කරයි, එහෙත් විශ්වාස සිතක් ඇත්තා කාරණය සඟවයි. (හිතෝපදේශ 11:13)

## ද්වේෂ සහගතව කතා කිරීම :

ඔහු තමාගේ දිවෙන් කේලම් නොකියයි. තමාගේ මිත්‍රයාට නපුර නොකරයි. තමාගේ අසල්වැසියාට විරුද්ධව නින්දා බසක් පතල නොකරයි. (ගීතාවලිය 15:3)

## ඇත්ත සඟවන වචන :

ඇත්ත සඟවන වචන බෙදීම් ඇති කරයි.

නුඹත් අඥානයාට සමාන නොවන පිණිස, ඔහුගේ මෝඩකමේ හැටියට ඔහුට උත්තර නොදෙන්න. (හිතෝපදේශ 26:4)

## විවාදයට පමුණුවන වචන :

අඥානයාගේ තොල් ඔහු විවාදයට පමුණුවයි, ඔහුගේ මුඛයද පහර වලට අඬ ගසයි. (හිතෝපදේශ 18:6)

## කලහකාර වචන :

මනුෂ්‍යයාගේ කුමන්ත්‍රණවලින් ඔබ හමුයෙහි වූ අප්‍රකාශස්ථානයෙහි ඔබ ඔවුන් සඟවන සේක. මුඛ විවාදයෙන් ඔවුන් විමානයෙක්හි රහස් ලෙස ආරක්ෂාකරනසේක. (ගීතාවලිය 31:20)

## භේද ඇති කරන වචන :

මුසාබස් නික්මවන බොරු සාක්ෂිකාරයාය, සහෝදරයන් අතරේ භේද පතුරුවන්නාය. (හිතෝපදේශ 6:19)

## විනාශ කරන්නාවූ වචන :

එම්බා කපටි දිව, නුඹ සියලු ආකාර නාස්තික වචන වලට ප්‍රිය ඇත්තෙහිය. (ගීතාවලිය 52:4)

## වංචාකාරී හා වංක වචන :

වංචා මුඛය නුඹෙන් පහකොට, වංක තොල් නුඹෙන් දුරු කරන්න. (හිතෝපදේශ 4:24)

## නපුරු රැවටිලිකාරී වචන :

නුඹේ කට නපුරට දී තිබේ, නුඹේ දිවද රැවටිලි යොදයි. (ගීතාවලිය 50:19)

නපුරු වූ කේලම්කාර මනුෂ්‍යයා පොළෙවෙහි ස්ථිර නොවන්නේය. (ගීතාවලිය 140:11)

## දුෂ්ට වචන :

**මාගේ ප්‍රාණය නසන්ට සොයන්නෝ මට මලපත් තබති, මට අන්තරායකරන්ට සොයන්නෝ නපුරු දේ කථාකරමින්, දවස මුළුල්ලේ ප්‍රයෝග යොදති. (ගීතාවලිය 38:12)**

**අශිෂ්ට කථාවන් :**

**නුමුත් දැන් නුඹලා ඒ සියල්ල කෝපය, උදහස, ක්‍රෝධය, අපහාසය, නින්දා කිරීම, නුඹලාගේ මුඛයෙන් නික්මෙන කැත කථාව-පහ කරපල්ලා. (කොලොස්සි 3:8)**

## දිව ජයගන්නාවූ ආත්මික ප්‍රති උපක්‍රම

දිව සමඟ කෙරෙන මහත් වූ සටන ගැන දාවිත් දැනගත් විට ඔහු මෙසේ කෑගැසීය :

**එම්බා වංචාකාර දිව, තට දිය යුත්තේ කිමෙක්ද? තට තවත් කරන්නේ කිමෙක්ද? (ගීතාවලිය 120:3)**

දිව සමග සටන් කිරීමේ එකම ක්‍රමය, දේව වචනයේ දි ඇති ආත්මික ප්‍රතිඋපක්‍රම භාවිත කිරීම වේ.

**ඔබගේ හදවත දෙවියන්වහන්සේ හා සමග නිවැරදි කර ගන්න. :**

දිව ජය ගැනිමේ පළමු පියවර වන්නේ, ඔබගේ හදවත දෙවියන්වහන්සේ හා සමග නිවැරදි කර ගැනිම මගිනි.

**නුමුත් කටින් පිටවෙන දේ නික්මෙන්නේ සිතින්ය, මනුෂ්‍යයා අපවිත්‍ර වන්නේ එයින්ය. මක්නිසාද නපුරු සිතුවිලි, මිනීමැරුම්, කාමමිථ්‍යාචාරකම්, වෙශ්‍යාකම්, සොරකම්, බොරු සාක්ෂිකීම් සහ අපහාසකිරීම් සිතින් නික්මෙන්නේය. මනුෂ්‍යයා අපවිත්‍රවෙන්නේ මේ දේවලින්ය. නුමුත් නොසේදූ අත් වලින් කෑවාට මනුෂ්‍යයා අපවිත්‍ර වෙන්නේ නැතැයි කී සේක. (මතෙව් 15:18-20)**

ඔබගේ මුඛය කතා කරන්නේ ඔබගේ හදවතෙහි ඇති දෙය වේ. ඔබගේ හදවත නිවැරදි නොවේ නම් ඔබගේ දිව එය එළිදරව් කරනු ඇත. ඔබගේ හදවත දෙවියන්වහන්සේ හා සමග නිවැරදි කර ගැනිම සඳහා ඔබගේ දිව භාවිත කරන්න.

**කුමක්හෙයින්ද යේසුස්වහන්සේ ස්වාමීන්වහන්සේ යැයි නුඹේ මුඛයෙන් ප්‍රකාශකරන්නෙහිනම්, දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම්, නුඹ ගළවනු ලබන්නෙහිය. මක්නිසාද මනුෂ්‍යයා ධර්මිෂ්ඨකම පිණිස සිතින් අදහාගන්නේය: ගැලවීම පිණිස මුඛයෙන් කියා දෙන්නේය. (රෝම 10:9-10)**

**ඔබගේ වගකීම හඳුනාගන්න. :**

ඔබගේ මුඛයෙන් නික්මෙන වචන පිළිබඳව ඔබ වගකිව යුතු බව පිළිගන්න.

**තවද මනුෂ්‍යයන් කියන්නාවූ සියලු නිශ්ඵල වචන ගැන විනිශ්චය දවසේදී උත්තරදෙන්ට වෙන්නේයයි නුඹලාට කියමි. මක්නිසාද නුඹේ වචන වලින් නුඹ නිදොස් කරනු ලබන්නෙහිය, නුඹේ වචන වලින් නුඹ වරදට පත් කරනු ලබන්නෙහියයි කීසේක. (මතෙව් 12:36-37)**

**එවිට ඔහු කථා කොට : දුෂ්ටවූ දාසය, නුඹේම කටින් නුඹ විනිශ්චයකරමි. මා නොතිබූ දේ ගන්නා වූ, නොවපුළ දේ කපන්නාවූ, කර්කස කෙනෙක් බව නුඹ දැනගෙන සිටියෙහිය. (ලූක් 19:22)**

**ඔබගේ වචන ශුභාරංචියේ කැඩපතක් බව වටහා ගන්න :**

ඔබගේ දිව නොවැදගත් බව ඔබ විශ්වාස කරන තෙක්, ඔබට එය පාලනය කළ නොහැකිය. ඔබගේ සාකච්ඡාවන් යේසුස්වහන්සේගේ ශුභාරංචිය පිළිබිඹු කරන බව වටහාගන්න.

> **...මට අසන්ට පුළුවන් වන පිණිස, ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචියට ඔබින ලෙසම හැසිරෙන්න. (පිල්ප්පි 1:27)**

මේ නිසා ඔබගේ කතාබහවලදී ඔබ ආදර්ශමත් විය යුතුය

> **නුඹේ යෞවන කම සුළු කරන්ට කිසිවෙකුට ඉඩ නැර, කථාවෙනුත් හැසිරීමෙනුත් ප්‍රේමයෙනුත් ඇදහිල්ලෙනුත් පිරිසිදුකමිනුත් අදහන්නන්ට නුඹම ආදර්ශයක් වෙන්න. (1 තිමෝති 4:12)**

ඔබගේ මුඛයෙන් පිටවෙන දෙය දෙස මිථ්‍යාදෘෂ්ටීන් බලා සිටිනු ඇත.

> **එකල අපේ කට සිනාවෙන්ද අපේ දිව ගායනාවෙන්ද පිරුණේය, එකල: ස්වාමීන්වහන්සේ මොවුන් උදෙසා මහත් දේ කළසේකැයි ජාතීන් අතරේ කියනලද්දේය. (ගීතාවලිය 126:2)**

සැබැවින්ම ඔබේ කතා බහ මගින් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට මිනිසුන් දිනා ගැනීමට ඔබට පුළුවන

> **එසේම, භාර්යාවරුනි, නුඹලාගේ පුරුෂයන්ගෙන් සමහරෙක් වචනයට අකීකරුව සිටිතත්, ඔවුන් නුඹලාගේ පිරිසිදුවූ යටහත් හැසිරීම දුටුවාම, වචනය නැතුව භාර්යාවන්ගේ හැසිරීම කරණකොටගෙන දිනාගන්නා පිණිස, ඔවුන්ට යටත්වෙයල්ලා. (1 පේතෘස් 3:1-2)**

### ඔබගේ වචන සරල හා ස්වල්පයක් විය යුතුය :

> **වචන බහුල වූ කල වරද හිඟ නැත, එහෙත් තමාගේ තොල් ආණ්ඩු කරගන්නා නුවණ ඇති කෙනෙක්ය. (හිතෝපදේශ 10:19)**

> **නුඹලාගේ වචනය: එසේය, එසේය කියාද, නැත, නැත කියාද වේවා. මීට වැඩි වූ යමක් ඇත්ද එය නපුරාගෙන් වේ. (මතෙව් 5:37)**

### කතා කිරීමට පෙර සිතා බලන්න :

> **මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, නුඹලා මේක දන්නහුය. නුමුත් එක එක මනුෂ්‍යයා ඇසීමට ඉක්මන්වේවා, කථා කිරීමටත් උදහස්වීමටත් ප්‍රමාද වේවා. (යාකොබ් 1:19)**

> **නුඹ උඩඟු වීමෙන් මෝඩකම් කළෙහි නම්, නොහොත් නපුරක් සිතුවෙහි නම්, අතින් කට වසා ගනින්න. (හිතෝපදේශ 30:32)**

> **ධර්මිෂ්ඨයාගේ සිත උත්තරදෙන පිණිස විමසා බලයි. එහෙත් දුෂ්ටයාගේ මුඛය නපුරුකම් වගුරුවයි. (හිතෝපදේශ 15:28)**

> **මෝඩයෙක් පවා නිශ්ශබ්දව සිටින විට ප්‍රඥාවන්තයෙකු මෙන්ද, ඔහු තමාගේ තොල් පියාගන සිටින විට තේරුම් ඇත්තෙකු මෙන්ද සලකනු ලැබේ. (හිතෝපදේශ 17:28)**

### වෙන්ව සිටින්න :

තමාගේ දිව පාලනය කරගත නොහැකි අයගෙන් වෙන්ව සිටින්න.

> **අඥානයා ඉදිරියට පලයන්න, එවිට ඔහුට දැනගැන්මේ තොල් නැති බව නුඹට පෙනෙන්නේය. (හිතෝපදේශ 14:7)**

### සාමයේ වචන වල බලය අත්හදා බලන්න :

කෝපයේ වචනවලට වඩා සාමයේ වචන බොහෝ සේ බලවත්ය.

**ඉවසිලිවන්තකමින් ආණ්ඩුකාරයෙකු නමා ගත හැක, මොළොක් දිවෙන් ඇට බිඳෙයි. (හිතෝපදේශ 25:15)**

## ඔබගේ දිව ආයුධයක් බව වටහාගන්න :

සතුරාගෙන් පරාජය නොවී සතුරා ජය ගැනීමට ආයුධයක් ලෙස ඔබට දිව භාවිත කළ හැකිය.

**ඔවුහු බැටළු පැටවාණන්ගේ ලේ නිසාද තමුන්ගේ සාක්ෂියේ වචනය නිසාද ඔහුගෙන් (සාතන්ගෙන් ) ජය ගත්තෝය. (එළිදරව් 12:11)**

ඔබ ඔබගේ දිව පාලනයකර ගතහොත්, ඔබට බොරු චෝදනා ගෙන එන්නවුන් ලජ්ජාවට පත් කළ හැකිය.

**නුඹලා නපුර කරන්නොහු යැයි නුඹලාට විරුද්ධව කථා කරන නුමුත්, ක්‍රිස්තුස්වහන්සේ තුළ තිබෙන නුඹලාගේ යහපත් හැසිරීමට දොස් තබන්නන් ලැජ්ජාවට පැමිණෙන පිණිස, යහපත් හෘදය සාක්ෂියක් ඇතුව සිටින්න. (1 පේත්‍රුස් 3:16)**

## ඔබගේ දිව පාලනයකර ගන්න:

දෙවියන් වහන්සේ උපකාරය ඇතිව ඔබට ඔබගේ දිව පාලනයකර ගත හැකිය. එහෙත් ඔබගේ දිව පාලනය කර ගැනීමට **ඔබ** ක්‍රියා කළ යුතුය. පහත දැක්වෙන පදවලින් **ඔබ** ගත යුතු ක්‍රියාවන් පෙන්නුම් කෙරේ.

**මක්නිසාද: ජීවිතයට ඇලුම්වෙන්ටත් යහපත් දවස් දකින්ටත් කැමති තැනැත්තේ තමාගේ දිව නපුරෙන්ද තමාගේ තොල් වංචා කථාකිරීමෙන්ද වළක්වා ගනීවා. (1 පේත්‍රුස් 3:10)**

**කිසිවෙකු ගැන අගුණ නොකියන්ටද, ඩබරකාරයන් නොවී ඉවසිලිවන්තව සිට, සියලු මනුෂ්‍යයන් ගැන සියලු ආකාර මොළොක්ගුණය පෙන්වන්ටද ඔවුන්ට සිහිකරවාපන්න. (තීතස් 3:2)**

**සහෝදරයනි, එකිනෙකාට විරුද්ධව කථා නොකරල්ලා. සහෝදරයෙකුට විරුද්ධව කථා කරන්නා නොහොත් තමාගේ සහෝදරයා විනිශ්චයකරන්නා ව්‍යවස්ථාවට විරුද්ධව කථා කරන්නේය. ව්‍යවස්ථාව විනිශ්චයකරන්නේය. ඉදින් නුඹ ව්‍යවස්ථාව විනිශ්චයකරන්නෙහි නම්, නුඹ ව්‍යවස්ථාව පවත්වන්නෙක් නොව විනිශ්චයකාරයෙක්ය. නීතිදායකයාද විනිශ්චයකාරයාද එක්කෙනෙක්ය, එනම් ගළවන්ටත් විනාශ කරන්ටත් පුළුවන් තැනැන්වහන්සේය. නුමුත් නුඹේ අසල්වාසියා විනිශ්චය කරන නුඹ කවුද? (යාකොබ් 4:11-12)**

**නුඹලාට ඇති දෙයින් සතුටුවී, වස්තු තෘෂ්ණාවෙන් තොරව සිටපල්ලා. මක්නිසාද: මම කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි, කිසි අන්දමකින්වත් නුඹ අත් නොහරිමියි උන්වහන්සේම කියා තිබේ. (හෙබ්‍රෙව් 13:5)**

**... නුඹලා එකම ආත්මයෙන් ස්ථිරව, එක සිතකින් ශුභාරංචියේ ඇදහිල්ල ගැන වීර්යකරමින්, විරුද්ධව සිටින්නන්ට කිසිවක් ගැන භිත නොවී සිටින බව මට අසන්ට පුළුවන් වන පිණිස, ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියට ඔබින ලෙසම හැසිරෙන්න. (පිලිප්පි 1:27)**

**(එසේ ඉගෙනගත්තේ) නුඹලාගේ ජීවිතයේ පළමු හැසිරීම ලෙස රැවටිල්ලේ තෘෂ්ණාවල් අනුව දුෂ්‍යවන්නාවූ පරණ මනුෂ්‍යයා පහකරදමා, නුඹලා නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත් කරනු ලැබ, සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද ශුද්ධකමින්ද දෙවියන්වහන්සේට සමානව මවනලද්දාවූ අලුත් මනුෂ්‍යයා පැළඳ ගන්නා ලෙසය. එහෙයින් බොරු කීම අත්හැර දමා එක් එක්කෙනා තම තමාගේ අසල්වාසියා සමඟ සැබෑව කථාකරපල්ලා. මක්නිසාද අපි එකිනෙකාගේ අවයවයෝය. (එපීස 4:22-25)**

නුමුත් දැන් නුඹලා ඒ සියල්ල කෝපය, උදහස, ක්‍රෝධය, අපහාසය, නින්දාකිරීම, නුඹලාගේ මුඛයෙන් නික්මෙන කැත කථාව-පහකරපල්ලා. (කොලොස්සි 3:8)

නුඹලාගේ මුඛයෙන් කිසි දූෂ්‍ය කතාවක් නික්මෙන්ට ඉඩ නැර, අසන්නන්ට ප්‍රයෝජන ලැබෙන පිණිස ඕනෑකරන වර්ධනවීම සඳහා යහපත් දේම කියන්න. (එපීස 4:29)

නුඹලා කැඳවූ තැනැත්වහන්සේ ශුද්ධව සිටින්නාක්මෙන් නුඹලාත් නුඹලාගේ මුළු හැසිරීමේදී ශුද්ධව සිටින්න. මක්නිසාද: මා ශුද්ධව සිටින හෙයින් නුඹලාත් ශුද්ධව සිටිය යුතුයයි ලියා තිබේ. (1 පේත්‍රුස් 1:15-16)

වංචා මුඛය නුඹෙන් පහකොට, වංක තොල් නුඹෙන් දුරු කරන්න. (හිතෝපදේශ 4:24)

නුඹේ දිව නපුරෙන්ද, නුඹේ තොල් වංචා කථාවෙන්ද වලක්වා ගනුව. (ගීතාවලිය 34:13)

මාගේ දිවෙන් පව් නොකරන පිණිස මාගේ හැසිරීම බලාගන්නෙමියි කියාත්, දුෂ්ටයා මා ඉදිරියෙහි සිටින අතර කටකලියාවකින් මාගේ මුඛය රැකගන්නෙමියි කියාත් කීයෙමි. (ගීතාවලිය 39:1)

ස්තුති පූජා කරන තැනැත්තේ මට ගෞරවකරයි, ස්වකීය හැසිරීම හරිලෙස පවත්වා ගන්නාට දෙවියන්වහන්සේගෙන් ලැබෙන ගැළවීම දක්වන්නෙමි. (ගීතාවලිය 50:23)

තාගේ දෙවි වූ ස්වාමින්වහන්සේගේ නාමය නිකරුණේ ව්‍යවහාරනොකරව: මක්නිසාද ස්වාමින්වහන්සේ තමන් නාමය නිකරුණේ ව්‍යවහාර කරන තැනැත්තා නිවැරදිකාරයෙකුකොට ගණන් නොගන්නාසේක. (නික්මයාම 20:7)

නුඹේ අසල්වාසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියව. (නික්මයාම 20:16)

### ඔබගේ කතා බහ යේසුස්වහන්සේගේ මෙන් කර ගන්න :

යේසුස්වහන්සේ කරුණාවන්ත වචන භාවිත කළ සේක.

සියල්ලෝ උන්වහන්සේට සාක්ෂිදෙමින්, උන්වහන්සේගේ මුඛයෙන් නික්මුණු කරුණාවේ වචන ගැන පුදුමව: මොහු යෝසෙප්ගේ පුත්‍රයා නොවේදැයි කීවෝය. (ලූක් 4:22)

උන්වහන්සේ දෙවියන්වහන්සේ ගැන ආධිපත්‍යය ඇතිව කථා කළ සේක.

උන්වහන්සේගේ ඉගැන්වීම ගැන ඔව්හු විස්මිතවූවෝය. මන්නිසාද උන්වහන්සේ ලියන්නන් මෙන් නොව බලය ඇති කෙනෙකු මෙන් ඉගැන්වූසේක. (මාක් 1:22)

උන්වහන්සේගේ මුඛයෙහි වංචාවක් (පාපි කතාවක්) නොතිබිණි.

උන්වහන්සේ කිසි පාපයක් නොකළසේක, උන්වහන්සේගේ මුඛයෙහි වංචාවක්ද සම්බවුණේත් නැත, උන්වහන්සේ නින්දා කරනු ලැබූ කල නින්දා නොකළසේක: වධවින්ද කල තර්ජන නොකර, ධර්මිෂ්ඨලෙස විනිශ්චය කරන තැනැත්වහන්සේට කාරණය භාර දුන් සේක.
(1 පේත්‍රුස් 2:22-23)

### යහපත් දේ සඳහා ඔබගේ දිව භාවිත කරන්න :

ප්‍රඥාවන්ත හා කරුණාවන්ත වචන කතා කරන්න.

ඈ නුවණින් යුක්තව ඇගේ මුඛය විහිදන්නීය, ඇගේ දිවෙහි කරුණාවන්ත දැනමුතුකම් තිබේ. (හිතෝපදේශ 31:26)

මාගේ මුඛය ඥානය කථාකරන්නේය, මාගේ සිතේ භාවනාකිරීම ප්‍රඥාව ගැන වන්නේය. (ගීතාවලිය 49:3)

දෙවියන්වහන්සේ ගැන කතා කරන්න.

**මම ඔබගේ ගෞරවයේ තේජෝමහිමයත් ඔබගේ පුදුම ක්‍රියාත් මෙනෙහිකරන්නෙමි. (ගීතාවලිය 145:5)**

**මාගේ මුඛය දවස මුළුල්ලේ ඔබගේ ධර්මිෂ්ඨකම හා ඔබගේ ගැළවීම ප්‍රකාශකරන්නේය. මක්නිසාද එහි ගණන නොදනිමි. (ගීතාවලිය 71:15)**

**මාගේ දිවද දවස මුළුල්ලේම ඔබගේ ධර්මිෂ්ඨකම ගැන කථා කරන්නේය. (ගීතාවලිය 71:24)**

දෙවියන්වහන්සේගේ වචන ගැන කතා කරන්න.

**ඔබගේ සියළු ආඥා ධර්මිෂ්ඨකම වන බැවින් මාගේ දිව ඔබගේ වචනය ගැන ගී කියාවා. (ගීතාවලිය 119:172)**

**ඔබගේ මුඛයේ සියලු විනිශ්චයන් මාගේ තොල් වලින් ප්‍රකාශකෙළෙමි. (ගීතාවලිය 119:13)**

**රජුන් ඉදිරියෙහිත් ඔබගේ ශික්ෂා ගැන ලජ්ජා නොවී කථාකරන්නෙමි. (ගීතාවලිය 119:46)**

දේව වචනයෙන් සැනසිලිදායක වචන කතා කරන්න.

**ඉන් නිසා මේ වචනවලින් එකිනෙකා සනසාගනිල්ලා. (1 තෙසලෝනික 4:18)**

දේව රාජ්‍යය ගැන කතා කරන්න.

**දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියාත් උන්වහන්සේගේ රාජ්‍යයේ තේජෝමහිමයත් මනුෂ්‍ය පුත්‍රයන්ට දන්වන පිණිස. (ගීතාවලිය 145:11)**

## දෙවියන්වහන්සේට කෙරෙන ප්‍රශංසා වලින් ඔබගේ තොල් පිරේවා :

**මාගේ මුඛය ස්වාමීන්ගේ ප්‍රශංසාව කියන්නේය: මාංසමයවූ සියල්ලෝද සදාකාලේටම උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට ප්‍රශංසා කෙරෙත්වා. (ගීතාවලිය 145:21)**

**ඔවුන්ගේ මුඛවල දෙවියන්වහන්සේට උතුම් ප්‍රශංසාද අතෙහි දෙමුවහත් කඩුවක්ද වේවා. (ගීතාවලිය 149:6)**

**ස්වාමීන්ගේ කරුණාවන් ගැන සදාකල් ගීතිකාකරන්නෙමි, මාගේ කටින් ඔබගේ විශ්වාසකම සියලු පරම්පරාවලට දන්වන්නෙමි. (ගීතාවලිය 89:1)**

**මාගේ මුවින් ස්වාමීන්ට බොහෝසෙයින් ස්තුති කරන්නෙමි, එසේය, සමූහයා අතරේදී උන්වහන්සේට ප්‍රශංසාකරන්නෙමි. (ගීතාවලිය 109:30)**

**ඔබගේ පනත් ඔබ මට උගන්වන බැවින් මාගේ තොල් ප්‍රශංසාව ප්‍රකාශ කෙරේවා. (ගීතාවලිය 119:171)**

**මක්නිසාද ඔබගේ කරුණාගුණය ජීවිතයට වඩා යහපත: මාගේ තොල් ඔබට ප්‍රශංසාකරන්නේය. (ගීතාවලිය 63:3)**

**මාගේ යහනේදී ඔබ සිහි කරන කලද, රැයාම් වලදී ඔබ මෙනෙහි කරන කලද... මාගේ මුඛයද ප්‍රීතිමත් තොල්වලින් ඔබට ප්‍රශංසාකරන්නේය. (ගීතාවලිය 63:5,6)**

**මාගේ මුඛයෙන් උන්වහන්සේට මොරගැසීමි, මාගේ දිවෙන් උන්වහන්සේ උසස් කරනු ලැබූ සේක. (ගීතාවලිය 66:17)**

**මාගේ මුඛය දවස මුළුල්ලේ ඔබට ප්‍රශංසා කිරීමෙන්ද ගෞරවකිරීමෙන්ද පිරෙන්නේය. (ගීතාවලිය 71:8)**

**මා විසින් ඔබට ප්‍රශංසා ගී කියන කල මාගේ තොල්ද ඔබ මිදුවාවූ මාගේ ආත්මයද බොහෝ කොට ප්‍රීතිවන්නේය. (ගීතාවලිය 71:23)**

**සැම කල්හිම ස්වාමීන්ට ප්‍රශංසා කරමි. උන්වහන්සේගේ වර්ණනාව මාගේ මුඛයෙහි නිතරම පවත්නේය. (ගීතාවලිය 34:1)**

## කතා කිරීමට පෙර මෙම ප්‍රශ්න අසන්න :

1. මා මේ පවසන්නට යන දෙයින් දෙවියන්වහන්සේට මහිමය ලැබේවිද?
   **තවද නුඹලා වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ මොකක් කරතත්, සියල්ලම ස්වාමීන් වූ යේසුස් වහන්සේගේ නාමයෙන් කරමින්, උන්වහන්සේ කරණකොටගෙන පියවූ දෙවියන්වහන්සේට ස්තුති කරන්න. (කොලොස්සි 3:17)**
2. මෙය සත්‍යයද?
3. මෙය අදාල සියලු දෙනාට සාධාරණද?
4. මෙය අදාළ සියලු දෙනාට වැඩදායක වේද?
5. මෙමගින් අන් අය ගොඩ නැගෙයිද? (වඩා යහපත් මිත්‍රත්වයක් හා හොඳහිතක් ලැබේවිද)
6. ඔබ වෙනත් කෙනෙකු ගැන කතා කරන්නෙහි නම්, ඔබ ඇයට හෝ ඔහුට ඒ දෙයම පැවසුවේද?
7. ඔබ පවසන දෙය සත්‍යයක් බව ඔබ දන්නෙහිද ? නැතහොත් ඔබ ඇසූ කට කතාවලින් ඔබ තීරණයක් ගෙන තිබේද?
8. ඔබට, ඔබගේ සහෝදරයාට හෝ සහෝදරීට හෝ විරුද්ධව යමක් ඇත්නම්, එය වෙනත් අය සමග සාකච්ඡා කිරීමට පෙර ඒ ගැන ඔවුන් සමඟ එකඟතාවකට පැමිණීමට ඔබ උත්සාහ කළෙහිද?
9. ඔබ මෙය පැවසීම අත්‍යාවශ්‍යද?

## මෙම පද මතක තබා ගන්න :

**මක්නිසාද, ස්වාමීනි, ඔබ මුළුමනින්ම නොදන්නා වූ කිසි වචනයක් මාගේ දිවේ නැත්තේය. (ගීතාවලිය 139:4)**

**සිතින් ප්‍රඥාවත් අය බුද්ධිමත් කෙනෙකැයි කියනු ලබන්නේය: තොල්වල මිහිරිකමින්ද ඉගෙනගැන්ම වැඩිවේ. (හිතෝපදේශ 16:21)**

**ඥාණවන්තයාගේ සිත ඔහුගේ මුඛයට උගන්වා, ඔහුගේ තොල්වලට ඉගෙනගැන්ම එකතු කරයි. (හිතෝපදේශ 16:23)**

**මනුෂ්‍යයෙකුට තමාගේ මුඛයේ උත්තරයෙන් ප්‍රීතිය ලැබේ: කලට සුදුසු වචනය කොපමණ හොඳද! (හිතෝපදේශ 15:23)**

**මේ සියල්ල මෙසේ නාස්තිවෙන්ට තිබෙන බැවින්, නුඹලා දෙවියන්වහන්සේගේ දවස පැමිණීම බලාසිටිමින්ද ඒ ගැන උනන්දුව ක්‍රියා කරමින්ද සියලු ආකාර ශුද්ධවූ හැසිරීමෙහිත් භක්තිවන්තකමෙහිත් කොයි ආකාර අයවල්ව සිටින්ට ඕනෑද? (2 පේත්‍රුස් 3:11)**

**කලට සුදුසු වචනය රිදී කර්මාන්තවල තිබෙන රන් ජම්බුමෙනි. (හිතෝපදේශ 25:11)**

**තමාගේ මුඛයත් දිවත් රැකවල්කරගන්නා තමාගේ ප්‍රාණය විපත්තිවලින් රැකගන්නේය. (හිතෝපදේශ 21:23)**

**කට රැකගන්නා තමාගේ ජීවිතයද රැකවල්කරගනී: එහෙත් බොහෝසෙයින් කට අරින්නා විනාශයට පැමිණේයි. (හිතෝපදේශ 13:3)**

## මෙම පොරොන්දු ඉල්ලන්න :

අසාපල්ලා, මක්නිසාද මම උතුම් කාරණා කියන්නෙමි: මාගේ තොල්වලින්ද හරි කරුණු නික්මෙන්නේය. එසේය, මාගේ කට සැබෑව කියනවා ඇත: දුෂ්ටකමද මාගේ තොල්වලට පිළිකුලක්ය. මාගේ මුඛයේ සෑම වචන ධර්මිෂ්ඨය: ඒවා අතරෙහි වංකවූ හිතුවක්කාරවූ කිසිවක් නැත. (හිතෝපදේශ 8:6-8)

## මෙම යාච්ඤාවන් යාච්ඤා කරන්න.

ස්වාමීනි, මාගේ කටෙහි රැකවලක් තබා, මාගේ තොල් නැමැති දොර රක්ෂාකල මැනව. (ගීතාවලිය 141:3)

මාගේ පර්වතයද මිදුම්කාරද වූ ස්වාමීනි, මාගේ මුඛයෙහි වචන හා සිතෙහි භාවනාද ඔබ ඉදිරියෙහි පිළිගැනීමට සුදුසු වේවා. (ගීතාවලිය 19:14)

## මෙම පරමාර්ථය පිහිටුවන්න :

ඔබ මාගේ සිත පරීක්ෂාකළසේක: රාත්‍රියෙහි මා බැලූ සේක. ඔබ මා විමසූ සේක, මා තුළ කිසි නපුරු අදහසක් නොදක්නාසේක: මාගේ මුඛයෙන් වරද නොකරන්ට නියම කර ගතිමි. (ගීතාවලිය 17:3)

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. මෙම පරිච්ඡේදයේ සාකච්ඡා කළ ආත්මික සටන පිළිබඳ විෂය කුමක්ද ?

3. ආත්මික සටනින් ඔබ පරාජය කිරීමට සාතන් ඔබගේ දිව යොදා ගැනීමට උත්සාහ කරන මාර්ග හඳුනා ගන්න.

4. දිව, සාතන්ගේ පාලනයෙන් ජය ගැනීමට භාවිත කෙරෙන ආත්මික ප්‍රති උපක්‍රම සාරාංශ ගත කරන්න.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# දක්ෂ ලෙෂ හැසිරවූ උපාය මාර්ග

බයිබලයේ ගීතාවලිය හා හිතෝපදේශ පොත් වල දිව පිළිබඳව බොහෝ දේ සඳහන්ව ඇත.

1. මෙහි සඳහන් හිතෝපදේශ සෑම පදයක්ම බලන්න. සැසැඳුම්, චාට් සටහනෙහි ලියන්න. නිදසුනක් ලෙස පළමුවැන්න සඳහන් කර ඇත.

| හිතෝපදේශ යොමුව | යහපත් දිව | නපුරු දිව |
|---|---|---|
| 10:6 | ආශිර්වාද | හිංසාව |
| 10:11 | | |
| 10:14 | | |
| 10:20 | | |
| 10:21 | | |
| 10:31 | | |
| 10:32 | | |
| 11:9 | | |
| 11:11 | | |
| 11:13 | | |
| 12:6 | | |
| 12:13 | | |
| 12:17 | | |
| 12:18 | | |
| 12:19 | | |
| 12:22 | | |
| 13:3 | | |
| 14:3 | | |
| 14:5 | | |
| 14:25 | | |
| 15:2 | | |
| 15:4 | | |
| 15:7 | | |
| 15:14 | | |
| 15:28 | | |
| 17:9 | | |
| 19:1 | | |

2. දෙවියන්වහන්සේ විශේෂයෙන්ම ද්වේශ කරන කරුණු හතක් හිතෝපදේශ 6:16-19 හි සඳහන්ව ඇත. ඒවා අතුරින් දිව මගින් කෙරෙන තුන කවරේද?

3. ගීතාවලිය හා හිතෝපදේශ පොත් කියවා පහත දැක්වෙන දේ කරන්න.

අ. දිව වැරදි විදියට භාවිත කරන බව සඳහන් පදවල ලයිස්තුවක් සකස් කරන්න. පහත දැක්වෙන රටාව අනුව ඔබගේ ලැයිස්තුව සකස් කරන්න.

| යොමුව | දිව වැරදි විදියට භාවිත කිරීම |
|---|---|
| ගීතාවලිය 5:9 | චාටු බස් කීම |
| ගීතාවලිය 10:7 | ශාප කිරීම හා රැවටිල්ල |

(මෙම ලයිස්තුව සම්පූර්ණ කරන්න)

ආ. දිව නිවැරදිව භාවිත කරන ආකාරය දැක්වෙන තවත් ලයිස්තුවක් සකස් කරන්න. පහත දැක්වෙන රටාව අනුගමනය කරන්න.

| යොමුව | දිව නිවැරදිව භාවිත කිරීම |
|---|---|

| | |
|---|---|
| ගීතාවලිය 19:14 | පිළිගත හැකි වචන |
| ගීතාවලිය 34:1 | නිරන්තරයෙන්ම දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම හා ආශිර්වාද කිරීම |

(මෙම ලයිස්තුව සම්පූර්ණ කරන්න)

4. "බොරු ප්‍රවෘත්තියක් පතළ නොකරන්න" (නික්මයාම 23:1) මෙම පදයේ "පතළ" යන වචනයෙන් අදහස් වන්නේ ලබාගැනීම හෝ පැවසීම නොකළ යුතු බවය. අප බොරු ප්‍රවෘත්තිවලට සවන් නොදිය යුතු අතර පැතිරවීමද නොකළ යුතුය. පිලිප්පි 4:8න් පෙන්නුම් කරන්නේ අප යහපත් වාර්තා ගැන පමණක් සිතිය යුතු බවය. යම් කෙනෙක් නපුරු වාර්තාවක් ගෙන එන්නේදැයි දැනගැනීමේ ක්‍රම කීපයක් පහත දැක්වේ :

## නපුරු වාර්තාවක් ...

- දෙවියන්වහන්සේ තුළ සිටින අනෙකුත් සහෝදර සහෝදරියන්ගේ ක්‍රියාවන් පිළිබඳව හෝ චේතනාවන් පිළිබඳව හෝ ප්‍රශ්න නගයි.
- ආත්මික නායකත්වයට අවමන් කරයි.
- බෙදීම් හා ගැටුම් ඇති කරයි. එකිනෙකා සමග අප සටන් කරන විට නියම සතුරා වූ සාතන් සමග ප්‍රබල සටනක යෙදීම අපට නොහැකිය.
- සෑම විටම ඍණාත්මක දේ කෙරෙහි අවධානය යොමු කරයි.

## නපුරු වාර්තාවක් බිහිවන්නේ මෙම චේතනාවන් නිසාය ...

- උඩඟුකම : තමාවම උසස් කර ගැනීමට, පුද්ගලයෙක් තවත් කෙනෙකුව පහත දමයි.
- ඊර්ෂ්‍යාව හා තන්හාව : යම් පුද්ගලයෙකුට වෙනත් කෙනෙකුට අයත් දේ අවශ්‍ය රහසිගතව විය හැකිය. එවිට ඔහු ඔවුන්ව විවේචනය කරයි.
- වැරදිකරුවෙකු වීම : මිනිස්සු තම වරද අනුන් පිට පටවති. තම පාපයන් හා අසාර්ථකවීම් ගැන කෙනෙක් වරදකරු විය හැකිය. එවිට ඔහු එම වරද වෙනත් කෙනෙකු යයි පවසයි.
- කැරළිගැසීම : කැරලිකාර ආත්මය නායකත්වය ඉලක්ක කරගනී. බයිබලයේ අබ්සලොම් පිළිබඳ කතාව කියවන්න (2 සාමුවෙල් 15). කැරළිකාරකම මගින් පොළඹවන ලද නපුරු වාර්තාවක් හැඳින ගැනීමේ එක් ක්‍රමයක් වන්නේ අබ්සලොම් ගේ ප්‍රකාශය භාවිත කිරීමය. "මම නායකයා වුයේ නම් මම.... කරමි"
- තිත්තකම : යම් පුද්ගලයෙකුට සිත් පීඩිමක් සිදුවී ඇත. එවිට ඔහු වචන භාවිතයෙන් තවත් කෙනෙකුට රිද්දවයි.

## නපුරු වාර්තාවක් හැඳිනගන්නේ කෙසේද?

- ඔහු පළමුව ඔබව පරීක්ෂා කරනු ඇත. "ඔබ----------- ගැන කුමක් සිතන්නෙහිද ? " වැනි ප්‍රශ්නයක් ඔවුන් ඇසිය හැකිය. නපුරු වාර්තාව ඉදිරියට ගෙන යාමට පෙර ඔවුන් ඔබගේ හැඟීම් පරීක්ෂා කර බලයි.

- ඔබගේ කුතුහලය අවස්සනු ඇත. ඔවුන් මෙසේ පැවසිය හැකිය. " -------------ගැන මා ඇසූ දෙය ඔබ විශ්වාස නොකරනු ඇත." නැතහොත් "-------------- ගැන ඔබ දන්නෙහිද?" ඔවුන් දන්නා දේ ඔබ අසා දැන ගැනීමට ඔබගේ කුතුහලය පෙළඹවීම ඔවුන්ට අවශ්‍යය.

- ඔවුන් සත්‍ය කතාව දන්නා බව හෝ රහස් දේ දැනගැනීමට ඔවුන්ට හැකි බව හෝ අභ්‍යන්තර තොරතුරුවලට ඔවුන්ට ඇති බව ඔවුන් පවසනු ඇත. මෙය ඔබගේ ආඬම්බරයට ආයාචනා කරයි. එවැනි තොරතුරු දන්නා සුවිශේෂී කණ්ඩායමකට ඇතුළුවීම ඔබට අවශ්‍ය වේ.

- උපදෙස් ලබා ගැනීමට කෙරෙන ඉල්ලීමක් ලෙස මෙය ඔබට පිළිගන්වනවා ඇත. "මේ පිළිබඳව ඔබගේ අදහස් මට අවශ්‍යය..", ඉන්පසු ආත්මික උපදෙස් ලබා ගන්නා මුවාවෙන් නපුරු වාර්තාවක් ඔබ සමග බෙදා ගනු ඇත.

- යාච්ඤා ඉල්ලීමක් ලෙස වුවද නපුරු වාර්තාවක් බෙදා ගතහැකිය. "අපි සැබවින්ම ------- ගැන යාච්ඤා කළ යුතු වෙමු. මන්ද ------------" යැයි පවසා, ඉන්පසු යම් පුද්ගලයෙකු ගැන ඕපාදූප කියනු ඇත.

- යම් තැකීමක් තිබෙන මුවාවෙන් නපුරු වාර්තාවක් ගැන අදහස් ප්‍රකාශ කළ හැකිය "මම--------- ගැන තදින් සැලකිලිමත් වෙමි " යි පවසමින් කතාව ආරම්භ කරනු ඇත. එය නපුරු වාර්තාවේ හැඳින්වීමයි. ඉන්පසු ඉතිරි දේවල් ඉදිරිපත් කෙරේ.

## නපුරු වාර්තාවක් නවත්වන්නේ කෙසේද?

- ඔබට වාර්තාව ගෙනෙන පුද්ගලයාගෙන් මෙම ප්‍රශ්න අසන්න:

- "මම මෙම දේ **මට** පවසන්නේ මන්ද?"

- "ඔබට මෙම තොරතුරු ලැබුනේ කෙසේද?" (නපුරු වාර්තාවක් ගෙනෙන පුද්ගලයෙකු සාමාන්‍යයෙන් එය ලැබුණු අයුරු පවසන්නේ නැත)

- "මතෙව් 18:15-17 හි ඇති ප්‍රතිපත්ති අනුව ඔබ කතා කරන පුද්ගලයා වෙත ඔබ ගියෙහිද?

- "ඔබ එම කරුණු පරීක්ෂා කර බැලුවෙහිද? නැතහොත් ඔබ අනුන්ගේ කතාවක් කියන්නෙහිද?"

- "මේ තොරතුරු පරීක්ෂා කර බලන විට, මට ඔබ ගැන සඳහන් කළ හැකිද?"

- "පිලිප්පි 4:8 හි සඳහන් දේවල් අනුව මේ දේවල් ගැළපිය හැකිද?"

නැතහොත් ඔබට මෙසේ පැවසිය හැකිය.

- "මට මෙයට සවන් දීමට අවශ්‍ය නැත"

# දහහත්වන පරිච්ඡේදය

## පවුරු මත කෙරෙන සටන

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "ආත්මික පවුරු" යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- ආත්මික පවුරු විනාශ වීමට හේතුන් පැහැදිලි කිරීමට
- ආත්මික පවුරුවලට පහරදීමට සාතන් යොදාගන්නා උපක්‍රම හඳුනා ගැනීමට
- පවුරු අසලදී ජයග්‍රහණය තහවුරු කෙරෙන ආත්මික ප්‍රතිඋපක්‍රම හඳුනාගැනීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **එවිට මම ඔවුන්ට උත්තරදෙමින්: ස්වර්ගයේ දෙවියන්වහන්සේම අපේ කාරණය සඵලකරනවා ඇත. එබැවින් උන්වහන්සේගේ සේවකයෝවූ අපි නැගිට ගොඩනගන්නෙමුව. නුමුත් නුඹලාට යෙරුසලමෙහි කිසි කොටසක් හෝ අයිතිවාසිකමක්වත් සිහිවීමේ ලකුණක්වත් නැතැයි කීවෙමි. (නෙහෙමියා 2:20)**

## හැඳින්වීම

පැරණි ගිවිසුමේ නෙහෙමියාගේ පොතෙන් සතුරෙකු විසින් විනාශ කරනලද යෙරුසලමේ පවුරු නැවත ගොඩනැගීමට කළ සටනක් පිළිබඳව පැවසේ. පැරණි ඉශ්‍රායෙලයේ නගර ආරක්ෂා කර ගැනීම සඳහා පවුරු වැදගත් විය. සතුරු ආක්‍රමණවලින් ආරක්ෂාවීමට ඒවා උපකාරී විය. යෙරුසලමේ ස්වභාවික පවුරු අපගේ ආත්මික පවුරුවල සංකේත වේ.

> **නුඹේ පවුරු ගැළවීමය කියාද නුඹේ දොරටු ප%ශංසාවය කියාද නුඹ කියන්නෙහිය. (යෙසායා 60:18)**

නෙහෙමියා 3 හි සඳහන් ස්වභාවික දොරටු සෑම එකකටම අපගේ ආත්මික පවුරුවලට අදාළ වන සංකේතාත්මක තේරුමත් ගෙන දෙයි.

**බැටළු දොරටුව** මගින් ඔබගේ ජීවිතයේ කුරුසියේ කාර්යය, ආත්මික ගොඩනැගීමේ අත්තිවාරම, නියෝජනය කෙරේ: 3:1; යොහන් 10:11

**මත්ස්‍ය දොරටුව** කිතුනු සාක්ෂිය නියෝජනය කෙරේ: 3:3; මතෙව් 4:19

**පරණ දොරටුව** මගින් පැරණි ස්වභාවය අලුත් ස්වභාවයට වෙනස්වීම නියෝජනය කෙරේ: 3:6; රෝම 6:1-23

**මිටියාවතේ දොරටුව** දුක්විඳීම හා පරීක්ෂාවන් ගැන කතා කරයි: 3:13; 2 කොරින්ති 1:3-5

**කසළ දොරටුව** මගින් නියෝජනය කෙරෙන්නේ ඉවත් කළ යුතු මාංශයේ කාර්යය:. 3:14; ගලාති 5:16-21

**උල්පත් දොරටුව** නියෝජනය කරන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ කාර්යය වේ: 3:15; යොහන් 7:37-39

**චතුර දොරටුව** දේව වචනය නියෝජනය කරයි: 3:26; යොහන් 4:10-14

**අශ්ව දොරටුව** ඇදහිලිවතුන්ගේ සටන නියෝජනය කරයි: 3:28; එපීස 6:10-17

**නැගෙනහිර දොරටුව** යේසුස්වහන්සේගේ නැවත පැමිණීම කෙරෙහි ඇති ඇදහිලිවතුන්ගේ බලාපොරොත්තුව නියෝජනය කරයි: 3:29; එසකියෙල් 43:1-2

**හම්මිප්කාද් දොරටුව** තමාම පරීක්ෂාකර ගැනීම හා යේසුස්වහන්සේගේ විනිශ්චය ආසනය ගැන කතා කරයි: 3:31; 1 කොරින්ති 3:9-15; 2 කොරින්ති 5:10

එබැවින් ඔබගේ ආත්මික පවුරුවල මේ දේ අඩංගු වේ.

- ගැළවීමේ පවුරු, ප්‍රශංසා කිරීමේ දොරටු
- ඔබගේ ජීවිතය තුළ කෙරෙන කුරුසියේ කාර්යයන්
- කිතුනු සාක්ෂිය
- පැරණි ස්වභාවය, අලුත් ස්වභාවයකට වෙනස් වීම
- පීඩාවන් හා පරීක්ෂාවන්
- මාංශයේ කාර්යයන් ඉවත් කිරීම
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ කාර්යයන්
- දෙවියන්වහන්සේගේ වචනය
- ආත්මික සටන
- යේසුස්වහන්සේගේ නැවත පැමිණීමේ බලාපොරොත්තුව
- තමාම පරීක්ෂාකර ගැනීම

ඔබගේ ජීවිතය තුළ තිබෙන, විනාශ කිරීමට සාතන් ඉලක්ක කර ඇති ආත්මික පවුරු මේවා වේ. ඔබගේ ප්‍රශංසාවන් හා කිතුනු සාක්ෂිය විනාශ කිරීමට ඔහුට අවශ්‍යය. එමෙන්ම ඔබගේ ජීවිතයේ ඇති කුරුසියේ, දුක් විඳීමේ හා ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාවන් විනාශ කිරීමටද ඔහුට අවශ්‍යය. ඔබ දේව වචනය අධ්‍යයනය කිරීමත් එහි ඇති සත්‍යතාවන් මත ක්‍රියා කිරීමත් වළක්වාලීමට ඔහු උත්සාහ කරයි. ආත්මික සටනින් ඔබ පරාජය කිරීමටත්, තමාම පරීක්ෂාකර ගැනීම වළක්වාලීමටත්, මාංශයේ ක්‍රියාවන් තුළ හා පැරණි පාපී ස්වභාවය තුළ ඔබ කොටුකර තැබීමටත් සාතන්ට අවශ්‍යය. යේසුස්වහන්සේගේ නැවත පැමිණීම කෙරෙහි ඇති ඔබගේ බලාපොරොත්තුව විනාශ කිරීමට ඔහුට අවශ්‍යය. මේවා ඔබගේ ආත්මික පවුරු වේ. සාතන් මේවාට පහර දෙන්නේ යෙරුසලමේ පවුරු මත වූ සටන්වලදී භාවිත කළ උපක්‍රමවලට සමාන ඒවා භාවිත කරමිනි. මෙම පරිච්ඡේදයෙන් අවධාරණය කෙරෙන්නේ ඔබගේ ආත්මික ජීවිතයේ ඇති පවුරු මත කෙරෙන සටන කෙරෙහිය. එය ආත්මික සටනේ ඇති ප්‍රබල සමාන්තරයන් දැක්වීමට නෙහෙමියාගේ කතාව උපයෝගි කර ගනී.

## යෙරුසලමේ තත්වය

මෙම පාඩම තවදුරටත් අධ්‍යයනය කිරීමට පෙර නෙහෙමියා 1 පරිච්ඡේදයේ සිට 7:3 දක්වා කියවන්න. නෙහෙමියා 1 හා 2 පරිච්ඡේදවලින් විස්තර කෙරෙන්නේ යෙරුසලම වටා තිබූ පවුරුවල තත්වය වේ. සතුරු ආක්‍රමණවලින් විනාශ වී ඒවා නටබුන්ව පැවති අතර දොරටු ගින්නෙන් දැවී තිබිණි. පවුරු හා දොරටු නොමැති වූ විට නගරයක් සෑම පැතිවලින්ම සතුරු ආක්‍රමණයට විවෘතව පැවතිනි. ඔබගේ ආත්මික පවුරු විනාශ වී ඇත්නම් ඔබද සතුරු ආක්‍රමණවලට විවෘතය.

## ගැටලුවට හේතුව

පවුරු විනාශ වී ඇත්තෙත්, නගරය වර්තමාන තත්වයට පත්ව ඇත්තෙත් පාපය නිසා බව නෙහෙමියාට වැටහිණි (නෙහෙමියා 1:5-7). ඔබගේ ආත්මික පවුරු නටබුන් වූ විට, ඊට හේතුව ද පාපයම වේ. යෙරුසලමේ වාසය කරන්නවුන් හට රැකවරණය ලබා දීම සඳහා පවුරු නැවත ගොඩනැගීමේ බර දෙවියන්වහන්සේ ඔහු මත තබා ඇති බව නෙහෙමියාට හැඟී ගියේය. ඔහුගේ සූදානම් වීම හා සැලැස්ම 1 හා 2 පරිච්ඡේදවල විස්තර කර ඇත. ඔහුත් ඔහුගේ සහායකයෝත්

පවුර ගොඩනැඟීමට කෙතරම් අධිෂ්ඨානයක් කරගෙන සිටියේදයත් "අපි නැගිට ගොඩනගමු" (නෙහෙමියා 2:18) යයි ඔවුහු කීවෝය.

## සාතන්ගේ උපක්‍රම: පවුරු මත සටන

යෙරුසලම වටා පවුරු නැවත ගොඩනැඟීමට නෙහෙමියා තීරණය කළ විට, ඔහුට ඔහුගේ සතුරන්ගෙන් ප්‍රබල විරෝධතා එල්ල විය. ඔබගේ ආත්මික පවුරු නැවත ගොඩනැඟීමට ඔබ තීරණය කළ විටද ඔබගේ සතුරාගෙන්, සාතන්ගෙන්, එවැනිම විරෝධතා එල්ල වනු ඇත. නෙහෙමියාගේ සතුරන්ගේ උපක්‍රම, ආත්මික පවුරුවලට පහර දීම සඳහා සාතන් යොදා ගන්නා උපක්‍රමවලට සෑම අතින්ම සමානය. මෙම පහරදීම ප්‍රධාන වර්ග දෙකකට බෙදේ. ඒ බාහිර හා අභ්‍යන්තර පහරදීම වශයෙනි.

### බාහිර පහරදීම් :

මේවා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොටස් නොවන බාහිර අයගේ මාර්ගයෙන් සතුරා එල්ල කරන ප්‍රහාරයන් වේ. මෙවැනි ප්‍රහාරවලට පහත දැක්වෙන දේ අන්තර්ගතය.

1. **ඍජු විවේචන :** නෙහෙමියා 2:19

"නුඹලා කරන මේ දෙය මොකක්ද?" යයි පවසමින් සතුරෝ ඔහු විවේචනය කළහ. මෙම පවුරු නැවත ගොඩනැඟීමේ ව්‍යාපෘතියට ඔවුහු විරුද්ධ වූහ. එබැවින් එය වළක්වාලීමට හැකි සෑම දෙයක්ම ඔවුහු කළහ.

2. **නින්දා හා පරිභව කිරීම :** නෙහෙමියා 4:1-3

නෙහෙමියා "කතාවල ඉලක්කයක්" විය. අන් අය ලවා නින්දා කිරීම් හා පරිභව කිරීම් මගින් ඔහුව පරාජය කිරීමට සතුරා උත්සාහ කළේය. ඔබව අධෛර්ය කිරීමට හා පරාජය කිරීමට සතුරා අන් අයගේ කතාවන් උපයෝගි කරගනු ඇත.

3. **බොරු චෝදනා :** නෙහෙමියා 6:5-7

සතුරා, පෞද්ගලිකවම බොරු චෝදනා නගමින් නෙහෙමියාට පහර දුන්නේය. ඔහු කැරළිකාරයෙක් යයි චෝදනා කළේය. සාතන් "සහෝදරයන්ගේ චෝදනාකරු" ලෙස හැඳින්වේ. ඔහු ඔබට චෝදනා කිරීමට අන් අයව යොදවන අතර ඔහු ඔබගේ සිතෙහිද චෝදනාත්මක සිතිවිලි ඇති කරන්නේය.

4. **වෙන මගකට හැරවීම :** නෙහෙමියා 6:2

සතුරා නෙහෙමියාව රැස්වීමකට සහභාගි කරවා ගැනීමට උත්සාහ කළේය. මෙම රැස්වීම, පවුරු ගොඩනැඟීමේ කාර්යයෙන් නෙහෙමියා වෙන අතකට යොමු කිරීමේ උපක්‍රමයක් වේ. දෙවියන්වහන්සේගේ කාර්යයන්ගෙන් හා උන්වහන්සේ ඔබට භාර දී ඇති වැඩ වලින් ඔබ වෙන මගකට හැරවීම සාතන් දැනුදු භාවිත කරන උපක්‍රමයකි.

5. **ජනප්‍රිය බලපෑම් :** නෙහෙමියා 6:2

"අපි" සම්මුඛ වෙමු යයි පවසමින් සතුරා උත්සාහ කළේ ජනප්‍රිය මතයන් මගින් නෙහෙමියාට බලපෑම් ඇති කිරීමටය. ජනප්‍රිය මතය වූයේ නෙහෙමියා කැරළිකාරයෙකු බව හා පවුර නැවත ගොඩනැගිය නොහැකි බවය. ජනප්‍රිය මතවලට එකඟවීම, බහුතර පාලනය හා ලෞකික ප්‍රතිපත්ති සාතන් භාවිත කරන ප්‍රධාන උපක්‍රම වේ. නෙහෙමියාට පහර දීමට, දෙවියන්වහන්සේගෙන් පැමිණී බව පවසමින් පැමිණි ව්‍යාජ දිවැසිවරයෙකුද සතුරා උපයෝගි කරගත්තේය (නෙහෙමියා 6:10-13). "දෙවියන්වහන්සේගේ දිවැසිවරයාට" සවන් දෙන්න යයි ජනප්‍රිය මතය පවසනු ඇත. දෙවියන්වහන්සේගෙන් අපව වෙන අතකට යොමු කරන ව්‍යාජ දිවැසිවරුන්ගෙන් ප්‍රවේසම් වන ලෙස අපට අවවාද කර ඇත.

## 6. **එකඟතාවකට පැමිණීම :** නෙහෙමියා 5:14-19

නෙහෙමියා එකඟතාවකට පැමිණීම ප්‍රතික්ෂේප කළේය. ඔහුට වැරදි ජීවන රටාවකට හා ඔහු වටා ඇති වැරදි ප්‍රතිපත්තිවලට එකඟ වූයේ නැත. ඔහුගේ ආදර්ශ පාඨය වූයේ "මම දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇතුව සිටි නිසා එසේ නොකෙළෙමි" යන්නය (නෙහෙමියා 5:15). සාතන් එකඟතාවන් දිරිගන්වයි. වෙනත් අය කරන නිසා ඒ දේ නිවැරදියයි හෝ ඒ දේ කිරීම වරදක් නොවේ යයි හෝ ලෙස විශ්වාස කිරීමට පෙළඹවීමට සාතන් උත්සාහ කරයි.

## 7. **තර්ජන හා බිය :** නෙහෙමියා 6:5-9

නෙහෙමියාට හා ඔහුගේ වැඩකාරයන්ට එරෙහිව බිය ගෙන දෙන තර්ජන සතුරා එල්ල කළේය. බිය ඇදහිලිවතුන්ව අඩපණ කරන බවත් එහෙත් ඇදහිල්ල ඔවුන්ව ශක්තිමත් කරන බවත් සාතන් දනී. සතුරාගෙන් බේරී පලායාමේ මාර්ගයක් නෙහෙමියාට පෙන්වූ විට බිය වී පසුබැසීම නෙහෙමියා ප්‍රතික්ෂේප කළේය (නෙහෙමියා 6:10-13). ඔහු පහසු ක්‍රමය තෝරා ගත්තේ නැත. විරෝධතාවන් හමුවේ පැනයාමට සතුරා ඇදහිලිවතුන්ව පොළඹවයි. ඔබ බියේ පැනයන විට ඔබ පසුබසියි. ඔබ පසුබසින විට ඔබට ආත්මිකව සිටගෙන සිටිමට හෝ ඉදි×යට යෑම කල නොහැක.
ඔබ ඇදහිල්ලෙන් යුතුව ගමන් කරන විට ඔබට විරෝධතාවන් පැමිණෙන්නේ දැකීමෙන් ඇවිදින අයගෙනි.

## 8. **සටන් කිරීම් හා බාධාවන් :** නෙහෙමියා 4:8

සටන් කිරීමේ හා බාධා පැමිණවීමේ විවෘත උපක්‍රම ද භාවිත කෙරිනි. සතුරා සැමවිටම සූක්ෂම ලෙස පහර දෙන්නේ නැත. ඇතැම් අවස්ථාවල ඔහු විවෘතවම සටන් කිරීමට හා බාධා ඇති කිරීමට පැමිණෙයි.

## 9. **කුමන්ත්‍රණ :** නෙහෙමියා 4:8; 6:2

නෙහෙමියාට එරෙහිව සතුරා විසින් කුමන්ත්‍රණයක් හෙවත් උපායක් ඇති කරන ලදී. ඔබගේ ජීවිතයට එරෙහිවද සතුරා කුමන්ත්‍රණ කරනු ඇත.

> **සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

## 10. **අනතුරට භාජනය විය හැකි අවස්ථාවල කෙරෙන පහරදීම් :** නෙහෙමියා 4:6

සතුරා ප්‍රබල පහරක් එල්ල කළේ පවුර අර්ධ වශයෙන් ගොඩනැඟූ අවස්ථාවේදී වේ. ඊට හේතුව එය වැදගත් අවස්ථාවක් වීමය. සතුරා ආක්‍රමණය කරන්නේ වැදගත් අවස්ථාවලදී වේ. ඒ අවස්ථාවල ඔබට පහරදීම පහසුය (ඔහුගේ පහරවලින් වඩාත්ම විනාශයක් වන හා විවෘත අවස්ථා).

- දිවසිවර යෝනා ශ්‍රේෂ්ඨතම පිබිදීම අත්දුටු අවස්ථාවේ අධෛර්ය විය. (යෝනා 3-4)
- දාවිත් පාපයට ගොදුරු වූයේ ඔහුගේ ජීවිතයේ මහත්ම ජයග්‍රහණය ලද අවස්ථාවේය. ඒ අවස්ථාව වන තුරු යුදමය පරාජය වීම් ඔහු දැන සිටියේ නැත.
- සැම්සන් පාපයට වැටුණේ ඔහු පිලිස්තිවරුන්ගෙන් ඉශ්‍රායෙලය මුදා ගැනීම "ආරම්භ" කළ අවස්ථාවේදිය.

ඔබ දෙවියන්වහන්සේට කාර්යක්ෂමව වැඩ කරන විට, සතුරාගේ පහරදීම්වලට ඔබ පහසුවෙන්ම අසුවේ. සාතන් වැඩි වශයෙන්ම අවධානය යොමු කරන්නේ ආත්මික ලෝකයේ ඉදිරියට යන අය කෙරෙහි වේ.

## **අභ්‍යන්තර පහරදීම් :**

සාතන්ගේ අභ්‍යන්තර පහරදීම් යනු ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ සිට කෙරෙන පහරදීම් වේ. පහත දැක්වෙන දේ ඊට අන්තර්ගතය.

## 1. **අධෛර්යවීම් :** නෙහෙමියා 4:10-11

සේවය කරන්නන් අධෛර්යයට පත්වීමේ ප්‍රතිඵල වූයේ:

- ශක්තිය හීන වීම
- "බොහෝ කුණු කන්දල් (පස)" තිබීමෙන් දර්ශනය හීන වීම
- ආත්ම විශ්වාසය හීන වීම

## 2. **භේදවීම :** නෙහෙමියා 5

නෙහෙමියා 5 ආරම්භ වන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟ අතර ඇති භේදයක් මගිනි. සාතන් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ බෙදීමක් ඇති කළහොත් ඉන් අප අක්‍රිය වේ. අප කළ යුතු වන්නේ ගොඩනැඟීමක් වුවද මෙවිට සිදු වන්නේ එකිනෙකා අතර සටනකි. භේදවීම පිටුපස සැම විටම ඇත්තේ වැරදි චේතනාවකි. නෙහෙමියා 5 හි වැරදි චේතනාව තෘෂ්ණාව විය.

## 3. **දුර්වල ඇදහිලිවන්තයෝ :** නෙහෙමියා 4:12

ඉදිකිරීමේ ව්‍යාපෘතිය පරාජය කිරීමට සතුරා භාවිත කළේ දුර්වල සේවකයන් වේ (ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ දුර්වල ඇදහිලිවන්තයන් සංකේතවත් වේ).

# ආත්මික ප්‍රතිඋපක්‍රම : පවුරු අසල ජයග්‍රහණය

යෙරුසලමේ පවුරු නැවත ගොඩනැගීමට නෙහෙමියා පහත දැක්වෙන උපක්‍රම භාවිත කළේය. ඔබගේ ආත්මික පවුරුවලද ජයග්‍රහණය තහවුරු කිරීමට එම උපක්‍රමම ඔබට භාවිත කළ හැකිය.

## පවුරු පරීක්ෂා කර බලන්න :

ස්වභාවික ලෝකයේ නෙහෙමියා කළ අයුරින්ම ඔබගේ ආත්මික ජීවිතයේ පවුරුද පරීක්ෂා කර බලන්න (නෙහෙමියා 2). සතුරා ඔබගේ පෞද්ගලික ජීවිතය, ඔබගේ නිවස, සභා සහභාගිත්වය, ව්‍යාපාරය ආදී තැන්වලට රිංගා ඇත්ද?

> **නුමුත් එක් එක්කෙනා තම තමාව සෝදිසිකොට, ඒ රොටී කැවාවේ. (1 කොරින්ති 11:28)**

> **නුමලා ඇදහිල්ලෙහි සිටිනවාද කියා නුඹලාම පරීක්ෂාකර බලාපල්ලා. නුඹලාවම සෝදිසිකර බලාපල්ලා. (2 කොරින්ති 13:5)**

තමාම පරීක්ෂාකර ගැනීම, ආත්මික ලෝකයේ ඔබගේ පවුරුවල එක් සංකේතාත්මක දොරටුවක් බව මතක තබාගන්න. ඔබ තමාම පරීක්ෂාකර ගැනීමේ යෙදීම වළක්වාලීමට සාතන් උත්සාහ කරනු ඇත. ඒ ඔබගේ ජීවිතයේ පවුරු කඩා බිඳ දමා ඔහුට ආක්‍රමණය කිරීමට ඔබ ඉඩ දී ඇති අවස්ථා හඳුනාගැනීමට ඔබට හැකිවන බැවිනි.

## ඔබගේ පව් පාපෝච්චාරණය කරන්න :

පවුරු විනාශවීමට හේතුව පාපය බව, නෙහෙමියා මෙන්ම හඳුනාගන්න. ඉන්පසු ඔහු කළ අයුරින්ම (නෙහෙමියා 1:5-7) ඔබගේ පව් පාපෝච්චාරණය කර කමාව ඉල්ලන්න.

> **අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටාගනිමුව, සැබෑවද අප තුළ නැත. අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහන් 1:8-9)**

## ඔබට තනිවම ගොඩනැගිය නොහැකි බව පිළිගන්න :

"අප තනිවම පවුර ගොඩනැගිය නොහැකිය"යි නෙහෙමියාගේ සේවකයෙක් පැවසුවේ සත්‍යයකි. තනිවම ඔවුන්ට එය කළ නොහැකිය. මේ කාර්යය සඳහා සන්නද්ධ වීමට ඔවුන්ට දෙවියන්වහන්සේගේ බලය අවශ්‍යය. ඔබටද එසේමය.

## නැගිට ගොඩනගන්න :

නෙහෙමියා මෙන් නැගිට ඔබගේ ආත්මික පවුරු නැවත ගොඩනැගීමට අධිෂ්ඨාන කරගන්න.

> **එවිට මම ඔවුන්ට උත්තරදෙමින්: ස්වර්ගයේ දෙවියන්වහන්සේම අපේ කාරණය සඵලකරනවා ඇත. එබැවින් උන්වහන්සේගේ සේවකයෝවූ අපි නැගිට ගොඩනගන්නෙමුව. නුමුත් නුඹලාට යෙරුසලමෙහි කිසි කොටසක් හෝ අයිතිවාසිකමක්වත් සිහිවීමේ ලකුණක්වත් නැතැයි කීවෙමි. (නෙහෙමියා 2:20)**

සූදානම්ව සිටින්න.. සතුරාගේ විරෝධතාවලට ඔබට මුහුණදීමට සිදුවනු ඇත.

## අන්මගකට යොමු නොවන්න :

සතුරාගේ උපාය මාර්ග මගින් වෙනත් මගකට යොමුවීම නෙහෙමියා ප්‍රතික්ෂේප කළේය (නෙහෙමියා 6:2-3). ඔබගේ ආත්මික පවුරු නැවත ගොඩනැගීමේ කාර්යයෙන් අන් අතකට සිත යොමු කිරීමට හෝ ඉවත් කිරීමට හෝ සතුරාට ඉඩ නොදෙන්න.

## "ජනප්‍රිය මත" මගින් නොනැමෙන්න :

නෙහෙමියා කැරළිකාරයෙකු යන්න ජනප්‍රිය මතය විය (නෙහෙමියා 2:19). එමෙන්ම පවුර නිසියාකාරව නැවත ගොඩනැගිය නොහැකි බවද ජනප්‍රිය මතය විය (නෙහෙමියා 4:3). එහෙත් ජනප්‍රිය මත නිසා නෙහෙමියා වැනුනේ නැත. ජනප්‍රිය මතයට අනුකූල නොවී නෙහෙමියා ආදර්ශයක් විය. "එහෙත් මම දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇතුව සිටි නිසා එසේ නොකෙළෙමි" යි ඔහු පැවසීය (නෙහෙමියා 5:14-19). ආත්මික සටනේ ආදර්ශයක් වන්න. ජයග්‍රහණය ලැබිය නොහැකිය යන්න පවසන සෙනඟගේ කොටසක් නොවන්න.

## සතුරා හා ඔහුගේ උපක්‍රම හඳුනාගන්න :

නෙහෙමියා තම සතුරන්ව හා ඔවුන්ගේ උපක්‍රම හැඳිනගත්තේය. සතුරා හදිසි ප්‍රහාරයකට සූදානම්වන බව ඔහු සොයා ගත්තේය (නෙහෙමියා 4:8 හා 11). ආත්මික සටන ඵලදායී වීමට ඔබ ඔබගේ ආත්මික සතුරා හා ඔහුගේ උපක්‍රම හඳුනාගත යුතුය. එමගින් හදිසි ප්‍රහාරවලට සූදානම්ව සිටීමට ඔබට පුළුවන. සතුරා ඔබව ඝාතනය කිරීමට, සොරකම් කිරීමට හා විනාශ කිරීම්වලට සූදානම් වන බව වටහාගන්න. එහෙත් දෙවියන්වහන්සේ ඊට වඩා බලවත් බවත් ඔබට අධික ලෙස ජීවනය දීමට උන්වහන්සේට අවශ්‍ය බවත් (යොහන් 10:10) පිළිගන්න.

## ආත්මික ප්‍රතිඋපක්‍රම වර්ධනය කරන්න :

සතුරා ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කරන බව නෙහෙමියා දැනගත් විට ඔහු ප්‍රති උපක්‍රම සැලසුම් කළේය. ඔහු ඇතැම් සේවකයන් සතුරා මුර කිරීමට යෙදුවේය. සෑම සේවකයෙක්ම පවුර ගොඩනැගූ අතරම සටන් කිරීම සඳහා කඩුවක් ඇතිව සූදානම්ව සිටියේය (නෙහෙමියා 4:13-18). ආක්‍රමණයක් පිළිබඳව හමුදාභටයන්ට දැනුම් දීමට සංඥාවක් (හොරණෑවක් පිඹීමක්) සූදානම් කෙරිනි. ඔවුන් සටනට සූදානම්ව සිටි නිසාත් සතුරාගේ උපක්‍රම දැන සිටි නිසාත්, ආක්‍රමණයක් වැළැක්වීමට ඔවුන්ට හැකි විය. සතුරන් සමඟ යුද කළ යුතුයැයි ඔවුහු දැන සිටියහ. දෙවියන්වහන්සේ ඔවුන් වෙනුවෙන් සටන් කරන බවද ඔවුහු දැන සිටියහ.

> **අපේ දෙවියන්වහන්සේ අප උදෙසා සටන්කරනසේක. (නෙහෙමියා 4:20)**

ඔබ උචිත ආත්මික ප්‍රතිඋපක්‍රම වර්ධනය කළහොත්, ඔබගේ ජීවිතය වෙතට සතුරාගෙන් එල්ලවන ආක්‍රමණ බොහොමයක් ඔබට වැළැක්විය හැකිය. සාතන් ආරක්ෂක වැටවල් බිඳගෙන ආක්‍රමණය කළහොත් ඔබ වනුවෙන් දෙවියන්වහන්සේ සටන් කරන බවට සහතික වන්න.

## සතුරාට මුහුණ දෙන්න :

නෙහෙමියාට සතුරාගෙන් රැකවරණය ලබා දීමට සූදානම් වූ විට ඔහු එය ප්‍රතික්ෂේප කරමින් මෙසේ පැවසීය. "මා වැනි කෙනෙකුට පලායන්නට හරිද?" (නෙහෙමියා 6:11). නෙහෙමියා සතුරාට මුහුණ දුන්නේ දෙවියන්වහන්සේගේ බලයෙනි. සතුරා ඔබට තර්ජනය කරන විට පලා නොයන්න, නැතහොත් පහසු මාර්ගය තෝරා නොගන්න. එසේ කළහොත් ඔබගේ ආරක්ෂක පවුරු කෙසේවත් ආරක්ෂා සහිත නොවේ. අභ්‍යන්තර බෙදීම් හා අධෛර්යවීම් පැන නැගුන විට සතුරා දුර්වල ඇදහිලිවන්තයන් තුළින් ක්‍රියා කළේය' නෙහෙමියා එම ප්‍රහාරයන් ගැන නොසැලකිලිමත් වූයේ නැත. ඔහු ඒවාට මුහුණ දී ඒවා ජයගත්තේය.

## අනතුරට භාජනය විය හැකි අවස්ථාවලින් ඔබලේ පවුරු රැකගන්න :

නෙහෙමියාගේ කතාවේ, සතුරාගේ ප්‍රබලතම ප්‍රහාරය එල්ල වූයේ පවුර අඩක් ගොඩනැගූ පසුවය. ඔබ ආත්මික ලෝකයේ ඉදිකිරීම් ආරම්භ කළ විට, ඔබ ආත්මික සටන කෙරෙන ප්‍රදේශයට ඇතුළු වූ විට, සූදානම්ව සිටින්න. එය පහසුවෙන් පහරදිය හැකි අවස්ථාවකි. ඔබ සාතන්ගේ ප්‍රහාරයනට ඉලක්කයකි.

## පවුර ගොඩනගන්න :

ඍජු විවේචන, උසුළු විසුළු කිරීම්, අවඥාවන්, බොරු චෝදනා, තර්ජන හා බිය වැද්දීම් ආදියට නෙහෙමියාගේ ප්‍රතිචාරය වූයේ, නොනවත්වාම පවුර ගොඩනැගීමය.

> **මෙසේ වැඩේ යෙදී සිටියෙමු. ඔවුන්ගෙන් දෙකෙන් කොටසක් අලුයම් වේලේ පටන් තරු පෙනෙන තුරු හෙල්ල රැගෙන සිටියෝය. (නෙහෙමියා 4:21)**

නෙහෙමියා කාර්යයේ දිගටම නියැලුනේය. පවුර ගොඩනැගීම නැවැත්වූයේ නැත.

> **පවුර වනාහි පනස් දෙදවසකින් එලූල් මාසයේ විසිපස්වෙනිදා නිම්දු විය. (නෙහෙමියා 6:15)**

කළ නොහැකි දෙයක් බවට සතුරා පැවසූ කාර්යය, නෙහෙමියා කෙටි කලකින් අවසන් කළේය.

ඔබ වටා ඇති පවුරු බිඳ වැටී ඇත්නම්, මේ කාර්යය කළ නොහැකි බව සතුරා පවසනු ඇත. එහෙත් දෙවියන්වහන්සේගේ උපකාරය ඇතිව ඔබට පවුර නැවත ගොඩනැංවිය හැකිය. දෙවියන්වහන්සේගේ ශක්තිය ඇතිව එය කිරීමට දිගු කාලයක් ගත නොවේ.

> **මා බලවත්කරන්නාවූ තැනැන්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන. (පිලිප්පි 4:13)**

ඔබගේ ආත්මික ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට සතුරා පහර දෙන විට, එය අත්හැර නොයන්න. ඔබගේ ආත්මික පවුරු නොනවත්වාම ගොඩනඟන්න.

## මුරකරුවෙකු තබන්න :

යෙරුසලම වටා පවුරු නැවත ගොඩනැඟීම අවසන් වූ පසු, නෙහෙමියා නගරය වටා පවුරුද දොරටුද රැකබලා ගැනීමට මුරකරුවන් යෙදවීය (නෙහෙමියා 7:1-3). ඔබගේ ආත්මික පවුරු වටාද මුරකරුවන් තබන්න. සැමවිට සතුරාගේ ප්‍රහාරයන් පිළිබඳව අවදිව සිටින්න.

## පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. ආත්මික පවුරු යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

3. යෙරුසලමේ පවුරු විනාශ වූයේ මන්ද? (ආත්මික පවුරු විනාශ වන්නේද ඒ හේතු නිසාමය.)

4. ආත්මික පවුරු හා සටන් කිරීමට සාතන් භාවිත කරන උපක්‍රම ලයිස්තුගත කරන්න.

5. පවුරු අසල ජයග්‍රහණය තහවුරු කෙරෙන ආත්මික ප්‍රතිඋපක්‍රම ලැයිස්තුගත කරන්න.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. සතුරා විසින් විනාශකරන ලද ආත්මික පවුරු ඔබගේ ජීවිතයේ තිබේද? ඔබගේ "ආත්මික පවුරු" පරීක්ෂා කර බලන්න. එහි මේවා අන්තර්ගත විය හැකිය.

    - ගැළවීමේ පවුරු, ප්‍රශංසා කිරීමේ දොරටු
    - ඔබගේ ජීවිතයේ කුරුසියේ කාර්යය
    - කිතුනු සාක්ෂිය
    - පැරණි ස්වභාවය අලුත් ස්වභාවයට වෙනස් කිරීම
    - දුක්විඳීම හා පරීක්ෂාවන්
    - මාංශයේ කාර්යයන් ඉවත් කිරීම
    - ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියා
    - දෙවියන්වහන්සේගේ ක්‍රියා
    - ආත්මික සටන
    - යේසුස්වහන්සේගේ නැවත පැමිණීම පිළිබඳ බලාපොරොත්තුව
    - තමාව පරීක්ෂාකර ගැනීම

2. ඇදහිලිවන්තයින් බොහෝවිට ආත්මික සටනින් පරාජය වන්නේ සුදුසු ආත්මික සූදානමක් නොමැතිකම නිසාය. පවුරු නැවත ගොඩනැඟීමට හා සතුරා අභිමුඛයට යෑමට පෙර නෙහෙමියා සූදානම් වූ අයුරු අධ්‍යයනය කරන්න.

    - ඔහු එම තත්වයන් තිබූ ආකාරයෙන්ම දුටුවේය. 1-2 පරිච්ජේද
    - ඔහු මෙම ගැටලුවේ මූලය පාපය බව හඳුනාගෙන එහි ඔහුගේ කොටසවූ පාපෝච්චාරණයෙහි යෙදිනි. නෙහෙමියා 1:5-7
    - ඔහු නිරාහාරව සිටියේය, හැඬුවේය, යාච්ඤා කළේය: නෙහෙමියා 1:4
    - කාර්යය ආරම්භ කිරීමට හා සතුරාට මුහුණ දීමට පෙර ඔහු ඉතා හොඳින් සූදානම් විය. 1 හා 2 පරිච්ජේද.
    - නැවත ගොඩනැඟීම සඳහා උපක්‍රමයක් ඔහුට තිබිණි. 3 පරිච්ජේදය

3. ඔබගේ ආත්මික පවුරු නැවත ගොඩනැඟීමට ඔබ සූදානම්ද? ඔබ මෙම පාඩමෙන් උගත් උපක්‍රම නැවත අධ්‍යයනය කර ඒවා යොදවන්න.

# දහඅට වන පරිච්ඡේදය

## උපක්‍රමික බලප්‍රදේශවල කෙරෙන සටන්

### අරමුණු:

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ශරීරයට එරෙහි සාතන්ගේ උපක්‍රම හැඳින ගැනීමට
- ශරීරයේ ජයග්‍රහණය සඳහා අවශ්‍ය ආත්මික ප්‍රතිඋපක්‍රම සාරාංශගත කිරීම
- ඇදහිලිවතුන්ට එරෙහිව සටන් කිරීමට මනුෂ්‍යයන් යොදා ගැනෙන සාතන්ගේ උපක්‍රම පැහැදිලි කිරීමට
- පවුලට එරෙහි සාතන්ගේ උපක්‍රම හැඳිනගැනීමට
- පවුල තුළ ජයග්‍රහණය සඳහා ඇති ආත්මික ප්‍රතිඋපක්‍රම සාරාංශගත කිරීමට
- මුදල් හා ද්‍රව්‍යමය ක්ෂේත්‍රයේ ඇති සාතන්ගේ උපක්‍රම හැඳින ගැනීමට
- මුදල් හා ද්‍රව්‍යමය ක්ෂේත්‍රයේ ජයග්‍රහණය සඳහා ඇති ආත්මික ප්‍රතිඋපක්‍රම සාරාංශගත කිරීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලියවිලිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය.** (යොහන් 10:10)

## හැඳින්වීම

මීට පෙර පරිච්ඡේදවලින් අවධානය යොමු කෙරුණේ සතුරා විසින් මනස, දිව, ඔබගේ ආත්මික පවුරු හා ලෝකයේ හා මාංසයේ සටන් පවතින පෙදෙස්වල දියත් කළ ප්‍රධාන ප්‍රහාරයන් පිළිබඳව වේ. මෙම පරිච්ඡේදය, සතුරාගේ සුවිශේෂී ඉලක්ක වන භෞතික ශරීරය, පවුල, මුදල් හා මනුෂ්‍ය පෞරුෂත්වය තුළින් කෙරෙන ප්‍රහාරයන් යන උපක්‍රමික බල ප්‍රදේශ වෙත අවධානය යොමු කරයි.

## සාතන්ගේ උපක්‍රම: භෞතික ප්‍රහාරයන්

ඔබගේ ශරීරය ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩ වාසය කරන දේවමාලිගාව වේ.

> **නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදනිවුද? යමෙක් දෙවියන්වහන්සේගේ මාළිගාව නාස්තිකරන්නේ නම්, දෙවියන්වහන්සේ ඔහුව නාස්තිකරන සේක. මක්නිසාද දෙවියන්වහන්සේගේ මාළිගාව ශුද්ධය. ඒ මාළිගාව නුඹලාය.** (1 කොරින්ති 3:16-17)

ඔබගේ ශරීරය දෙවියන්වහන්සේගේ ආත්මයේ මාලිගාව බැවින්, සාතන් පහත දැක්වෙන දේ වලින් ඊට පහර දෙනු ඇත.

### රෝග :

මේ ලෝකයේ රෝග පවතින්නේ ආදම් හා ඒවගේ මුල් පාපය නිසා වේ. ලෝකයේ ඇති සෑම රෝගයක්ම පාපය නිසා ඇති වුවද රෝග වලින් දුක්විඳින සෑම කෙනෙක්ම දුක් විඳින්නේ තම පාපය නිසා යයි නොසිතිය යුතුය.

රෝග ඇතිවීමට බොහෝ හේතු බයිබලය එළිදරව් කරයි. පළමුවැන්න, සාතන් විසින් ඇති කරන රෝග වේ. සාතන් ආත්මයට පීඩා ඇතිකරන ආකාරයෙන්ම ශරීරයටද පීඩා කිරීමට උත්සාහ කරයි.

ඔබගේ ආත්මයට අධෛර්ය, ෝෂාරෝපනය ආදියට ප්‍රතිශක්තියක් නොමැත්තාසේම ඔබගේ ශරීරයටද ඔහුගෙන් කෙරෙන ප්‍රහාර වලට ප්‍රතිශක්තියක් නොමැත. එහෙත් රෝග පාප සඳහා දඬුවමක් ද විය හැකිය. නිදසුනක් ලෙස ගණන් කථාවේ 12 හි මිරියම් පිළිබඳ කතාව බලන්න. යේසුස්වහන්සේ තමන්වහන්සේගේ සේවයේ මුල් කාලයේදී කළ සුව කිරීමකදී මෙසේ පැවසූ සේක.

> **ඉන්පසු යේසුස්වහන්සේ දේවමාළිගාවේදී ඔහු දැක: බලාපන්න, නුඹ සුවය ලැබුවේහිය. නුඹට මීට වඩා නරකක් සිදුනොවන පිණිස, තවත් පව් නොකරන්නැයි ඔහුට කීසේක. (යොහන් 5:14)**

මෙම මනුෂ්‍යයාගේ රෝගය, පාපයේ ප්‍රතිඵලයක් ලෙස පෙනෙන්නට තිබුණි. එහෙත් තවත් අවස්ථාවලදී රෝගය පාපයේ ප්‍රතිඵලයක් නොව දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා බව යේසුස්වහන්සේ පැහැදිලිව ප්‍රකාශ කළ සේක.

> **උන්වහන්සේ යද්දී, උපන්දා පටන් අන්ධවූ මනුෂ්‍යයෙකු දුටුසේක. උන්වහන්සේගේ ගෝලයෝ රබ්බි, මොහු අන්ධව ඉපදීමට පව්කළේ කවුද? මොහුද? මොහුගේ මවුපියෝද?යි ඇසුවෝය. යේසුස්වහන්සේ උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ ක්‍රියා මොහු කෙරෙහි ප්‍රකාශවන පිණිස මිස මොහුවත් මොහුගේ මවුපියන්වත් පව්කළ නිසා නොවේ. (යොහන් 9:1-3)**

දෙවියන්වහන්සේගේ මහිමය සඳහා වූ රෝගයක්ද සාතන් නිසා ඇතිවන්නකි. එහෙත් ශාරීරික සුවය යාච්ඤාව තුළින් ලැබූ විට එය දෙවියන්වහන්සේ තම මහිමය උදෙසා යොදාගන්නාසේක. මේ ආකාරයේ රෝගයක් සාතන්ගේ සෘජු ශාරීරික ප්‍රහාරයකි. ජයග්‍රහණය සඳහා ප්‍රතිඋපක්‍රම භාවිත කළ විට, මෙම ශාරීරික ප්‍රහාරය සැබවින්ම දෙවියන්වහන්සේට මහිමය ගෙන එනු ඇත.

සෑම රෝගයක්ම පාපය නිසා හෝ සාතන් නිසා හෝ දඬුවමක් පිණිස හෝ ඇති නුවූවකි. ස්වභාවික නීති කඩ කිරීම නිසාද රෝග ඇති වේ. නිදසුනක් ලෙස ඔබ නියම ආකාරයෙන් ආහාර නොගත් නිසා රෝගයකට ගොදුරු විය හැකිය. නැතහොත් පොල්ගසකින් පැනීමෙන් ඔබේ කකුල කැඩී යා හැකිය. ස්වභාවික නීති කඩ කිරීමට ඇතිවන පරීක්ෂාව සාතන් විසින් අනියමින් ඔබගේ ශරීරයට එල්ල කරන ප්‍රහාරයකි. අනිසි ලෙස ආහාර ගැනීමට හා ඔබගේ ශරීරය කෙරෙහි සැලකිලිමත් නොවීමට ඔහු ඔබව පොලඹවයි. ඊට හේතුව එමගින් ඔබ රෝගාතුර වන බවත් ඒ නිසා දෙවියන්වහන්සේ කෙරෙහි ඔබගේ ඇති ඵලදායිත්වයට බාධා කෙරෙන බවත් ඔහු දන්නා බැවිනි.

## විඩාවට පත්වීම :

විඩාවට පත්කිරීම තුළින්ද සාතන් ඔබගේ ශරීරයට පහර දෙයි. ඒ ඔබ බොහෝ සේ වෙහෙස වී වැඩ කළ විට හා කාර්ය බහුල වූ විටය. ඔබ ශාරීරිකව වෙහෙසට පත්ව සිටින විට, සාතන් ඒ අවස්ථාව ඔබට ආත්මිකව පහර ගැසීමට ප්‍රයෝජනයට ගනී. සාතන් යේසුස්වහන්සේ ළඟට පැමිණියේ උන්වහන්සේ දින 40ක් නිරාහාරව සිට විඩාවට පත් වූ අවස්ථාවේදිය (මතෙව් 4:2). එලියා ආත්මික කටයුතුවලින් බොහෝසේ විඩාවට පත්ව සිටි අවස්ථාවේ අධෛර්යයට පත්වී ඔහුට මැරෙන්නට අවශ්‍ය විය (1 රාජාවලිය. 19:4).

## මරණය :

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණෙන තෙක් සියලුම මනුෂයන්ට ශාරීරික මරණය පැමුණුනද, ඔබව අකාල මරණයට පත් කිරීමට සාතන් උත්සාහ දරයි. ඔහු සිය දිවි නසා ගැනීමට මිනිසුන් පොලඹවයි. එමෙන්ම රෝග නිසා හෝ ප්‍රතිඵලය මරණය විය හැකි අනතුරු ගැන බිය ඇති කිරීමට සාතන් උත්සාහ දරයි.

## වැරදි ලෙස ප්‍රයෝජනයට ගැනීම :

මත්පැන්, මත්ද්‍රව්‍ය වැනි විෂ සහිත ද්‍රව්‍ය ගැනීමෙන් තම ශරීරය වැරදි කටයුතු වල යෙදවීමට සාතන් මිනිසුන්ව පොලඹවයි. එවැනි විෂ සහිත ද්‍රව්‍යවලින් ලෙඩ රෝග සෑදෙන බවත්, මනසට හානි සිදුවන බවත්, මරණය වුවද සිදුවිය හැකි බවත් ඔහු දනී.

# ආත්මික ප්‍රතිඋපක්‍රම: ශාරීරික ප්‍රහාරවලින් ජය ගැනීම

ඔබ අසනීප වූ විට, ඔබගේ අසනීපයට හේතුව තීරණය කිරීමට ස්වාමින්වහන්සේ වෙත යන්න. ඔබ ස්වභාවික නීතියක් කඩ කිරීම නිසා රෝගාතුර වූයේද? නිදසුනක් ලෙස අනිසි ලෙස ආහාර අනුභව කෙළෙහිද නැතහොත් අපිරිසිදු ජලය පානය කළෙහිද? සිගරට් දුම් වැනි විෂ සහිත දේ ඔබ ශරීරයට ඇතුළු කරමින් ශරීරය වැරදි ලෙස පරිහරණය කෙළෙහිද?

ඔබ ස්වභාවික නීති කඩකර ඇත්නම්, දෙවියන්වහන්සේට ඔබ සුවකළ හැකිය. එහෙත් ඔබ ඉදිරියේදී වඩාත් ප්‍රඥාවන්තව ක්‍රියා කළ යුතු වේ. ඔබගේ ශරීරය දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගාව බව මතක තබා ගන්න. ස්වභාවික නීති කඩ කිරීම නවත්වා ඔබගේ ශරීරය ගැන වඩාත් සැලකිලිමත් වන්න. විඩාවට පත්වූ අවස්ථාවලදී ද මෙය මතක තබා ගැනීම වැදගත් වේ. යේසුස්වහන්සේ තම ගෝලයන්ට, ඔවුන් අධික ලෙස වෙහෙසව වැඩ කළ පසු විවේක ගැනීමට උපදෙස් දුන් සේක (මාක් 6:31).

එලියා වෙහෙසට හා දොම්නසට පත්ව සිටි අවස්ථාවේ ගසක් යට විවේකගත් අතර දෙවියන්වහන්සේ දේවදූතයෙකු අත ඔහුට ආහාර එවූ සේක. දෙවියන්වහන්සේගෙන් නව ස්පර්ශයක් ලැබෙන තෙක් එලියා බලා සිටියේය. ඔහු සේවයේ අලුත් අභියෝගවලට මුහුණ දීමට පෙර ඔහුගේ ශාරීරික ශක්තිය අලුත් වන තෙක් බලා සිටියේය (1 රාජා. 19:4-8).

පාපයට දඬුවමක් ලෙස රෝගයක් සෑදුන විට එය සාතන් විසින් සිදුකළ දෙයක් නොවන අතර සතුරාගේ බලය බැඳීමෙන් පලක් නැත. ඊට සහනය ලැබෙන්නේ පශ්චාතාපවීමෙන් හා දෙවියන්වහන්සේ වෙතට ආපසු පැමිණීමෙන් පමණී.

> **වරෙල්ලා, අපි ස්වාමින්වහන්සේ වෙතට හැරීයමු. මක්නිසාද ඉරා දැමුවේ උන්වහන්සේය. උන්වහන්සේ අප සුවකරනවා ඇත. පහරදෙන උන්වහන්සේ අපේ තුවාල බඳිනවා ඇත. (හොසියා 6:1)**
>
> **''' මම නුඹට සනීප ලබාදී, නුඹේ පහර සුවකරන්නෙමියි ස්වාමින්වහන්සේ කියනසේක. (යෙරෙමියා 30:17)**
>
> **නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ හඬට නුඹ ඕනෑකමින් ඇහුම්කන්දී උන්වහන්සේගේ ඇස් හමුයෙහි හරිව තිබෙන දේ කොට උන්වහන්සේගේ ආඥාවලට කන්දෙමින් උන්වහන්සේගේ සියලු නියෝග රක්ෂාකරන්නෙහි නම් මිසරවරුන් පිට මා පැමිණෙවූ රෝගවලින් එකක්වත් නුඹ පිටට නොපමුණුවන්නෙමි. මක්නිසාද මම වනාහි නුඹ සුවකරන්නාවූ ස්වාමින්වහන්සේයයි කීසේක. (නික්මයාම 15:26)**
>
> **උන්වහන්සේ තාගේ සියලු අයුතුකම් කමාකරන සේක. තාගේ සියලු රෝග සුවකරන සේක. (ගීතාවලිය 103:3)**

සාතන් විසින් ශා×ꕤික ප්‍රහාරයන් එල්ල කරන විට, ඇදහිලිවන්තයෙකු ලෙස ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේ පාලනය කරන බව මතක තබා ගැනීම වැදගත් වේ. සාතන්ට ඔබව ස්පර්ශ කළ නොහැකි අතර දෙවියන්වහන්සේ නොදැනුවත්ව ඔබගේ ජීවිතය ගැනීමටද ඔහුට නොහැකිය. මෙම කරුණු විමසා බැලීමට යෝබ් පළමුවන හා දෙවන පරිච්ඡේද කියවන්න. දෙවියන්වහන්සේගේ බලය සාතන්ගේ බලයට වඩා වැඩිය. මනුෂ්‍ය ශරීරය තැනූ දෙවියන්වහන්සේට එම ශරීරිය සුව කිරීමේ හැකියාවද ඇත. ඔබ සාතන්ගේ ශාරීරික ප්‍රහාරවලට ලක්වන විට මෙම පොරොන්දු ඉටු කරන ලෙස ඉල්ලා සිටින්න.

> **නුමුත් මාගේ නාමය කෙරෙහි භය ඇත්තාවූ නුඹලාට ධර්මිෂ්ඨකමේ සූර්යයා ස්වකීය පියාපත්වල සුවකිරීම ඇතුව උදාවන්නේය. නුඹලා නික්ම ගොස් ගාලේ වස්සන් මෙන් පනින්නහුය. (මලාකි 4:2)**
>
> **අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත්වන පිණිස, උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන් ඉසුලූ සේක. උන්වහන්සේගේ තුවාල වලින් නුඹලා බැටළුවන් මෙන් මුළාවයමින් සිටියහුය. නුමුත් දැන් නුඹලාගේ ආත්මවල එඬේරාද රැකවලාද වෙතට හැරී ඇවිත් සිටින්නහුය. (1 පේතෲස් 2:24)**

**නුමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය, පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය, අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමුණුණේය. උන්වහන්සේගේ පහරවලින් අපට සුවය ලැබී තිබේ. (යෙසායා 53:5)**

**ප්‍රේමවන්තය, නුඹේ ආත්මය සඵලවන්නාක්මෙන්ම නුඹ සියල්ලෙහි සඵලවන ලෙසද සුවසේ සිටින ලෙසද යාච්ඤා කරමි. (3 යොහන් 1:2)**

සාතන් ඔබට ශාරීරිකව ප්‍රහාරයන් එල්ල කරන විට අනෙක් ඇදහිලිවතුන්ගේ යාච්ඤාවන් ඉල්ලා සිටින්න. සුවකිරීමේ ආත්මික දීමනාව ඇති අයගේ හා වැඩි මහල්ලන්ගේද යාච්ඤා මීට ඇතුලත්ය.

**එම ආත්මයාණන්වහන්සේ තුළ වෙන කෙනෙකුට ඇදහිල්ලද, එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙකුට සුවකිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආශ්වර්ය කිරීමද '''
(1 කොරින්ති 12:9)**

**මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්වර්ය කරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද ''' සභාවෙහි පිහිටෙවූ සේක. (1 කොරින්ති 12:28)**

**එවිට ඇදහිල්ලේ යාච්ඤාවෙන් රෝගාතුරයාට සුවය ලැබේ. ස්වාමින්වහන්සේ ඔහු නැගුටුවනවා ඇත. ඔහු පාපයන්කර තිබේ නම්, ඒවා ඔහුට කමාකරනු ලැබේ.
(යාකොබ් 5:14-15)**

අවසාන කාලය එන තෙක්, ශාරීරික මරණය ජීවිතයේ අංගයකි. ඇදහිලිවතුන් ඊට බිය විය යුතු නැත. ඒ අපට සදාතන ජීවනයේ පොරොන්දුව ඇති බැවිනි.

**එම්බා මරණය, තාගේ ජය කොයිද? එම්බා මරණය, තාගේ කටුව කොයිද?
(1 කොරින්ති 15:55)**

**එසේය, අපි ධෛර්යවත්ව, ශරීරයෙන් ඈත්ව ස්වාමින්වහන්සේ සමඟ සිටින්ට වඩා කැමතිවෙමුව. (2 කොරින්ති 5:8)**

නියමිත කාලයට පෙර ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය ගැනීමට සාතන්ට නොහැකිය. එය යෝබ්ගේ කතාවෙන් පැහැදිලි වේ. කෙසේ වුවද මනුෂ්‍ය කැමැත්ත දෙවියන්වහන්සේ මැඩපවත්වන්නේ නැත. සිය දිවි නසා ගැනීමට සාතන් යම් පුද්ගලයෙකුව පොළඹවනු ලැබුවහොත් හා ඔහු ඒ පරීක්ෂාවට යටත් වුවහොත් ඔහුගේ ඒ කැමැත්ත දෙවියන්වහන්සේ මැඩපවත්වන්නේ නැත.

## සාතන්ගේ උපක්‍රම: මනුෂ්‍ය පෞරුෂත්වය තුළින් එල්ල කෙරෙන ප්‍රහාර

සාතන් ඔබට පහර ගසන තවත් මාර්ගයක් වන්නේ මිනිසා තුළිනි. ඔබට ආත්මිකව පහර ගැසීමට ඔබ වටා සිටින මිනිසුන් යොදවා ගැනීමට සාතන්ට හැකිය. පහර ගැසීම පවුල, මිතුරන්, සතුරන්, ව්‍යාපාරික හවුල්කරුවන් හෝ නාඳුනන තැනැත්තන් තුළින් වුවද පැමිණිය හැකිය. මිනිසා "ආලෝකයේ දූතයන්" ප්‍රේරිතයන් සහ ධර්මිෂ්ඨකමේ දේව සේවකයන් ලෙස වෙස්වළා ගත හැකිය. එහෙත් සැබවින්ම සාතන් ඔවුන් තුළින් ක්‍රියා කරන්නේය.

**එබඳු මනුෂ්‍යයෝ බොරු ප්‍රේරිතයෝය. ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයන්ගේ වෙස් ගන්නාවූ වංචාකාර සේවකයෝය. ඒක පුදුමයක් නොවේ. මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ. ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය.**

**මා අඥානයෙන්ය කියා කිසිවෙක් නොසිතාවයි මම නැවත කියමි, නුමුත් නුඹලා එසේ සිතුවත් මාත් මඳක් පාරට්ටුකරගන්න පිණිස අඥානයෙකු හැටියට මා පිළිගනිල්ලා.
(2 කොරින්ති 11:13-16)**

ආත්ම මාරුවීමේ සංක්‍රමණය වීමේ ආත්ම උපාය පිළිබඳව දැනටමත් පසුගිය පරිච්ඡේදයක ඇතුළත්කර ඇත. එහෙත් මිනිසා භාවිත කිරීමට සාතන්ට ද වෙනත් මාර්ග ඇත්තේය. ඔබට වැරදි උපදෙස් දෙන පිණිස සාතන් මිනිසුන් උපයෝගී කරගනු ඇත. යෝබ්ගේ පොත කියවා ඔහුගේ මිතුරන් සහ ඔහුගේ භාර්යාව දුන් වැරදි උපදේශ වෙත අවධානය යොමු කරන්න. අනාවැකි කිම ශුද්ධාත්මයාණන්ගේ දීමනාවක් වුවද සාතන්ට ද ඔහුගේ අනාගතවක්තෘවරු සිටිති. මනුෂ්‍යයන් තුළින් ලැබෙන පෞද්ගලික අනාගතවාක්‍යයන් සැමවිටම දේවානුභාවයෙන් ලැබූ ඒවා නොවේ. 1 රාජාවලිය 13 හි ඇති මේ පිළිබඳ දුක්බරදායක උදාහරණය අධ්‍යයනය කරන්න. සාතන්ගේ පහර ගැසීම විශ්වාසවන්ත මිතුරන් තුළින් මෙන්ම සතුරන් තුළින් හෝ ඇදහිලිවතුන් නොවන අය තුළින් පැමිණිය හැකිය.

> **මක්නිසාද මට නින්දාකළේ සතුරෙක් නොවේ, එසේ වුයේ නම් මට ඉවසිය හැක්කේය. මට විපක්ෂව තමාම උසස්කරගත්තේ මට වෛරවූ තැනැත්තේ නොවේ. එසේ වුයේ නම් මම ඔහු කෙරෙන් සැඟවී යන්නෙමි. නුමුත් එසේ කළේ මා සමාන මනුෂ්‍යයෙක් වූ, මාගේ සමාගම්කාරයෙක්වූ, මාගේ හිතේසි මිත්‍රයෙක්වූ නුඹමය. අපි එක්ව ප්‍රිය මන්ත්‍රණ පැවැත්වීමුව. සමූහයා සමඟ දෙවියන්වහන්සේගේ ගෘහයෙහි සක්මන් කෙළෙමුව. (ගීතාවලිය 55:12-14)**

ඔබව උසස් කරවීමට සහ දෙවියන්වහන්සේගේ මහිමය ඔබට ලබාගැනීම සඳහා සාතන් මිනිසුන්ගේ පෞරුෂත්වය උපයෝගිකරගනු ඇත.

> **සෙනඟ හඬනඟා කතාකොට: මෙය මනුෂ්‍යයෙකුගේ හඬ නොව දෙවිකෙනෙකුගේ හඬයයි කිව්වෝය. ඔහු ඒ ගෞරවය දෙවියන්වහන්සේට නුදුන් බැවින්, ස්වාමින්වහන්සේගේ දූතයෙක් එකෙණෙහිම ඔහුට පහරදුන්නේය. ඔහු පණුවන් විසින් කන ලදුව මැරුණේය. (ක්‍රියා 12:22-23)**

ඔබගේ ජීවිතය සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්මෙන් ඔබ ඉවතට ගෙනයාමට සාතන් විසින් මිනිසුන් උපයෝගී කොටගෙන ඇත. මේ අයුරින් පේත්‍රුස් යේසුස්වහන්සේට එරෙහිවීම පිණිස සාතන් විසින් යොදාගත්තේ කෙසේදැයි කියවන්න (මාක් 8:31-33). දෙවියන්වහන්සේ වෙනුවට වෙනත් අය වෙත ඔබගේ ඇස් යොමුකරවීමට සාතන් උත්සාහ කරනු ඇත. යොහන් පිළිබඳව පේත්‍රුස් වියවුල් විය (යොහන් 21:20-23).

මාංශයේ ක්‍රියාවන් අන්‍යයෙකු හා කරට කරසිටින්නට වැඩි කරවීමට සාතන් ඔබව පොළඹවනු ඇත (ගලාති 5:19-21). අන්‍යයෙකු හා කරට කර සිටින්නට වෑයම් කිරීම අනුකරණය කිරීම, සමානවීම, අනෙක් අය පරාජය කිරීම, පිටපත් කිරීමට, තරඟකාරීවීම හෝ ඔවුන් සමඟ තරඟ කිරීම, ඔබ මේ දේවල නියැලෙනතාක් ඔබගේම ජීවිතය සඳහා වන දෙවියන්වහන්සේගේ සැලැස්ම අනුගමනය කරන්නේ නැත.

සාතන් ඔබ රවටන පිණිස මිනිසුන් යොදා ගනු ඇත. ජොෂුවාට මෙය සිදුවූයේ කෙසේදැයි කියවන්න (යොෂුවා 9). මිනිසුන් ඔබ අත්හැර දමනු ඇත. (2 තිමෝති 4:16-17, ක්‍රියා 15:37-38, යොහන් 6:66). අනෙක් අය සම්බන්ධයෙන් සාතන් ඔබගේ ආත්මික බලාපොරොත්තුවලට බාධා කොට වියවුල්තාවය හා භේද භින්නතා ඇතිකරනු ඇත (1 කොරින්ති 14:33, යාකොබ් 3:16). ඔබගේ ජීවිතයේ ලැබෙන අවස්ථාවන්ට බාධා කිරීමට සාතන් අනෙක් මිනිසුන් යොදාගනු ඇත. යෝසෙප්ගේ ජීවිතයේ මෙය සිදුවූයේ කෙසේදැයි උත්පත්ති 37 සහ 39 පරිච්ඡේද කියවන්න.

## ප්‍රති උපායන්: මනුෂ්‍ය පෞරුෂත්ව වලට එරෙහිව ජයග්‍රහණය

ආත්ම මාරුවීම පිළිබඳව වූ පෙර පරිච්ඡේදයේ මිතුරන් හා සබඳතා පවත්වන්නන් පරෙස්සමෙන් තෝරා ගැනීම අවධාරණය කළේය. මෙය සාතන් අන් අය තුළින් අපට එල්ල කරන ප්‍රහාර ජය ගැනීමේ වැදගත් ප්‍රතිඋපක්‍රමයකි. සමීප සබඳතා පවත්වන්නන් පරෙස්සමෙන් තෝරා ගැනීමෙන් රැවටීම, අත්හැරයාම, අධෛර්යයට පත්කිරීම, වැරදි උපදෙස් හා ආත්මික ප්‍රගතියට බාධා පැමිණවීම ආදිය මඟ හැරෙනු ඇත. එහෙත් මනුෂ්‍ය පෞරුෂත්වය ජයග්‍රහණය කෙරෙන තවත් වැදගත් ප්‍රතිඋපක්‍රම දෙකක් ඇත.

**පළමුවැන්න: මිනිසාට නොව දෙවියන්වහන්සේට කීකරුවන්න**

> **පේත්‍රුස්ද ප්‍රේරිතයෝද උත්තරදෙමින්: මනුෂ්‍යයන්ට වඩා දෙවියන්වහන්සේට අපි විසින් කීකරු විය යුතුය. (ක්‍රියා 5:29)**

**දෙවැන්න: අන් අය අනුගමනය කළ යුත්තේ ඔවුන් දෙවියන්වහන්සේ අනුගමනය කරන ආකාරය අනුව පමනි.**

> **එබැවින් නුඹලා ප්‍රිය දරුවන් මෙන් දෙවියන්වහන්සේ අනුව යන්නෝ වෙයල්ලා. (එපීස 5:1)**

දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය සමඟ එකඟ නොවන අවස්ථාවල කිසිම කෙනෙකුගෙන් උපදෙස් හේ අනාවැකි හෝ පිළිනොගන්න. දේව වචනය හා එකඟ නොවන ජීවිත ගත කරන අයගේ නායකත්වය පිළිනොගන්න, ඔවුන්ව අගය නොකරන්න. ඔබ සාර්ථක වන්නේ ඔබගේ ජීවිතය සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම අනුගමනය කළහොත් පමණක් බව පිළිගන්න. ඔබ අනෙකුත් අය අනුගමනය කිරීමෙන් සාර්ථක වන්නේ නැත. ඔබ අවට සිටින අය මගින් ඔබ වෙනත් පැත්තකට යොමු නොවිය යුතුය. ඔබ විශ්වාසය තැබිය යුත්තේ එළිදරව්වීම මත මිස අනුකරණය කිරීම මත නොවේ.

ඔබට බලපවත්වන වාතාවරණයන් හැසිරවීම ඔබ වටා සිටින අයට හැකිවුවද දෙවියන්වහන්සේගේ පාලනය තවමත් ඇති බව මතක තබාගන්න. මනුෂ්‍ය පෞරුෂත්ව තුළින් එවැනි ප්‍රහාරයන් යෝසෙප් අත්දුටුවද, දෙවියන්වහන්සේ එය යහපත සඳහා හැරවූ සේක.

> **එබැවින් මා මෙහි එවුවේ නුඹලා නොව දෙවියන්වහන්සේය. උන්වහන්සේ මා පාරාවෝට පියෙක්ද ඔහුගේ මුළු ගෙදරට ස්වාමියෙක්ද මුළු මිසර දේශයට ආණ්ඩුකාරයෙක්ද කළ සේක. (උත්පත්ති 45:8)**

> **නුඹලා වනාහි මට නපුර කරන්ට අදහස් කළහුය: එහෙත් බොහෝ සෙනඟ දිවි සහිතව රක්ෂාකරන පිණිස අද තිබෙන ප්‍රකාර ඉෂ්ටකිරීමට දෙවියන්වහන්සේ ඒක යහපතට අදහස්කළ සේක. (උත්පත්ති 50:20)**

## සාතන්ගේ උපක්‍රම: පවුල වෙත ප්‍රහාරයන් එල්ල කිරීම

ලෝකය ආරම්භයේ දී දෙවියන්වහන්සේ පළමුව මනුෂ්‍යයා මැවූ විට උන්වහන්සේ ආරම්භයේදී පිහිටවූ මූලික සමාජ ඒකකය පවුල වේ. දෙවියන්වහන්සේ සෑම අවස්ථාවකම පවුල කෙරෙහි අවධානය යොමු කර ඇත. උන්වහන්සේ තෝරාගත් සෙනඟගෙන් යුත් ජාතියක් ගොඩනැඟුවේ එක් මනුෂ්‍යයෙකුවූ ආබ්‍රහම්ගේ පවුල තුළිනි. ක්‍රිස්තුස්වහන්සේ හා සභාව අතර ආත්මික සබඳතාව විස්තර කිරීමට තෝරාගනු ලැබුවේ මනුෂ්‍යයා හා ස්ත්‍රිය අතර ඇති භෞතික සබඳතාවයය. ශුද්ධ ලියවිල්ල මුළුල්ලේම උන්වහන්සේගේ සැලැස්ම සඳහා පවුලේ ඇති වැදගත්කම අවධාරණය කර ඇත.

සියලුම ව්‍යුහයන් ඇතිවන මූලික ව්‍යුහය පවුල වේ. රජයේ හා අගමික නායකයන් ඇති වන්නේ පවුල තුළිනි. ප්‍රජාවන් හා ජාතීන්, එකට එක් කරන ලද පවුල් බොහොමයකින් සමන්විත වේ. සමාජයේ මෙම මූලික ඒකකයේ වැදගත්කම නිසා පවුල සාතන් ප්‍රහාරයන් එල්ල කරන ඉලක්කයක් බවට පත්වී ඇත.

මිනිසා හා ඔහුගේ බිරිඳ අතර ඇති සබඳතාවට සාතන් ප්‍රහාරයන් එල්ල කරයි. ඔහු පාපයට පෙළඹෙන අනිසි ලිංගික සබඳතා ඇති කිරීමට උත්සාහ කරනු ඇත (1 කොරින්ති 7:5). කාමමිථ්‍යාචාරයේ පාපයට ඔහු මිනිසා හා ස්ත්‍රිය පොළඹවයි (ගලාති 5:19). ඔහු දෙවියන්වහන්සේ වෙතින් එක් සහකරුවෙකු ඉවත් කිරීමට අනෙක් සහකාරයාට බලපෑම් ඇති කරයි (යෝබ් 2). සාතන් නිවෙස තුළ බෙදීම් ඇති කරයි. මෙය බහින් බස් වීමේ සිට දික්කසාදය දක්වා පරාසයක පවතී. සාතන් බෙදීම් ගෙන ඒමට උත්සාහ කරන්නේ ඔහු මේ දේ දන්නා නිසාය.

> **උන්වහන්සේ ඔවුන්ගේ සිතිවිලි දැන ඔවුන්ට කථාකොට: තමාටම විරුද්ධව භේදවුණාවූ හැම රාජ්‍යයම පාළුවන්නේය. තමාටම විරුද්ධව භේදවුණාවූ හැම නුවර හෝ ගෙය නොපවතින්නේය. (මතෙව් 12:25)**

බෙදීම් ගෙන ඒම තුළින් ජාතියක ගෙවල් විනාශ කිරීමට සාතන්ට හැකි නම්, අවසානයේදී මුළු ජාතියම විනාශ කිරීමට ඔහුට පුළුවන.

දෙවියන්වහන්සේ නිවසක නියෝග දාමයක් පිහිටුවා ඇති අතර පුරුෂයා නිවසේ ප්‍රධානියා වන අතර ඔහු බිරිඳට ප්‍රේම කළ යුතුය. බිරිඳ ඔහුගේ නායකත්වය පිළිගත යුතු අතර දරුවෝ දෙමවුපියන්ට යටත් විය යුත්තාහ (1 කොරින්ති 7, එපීස 5:1-6:1). සාතන් නිවසේ පුරුෂයා ඉලක්ක කර අනාදරයෙන් හැසිරීමට ඔහු පොළඹවයි. මෙහි ප්‍රතිඵලය වන්නේ බිරිඳගේ හා දරුවන්ගේ ගෞරවය ඔහුට නොලැබීම වේ. පුරුෂයාට එරෙහිව ක්‍රියා කිරීමට සාතන් බිරිඳව පොළඹවයි. නිවසේ සිටින ළමයින්වද සාතන් තම ප්‍රහාරවලට ඉලක්ක කර ගනී. නිවෙස තුළ විනයක් නොමැතිකමේ වාතාවරණයක් ඔහු ඇති කරන අතර එහි ප්‍රතිඵලය වන්නේ අඬදබරය. 1 සාමුවෙල් 2 හි ඒලිගේ පුත්‍රයා ගැනද 2 සාමුවෙල් 13-19 හි දාවිත්ගේ පුත්‍රවූ අබ්සොලොම් ගැනද කියවන්න. නිවෙසක ඇති සතුරාගේ ප්‍රහාරයන් ගැන යේසුස්වහන්සේ අනතුරු ඇඟවූ සේක.

> **මක්නිසාද මෙවක් පටන් එක ගෙයක සිටින පස්දෙනෙකුගෙන් දෙදෙනෙකුට විරුද්ධව තුන්දෙනෙක්ද තුන්දෙනෙකුට විරුද්ධව දෙදෙනෙක්ද භේදව සිටින්නෝය. පියා පුත්‍රයාටත් පුත්‍රයා පියාටත් මවු දුවටත් දුව මවුටත් නැන්දා යෙහෙළියටත් යෙහෙළි නැන්දාටත් විරුද්ධව භේද වන්නෝයයි කීසේක. (ලූක් 12:52-53).**

## ආත්මික ප්‍රතිඋපක්‍රම: පවුල තුළ ජයග්‍රහණය

ඇදහිලිවන්තයෙකු තම සහකාරයා/සහකාරිය නිවැරදිව තෝරාගත්තේ නම් පවුල තුළ ඇතිවන බොහෝ ගැටලු මගහරවා ගත හැකිය. නොඇදහිලිවන්තයන් සමග විවාහ නොවන ලෙසට බයිබලය අනතුරු අඟවයි.

> **දෙදෙනෙක් එකඟවුණොත් මිස නැත්නම් එක්ව යනවා ඇද්ද? (ආමොස් 3:3)**
>
> **නොඇදහිලිකාරයන් සමඟ අසම ලෙස සම්බන්ධ නොවෙල්ලා. ධර්මිෂ්ඨකමෙත් අධර්මිෂ්ඨකමෙත් ඇති සහභාගිකම මොකද? නොහොත් අන්ධකාරය සමඟ ආලෝකයේ ඇති පංගුකාරකම මොකද? (2 කොරින්ති 6:14)**

පවුල් ඒකකයක් තුළ ඇදහිලිවන්තයන් හා නොඇදහිලිවන්තයන් සිටින විට, ආත්මික භේදයක් පවතී. මෙය මාංසය හා රුධිරය අතර පවතින ගැටුමක් නොවේ. එය ආත්මික ඝට්ටනයකි. එය පරුෂ වචනවලින් හෝ තර්ක විතර්කවලින් හෝ විසඳිය නොහැකිය.

පවුලක එක්සත්කම ක්‍රිස්තුස්වහන්සේ හා සභාව අතර එක්සත්කමට සමාන නිසා සාතන් ඊට එරෙහිව සටන් කරයි. ඇදහිලිවන්තයන් මෙය තේරුම්ගෙන මෙසේ පැවසිය යුතුය.

> **''' එහෙත් අපි නම් මමද මාගේ පවුලද ස්වාමින්වහන්සේට සේවය කරමුයයි කීවේය. (යෝෂුවා 24:15)**

ආබ්‍රහම්ට දෙන ලද පොරොන්දුවේ උරුමක්කාරයන් ලෙස ඔබට එම පොරොන්දුව ඉල්ලිය හැකිය. ¶පොළොවේ සියලු පවුල් නුඹ කරණකොටගෙන ආශිර්වාද ලබන්නෝය¶ (උත්පත්ති 12:3). ඔබ ආබ්‍රහම්ගේ ආත්මික උරුමක්කාරයෙකු බැවින් ඔබගේ පවුලට ආශිර්වාද කරනු ඇත.

සාතන්ගේ ප්‍රහාරවලින් බේරීමට ඔබගේ පවුල ආත්මිකව එකට වර්ධනය විය යුතුය. දෙවියන්වහන්සේගේ වචනය පවුල එකට බැඳ තබනු ඇත.

> **මා විසින් අද නුඹට අණ කරන මේ වචන නුඹේ සිතේ තිබේවා. ඒවා නුඹේ දරුවන්ට හොඳකාරයෙන් උගන්වා, නුඹ ගෙයි හිඳින කලද මග යන කලද නුඹ සයනයකරන කලද නැගිටින කලද ඒවා ගැන කථා කරපන්න. ඒවා නුඹේ අතෙහි ලකුණක් පිණිස බැඳගනින්න, ඒවා නුඹේ ඇස් අතරෙහි නළල් පටි පිණිස තිබේවා. ඒවා නුඹේ ගෙයි උළුවහු පිටද නුඹේ දොරවල් පිටද ලියාපන්න. (ද්විතිය කථාව 6:6-9)**

ඔබ සේවයේ නායකත්වය ලබා ගැනීමට පෙර ඔබගේ පවුල නියමාකාරයෙන් පැවතිය යුතුය. නායකත්වය සඳහා නව ගිවිසුමේ අවශ්‍යතාවන් වන්නේ තම පවුල හොඳින් හසුරුවාගැනීම වේ (තිතස් 1 හා 1 තිමෝති 3 බලන්න). සේවය කෙරෙහි දක්වන වැරදි අවධාරණය නිසා කිතුනු පවුල් බොහෝමයක භේද ඇතිවී තිබේ. මේ ක්ෂේත්‍රයේ ඇති සාතන්ගේ උපක්‍රම පරාජය කිරීමට ඇදහිලිවන්තයෙකු සභාවේ නායක තනතුරු ලබාගන්නට ප්‍රථම තම නිවෙස ශුද්ධලියවිල්ලේ ප්‍රකාරයට සකස් කර ගත යුතුය. දෙමවුපියන්ට තම දරුවන් හික්මවීමේ වගකීමක් තිබේ. ඒලිගේ හා දාවිත්ගේ නිවෙස්වල ගැටලු මතුවූයේ විනයක් නොතිබීම නිසාය. මෙම වගකීම පිළිබඳව බයිබලය උපදෙස් දී ඇත.

> **දරුවෙකු සුදුසු මාර්ගයෙහි පුහුණුකරපන්න, එවිට ඔහු වයස්ගතවූ කලත් එයින් අහක්ව නොයන්නේය. (හිතෝපදේශ 22:6)**

> **ඉපල පාවිච්චි නොකරන්නා තම පුත්‍රයාට වෛරවන්නේය. එහෙත් ඔහුට ප්‍රේමවන්නා කල් තබා ඔහුට දඬුවම් කරන්නේය. (හිතෝපදේශ 13:24)**

## සාතන්ගේ උපක්‍රම: මුදල් සම්බන්ධ ප්‍රහාරයන්

මුදල් හා ඇදහිලිවන්තයාට අයත් දේ සාතන්ගේ ප්‍රහාරවලට ලක්වන තවත් ක්ෂේත්‍රයක් වේ. සාතන්ගේ ප්‍රහාර දියත් කරන ප්‍රධාන ක්ෂේත්‍ර දෙකකි.

**පළමුවැන්න:** ඇදහිලිවන්තයෙකුගේ වැරැද්දක් නොමැතිව මුදල් නැතිවීම' මෙය ඇදහිලිවන්තයෙකුගේ මුදල් හා ඇදහිලිවන්තයාට අයත් දේ කෙරෙහි සාතන් සෘජුව කරනු ලබන ප්‍රහාරයක් වේ.

**දෙවැන්න:** දේව වචනයේ උපදෙස් කඩ කිරීම තුළින් මුදල් හා ඇදහිලිවන්තයාට අයත් දේ කෙරෙහි එල්ල කරනු ලබන ප්‍රහාරයන්.

පළමු වර්ගයේ ප්‍රහාරය යෝබ් 1 හා 2 පරිච්ඡේද මගින් පැහැදිලි කර ඇත. යෝබ්ගේ ගව සම්පත් (එය ඔහුගේ ව්‍යාපාරය විය) හා නිවෙස විනාශ කිරීම මගින් සාතන් ඔහුගේ මුදල්වලට ප්‍රහාරයක් එල්ල කළේය. වෙනත් වචන වලින් කිවහොත් ඔහුගේ සියල්ල කඩා වැටිණි. යෝබ් ධර්මිෂ්ඨ මිනිසෙකු බව බයිබලය ප්‍රකාශ කරයි. එබැවින් ඔහු ආත්මික ප්‍රතිපත්ති කඩ නොකළ බව අපි දනිමු.

දෙවැනි වර්ගයේ ප්‍රහාරය ඕනෑම ආකාරයක දේව වචනයේ උපදෙස් කඩ කිරීම තුළින් පැහැදිලි වේ. බයිබලීය මූලධර්ම කඩකිරීමට ඇදහිලිවන්තයන්ව යොමු කළ හැකි නම් ඔවුන්ගේ මුදල්වලට ආශිර්වාද නොලැබෙන බව ඔහු දනී. මුදල් හා ඇදහිලිවන්තයාට අයත් දේ නොමැති වූ විට, ලෝකය පුරා ශුභාරංචිය පැතිරවීමට උපකාර කිරීමට ඔවුන්ට නොහැකිවන බව ඔහු දනී.

සාතන් අපගේ මුදල් කටයුතුවලට පහර දෙන ආකාරය සොයා ගැනීමට පහත දැක්වෙන නිදර්ශන අධ්‍යයනය කරන්න.

- නොඇදහිලිවතුන් සමඟ ඇති අනිසි ව්‍යාපාරික සබඳතා, 2 කොරින්ති 6:14-18 (මෙය සාමාන්‍යයෙන් ව්‍යවහාර කෙරෙන්නේ විවාහ සබඳතා කෙරෙහි වුවද එය ඇදහිලිවන්තයන් හා නොඇදහිලිවන්තයන් අතර ඇති සබඳතා වලටද යෙදිය හැකිය.)
- ණයවීම රෝම 13:8
- අන් අය වෙනුවෙන් ණය සදහි අත්සන් කි×ම. හිතෝපදේශ 6:1-2
- මුදල් තිබියදීත් ගෙවීම් නොකර සිටීම. හිතෝපදේශ 3:27-28
- දශයෙන් කොටස හා පූජාවන් නොදීම. මලාකි 3-1-12, හිතෝපදේශ 11:24
- අවංක නොවීම. හිතෝපදේශ 16:8, ක්‍රියා 5:3-4
- වංචාවන්. යාකොබ් 5:3-4
- අසාධාරණ වැටුප්. යෙරමියා 22:13
- තෘෂ්ණාව. හිතෝපදේශ 28:22
- බේබදුකම. හිතෝපදේශ 23:21

- මුදල් පිළිබඳ රජයේ රෙගුලාසි කඩ කිරීම. (රෝම 13:6-7
- කම්මැලිකම එහි ප්‍රතිඵලය දිලි¥කම වේ. හිතෝපදේශ 20:13
- ඉක්මනින් පොහොසත්වීමේ උපායමාර්ග. හිතෝපදේශ 20:21, 28:22
- මුදල්වලට ආශාවීම. 1 තිමෝති 6:10
- "අනවශ්‍ය දේ කෙරෙහි පටලැවෙන" ව්‍යාපාරික හා මුදල් සම්බන්ධ අවස්ථා. 2 තිමෝති 2:4
- පූජාවන් ගැන සැලකිලිමත් නොවීම හා පෞද්ගලික අවශ්‍යතාවන් සඳහා අධිකතර අරමුදල් ලබා ගැනීම. 1 සාමුවෙල් 2:29

## ආත්මික ප්‍රතිඋපක්‍රම: මුදල් කටයුතු ජයගැනීම

තමන්ගේ වරදක් නොමැතිව ඇදහිලිවන්තයෙකුගේ මුදල් හා ඇදහිලිවන්තයාට අයත් දේ පහර දීමට සාතන්ට පුළුවන. මේ සඳහා යෝබ් පිළිබඳ නිදසුන කියවන්න. එහෙත් දෙවියන්වහන්සේගේ අවසරයක් නොමැතිව සාතන්, යෝබ්ගේ මුදල්වලට හෝ ඔහුට අයත් දේවලට හෝ අත තැබුවේ නැත. මෙය යෝබ්ගේ ඇදහිල්ල පරීක්ෂා කිරීමට දෙවියන්වහන්සේ අවසර දුන් ප්‍රහාරයකි. යෝබ් විශ්වාසවන්තව සිටි නිසා දෙවියන්වහන්සේ ඔහුට ආරම්භයේදීට වඩා ආශිර්වාද කළ සේක.

ඔබගේ වරදක් නොමැතිව ඔබ මුදල් අර්භුදයකට මුහුණ දෙන විට එය සතුරා විසින් දියත් කරන ලද ප්‍රහාරයක් බවට සහතික විය හැකිය. දෙවියන්වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය දිගටම පවත්වාගෙන ගියහොත් හා ඔබ ශුද්ධලියවිලි මූලධර්ම අනුව මුදල් කටයුතු කළහොත් මෙම තාවකාලික පරීක්ෂාවෙන් පසු දෙවියන්වහන්සේගේ ආශිර්වාද දිගටම ලැබෙන විට ඔබට පෙනෙනු ඇත.

> **මෙසේ ස්වාමින්වහන්සේ යෝබ්ගේ පටන්ගැන්මට වඩා ඔහුගේ අන්තිමයට ආශිර්වාද කළ සේක. බැටළුවන්ද එළුවන්ද දහහතර දහසකුත් ඔටුවන් හදහසකුත් ගොන්බාන් දහසකුත් කොටළු දෙනුන් දහසකුත් ඔහුට සිටියෝය. (යෝබ් 42:12)**

මෙම මුදල් අර්බුදයකට මුහුණ පා සිටින්නේ ශුද්ධලියවිලි මූලධර්ම කඩකිරීම නිසා නම්, පසුතැවිලි වී වරද නිවැරදි කර ගත යුතුය. නොඇදහිලිවතුන් සමඟ ඇති සම්බන්ධතාවන් නැවැත්විය යුතුය (2 කොරින්ති 6:14-18). වංකකම නැති කළ යුතුය (හිතෝපදේශ 16:8, ක්‍රියා 5:3-4). රජයේ නීති කඩ නොකළ යුතුය (රෝම 13:6-7). සාතන්ගේ උපක්‍රම ප්‍රතිවිරුද්ධ කිරීමට ඔබ වංචාවලින්, (යාකොබ් 5:3-4) අසාධාරණ වැටුප් ගෙවීමෙන් (යෙරමියා 22:13), තෘෂ්ණාවෙන් (හිතෝපදේශ 28:22) බේබදුකමින් (හිතෝපදේශ 23:21) හා කම්මැලිකමින් (හිතෝපදේශ 20:13) වැළකී සිටිය යුතුය.

ඔබ යහපත් ආත්මික භටයෙකු (2 තිමෝති 2:4) වීම වළක්වන, ව්‍යාපාරික හා මුදල් කටයුතුවලින් වැලකී සිටිය යුතුය. වස්තු තෘෂ්ණාව (1 තිමෝති 6:10) මගින් පොලඹවන "ඉක්මනින් පොහොසත්වීම" උපක්‍රම ඔබ ප්‍රතික්ෂේප කළ යුතුය (හිතෝපදේශ 20:21, 28:22). ඔබ වස්තුව කෙරෙහි නොව දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය යුතුය (ද්විතීය කථාව 8:18-19, ගීතාවලිය 49:6). ඔබ අන් අය වෙනුවෙන් ඇප නොවිය යුතු අතර (හිතෝපදේශ 6:1-2) ඔබද ණය වලින් ඉවත් විය යුතුය (රෝම 13:8, හිතෝපදේශ 3:27-28).

ඔබ දසයෙන් කොටස දීම හා පූජාවන් දීම නොකරන්නේ නම්, එය වහාම නිවැරදි කර ගත යුතුය (හිතෝපදේශ 11:24, මලාකි 3:1-12). ඔබ පූජාවන් ලැබෙන කෙනෙකු නම්, ඒවා පෞද්ගලික කටයුතු සඳහා නොයෙදවිය යුතුය. ඒවා සුලු කොට නොසැලකිය යුතුය (1 සාමුවෙල් 2:29). ඔබ දෙවියන්වහන්සේට දසයෙන් කොටස හා පූජාවන් දෙන විට දිය යුත්තේ:

- කැමැත්තෙනි: නික්මයාම 35:5, 1 ලේකම් 29:9
- අවංක සිතකිනි :1 ලේකම් 29:9
- නිදහසේය: මතෙව් 6:38
- රහසිගතවය: මතෙව් 6:3

- නිරන්තරයෙන්මය: 1 කොරින්ති 16:2
- ප්‍රීතියෙනි: 2 කොරින්ති 9:7
- සරලවය: රෝම 12:8
- ඔබගේ ආදායම අනුවය: මතෙව් 5:42
- ඔබගේ හැකියාව අනුවය: එස්රා 2:69
- ආදායම් ප්‍රතිශතයක් වශයෙන්ය: උත්පත්ති 14:20, 28:22, ලෙවී කථාව 27:30, 2 ලේකම් 31:5, මලාකි 3:10.

ඔබගේ මුදල් කටයුතුවලදී සාතන්ගේ ප්‍රහාරවලින් ජයග්‍රහණය කිරීම ඔබට කළ හැකි වන්නේ මෙම ශුද්ධලියවිලි කඩකිරීම් නිවැරදි කර ගැනීමෙන් පමණි.

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලියවිලිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. භෞතික ශරීරයට එරෙහි සාතන්ගේ උපක්‍රම කිපයක් සඳහන් කරන්න.

3. භෞතික ශරීරය තුළ ජයග්‍රහණය සඳහා අවශ්‍ය ආත්මික ප්‍රතිඋපක්‍රම සාරාංශගත කරන්න.

4. ඇදහිලිවතුන්ට එරෙහිව යුද වැදීමට සාතන් මනුෂ්‍ය පෞරුෂත්ව භාවිත කරන්නේ කෙසේද?

5. ඇදහිලිවතුන්ට එරෙහිව යුද වදින මනුෂ්‍ය පෞරුෂත්ව ජය ගැනීම සඳහා ඇති ආත්මික ප්‍රතිඋපක්‍රම ලැයිස්තුගත කරන්න.

6. පවුලට එරෙහිව සාතන් භාවිත කරන ඇතැම් උපක්‍රම මොනවාද?

7. පවුල තුළ ජයග්‍රහණය සඳහා අවශ්‍ය ආත්මික ප්‍රතිඋපක්‍රම ලැයිස්තුගත කරන්න.

---

---

---

8. මුදල් හා ද්‍රව්‍යමය ක්ෂේත්‍රවල ඇති සාතන්ගේ උපක්‍රම සමහරක් සඳහන් කරන්න.

---

---

---

9. මුදල් හා ද්‍රව්‍යමය ක්ෂේත්‍රයේ ජයග්‍රහණය සඳහා අවශ්‍ය ආත්මික ප්‍රතිඋපක්‍රම ලැයිස්තුගත කරන්න.

---

---

---

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපායමාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. යෝබ්ගේ පොත කියවන්න. ශාරීරික, ද්‍රව්‍යමය හා පවුල යන සෑම ක්ෂේත්‍රවලදීම යෝබ්ට පහර දෙන ලදී. එමෙන්ම මනුෂ්‍ය පෞරුෂත්වයන් තුළින්ද ඔහුට පහර දෙන ලදී. මේ සෑම අවස්ථාවක් පසුපසම හා ක්ෂේත්‍රයක් පසුපසම ආත්මික හේතුවක් තිබිණි. යෝබ් 1:6-12;2:1-6; 42:5 බලන්න.

   **මතක තබාගන්න:** ඔබ ජීවිතයේ මුහුණ දෙන සෑම ගැටලුවක් හා අවස්ථාවක් පසුපසම ආත්මික හේතුවක් තිබේ.

2. රෝග හා දිව්‍යමය සුවවීම පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතයේ "ශ×රය උදෙසා සටන" යන පාඨමාලාව ලබාගන්න. රෝග හා දිව්‍යමය සුවවීම් පිළිබඳව විස්තර "ශ×රය උදෙසා සටන" හි සපයා ඇති බැවින් මෙම පාඨමාලාවේ එය නැවතත් සඳහන් කර නැත. කෙසේවුවද ඔබ මේ ක්ෂේත්‍රය පිළිබඳව තව දුරටත් අධ්‍යනය කිරීම වැදගත්ය. ඊට හේතුව සාතන්ගේ ශරීරයට පහරදීම සතුරාගේ ප්‍රධාන උපක්‍රමයක් බැවිනි.

3. ඔබ ශාරීරිකව හෝ මුදල් අංශවලින් ප්‍රහාරයන්ට ලක්වී ඇද්ද? ඔබ මෙම පාඩමෙන් උගත් ලෙස දීමේ පුරුද්ද හා ආකල්ප ගැන කුමක් කිව හැකිද? ඔබ දෙන්නේ මේවාට අනුකූලවද?

   - කැමැත්තෙනි: නික්මයාම 35:5, 1 ලේකම් 29:9
   - අවංක සිතකිනි :1 ලේකම් 29:9
   - නිදහසේය: මතෙව් 6:38
   - රහසිගතවය: මතෙව් 6:3
   - නිරන්තරයෙන්මය: 1 කොරින්ති 16:2
   - ප්‍රීතියෙනි: 2 කොරින්ති 9:7
   - සරලවය: රෝම 12:8
   - ඔබගේ ආදායම අනුවය: මතෙව් 5:42
   - ඔබගේ හැකියාව අනුවය: එස්රා 2:69
   - ආදායම් ප්‍රතිශතයක් වශයෙන්ය: උත්පත්ති 14:20, 28:22, ලෙවී කථාව 27:30, 2 ලේකම් 31:5, මලාකි 3:10.

# ආත්මික සටන
# උසස් පුහුණුව

## සටන්වලදී සුවිශේෂී ක්ෂේත්‍ර සඳහා දෙනු ලබන උසස් උපදෙස්

සටන් පිළිබඳව අත්දැකීම් ස්වල්පයක් ලබා ගත් පසු සාමාන්‍යයෙන් යුද භටයන්ට සුවිශේෂී ක්ෂේත්‍ර ගැන වඩාත් උසස් උපදෙස් දෙනු ලැබේ. සටන් පිළිබඳ අත්පොතේ මෙම කොටස "ආත්මික සටන, උසස් පුහුණුව" ලෙස හැඳින්වේ. මෙය, එහි ඉංග්‍රීසි වචනවන "Spiritual Warfare, Advanced Training" හි මුල් අකුරු ගෙන SWAT ලෙස කෙටියෙන් හඳුන්වනු ලැබේ. හමුදාමය ක්‍රියාවලදී SWAT කණ්ඩායම අසීරු මෙහෙයන් සඳහා යොදා ගනු ලබන විශේෂ කණ්ඩායමකි.

## දහනව වන පරිච්ඡේදය

### ආත්ම පවරා දීම

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "ආත්ම පවරා දීම" යන්න පැහැදිලි කිරීමට
- යහපත් පවරා දීම පිළිබv බයිබලයෙන් නිදසුනක් දීමට
- නපුරු පවරා දීම පිළිබvව බයිබලයෙන් නිදසුනක් දීමට
- නපුරු ආත්මයක් පවරා දීමට එරෙහිව ඇති ප්‍රතිඋපක්‍රම පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **මම බැස එහිදි නුඹ සමd කථාකරන්නෙමි. නුඹ තනියම සෙනdගේ බර නුසුලා, ඔවුන් නුඹ සමd එය උසුලන පිණිස නුඹ කෙරෙහි තිබෙන ආත්මයෙන් ගෙන මම ඔවුන් කෙරෙහි තබන්නෙමි.** (ගණන්කථාව 11:17)

### හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් ඔබ සාතන් උපයෝගී කරගන්නා ඉතා ප්‍රබල හා බලපෑම් ඇති කළ හැකි එක් උපක්‍රමයක් අධ්‍යයනය කරන්නෙහිය. ඔබ ඔබගේ පවුල තුළ, මිත්‍රයන් අතර, සභා සහභාගිත්වයෙදි හා ඇතැම් විට ඔබම තුළ තිබූ සෘණාත්මක වෙනස් වීම් දුටු විට පැන නැගුනු බොහෝ ගැටලුවලට, මෙම උපක්‍රමය හvින ගැනීමෙන් පිළිතුරු ලැබෙනු ඇත. අප කතා කරන මෙම උපක්‍රමය "ආත්ම මාරු වීම " ලෙස හvින්වේ.

### ජීවිතයෙන් ලබාගත හැකි නිදසුන් කිපයක්

පළමුව පහත දැක්වෙන නිදසුන් සලකා බලන්න:

**පළමු නිදසුන :**

ඔබගේ බාල පුත්‍රයා ඇති දැඩි කරනු ලැබුවේ පවුල තුළ එකට බැඳුනු සබvතාවක් ඇතිව හා විවෘත සන්නිවේදනයෙන් යුතුව වේ. ඔහු ඔබගේ නීතිවලට ගරු කළ අතර ඔබ සමd එකට දේව මෙහෙයට සහභාගි විය. එක් වරම ඔහු පවුල තුළ එකට සිටීමට හෝ දේව මෙහෙයට සහභාගවීම හෝ ප්‍රතික්ෂේප කළේය. ඔහු කනස්සල්ලෙන් යුතුව, පවුලෙන් වෙන්ව, කැරලිකාර ගතියකින් පසුවෙයි. ඔබගේ උපදෙස් ඔහු පිළිනොපදින අතර, බොහෝ රෑ වී ගෙදර පැමිණෙයි. මේ සැනෙකින් සිදු වූ වෙනස ඔබට අවබෝධ කරගත නොහැකිය. ඔබගේ වැඩිමහල් පුත්‍රයා සමd මෙබඳු ගැටලුවක් තිබුණේ නැත. ඔබ මේ දෙදෙනාටම එක ලෙස ප්‍රේම කළ අතර එකම ලෙස මd පෙන්වීය. මෙසේ සිදුවුයේ ඇයි?

**දෙවැනි නිදසුන :**

සභාවට මහත් ආශිර්වාදයක්ව සිටි උප පූජකවරයක් අසතුටට පත්ව, සභාව විවේනය කරන අතර පූජකතුමාගේ උපදෙස් පිළිපැදීම ප්‍රතික්ෂේප කරයි. ඔහු වටා කණ්ඩායමක් සාදාගනියි. ඔවුහු ද එවැනිම ආකල්ප ඇති කර ගනිති. උප පූජකවරයා බේද ඇති කරන අතර සහභාගි කම කඩා බිඳ දමයි.

## ගැටලුව කුමක්ද?

ඔබගේ පුත්‍රයා සමd ඇති ගැටලුව විමසා බලන්න. මේ වෙනස ඇති වූයේ ඔහු ගරු කළ හා උතුම්කොට සැලකූ යම් කෙනෙක් ඔහුගේ ජිවිතයට කිට්ටු වූ අවස්ථාවක බව ඔබට පෙනෙනු ඇත. ඔහු මේ අය සමd කිට්ටු සබvතාවක් ඇති කර ගෙන ඇත. ඔවුන් සිතු දේ හෝ පැවසූ දේද ඔවුන් ගේ දෙමව්පියන් ඔවුන් කිරීමට ඉඩදුන් දේද ඔහු ඔබට පැවසූ අතර ඔවුන්ගේ ජිවන රටාව අනුගමනය කරන්නට හා ඔවුන්ගේ ක්‍රමයට ඇඳුම් අඩින්නට පටන් ගත්තේය.

උප පූජකවරයාගේ සිද්ධියද ඒ හා සමාන බව ඔබට පෙනෙනු ඇත. ආත්මික නායකයෙකු ලෙස සභාවේ අය ඔහුට ගෞරව කළ නිසා හා ආදරය කළ නිසා ඔහු භේද කෙරෙන බීජ වැපුරූ විටද ඔවුහු ඔහුට සවන් දුන්හ. ඔහුගේ විවේචනාත්මක හා කැරලිකාර ආත්මය සභාවේ අන් අය වෙතද ඉතා ඉක්මනින් පැතිරිණි.

## ආත්ම පවරාදීම

මේ අවස්ථා දෙකම ඇති වූයේ "ආත්ම පවරාදීම" නමැති සාතන්ගේ උපක්‍රමයක් නිසාය. "පවරාදීම' යනු එක් පුද්ගලයෙකුගෙන් තවත් කෙනෙකුට යමක් දීම වේ. "ආත්මය" යන වචනය මෙම පාඩමේ භාවිතා කර ඇත්තේ "ගති ලක්ෂණ, ආකල්ප හෝ යම්ක්‍රියාවක් පිටුපස ඇති චේතනාව වේ" යක්ෂයෙකු නොවේ.

සෑම පුද්ගලයෙකුගේම ක්‍රියාවක් යම්කිසි "ආත්මයක්" ප්‍රදර්ශනය කරයි. නිදසුනක් ලෙස යම් පුද්ගලයෙකුට තම ක්‍රියාවන් මගින් මෘදු ආත්මයක් හෝ ප්‍රචණ්ඩ ආත්මයක් හෝ කැරලිකාර ආත්මයක් හෝ ප්‍රදර්ශනය කළ හැකිය. යම් පුද්ගලයෙකුගේ ආත්මය කෙරෙහි යහපත් හෝ නපුරු හෝ ආත්ම මගින් බලපෑමක් ඇති කළ හැකි අතර ඔහුගේ ආත්මය ඔහුට පෞද්ගලිකවත් කණ්ඩායමකටත් පැවරිය හැකිය.

## ආත්මයේ ඇති වැදගත්කම

ආත්ම පවරාදීම පිළිබv බයිබලීය නිදසුන් කිපයක් අධ්‍යයනය කිරීමට පෙර, ඔබගේම ආත්මය හා එය සාතන්ගේ ප්‍රහාරවලට ලක්වීම වැදගත් වන්නේ මන්ද යන්න පිළිබvව අවබෝධ කර ගැනීම වැදගත් වේ. ඔබගේ ආත්මය මවන ලද්දේ දෙවියන්වහන්සේ විසිනි.

**ඉශ්‍රායෙල් ගැන තිබෙන ස්වාමින්වහන්සේගේ වචනයේ දිව්‍ය ප්‍රකාශනයය. අහස දිගහරින්නාවූ, පොළොවේ අත්තිවාරම තබන්නාවූ, මනුෂ්‍යයා තුළ ඔහුගේ ආත්මය උපදවන්නාවූ ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක. (සෙකරියා 12:1)**

**ආකාශ මණ්ඩලය මවා ඒවා දිග ඇරියාවූද, පොළොව සහ එහි සෑදෙන දේ ඇතුරුවාවූද, එහි සෙනගට හුස්මත් එහි හැසිරෙන්නන්ට ආත්මයත් දෙන්නාවූද දෙවිවූ ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක. (යෙසායා 42:5)**

ජීවය දෙනු ලබන්නේ ආත්මය විසිනි.

**මක්නිසාද ආත්මය නැති ශරීරය මැරී තිබෙන්නාක් මෙන්ම ක්‍රියාවලින් වෙන්වූ ඇදහිල්ල මැරී තිබේ. (යාකොබ් 2:26)**

මරණයේදී ආත්මය දෙවියන්වහන්සේ වෙතට නැවත යන්නේය.

**මනුෂ්‍ය පුත්‍රයන්ගේ පණ ඉහළට නැගී යනවාද කියාවත් තිරිසනාගේ පණ පොළොව යටට බසිනවාද කියාවත් දන්නේ කවුද? (දේශනාකාරයා 3:21)**

**දූවිල්ල තිබුණු හැටියට පොළොවට හැරියන්ටත්, ආත්මය ඒක දුන් දෙවියන්වහන්සේ වෙතට හැරියන්ටත් පළමුවෙන් උන්වහන්සේ සිහිකරපන්න. (දේශනාකාරයා 12:7)**

දෙවියන්වහන්සේ ඔබගේ ආත්මයේ ස්වාමින්වහන්සේය.

**මාංසමයවූ සියල්ලන්ගේ ආත්මවල දෙවිවූ ස්වාමින්වහන්සේ තමන්වහන්සේගේ සභාව එඬේරෙක් නැති බැටළුවන් මෙන් නොවන පිණිස, ඔවුන්ට පෙරටුව පිටතට යන්ටත් ඔවුන්ට පෙරටුව ඇතුළට එන්ටත් ඔවුන් පිටතට ගෙනයන්ටත් ඇතුළට ගෙන එන්ටත් සභාව කෙරෙහි මනුෂ්‍යයෙකු පත්කරනසේක්වයි කීවේය. (ගණන්කථාව 27:16,17)**

**තවද අපට දඬුවම් කළාවූ මාංසයේ පියවරු අපට සිටියෝය. අපි ඔවුන්ට ගෞරවකෙළෙමුව. ඊට බොහෝ වැඩියෙන් අප විසින් ආත්මවල පියාණන්වහන්සේට යටත්ව ජීවත්වෙන්ට යුතු නොවේද? (හෙබ්‍රෙව් 12:9)**

දෙවියන්වහන්සේ ඔබගේ ආත්මය කිරා බලන සේක. නැතහොත් විනිශ්චය කරන සේක.

**මනුෂ්‍යයෙකුගේ සියලුම මාර්ග තමාගේම ඇසට පිරිසිදුව පෙනේ; එහෙත් ස්වාමීන්වහන්සේ ආත්ම කිරා බලන සේක. (හිතෝපදේශ 16:2)**

දෙවියන්වහන්සේ වෙනුවෙන් ජීවත්වීමට ඔබට හැකිවන පිණිස උන්වහන්සේගේ ආත්මය (ශුද්ධාත්මයාණන්වහන්සේ) ඔබ තුළ තැබීමට උන්වහන්සේට අවශ්‍යය. සාතන් ඔබගේ ආත්මයට පහර දෙන්නේ එබැවිනි.

**මාගේ ආත්මය නුඹලා තුළ තබා, නුඹලා මාගේ පනත් ප්‍රකාර හැසිර මාගේ විනිශ්චයන් පවත්වමින් ඒවා කරන්ට සලස්වන්නෙමි. (එසකියෙල් 36:27)**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණෙන තුරු ඔබගේ ආත්මය ශුද්ධව ආරක්ෂා කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යය.

**සමාදානයේ දෙවියන්වහන්සේම නුඹලා සහමුලින්ම පවිත්‍රකරනසේක්වා; නුඹලාගේ මුළු ආත්මයත් ප්‍රාණයත් ශරීරයත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඊමේදී නිදොස්ව තිබෙන ලෙස ආරක්ෂා කරනු ලැබේවා. (1 තෙසලෝනික 5:23)**

සාතන් මනුෂ්‍යයාගේ ආත්මයට පහර දීමේ එක් වැදගත් හේතුවක් වන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේ සමග සාක්ෂි දරන්නේ ආත්මය නිසා හා ගැළවීම පිළිබඳව සහතිකයක් එය දෙන නිසා වේ.

> **අපි දෙවියන්වහන්සේගේ දරුවෝ යයි ආත්මයාණන්වහන්සේම අපේ ආත්මය එක්ව සාක්ෂි දෙන සේක. (රෝම 8:16)**

තවත් හේතුවක් නම් ඔබගේ ජීවිතයට මග පෙන්වීම සඳහා දෙවියන්වහන්සේ ඔබගේ ආත්මය භාවිත කරන බැවිනි. ස්වාභාවික ලෝකයේ යම් කෙනෙකුට මගපෙන්වීම සඳහා ඉටි පන්දමක් ආලෝකය ලබා දෙයි. ආත්මික ලෝකයේ ආත්මයේ ක්‍රියාව මෙය වේ.

> **මනුෂ්‍යයාගේ ආත්මය ස්වාමීන්වහන්සේගේ පහනය, එය සියලුම ඇතුල් කොට්ඨාස සෝදිසිකරන්නේය. (හිතෝපදේශ 20:27)**

සාතන් ආත්මයට පහර දීමට තවත් හේතුවක් වන්නේ, දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ රාජ්‍යය සඳහා භාවිතා කරන්නේ නිවැරදි ආත්මයක් ඇති මනුෂ්‍යයෙකු බව සාතන් දන්නා බැවිනි.

> **මේ සියල්ල මාගේ අතින් සාදනලද්දේය, එසේ මේ සියල්ල සිදුවියයි ස්වාමීන්වහන්සේ කියනසේක. එහෙත් යටහත්වූ, තැළුණු ආත්මයක් ඇත්තාවූ, මාගේ වචනයට වෙවුලන්නාවූ මනුෂ්‍යයා දෙස බලමි. (යෙසායා 66:2)**

නිවැරදි ආත්මයක් ඇති මිනිසෙකු තුළ දෙවියන්වහන්සේ වාසය කරන නිසාද සාතන් ආත්මයට පහර දෙයි. එමෙන්ම උන්වහන්සේ නිවැරදි ආත්මයක් ඇති මනුෂ්‍යයෙකු තුළින් හා එවැනි මනුෂ්‍යයෙකු ප්‍රාණවත් කරන සේක.

> **මක්නිසාද උසස්වූ, උත්කෘෂ්ටවූ, සදාකාලයෙහි වසන්නාවූ ශුද්ධය යන නාමය ඇති තැනන්වහන්සේ මෙසේ කියනසේක. මම උසස්වූ ශුද්ධවූ ස්ථානයේද යටහතුන්ගේ ආත්මය ප්‍රාණවත් කරන්ටත් පොඩිවී සිටින්නන්ගේ සිත ප්‍රාණවත් කරන්ටත් තැළුණාවූ යටහත් ආත්මයක් ඇත්තා සමග වාසයකරමි. (යෙසායා 57:15)**

සභාවක් තුල සාතන් වැරදි ආත්ම මගින් පිබිදීම වළක්වනු ඇත. එමෙන්ම සාතන් ඔබගේ ආත්මයට පහරදෙන අතර එය දිවට දෙනු ලබන පහර දීම් සමග සම්බන්ධ කරන්නේය. ඔබ කලින් උගත් පරිදි සාතන් දිව භාවිතා කරමින් ආත්මය බිඳ දමන්නේය. මෙහි බිඳ දැමීම යනු විවෘත සිදුරක් ඇති කිරීම වන අතර සාතන්ට එය තුළින් ඇතුළු විය හැකිය.

> **ශාන්තිදායක දිව ජීවන වෘක්ෂයක්ය; එහෙත් එහි වංචාව ආත්මය පොඩි කිරීමක්ය. (හිතෝපදේශ 15:4)**

දිව මගින් පව් කිරීමට සාතන් ඔබ පෙළඹවූ විට ඔහු ඔබගේ ආත්මයට ඇතුළු වීමට හැකිවෙන පරිදි විවරයක් ඇති කර ගෙන ඇත.

## ආත්මය පවරා දීම ශුද්ධලියවිල්ලට එකඟද?

"තවත් ආත්මයක්'' ලබා ගැනීමට ඔබට හැකියාවක් ඇත. "වෙන ආත්මයක්'' පැවරීම ගැන පාවුලු තුමා සඳහන් කරයි.

> **මක්නිසාද එන්නාවූ තැනැත්තේ අප දේශනා නොකළ වෙන යේසුස් කෙනෙකු ගැන දේශනාකෙරේ නම්, නොහොත් නුඹලා නොලැබූ වෙන ආත්මයක්වත් නුඹලා පිළි නොගත් වෙන ශුභාරංචියක් නුඹලා ඔහුගෙන් පිළිගන්නහුනම්, ඔහු ගැන ඉවසීම හොඳය.**
> **(2 කොරින්ති 11:4)**

ආත්ම පවරාදීමේ සංකල්පයට බයිබලීය උදාහරණවලින්ද අනුබල ලැබෙයි. යහපත් ආත්මයක් පැවරීම පිළිබඳ උදාහරණයක් ගණන්කථාව 11:16-17 හි ඇත.

**ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථා කොට: සෙනගගේ වැඩිමහල්ලන්ව ඔවුන් කෙරේ මුලාදෑනීන්ව සිටින බව නුඹ දන්නාවූ ඉශ්‍රායෙල් වැඩිමහල්ලන්ගෙන් සැත්තෑදෙනෙකු මට රැස් කර ඔවුන් නුඹ සමග සිටින පිණිස සම්මුඛ වීමේ කූඩාරම ළඟට කැඳවාගෙන වරෙන්න. මම බැස එහිදී නුඹ සමග කථාකරන්නෙමි. නුඹ තනියම සෙනගගේ බර නුසුලා, ඔවුන් නුඹ සමග එය උසුලන පිණිස නුඹ කෙරෙහි තිබෙන ආත්මයෙන් ගෙන මම ඔවුන් කෙරෙහි තබන්නෙමි.** (ගණන්කථාව 11:16-17)

මෝසෙස් මත තිබූ දෙවියන්වහන්සේ ප්‍රබල ආලේප කිරීම, තෝරාගත් වැඩිමහල්ලන් කිප දෙනෙකුට පවරන ලදී. ඔවුහු මෝසෙස්ගේ බලපෑම් යටතට පැමිණියහ. ඔවුන්ගේ ආත්මයන් මෝසෙස්ගේ ආත්මයට යටත්වද එක්සත්වද පැවිතිණී

## සාතන්ගේ උපක්‍රම: නපුරු ආත්මයක් පැවරීම

සාතන් අනුකරණය කරන්නෙකු මිස, අලුතින් උපදවන්නෙක් නොවේ. යහපත් ආත්මයක් පැවරීම සඳහා දෙවියන්වහන්සේ විසින් පිහිටුවන ලද ක්‍රමයම භාවිතා කරමින් සාතන් වැරදි ආත්ම මනුෂ්‍යයන් අතර මාරු කිරීමට භාවිත කරයි. දෙවියන්වහන්සේ විසින් ඉශ්‍රායෙල්වරුන්ට පොරොන්දු වූ දේශයට ඔත්තු බැලීම සඳහා යවන ලද ඔත්තුකාරයන් දොළොස් දෙනා පිළිබඳ කතාව මේ සඳහා උදාහරණයක් වේ. මේ පිළිබඳව, ගණන්කථාව 13:17-14:39 කියවා බලන්න.

මොවුන් අතුරින් දස දෙනෙකු ගෙනෙන ලද්දේ සෘණාත්මක වාර්ථාවකි. ඔවුහු විශාල පවුරු සහිත නගර හා ප්‍රබල සතුරු බලවේග ගැන පැවසූහ. ඔවුහු බිය සුලු ආත්මයක් හා අවිශ්වාසයක් දෙවියන්වහන්සේ සෙනග තුළ ඇති කළහ.

**එහෙත් ඔහු සමග ගිය මනුෂ්‍යයෝ කථාකොට: ඒ සෙනගට විරුද්ධව යන්ට අපට නොහැකිය; මක්නිසාද ඔවුන් අපට වඩා බලවත්යයි කීවෝය. එහි යෝධයන්ගෙන් පැවත එන අනාක්ගේ පුත්‍රයන් වන යෝධයන් දුටිමුව. අප පළගැටියන් මෙන් අපටම පෙනුණේය, එසේම ඔවුන්ටත් අප පෙනුනේයයි කීවෝය.** (ගණන්කථාව 13:31" 33)

එහෙත් ඔත්තුකරුවන් දොළොස් දෙනා අතුරින් දෙදෙනෙකුට මීට වෙනස් ආත්මයන් තිබිණි.

**එහෙත් මාගේ මෙහෙකරුවූ කාලෙබ්ට වෙන ආකාර සිතක් තිබුණු බැවින්ද ඔහු සම්පූර්ණ ලෙස මා අනුව ආ බැවින්ද ඔහු ගිය දේශයට මම ඔහු පමුණුවන්නෙමි; ඔහුගේ වංශයද එය හිමිකරගන්නේය.** (ගණන්කථාව 14:24)

**දේශය සෝදිසිකළවුන්ගෙන් නූන්ගේ පුත්‍රවූ යෝෂුවාද යෙඵුන්නේගේ පුත්‍රවූ කාලෙබ්ද තමුන්ගේ වස්ත්‍ර ඉරාගෙන, ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු සභාවට කථා කොට: අප සෝදිසි කරන්ට ගිය දේශය ඉතාම හොඳ දේශයක්ය. ස්වාමීන්වහන්සේ අප කෙරෙහි ප්‍රසන්නවන සේක්නම් කිරි සහ මීපැණි ගලායන ඒ දේශයට අප පමුණුවා ඒක අපට දෙනවා ඇත.** (ගණන්කථාව 14:6-8)

එකිනෙකාට පටහැනි ආත්ම දෙකක් මනුෂ්‍යයන් පාලනය කිරීමට දරණ උත්සාහයක් මෙතැන ඇත. එකක් අවිශ්වාසයේ ආත්මයකි. අනෙක විශ්වාසයේ ආත්මයකි.

**කාලෙබ් මෝසෙස් ඉදිරියෙහි සෙනග නිශ්ශබ්ද කරවා: අපි වහාම නැගී ගොස් ඒක හිමිකර ගනිමු; මක්නිසාද අපට ඒක පුළුවනැයි කීය.** (ගණන්කථාව 13:30)

ඔත්තුකරුවන් දස දෙනාගෙන් සෘණාත්මක ආත්ම මනුෂ්‍යයන්ට බලපෑ ආකාරය බලන්න.

**එවිට මුළු සභාව ශබ්දනගා හැඬුවෝය. සෙනනග ඒ රාත්‍රියේ වැලපුණෝය. සියලු ඉශ්‍රායෙල් පුත්‍රයෝ මෝසෙස්ටත් ආරොන්ටත් විරුද්ධව කොඳුළෝය. මුළු සභාව ඔවුන්ට කථා කර: අහෝ අපි මිසර දෙශයෙහි මළෙමුනම් යහපත; නොහොත් මේ කාන්තාරයෙහි මළෙමුනම් යහපත. අප කඩුවෙන් වැටෙන පිණිස ස්වාමින්වහන්සේ මේ දේශයට අප ගෙනෙන්නේ මක්නිසාද? අපේ භාර්යාවන්ද බාලයන්ද කොල්ලයක් වෙනවා ඇත. මිසරයට හැරීයාම අපට හොඳ නොවේදැයි කීවෝය. තවද ඔවුහු එකිනෙකාට කථාකොට: අපි ප්‍රධානියෙකු පත්කර ගෙන මිසරයට හැරීයමුයයි කීවෝය. (ගණන්කථාව 14:1-4)**

මෙහි බලාපොරොත්තු කඩවීමේ, මිමිණීමේ හා කැරලිගැසීමේ ආත්ම තිබූ අතර ඒවා මෙම ඔත්තු කරුවන් දස දෙනා විසින් දෙවියන්වහන්සේගේ සෙනගට පවරන ලදී. පොරොන්දු දේශයෙන් ඉශ්‍රායෙල්වරුන්ව ඇත් කර තබන ලද්දේ දුර්වල හමුදාවක් නිසා නොවේ. ඔවුන්ව ඇත් කර තබන ලද්දේ වැරදි ආත්මයක් නිසා වේ.

යහපත් ආත්මයකින් නොව නපුරු ආත්මයකින් සෙනගට බලපෑම් ඇති වීමට හේතුව කුමක්ද? මනුෂ්‍යයන්ගේ මූලික පාප ස්වභාවය නිසා නපුරු වාර්තා විශ්වාස කිරීමට හා පිළිගැනීමට මිනිසුන් පෙළඹේ. එමෙන්ම " සෙනග අනුගමනය කිරීමේ " ප්‍රවණතාවක් මිනිසුන් තුළ ඇති අතර වැඩි දෙනෙකුගේ තීරණය දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස පිළිගැනීමට ඔවුහු පෙළඹෙති. එමෙන්ම ඉශ්‍රායෙල්වරුන් ධනාත්මක වාර්තාව පිළිගත්තේ නම් ඉන් ඔවුන්ගේ ජීවිත අනතුරේ වැටීමටද ඉඩ තිබිණි. වඩාත් භයානක අනතුරුවලට ඔවුන්ට මුහුණ දීමට සිදුවනු ඇත. අපගේ මනුෂ්‍ය ස්වභාවය සෑම විටම උත්සහ කරන්නේ පහසු මාර්ගය තෝරා ගැනීම වේ.

ආත්ම පවරා දීමේ මේ ප්‍රබල උපක්‍රම අද ඇදහිලිවතුන් යෙදී සිටින බොහෝ සටන්වලට හේතු වී තිබේ. අප වටා සිටින බොහෝ අය තුළ අද දක්නට ලැබෙන ධනාත්මක දේවලින් සෘණාත්මක දේට හදිසියේ මාරු වීම මෙහි ප්‍රතිඵලයකි. එකම නිවසේ, එකම කිතුනු පුහුණුවීම ලද දරුවන් දෙදෙනෙකු එනිනෙකාට බොහෝ සේ වෙනස් වීම් මෙමගින් පැහැදිලි වේ. නිවෙස් තුළද, මිතුරන් අතරද, සභා සහභාගිත්වයේද භේද ඇතිවීමට හේතුව මෙය වේ. ඔබ, ඔබගේ ආත්මයට වඩා බලවත් ආත්මයක් ඇති කෙනෙකුගේ බල පෑම යටතට ඔබ පැමිණි විට, ඔබගේ ආත්මයට ඔහුගේ ආත්මය මාරුවීමට ඉඩ ඇත. ඔහුගේ ආත්මය මගින් ඔබට බලපෑම් ඇතිවන අතර එය ඔබ තුළට මාරු වන්නේය.

## ප්‍රති උපක්‍රම : නපුරු ආත්මයක් පවරනු ලැබීම වැළැක්වීම

නපුරු ආත්මයක් පවරනු ලැබීම වැළැක්වීම සඳහා ප්‍රති උපක්‍රම දෙවියන්වහන්සේ දී ඇත.

### ඔබගේ ආත්මය පාලනය කරගන්න :

ඔබගේ ආත්මය පාලනය කර ගන්න. අන් අයට පවරා දිය හැකි වැරදි ආත්මයක් ඔබ වර්ධනය කර නොගන්නා බවට සහතික වන්න.

**තමාගේ සිත මැඩපවත්වා නොගන්න මනුෂ්‍යයා පවුරක් නැති බිඳ වැටුණු නුවරක් මෙන්ය. (හිතෝපදේශ 25:28)**

**බලවන්තයාට වඩා ඉවසිලි ඇත්තාද නුවරක් අල්ලාගන්නාට වඩා තමාගේ සිත ආණ්ඩුකරගන්නාද උතුම්ය. (හිතෝපදේශ 16:32)**

**''' එබැවින් නුඹලාගේ ආත්ම ගැන ප්‍රවේසම්වීම්, දෝහිකම් නොකර සිටපල්ලා. (මලාකි 2:16)**

### ඔබගේ දිව පාලනය කරගන්න :

ඔබ උගත් පරිදි, ආත්මය බිඳ දමා සතුරාට ඇතුළු වීමට ඉඩ කඩ සැලසීමට දිව භාවිතා කළ හැකිය. ඔබ පවසන දේ පිළිබඳව ප්‍රවේසම් වන්න.

## ඔබගේ ඇලුම් කිරීම් ගැන ප්‍රවේසම් වන්න :

> **සියල්ලටම වඩා නුඹේ සිත ආරක්ෂා කරගනින්න; මක්නිසාද එයින් ජීවනය නික්මෙන්නේය. (හිතෝපදේශ 4:23)**

ඔබගේ ඇලුම් කිරීම් ගැන ප්‍රවේසම් වන්න. ඔබගේ ආදරය හා ගෞරවය සෑම කෙනෙකුට නොදෙන්න. ඔබ ප්‍රේම කරන හා ගෞරව කරන අය වෙත බලවත් හැඟීමකින් යුතුව ඔබ විවෘත වනු ඇත. එවිට ඔවුන්ගේ ආත්මයට ප්‍රතිචාර දැක්වීමට ඔබ පෙළඹේ.

## ඔබ ආශ්‍රය කරන්නන් ප්‍රවේසමෙන් තෝරාගන්න :

වැරදි ආත්ම ඇති අය ආශ්‍රය කිරීමේ භයානකකම ගැන හිතෝපදේශ පොත වරින් වර අනතුරු අඟවා ඇත. නිදසුනක් ලෙස හිතෝපදේශ 1:10-19 හා 2:11-22 කියවන්න. අපට මෙසේ අනතුරු අඟවා ඇත.

> **තරහ ගති ඇත්තෙකු සමඟ මිත්‍ර නොවන්න. කෝපාධික මනුෂ්‍යයෙකු සමග නොගැවසෙන්න. එසේ කළොත් සමහරවිට නුඹත් ඔහුගේ මාර්ගවල පුහුණුවී, නුඹේ ප්‍රාණයට මලපතක් පමුණුවා ගන්නෙහිය. (හිතෝපදේශ 22:24-25)**

> **දුෂ්ටයන්ගේ මාවතට ඇතුල් නොවන්න. නපුරු මිනිසුන්ගේ මාර්ගයෙහි ගමන් නොකරන්න. එයින් වැලකී, එහි නොගොස්, එයින් අහකට හැරී පලයන්න. (හිතෝපදේශ 4:14-15)**

> **අඥානයා ඉදිරියට පලයන්න, එවිට ඔහුට දැනගැන්මේ තොල් නැති බව නුඹට පෙනෙන්නේය. (හිතෝපදේශ 14:7)**

> **මුද්‍රිකපානයෙහි ලොල්වුවන්ටවත් මස් කෑමෙහි ගිජුවුවන්ටවත් එක් නොවන්න. (හිතෝපදේශ 23:20)**

> **හොරෙකු සමග හවුල්වෙන අය තමාගේම ප්‍රාණයට වෛරවන්නේය. ඔහු දිවුරවීම අසන නුමුත් කිසිවෙක් නොපවසයි. (හිතෝපදේශ 29:24)**

ඔබ ප්‍රඥාවන්ත මනුෂ්‍යයන් ආශ්‍රය කරන්නෙහිනම් එම ආත්මය ඔබට පැවරේ.

> **ඥාණවන්තයන් කැටුව යන්න, එවිට නුඹ ඥාණවන්ත වන්නේය. එහෙත් අඥානයන්ගේ සමාගම්කාරයාට වේදනා සිදුවන්නේය. (හිතෝපදේශ 13:20)**

ඔබ කිට්ටුව ආශ්‍රය කරන්නන් ප්‍රවේසමෙන් තෝරාගන්න. ඔබ දෙමවුපියෙකු නම් ඔබගේ දරුවන් ඇසුරු කරන්නන් ගැන සොයා බලන්න.

## ඔබගේ ශාරීරික ඉන්ද්‍රියන් ආරක්ෂා කරගන්න :

මාංසය පිළිබඳව ඔබ උගත් දෙයින් ශාරීරික ඉන්ද්‍රියන් වැදගත් බව ඔබ අවබෝධ කර ගත්තෙහිය. ඔබගේ සවන් ඕපාදූප, චෝදනා, අපහාස හා විවේචනවලින් ආරක්ෂා කරගන්න. ඒවා මගින් වැරදි ආත්මයක් වර්ධනය කර ගැනීමට ඉඩ ඇත. ඔබගේ දෙනෙත් අසභ්‍ය හා චණ්ඩ චිත්‍රපට බැලීමෙන්ද, කාමමිථ්‍යාචාර, තෘෂ්ණාධික හා භයානක ආත්ම පැවරිය හැකි පතපොත කියවීමෙන්ද පරෙස්සම් කර ගන්න.

## "අත් තැබීම" ගැන ප්‍රවේසම් වන්න

හෙබ්‍රෙව් 6:1-3 හි පාවුලුතුමා කතා කරන කිතුනු ඇදහිල්ලේ එක් පදනමක් "අත් තැබීම" වේ. ඊට වැදගත් ආත්මික පරමාර්ථයන් ඇත. මේ පිළිබඳව හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ "ඇදහිල්ලේ පදනම්" නම් පාඨමාලාවේ විස්තරාත්මක අධ්‍යයනයක් ඇත.

මෙහිදී මෝසෙස් හා වැඩිහිටියන් සැත්තෑදෙනා පිළිබඳ කතාවෙන් පෙන්වා ඇති පරිදි වැදගත් වන්නේ ''අත් තැබීම මගින් ආත්මයක් පැවරිය හැකි බව පිළිගැනීම වේ“' අත් තැබීම මගින් යහපත් ආත්මයක් පැවරිය හැකි නම් නපුරු ආත්මයක්ද එලෙසම පැවරිය හැකිය“' ආත්ම පැවරීම සඳහා ඔබ “අත් තැබීමට” ඉඩ දෙන අය පිළිබඳව ප්‍රවේසම් වන්න“

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලියවිලිවලින් ලබා ගත් ප්‍රධාන පදය ලියන්න.

2. "ආත්ම පවරාදීම" යන වාක්‍ය ඛණ්ඩයෙන් අදහස් වන්නේ කුමක්ද?

3. යහපත් ආත්මයක් පැවරීම පිළිබඳව බයිබලයෙන් උදාහරණයක් දෙන්න.

4. නපුරු ආත්මයක් පැවරීම පිළිබඳව බයිබලයෙන් උදාහරණයක් දෙන්න.

5. නපුරු ආත්මයක් පැවරීමට එරෙහිව ආරක්ෂාවීමේ උපක්‍රම හයක් ලැයිස්තුගත කරන්න.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. යහපත් ආත්මයක් පවරාදීම පිළිබඳව තවදුරටත් අධ්‍යනය කරන්න. එලියා මැරුණ මොහොතේ ඔහුගේ "සළුව" තමා පිටට වැටෙන්නට සලස්වන ලෙස එලිෂා දිවැසිවරයා, එලියාගෙන් ඉල්ලා සිටියේය. "සළුවෙන්" සංකේතවත් වූයේ එලියා වෙත තැබූ දෙවියන්වහන්සේගේ ආත්මයයි. එලියා වෙත ඇති යහපත් ආත්මයෙන් "දෙගුණයක්" තමාට දෙන ලෙස එලිෂා ඉල්ලා සිටියේය. 2 රාජාවලිය 2 හි ඇති මෙම කතාව කියවන්න.

2. නපුරු ආත්මයක් පවරාදීම පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කරන්න. ක්‍රියා 5:1-11 හි සඳහන් අනනියස් සහ සප්පිරා පිළිබඳ කතාව කියවන්න. මෙය ස්වාමිපුරුෂයෙක් රැවටීමේ ආත්මයක් තම බිරිඳට පවරාදීම පිළිබඳ නිදසුනකි.

3. පහත දැක්වෙන යොමුවීම් අධ්‍යයනය කරන්න. මේවා ඔබගේ ආත්මයට බලපෑම් ඇති කළ හැකි ඇතැම් වැරදි හා නිවැරදි ආකල්ප හා චිත්තවේගී ප්‍රතිචාර පෙන්නුම් කරයි. ඔබගේ ආත්මය"

ඊර්ෂ්‍යා සහගත විය හැකිය. ගණන්කථාව 5:14
දැඩි විය හැකිය. ද්විතිය කථාව 2:30
බලවත් වේදනාවෙන් විය හැකිය. නික්මයාම 6:9
යහපත් විය හැකිය. නෙහෙමියා 9:20
වංචාරහිත විය හැකිය. ගීතාවලිය 32:2
නිවැරදි විය හැකිය. ගීතාවලිය 51:10
බිඳී තිබිය හැකිය. ගීතාවලිය 51:17
ශෝකයෙන් පිරී තිබිය හැකිය. ගීතාවලිය 77:3; 142:3; 143:4
කඩිසර හා විමසුම් සහිත විය හැකිය. ගීතාවලිය 77:6
ස්ථිර විය හැකිය. ගීතාවලිය 78:8
ඇතුළතින් අසාර්ථක විය හැකිය. ගීතාවලිය 143:7
විශ්වාසවන්ත විය හැකිය. හිතෝපදේශ 11:13; 2 කොරින්ති 4:13
අපරීක්ෂාකාරී විය හැකිය. හිතෝපදේශ 14:29; දේශනාකාරයා 7:9;
අහංකාර විය හැකිය. හිතෝපදේශ 16:18
නිහතමානී විය හැකිය. හිතෝපදේශ 16:19
බිඳී තිබිය හැකිය. හිතෝපදේශ 18:14
අමනාපගතියෙන් යුක්ත විය හැකිය. දේශනාකාරයා 1:14
ඉවසිලිවන්ත විය හැකිය. දේශනාකාරයා 7:8
උඩඟු විය හැකිය. දේශනාකාරයා 7:8
සොයායමින් සිටිය හැකිය. යෙසායා 26:9
විනිශ්චයේ ආත්මයක් විය හැකිය. යෙසායා 28:6
මුළාවී තිබිය හැකිය. යෙසායා 29:24
තැළුණාවූ යටහත් ආත්මයක් විය හැකිය. යෙසායා 57:15
තැළුණු දුප්පත් ආත්මයක් විය හැකිය. යෙසායා 66:2
සංසිඳුවූවක් විය හැකිය. සෙකරියා 6:8
විශිෂ්ට විය හැකිය. දානියෙල් 5:12; 6:3
ශෝකයට පත් වූවක් විය හැකිය. දානියෙල් 7:15
ඥාණවන්ත විය හැකිය. නික්මයාම 28:3
ශක්තිමත් විය හැකිය. ලූක් 2:40
සාවද්‍ය විය හැකිය. ලූක් 9:55
නමස්කාරයෙන් යුක්ත විය හැකිය. යොහන් 4:23-24; පිලිප්පි 3:3
කැලඹී තිබිය හැකිය. උත්පත්ති 41:8; දානියෙල් 2:3; යොහන් 13:21; 2 තෙසලෝනික 2:2
පොළඹවන සුලු විය හැකිය. ක්‍රියා 6:10
පිබිදී තිබිය හැකිය. එස්රා 1:1; හග්ගයි 1:14; ක්‍රියා 7:16
තෙරපී තිබිය හැකිය. ක්‍රියා 18:5
ජ්වලිතව තිබිය හැකිය. ක්‍රියා 18:25; රෝම 12:11
බැඳී තිබිය හැකිය. ක්‍රියා 20:22
සේවයේ යෙදිය හැකිය. රෝම 1:9
චර්මඡේදව තිබිය හැකිය. රෝම 2:29

අලුත් විය හැකිය. එසකියෙල් 11:19; 18:31; 36:26; රෝම 7: 6
වහල්ව තිබිය හැකිය. රෝම 8:15
දෙවියන්වහන්සේගේ ආත්මය සමග සාක්ෂි දැරිය හැකිය. රෝම 8:16
අඩ නින්දේ තිබිය හැකිය. රෝම 11:8
මෘදු විය හැකිය. ගලාති 6:1
මෘදු, නිශ්චල විය හැකිය. 1 පේත්‍රුස් 3:4
යාච්ඤාවෙන් යුක්ත විය හැකිය. 1 කොරින්ති 14:14
දෙවියන්වහන්සේ සමග එක්වුවක් විය හැකිය.1 කොරින්ති 6:17
දෙවියන්වහන්සේට ගෞරවයෙන් විය හැකිය.1 කොරින්ති 6:20
ගීතිකාවෙන් යුක්ත විය හැකිය. 1 කොරින්ති 14:15
ප්‍රාණවත් විය හැකිය. 1 කොරින්ති 16:18; 2 කොරින්ති 7:13
අවිවේකී විය හැකිය. 2 කොරින්ති 2:13
අපවිත්‍ර විය හැකිය. 2 කොරින්ති 7:1
අනෙකුත් ඇදහිලිවතුන් සමග එක්සත්ව තිබිය හැකිය. 2 කොරින්ති 12:18; පිලිප්පි 1:27
ආරක්ෂා කරනු ලැබ තිබිය හැකිය. 1 තෙසලෝනික 5:23
ඇදහිලිවතුන්ට ආදර්ශයක් විය හැකිය. 1 තිමෝති 4:12
බියසුලු විය හැකිය. 2 තිමෝති 1:7
තෘෂ්ණාධික විය හැකිය. යාකොබ් 4:5
කැමති කරන ලද්දාවූ එකක් විය හැකිය. නික්මයාම 35:21; මතෙව් 26:41
දුප්පත් විය හැකිය. මතෙව් 5:3
හොඳින් කල්පනා කරන්නෙක් විය හැකිය. මාක් 2:8
සූදානම්ව සිටිය යුතුය. මාක් 14:38
දුක් සහිත විය හැකිය. 1 සාමුවෙල් 1:15
අප්‍රසන්නව තිබිය හැකිය. 1 රාජාවලිය 21:5
ප්‍රීතිමත්ව තිබිය හැකිය. ලූක් 1:47
සුසුම්ලමින් තිබිය හැකිය. මාක් 8:12

4. නපුරු ආත්මයක් පවරනු ලැබීය නිසා ඔබට යම් බලපෑම්ක් සිදුවී ඇති බවට ඔබට හැඟේද? ඔබගේ ආත්මයට බලපෑමක් ඇති කළේ කවුද? මේ සෘණාත්මක බලපෑමේ ප්‍රතිඵල කවරේද? නපුරු ආත්මයක් පවරනු ලැබීම නිසා ඔබට යම් බලපෑමක් සිදුවී ඇත්නම් හා එවැනි බලපෑම්වලින් ආරක්ෂාවීමට මෙම පරිච්ඡේදයේ දී ඇති ප්‍රතිඋපක්‍රම අනුගමනය කරන්න.

- ඔබගේම ආත්මය පාලනය කරගන්න.
- ඔබගේ දිව රැකගන්න.
- ඔබේ ඇලුම් කිරීම් ගැන ප්‍රවේසම් වන්න.
- ඔබ ආශ්‍රය කරන්නන් ප්‍රවේසමෙන් තෝරාගන්න.
- ඔබගේ ශාරීරික ඉන්ද්‍රියන් රැකගන්න
- අත් තැබීමේදී ප්‍රවේසම් වන්න.

5. "ආත්ම විමසීම" නමැති ශුද්ධාත්මයාණන්වහන්සේගේ විශේෂ දීමනාවක් තිබේ. එමගින් ආත්මයක් යහපත්ද නැතහොත් නපුරුද යන්න තිරණය කිරීමට ඇදහිලිවතුන්ද හැකි වේ. ඔබට මේ පිළිබඳව තව දුරටත් භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය"* නමැති පාඨමාලාවෙන් උගත හැකිය.

# විසිවන පරිච්ඡේදය

## ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම" යන්න පැහැදිලි කිරීමට
- මෙම ක්ෂේත්‍රයේ සාතන්ගේ උපක්‍රම සාරාංශගත කිරීමට
- ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම පරාජය කිරීම සඳහා ප්‍රතිඋපක්‍රම හඳුනා ගැනීමට හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

> **ඒක පුදුමයක් නොවේ, මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස්ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ. ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය. (2 කොරින්ති 11:14-15)**

## හැඳින්වීම

ආත්මික සටන මාංසය හා රුධිරය සමග නොවන බව ඔබ උගත්තෙහිය. නපුරු බලවේග හා ඒවා සංවිධානය වී ඇති අන්දම ඔබ අධ්‍යයනය කෙළෙහිය. මෙම පරිච්ඡේදය සාතන්ගේ නපුරු බලවේගවල සුවිශේෂී කොටසක් වන "ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම" කෙරෙහි අවධානය යොමු කරයි. ප්‍රේරිතවූ පාවුල්තුමා මෙම බලවේග ගැන අනතුරු හඟවයි.

> **මක්නිසාද අපේ පොරබැදීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

## ස්වර්ගීය ස්ථාන හෙවත් උස්තැන්

දෙවියන්වහන්සේ වැඩ සිටින්නේ යම්කිසි උස් තැනක බව සිතීම මනුෂ්‍ය ස්වභාවයේ ගැබ්ව ඇති දෙයක් බව පෙනේ. ඈත අතීතයේ සිටම සැබෑ දෙවිදුන් මෙන්ම ව්‍යාජ දෙවිවරුන් හා මනුෂ්‍යයා විසින් සාදන ලද පිළිම වන්දනා කිරීමට මනුෂ්‍යයෝ උස් ස්ථාන තෝරා ගත්හ. පැරණි ගිවිසුම් යුගයේ මෙම උස් ස්ථානවල දුෂ්ට උත්සව මෙන්ම ව්‍යාජ දෙවිවරුන් නමස්කාර කෙරෙන මනුෂ්‍ය බිලි පූජාවන් හා සම්බන්ධ යාගයන් ද පැවැත්විණි. දෙවියන්වහන්සේ ඉශ්රායෙල්වරුන්ට පැවසුවේ ඔවුන් පොරොන්දු දේශයට ඇතුළු වූ විට එම දේශයේ සියලු වැසියන් පන්නා දමා ඔවුන්ගේ උස් ස්ථාන විනාශ කරන ලෙසය.

> **දේශයේ සියලු වැසියන් නුඹලා ඉදිරියෙන් පන්නා දමා ඔවුන්ගේ සියලු රූප සහිතවූ කැටයම් ගල්ද ඔවුන්ගේ සියලු වාත්තු පිළිමද නැති කර දමා ඔවුන්ගේ සියලු උස් තැන් නටබුන් කරපල්ලා. (ගණන්කථාව 33:52)**

එම දේශයේ සෙනඟ පන්නා දැමීමට ඉශ්රායෙල්වරුන් අසමත් වූ අයුරු අපි විනිශ්චයකාරයාගේ පොතේ කියවමු. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුහු උස් තැන්වල රූප වන්දනාවට පෙලඹුනහ. විනිශ්චයකාරයන්ගේ කාලයෙන් පසු ඇතැම් යහපත් ඉශ්රායෙල් රජවරු තම උස් ස්ථාන විනාශ කළහ. අනෙක් අය ඒවා නැවත ගොඩනගා ව්‍යාජ දෙවිවරු නමස්කාර කළහ. මේ උස් ස්ථාන

ගොඩනැඟූ එක රජකෙනෙක් මනස්සේ වේ. මෙම පාපය උදෙසා ඔහුට දඬුවම් කිරීමෙන් පසු ඔහු පසුතැවිලිවූ අතර නැවතත් සිංහාසන ගතවී සැබෑ දෙවිඳුන් නමස්කාර කිරීමට පටන්ගත්තේය. මිනිසුන් තවමත් උස් ස්ථානවල පූජා පැවැත්වුවද "එසේ කළේ තමුන්ගේ දෙවිවූ ස්වාමින්වහන්සේට පමණක්ය" (2 ලේකම් 33).
බලවත් යුද හේවායෙකු වීමට දෙවියන්වහන්සේ ගිඩියොන් කැඳවූ විට, පූජාසනය විනාශකර ලි ප්‍රතිමා කපා දමන ලෙස ස්වාමින්වහන්සේ ඔහුට පැවසූ සේක. ඉන්පසු ගිඩියොන් දෙවියන්වහන්සේගේ පූජාසනයක් ගොඩනැගිය යුතු විය. දැවෙන පූජාවක් කළ හැක්කේ උස් ස්ථාන කඩාබිඳ දැමීමෙන් පසුව පමණි. මිදිම පැමිණියේ ඉන්පසුවය. "ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම" බිඳ දමන ලෙස දෙවියන්වහන්සේගේ බලවත් යුද හේවායන්ට අද වුවද උන්වහන්සේ කැඳවන සේක.

## සාතන්ගේ උපක්‍රම: ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම

පාවුල්තුමා "ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම" ගැන කතා කරන විට, ඔහු අදහස් කරන්නේ ලෝකයේ ආගමික පද්ධතිවලට රිංගා සිටින දුෂ්ට ආත්ම ගැන වේ. ඔවුහු ධර්මිෂ්ඨ සෙනග තුලටද රිංගා සිටිති. දෙවියන්වහන්සේගේ සැබෑ සභා සංවිධාන අනුකරණය කිරීමට සාතන් තම නපුරු බලවේග සංවිධානය කර ඇත. ඇතැම් අවස්ථාවල "සාතන්ගේ දේවස්ථාන" හෝ " භූත ආත්මිකයෝ" හෝ යන නමින් හැඳින්වෙන සමූහයන් ඔහුට තිබේ. ඔහු ආත්මික උස් ස්ථානවල නමස්කාර කරන ක්‍රමයක් සකස් කර ඇත.

වැරදි ඇදහිලි ක්‍රම සහිත සංවිධාන ඇති කිරීමට සාතන් මුල් වී ඇත. "මායාකාර" යන වචනයෙන් අදහස් වන්නේ "යමක් සැඟවීම" යන්න වේ. මේ ඇදහිලි ක්‍රම මායාකාර දේවල කොටසක් වන අතර ඒවා ආගම නමැති ලෝගුව මගින් නපුරු දේ සඟවයි. ඊටත් වඩා භයානක දෙයක් ඇත. සාතන් තම පද්ධතිය පිහිටුවා ඇත්තේ "රහසින් ඇතුළුවී ඇති" (යූද් 4) දුෂ්ට සෙනඟ මාර්ගයෙන් සැබෑ සභාව තුළය.

"ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම" තුළින් සාතන් මනුෂ්‍යයාගේ පූර්ණ පක්ෂපාතකම අපේක්ෂා කරයි. මෙම පරමාර්ථය සම්පූ¾න කරගැනීම සඳහා ඔහු වැරදි ඇදහිලි ක්‍රම" සාතන්ගේම සභාව හා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළට රිංගා ගැනීම භාවිත කරයි. සාතන්ගේ ආගමික සංවිධාන ගැන බයිබලය උගන්වන්නේ මේ දෙය වේ.

### සාතන්ට ඔහුගේම ත්‍රිත්වය ඇත :

ඔබ දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයවූ පියාණන්වහන්සේ, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන කලින් අධ්‍යයනය කර ඇත. සාතන්ටද ත්‍රිත්වයක් තිබේ. ඊට සාතන්මද, මෘගයා හා ව්‍යාජ දිවැසිවරයාද අයත් වේ. ඔබ මෙහි අවසන් වරට සඳහන් කර ඇති දෙදෙනා පිළිබඳව මෙම පාඨමාලාවේ අවසාන පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නවා ඇත. එළිදරව් පොතේ මෙම අශුද්ධ ත්‍රිත්වයේ ඉරණම ගැන විස්තර කර ඇත.

> **ඔවුන් මුළාකළ යක්ෂයා වනාහි, මෘගයාද බොරු අනාගතවක්තෘද වසන, ගින්නෙන්ද ගෙන්දගම්න්ද යුත් විලට හෙළනු ලැබුවේය. ඔව්හු සදාකාලේටම දිවා රෑ දෙක්හි වධකරනු ලබති. (එළිදරව් 20:10)**

### සාතන්ට ඔහුගේම සභාවක් ඇත :

"ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය" ලෙසින් හැඳින්වෙන සැබෑ සභාව දෙවියන්වහන්සේ විසින් පිහිටුවන ලද අතර එහි ප්‍රධානියා යේසුස්වහන්සේ වේ.

> **ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝද වෙති. (1 කොරින්ති 12:27)**

> **ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය. උන්වහන්සේගෙන් මුළු ශරීරය එකට සන්ධිකරනු ලැබ සවිවී, එක එක**

**කොට්ඨාසයේ ප්‍රමාණයේ ක්‍රියාකිරීමේ හැටියට සහකාරවූ එක එක සන්ධිය කරණකොටගෙන ප්‍රේමයෙන් වර්ධනය වන ලෙස ශරීරය වැඩෙන්නේය. (එපීස 4:15-16)**

"සාතන්ගේ සිනගෝගය" ලෙසින් හැඳින්වෙන සාතන්ගේම සභාවක් ඔහුට ඇත.

**එනම්, මම නුඹේ පීඩාවද දිළිඳුකමද දනිමි (නුමුත් නුඹ ධනවත්ය), යුදෙව්වෝයයි කියන සාතන්ගේ සිනගෝගයක්ව සිටින්නන්ගේ අපහාසයද දනිමි. (එළිදරව් 2:9)**

"සාතන්ගේ සිනගෝගය" යන්න වචනය සෑම විටම විවෘතව භාවිත නොකෙරේ. එහෙත් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය දේශනා නොකරන ඕනෑම තැනක ඔහුගේ සිනගෝගය පිහිටුවා ඇත.

## සාතන්ට ධර්මයක් ඇත :

ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් එළිදරව් කරන ලද දෙවියන්වහන්සේගේ සැබෑ ධර්මයෙන් බයිබලය පිරී තිබේ.

**දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16)**

සාතන්ගේ ධර්මය "භූතයන්ගේ ධර්මය" ලෙස හැඳින්වේ.

**එහෙත් පසු කාලවලදී සමහරු මුළාකරවන ආත්මයන්ද යක්ෂයන්ගේ ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලි ලෙස කියන සේක. (1 තිමෝති 4:1)**

භූතයන්ගේ එක් වර්ගයක් "මුළාකරවන ආත්ම" ලෙස හැඳින්වේ. ඔවුන් සුවිශේෂී කාර්යය වන්නේ වැරදි ධර්ම අනුගමනය කිරීමට මිනිසුන්ව මුළා කිරීමය. "භූතයන්ගේ ධර්මය" යනු ලිඛිත දේව වචනය සමඟ එකඟ නොවන "සත්‍යය" ලෙස ඉදිරිපත් කෙරෙන ඉගැන්වීමකි.

## පූජාවන් කිරීමේ ක්‍රමයක් ද සාතන්ට ඇත :

තමන්වම "ජීවමාන යාගයක්" ලෙස දෙවියන්වහන්සේට ඔප්පු කරන ලෙස රෝම 12:1 න් අපට දන්වා ඇත. මින් අදහස් වන්නේ දෙවියන්වහන්සේට පූර්ණ පක්ෂපාතීත්වයෙන් යුතුව අප යටත් විය යුතු බවය. සාතන්ද පූජාවන් කරන ලෙස බල කරයි.

**නුමුත් මිථ්‍යා දෘෂ්ටීන් පූජාකරන දේ ඔවුන් පූජාකරන්නේ දෙවියන්වහන්සේට නොව යක්ෂයන්ටය කියමි. නුඹලා යක්ෂයන් සමග සහභාගිව සිටිනවාට නොකැමැත්තෙමි. (1 කොරින්ති 10:20)**

සාතන්ද ශරීරයේත්, ප්‍රාණයේත් හා ආත්මයේත් පූර්ණ පක්ෂපාතීත්වය ඉල්ලා සිටී. සාතන්ගේ සේවයට ස්ත්‍රීන් හා පුරුෂයන් කැපවන පූජා කිරීමේ මෙහෙයයන් සැබවින්ම පැවැත්වේ. මනුෂ්‍යයන්ගේ හා සත්ත්වයන්ගේ ලේ පූජා කිරීම් ද සිදුවේ.

## සාතන්ට ඔහුගේම සහභාගිකමේ මෙහෙයක් ඇත :

සහභාගිකමේ රොටී හා මුද්‍රික පානය බෙදා ගැනීම යේසුස්වහන්සේ විසින් ආරම්භ කරන ලද්දේ සියලු මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් උන්වහන්සේ කුරුසියේ කරන ලද පූජාව සිහිවීම පිණිසය (1 කොරින්ති 11:23-24). සාතන්ද ව්‍යාජ සහභාගිකමක් පවත්වයි.

**නුමුත් මිථ්‍යා දෘෂ්ටීන් පූජාකරන දේ ඔවුන් පූජාකරන්නේ දෙවියන්වහන්සේට නොව යක්ෂයන්ටය කියමි. නුඹලා යක්ෂයන් සමග සහභාගිව සිටිනවාට නොකැමැත්තෙමි. (1 කොරින්ති 10:20)**

## සාතන්ටද සේවකයන් ඇත :

පූජකවරුන් හා සේවකයන් ලෙස සේවය කරන ලෙස දෙවියන්වහන්සේ ඇතැම් ඇදහිලිවතුන්ව උන්වහන්සේගේ සභාවට කැඳවා ඇති අතර ඔවුන් ශුභාරංචිය ප්‍රකාශ කළ යුතු වේ (1 කොරින්ති 12:28). සාතන්ටද සේවකයන් ඇත.

> **ඒක පුදුමයක් නොවේ, මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස්ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ. ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය. (2 කොරින්ති 11:14-15)**

## සාතන්ගේ සේවකයෝ ඔහුගේ ශුභාරංචිය ප්‍රකාශ කරති :

සාතන්ගේ "ශුභාරංචිය" ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියට පටහැනි වේ.

> **සමහරු නුඹලා කළඹා, ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය පෙරළන්ට කැමතිවා මිස, ඒක වෙන ශුභාරංචියක් නොවේ. නුමුත් අප විසින් නුඹලාට ප්‍රකාශකළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේවදූතයෙක්වත් ප්‍රකාශකරතොත් ඔහු ශාපලද්දෙක් වේවා. (ගලාති 1:7-8)**

## සාතන්ට ඔහුගේම සිංහාසනය ඇත :

දෙවියන්වහන්සේට සිංහාසනයක් ස්වර්ගයේ තිබේ. සාතන්ටද සිංහාසනයක් ඇති අතර එය තිබෙන ස්ථානය අපි නොදනිමු.

> **මා දුටු මෘගයා අඳුන්දිවියෙකුට සමානය. උගේ පාද වලසෙකුගේ පාද වැනිය. ඌගේ කට සිංහයෙකුගේ කට වැනිය. මහ සර්පයා තමාගේ පරාක්‍රමයත් තමාගේ සිංහාසනයත් මහත් බලයත් ඌට දුන්නේය. (එළිදරව් 13:2)**

## සාතන්ටද නමස්කාර කරන්නෝ සිටිති :

සැබෑ වූ දෙවියන්වහන්සේට නමස්කාර කරන බොහෝ අය සිටිති. සාතන්ටද නමස්කාර කරන්නන් ඇත.

> **මහ සර්පයා මෘගයාට බලය දුන් නිසා ඔවුහු මහ සර්පයාට නමස්කාර කළෝය. ඔව්හු මෘගයාටත් නමස්කාරකොට, මෘගයාට සමාන කවුද? ඌ සමග යුද්ධකරන්ට කවරෙකුට හැකිදැයි කීවෝය. (එළිදරව් 13:4)**

සාතන් නමස්කාර කරන ඇතැමෙක් යේසුස්වහන්සේගේ අනුගාමිකයෝ ලෙස පෙනී සිටිති.

> **කෙත නම් ලෝකයය, හොඳ බීජ නම් රාජ්‍යයේ පුත්‍රයෝය. කිරිඳි නම් නපුරාගේ පුත්‍රයෝය, ඒවා වපුළ සතුරා නම් යක්ෂයාය. කපන කාලය නම් ලෝකාන්තිමයය, කපන්නෝ නම් දේවදූතයෝය. (මතෙව් 13:38-39)**

සාතන් නරක "බීජ" හොඳ "බීජ" (ඇදහිලිවන්තයන්) සමඟ මිශ්‍ර කරයි.

## සාතන්ට දිවැසිවරයන් ඇත :

දෙවියන්වහන්සේ සභාව තුළ දිවැසිවරයන් තබා ඇත. ඔවුහු දෙවියන්වහන්සේගේ පණිවුඩයක් සෘජුවම සභාවට ගෙන ඒම පිණිස ආලේප කරනු ලැබ සිටිති (1 කොරින්ති 12:28). සාතන්ට බොරු දිවැසිවරුන් ඇති අතර ඔවුහු බොරු පණිවුඩ ගෙන එති.

> **නොයෙක් බොරු අනාගතවක්තෘවරු නැගිට බොහෝ දෙනෙකු මුළාකරන්නෝය. (මතෙව් 24:11)**

### සාතන්ට ගුරුවරු සිටිති :

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය පැහැදිලි කිරීමට හා බෙදා ගැනීමට ඇතැම් අය ගුරුවරුන් ලෙස ආලේප කර ඇත (1 කොරින්ති 12:28). එහෙත් සියලුම ගුරුවරු දෙවියන්වහන්සේගෙන් නොවෙති. සාතන්ටද තම නපුරු ධර්මය පැතිරවීමට බොරු ගුරුවරු සිටිති.

> **නුමුත් සෙනඟ අතරේ බොරු ප්‍රොපේතවරුද සිටියෝය. එලෙසම විනාශක ධර්මභේද රහසින් උපදවමින්ද, තමුන්ම මිලේටගත් ආචාරීන්වහන්සේව එපාකරමින්ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවාගන්නාවූ බොරු ගුරුවරු නුඹලා අතරෙන් වන්නෝය. ඔවුන්ගේ සල්ලාලකම් අනුව බොහෝ දෙනෙක් යනවා ඇත. ඔවුන් නිසා සත්‍යතාවේ මාර්ගයට අපහාස පැමිණෙන්නේය. තණ්හාව නිසා ඔවුන් වංචා වචනවලින් නුඹලා වෙළඳාමක් කරගන්නවා ඇත. පුරාණයේ සිට පවතින ඔවුන්ගේ විනිශ්චය ප්‍රමාද නොවන්නේය. ඔවුන්ගේ විනාශයද නිදා නොගනියි.**
> (2 පේත්‍රුස් 2:1-3)

සාතන්ගේ ගුරුවරු "විනාශක ධර්මභේද", එනම් භේද ඇති කරන බොරු ඉගැන්වීම් ගෙන එති. ඔවුහු බොරු පවසන අතර සත්‍යය හා වැරැද්ද මිශ්‍ර කර, වැරැද්ද පිළිගත හැකි දෙයක් ලෙස ඉදිරිපත් කිරීමේ අති දක්ෂයෝ වෙති. මෙවැනි බොරු ඉගැන්වීම් නිසා බොහෝ ලබ්ධීන් වර්ධනය වී ඇත. ලබ්ධියක් යනු ලිඛිත දේව වචනය සමඟ සම්පූර්ණ ලෙස නොගැලපෙන්නාවූ ආගමක් හෝ නමස්කාර කිරීමක් හෝ වේ. එය "විනාශක ධර්ම භේදයකි"'

මෙම ලබ්ධීන්ගේ නම්" ධර්මයන් හා සංවිධාන දේශයෙන් දේශයට වෙනස් වේ. ලබ්ධි බොහෝ ඇති බැවින් ඒ සියල්ල සඳහන් කළ නොහැකිය. දේව වචනය සමඟ සම්පූර්ණ ලෙස නොගැලපෙන්නාවූ ඕනෑම ආගමික පද්ධතියක් ලබ්ධියක් බව මතක තබා ගන්න (මෙම "දක්ෂ ලෙස හැසිරවූ උපාය මාර්ග" කොටස, ලබ්ධි හඳුනා ගැනීමට අතිරේක මාර්ගෝපදේශ සපයා ඇත).

## සාතන්ට ප්‍රේරිතයෝ සිටිති :

ප්‍රේරිතයෙකු යනු ශුභාරංචිය පතුරුවමින් සභා පිහිටුවන තැනැත්තෙකි (1 කොරින්ති 12:28). සාතන්ටද තම කාර්යය ලොව පුරා ඉටු කරන ප්‍රේරිතයෝ සිටිති. ඔව්හු සැබෑ ප්‍රේරිතයන් අනුකරණය කරමින් මිනිසුන්ව රවටති.

> **එබඳු මනුෂ්‍යයෝ බොරු ප්‍රේරිතයෝය. ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයන්ගේ වෙස් ගන්නාවූ වංචාකාර සේවකයෝය.** (2 කොරින්ති 11:13)

සාතන්ගේ ප්‍රේරිතයෝ ව්‍යාජ ලබ්ධිවල නායකයන් බවට පත්වී සභා තුළට රිංගා නායකයෝ බවට පත්වෙති.

## බොරු ක්‍රිස්තුස්ලා මගින් සාතන් යේසුස්වහන්සේව අනුකරණය කරයි :

බොරු ක්‍රිස්තුස්ලා ඇති කිරීම මගින් සාතන් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේවද අනුකරණය කර ඇත. යේසුස්වහන්සේ මෙසේ අනතුරු අඟවා ඇත.

> **යේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්, කිසිවෙක් නුඹලා මුළා නොකරන ලෙස බලාගනිල්ලා. මක්නිසාද බොහෝ දෙනෙක් මම ක්‍රිස්තුස්ය කියා මාගේ නමින් ඇවිත් බොහෝ දෙනෙකු මුළා කරන්නෝය.** (මතෙව් 24:4-5)

### සාතන්ට සන්නිවේදන පද්ධතියක් ඇත :

බයිබලය යනු දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කතා කළ ආකාරය පිළිබඳ වාර්තාවකි. දෙවියන්වහන්සේ අදද මනුෂ්‍යයාට කතා කරන සේක (හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ සම්පූර්ණ පාඨමාලාවක් " දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම " යන්නට වෙන්කර ඇත). සාතන්ද මනුෂ්‍යාට කතා කරයි. මනුෂ්‍යයාට කතා කළ ඔහුගේ පළමු වචනවලින් ඒදන් උයනේදී මනුෂ්‍යයා පාපයට වැටුණේය (උත්පත්ති 3 පරි.).

තම අවශ්‍යතාවන් පිළිබඳව ඇදහිලිවන්තයෝ දෙවියන්වහන්සේට යාච්ඤා කරති. ධර්මිෂ්ඨයන්ගේ යාච්ඤාවලට දෙවියන්වහන්සේ ප්‍රතිචාර දක්වන සේක (යාකොබ් 5:16). සාතන්ගේ අනුගාමිකයෝ ඔහුට යාච්ඤා කරමින් නපුරු ආත්ම සමග සන්නිවේදනයේ යෙදෙති. ඇතැම් අවස්ථාවල සාතන් හඬවල්, වස්තූන් චලනය කිරීම් හා ශබ්ද ආදී අධිස්වභාවික සිද්ධීන් මගින් ප්‍රතිචාර දක්වයි.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ලිඛිත වචනය වූ බයිබලය තුළින් මනුෂ්‍යයන් සමඟ සන්නිවේදනයේ යෙදෙන සේක. සාතන්ගේ පණිවුඩයටද අසභ්‍ය සඟරා, පොත්, චිත්‍රපට හා සංගීතය ආදිය මගින් සන්නිවේදනය කෙරේ. දෙවියන්වහන්සේගේ ලිඛිත හා කතා කරන වචනය මගින් කෙරෙන සන්නිවේදනය තුළින් මිනිසාගේ ජීවිතයේ කටයුතුවලට මඟපෙන්වීම ලැබේ. සාතන්ටද පහත දැක්වෙන ක්‍රම මගින් බොරු මගපෙන්වීම් සැපයීමේ ක්‍රමයක් ඇත.

**ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය හා හඳහන** මේවා මගපෙන්වීම සැපයීමට හා අනාගතය කිමට තරු භාවිත කෙරේ.

**කියවීම:** තේ කොළ, කාඩ්, පින්තූර, හිසේ ඇති ගෙඩි වැනි දේ, අල්ල හා වීදුරුගෝල කියවීම, තේ කොළ, කාඩ්, අල්ලේ රේඛා, වීදුරුගෝල හා පින්තූරු ආදිය මඟපෙන්වීම් දෙන බවට විශ්වාස කෙරේ.

**හූනියම්:** මඟපෙන්වීම් ලබා ගැනීම් සඳහා වශීකරණ, මන්ත්‍ර, මායම්, උපවිෂ්ටි, ජේනකීම්, දර්ශන හා මෙවැනි ශුද්ධ ලියවිල්ලට එකඟ නොවන දේ භාවිත කිරීම.

## සාතන්ට අධිස්වභාවික බලයක් ඇත:

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය ලැබුණු පසු තම අනුගාමිකයන්ට අධිස්වභාවික බලයක් දෙන බවට යේසුස්වහන්සේ පොරොන්දු වූ සේක (ක්‍රියා 1:8). සාතන්ද අධිස්වභාවික බල හා අධිකාරී බලය දෙනු ඇත (එළිදරව් 13:2). ඔහුගේ යක්ෂයන්ට අධිස්වභාවික ශක්තිය හා බලයක් දිය හැකිය. සාතන්ට බොහෝ අධිස්වභාවික ලකුණු හා හාස්කම් කළ හැකිය.

> **මක්නිසාද ඔවුහු සර්වපරාක්‍රමවූ දෙවියන්වහන්සේගේ මහත් දවසේ යුද්ධයට මුළු ලෝකයේ රජුන් රැස්කරන පිණිස, ඔවුන් ළඟට යන්නාවූ, හාස්කම්කරන්නාවූ යක්ෂයින්ගේ ආත්මයෝය. (එළිදරව් 16:14)**

යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **ඒ දවසේදී බොහෝ දෙනෙක් ස්වාමිනි, ස්වාමිනි, ඔබගේ නාමයෙන් අනාගත වචන නොකියෙමුද? ඔබගේ නාමයෙන් යක්ෂයන් දුරු නොකෙළෙමුද? ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකෙළෙමුදැයි මට කියනවා ඇත. එවිට මම, කිසිකලෙකත් නුඹලා නොහැඳින්නෙමි, අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන් අහක්ව පලයල්ලායයි ඔවුන්ට කියන්නෙමි. (මතෙව් 7:22-23)**

# ආත්මික ප්‍රතිඋපක්‍රම

## උස් ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්මවලට එරෙහිව සටන් කිරීම

උස් ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම පරාජය කළ හැකි සුවිශේෂී ප්‍රතිඋපක්‍රම පහත දැක්වේ.

### සාතන් අනුකාරකයෙකු ලෙස හඳුනාගන්න :

ඔබ මෙම පාඩමේ මෙතෙක් අධ්‍යයනය කළ කොටසින් සාතන් අනුකාරකයෙකු බව පැහැදිලි වන්නට ඇත. "අනුකරණය කිරීම" යනු යම් දෙයක් ඒ ආකාරයෙන්ම කිරීම හෝ බොරු දෙයක් හෝ වේ. උස් ස්ථානවල දුෂ්ටකමේ පරාජය කිරීමේ පළමු පියවර වන්නේ සාතන්

දෙවියන්වහන්සේගේ ආගමික ව්‍යුහයන්හි සෑම අංගයක්ම අනුකරණය කරන බව හඳුනාගැනීම වේ. අනුකරණයන් පිළිබඳව අවදියෙන් සිටින්න.

## විමසීම භාවිත කරන්න :

"ආත්ම විමසීම " නමැති ශුද්ධාත්මයාණන්වහන්සේගේ විශේෂ දීමනාවක් ඇත. එය සැණෙකින් තවත් කෙනෙකුගේ ආත්මය නිර්ණය කර එය යහපත් ද නපුරුද යන්න දැනගැනීම සඳහා දෙවියන්වහන්සේ විසින් දෙනු ලබන අසාමාන්‍ය හැකියාවකි. ඔබට මෙම ආත්මික දීමනාව තිබේ නම් එය උස් ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සමඟ කටයුතු කිරීමට භාවිත කරන්න. ඔබට මෙම දීමනාව නොමැති නම් මෙම ආත්ම සොයා ගැනීමේ වෙනත් ක්‍රම දෙවියන්වහන්සේ දී තිබේ. දූෂිත ආත්ම සහිත මෙම මිනිසුන්ගේ ගති ලක්ෂණ 2 පේත්‍රුස් 2 හි හා යුද් 4 හි ලැයිස්තුගත කර ඇත (මෙම පාඩමේ "දක්ෂ ලෙස හැසිරවූ උපාය මාර්ග" නමැති කොටස මෙම විෂය පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කිරීමට භාවිත කරන්න). සියලුම ඇදහිලිවන්තයන්ට "ආත්ම.. පරීක්ෂා කිරීමට" (1 යොහන් 4:1) දිරි ගන්වනු ලැබේ. ඔබ ආත්ම පරීක්ෂාකර බලන්නෙහි නම් ඔබ එසේ කරන්නේ අවිශ්වාසය නිසා යැයි නොහැඟේ. එම ආත්ම දෙවියන්වහන්සේගේ නම්, ඒවා පරීක්ෂණයෙන් සමත් වනු ඇත.

## දේව වචනය ඉගෙන ගන්න :

සාතන්ගේ ගුරුවරුන්ගේද, ප්‍රේරිතවරුන්ගේද, දිවැසිවරුන්ගේද, සේවකයන්ගේ ද බොරු ධර්ම හැඳිනගැනීමට ඔබ දේව වචනයේ උගන්වන දේ දත යුතුය. පාවුල්තුමා තිමෝතිට මෙසේ පැවසීය.

> **සැබෑවේ වචනය හරි ආකාර පහදාදෙන්නාවූ, ලජ්ජාවෙන්ට ඕනෑ නැත්තාවූ වැඩ කාරයෙක්ව, දෙවියන්වහන්සේට ඒත්තුවුනාවූ කෙනෙකනු මෙන් පෙනෙන්ට උත්සාහ කරපන්න. (2 තිමෝති 2:15)**

පාවුල්තුමා මුල් සභාවේ ශ්‍රේෂ්ඨ ආත්මික නායකයෙකු වුවද, බෙරියා නගරයේ සිටි ඇදහිලිවන්තයෝ, ඔහු පැවසූ සෑම දෙයක්ම දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය හා සමඟ සසඳා බැලූහ.

> **ඔව්හු තෙසලෝනිකයෙහි අයවලුන්ට වඩා උතුම්වූවෝය. මක්නිසාද ඔව්හු මේ කාරණ මෙසේදැයි දැනගන්නා පිණිස දවස්පතා ලියවිලි සොයමින්, සිතේ මුළු කැමැත්තෙන් වචනය පිළිගත්තෝය. (ක්‍රියා 17:11)**

උස් ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම මගින් නොරැවටෙන පිණිස, උගන්වන ලද සෑම දෙයක්ම දේව වචනය සමඟ විමසා බලන්න.

## දේව වචනයේ නොමැති ඕනෑම දෙයක් ප්‍රතික්ෂේප කරන්න :

සාතන්, උස් ස්ථානවල සිටින බොහෝ දුෂ්ට ආත්ම "අලුත් සත්‍යයේ විශේෂ එළිදරව්වීම" ලෙස හැඳින්වෙන දේ තුළින් පිහිටුවන්නේය. මිනිසුන් විශේෂ සිහින, දේවදූතයන් පෙනී සිටීම, දර්ශන, හඬවල් හෝ වෙනත් අධිස්වභාවික සිද්ධීන් දුටු බව පවසනු ඇත. එහෙත් පාවුල්තුමා මෙසේ අනතුරු අඟවයි.

> **සමහරු නුඹලා කළඹා, ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය පෙරළන්ට කැමතිවා මිස, ඒක වෙන ශුභාරංචියක් නොවේ. නුමුත් අප විසින් නුඹලාට ප්‍රකාශකළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේවදූතයෙක්වත් ප්‍රකාශකරතොත් ඔහු ශාපලද්දෙක් වේවා. (ගලාති 1:7-8)**

දේව වචනයට අනුකූල නොවන ඕනෑම ඉගැන්වීමක්, ධර්මයක්, ප්‍රකාශවීමක් හෝ එළිදරව්වීමක් ප්‍රතික්ෂේප කරන්න. ඇදහිල්ල සමඟ නිවැරදි සබඳතාවක් නොමැති දිවැස්වැකි ලෙස හැඳින්වෙන දේ (රෝම 12:6) හා ඉටු නොවන දේ (ද්විතිය කථාව 18:22) පිළි නොගන්න. ඔබ දෙවියන්වහන්සේගෙන් හා උන්වහන්සේගේ සැබෑ වචනයෙන් ඈත් කෙරෙන (ද්විතිය කථාව 13:1-5) ඕනෑම එළිදරව්වීමක් ද පිළිනොගන්න.

**ප්‍රඥාවේ මාර්ගයෙන් මුළාව යන මනුෂ්‍යයා මළවුන්ගේ සමාගමේ වසන්නේය. (හිතෝපදේශ 21:16)**

## ආත්මික ඵල මගින් ඇගයීම් කරන්න :

සාතන්, හාස්කම්, ලකුණු හා පුදුම දේවල් අධිස්වභාවික ප්‍රකාශවීම් මගින් දෙවියන්වහන්සේගේ බලය අනුකරණය කරන බැවින් සේවාවන් ඇගයීමට දෙවියන්වහන්සේගේ විශේෂ ක්‍රම සපයා ඇත. මෙම අධිස්වභාවික දේ ඇගයීමට භාජනය කළ යුත්තේ ආත්මික ඵල පදනම් කරගෙන වේ.

යේසුස්වහන්සේ මිනිසුන්ව ඵල දරන ගස්වලට සමාන කළ සේක. ඔබ ඔවුන්ගේ ආත්මික ඵල පරීක්ෂා කර බැලීමෙන් සත්‍ය හා අසත්‍ය දේ ඔබ දන්නෙහියයි උන්වහන්සේ පැවසූ සේක.

**හොඳ ගහක නරක ඵලවත් නරක ගහක හොඳ ඵලවත් හටගන්ට බැරිය. එබැවින් ඔවුන්ගේ ඵලවලින් නුඹලා ඔවුන් ඇඳිනගන්නහුය. (මතෙව් 7:18, 20)**

සාතන්ට ආත්මික දීමනාද දෙවියන්වහන්සේගේ බලයද අනුකරණය කළ හැකිය. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල පෙන්වන ශුද්ධවන්ත ජීවිතයක් අනුකරණය කිරීමට ඔහුට නුපුළුවන. එම ඵල අතර මේවාද ඇත.

**නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්, ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත. (ගලාති 5:22-23)**

සේවයක බලය අධිස්වභාවික ප්‍රකාශවීම් මගින් නොව ආත්මික ඵල මගින් ඇගයීම් කරන්න.

## සියලුම සාතනික බලපෑම් මගහරින්න :

සෑම ආකාරයකම සාතනික බලපෑම් මගහරින ලෙස දෙවියන්වහන්සේ ඉශ්රායෙල්වරුන්ට අනතුරු ඇඟවූ සේක.

**දේශයේ සියලු වැසියන් නුඹලා ඉදිරියෙන් පන්නා දමා ඔවුන්ගේ සියලු රූප සහිතවූ කැටයම් ගල්ද ඔවුන්ගේ සියලු වාත්තු පිළිමද නැති කර දමා ඔවුන්ගේ සියලු උස් තැන් නටබුන් කරපල්ලා. (ගණන්කථාව 33:52)**

දෙවියන්වහන්සේ විසින් දෙන ලද අතිරේක උපදෙස් ද්විතියකථාව 18:9-14 න් කියවන්න. කුමන ආකාරයක හෝ සාතන්ගේ ක්‍රියාවන් සමඟ සබඳතාවක් ඉශ්රායෙලය නොපැවැත්විය යුතුය. භූනියම් හෝ වෙනයම් සාතන්ගේ ක්‍රියාවන් හෝ සම්බන්ධ ඔබට අයත් සෑම දෙයක්ම විනාශ කර දැමිය යුතුය. මේවා අතර පිළිම, "වාසනාවන්ත වශීකරණ" ආරක්ෂාවන්, විදුරුගෝල, ක්‍රීඩා, ජේනකීමේ උපක්‍රම හා එවැනි දේ තිබිය හැකිය. අලුත් ගිවිසුමේ මිනිසුන් ඇදහිලිවතුන් වූ විට ඔවුන් කළ දේ මෙසේය.

**යන්ත්‍ර මන්ත්‍ර අභ්‍යාස කළ බොහෝ දෙනෙක්ද තමුන්ගේ පොත් එක්කොට ගෙනැවිත් සියල්ලන් ඉදිරියෙහි පුළුස්සාදැමුවෝය. ඒවායේ මිලගණන් බලා, රිදීමිල පණස්දහසක් (ඩොල¾ 9,300 පමණ) බව දැනගත්තෝය. (ක්‍රියා 19:19)**

දෙවියන්වහන්සේ මහිමයට පත් නොකරන දුෂ්ට සාහිත්‍යය හා සංගීත විනාශ කරන්න. නපුරු බලපෑම් ඇති ස්ථානවල කාලය ගත නොකරන්න. දෙවියන්වහන්සේ ප්‍රකාශ වූ විශේෂ ස්ථාන බයිබලයේ සඳහන් වේ. පැරණි ගිවිසුමේ සඳහන් දේවමාලිගාව, පෙන්තකොස්ත දිනයේ නිවෙසක තැබූ උඩුමහල් මැදුර ආදිය මෙවැනි තැන් වේ. නපුරාට කැපකළ විශේෂ ස්ථානවල සාතන්ගේ බලය ප්‍රකාශ කළ හැකි බවද සත්‍යයකි. මේවා අතර අසභ්‍ය පින්තූර ප්‍රදර්ශනය කරන ස්ථාන, බීමත්ව කැරලි කෝලහාල කරන ස්ථාන, සාත්නට නමස්කාර කරන ස්ථාන ස්ථාන ආදී පාපී ක්‍රියාවන් කරන ඕනෑම තැනක් තිබිය හැකිය. එවැනි ස්ථානවල සාතන්ගේ බලය විශේෂයෙන්ම පවතින බැවින් ඒ තැන මගහරින්න. ඔබට ස්වාමීන්ගේ යාච්ඤාවේ "නපුරාගෙන් අප ගළවාගත මැනව" යයි යාච්ඤා කර එවැනි තැන්වලට යා නොහැකිය.

**නුමුත් මිථ්‍යා දෘෂ්ටීන් පූජාකරන දේ ඔවුන් පූජාකරන්නේ දෙවියන්වහන්සේට නොව යක්ෂයන්ටය කියමි. නුඹලා යක්ෂයන් සමග සහභාගිව සිටිනවාට නොකැමැත්තෙමි.**
**(1 කොරින්ති 10:20)**

බොරු නායකයන්, ප්‍රේරිතයන්, දිවැසිවරුන්, ගුරුවරුන් හා සේවකයන් ආශ්‍රය නොකරන්න.

**සියලු අන්දම්වල නපුරෙන් වැළකියල්ලා. (1 තෙසලෝනික 5:22)**

## උස් ස්ථානවල දුෂ්ටකම් පෙන්වන්න :

උස් ස්ථානවල ඇති ආත්මික දුෂ්ටකම් ඇදහිලිවතුන් නොසලකා හැරිය යුතුය. රැවටිලිකාරකම් ඇති විට පූජකවරුන් දෙවියන්වහන්සේගේ සම්පූර්ණ අනුශාසනාව දේශනා කළ යුතුය (2 තිමෝති 4:1-4). ලබ්ධීන්වල වැරදි ඉගැන්වීම් හා යක්ෂයන්ගේ ධර්මය හඳුනාගත යුතුය. "අන්ධකාරයේ ඵල නැති ක්‍රියාවලට" ඇදහිලිවතුන් හවුල් නොවිය යුතු අතර ඔවුන් ඒවා එළිදැක්විය යුතුය (එපීස 5:11).

## මිදීමේ සේවය කි%යාකා× කරන්න :

දෙවියන්වහන්සේගේ සංවිධානය එනම් සැබෑ සභාව, සාතන්ගේ ඒවාට වඩා බලවත්ය. යේසුස්වහන්සේ සභාවේ හිස බවත් ඇදහිලිවතුන් ශරීරය බවත් ඔබ උගත්තෙහිය. එය සිතේ තබාගෙන පහත දැක්වෙන පද කියවන්න.

**සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත්කොට, සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළසේක. ඒ සභාව නම්, සියල්ලන් තුළ සියල්ල සම්පූර්ණකරන තැනැන්වහන්සේගේ පූර්ණකම වන උන්වහන්සේගේ ශරීරයය. (එපීස 1:22-23)**

**එසේ කළේ අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරන ලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයට, ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්ට ලැබෙන පිණිසය. (එපීස 3:10-11)**

යේසුස්වහන්සේ සභාවේ හිසය. ඇදහිලිවතුන් ශරීරයය. සියලුම දේ (සාතන් හා ඔහුගේ ආගමික ව්‍යුහය ඇතුළුව) යේසුස්වහන්සේගේ පාදවලට යටත් කොට ඇත් නම්, ඒවා අපේ පාදවලටද යටත් කොට ඇත. මක්නිසාද අප ශරීරය බැවිනි. "පාදවලට යටත් කොට" යන්නෙන් අදහස් වන්නේ ඒවා දෙවියන්වහන්සේගේ බලය හා ආධිපත්‍යය යටතේ බව වන අතර ඒ බලය උන්වහන්සේ අපට පවරා ඇත. යේසුස්වහන්සේ අපට "සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්නට" බලය අපට දී ඇති බව පැවසූ සේක (ලූක් 10:19). මීට උස්තැන්වල ආත්මික දුෂ්ටකමේ බලද ඇතුලත් වේ.

සභාව සැබවින්ම මේ අධිපතීන්ටත් බලධාරීන්ටත් උන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කළ යුතුය. "උස්තැන්වල සිටින දුෂ්ටකමේ ආත්ම" වලට වහල්ව සිටින අයට මිදීම ලබා දීමට අපි මේ සේවය භාවිත කළ යුතු වෙමු. අප මිනිසුන්ව අන්ධකාරයෙන් ආලෝකයටත් සාතන්ගේ බලයෙන් දේව රාජ්‍යයටත් ගෙන ආ යුතුය (ක්‍රියා 26:18).

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. පැරණි ගිවිසුමේ "උස් ස්ථාන" භාවිත කර ඇත්තේ කෙසේද?

3. "උස් ස්ථානවල දුෂ්ටකමේ ආත්ම" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

4. උස් ස්ථානවල දුෂ්ටකමේ ආත්ම සඳහා වන සාතන්ගේ උපක්‍රම ඔබට මතක ඇති අන්දමින් සාරාංශගත කරන්න.

5. උස් ස්ථානවල දුෂ්ටකම් පරාජය කිරීමට ඇති ප්‍රති උපක්‍රම සාරාංශගත කරන්න.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපායමාර්ග දක්ෂලෙස හැසිරවීම

1. සාතන් සහ මායාකාරකම් පිළිබඳව දෙවියන්වහන්සේ ඉශ්රායෙල්වරුන්ට දී අනතුරු ඇඟවීම් අධ්‍යයනය කරන්න. ද්විතියකථාව 18:10-12, ලෙවීකථාව 17:7, 19:31, 20:16.

2. යක්ෂයන්ට කර ඇති පූජාවන් පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කරන්න. ද්විතියකථාව 32:17, 2 ලේකම් 11:15, ගීතාවලිය 106:37.

3. පහත දැක්වෙන්නේ විවිධ ලබ්ධීන් (වැරදි ආගමික ක්‍රම) පිළිබඳ පොදු ගති ලක්ෂණ වේ.

   - ඒකාධිපති නායකත්වයක් ඇත. ලබ්ධීන් ආධිපත්‍යයන් හා ආකර්ෂණීය පෞරුෂත්වයක් ඇති අය වටා ඒකරාශි වේ. මේ අය කිසිවෙකුටත් වගකිමක් නොදරන පූර්ණ බලයක් ඇති අය වේ.
   - විශේෂිත අය වෙති. දිව්‍යමය සත්‍යය ඇත්තේ තම කණ්ඩායම්වලට පමණක්ය යන ආකල්පය මෙම ලබ්ධීන්ට ඇත. ඔවුන් සමඟ එකඟ නොවන අය ඔවුහු බැහැර කරති.
   - නීතියට කටයුතු කරති. සාමාන්‍යයෙන් මෙම ලබ්ධීන්ට විශ්වාසය හා හැසිරවීම පිළිබඳව තද නීති ඇත. ඒවාට කිසිඳු ශුද්ධ ලියවිලි පදනමක් නැත.
   - ආරක්ෂාව ගැන සිතති. මෙම ලබ්ධිවල සාමාජිකයන් සාමාන්‍යයෙන් සමාජයද, සංවිධානාත්මක ආගම්ද, රජය ද තමන්ට විරුද්ධ බව සිතීමට පොලඹවා ඇත. මේ නිසා ආගමද රජයද සමාජයද කෙරෙහි විප්ලවකාරී ලෙස සිතීමට ඔවුහු පෙලඹෙති.
   - පීඩා ගෙන දේ: ලබ්ධි සාමාජිකයන් සාමාන්‍යයෙන් ඔවුන්ගේ නායකත්වය විසින් හසුරුවන අතර පීඩාවට භාජනය කරති.
   - රහසිගතය: ලබ්ධිය පිළිබඳ බොහෝ දේ "පිටත අයගෙන්" රහසිගතව තබනු ඇත.
   - උසස් එළිදරව්වීම් ඇත. බොහෝවිට මෙම ලබ්ධි ඔවුන්ට දෙවියන්වහන්සේගෙන් "උසස් එළිදරව්වීමක්" ඇතැයි පවසති. ඔවුන්ට සැමවිටම ශුද්ධලියවිල්ලට ඔබ්බෙන් ආධිපත්‍යයක් ඇති ප්‍රභවයක් තිබේ. එය නිර්මාතෘවරයාගේ හෝ වෙනත් කෙනෙකුගේ හෝ ලියවිල්ලක් නැතහොත් එළිදරව්වීමක් විය හැකිය. ඇතැම් අවස්ථාවල එය නිර්මාතෘවරයාගේ බයිබලය අර්ථනිරූපණය කරන අනුකූල ක්‍රමයක් විය හැකිය. ඔවුන්ගේ ධර්මය බයිබලය නියෝජනය නොකරයි.
   - සභාවට විරුද්ධය: මෙම ලබ්ධීන් සාමාන්‍යයෙන් සංවිධානාත්මක සභාවලට හා ඒවායේ පූජකවරුන්ට තදින්ම විරුද්ධය.
   - පවුලට විරුද්ධය. ඇතැම්විට ලබ්ධීන් පවුලට විරුද්ධය. මින් අදහස් වන්නේ සාමාජිකයන් නොවන තම පවුලේ අය සමග සබඳතාවන් බිඳ දැමීම ඔවුන්ට අවශ්‍යය. තම ගෝලකම තබා ගැනීමට ජීවවිද්‍යාත්මක පවුල් සබඳකම් බිඳ දැමීමට ඔවුහු උත්සාහ කරති.

4. ලොවපුරා බොහෝ ලබ්ධීන් ඇති බැවින් ඒ සියල්ල හඳුනා ගැනීම කෙසේවත් කළ නොහැකිය. එහෙත් "නව යුගයේ සංවිධානය" ලෙස හැඳින්වෙන දෙයෙහි වේගවත් වර්ධනය නිසා "යක්ෂයන්ගේ ධර්මය" ගැන සඳහන් කිරීම වැදගත් යයි අපි සිතුවෙමු. මෙම අත්පොත ලියන වකවානුවේ මිනිසුන් මිලියන සංඛ්‍යාවක් නව යුගය හා බැඳී ඇති අතර එය වේගවත්ව වර්ධනය වෙමින් පවතී. එක්සත් ජනපදයේ ප්‍රධාන ප්‍රකාශන සමාගම් දැන් "නව යුගයේ දෙපාර්තුමේන්තු" පිහිටුවා ඇත. ඒවායේ ලිපි ලේඛණ සඳහා එතරම්ම ඉල්ලුමක් ඇති බැවිනි. මෙම නව යුගයේ සංවිධානවල මුල් ඇත්තේ පැරණි මායාකාර දේවල වේ. එහි ඓතිහාසික බැඳුම් සුමේරියානු, ඉන්දියානු, ඊජිප්තු, බබිලෝනියානු හා පර්සියානු ආගමික පුරුදු සමග පවතී. "නව යුගය" යනු නව නමක් වුවද එහි අන්තර්ගත ලබ්ධීන් කෙසේවත් අලුත් ඒවා නොවේ.

   ඔවුන් යේසුස්වහන්සේ සලකන්නේ බුදුන්වහන්සේ මොහොමඩ්තුමා, කොන්ෆියුසියස්, සෝරාස්ටර්, ක්‍රිෂ්ණා වැනි අය සමග "සත්‍යය" එළිදරව් කළ කෙනෙකු හෝ "දෙවියෙකු" ලෙසය. යේසුස්වහන්සේගේ දේවත්වය ඔවුහු ප්‍රතික්ෂේප කරති. මිනිසා දෙවියන්වහන්සේගෙන් වෙන් කෙරෙන්නේ පාපය නිසා බව බයිබලය උගන්වන අතර නව යුගයේ සංවිධානය විශ්වාස කරන්නේ මිනිසා යහපත උරුමකරගෙන ඉපදුනු කෙනෙකු ලෙසය. ඔවුන් විශ්වාස කරන්නේ

මිනිසා දෙවියන්වහන්සේගෙන් වෙන්වී ඇත්තේ ඔහුගේ හෘදය සාක්ෂිය නිසා වන අතර දෙවියන්වහන්සේ හා සමඟ ඇති ඔහුගේ එකඟත්වයට වෙනස් අනන්‍යතාවක් ඇත යන බොරු හැඟීම නිසා අන්ධ වී ඇති බවය.

මේ නිසා මෙම නව යුගයේ සංවිධානය, හෘදය සාක්ෂිය වෙනස් කිරීමේ විවිධ ක්‍රම යෝජනා කරයි. ඒවා අතර යෝග ක්‍රම, භාවනාව, සජ්ජායනයන්, වශී කෙරෙන නැටුම්, මත් ද්‍රව්‍ය ආදිය වේ. මේ ගැළවීමේ ක්‍රම ලෙස ඔවුහු සලකති. හූනියම්, මන්ත්‍ර ගුරුකම් ආදී නව යුගයේ ක්‍රියාකා×කම් යක්ෂ බලපෑම්වලට දොර විවෘත කරයි.

එමෙන්ම මෙම නව යුගයේ සංවිධානය පැරණි හින්දු ධර්මයක් වූ නැවත නැවත ඉපදීම හා කර්මය ප්‍රබල ලෙස අවධාරණය කරයි. ඔවුන් විශ්වාස කරන්නේ නැවත නැවත ඉපදීම නිසා අයහපත් "කර්ම" ඉවත් වන බවය. මනුෂ්‍යයා තමාගේම "සාතන්" හා තමාගේම "දෙවියන්" හා ගැළවීම බව ඔව්හු සලකති. මේ ආකාරයෙන් නව යුගයේ සංවිධානය මනුෂ්‍ය වර්ගයා කෙරෙහි මුල් බැස ඇත. අගයයන් හා සදාචාරයන් සාපේක්ෂය, එනම් පුද්ගලයා හා සංස්කෘතිය අනුව ඒවා වෙනස් වේ. ඔබ ඔබට නිවැරදියයි හා හපත් යයි සිතන දේ කිරීම මගින් ඔබගේම සත්‍යතාව නිර්මාණය කර ගන්නෙහිය. මෙම නව යුගයේ සංවිධානය දේව වචනයේ ඇති සදාචාරයන් අවසාන සත්‍ය ලෙස පිළිගන්නේ නැත.

නපුරක් නැතැයි ඔවුන් විශ්වාස කරන බැවින් අපරාධයක් හෝ ඊට ලක්වෙන්නෙකු හෝ නැත. මරණය මායාවක් ලෙස ඔවුන් සලකන අතර ඔවුන් විශ්වාස කරන්නේ මනුෂ්‍යයෙකු නිරන්තරයෙන්ම නැවත නැවත ඉපදෙන බැවින් මිනී මැරීමේ හෝ ගබ්සා කිරීමේ හෝ වරදකාරයෙකු නොමැති බවය.

නව යුගයේ ප්‍රචාරක ක්‍රම අතර, ලොව පුරා ඇති ජාල මගින් විවිධ සංවිධානවලට රිංගා ගැනීම (සැබෑ සභාවට වුවද) හා එක්සත් කිරීම අන්තර්ගත වේ. නව යුගයේ සාමාජිකයෝ "පවිත්‍ර කිරීමක්" ගැන කතා කරති. එමගින් ලෝකයේ ඇති සියලු "පූර්ණ ලෙස පරිණාමණය නුවූ ආත්ම" එනම් දෙවි කෙනෙකු ලෙස තමාටම නොපෙනෙන අය පවිත්‍ර කෙරෙනු ඇත. ගෝලීය මට්ටමින් බලය කේන්ද්‍රගත කිරීමේ ව්‍යාපාරයක එනම් මනුෂ්‍යයා එකම අධිපතියා ලෙස සලකන අභක්තික එක්සත්කමක් කරා ඔවුහු ක්‍රියා කරති. මෙම නව යුගයේ සංවිධානය, ගෝලීය එක්සත්මක් පිළිබඳව සාතන්ගේ සැලසුම ක්‍රියාකරවන බලවේග බොහොමයකින් එකක් විය හැකිය. ලොව පුරා තම ආධිපත්‍යය පතුරුවන ක්‍රිස්තු විරෝධියාගේ වේදිකාව ඇතැම්විට මෙය විය හැකිය.

5. 2 පේත්‍රුස් 2 පරිච්ඡේදය හා යුද් පොත අධ්‍යයනය කරන්න. සභාවේ සාතන්ගේ පණිවුඩකරුවන් සොයා ගැනීමට ඔබට උපකාර වන ක්‍රම ලැයිස්තුගත කරන්න.

## ව්‍යාජ ගුරුවරුන්ගේ ගති ලක්ෂණ
## 2 පේත්‍රැස් 2 පරිච්ඡේදය

**නිදර්ශනය**
ව්‍යාජ ගුරුවරු විනාශක ධර්මභේද උගන්වති. 1 පදය
ඔවුහු ස්වාමින්වහන්සේ ප්‍රතික්ෂේප කරති.

**දැන් ඉතිරි ඒවා ලියන්න.**

________________________________________
________________________________________
________________________________________
________________________________________
________________________________________
________________________________________
________________________________________
________________________________________

**සභාව තුළට රිංගා ඇති "ඇතැම් මිනිසුන්ගේ" ගති ලක්ෂණ**
**යුද් පොත**

# විසිඑක්වන පරිච්ජේදය

# යක්ෂ බලවේග සමග කටයුතු කිරීම

**අරමුණු:**

මෙම පරිච්ජේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ශරීරයට ප්‍රාණයට හා ආත්මයට ප්‍රහාර එල්ල කරන ප්‍රධාන යක්ෂයන්ගේ වර්ග තුන හඳුනාගැනීමට
- යක්ෂ බලවේග සමග කටයුතු කිරීමේදී ආත්ම විමසීමේ දීමනාවේ අගය පැහැදිලි කිරීමට
- යක්ෂයාට වසඟවීම යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- යක්ෂයාට වසඟ වූ පුද්ගලයෙකුගේ ගති ලක්ෂණ හඳුනාගැනීමට
- යක්ෂයාගේ පීඩා විඳීම යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- යක්ෂයාගෙන් පීඩා විඳින්නෙකුගේ ගති ලක්ෂණ හඳුනාගැනීමට
- යක්ෂාවේශ වීම යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- යක්ෂාවේශ වූ පුද්ගලයෙකුගේ ගති ලක්ෂණ හඳුනාගැනීමට
- යක්ෂ බලවේග පිළිබඳව යේසුස්වහන්සේගේ මෙහෙය සාරාංශගත කිරීමට
- යක්ෂ බලවේග පරාජය කිරීමට ශුද්ධ ලියවිලි මාර්ගෝපදේශ භාවිත කිරීමට හැකිවනු ඇත.

## යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය

**දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේපකළ බවත් දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසිරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

## හැඳින්වීම

යක්ෂයාගේ ක්‍රියාවන් කුතුහලය දනවන මිථ්‍යාදෘෂ්ටි සංස්කෘතියේ පුරුදු ලෙස දිගු කාලයක් ඉවත දමා තිබිණි. එය ජීවිත, නිවෙස්, සභාවන් හා ජාතිය ආක්‍රමණය කරන ගැටළුවක් ලෙස සැලකුවේ නැත.

ඔබ කලින් උගත් පරිදි යක්ෂයන් යනු ඇදහිලිවතුන් සමග පොර බදින සංවිධානාත්මක බලවේගයකි (එපීස 6:12). සාතන්, මේ ලෝකයේ තම පරමාර්ථ ඉටු කරගැනීමට යොදාගන්නා නියෝජිතයෝ යක්ෂයෝ වෙති.

පහත දැක්වෙන සටහනින් යක්ෂයන් හා ඔවුන්ගේ ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් පිළිබඳ ඔබ උගත දේ සාරාංශ ගත කෙරේ.

| **දූෂණය කෙරෙන ආත්ම** | **අපවිත්‍ර ආත්ම** | **දුර්වලත්වයේ ආත්ම** |
|---|---|---|
| ආත්මයට බලපෑම් ඇතිකරයි | ප්‍රාණයට බලපෑම් ඇති කරයි | ශරීරයට බලපෑම් ඇති කරයි |

**ආත්මයකට** පීඩා කළ හැකිය, ආවේග විය හැකිය, වසඟ කළ හැකිය.

ඔබ සාර්ථක සටනක යෙදීමට නම් ශරීරය, ප්‍රාණය හා ආත්මය වසඟ කරන ආවේශ කරන හා පීඩාවන්ට භාජනය කරන යක්ෂාවේශ බලවේග සමග කටයුතු කරන ආකාරය උගත යුතු වේ. යක්ෂයන් ලෙස හැඳින්වෙන අඳුරු බලවේග මගින් වධ දෙන්නාවූ දුක් දෙන්නාවූ ආවේශ වී ඇත්තාවූ බොහෝ අය ඔබ වටා සිටිති. මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරෙන්නේ යක්ෂ බලවේග මගින් බලපෑම් සිදුවී ඇති අයට සේවය කිරීමේ මාර්ගෝපදේශයකි.

## යේසුස්වහන්සේ හා යක්ෂයන්

යේසුස්වහන්සේගේ ඉගැන්වීම් හා සේවයෙන් පෙන්නුම් කළේ යක්ෂාත්ම දුෂ්ටවූ සැබෑ බලවේග බවය. යක්ෂයන් පිළිබඳව යේසුස්වහන්සේ උගැන්වූ දේ හා උන්වහන්සේ ඔවුන් සමග කටයුතු කළ ආකාරය සාතන්ගේ උපක්‍රම පිළිබඳව වටිනා තොරතුරු සපයයි.

සාතන් යක්ෂ සේනාවකගේ පාලකයා බව යේසුස්වහන්සේ පිළිගත්සේක. උන්වහන්සේ යක්ෂයා සැබෑ බව හා ඔහුගේ බලය ගැන ඉගැන්වූසේක. යක්ෂ බලවේග පලවාහැරීම දේව රාජ්‍යයේ පැමිණීම පිළිබඳව එක් ලකුණක් බව උන්වහන්සේ පැවසූසේක. යක්ෂයන් පිළිබඳව යේසුස්වහන්සේ උගැන්වූ දෙයෙහි සාරාංශයක් මතෙව් 12:22-30; මාක් 3:22-27; හා ලූක් 11:14-23න් කියවන්න.

යේසුස්වහන්සේගේ සේවයේ විශාල කොටසක් යක්ෂයන් සමග කටයුතු කළේය. යේසුස්වහන්සේ පිළිබඳ නිදසුනෙන් හා උන්වහන්සේගේ නාමයේ ආධිපත්‍යයෙන් යක්ෂ බලවේග සමග ක්‍රියාකිරීම සඳහා ශුද්ධ ලියවිලි පදනමක් සපයයි.

යක්ෂයන් සම්බන්ධ ගැටළු සහිතව පැමිණි "සියලු දෙනාට" උන්වහන්සේ සේවයකළසේක. යේසුස්වහන්සේ පිළිබඳව පේත්‍රුස්තුමා මෙසේ පවසා ඇත:

> **දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරිය යේසුස්වහන්සේ ආලේපකළ බවත් දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසිරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

මෙම පාඩමේ "උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම" කොටසෙන් ඔබට තවදුරටත් යේසුස්වහන්සේ යක්ෂ බලවේග සමග කටයුතු කළ බයිබලයේ සඳහන් සුවිශේෂී අවස්ථා ගැන උගත හැකිය.

## යක්ෂයන් ක්‍රියා කරන ආකාරය

ඔබ උගත් පරිදි දෙවියන්වහන්සේටත් උන්වහන්සේගේ සැලැස්මට පරමාර්ථයන්ට හා උන්වහන්සේගේ සෙනගට එරෙහි වීමට සාතන් යක්ෂයන්ව භාවිතා කරයි. එමෙන්ම නොඇදහිලිවතුන්ව ශුභාරංචි සත්‍යයෙන් ඈත් කර තැබීමටත් ඔහු යක්ෂයන් ක්‍රියාකරයි. යක්ෂයෝ සුවිශේෂී බලප්‍රදේශ (බල පරාක්‍රමයන්) පාලනය කරති. දානියෙල් 10:12-13හි සඳහන් පර්සියාවේ කුමාරයා ඊට නිදසුනකි. යක්ෂයා පෞරුෂත්ව තුළින්ද ස්ත්‍රීන් හා පුරුෂයන් තුළින්ද සාතන්ගේ අරමුණ ඉටු කිරීමට ක්‍රියා කරති.

සාතන්ගේ ප්‍රධාන අරමුණ දෙවියන්වහන්සේගේ කැමැත්තට එරෙහිව ක්‍රියා කිරීම වේ. "සාතන්" යන වචනයේ තේරුම "එදිරිකාරයා" යන්න වේ. සාතන් මූලිකවම දෙවියන්වහන්සේගේ සතුරා වන

අතර (යෝබ් 1:16; මතෙව් 13:39) දෙවනුව ඔහු මිනිසාගේ සතුරා වේ (සෙකරියා 3:1; 1 පේතෘස් 5:8).

ඔබ උගත් පරිදි යක්ෂයන්ට විවිධ ස්වභාවයන් ඇත. 1 රාජාවලිය 22:23හි සඳහන් පරිදි එක් යක්ෂයෙක් තමාවම "බොරුකාර ආත්මයක්" ලෙස හැඳින්වීය. මාක් 9:25හි ඇත්තේ "ගොළු බිහිරි" ආත්මයකි. විවිධාකාරයේ යක්ෂයන් බෙලහීන ආත්ම ලෙස දූෂ්‍ය කෙරෙන ආත්ම ලෙස හා අපවිත්‍ර ආත්ම ලෙස ක්‍රියා කරයි. සාතන් ඒවා මනුෂ්‍යයාගේ ශරීරය, ප්‍රාණය හා ආත්මයට එරෙහිව යුද වැදීමට භාවිත කරයි.

## බෙලහීන ආත්මය :

ඇදහිලිවතුන්ගේ මෙන්ම නොඇදහිලිවතුන්ගේ ශරීර වලටද මේ ආත්ම වලට බලපෑම් කළ හැකිය. ලූක් 13:10-17 කියවන්න. මෙම ස්ත්‍රියට පීඩා පැමිණියේ බෙලහීන ආත්මයකිනි. ඇය සබත් මෙහෙයන්ට සහභාගි වූ අතර යේසුස්වහන්සේ ඇය හැඳින්වූයේ "ආබ්‍රහම්ගේ දියණියක" ලෙසිනි. මෙම කරුණු දෙකෙන්ම පෙන්නුම් කෙරෙන්නේ ඇය ඇතැම්විට දෙවියන්වහන්සේගේ අනුගාමිකයකු බවය. එසේවුවද ඇය බෙලහීන ආත්මයකින් වසර දහඅටක් දුක් වින්දාය.

ශරීරයට පීඩා ඇති කරක යක්ෂ බලවේග පිළිබඳව තවත් උදාහරණ සඳහා මතෙව් 12:22; 17:15-18; ක්‍රියා 10:38; 2 කොරින්ති 12:7 බලන්න.

## දූෂ්‍ය කෙරෙන ආත්ම :

මෙම ආත්ම මිනිසාගේ ආත්මයට පීඩා ගෙනදෙන අතර ධර්මය පිළිබඳ බොරු විශ්වාස කිරීමට හා සදාතන දඬුවම සඳහා වැරදිකාරයෙකු වීමට ඔහුව දූෂ්‍ය කෙරේ. ඒවා ව්‍යාජ ධර්ම, ලබ්ධීන්, ව්‍යාජ ක්‍රිස්තුස් හා ව්‍යාජ ගුරුවරුන්ගේ ආත්ම වේ.

> **එහෙත් පසු කාලවලදී සමහරු මුළාකරවන ආත්මයන්ද යක්ෂයන්ගේ ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලිලෙස කියනසේක. (1 තිමෝති 4:1)**
>
> **මක්නිසාද ඔව්හු සර්ව පරාක්‍රමවූ දෙවියන්වහන්සේගේ මහත් දවසේ යුද්ධයට මුළු ලෝකයේ රජුන් රැස්කරන පිණිස ඔවුන් ළඟට යන්නාවූ හාස්කම් කරන්නාවූ යක්ෂයින්ගේ ආත්මයෝය. (එළිදරව් 16:14)**

සියලු බලය හා ලකුණු හා ව්‍යාජ ආශ්චර්යයන් හා සමග ඔහු පැමිණෙන්නේද සාතන්ගේ ක්‍රියා වලින් පසුව වේ.

> **ඔහුගේ ඊම සාතන්ගේ ක්‍රියාකිරීමේ හැටියට බොරුවූ සියලු ආකාර ආශ්චර්යවලින්ද ලකුණුවලින්ද පුදුමවලින්ද විනාශවෙන්නවුන්ට අධර්මිෂ්ඨකමේ සියලු රැවටිලි වලින්ද යුක්ත වේ. මක්නිසාද ගැළවෙන පිණිස ඔව්හු සැබෑකමට ප්‍රේම වීම පිළි නොගත්තෝය. (2 තෙසලෝනික 2:9-10)**

දූෂ්‍ය කෙරෙන ආත්ම වලට ක්‍රියා පොතේ සඳහන් "පේනකීමේ ආත්ම" ද ඇතුළත්ය.

> **අප යාච්ඤා කරන තැනට යද්දී, ශාස්ත්‍ර කියන ආත්මයක් ඇත්තාවූ පේනකීමෙන් බොහෝ ලාභ ඉපදෙවුවාවූ එක්තරා තරුණියක් අපට සම්බවූවාය. (ක්‍රියා 16:16)**

මෙවැනි පේනකීමේ ආත්ම හෙවත් "ආත්ම බන්ධන" ශාස්ත්‍රකාරයන්, මායාකාරයන්, මායාකාරියන් හා අත හා වීදුරුගෝලයද තේ කොළ භාවිතයෙන්ද ශාස්ත්‍ර කියන අය තුළින් ක්‍රියා කරයි. ශුද්ධ ලියවිල්ලට පටහැනිකුම මගින් පේන කීමේ ආත්ම අනාගතය ගැන පවසයි. නැතහොත් ස්වභාවිකව නොදන්නා දැනුම සොයාගනියි. ආත්ම බන්ධන වලට එරෙහි අනතුරු ඇඟවීම් ලෙවීකථාව19:31; 20:6; ද්විතිය කථාව 5:9; 18:10; ලෙවීකථාව 20:27 හා 1 සාමුවෙල් 28:3හි දී ඇත.

දූෂ්‍ය කිරීමේ ආත්ම හෘදය සාක්ෂිය දැඩිකරයි, මුළා කරයි, පොළඹවයි, පරීක්ෂා කරයි, සිත් ඇදගනියි, උද්යෝගිමත් කරයි, ආශාවන් ඇති කරයි, අවුස්සයි, ආකර්ශනය කරයි හා රවටයි.

“උස් ස්ථානවල දුෂ්ටකමේ ආත්ම” ඇතිකිරීමට දූෂ්‍ය කිරීමේ ආත්ම ක්‍රියා කරයි. සෑම ලබ්ධියකම හා වැරදි ධර්ම පවතින ස්ථානයකම මේවා පවතින අතර ක්‍රියාත්මක වේ.

සාතන් නමස්කාරයට ආශාකරන අතර ඔහුට එය ලබාගත හැකිඕනෑම ආකාරයකින් ලබාගනු ඇත. දූෂ්‍ය ආත්ම පිළිම හා සාතන්ම වුවද නමස්කාර කිරීමට ස්ත්‍රීන්ව හා පුරුෂයන්ව පොළඹවයි. ඔබ විසිවන පරිච්ඡේදයෙන් “උස් ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම” ගැන තවදුරටත් ඉගෙන ගන්නෙහිය.

## අපවිත්‍ර ආත්ම :

මෙම යක්ෂ බලවේග මිනිසාගේ ප්‍රාණය කෙරෙහි පීඩා ඇතිකරයි. ඒවා දුරාචාර ක්‍රියා, අපවිත්‍ර සිතිවිලි, පරීක්ෂාවන් හා මිනිසුන් හා ස්ත්‍රීන් බැඳ තැබීමට සාතන් භාවිත කරන අනෙකුත් උපක්‍රම සඳහා වගකිව යුතුය. සාතන් පුද්ගලයන්ව අපවිත්‍ර ආත්ම මගින් පාලනය කරන විට ඔහුට නිවෙස්, සභාවන් හා මුළු ජාතිය තුළම ක්‍රියා කළ හැකිය. මක්නිසාද ඒවා පුද්ගලයන්ගෙන් සමන්විත වන බැවිනි. සමාජ ව්‍යුහයේ විවිධ මට්ටම් වල සාතන් ක්‍රියා කරන්නේ මේ අයුරිනි. අපවිත්‍ර ආත්ම සඳහා උදාහරණ මතෙව් 10:1; 12:43 හා මාක් 1:23-26 බලන්න.

## පීඩාවන්, වසඟකරගැනීම්, හිමිකරගැනීම් :

දුෂ්ට ආත්ම වලට මිනිසුන්ට පීඩා කළ හැකිය. පීඩා ඇති කිරීම යනු පාගා දැමීම, විරුද්ධ වීම හෝ පිටතින් බැඳ තැබීම වේ. මේ පීඩා කිරීම් විවිධාකාර දුෂ්ටාත්ම හා බැඳී පවතී. ඒවා කනස්සලු ස්වභාවයක් ඇති කරන අතර ඍණාත්මක වාතාවරණ මවා පාමින් හා සිය දිවි නසාගැනීම, දුරාචාර, අවිශ්වාසය, බිය ආදී වැරදි සිතිවිලි මනසට ඇතුළු කරයි. යක්ෂයන්, සාතනික වාතාවරණ හා මිනිසා පාපයට පොළඹවන අවස්ථා නිර්මාණය කරති.

> **දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේපකළ බවත් දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසිරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

මිනිසුන්ට ආවේශවීමට යක්ෂයන්ට පුළුවන. යක්ෂාවේශ වීම යනු දුෂ්ටාත්ම (යක්ෂයන්) එකක් හෝ කිපයක් මනුෂ්‍යයාගේ ශරීරයේ වාසය කරමින් ඔහුගේ සම්පූර්ණ පාලනය ඔවුන් අතට ගැනීම වේ. සමහරුන් “යක්ෂාවේශ වීම“ වෙනුවට “යක්ෂයෙකු වාගේ“ යනුවෙන් භාවිත කිරීමට කැමතිවේ. කුමන වචනයක් භාවිත කළත් යක්ෂාවේශ වූ තැනැත්තා ඔහු තුළ පදිංචි යක්ෂයන්ට සත්කාර කරන තැනැත්තා වේ. “ආවේශවීම” යන්නෙන් තමාගේ පාප වලට තමා වග නොකියන බවක් අදහස් නොවේ. එම තත්වයට පැමිණීමට කරන ලද දේවල් සඳහා ඔහු වගකිව යුතුය.

ආවේශ වීම සිය කැමැත්තෙන්ම සිදු කළ හැකිය. උපවිෂ්ටයන් හැසිරවීමට, ශාපකිරීමට, මායාකාරියක වීමට, නැතහොත් වෙන කිසියම් අධිස්වභාවික බලයක් ලබාගැනීමට මිනිසෙකුට අවශ්‍ය විය හැකිය. අවේශවීම අකැමැත්තෙන්ද සිදුවිය හැකිය. ආවේශවීමට පුද්ගලයෙකු නොඉල්ලුවද ඔහුගේ පාපි සිතිවිලි, ක්‍රියා හෝ මායාකාරී දේ සමග සම්බන්ධ වීම නිසා අවේශවීම සිදුවිය හැකිය.

දෙමව්පියන් තුළ ක්‍රියා කරන යක්ෂ බලවේග වලට ඊලඟ පරම්පරාවට බලපෑම් ඇති කළ හැකි වේ (නික්මයාම 20:5; 34:7 හා ද්විතීය කථාව 5:9 බලන්න). යක්ෂාවේශවීම හෝ මාක් 7:24-30; හා 9:17-21හි සඳහන් ළමයින්ට පීඩා කිරීම් වැනි දේ හෝ මේවායින් සනාථ වේ.

යක්ෂයින්ට වසඟවීම යනුවෙන්ද දෙයක් ඇත. මෙය යක්ෂයන් ගැන උනන්දුවක් ඇති වීමෙන් හෝ ඔවුන් සමග කටයුතු කිරීමෙන් හෝ යම් පුද්ගලයෙකු වසඟවීමේ තත්වයකි. එය ගුප්ත දේවල්, යක්ෂයන් හා සාතන් ගැන අසාමාන්‍ය උනන්දුවක් ඇතිවීම වන අතර එමගින් ආශාවන් පාලනය කිරීම හා ඒකාධිපතියෙකු ලෙස ක්‍රියාකිරීම සිදුවිය හැකිය. එවැනි යක්ෂ බලවේග වලට වසඟ වීම තුළින් යක්ෂාවේශ විය හැකිය.

# ඇදහිලිවතුන්ට බලපෑම් ඇති කිරීමට යක්ෂයන්ට හැකිවේද?

ශුද්ධාත්මයාණන්වහන්සේට දුෂ්ට ආත්මයක් සමග එකම මාලිගාවේ වාසය කිරීමට නොහැකි බැවින් සැබෑ ඇදහිලිවන්තයෙකුට යක්ෂයෙකු ආවේශ විය නොහැකිය.

> **නොහොත් නුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබූ නුඹලා තුළ ඇත්තාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගාව බව නොදනිවුද? නුඹලා නුඹලාටම අයිති නැත: මක්නිසාද නුඹලා මිලේට ගනු ලැබුවහුය. එබැවින් නුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට ගෞරවකරපල්ලා. (1 කොරින්ති 6:19-20)**

ඔබ දෙවියන්වහන්සේට අයත් වූ විට හා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරුණු විට ඔබ සාතන්ට අයත් විය නොහැකි අතර එකම අවස්ථාවේ ඔහුගේ ආත්මයෙන්ද පිරී තිබිය නොහැකිය. සාතන් සමග එකම "මාලිගාවේ" ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩ නොසිටිනු ඇත.

එහෙත් යක්ෂ බලවේග වලින් ඇදහිලිවතුන්ට බලපෑම් ඇති නොවේ යයි මින් අදහස් නොකෙරේ. අප පොර බදන්නේ මෙම බල වලට විරුද්ධව වේ. අප කලින් සාකච්ඡා කළ ලක්ෂණ සහිත බාහිර බලපෑම් මගින් ඇදහිලිවතුන්ට පහර දීමට සාතන් යක්ෂ බලවේග භාවිතා කරයි. එහෙත් සැබෑ ඇදහිලියන්තයෙකුට ආවේශ වීම ඔහුට නොහැකිය. "ආවේශ වීම" යනු ඇතුළත විසීම වේ. "වසඟවීම" හෝ බැඳීම යන්නෙන් පෙන්නුම් කෙරෙන්නේ බාහිරින් පාලනය කිරීමක් වේ. ඇදහිලිවන්තයෙකුගේ ක්‍රියාකාරකම් යක්ෂ බලවේග මගින් බලපෑම් කිරීමට ඉඩ දුනහොත් සාතන් මගින් පාලනය කළ හැකිය. එවැනි බලපෑම් හෝ නපුරු බලවේග මගින් කෙරෙන බැඳ තැබීම් ඔවුන්ව දුෂ්ට පරමාර්ථ වලට භාවිත කිරීමට සාතන් ඉඩ දෙනු ඇත.

යේසුස්වහන්සේගේ ගෝලයෙකු වූ පේත්‍රුස් යේසුස්වහන්සේ මනුෂ්‍ය වර්ගයාගේ පාප වෙනුවෙන් දුක්විඳීම වැළැක්වීම සඳහා සාතන් විසින් යොදාගත් විට සිදුවූයේ මෙය වේ. යේසුස්වහන්සේ තමන්වහන්සේට විඳීමට සිදුවන දුක් ගැන පැවසූ විට පේත්‍රුස්තුමා මෙසේ පැවසිය.

> **එවිට පේත්‍රුස් උන්වහන්සේ කැඳවා තරවටු කරන්ට පටන්ගෙන: ස්වාමිනි, එය ඔබ කෙරෙන් දුරුවේවා. ඔබට කිසිකලෙකත් එසේ සිද්ධ නොවන්නේයයි කීවේය. (මතෙව් 16:22)**

එවිට යේසුස්වහන්සේ පේත්‍රුස්ට මෙසේ කීසේක.

> **නුමුත් උන්වහන්සේ හැරී පේත්‍රුස්ට කථාකොට: සාතන් මා පස්සට යට, නුඹ මට බාධාවක්ය. මක්නිසාද නුඹ මනුෂයයන්ගේ කාරණා මිස දෙවියන්වහන්සේගේ කාරණා කල්පනා කරන්නේ නැතැයි කීසේක. (මතෙව් 16:23)**

පේත්‍රුස් සාතන් බව යේසුස්වහන්සේ අදහස් කළේ නැත. ඒ මොහොතේ සාතන්ට තමා තුළින් ක්‍රියා කිරීමට පේත්‍රුස් ඉඩ දුන් බව උන්වහන්සේට හැඟී ගියසේක. ඔහු යක්ෂාවේශව සිටියේ නැත. එහෙත් සාතනික ආත්මයට තමා කෙරෙහි බලපෑම් ඇතිකිරීමට ඔහු ඉඩ දුන්නේය.

> **යක්ෂයාට ඉඩ නොදෙල්ලා. (එපීස 4:27)**

යම් පුද්ගලයෙකු නැවත ඉපදුන විට ඔහුගේ නම ස්වර්ගයේ ඇති විශේෂ පොතක් වන ජීවන පොතේ ලියනු ඇත. සදාතනය සඳහා ස්වර්ගයේ ජීවත් වන්නේ මේ පොතේ නම ඇති අය පමණි.

> **යමෙකුගේ නම ජීවන පොතෙහි ලියා නැති බව සම්බවීද ඔහු ගිනි විලට හෙළනු ලැබුවේය. (එළිදරව් 20:15)**

ජීවන පොතේ ඔබේ නම තිබිය හැකිය. එහෙත් පාපී ජීවිතයක් ගතකිරීමට ඔබ නැවත හැරී ආ නිසා ඔබේ නම එම පොතෙන් මකා දැමිය හැකිය.

> **ජයගන්නා නම් මෙසේ සුදු වස්ත්‍රයෙන් පළඳවනු ලැබේ: ඔහුගේ නම ජීවන-පොතෙන් කිසිසේත් මකා නොහැර, මාගේ පියාණන්වහන්සේද උන්වහන්සේගේ දූතයන්ද ඉදිරියෙහි ඔහුගේ නාමය පිළිගන්නෙමි. (එළිදරව් 3:5)**

ඇදහිලිවන්තයෙකු පාපොච්චාරණය නොකළ පාපයේ දිගටම ඇලී සිටියාහොත් ඔහු කිතුනුවෙකු නොවන අවස්ථාවක් පැමිණෙනු ඇත. ප්‍රේරිතවූ පාවුල්තුමා තමා අන් අයට දේශනා කළ පසුත් තමාව "පිටතට දමනු ඇතැයි" යන හැඟීමක් ඔහුට තිබිණි.

> **නුමුත් මාගේ ශරීරය දමනය කර වාල්කමට පමුණුවමි. එසේ කරන්නේ අනුන්ට දේශනාකළාට පසු කොයි ලෙසකින්වත් මා එපාකරනු නොලබන පිණිසය.** (1 කොරින්ති 9:27)

පාපය, විශේෂයෙන්ම පාපොච්චාරණය නොකළ දිගටම ඇලී සිටින මාංසයේ පාපය නිසා තමා අන් අයට දේශනා කළද තමාගේම ආත්මය නැති විය හැකි බව පාවුල්තුමා දැනගත්තේය.

දිගටම පාපයේ ජීවත්වීම නිසා අවසානයේදී ඔබ පසුබැස්සාවූ කෙනෙකු බවට පත්විය හැකිය. මින් අදහස් වන්නේ ඔබ තවදුරටත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ අනුගාමිකයෙකු නොවන බවය. ඔබ දන්නා හා පාපොච්චාරණය නොකළ පාපයේ දිගටම ඇලී සිටියහොත් ඔබ යේසුස්වහන්සේගේ අනුගාමිකයෙකු බවින් ඉවත් වී නැවතත් සාතන්ගේ රාජ්‍යයේ කොටස්කරුවන් වූයේ කවදාද යන්න කිසි කෙනෙකුට කිව නොහැකි වේ. එය තීරණය කරන්නේ දෙවියන්වහන්සේය. එහෙත් එය සිදුවූ විට ඔබ සතුරාගේ ප්‍රහාර වලට විවෘතය. ඇතැම්විට යක්ෂාවේශ වුවද විය හැකිය. පාපයක් කළ විට එවේලෙහිම එය පාපොච්චාරණය කර අධර්මිෂ්ඨකමින් ඉවත්වීම වැදගත් වන්නේ එබැවිනි.

> **අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක. අපි පව්කළේ නැතැයි කියමු නම්, අපි උන්වහන්සේ බොරුකාරයෙක් කරමුව, උන්වහන්සේගේ වචනද අප තුළ නැත.**
> (1 යොහන් 1:9-10)

ශුභාරංචියේ බොහෝ තැන්වල යේසුස්වහන්සේ දේව වචනය ලෙස හැඳින්වේ. දේව වචනය ඔබ තුළ ජීවත් නොවන්නේනම්, යේසුස්වහන්සේද ඔබ තුළ ජීවත් නොවේ.

## යක්ෂයන් පාලනය ලබාගන්නා ආකාරය

යක්ෂයන් විවිධාකාරයෙන් පාලනය ලබාගනී.

1. **පරම්පරාවන් තුළින්:** යම් පුද්ගලයෙකුගේ දෙමවුපියන් යක්ෂයා විසින් පීඩාවට පත් කළ නිසා හෝ ඔවුන්ට ආවේශ වී සිටි නිසා එම පුද්ගලයාද යක්ෂයන් මගින් පීඩාවට පත්විය හැකිය. නැතහොත් යක්ෂාවේශ විය හැකිය. දරුවන් කෙරෙහි යක්ෂයන්ගේ බලපෑම මෙමගින් පැහැදිලි වේ (නික්මයාම 20:5; 34:7; ද්විතිය කථාව 5:9).

2. **මනස තුළින් :** මනස, සාතන්ගේ එක් ප්‍රධාන යුද භූමියක් වේ. සාතන්ට ඔබගේ සිතිවිලි පාලනය කළ හැකි නම් අවසානයේ ඔබේ ක්‍රියාවන්ද පාලනය කරනු ඇත. මනස පාලනය කිරීමට නොහැකි වීම නිසා අවසානයේදී අධිෂ්ඨානය භාවිත කළ නොහැකි වේ. මේ නිසා පාපතර ක්‍රියාවල නියැලෙනු ඇත. පාපි සිතිවිලි වල හා ක්‍රියා වල අඛණ්ඩව යෙදීම නිසා අවසානයේදී පීඩා තුළින් ආවේශ වීමටත් ඉන්පසු රෝම 1 විස්තර කර ඇති පරිදි ශාපලත් මනසකටත් යොමු විය හැකිය. මෙම මනස සම්පූර්ණයෙන්ම නපුරු සිතිවිලි මගින් පාලනය කරනු ලබන මනසක් වේ.

මනස වෙනස් කරන්නාවූ මත්ද්‍රව්‍ය තුළින්ද ප්‍රවේශ වීමට යක්ෂයෝ ක්‍රියා කරති. එතුළින් යක්ෂයන්ට විරුද්ධව සිටීමේ හැකියාව අඩුවන අතර ඔවුන්ට වැඩි වැඩියෙන් ඇතුළු වීමට හැකි වේ. "මනස සේදීමේ" හෝ "මනස පාලනය කිරීමේ" ඉගැන්වීම් මගින්ද ඇතුළු වීමේ මාර්ගයක් ඔවුන්ට ලැබේ.

3. **පාපි ක්‍රියාවන් මගින් :** පාපි සිතිවිලි පාපි ක්‍රියා බවට පත්වේ. නිදසුනක් ලෙස කාමමිථ්‍යාචාර සිතිවිලි කාමමිථ්‍යාචාර ක්‍රියාවන් මගින් අවසන් වේ. පාපය කැරලිකාරී වේ. එමෙන්ම කැරලිකාරී සිතිවිලි හා ක්‍රියා යක්ෂයන්ගේ ක්‍රියාවන්ට ඇතුළුවීමේ මාර්ගයක් සපයයි.

ඇදහිලිවන්තයෙක් නිරන්තරයෙන්ම පාපි සිතිවිලි හා ක්‍රියාවන් වල නියැලුනු විට ඒවා යක්ෂයාට "ඉඩක් දෙන්නේය" (එපීස 4:27). සතුරාට ක්‍රියා කිරීම සඳහා වඩ වඩාත් ආත්මික ඉඩ දෙනු ලැබේ. මායාකාරී ක්‍රියා, සාහිත්‍යය, මළවුන් සමග කතා කිරීම් ආදී දේ සමග ඇති පාපි සබඳතා භයානක හා යක්ෂ බලවේග ආකර්ශනය කෙරෙන ක්‍රියාවන් වේ.

පාපය සමග ජීවත්වන නොඇදහිලිවන්තයෙකු යක්ෂ බලවේග වල පීඩාවන්ට පමණක් නොව ආවේගවීම් වලටද විවෘතය. ඔබ උගත් පරිදි ආත්මික සටනට පක්ෂග්‍රාහී නොවන භූමියක් නැත. ඔබ යහපතේ හෝ නපුරේ හෝ පැත්තෙහි වේ. ඔබ යේසුස්වහන්සේට හෝ යක්ෂයාට හෝ අයත්ය. ඔබ සාතන්ට අයත් නම්, හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අලුත් ඉපදීම අත්දැක නොමැතිනම්, එවිට ඔබ යක්ෂයාගේ වන අතර ඔබව භාවිතා කිරීමට, පීඩා කිරීමට හෝ ආවේශ වීමට යක්ෂයාගේ කැමැත්ත පරිදි ඔහුට පුළුවන.

4. **ආශාවන් තුලින් :** ඇතැම් අය යක්ෂයන්ගේ බලවේග මගින් පාලනය වීමට කැමති අතර සාතන්ගෙන් එසේ වීමට ඉල්ලා සිටියි. ඔවුන් මෙසේ කරන්නේ අධිස්වභාවික බලයක් ලබාගැනීමට හා අධිස්වභාවිකව ක්‍රියා කිරීමට වේ.

5. **හිස් "නිවෙසක්" තුලින් :** යක්ෂයන් තමන් වාසය කරන ශරීරය ඔවුන්ගේ නිවෙස ලෙස සලකති (මතෙව් 12:44). යක්ෂ බලවේග මගින් නිදහස් වූ පුද්ගලයෙකු ඔහුගේ ආත්මික නිවෙස ගැලවීමේ අත්දැකීම් හා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පුරවා නොගත්විට යක්ෂයන් නැවත ඇතුළු වනු ඇත.

6. **අවසරදීම තුලින් :** ඇතැම්විට දෙවියන්වහන්සේ විශේෂ අභිප්‍රායන් ඉටු කිරීම උදෙසා යක්ෂ බලවේග වලට ක්‍රියා කිරීමට අවසර දෙනසේක. මෙය යෝබ්ගේ කතාවේ මෙන් ඇදහිලිවතුන් පරීක්ෂා කිරීමට විය හැකිය. එමෙන්ම සාවුල් රජතුමාගේ සිද්ධියේදී මෙන් විනිශ්චය සඳහා විය හැකිය.

## යක්ෂ බලවේග සමග ක්‍රියා කල යුත්තේ කවුරුන්ද?

යක්ෂ බලවේග සමග කටයුතු කිරීම සඳහා නිලයක් සහිත දේවසේවකයෙකු වීම අවශ්‍ය නැත. යක්ෂ බලවේග පරාජය කිරීමේ හැකියාව සියලුම ඇදහිලිවතුන්ට ඇති බව යේසුස්වහන්සේ පැවසූසේක.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම් : ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයින් දුරුකරන්නෝය: අන් භාෂාවලින් කථා කරන්නෝය: සර්පයන් අල්ලාගන්නෝය. (මාක් 16:17)**

යක්ෂ බලවේග සමග කටයුතු කිරීමේ හැකියාව යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට දී ඇත. උන්වහන්සේ පළමුවෙන් ඒ හැකියාව සිය ගෝලයන්ට දුන්සේක.

> **තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරුකරන්ට ඔවුන් කෙරෙහිද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුවකිරීමටද ඔවුන්ට බලය දුන්සේක. (මතෙව් 10:1)**
>
> **එකල උන්වහන්සේ දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙන දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන, අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලය දී ... (මාක් 6:7)**

උන්වහන්සේ මේ බලය සියලුම ඇදහිලිවතුන්ට පැවරූසේක.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම් : ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයින් දුරුකරන්නෝය: අන් භාෂාවලින් කථා කරන්නෝය: සර්පයන් අල්ලාගන්නෝය. (මාක් 16:17)**
>
> **... මළවුන් නැගුටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍ර කරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා, නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:8)**

මෙම වැදගත් මෙහෙය එක් විශේෂිත කණ්ඩායමකට පමණක් සීමා කළ බව විශ්වාස කිරීමට බයිබලිය පදනමක් නැත. සමාරියේදී දුෂ්ටාත්ම පලවා හැරීමට දෙවියන්වහන්සේ පිලිප් නමැති ගිහියෙකු පාවිච්චි කළසේක (ක්‍රියා 8). එහෙත් ඇදහිලිවතුන් සුදුසු පදනමක් නැතිව ස්කේවාගේ පුත්‍රයන් කල පරිදි යක්ෂ බලවේග හමුවට යා යුතුය යයි මින් අදහස් නොකෙරේ (ක්‍රියා 19).

එමෙන්ම යක්ෂයන් ගැන ඇදහිලිවන්තයන් ඕනෑවට වඩා සැලකිලිමත් නොවීමද වැදගත්ය. අප කැඳවා ඇත්තේ යක්ෂයන් විශාල කර සැලකීමට නොවේ. "යක්ෂයන් පලවා හැරීම" සඳහා ආත්මික දීමනාවක් නැත. එහෙත් ඔබ යක්ෂ බලවේගවලට බිය විය යුතු නැත. යක්ෂයන්ගේ බලපෑම් වලට භාජනය වූවන් ඔබට මුණ ගැසුන විට ඔවුන්ට දෙවියන්වහන්සේගෙන් නිදහස ගෙන ඒමට ඔබට හැකිවිය යුතුය.

## යක්ෂයන් සිටින්නේදැයි සොයාගැනීම

යක්ෂයන්ගේ බලවේග පරාජය කිරීමට ඔවුන් සිටින බවත් ඔවුන්ගේ උපක්‍රමත් දැනගැනීම වැදගත්ය. මේ සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ විශේෂ ආත්මික දීමනාවක් දී තිබේ. මේ දීමනාව "ආත්මවල් විමසීම" (1 කොරින්ති 12:10) ලෙස හැඳින්වේ.

විමසීම යනු "සොයාගැනීම, ඇගයීම හා වෙනස සොයාගැනීම" වේ. ආත්ම විමසීමේ දීමනාව මගින් ඇදහිලිවන්තයෙකුට අන් අය තුළ ක්‍රියා කරන ආත්ම විමසිය හැකිය. එමගින් නපුරු ආත්ම සොයාගැනීමටත් ඇගයීමටත් හඳුනාගැනීමටත් හැකිවනු ඇත.

යක්ෂ බලවේග සමග කටයුතු කරන විට ආත්ම විමසීමේ දීමනාව වැදගත් වේ. එමගින් එවෙලෙහිම යම් පුද්ගලයෙකු තුළ හෝ ඔහුට එරෙහිව හෝ නපුරු ආත්මයක් ක්‍රියා කරන්නේද යන්න විමසා බැලිය හැකිය. එමගින් බොරු කියන ආත්ම මගින් කෙරෙන රැවටීම් හා දූෂ්‍ය කිරීම් වැළැක්වීමට පුළුවන.

නිදසුනක් වශයෙන් ඇතැම් බිහිරිවීම් හා ගොළුවීම් (බයිබලීය වාර්තා අනුව) ඇතිවන්නේ ආත්මයන් නිසාය. අනෙකුත් බිහිරිවීම් හා ගොළුවීම් අනතුරක් හෝ අසනීපයක් තුළින් වේ. මෙසේ විමසීම තුළින් අවශ්‍ය සේවාව ඉටු කිරීමට වේ.

මෙම ආත්ම විමසීමේ විශේෂිත දීමනාව සෑම ඇදහිලිවන්තයෙකුටම නැත. මෙම දීමනාව යම් ඇදහිලිවන්තයෙකුට නොමැති නම් යක්ෂයන් සිටින බව නිරීක්ෂණය කිරීමට වෙනත් ලකුණු තිබේ. තම දියණියගේ අශුද්ධ ආත්මය පලවා හරින ලෙස කානානිය ස්ත්‍රියක යේසුස්වහන්සේගෙන් ඉල්ලා සිටි විට ඇය පැවසුවේ "මාගේ දුව බලවත් ලෙස යක්ෂාවේශව සිටින්නිය" යනුවෙනි (මතෙව් 15:22). ඇය මෙය දැනගත්තේ කෙසේද? ඇය දැනගත්තේ රෝග ලක්ෂණ මගිනි. යක්ෂාත්ම යම් පුද්ගලයෙකුට කරන දේ නිරීක්ෂණය කිරීමෙන් යක්ෂාත්මයක් ඇද්දැයි සොයාගත හැකිය.

යක්ෂයන්ගේ ක්‍රියා වල ලක්ෂණ කිපයක් පහත දැක්වේ:

**යක්ෂයෙකුට වසඟ වී ඇත්දැයි** හැඳිනගත හැක්කේ අසාමාන්‍ය ලෙස හා පාලනය කළ නොහැකි ලෙස යක්ෂයන් කෙරෙහිද සාතන් කෙරෙහිද ගුප්ත දේ කෙරෙහිද සිත යොමු කිරීම විය හැකිය. මෙවැනි පුද්ගලයෙකු ගුප්ත දේ පුහුණු කිරීම, සෑම දෙයකම ප්‍රශංසාව සාතන්ට හෝ යක්ෂයන්ට දීම නැතහොත් යක්ෂයන් හා සාතන් ගැන ඉගෙනීමේ යෙදී සිටීම කරනු ඇත.

**යක්ෂයන්ගෙන් සිදුවන පීඩාව** පහත දැක්වෙන ලකුණු වලින් හඳුනාගත හැකිය.

1. ශාරීරික බන්ධනයක්: යේසුස්වහන්සේ කුදු බවේ ආත්මයෙන් නිදහස් කළ "ආබ්‍රහම්ගේ දුව" ශාරීරිකව බැඳ සිටියෙකි. ලූක් 13:10-17 බලන්න. නිදන්ගත රෝග යක්ෂයාගේ පීඩාව නිසා ඇතිවිය හැකිය. සියලු රෝග යක්ෂ බලවේග වලින් ඇති වූ ඒවා නොවේ. සමහර රෝග නියම ආකාරයෙන් ආහාර නොගැනීම හෝ අපිරිසිදු ජලය පානය කිරීම වැනි ස්වභාවික නීති කඩ කිරීම නිසා ඇති වන්නේය. සමහර රෝග වලට හේතුව දඬුවමක් වේ. දෙවියන්වහන්සේ මහිමාන්විතයට පත් නොකළ එක රජ කෙනෙක් බඩවැලෙහි රෝග සෑදී මරුමුවට පත්විය.

2. මානසික පීඩාවක්: මනසේ හා සිතුවිලි වල ඇති වන , වියවුල, අවිශ්වාසය, අමතක වීම අනෙක් අයට සවන් දීමට අකමැති වීම, යුක්ති සහගත දේ පිළි නොගැනීම, අසාමාන්‍ය ආකාරයෙන් කතා කිරීම ආදිය දැකිය හැකිය. සියලුම මානසික ප්‍රශ්න සාතන් නිසා ඇති නොවේ. අධෛර්යවීම, කනස්සල්ල ආදි දේ ඇතැම් ආහාර ගැනීම නිසා හෝ මනසෙහි යම් අසමබරතාවක් නිසා හෝ ඇතිවිය හැකිය. යක්ෂ බලවේග වලින් හා වෙනත් දේ මගින් ඇතිවන මානසික ගැටළු සුව කිරීමට දෙවියන්වහන්සේට පුළුවන. එහෙත් සියලු මානසික ගැටළු හෝ රෝග යක්ෂාත්ම නිසා ඇතිවූ බවට තීරණය නොකිරීමට වගබලා ගත යුතුය.

ඇතැම්විට ආහාර වර්ග වෙනස් කිරීම මගින් හෝ ජීවන රටාව වෙනස් කිරීමෙන් භෞතික හේතුවක් නිසා පැන නැගි ඇති ගැටළු විසඳා ගැනීමට හැකි වනු ඇත.

3. සිතෙහි හැඟීම් පිළිබඳ ගැටළු : අමනාපවීම්, වෛරය, කෝපය, බිය, ඊර්ෂ්‍යාව, කරදර, අවමානය, තමා ගැනම අනුකම්පා සිතීම ආදී හැඟීම් පිළිබඳ කැළඹීම් තිබිය හැකිය.

4. ආත්මික ගැටළු : පාපිෂ්ට පුරුදු ඇතුළුව පාපය පරාජය කිරීමට ඇති අපහසුතාවය, ගැටළුවලට ආත්මික විසඳීමක් ප්‍රතික්ෂේප කිරීම, ඕනෑම වර්ගයක ධර්මය පිළිබඳ වැරදි වලට හෝ රැවටීම් වලට හෝ විවිධ ලබ්ධිවල සාහිත්‍යය වලට හෝ වස්තූන් වලට බන්ධනය විම, අන්තර්ගත විය හැකිය.

5. වාතාවරණයන් : පීඩා සහිත වාතාවරණ යක්ෂයන්ට නිර්මාණය කළ හැකිය. සාමාන්‍යයෙන් එවැනි වාතාවරණ නිසා වියවුල් බවක් ඇතිවේ. දෙවියන්වහන්සේ වියවුලේ කර්තෘ නොවන බැවින් (1 කොරින්ති 14:33; යාකොබ් 3:16) එය යක්ෂයාගේ ක්‍රියාවක් බව හඳුනාගත හැකිය.

පහත දැක්වෙන ලකුණු මගින් **යක්ෂාවේශවීම** හඳුනාගත හැකිය:

1. අපවිත්‍ර ආත්මයක් පදිංචි සිටීම : මූලික සදාචාරාත්මක අපවිත්‍රකම් මගින් මෙය ප්‍රදර්ශනය කෙරෙනු ඇත. නිර්වස්ත්‍රව ඇවිදීමට ආශාවක් ඇතිවීම වැනිදේ මීට අන්තර්ගත විය හැකිය. නිදසුන් සඳහා මාක් 5:2; ලූක් 8:27 බලන්න.

2. අසාමාන්‍ය ශාරීරික ශක්තිය : සාමාන්‍ය මිනිසෙකුට වඩා ශක්තියක් පෙන්වීම. නිදසුන් සඳහා මාක් 5:3 හා ලූක් 8:29 බලන්න.

3. බලවත් කෝපය : කටින් පෙන දැමීම වැනි දේ දැකිය හැකිය. මාක් 9:14-29 හා ලූක් 8:26-39 බලන්න.

4. ආත්මික දේවලට ප්‍රතිරෝධයක් දැක්වීම : මාක් 6:7 හා 1:21-28හි ඇති වාර්තා වල සඳහන් පරිදි යක්ෂයෝ සැනෙකින් යේසුස්වහන්සේව දැනගෙන ඔවුන් වෙතින් ඉවත්වෙන ලෙස ඉල්ලුවෝය. යේසුස්වහන්සේගේ නමට, යාච්ඤාවට, දේව වචනයට බියවීම හා දේව අපහාසය ආදිය යක්ෂාවේශවීමේ සලකුණු වේ. ආත්මික දේ සඳහන් කරන විට බොහෝ සේ දේව අපහාස කිරීම හා ශරීරික අසාමාන්‍ය හැසිරීම් වැනි දේ දැකිය හැකිය.

5. පෞරුෂත්වයේ හා / හෝ හඬෙහි වෙනස්වීම් : සාමාන්‍යයෙන් ලජ්ජා සහිත කෙනෙක් එක්වරම චණ්ඩි ලෙස හැසිරීමට පටන් ගනී. ක්‍රියාවන් මෙන්ම පෙනුමද වෙනස් විය හැකිය. සදාචාරාත්මක ගතිගුණ හා බුද්ධියද වෙනස් විය හැකිය. හඬද වෙනස් වීමට ඉඩ තිබේ. මාක් 5:9 බලන්න.

6. ශාරීරික පීඩාවන් තිබීම : යක්ෂාවේශ වූ විට බොහෝ අවස්ථාවන්වල මානසික පීඩාවට පත්වූ බවක් හෝ ස්නායු පද්ධතියට බලපෑමක් වූ බවක් පෙනෙනු ඇත (මතෙව් 9:33; 12:22; මාක් 5:4-5 බලන්න). එමෙන්ම ශරීරයේ ක්ෂයවීමක්ද දැකිය හැකි වනු ඇත (මාක් 9:14-29 බලන්න).

7. තමාම ශරීරයේ තුවාල ඇතිකරගැනීම : ගින්නට පනින පුත්‍රයෙකු සිටි මිනිසෙකු පිළිබඳ කතාවක් මතෙව් 17:14-21හි ඇත. ලූක් 8:26-39හි සඳහන් පරිදි මේ මිනිසා ගලකින් තමාවම කපාගෙන තුවාල ඇති කරගත්තේය.

8. දැඩි වේදනාවට පත්වීම : මේ මිනිසා ඔහුගේ ආවේශවීම නිසා අභ්‍යන්තරයේ ඇති හිරිහැර හේතුකොටගෙන අඬමින් එහෙ මෙහෙ ගිය බව ලූක් 8:28හි සඳහන් වේ.

9. සාමාන්‍ය ජීවිතයක් ගතකිරීමට නොහැකිවීම : මෙම මිනිසාට සමාජයේ ජීවත් වීමට නොහැකි වූ අතර ඔහු සොහොන් ගෙවල්හි විසුවේය. ලූක් 8:27 බලන්න.

10. ශුද්ධ ලියවිල්ලට අනුකූල නොවන ක්‍රම මගින් අනාගතය කීමේ හැකියාව හෝ නොදන්නා දේ සොයාගැනීමේ හැකියාව ලැබීම. ක්‍රියා 16:16හි සඳහන් ස්ත්‍රිය ජේන කීමේ ආත්මයකින් "ආවේශ වී" සිටියාය.

පහත දැක්වෙන දේ වලින්ද යක්ෂයන්ගෙන් පීඩා විඳීම, ආවේශවීම හා වසඟවීම පෙන්වනු ලැබේ.

1. අසභ්‍ය සාහිත්‍යය, කාමමිථ්‍යාචාරය, වෛශ්‍යාකම, අතින් පිරිමැදීමෙන් ලිංගික තෘප්තිය ලබා ගැනීම, සමලිංගිකතාව වැනි නොයෙකුත් ලිංගික පාප වල ගැලී සිටීමෙන් සදාචාරාත්මක නොවන දේට වසඟ විය හැකිය. එමෙන්ම අසාමාන්‍ය ලෙස ආහාර ගැනීම, සිය දිවි නසාගැනීම, අත් පා කපාගැනීම් හා මිනී මැරීම් ආදියට බලවත් ලෙස පෙළඹිය හැකිය.

2. මත්ද්‍රව්‍ය හා මත්පැන්වලට ඇබ්බැහිවීම.

3. සැබෑ දෙවියන්ගෙන් නොවන හා උන්වහන්සේ කෙරෙහි අවධානය යොමු නොකරන ආවේගවීම්, දර්ශන හා භාවනාවන් මගින්.

4. බිය, කංසාව, වෛරය, කෝපය, ඊර්ෂ්‍යාව, කේලම්කීම, අහංකාරය, තිත්තකම, ඍණාත්මක භාවය හා විවේචනය වැනි දේ හා බැඳීම.

## යක්ෂයන් සමග කටයුතු කෙරෙන ප්‍රති උපක්‍රම

යක්ෂ බලවේග සමග කටයුතු කළ හැකි ශුද්ධලියවිල්ලට අදාළ උපක්‍රම සමහරක් පහත දැක්වේ.

### තමා තුළම පෙර සූදානම :

දේව වචනයට සුවිශේෂී හෙවත් "රේමා" වචනයට සවන් දීමෙන් ඇදහිල්ල ලැබේ. නව ආකල්පයක් ඇතිව නව ගිවිසුම කියවීම තුළින් ඔබගේම සිත තුළ ඇදහිල්ල ගොඩ නැගීම ආරම්භ කරන්න.

- යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට කිරීමට පැවසූ දෙය ඔබද කරන්න.
- උන්වහන්සේ කරන බවට උන්වහන්සේ පැවසූ දෙය උන්වහන්සේ කරන බව විශ්වාස කරන්න.
- සාතන් මගින් දුකට පත් කළ අය ගැළවීමට ඔබට පුළුවන් බව උන්වහන්සේ පැවසුසේක් නම්, ඔවුන්ගේ ගැළවීම බලාපොරොත්තුවන්න.
- උන්වහන්සේ යක්ෂයන් පලවාහැරීමට ඔබට පැවසුසේක්නම්, උන්වහන්සේගේ නාමයෙන් එසේ කරන්න. එමෙන්ම ඔවුන් ඔබට කීකරු වන බවට බලාපොරොත්තුවන්න.

මනුෂ්‍යයාගේ සියලු ඉගැන්වීම් හා ඔබගේ අත්දැකීම් නොසලකා හරින්න. නව ගිවිසුමෙන් පවසන දෙය ඒ ආකාරයෙන්ම පිළිගන්න. එය සත්‍ය බව පිළිගෙන ඒ අනුව ක්‍රියාකරන්න. ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ තානාපතියෙක් වේ (2 කොරින්ති 5:20). තානාපතිවරයෙක් තමා නියෝජනය කරන රට තම වචනය තහවුරු නොකරන බවට සැක නොසිතයි.

ගැළවීමේ සේවයේ යෙදීමට පෙර නිරාහාර සිට යාච්ඤා කරන්න. ගැළවීම සඳහා බලය හා ආධිපත්‍යය ලැබෙන්නේ දෙවියන්වහන්සේගෙන් බැවින් සෑමවිට ඒ හා බැඳී සිටීම අවශ්‍යය. ඇතැම් යක්ෂයන් පලවා හැරිය හැක්කේ නිරාහාරව සිටීමෙන් හා යාච්ඤා කිරීමෙන් පමණි. අන් අය වෙනුවෙන් කෙරෙන සේවය කෙරෙහි අවධානය යොමු කෙරෙන නිරාහාර යාච්ඤාට දෙවියන්වහන්සේ ගෞරව කරන බව යෙසායා 58න් අපට උගන්වයි.

### අන් අය තුළ ඇති පෙර සූදානම :

හැකි සෑම අවස්ථාවකම යක්ෂයන් බඳින විට හා පලවා හරින විට ඇදහිලිවන්තයන් කණ්ඩායමක් යොදාගැනීම කළ යුතු වේ. යේසුස්වහන්සේ මේ සේවය උදෙසා තම ගෝලයන් පිටත් කර හැරියේ ජෝඩු වශයෙනි.

**එකල උන්වහන්සේ දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙන දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන, අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලය දී ... (මාක් 6:7)**

යක්ෂ බලපෑම් ඇති අයට තනිවම සේවය කළ නොහැකි බවක් මින් අදහස් නොකෙරේ. එහෙත් තවත් ඇදහිලිවන්තයෙකු ඇති විට යාච්ඤාවේ එකමුතුකමෙහි ශක්තියක් තිබේ. ශක්තිය ලැබෙන්නේ එකමුතුකමෙන් බැවින් ගැළවීමේ සේවයේ යෙදෙන පිණිස ඔබ සමග එක්වෙන අයද ඔබ මෙන්ම නිරාහාරව සිටීමට හා යාච්ඤා කිරීමට එකඟ විය යුතුය.

පීඩාවන් හා වසඟවීම් ඇති විට (කනස්සලු ස්වභාවය, යක්ෂයන් නිසා වැළඳෙන ලෙඩ රෝග ආදිය) සේවය ලබන පුද්ගලයාව සූදානම් කරවන්න. ගැළවීම පිළිබඳ “රේමා” වචනය තුළින් ඔවුන්ගේ ඇදහිල්ල ගොඩනගා ගැනීම අවශ්‍යය (ආවේගවීම් වලදී මෙය කළ නොහැකි විය හැකිය).

සුදුසු උපදෙස් නොමැතිව යක්ෂ බලපෑම් ඇති අය වෙනුවෙන් යාච්ඤා කිරීමට ඔබ උත්සාහ කළහොත් එය ගැළවීම නොලද අය යේසුස්වහන්සේව උන්වහන්සේ කවරෙක්දැයි නොදැන පිළිගැනීමට හා ඔවුන්ගේ පාප හා ගැළවීමේ අවශ්‍යතාව හඳුනා නොගෙන ගැළවීම ලබන පිණිස දිරිමත් කිරීම වැනිය. ශුභාරංචිය බෙදාගන්නා විට ආත්ම දිනාගන්නා ඥාණවන්තයෙක් නම් ඉක්මන් තීරණයක් සඳහා බලනොකරයි. ඊට පෙර කළ යුතු සේවයක් ඇත. සුදුසු උපදෙස් දිය යුතුය.

මිදීම පිළිබඳවද මෙය සත්‍යයකි. ඇතැම්විට එවැනි උපදෙස් නොමැතිව දෙවියන්වහන්සේ පුද්ගලයන් ගළවයි. එහෙත් මිදීමේ සේවය තුළදී දේව වචනය නිර්දේශ කර ඇති සියලු මාර්ග භාවිතා කිරීම වැදගත්ය. දෙවියන්වහන්සේගේ බලය ලබාදීමේ එක් මාර්ගයක් ඇදහිල්ල වේ. එය දේව වචනයට සවන් දීමෙන් ලැබෙන නිසා, උපදෙස් වැදගත් වේ. යේසුස්වහන්සේ දේශනා කිරීම හා ඉගැන්වීම, සුවකිරීම හා මිදීම සමග සම්බන්ධ කළ අතර උන්වහන්සේගේ අනුගාමිකයන්ටද එසේ කිරීමට උපදෙස් දුන්සේක.

## සේවය කිරීමේ ස්ථානය :

යක්ෂ බලවේග වලින් පීඩා විඳින අය මුදවා ගැනීම සඳහා සාමාන්‍ය දේව මෙහෙය තුළදී කොටසක් වෙන් කළ හැකිය. එවැනි සේවයක් පුද්ගලිකවම කළ යුතු නැත. එය සභාවේ කළ යුතු සේවයක් වේ.

යේසුස්වහන්සේ යක්ෂාවේශවූවන්ට සේවය කළේ සාමාන්‍ය දේව මෙහෙයේදීය (මාක් 1:21-25). කෙසේවුවද යක්ෂ බලවේග වෙනුවෙන් කටයුතු කිරීමට සාමාන්‍ය දේව මෙහෙයක් එනතෙක් බලා සිටිය යුතු නැත. යේසුස්වහන්සේ මිදීම ගෙන එන ලද්දේ ඒවා හමුවූ අවස්ථාවේදීමය.

## සේවය කරන වේලාව :

මිදීම සඳහා ඔබ සේවය කිරීමට සූදානම් වූ විට :

## 1. නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙන් ආරම්භ කරන්න.

අප උන්වහන්සේ වෙතට ළඟ වන්නේ ( මිදීම හා සුවකිරීම ඇතිවිට) නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙනි. මිදීම යාච්ඤාව නොමැතිව වුවද නමස්කාරය හා ප්‍රශංසාව තුළින් ලබාගත හැකිය. ඊට හේතුව උන්වහන්සේගේ සෙනඟ ප්‍රශංසා කරන ස්ථානවල උන්වහන්සේ වැඩ සිටිනි බැවිනි. උන්වහන්සේ සුව කිරීමටද මිදීමටද වැඩවසනසේක.

## 2. ඇදහිල්ලේ වාතාවරණයක් ඇති කරන්න :

ඔබ මිදීමේ වචනය දුන් අවස්ථාවේදීම මෙම දෙය ආරම්භ කෙළෙහිය. එහෙත් ඇදහිල්ලේ වාතාවරණයක් ඇති කිරීමට මීට අමතරව තවත් පියවර ගත යුතු වේ.

අවිශ්වාසය, නාසරෙත්හිදී යේසුස්වහන්සේගේ සේවයට වුවද බාධා ඇති කළේය. ඇතැම් අවස්ථාවල යේසුස්වහන්සේ, උන්වහන්සේ සේවය කරන විට නොඇදහිලිවන්තයන් ඉවත් කළසේක (මාක් 5:35-40). අනෙක් අවස්ථාවල උන්වහන්සේ සෙනඟ ඔවුන්ගේ ගමෙන් (අවිශ්වාසය

වාතාවරණය) පිටතට ගෙන ගියසේක (මාක් 8:23). ඇතැම් අවස්ථාවල දෙවියන්වහන්සේ මඟපෙන්වන පරිදි නොඇදහිල්ලෙන් බියෙන් ආදියෙන් පොර බදින අයට එතැනින් ඉවත්වන ලෙස කිම අවශ්‍ය වනු ඇත.

## 3. පළමුව යාච්ඤා කරන්න :

මිදිමේ සේවය ආරම්භ කිරීමට පෙර ප්‍රඥාව හා විමසීමේ හැකියාව ඉල්ලන්න. යාච්ඤා කරන අවස්ථාවේදී දෙවියන්වහන්සේ පහත දැක්වෙන දේ එළිදරව් කිරීමට ඉඩ තිබේ.

- දැනුමේ වචනයක් : ඔබට යාච්ඤා කල යුත්තේ කෙසේදැයි දැනගැනීමට හැකිවන පරිදි යම් පුද්ගලයෙකු හෝ තත්වයක් හෝ පිළිබඳව සුවිශේෂී කරුණක් හෝ තොරතුරක් ඔබට ලබා දිය හැක' "දැනුමේ වචනයකට" ඔබගේ ආත්මයේ, සිතිවිලවලි, වචනවල හෝ හැඟීම්වල ගැඹුරු දැනුමක් හෝ අදහසක් ඇතුළත් විය හැකිය. දැනුමේ වචනය රෝගයට හේතුව හෝ එම පුද්ගලයාට එවැනි තත්වයක් තිබීමේ හේතුව හෝ එළිදරව් කරනු ඇත.
- ශුද්ධ ලියවිලි පදයක් : එම අවස්ථාවට, තත්වයට, පුද්ගලයාට හෝ කණ්ඩායමට සු¥සු "රේමා" වචනය
- දර්ශනයක් : ඔබ සේවය කරන තැනැත්තා පිළිබඳව මනසෙහි පින්තූරයක්
- ඇදහිල්ලේ වචන : විශේෂයෙන්ම එම පුද්ගලයාට අදාළව දිරිමත් කිරීමේ හා ඇදහිල්ලේ සුවිශේෂී වචන
- විශේෂ ආලේප කිරීමක් : එක්වරම සෙලවීමක්, රශ්මියක් හෝ අධිස්වභාවික ආත්ම විශ්වාසයක් වැනි බලයේ කා වැද්දීමක්
- එම පුද්ගලයා විසින් කල යුතු ඇදහිල්ලේ සුවිශේෂී ක්‍රියාවක් දෙනු ලැබේ.

## 4. කෙටි සම්මුඛ පරීක්ෂණයක් පවත්වන්න :

මෙය අවශ්‍යම නැත. එය ස්වාමීන්වහන්සේගේ මඟපෙන්වීම අනුව අවශ්‍ය නම් කළ හැකිය. පුද්ගලයාගේ තත්වය පිළිබඳව දෙවියන්වහන්සේ ඔබට ප්‍රඥාවේ සුවිශේෂී වචන දීමට ඉඩ ඇත. එවිට සම්මුඛ පරීක්ෂණයක් අවශ්‍ය නැත.

එහෙත් දෙවියන්වහන්සේ අධිස්වභාවිකව ඔබට යමක් එළිදරව් නොකරනසේක්නම් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නොපැකිලෙන්න. යේසුස්වහන්සේ ස්වභාවික මෙන්ම අධිස්වභාවික ක්‍රමද භාවිතා කළසේක. ඇතැම් අවස්ථාවල ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් උන්වහන්සේ මිනිසුන්ගේ තත්වය තීරණය කළසේක. අනෙක් අවස්ථාවල ඔවුන්ට අවශ්‍ය කවරක්ද යන්නත් කෙතරම් පීඩා වින්දේද යන්නත් උන්වහන්සේ ඇසූසේක.

සම්මුඛ පරීක්ෂණයක් මගින් ඔබට සුවිශේෂීව යාච්ඤා කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගත හැකිය. එමෙන්ම යාච්ඤා කිරීමට පෙර තවත් උපදෙස් අවශ්‍යදැයි සොයාගැනීමටද පුළුවන. යේසුස්වහන්සේ බොහෝ අවස්ථාවල එසේ කළසේක. උන්වහන්සේ ඔවුන්ගේ ඇදහිල්ල පිළිබඳව ප්‍රශ්න ඇසූ අතර සේවය කිරීමට පෙර ඍණාත්මක බලවේග සමග කටයුතු කළසේක.

පහත දැක්වෙන උදාහරණ අධ්‍යයනය කරන්න :

- මාක් 5:1-20 : යක්ෂාවේශ වූ මිනිසුන්ගෙන් යේසුස්වහන්සේ ප්‍රශ්න ඇසූසේක.
- මාක් 8:22-26 : අන්ධ මිනිසාගෙන් ප්‍රශ්න ඇසූසේක.
- මාක් 9:14-27 : නපුරු ආත්මයක් සහිත ළමයෙක්
- මාක් 10:46-52 : අන්ධ බර්තෙමියුස්ව ප්‍රශ්න කිරීම

"ගැටළුව කුමක්ද"යි එම පුද්ගලයාගෙන් අසන්න. යාච්ඤාව සඳහා ඉල්ලීම වැදගත්ය. යේසුස්වහන්සේ තමන් වෙතට පැමිණි අයගේ අවශ්‍යතාවන් දැනගෙන ඔවුන්ව ගැළවූසේක. ඉල්ලීම ඇදහිල්ලේ ක්‍රියාවක් වේ. එමගින් සුව කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වේ (යාකොබ් 5:14-15). විශේෂ ප්‍රකාශනයක් ඉල්ලන්න. ඔබට අවශ්‍ය කෙටි කරුණු පමණය. ඔබට සම්පූර්ණ ඉතිහාසය හෝ ජීවිත කතාව හෝ අවශ්‍ය නැත.

ඔබ ලද තොරතුරු මනෝවිද්‍යාත්මකව විශ්ලේෂණය නොකරන්න. ඔබගේ ක්‍රියාව මිදීම ප්‍රදානය කිරීම වේ. ඇතැම් සුවිශේෂී අවස්ථාවල පෞද්ගලිකව වැඩි කාලයක් ගත කිරීමත් පුහුණුවීම ලද උපදේශකයෙකුගේ සේවය ලබාගැනීමටද සිදුවිය හැකිය. මේ සඳහා උපදේශකයන් සූදානම් කර තබාගන්න.

"යේසුස්වහන්සේට ඔබ මිදිය හැකි බවට ඔබ විශ්වාස කරන්නෙහිද?" යන ප්‍රශ්නය යාච්ඤාව ලැබිය යුතු තැනැත්තාගෙන් අසන්න. ඔවුන් "ඔව්" යයි පැවසුවහොත් "යේසුස්වහන්සේ දැන් එසේ කරන බව ඔබ විශ්වාස කරන්නෙහිද,"යි අසන්න. මේ එක් ප්‍රශ්නයකට හෝ පිළිතුර "නැත" යන්න නම් දේව වචනයෙන් තවත් උපදෙස් අවශ්‍යය.

ඔබ විශාල සෙනඟකට සේවය කරන විට සැම පුද්ගලයෙකුට කතා කිරීමේ අවස්ථාවක් ඔබට නොලැබෙනු ඇත. දෙවියන්වහන්සේ ඇතැම්විට ඔබට සභාවේ සිටින අයගේ යක්ෂ බලවේග වලට හේතුව එළිදරව් කරනු ඇත. නැතහොත් යම් පුද්ගලයන්ට සුවිශේෂී යාච්ඤාවන් කිරීමට මඟපෙන්වනු ඇත.

ඔබ විශාල සෙනඟකට සේවය කරන්නෙහි නම් ඔබ සමග සේවය කිරීමට තවත් අය පුහුණු කරන්න. ඔබ තනිවම සේවය කිරීමට වඩා එය උචිතය. යේසුස්වහන්සේගේ පැවරීම වූයේ මෙම ලකුණු විශ්වාස කරන **අය** අනුගමනය කරනවා මිස "ඔබ" අනුගමනය කරනවා නොව. සේවය, ඇදහිලිවන්තයන් එක්කෙනෙකු හෝ දෙදෙනෙකු හෝ මගින් නැතහොත් එවැන්ජලිස්තවරුන් මගින් නොව සභාව මගින් විය යුතුය.

## 5. සුවිශේෂී ගැටලුව සොයාගන්න :

සම්මුඛ පරීක්ෂණයෙන් හෝ / හා දෙවියන්වහන්සේ ඔබට දී ඇති ප්‍රඥාවෙන් ගැටලුව කවරක්දැයි තිරණය කරන්න. එය පහත දැක්වෙන ඕනෑම ක්ෂේත්‍රයක විය හැකිය.

**ආත්මික ක්ෂේත්‍රය :** පාපය හා සම්බන්ධ ගැටළු' මේ සඳහා ආත්මික සුව කිරීමේ සේවයක් අවශ්‍යය (ගැළවීම, පාපොච්චාරණය හා පාපයට කමාව දීම).

**ශාරීරික ක්ෂේත්‍රය :** බෙලහීන යක්ෂාත්ම මගින් ඇතිවූ ශාරීරික ලෙඩරෝග.

**හැඟීම් ක්ෂේත්‍රය :** සංකාව, බිය, කෝපය, තිත්තකම, අමනාපය, අවිශ්වාසය, අසාර්ථකවීම, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථය, වියවුල, බලාපොරොත්තු කඩවීම, මාංශයේ පරිපූර්ණ බව, සමාව නොදීම ආදි ගැටළු පිළිබඳවය.

මෙය ඇතැම්විට "අභ්‍යන්තර සුවකිරීම" ලෙස හැඳින්වේ. එහෙත් එය වැරදි ලෙස භාවිතා කර ඇත. කරුණු නැවත නැවත සලකා බලා මේ හැඟීම් නිදහස් කිරීම අනවශ්‍යය. මෙවැනි පීඩාවන් තුළින් ආපසු ගොඩ ඒමට සති හෝ මාස හෝ අවුරුදු ගණනාවක් ගතකිරීම අවශ්‍ය නැත. ඔබ එසේ කළහොත් ඉන් උත්සාහ කරන්නේ පැරණි පුද්ගලයා සුව කිරීම මිස ක්‍රිස්තුස්වහන්සේ තුළ අලුත් කෙනෙකු නිර්මාණය කිරීමට නොවේ.

හැඟීම් ක්ෂේත්‍රයේ ගැටළු බොහොමයක් පෞද්ගලික ජීවිතයේ සමාජීය ක්ෂේත්‍රයට අදාළ වේ. එනම් ඒවා පැන නගින්නේ පවුලේ හො සමාජයේ හෝ සබඳතා වලිනි. මිදීම ලැබෙන්නේ එම කරුණු හැඳිනගැනීමෙන් සමාව ඉල්ලීමෙන් හා සමාව දීමෙන් වේ.

හැඟීම් ක්ෂේත්‍රයේ සුවවීමට අදාළ විශාලතම බාධකය සාමාන්‍යයෙන් කමාව දීම වේ. එබැවින් හැඟීම් සුවකිරීමට සමාජ සම්බන්ධතා සුවකිරීම අන්තර්ගතය.

අප සමගිකිරීමේ සේවයට කැඳවා ඇත (2 කොරින්ති 5:18-21). සමගිවීම දෙවියන්වහන්සේ සමගත් මනුෂ්‍යයා සමගත් විය යුතුය. හැඟීම් පිළිබඳවද මානසික හා අභ්‍යන්තර සුව කිරීමද පැමිණෙන්නේ මෙතැනින් වේ.

කමාවදීම පිළිබඳව යම් පුද්ගලයෙකුට උපදෙස් දීම අවශ්‍ය විය හැකිය. එය,

- යම් කෙනෙකු කරන ලද වැරදි හ× යයි කිම සඳහා කරුණු දැක්වීම ("ඔවුන් බොහෝ පීඩාවන් යටතේ සිටින්නට ඇත")
- අපට රිදවීම් වූ බව ප්‍රතික්ෂේප කිරීම
- ඔබට කරන ලද දෙය කිසිම විරෝධයක් නොමැතිව පිළිගැනීම
- රිදවීම සුව වන තුරු බලා සිටීමවත් නොවේ.

සැබෑ කමාව දීම මේ දේවලින් ලැබේ :

- අපට කරන ලද දෙය වැරදි බවද එය පාපී ලෝකයක පාපී මිනිසුන් විසින් කරන ලද දෙයක ප්‍රතිඵලයක් බවද අවබෝධ කරගැනීම.
- රිදවීම පිළිබඳව දෙවියන්වහන්සේට පාපොච්චාරණය කර හිංසාකාරී හැඟීම් සුව කරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටීම (එනම් වෛරය, තිත්තකම ආදිය). එම සිද්ධිය ඔබට අමතක නොවිය හැකිය. ඔබට අවශ්‍ය ඒ හා සම්බන්ධ වැරදි හැඟීම් සුව කිරීම වේ.
- ඊට සහභාගි වූ අයට සමාව දීමට දෙවියන්වහන්සේගේ උපකාරය ඉල්ලා සිටීම හා ඉන්පසු ක්‍රිස්තුස්වහන්සේ ඔබට සමාව දුන් ආකාරයෙන්ම සමාවදීම

ඔබ අන් අයට සමාව දෙන අයුරින්ම දෙවියන්වහන්සේ ඔබට සමාව දෙන බව පිළිගන්න. "අපට වැරදි කරන අයට අප කමා වන්නාක් මෙන් අපේ වරදටත් කමා වුව මැනව". තමාටම කමාව දීම එම පුද්ගලයාට අවශ්‍ය විය හැකි (තමන්ගේම වැරදි ක්‍රියා ගැන වරදකරු වීම) අතර හැඟීම් සුවකිරීම සඳහා යාච්ඤා කිරීම සැබවින්ම අවශ්‍යය.

- වරදට හේතු වූ පාපය හා / හෝ පාපී හැඟීම් පිළිගන්න. ඒ ගැන දෙවියන්වහන්සේට පාපොච්චාරණය කර පසුතැවිලිවෙන්න. ඔබගේ පාපයට කමාව දී ඔබගේ හැඟීම් සුව කරන ලෙස ඉල්ලන්න.
- දෙවියන්වහන්සේ සමාව දුන් විට උන්වහන්සේ එය අමතක කරන බව පිළිගන්න (නැගෙනහිර බස්නාහිරෙන් දුරව තිබෙන්නාක් මෙන් උන්වහන්සේ අපගේ පාප පලවා හරිනු ඇත).
- 1 යොහන් 1:8-9 හා රෝම 8:1 ඉල්ලන්න.
- ඔබගේම කැමැත්තෙන් කරන ක්‍රියාවක් මගින් ඔබව දෝෂාරෝපණයෙන් මුදවාගන්න. අනාගත සිතිවිලි රටා "ව්‍යාජ සිතිවිලි" හා අතිතයේ ඇතිවූ දේ "අමතක කිරීම" මගින් පහලට ඇද හෙලමින් පාලනය කරන්න.

**මානසික ක්ෂේත්‍රය :** සෘණාත්මක සිතුවිලි තුළින් පැන නගින ගැටළු" මනස වෙත කෙරෙන සාතන්ගේ ප්‍රහාර" මානසික පසුබෑම මින් සමහරකි' මිනිසා ත්‍රිත්ව පුද්ගලයෙකු බැවින්, එක් ක්ෂේත්‍රයක ඇති ගැටළු මගින් සම්පූර්ණ පුද්ගලයාට බලපෑම් කෙරෙන බව මතක තබාගන්න. ඔබ සේවය කරන විට එක් ක්ෂේත්‍රයක් ගැන පමණක් නොව සම්පූර්ණ මිනිසා වෙනුවෙන් වැඩ කරන්න. මිනිසා ශරීරය, ප්‍රාණය හා ආත්මය වේ. සම්පූර්ණත්වය යනු මේ සියල්ල ගැන කටයුතු කිරීම වේ.

## 6. මේ යාච්ඤා කිරීමට කාලයදැයි තිරණය කරන්න :

සුවකිරීමේ යාච්ඤාව යාච්ඤා කිරීමට මෙය සුදුසු කාලයද නැත්දැයි තිරණය කරන්න. බොහෝ අවස්ථාවල ඔබ යාච්ඤා කරනු ඇත. එහෙත් ඇතැම් විට යාච්ඤා නොකරන්න හෝ යාච්ඤාව පරක්කු කරන ලෙස ස්වාමින්වහන්සේ මඟපෙන්වන්නේ නම් ඒ ගැන පුදුම නොවෙන්න.

සයිරොපිනිසියානු ස්ත්‍රියගේ දුව හා ලාසරස් සුව කිරීම යේසුස්වහන්සේ ප්‍රමාද කළසේක' අවිශ්වාසය නිසා නාසරෙත්හිදී යේසුස්වහන්සේට බොහෝ දේවල් කිරීමට නොහැකි විය . නැවත උපදෙස් දෙන තුරු ඇතැම් දේ ප්‍රමාද කිරීමට ස්වාමින්වහන්සේ ඔබටද මඟපෙන්වනු ඇත. එනම් පාපය පිළිබඳ ගැටළුවක් ගැන කටයුතු කිරීමට ඔවුන්ට අවශ්‍ය විය හැකිය. එමෙන්ම ගැළවීම පිළිබඳ උපදෙස් ආදිය අවශ්‍ය විය හැකිය.

## 7. මිදිමේ යාච්ඤාව යාච්ඤා කරන්න :

ඔබ හඳුනාගත් යක්ෂයාගේ බලපෑම පිළිබඳ සුවිශේෂී ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමු කෙරෙන **මිදිමේ** යාච්ඤාව යාච්ඤා කරන්න. ඔබගේ යාච්ඤාව මගින් මිදීම ලැබීම සඳහා දෙවියන්වහන්සේව පෙළඹවීම අවශ්‍ය නැත. ගැළවීම දැනටමත් දී ඇත්තාක් මෙන් මිදීමද එසේම ලැබෙනු ඇත. ගැළවීම ඇදහිල්ල මත පදනම් වන්නාක් මෙන් මිදීමද එසේම වේ. දෙවියන්වහන්සේට ඔබ ගැළවීමට අවශ්‍ය වන සේම මිදීමටද අවශ්‍යය.

දෙවියන්වහන්සේගේ බලය ඇතැම්විට මුදාගැනීම සඳහා විශේෂාකාරයෙන් පැවතියද (ලූක් 5:17) ඔබව ආලේප කිරීමක් නොමැතිව හෝ ඔබට යාච්ඤා කළ හැකිය. හේතුව යේසුස්වහන්සේ ඔබට ශුභාරංචිය පැතිරවීමට අණ කළාක් මෙන් මිදීමේ සේවය කිරීමටද අණ කර ඇත.

ඔබ කණ්ඩායමක සිටින්නෙහි නම් සේවය කිරීම සඳහා අන් අයගේ සහායද ලබාගන්න. බොහෝදෙනෙක් යාච්ඤා කරන විට ආත්මික බලය දෙගුණ තෙගුණ වේ (මතෙව් 18:19). " ඇදහිලිවතුන් එක්ව කරන සේවය" මගින් මිදීමේ සේවය සාර්ථකව අත්දකින පුද්ගලයන් එම සේවය ලබන්නන් විසින් ඔවුන්ට දෙන්නාවූ මහිමය ලබාගැනීමෙන් අධෛර්යමත් කරයි. පළමුව සතුරාව බඳින ලෙසත් ඉන්පසු ඔහුට එරෙහිව බලය පාවිච්චි කරන ලෙසත් යේසුස්වහන්සේ ඉගැන්වූසේක.

> **නොහොත් බලවන්තයා පළමුකොට නොබැඳ යමෙකුට ඔහුගේ වස්තු කොල්ලකන්ට කෙසේ හැකි වේද? බැඳලාම ඔහුගේ ගෙය කොල්ලකන්නේය. (මතෙව් 12:29)**

යක්ෂ බලවේග බාහිරින් පීඩාවන් බැඳ තබන්නේනම් යක්ෂ බලවේග බැද එම බැම්වලින් පුද්ගලයා නිදහස් වන ලෙස යාච්ඤා කරන්න. නිදසුනක් ලෙස යේසුස්වහනසේ බෙලහීන ආත්මයකින් සිනගෝගයේ සිටි ස්ත්‍රිය නිදහස් කළසේක. ඇය ආවේශව සිටියේ නැත. එහෙත් පීඩාවට පත්ව සිටියාය. එමනිසා පලවා හැරීමක් අවශ්‍ය වුයේ නැත.

යක්ෂයන් ආවේශ වී සිටින අවස්ථාවල යේසුස්වහන්සේගේ නාමයෙන් යක්ෂයන් පලවා හැරීමේ අධිකාරී බලය ඔබට ඇත. එය ඔබගේ බලයේ හෝ හැකියාවේ හෝ අධිකාරී බලයක් නොවේ. එය උන්වහන්සේගේ නාමයේ බලය වේ. යක්ෂයන් පලවා හැරීමේ සැබෑ යාච්ඤාවේදී යේසුස්වහන්සේගේ නම භාවිත කිරීම වැදගත් වේ.

යක්ෂයන් පලවා හැරීමට ඇදහිල්ල, නිරාහාරව සිටීම හා යාච්ඤාව අවශ්‍යය (මතෙව් 17:14-21 කියවන්න). මේ ක්ෂේත්‍ර වලදී පෙර සූදානම අවශ්‍ය වන්නේ ඒ නිසාය. මිදීමේ සේවය සඳහා දෙවියන්වහන්සේ ඔබට දී ඇති "මෙවලම්" අතර දේවවචනය (එපීස 5:17; හෙබ්‍රෙව් 4:12); යේසුස්වහන්සේගේ ලේ (එළිදරව් 12:11) හා ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් පූර්ණවීම (ක්‍රියා 1:8; 2:38) යනාදි දේ ඇතුලත් වේ.

යක්ෂයන් වෙත යටි ගිරියෙන් කෑගැසීමක් අවශ්‍ය නැත. ඔවුන් පිටව යන්නේ යේසුස්වහන්සේගේ නාමයෙන් ඔබට ඇති අධිකාරී බලය නිසා මිස මිදීමේ යාච්ඤාවේදී ඔබගේ හඬෙහි ඇති ශබ්දයේ ප්‍රමාණය නිසා නොවේ.

සෑමවිටම යක්ෂයන්ට නැවත ඇතුළුවීමට ඉඩ නොදෙන්න. මෙය මිදීමේ යාච්ඤාවේ වැදගත් කොටසකි.

> **සමූහයක් දුව එමින් රැස්වෙන බව යේසුස්වහන්සේ දුටු කල, උන්වහන්සේ අශුද්ධාත්මයට තරවටු කර : ගොළු බිහිරි ආත්මය, මොහු කෙරෙන් පහව යව, තවත් මොහුට ආවේශ නොවන්ට අණකරමියි කීසේක. (මාර්ක් 9:25)**

යක්ෂයන් කතා කරන වචන තුළින් ප්‍රකාශ වීමට තැත් කරත් ඔවුන් සමග කතා කිරීමට කාලය ගත නොකරන්න. යේසුස්වහන්සේ යක්ෂයන්ට තරවටු කරමින් නිශ්ශබ්දව සිටින ලෙස අණ කළසේක (ලූක් 4:34-35). යක්ෂයන් සමග කෙරෙන ඕනෑම සාකච්ඡාවක් භයානක බව මතක තබාගන්න. මන්ද ඔවුන් බොරුවේ ආත්මයන් වේ.

මිදීමේ යාච්ඤාවේදී ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට මඟපෙන්වනු ඇත. එහෙත් ඔබ මෙම සේවයට අÆත් නම් අධ්‍යයනය කිරීම සඳහා යාච්ඤා රටාවක් පහත දැක්වේ.

***"යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් හා උන්වහන්සේගේ බලයේ, වචනයේ, රුධිරයේ හා ශුද්ධාත්මයාණන්වහන්සේගේ අධිකාරී බලයේ පදනමෙන් වේ ..."***

*මුදාගැනීම සඳහා වූ බලයේ පදනම මින් පිහිටුවනු ලැබේ.*

***"මම ඔබ බැඳ තබමි"***

*යේසුස්වහන්සේ පළමුව ශක්තිමත් මිනිසා පලවාහැරීමට පෙර බැඳ තබන ලෙස ඉගැන්වූසේක.*

***"මම ඔබට අණ කරමි"***

*මිදීමේ සේවය බලයේ යාච්ඤාවක් මිස බැගෑපත් ලෙස කෙරෙන ඉල්ලීමක් නොවේ. ඔබට සෙමින් කතා කළ හැකිය. එහෙත් යේසුස්වහන්සේගේ නාමයෙන් ඔබ නපුරු බලවේග වලට එරෙහිව අධිකාරී බලය ලබාගත යුතුය. ඔබ කතා කරන විට එම පුද්ගලයාගේ ඇස් දෙක දෙස ඍජුව බලන්න.*

***"___________ ආත්මය "හෝ" සාතන්ගේ අශුද්ධ ආත්මය"***

*ආත්මික හෝ ස්වභාවික හෝ මගපෙන්වීමක් මගින් ආත්මය හඳුනාගෙන ඇත්නම් එය සුවිශේෂීව නම් කරන්න. නැතහොත් පොදුවේ කතා කරන්න.*

***"ඉවත් වන්න"***

*මෙය පලවා හැරීමේ ක්‍රියාවලිය වේ.*

***"කිසිදු උවදුරක් නොකර (මුදාගන්නාවූ කෙනාගේ නම කියන්න) නැතහොත් මේ නිවසේ කිසිවෙකුට කරදරයක් හෝ ශබ්දයක් හෝ නොකර"***

*ඇතැම් අවස්ථාවල එම පුද්ගලයාට උවදුරක් කිරීමට හෝ කැළඹීමක් ඇති කිරීමට හෝ යක්ෂයා උත්සාහ කරනු ඇත.*

***"මෙම පුද්ගලයා තුළට නැවත ඇතුළුවීම මම තහනම් කරමි"***

*යේසුස්වහන්සේ මෙසේ අණකළ බව මතක තබාගන්න.*

***"එමෙන්ම මම මෙම පුද්ගලයාව යේසුස්වහන්සේගේ රුධිරයේ බලයෙන් පවිත්‍ර කිරීමේ බලයෙන් පූර්ණවීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේව මුදාහරිමි"***

*මුදාහැරීමටත් බැඳ තැබීමටත් අපට පවසා ඇත. මේ ක්‍රියාවක යෙදෙන සුවිශේෂී ආත්මයක් ඔබ හඳුනාගෙන ඇත්නම්, ඊට විරුද්ධ ආත්මය මුදාහරින්න. නිදසුනක් ලෙස අහංකාරයේ ආත්මය බැඳ තබා නිහතමානී ආත්මය මුදාහරින්න.*

එවැනි සේවයක් මගින් විශාල සෙනඟක් ආකර්ශනය කරගැනීමට උත්සාහ නොකරන්න. යක්ෂයාගේ ක්‍රියා මගින් සෙනඟ ආකර්ශණය කිරීම යේසුස්වහන්සේ දුටු විට ඒ සැනෙකින් යක්ෂයාව පලවා හැර ඒ රඟදැක්වීම නැවැත්වූසේක.

> **සමූහයක් දුව එමින් රැස්වෙන බව යේසුස්වහන්සේ දුටු කල, උන්වහන්සේ අශුද්ධාත්මයට තරවටු තර: ගොළු බිහිරි ආත්මය මොහු කෙරෙන් පහව යව, තවත් මොහුට ආවේශ නොවන්ට තට අණකරමියි කීසේක. (මාක් 9:25)**

යක්ෂයන් නිරයට යැවීමට උත්සාහ නොකරන්න. යේසුස්වහන්සේ හා උන්වහන්සේගේ ගෝලයෝ එසේ නොකළහ. අපට බලය ඇත්තේ බැඳීමට, මුදවා හැරීමට හා පලවා හැරීමට පමණි. යක්ෂයන්ගේ අවසාන විනිශ්චය සඳහා අනාගතයේ කාලයක් වෙන්කර ඇත. යක්ෂයෝ යේසුස්වහන්සේට මෙසේ පැවසූහ.

> **බලව, ඔවුහු මොරගසමින්: දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෙනි ඔබට අපෙන් කම මොකද? කාලයට ප්‍රථමයෙන් අපට වද දෙන්ට ඔබ මෙහි ආසේක්දැයි කීවෝය. (මතෙව් 8:29)**

යක්ෂයන්ගේ බලපෑම් ඇතිවූ අය සඳහා යාච්ඤා කිරීම අත් තබා හෝ නොතබා හෝ කළ හැකිය. ලූක් 13:11-13හි යේසුස්වහන්සේ බෙලහීන ආත්මයකින් පීඩා විඳි ස්ත්‍රියට සේවය කිරීම සඳහා අත් තබන ලදී. වෙනත් අවස්ථා වලදී උන්වහන්සේ අත් තැබුවේ නැත. යක්ෂයාට කථා කළා පමණි. (ලූක් 9:42)

## 8. පිළිතුර සඳහා යේසුස්වහන්සේට ප්‍රශංසා කරන්න :

යාච්ඤාවට පසුව මුදාගැනීම සඳහා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. ලාදුරු රෝගීන් දසදෙනාගේ නිදසුනේදී සියලු දෙනාම සුවය ලැබූ නමුත් ප්‍රශංසා කිරීමට පැමිණි කෙනා සම්පූර්ණ විය . ඇදහිල්ලෙන් යුතුව ප්‍රශංසා කරන්න. අන් අයට පෙනීමට නොවේ. ඔබ දෙවියන්වහන්සේගේ වචනයෙන් කී ලෙස ක්‍රියා කර ඇත. උන්වහන්සේ කරන බව කී දෙය කළ බව විශ්වාස කරන්න. ඒ සඳහා උන්වහන්සේට තුති පුදන්න.

## මුදාගැනීමේ ලකුණු හඳුනාගැනීම :

යක්ෂයන් ආවේශ වී සිටින ඇතැම් අවස්ථාවල යක්ෂයන් පිටව යන්නේ පොර බැඳීමකිනි. එය ඇඩීමක් හෝ මෙම පුද්ගලයාව බිම දැමීම හෝ විය හැකිය. යක්ෂයන් පිටව ගිය විට (ආවේශ වූ හෝ පීඩා ගෙන දුන් හෝ විය හැකිය) නිදහස්වීමේ ප්‍රීතියේ හැඟීමක් ඇතිවිය හැකිය.

## පසුව කෙරෙන රැකබලාගැනීම :

යක්ෂයන් ආවේශ වී සිටි පුද්ගලයාව පාපොච්චාරණය කිරීමේ, පසුතැවිලිවීමේ හා යක්ෂයන්ගේ ක්‍රියාවන් හා සම්බන්ධවීමේ හා පාපයන් අත්හැරීමේ යාච්ඤාවකට මඟපෙන්විය යුතුය. යම් පුද්ගලයෙකුට ගුප්ත දේ ඇත්නම් (නිදසුනක් ලෙස පිළිම, මන්ත්‍ර ගුරුකම් උපකරණ ආදිය) ඒවා විනාශ කළ යුතුය"

යක්ෂාවේශව සිටි අයට නිදහස් විමෙන් පසු ඔවුන්ට කරන සේවය ඉතා වැදගත්ය. යක්ෂයෙකු පලවා හැරිය විට ක්‍රියාකා× විම සඳහා වෙනත් ස්ථානයක් සොයන බව යේසුස්වහන්සේ ඉගැන්වූසේක. යේසුස්වහන්සේ ඉගැන්වූයේ යක්ෂයෙකු පලවා හැරිය විට එම ස්ථානයේ අවකාශයක් ඇතිවන බවය' යක්ෂයන් ඔහුගේ මුල් ගොදුර වෙත ඊටත් වඩා භයානක ආත්මයක් ඇතිව පැමිණීමේ අවදානමක් ඇත.

> **අශුද්ධාත්මය මනුෂ්‍යයාගෙන් දුරුව ගිය කල, නිවාඩු සොයමින් දිය නැති තැන් වල ඇවිද එය නොලැබුණු බැවින් ඔහු කථාකොට මම පිටතට ආ මාගේ ගෙට හැරී යමියි කියයි. ඔහු එහි පැමිණි කල එය අතුගා සරහා තිබෙනවා සම්බවේ. එවිට ඔහු ගොස් තමාට වඩා නපුරු වූ වෙන ආත්මයන් සත්දෙනෙකු තමා කැටුව ගෙන එන්නේය. ඔවුහු ඇතුල්ව එහි වාසය කරති. එවිට ඒ මනුෂ්‍යයාගේ පළමු ස්වභායට වඩා අන්තිම ස්වභාව නපුරු වන්නේයයි කීසේක. (ලූක් 11:24-26)**

යක්ෂයෙක්ව පලවා හැරිය විට ඔහු මනුෂ්‍ය ශරීරයේ පිටත අවිවේකීව අතෘප්තිමත්ව සිටී. යක්ෂයෙකුට සාතන්ගේ නපුරු අභිප්‍රායන් ඉටු කළ හැක්කේ මනුෂ්‍ය ජීවිතයක් තුළ පදිංචි වීමෙන් හා පාලනය කිරීමෙන් පමණි. යක්ෂයන් පලවා හැරීම පමණක් ප්‍රමාණවත් නොවන්නේ එබැවිනි. ආත්මික "නිවෙස" නැවත උත්පාදනයවූ අත්දැකීම් වලින් පිරවිය යුතුය. ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අවශ්‍යය. දිගටම උපස්ථානය හා සේවය කිරීම කරන්න. එම පුද්ගලයා දේව වචනයේ හා යාච්ඤාවේ ගිල්විය යුතුය. ඔහු ඇදහිලිවතුන්ගේ සමූහයේ කෙනෙකු බවට පත්විය යුතුය.

යක්ෂ බලවේග වලින් මිදුනු අය සාක්ෂි දීමටද සූදානම් විය යුතුය. ගෙරසේනයේ යක්ෂාවේග වූ මිනිසාට යේසුස්වහන්සේ මෙසේ පැවසූසේක.

> **නමුත් උන්වහන්සේ ඔහුට අවසර නොදී නුඹ ගෙදර නුඹේ නෑ මිතුරන් ළඟට ගොස් ස්වාමින්වහන්සේ නුඹට කරුණා කළ හැටි ඔවුන්ට දන්වාපන්නැයි ඔහුට කීසේක. ඔහු පිටත්ව ගොස් යේසුස්වහන්සේ තමාට කොපමණ මහත් දේවල් කළසේක්ද කියා දෙකපොලිසෙහි ප්‍රකාශ කරන්ට පටන් ගත්තේය. සියල්ලෝ මවිත වූවෝය. (මාක් 5:19-20)**

## යක්ෂ බලවේග වලින් ආරක්ෂාවීම

යක්ෂ බලවේග වල ක්‍රියාකාරකම් වලින් ඔබ ආරක්ෂා වීමට විශේෂිත මාර්ග ඇත. ඉතාමත් වැදගත් ආරක්ෂව වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගැනීම වේ. මක්නිසාද සැබෑ නැවත ඉපදුනු ඇදහිලිවන්තයෙකුට ආවේශ වීමට යක්ෂයන්ට නොහැකිය. ඔබ පාපයෙන් ඈත්ව සිටින්න. පාපය තුළින් ඔබ "යක්ෂයාට තැනක් දෙන" බැවිනි. ඔබට පීඩා ගෙන දෙන යක්ෂයන්ගේ ක්‍රියාවන් කිරීමට ඔබ සාතන්ට අවස්ථාවන් සපයනු ඇත.

ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණ වන්න. යක්ෂාත්ම වලට හා දෙවියන්වහන්සේගේ ආත්මයට එකම ආත්මික භාජනයේ විසීමට නුපුළුවන.

යක්ෂයන්ට වසඟවීමේ ආශාවන් මඟහරින්න. ඔවුන් පිළිබඳව දේව වචනය පවසන දෙය ඉගෙනීම වැරැද්දක් නොවේ. එමෙන්ම දේව වචනය මත පදනම් වූ මෙවැනි පාඨමාලාවක් හැදෑරීමද වැරැද්දක් නොවේ. එහෙත් යක්ෂයන් පිළිබඳව වැඩිදුරටත් ඉගෙනීමට ලෞකික පොත් අධ්‍යයනය කිරීමෙන් හා රැස්වීම් වලට සහභාගි වීමෙන් වළකින්න. ගුප්ත දේ සමග සබඳතා නොපවත්වන්න. ශාස්ත්‍රකාරයන්, මායාකරුවන්, කේන්දර, අත් බලා ශාස්ත්‍ර කීම, තේ කොළ කියවන්නන් ආදී දෙයෙහි නොයෙදෙන්න. ව්‍යාජ දෙවිවරුන්ට සේවය නොකරන්න. එමෙන්ම ඔබගේ නිවෙසට පිළිම ආදිය ගෙන නොඑන්න.

> **ඔවුන්ගේ දෙවිවරුන්ගේ රූප ගින්නෙන් දවා දමාපල්ලා. ඒවායේ තිබෙන රන් රිදී වලට ආශාවී ඒවා නොගනින්න. එසේ කළොත් නුඹ මළපතකට අසුවන්නේය. මක්නිසාද ඒවා නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට පිළිකුලක්ය. පිළිකුල් දෙයක් නුඹේ ගෙට ගෙන ගොස් නුඹ ඊට සමාන වී නාස්තියට කැප නොවන්න. නුඹ ඊට ද්වේෂ වී එය සහමුලින්ම පිළිකුල්කොට සිතාපන්න. මක්නිසාද එය නාස්තියට කැපය. (ද්විතීය කථාව 7:25-26)**

ඔබගේ මනසත් දිවත් පාලනය කරගැනීම වැදගත්ය. ඔබ ඇසුරු කරන්නන් පරෙස්සමෙන් තෝරාගන්න. ලෝකයත් මාංශයත් ජයගැනීමද වැදගත් බව මතක තබාගන්න.

යක්ෂ බලවේග වලට විරුද්ධව ආරක්ෂාකාරී මෙන්ම ආක්‍රමණශීලි සටන් කළ යුතුය. මෙම පාඨමාලාවෙන් ඔබ උගත් ආයුධ හා උපක්‍රම භාවිතා කරන්න.

## පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. මිනිසාගේ ශරීරය, ප්‍රාණය හා ආත්මයට පහර දෙන ප්‍රධාන යක්ෂයන් වර්ග තුන කවරේද?

3. යක්ෂ බලවේග සමග කටයුතු කිරීම සඳහා දී ඇති ආත්ම විමසීමේ දීමනාවේ ඇති වටිනාකම කුමක්ද?

4. යක්ෂාවේශ වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

5. යක්ෂාවේශ වූ පුද්ගලයෙකු තුළ ඇති ගති ලක්ෂණ මොනවාද?

6. යක්ෂයන් මගින් වසඟ වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

7. යක්ෂයන්ට වසඟ වූ කෙනෙකුගේ ගති ලක්ෂණ මොනවාද?

8. යක්ෂයන් මගින් පීඩාවට පත්වීම යනු කුමක්ද?

9. යක්ෂයන් මගින් පීඩාවට පත් වූවෙකුගේ ගති ලක්ෂණ මොනවාද?

10. යක්ෂ බලවේග පරාජය කිරීමට මෙම පාඩමෙන් දී ඇති ශුද්ධ ලියවිලි මාර්ගෝපදේශ සාරාංශගත කරන්න.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. යක්ෂ බලවේග සමග යේසුස්වහන්සේ ක්‍රියා කළ ආකාරය පහත දැක්වෙන නිදර්ශන මගින් අධ්‍යයනය කරන්න.

**සිද්ධිය :** දුර්වලකමේ ආත්මයක් ඇතිව සිනගෝගයේ සිටි ස්ත්‍රිය (ලූක් 13:10-17)

**සාරාංශය :** මෙම ස්ත්‍රිය සබත් දින දේව මෙහෙයට සහභාගි වී සිටියාය. යේසුස්වහන්සේ ඇයට "ආබ්‍රහම්ගේ දියණිය" ලෙස ආමන්ත්‍රණය කළසේක. ඇය ධර්මිෂ්ඨ දේව බය ඇති තැනැත්තියක් ලෙස අපට සිතිය හැකිය. එසේ වුවද වසර දහඅටක් දුර්වලකමේ ආත්මයකින් ඇය බැඳ තිබිණි.

යේසුස්වහන්සේ තම සේවයේදී සාමාන්‍ය ශාරීරික රෝග හා යක්ෂයන් නිසා ඇතිවූ රෝග වෙන් කර හඳුනාගත්සේක. සාමාන්‍ය රෝග අත තැබීමෙන් හෝ තෙල් වලින් ආලේප කිරීමෙන් හෝ සුව කළසේක. යක්ෂයන්ගේ විපත් නිසා බාහිරින් බැඳ සිටි ඇදහිලිවතුන්ගේ බන්ධනයන් ලිහිල් කරන ලදි. ශාරීරික දුබලතා ඇතිව සිටි යක්ෂාවේශ වූ නොඇදහිලිවතුන්ගේ යක්ෂයන් පලවා හැරියසේක.

මෙම ස්ත්‍රිය මුදාගනු ලැබුවේ සාමාන්‍ය දේව මෙහෙයකදී වේ. ඊට සිනගෝගයේ පාලකයා ඇතුළු ආත්මික නායකයෝ විරුද්ධ වූහ. යක්ෂ බලවේග පිළිබඳව කටයුතු කිරීම ගැන අද වුවද ආත්මික නායකයෝ විරුද්ධ වෙති. යක්ෂයන් සිටින බව සමහර අය නොපිළිගනිති. අනෙක් අය යක්ෂන්ට මනුෂ්‍යයාව ආවේශ වීමට හෝ පීඩනයක් ඇති කි×මට බලයක් ඇති බව ප්‍රතික්ෂේප කරති.

මෙම මුදාගැනීමේදී යේසුස්වහන්සේ බන්ධනය සහිත ස්ත්‍රියට අත තැබූසේක. සැනෙකින් ඇගේ කුදු බව නැති වී ඇය දෙවියන්වහන්සේට ප්‍රශංසා කළාය. යක්ෂයන් නිසා පීඩා විඳින හෝ යක්ෂාවේශවූ හෝ අය පිළිබඳව සේවයේදී සියලු මහිමය දෙවියන්වහන්සේට විය යුතු අතර මුදාගැනීමේ ක්‍රියාවලියට දෙවියන්වහන්සේ යොදා ගන්නා පුද්ගලයාට විය යුතු නැත.

**සිද්ධිය :** සයිරොපීනිසියානු ස්ත්‍රියගේ දුව (මාක් 7:24-30; මතෙව් 15:21-28)

**සාරාංශය :** මෙම තරුණ ගැහැණු ළමයාට අපවිත්‍ර ආත්මයක් තිබූ අතර එම ආත්මයේ බාහිර ප්‍රකාශවීම් මගින් ඇගේ මව ඒ බව අවබෝධ කරගත්තාය. ඇගේ දුව "බලවත් ලෙස යක්ෂාවේශව සිටින්නීය"යි ඇ පැවසුවාය. යේසුස්වහන්සේ ඇයව සුව කළේ ඇයගේ මවගේ මහත් ඇදහිල්ල නිසාය. එම දුව යේසුස්වහන්සේ අබියස සිටියේ නැත. මින් පෙන්නුම් කරන්නේ සාතන් මගින් පීඩා විඳින්නන් හෝ ආවේශ වුවන් සුව කිරීමට ශාරීරිකව පෙනී සිටීම අවශ්‍ය නැති බවය. මෙමගින් හා ඊළඟ සිද්ධිය මගින් ළමයින්වද සාතන් පීඩාවට පත්කරන බව පෙන්නුම් කෙරේ.

**සිද්ධිය :** අපස්මාර ගොළු ළමයා (මාක් 9:14-29; මතෙව් 17:14-21; ලූක් 9:37-43)

**සාරාංශය :** එකම පුත්‍රයෙකු සිටි පියෙක් එම ළමයාගේ සුවය සඳහා යේසුස්වහන්සේව සෙව්වේය. යක්ෂාවේශ වූ ළමයා ගොළුව හා බිහිරිව සිටියේය. මතෙව්, මාක් හා ලූක් යන තිදෙනාම මේ ළමයාට යක්ෂයා ආවේශ වූ බව හා ඒ නිසා ගින්නට හා ජලයට වැටෙන බව පවසති.

සමහර අවස්ථාවල යක්ෂයා ඔහුව බිම දමමින් කටින් පෙණ දමමින් දත්මිටි කෑමට සලස්වයි. බොහෝ අවස්ථාවල ආත්මය මගින් ඔහුව සීරුම් වලට (තුවාළ) භාජනය කර ඇත. එමෙන්ම යක්ෂයා ඔහු තුළ සිටි නිසා ඔහු ශාරීරිකව දුර්වල විය. ඔහුගේ පියා ඔහුට "පිස්සු" යයි පැවසීය. ඉන් ඔහුට මානසික ප්‍රශ්න තිබූ බවක්ද පෙනේ. ගෝලයන් මෙම ආත්මය පහ කිරීමට උත්සාහ කළද එසේ කිරීමට ඔවුන්ට නොහැකි විය.

ළමයා යේසුස්වහන්සේ වෙතට පැමිණෙන කල යක්ෂයා ඔහුව බිම හෙළා පීඩා කළ බව ලූක් සඳහන් කරයි. යේසුස්වහන්සේ අශුද්ධාත්මයට තරවටු කර ළමයා සුව කළේය. මතෙව් සඳහන් කරන්නේ යක්ෂයාට තරවටු කළ කල්හි ඔහු ඉවත්ව ගිය බව හා ඒ පැයේම ළමයා සුව වූ බවය.
මෙම සිද්ධිය පිළිබඳ මාක්ගේ විස්තරය මතෙව් හා ලූක්ගේ විස්තර වලට වඩා දිගු වේ. යේසුස්වහන්සේ මේ ළමයාගේ පියාගෙන් කොපමණ කාලයක් ඔහු යක්ෂාවේශව සිටියේද යන්න ප්‍රශ්න කළ බව ඔහු සඳහන් කරයි. පියාගේ පිළිතුර වූයේ ළදරු කාලයේ පටන්ම මේ තත්වය තිබූ බවය.

විශ්වාස කිරීමේ වැදගත්කම යේසුස්වහන්සේ පියාට අවධාරණය කළසේක. ඉන්පසු ගොළු බිහිරි ආත්මයට කතා කර පහව යන ලෙසත් තවත් ආවේශ නොවන ලෙසත් අණ කළසේක. ආත්මය මොරගසා පිටතට ආවේය. එවිට ඔහු මළ කෙනෙකු මෙන් විය. වැඩිදෙනෙක් සිතුවේ ඔහු මළ බවය. එහෙත් යේසුස්වහන්සේ ඔහුගේ අත අල්ලා ඔහුව නැගිටවූසේක.

යක්ෂයන් පලවා හැරීමට ඔවුන්ට නොහැකි වූයේ මන්දැයි ගෝලයන් ඇසූ විට යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන්සේක.

**උන්වහන්සේ කියනසේක: නුඹලාගේ ඇදහිල්ලේ මඳිකම නිසාය. සැබවක් නුඹලාට කියම්-අබ ඇටයක් ඇදහිල්ල නුඹලාට ඇත්නම්, මේ කන්දට කථාකොට: මෙතැනින් අහක්ව, එතැනට යවයි කීවත් ඒක යන්නේය. කිසිවක් නුඹලාට බැරි නොවන්නේයයි කීසේක. (මතෙව් 17:20-21)**

උන්වහන්සේගේ පිළිතුරෙන් යක්ෂ බලවේග සමග කටයුතු කරන විට ඇදහිල්ලේ යාච්ඤාවේ හා නිරාහාරව සිටීමේ වැදගත්කම පැහැදිලි වේ. එමෙන්ම ඇතැම් යක්ෂයන් පලවා හැරීම අසීරු බවද මින් පෙන්නුම් කෙරේ. යාච්ඤාවෙන් හා නිරාහාරව සිටීමෙන් මිස **මේ ජාතිය** දුරු කරන්ට නුපුළුවනැයි යේසුස්වහන්සේ පැවසුවේ ඒ නිසාය.

**සිද්ධිය :** සිනගෝගයේ සිටි යක්ෂයා (මාක් 1:23-28; ලූක් 4:31-37)

**සාරාංශය :** මේ මිනිසා සිනගෝගයේ සිටියද යේසුස්වහන්සේ ඔහු ආබ්‍රහම්ගේ පුත්‍රයෙකු හෝ දෙවියන්වහන්සේගේ අනුගාමිකයෙකු හෝ ලෙස හඳුන්වන්නේ නැත. යක්ෂාවේශ වූ හා නොඇදහිලිවත් අය සභාවේ සිටිය හැකිය. දේව මෙහෙයකට පැමිණීමෙන් නැවත ඉපදීම අත්දකින බවක් හෝ යක්ෂ බලවේග වලින් නිදහස් වන බවක් හෝ පෙන්නුම් නොකෙරේ.

මෙහි "අපෙන්" යන වචනයෙන් පෙන්නුම් කෙරෙන්නේ එක් යක්ෂයෙකුට වඩා ආවේශ වී සිටි බවකි. කතා කළේ එක් යක්ෂයෙකි. මන්ද ඔහු "දනිමි"යි පැවසූ බැවිනි.

යක්ෂයා කතා කිරීම ඇරඹූ විට "කථා නොකරව"යි යේසුස්වහන්සේ පැවසූසේක. උන්වහන්සේ යක්ෂයන්ට තරවටු කළසේක. එවිට ඔවුහු මේ මනුෂ්‍යයාව තදින් වෙවුලවා, බිම හෙළා, මහත් හඬකින් මොරගසා පිටවූහ. මේ සිද්ධිය දුටු අය යේසුස්වහන්සේ අශුද්ධාත්ම සමග ක්‍රියා කළ ආකාරය දැක උන්වහන්සේගේ බලය හා ආධිපත්‍යය ගැන පුදුම වූවෝය.

**සිද්ධිය :** යක්ෂාවේශවූ අන්ධ ගොළුවා (මතෙව් 12:22-29; මාක් 3:22-27; ලූක් 11:14-22)

**සාරාංශය :** මෙම ආවේශ වීමෙහි අන්ධවීමේ හා ගොළු වීමේ ශාරීරික දුබලතාව අන්තර්ගතය. යේසුස්වහන්සේ යක්ෂයා ඔහුගෙන් පලවා හැරීමෙන් ඔහුව සුව කළසේක. මුදවාගැනීමෙන් පසු ඔහුට කතා කිරීමට හැකිවිය. පෙනීම ලැබීය. යක්ෂයන් පලවා හැරීම පිළිබඳව උන්වහන්සේගේ දීර්ඝතම ඉගැන්වීම යේසුස්වහන්සේ කරන ලද්දේ මෙතැනදී වේ. එම ඉගැන්වීම් සාරාංශයෙන් පහත දැක්වෙන දේ එළිදරව් වේ.

- බෙදුම් සහිත නිවසකට පැවතිය නොහැකිය. යක්ෂයෝ තමන් වෙසෙන ශ×රයන් "නිවෙස්" ලෙස හඳුන්වති. යක්ෂයන්ටත් දෙවියන්වහන්සේගේ ආත්මයටත් එකම නිවසේ සිටීම කෙසේවත් කළ නොහැකිය.
- බෙදුනු රාජධානි වලට හා නගර වලටද පැවතිය නොහැකිය.
- සාතන්ට සාතන්වම පලවා හැරිය නොහැකිය.
- යක්ෂයන් පලවා හැරීම දේව රාජ්‍යයේ එක් සේවයකි.

- යක්ෂයන් පලවා හරිනු ලබන්නේ දෙවියන්වහන්සේගේ ආත්මයෙනි.
- ශක්තිමත් මිනිසා (සාතන්) බැඳ තැබීම, ඔහුව පලවා හැරීමට පෙර අවශ්‍ය වේ.
- මෙම ආත්මික සටනේදී අපක්ෂපාති භූමියක් නැත. ඔබ යේසුස්වහන්සේ සමග නොවේ නම් ඔබ උන්වහන්සේට විරුද්ධය.
- අශුද්ධාත්මයක් යම් පුද්ගලයෙකුගෙන් පලවා හැරිය විට නැවතත් එම ශරීරයට ඇතුළු වීමට එම ආත්මය උත්සාහ කරයි.
- යක්ෂයාව පලවා හරිනු ලැබූ පුද්ගලයා ඔහුගේ ආත්මික නිවාසය පුරවා නොගතහොත් යක්ෂයා තවත් යක්ෂයන් සමග පැමිණෙනු ඇත. ඔහුගේ අවසාන තත්වය මුල් තත්වයට වඩා භයානක වනු ඇත.

**සිද්ධිය :** ගෙරසේනයේ යක්ෂාවේශවූ මිනිසා (මාක් 5:1-20; මතෙව් 8:28-34; ලූක් 8:26-34)

**සාරාංශය :** මතෙව් ශුභාරංචිය අනුව යක්ෂාවේශ වූ ඉතා රෞද්‍ර මනුෂ්‍යයන් දෙදෙනෙක් සොහොන් ගෙවල් වල විසුවෝය. ඔවුන්ව පාලනය කිරීමට කිසිවෙකුට නොහැකි විය. මාක් හා ලූක් අවධාරණය කරන්නේ මේ දෙදෙනාගෙන් එක් කෙනෙක් ඇතැම්විට ඉතා බරපතල තත්වයේ සිටි ආකාරයත් යේසුස්වහන්සේ මුදාගත් ආකාරයත් ගැනය.

මෙහි යක්ෂයෝ බොහොමයක් ආවේශව සිටියහ. දෙදෙනාටම බලපෑම් තිබූ බැවින් සාමාන්‍ය සමාජයේ ජීවත් වීමට ඔවුන්ට නොහැකි විය. ඔවුහු සොහොන් ගෙවල් වල ජීවත්වූහ. එක් මිනිසෙකු තුළ වූ යක්ෂයා ඔවුන්ව "ලෙගියොන්" ලෙස හැඳින්විය. මන්ද ඔවුන් බොහෝ දෙනෙකු වූ බැවින්ය. දම්වැල් වලින්ද ඔවුන් බැඳ තැබිය නොහැකි විය. යකුන් ඔහුට කෙතරම් දුක් දුන්නේද යත් ඔහු මොර ගසමින්, ගල් වලින් කපා ගනිමින්, නිර්වස්ත්‍රව සෑමතැනම දිව ගියේය.

යක්ෂයෝ යේසුස්වහන්සේ හැඳිනගෙන නියමිත කාලයට පෙර ඔවුන්ට දුක් දීමට උන්වහන්සේ පැමිණිසේක්දැයි ඇසුවෝය. "ඔවුන්ගේ කාලය" යනුවෙන් හැඳින්වෙන්නේ ගිනි විලේ (නිරයේ) අවසාන විනිශ්චයේ කාලය වේ. රටින් පිට නොකරන ලෙස ඉල්ලීමෙන් පෙන්නුම් කෙරෙන්නේ සාතන් යක්ෂයන්ට විශේෂිත පෙදෙස් වෙන්කර ඇති බවකි. යේසුස්වහන්සේ ඔවුන්ට ඌරු රැළකට ආවේශ වීමට අවසර දුන්සේක. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඌරු රැළ මුහුදේ වැටී ගිලී මළෝය. එබැවින් යේසුස්වහන්සේට එම ස්ථානයෙන් පිටවන ලෙස සෙනග ඉල්ලිය' යක්ෂ බලවේග වලින් මිනිසුන් මුදවාගැනීමට වඩා ඔවුන්ට ඔවුන්ගේ ජීවිකාව ගෙන යාමට උපකාර වූ ඌරු රැළ ඔවුන්ට වටින ලදි.

**අනෙකුත් සිදුවීම් :** මේ විශේෂිත අවස්ථාවන්ට අමතරව යේසුස්වහන්සේ යක්ෂයන් පිළිබඳව කටයුතු කළ පොදු අවස්ථාවන් බයිබලයේ සඳහන්ව ඇත.

- පහත දැක්වෙන් යොමුකිරීම්වල "සුව කිරීම" යන පදය භාවිත කර ඇත්තේ යේසුස්වහන්සේ යක්ෂයන් සමග කටයුතු කළ ආකාරය විස්තර කිරීමට වේ: මතෙව් 4:24; ලූක් 6:18.
- පහත දැක්වෙන යොමුකිරීම් වල "පහ කිරීම" යන පදය භාවිත කර ඇත්තේ උන්වහන්සේගේ උපක්‍රමය විස්තර කිරීමට වේ: මාක් 1:32-34, 39; 6:13.
- ලූක් 4:41හි සඳහන් වන්නේ යක්ෂයෝ "දුරුවුණෝය" යනුවෙනි. ලූක් 7:21හි සඳහන් වන්නේ උන්වහන්සේ ඔවුන් "සුවකළ" බවය. මතෙව් 8:16හි වාර්තා වන්නේ උන්වහන්සේ "වචන මාත්‍රයකින් ආත්මයන් දුරු කළසේක" යනුවෙනි.
- මාක් 16:9හි හා ලූක් 8:2-3හි යේසුස්වහන්සේ මග්දලායේ මරියාගෙන් යක්ෂයන් සත්දෙනෙකු දුරු කළ බව සඳහන් වේ.

2. සමහර අවස්ථා වල දෙවියන්වහන්සේ යක්ෂයන්ව තම පරමාර්ථයන් ඉටු කිරීමට භාවිත කරනසේක. 1 සාමුවෙල් 16:14 හා 2 කොරින්ති 12:7 බලන්න. දුෂ්ට ආහබ්ට දෙවියන්වහන්සේ දඬුවම් දුන්නේ දිවැසිවරයාගේ මුඛයට දෙවියන්වහන්සේ බොරුකීමේ ආත්මයක් දමා ඔහුගේ විනාශය කරා ගෙනයෑමෙන්ය. 1 රාජාවලිය 22:23 බලන්න. යක්ෂයන්, හර්මගෙදොන්හි හමුදාවන් ඒ හා සමාන ඉරණමකට පොළඹවනු ඇත (එළිදරව් 16:13-16 බලන්න).

3. යක්ෂයන් බලවේග වලට ජාතීන් මෙන්ම පුරුෂයන් හා ස්ත්‍රීන්ව පාලනය කිරීමටද හැකිවනු ඇත. දානියෙල් 10 සඳහන් "පර්සියාවේ රාජධානියේ කුමාරයා" යන නිදසුන බලන්න. මෙම යක්ෂ බලවේගය මෙම ප්‍රදේශයේ කටයුතු පාලනය කරන බවක් පෙනේ. ජාතීන්ට අදාළව යක්ෂ ආත්ම හා ඔවුන්ගේ කටයුතු එළිදරව් පොතේ සඳහන් වේ. එළිදරව් 16:13-16 බලන්න.

4. යක්ෂයන් හා සාතන් පිළිබඳව විසුළු කිරීම ප්‍රඥාවන්ත නොවේ. 2 පේතෘස් 2:10-11 බලන්න. එමෙන්ම සාතන්ට තරවටු කිරීමේ බලයද අපට නැත. යූද් 9 බලන්න.

5. යක්ෂයන් පලවා හැරීමේ බලය යේසුස්වහන්සේ තම ගෝලයන්ට දුන්සේක. ඔවුන් බලය භාවිත කළ ආකාරය පිළිබඳව පහත දැක්වෙන වාර්තා කියවන්න. මාක් 9:38; ලූක් 10:17; ක්‍රියා 5:16; 8:7; 16:16-18; 19:11-12.

6. "ආවේශවීම" යන වචනය භාවිත කරන පහත දැක්වෙන යොමු කිරීම් අධ්‍යයනය කරන්න. මතෙව් 4:24; 8:16, 28, 33; 9:32; 12:22; මාක් 1:32; 5:15-18; ලූක් 8:36; ක්‍රියා 8:7; 16:16.

7. යේසුස්වහන්සේ පීඩා විඳිසේක. එහෙත් පාපයක් නොමැතිවය. යෙසායා 53:7 හෙසකියා පීඩාවන්ට භාජනය වූ විට ඔහු දෙවියන්වහන්සේගෙන් ඔහු වෙනුවෙන් ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටියේය. යෙසායා 38:14. යක්ෂයාගෙන් පීඩා විඳි සියලුදෙනාවම යේසුස්වහන්සේ සුවකළෙසේක. ක්‍රියා 10:38.

   පීඩාවන් පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන්න.

   - නපුරු අයගෙන් : ගීතාවලිය 17:9
   - සතුරන්ගෙන් : ගීතාවලිය 106:42
   - උඩඟු අයගෙන් : ගීතාවලිය 119:122
   - පොහොසතුන්ගෙන් : යාකොබ් 2:6

# විසි දෙවන පරිච්ඡේදය

## යුද්ධයෙන් අනතුරට පත්වූවෝ

**අරමුණු:**

මෙම පරිච්ජේදය අධ්‍යයනයෙන් පසු ඔබට ...

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දුක්විඳීම ලෝකයට ඇතුළු වූ ආකාරය පැහැදිලි කිරීමට
- ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයට දුක්විඳීම ඇතුළුවන ආකාර පහක් හඳුනාගැනීමට
- දුක්විඳීම පිළිබඳ නිවැරදි ආකල්පය අවබෝධ කරගැනීම පෙන්වීමට
- දුක්විඳීමේ ධනාත්මක වාසි හඳුනාගැනීමට
- දෙවියන්වහන්සේගේ කැමැත්ත තුල හෝ කැමැත්තෙන් පිටත කුණාටුවක් තුළින් ගමන් කිරීමේ වෙනස පැහැදිලි කිරීමට

හැකිවනු ඇත.

### යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය :

**ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ යහපත් භේවායෙකු මෙන් දුක්විඳීමට පංගුකාරයෙක් වෙයන්න. (2 තිමෝති 2:3)**

## හැඳින්වීම

සෑම ස්වභාවික යුද්ධමයකම අනතුරට පත්වූවෝ සිටිති. ඒ සටනේදී තුවාල ලද සෙබලුන් වේ. සමහරු නැවතත් සුවය ලබා යුද පිටියට යති. සමහර අය සදහටම තුවාල ලද්ෙ ් වෙති. අප යෙදී සිටින ආත්මික යුද්ධය පිළිබඳවද මෙය සත්‍යයකි. කිතුනු සොල්දාදුවෝ සාතන්ගේ ප්‍රහාර වලින් මිදුණු අය නොවෙති. එමෙන්ම දුක්විඳීමෙන් ඔවුන් නිදහස් කර නැත.

අපි බොහෝ දෙනෙක් දුක්විඳීම පිළිබඳව කතා කිරීමට නොකැමැත්තෙමු. මේ විෂය පිළිබඳ දේශනා අපට වැඩිපුර ඇසෙන්නේ නැත. අප ආශා කරන්නේ ජයග්‍රහණය හා සමෘධිය පිළිබඳ පණිවිඩ වලට වේ. ඒවා දෙවියන්වහන්සේගේ එළිදරව් වීමේ අංගයක් බැවින් ඒවා යහපත්ය. එහෙත් දුක්විඳීම පිළිබඳ විෂය අප මගහරින්නේ අවබෝධ කරගැනීමටත් පැහැදිලි කිරීමටත් අසීරු දේ එහි ඇති බැවිනි. එහෙත් බයිබලය බහුලවූ ජීවිතය පිළිබඳ පමනක් පොරොන්දු ඇතුළත් පොතක් නොවේ. එය ධර්මිෂ්ඨවූවන්ට හා අධර්මිෂ්ඨවවන්ට අයත් දුක්විඳීම පිළිබඳ වාර්තාවක්ද වේ.

යේසුස්වහන්සේ මෙම පොළොවේ ජීවත් වූ කාලයේ උන්වහන්සේ කුරුසියේදී මුහුණ දෙන දුක්විඳීම පිළිබඳව කතා කළ විට උන්වහන්සේගේ අනුගාමිකයෝ බොහෝ දෙනෙක් උන්වහන්සේ අතහැර ගියහ (යොහන් 6:55-66). ඔවුන් අපේක්ෂා කළේ මෙසියස්වහන්සේ බලයෙන් හා මහිමයෙන් යුක්තව රජ කිරීම වේ. එහෙත් ඒ වෙනුවට උන්වහන්සේ දුක්විඳීම ගැන කතා කළසේක. ඔවුන්ට එය තේරුම්ගත නොහැකි විය. එම නිසා ඔවුහු උන්වහන්සේ අනුගමනය නොකළහ. ඔබටද දුක්විඳීම අවබෝධ කරගත නොහැකි නම් ඔබ අමාරු අවස්ථාවන්ට මුහුන දෙන විට ඔබද යේසුස්වහන්සේ අනුගමනය නොකරනු ඇත. ඔබ ජයග්‍රාහකයෙකු වෙනුවට යුද්ධයෙන් අනතුරට පත්වන්නෙකු වනු ඇත.

මේ පාඩමෙන් උගන්වනු ලබන්නේ "යුද්ධයෙන් අනතුරට පත්වූවෝ" ගැනය. ඔවුන් සටන් කිරීමේදී තුවාළ ලැබූ අය වේ. මේ පාඩමේදී ඔබ ඔබගේම දුක්විඳීම පිළිබඳව කටයුතු කිරීමට ඉගෙන ගන්නවා පමණක් නොව අසීරුතා අත්දකින අනෙක් අයටද සේවය කිරීමට ඉගෙන ගන්නෙහිය.

## දුක්විඳීමේ ප්‍රභවය

දෙවියන්වහන්සේ දුක්විඳීම මැව්වේ නැත. එය මුලින් ඇතුළු වූයේ සාතන් විසින් පොළඹවන ලදුව හා මිනිසා විසින් කරන ලද පාපය තුළිනි (උත්පත්ති 3). මනුෂ්‍යයා සාතන්ගේ පරීක්ෂාවන්ට ගොදුරු වී පව් කළ විට දුක්විඳීම ලෝකයට ඇතුළු විය. එබැවින් සියලු දුක්විඳීම්වල ප්‍රතිඵලය වූ පාපය එහි නිර්මාතෘ වූ සාතන්ට දක්වා පෙන්විය හැකිය. පාපය ඔබගේ ජීවිතයට ඇතුළු වීමට හේතු බොහොමයක් තිබුණද සියලුම පාප එහි ප්‍රභවය වෙත ගෙන යාමට පුළුවන. එහෙත් කිතුනු සොල්දාදුවෙකුගේ ජීවිතයේ දුක්විඳීම දෙවියන්වහන්සේට බාරගත හැකිය. සාතන් බලාපොරොත්තු වූයේ ඉන් නපුරක් වුවද දෙවියන්වහන්සේට එය යහපතට හැරවිය හැකිය. දුකට පත්වන්නෙක් ජයග්‍රාහකයෙකු කිරීමට උන්වහන්සේට පුළුවන.

## දුක්විඳීමට හේතුව

දුක්විඳීම, ගැටළු හා පීඩාවන් ගැන බයිබලයේ බොහෝ දේ සඳහන් වේ. එහි ඉගැන්වීම් සාරාංශගත කරන විට ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයට දුක්විඳීම ඇතුළු වන ආකාර පහක් අපට සොයාගත හැකි වේ. ජීවිතයේ ඔබ මුහුණ දෙන ඕනෑම දුක් විඳීමක් මේ පහෙන් එකකට අයත් වේ.

### ඔබ වටා සිටින අනෙක් අය :

දුක්විඳීම හා ජීවිතයේ අසිරු අවස්ථාවන් ඔබ වටා සිටින අයගෙන් පැමිණිය හැකිය. මේ ආකාරයේ දුක්විඳීම පිළිබඳ නිදර්ශනයක් යෝසෙප් වේ. ඔහුගේ කිසිදු වරදක් නොමැතිව යෝසෙප්ව ඔහුගේ සහෝදරයන් විසින් මිසරයට විකුණන ලදි. එහිදී පොතිපර්ගේ බිරිඳ විසින් බොරු වරදකට ඔහුව සිරගත කළාය. සිරගෙදරදී ඔහු උපකාර කළ අයට ඔහුව අමතක විය. එහෙත් යෝසෙප්ගේ ප්‍රතිචාරයට සවන්දෙන්න.

> **නුඹලා මේ රටට මා වික්ක නිසා ශෝකනොවෙල්ලා, නුඹලාටම කෝපනොවෙල්ලා. මක්නිසාද දෙවියන්වහන්සේ ජීවිත ආරක්ෂා කරන පිණිස නුඹලාට පෙරටුව මා එවූසේක. දෙවියන්වහන්සේ නුඹලා පොළොවෙහි ඉතිරි කරන පිණිසද මහත් වූ ගැළවීමකින් නුඹලාගේ ජීවිත ආරක්ෂා කරන පිණිසද නුඹලාට පෙරටුව මා එවූසේක. (උත්පත්ති 45:5, 7)**

කිතුනු සොල්දාදුවෙකුට තමා වටා සිටින අයගෙන් දුක්විඳීම් පැමිණෙන්නේ බයිබලය "නපුරු වාර්තා" හෙවත් කටකතා ලෙස හැඳින්වෙන දේ තුළිනි. බොහෝ දුක්විඳීම් පැමිණෙන්නේ ඔබ අන් අය පිළිබඳව පවසන දේ තුළින් හා අන් අය ඔබ පිළිබඳව පවසන දේ තුළිනි. ඔබ මෙම පාඩමාලාවෙන් උගත් පරිදි දිව ඉතා බලගතු ආයුධයක් වන අතර ඉන් කතා කරන දේ මගින් බොහෝ අය යුද්ධයෙන් අනතුරට පත්වන්නෝ වෙති.

### ජීවිතයේ අවස්ථාවන් :

ඔබට දුක්විඳීම් පැමිණෙන දෙවැනි ක්‍රමය වන්නේ ජීවිතයේ අවස්ථාවන්ගෙනි. බයිබලයේ රූත් පොතේ සඳහන් නයෝමිගේ අත්දැකීම්වලින් මෙය පැහැදිලි කෙරේ. ඇගේ ස්වාමි පුරුෂයාගේ හා පුත්‍රයන්ගේ මරණයෙන් ඇය දුකට පත්වූවාය.

යේසුස්වහන්සේ නැවත පැමිණ මරණයේ අවසාන සතුරා ජයගන්නා තුරු මරණය ජීවිතයේ කොටසක් වේ. මරණය මිනිසාගේ මුල් පාපය තුළින් ඇතුළු විය. එය අප සියලු දෙනා මුහුණ දෙන ස්වාභාවික අවස්ථාවක් වේ. "එක වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබේ" (හෙබ්‍රෙව් 9:27).

නයෝමි ජීවිතයේ මේ අසිරු අවස්ථාවන්ට මුහුණ දෙන විට "මට තවදුරටත් නයෝමි (ඉන් අදහස් වන්නේ ආශිර්වාද ලත් යන්නය) යයි නොකියන්න, මට මාරා යයි කියන්න" යයි කීවාය. මාරා යන නමේ තේරුම "තිත්ත" යන්න වේ. නයෝමි තිත්ත වතුරට මුහුණ දුන්නාය.

## ඔබගේ සේවය :

දුක්විඳීමේ තෙවැනි හේතුව ඔබ ස්වාමින්වහන්සේට කරන සේවය නිසා වේ. උන්වහන්සේගේ නාමය නිසාත් (ක්‍රියා 9:16) ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙනුත් (පිලිපි 1:29) දේව රාජ්‍යය වෙනුවෙනුත් (2 තෙසලෝනික 1:5) ශුභාරංචිය උදෙසාත් (2 තිමෝති 1:11-12) හොඳින් වැඩ කිරීම නිසාත් (1 පේත්‍රුස් 2:19-20: 3:17) "ධ¾මිෂ්ටකම නිසාත්(1 පේත්‍රුස් 3:14)"ls;=ne;sfhla නිසාත්(1 පේත්‍රුස් 4:15-16)" හා දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුවත් (1 පේත්‍රුස් 4:19) දුක් විඳීමට සිදුවේ.

පාවුල්තුමා සේවය නිසා දුක්විඳීමට සිදුවූ කෙනෙක් වේ . ඇතැම් අය දුක්විඳීම ගැන සිතන්නේ එය අසාර්ථක වීමේ හෝ ඇදහිල්ල මද කමේ ලකුණක් ලෙසය. මෙය සත්‍යයක් නම් පාවුල්තුමාට ඇදහිල්ලක් නොතිබුණු අතර සභාවේ අසාර්ථකම වූ තැනැත්තා ඔහු වේ. ආසියාවේ සිටියදී තමා කෙතරම් පොඩි වී සිටියේද යත් ජීවිතය ගැන පවා බලාපොරොත්තුවක් නොතිබූ බව පාවුල්තුමා පැවසිය (2 කොරින්ති 1:8). ඇදහිලිවතුන්ට සමෘධිය හා සාමය පමණක් පොරොන්දු වන එවැන්ජලිස්තවරුන්ට වඩා හාත්පසින්ම වෙනස් පින්තූරයක් ඔහු ඉදිරිපත් කළේය.

දෙවියන්වහන්සේගේ සේවයට පාවුල්තුමාව පළමුව කැඳවූ විට ස්වාමින්වහන්සේ වෙනුවෙන් විඳීමට සිදුවන "බොහෝ දේ" ඔහුට පවසන ලදි. දුක්විඳීම පිළිබඳව පාවුල්තුමාගේ ප්‍රතිචාරය වූයේ "කීප දෙනෙකුව ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන ඒමට සියල්ල නැතිවීම" දරාගත යුතු බවය. ඔහු ඇදහිලිවතුන්ට මෙසේ ලිවේය. "ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්නට පමණක් නොව උන්වහන්සේ උදෙසා දුක් විඳින්ටත් වරප්‍රසාදය දෙන ලද්දේය" (පිලිප්පි 1:29) යනුය.

සේවය උදෙසා දුක් වින්දේ පාවුල්තුමා පමණක් නොවේ. නව ගිවිසුම් යුගයේ මුළු සභාවම දුක් වින්දෝය (ක්‍රියා 8). ඔවුන් මුහුණ දුන්නාවූ කෲර පීඩාවන් පිළිබඳව හෙබ්‍රෙව් 11 පරිච්ඡේදයේ වාර්තා කර ඇත. මේ බොහෝ ඇදහිලිවන්ත පුරුෂයෝ හා ස්ත්‍රීහු දෙවියන්වහන්සේගේ බලයෙන් ගළවන ලද්දෝය. සිර ගෙවල්වල දොරවල් විවෘතව ඔවුහු පිටතට ගියහ. ගිනි උදුන්වල දවා මැරීමට නියම කළද ගිනිදැල් වලින් ඔවුන්ට හානියක් සිදු නොවීය.

එහෙත් "ඇදහිල්ලේ" පුරුෂයන් හා ස්ත්‍රීන් ලෙස හැඳින්වෙන සමහර ඇදහිලිවන්තයන් එවැනි ගැළවීමක් ලැබුවේ නැත. ඔවුන්ව සිරගත කොට පීඩා කර වධ දී ඇතැම් විට ශුභාරංචිය වෙනුවෙන් සාක්ෂි දීම නිසා ජීවිතය පවා පරිත්‍යාග කිරීමට සිදුවිය (හෙබ්‍රෙව් 11:36-40). අප අවධානය යොමු කරන්නේ ජීවත්වන ඇදහිල්ල කෙරෙහිය. එහෙත් දෙවියන්වහන්සේ මරණයේ ඇදහිල්ලේදීද උන්වහන්සේගේ බලය එළිදරව්කරනසේක. මෙය අයහපත් කාල වලදී නොසෙල්වන ඇදහිල්ලක් වන අතර යහපත් කාල වලදී ප්‍රකාශ වල ශ්‍රේෂ්ඨ ගැළවීමක් නොවේ.

## සාතන්ගේ සෘජු ක්‍රියාකාරකම් :

සාතන්ගේ සෘජු ක්‍රියාකාරකම් නිසාද දුක්විඳීම ඔබගේ ජීවිතයට ඇතුළු විය හැකිය. යෝබ්ගේ කතාවෙන් මෙය පැහැදිලි වේ. මෙම පොත "ධර්මිෂ්ඨයන් දුක්විඳින්නේ මන්ද?" යන ප්‍රශ්නය සමග පොර බදයි.

යෝබ් පිළිබඳව දෙවියන්වහන්සේගේ සාක්ෂිය වූයේ ඔහු ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු බවය (යෝබ් 1-2). ඔහු ඔහුගේ මිත්‍රයන් පැවසූ පරිදි පව් කළ නිසා දුක් විඳි කෙනෙකු නොවේ. යෝබ් පසුතැවිලි වුවහොත් මේ දේවල් වෙනස් විය හැකි බවට මිත්‍රයන් විශ්වාස කළහ. පුද්ගලික අත්දැකීම් මත පදනම් වූ විශ්විය දෙයක් යෙදීමට ඔහුගේ මිත්‍රයෝ උත්සාහ කළහ. එය දෙවියන්වහන්සේ පේත්‍රුස්ව සිරගෙයින් නිදහස් කළ නිසා ඔබටද එසේම කරනු ඇත යන ප්‍රකාශය හා සමාන දෙයකි. එය සැබෑවක් නොවේ. බොහෝ දෙනෙකුට ශ්‍රේෂ්ඨ ඇදහිල්ලක් හා පාප රහිත ජීවිතයක් තිබියදී පවා සිර ගෙයෙහිදී ජීවිත පරිත්‍යාග කිරීමට සිදුවිය.

අන් අය දුක්විඳින විට ඊට හේතුව පාපය, ඇදහිල්ල නොමැති කම හා අවිශ්වාසය නිසා බවට චෝදනා කිරීම ගැන අප ප්‍රවේසම් විය යුතුය. පාපිෂ්ඨ මනුෂ්‍යයෙක් මාංසික තෘෂ්ණාවන්ට වැපිරීම නිසා තිත්ත වූ අස්වැන්නක් නෙළාගන්නා බව දේව වචනය අපට උගන්වයි (ගලාති 6:8). එහෙත් ධර්මිෂ්ඨයාගේ දුක්විඳීම තේරුම් කිරීම පිණිස වැපිරීම හා නෙළාගැනීමේ මූලධර්මය භාවිතා කළ නොහැකිය.

යෝබ් ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් විය. ඔහුට දුක්විඳින්ට සිදුවූයේ ඔහු කළාවූ වරදක් හේතුකොටගෙන නොවේය. යෝබ් පිළිබඳ දෙවියන්වහන්සේගේ සාක්ෂියත් තමා පිළිබඳවම යෝබ්ගේ සාක්ෂියත් මනුෂ්‍යයන් ඉදිරියේ ඔහුගේ ගෞරවයත් මෙය වේ. ආත්මික ලෝකය පසුපස යෝබ්ගේ දුක්විඳීමට සැබෑ හේතුව ඇත. යෝබ්ගේ හදවත, මනස හා යෝබ්ගේ භක්තිය පිළිබඳව ආත්මික සටනක් පැවතිණි.

ඔබ පිළිබඳවද ආත්මික ලෝකයේ සටනක් පවතී. එම සටන සාමාන්‍ය ලෝකයේ ඔබ අත්දකින අසිරු අවස්ථාවන් තුලින් ප්‍රකාශ වේ. යෝබ්ගේ දුක්විඳීම තුළ දක්නට ලැබෙන වැදගත් සත්‍යයක් වන්නේ දෙවියන්වහන්සේගේ අනුදැනුමක් නොමැතිව ඇදහිලිවන්තයෙකුගේ ජිවිතය තුළට කිසිවක් ඇතුළු විය නොහැකි බවය. දෙවියන්වහන්සේ ඔබගේ දුක් විඳීමේ මුල නොවේ. එය සාතන් විසින් කරන දෙයක් වන අතර එහි සීමාවන් දෙවියන්වහන්සේ පනවයි. දෙවියන්වහන්සේගේ බලය සාතන්ගේ බලයට වඩා වැඩිය. ඔබ නොකඩවා උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්නෙහි නම් ඔබට ජයග්‍රහණය අත්දැකිය හැකිය.

## ඔබගේම පාපය :

පාපය ඔබගේ ජිවිතයට ඇතුළුවන පස්වන ක්‍රමය නම් ඔබගේම පාපය නිසා වේ. එවැනි දුක් විඳීමකට නිදසුනක් යෝනා වේ. යෝනා දෙවියන්වහන්සේට අකීකරු වෙමින් ඔහුට ගොස් පශ්චාත්තාප වීම දේශනා කිරීමට අණ දුන් නිනිවයට නොව ඊට විරුද්ධ දෙසට ගියේය. ඔහු මුහුදේදී තදබල කුණාටුවකට මුහුණ දුන් අතර අවසානයේදී තමාගේම පාපය නිසා විශාල මාළුවෙකුගේ බඩ තුළ සිටීමට සිදුවිය (යෝනා 1-2).

කරදරයක් ගැන සැමවිටම සිතිය යුත්තේ එය ඔබගේ මාර්ග පරීක්ෂා කිරීමට හා ඔබගේ හදවත දෙවියන්වහන්සේ ඉදිරියේ විමසීමට මගක් ලෙසිනි. උන්වහන්සේගේ වචනයට අකීකරු වන්නන්ට දෙවියන්වහන්සේ දඬුවම් කරන බව බයිබලය එළිදරව් කරයි. දඬුවම් කිරීම යනු හික්මවීමට, තරවටු කිරීම හා නිවැරදි කිරීම වේ.

> **කිසි දඬුවමක් ලබන කල ඒක ශෝකයට මිස ප්‍රීතියට කාරණාවක් මෙන් පෙනෙන්නේ නැත. නුමුත් පසුව එයින් පෙළුණු තැනැත්තන්ට ධර්මිෂ්ඨකමේ සමාදාන ඵල හටගන්නේය. (හෙබ්‍රෙව් 12:11)**

දෙවියන්වහන්සේ ඔබව නිවැරදි කිරීමට හා නැවතත් ඔබගේ ජිවිතය දෙවියන්වහන්සේගේ කැමැත්තට ගෙනඒමට දුක්විඳීම භාවිත කරන සේක.

> **මට විපත්ති පැමිණෙන්ට පළමුවෙන් මුළාව ගියෙමි; නුමුත් දැන් ඔබගේ වචනය පවත්වමි.**
> **ඔබගේ පනත් ඉගෙන ගන්නා පිණිස මට විපත්ති පැමුණුණා යහපති.**
> **ස්වාමිනි, ඔබගේ විනිශ්චයන් ධර්මිෂ්ඨ බවත් විශ්වාසකමින් ඔබ මට පීඩා කළ බවත් දනිමි.**
> (ගීතාවලිය 119:67, 71, 75)

## දුක්විඳීම කෙරෙහි ඇති නිවැරදි ආකල්පය :

කරදර ඇතිවීම අවශ්‍යයෙන්ම දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් ඇත්වීමේ ලකුණක්ම නොවේ. බයිබලය මෙසේ පවසයි. "ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය" (ගීතාවලිය 34:19). ඔබගේම පාපයක් නොමැතිව ඔබ අහිංසකව දුක්විඳින විට ඔබ දුක්විඳීම කෙරෙහි නිවැරදි ආකල්පයක් ඇති කරගත යුතුය. ඔබගේ ආත්මික බවේ සැබෑ පරීක්ෂාව වන්නේ විපත්තියේදී ඔබ දක්වන ප්‍රතිචාරය වේ.

> **නුඹ විපත්ති දවසෙහි කලකිරෙන්නෙහි නම් නුඹේ ශක්තිය අල්පය.** (හිතෝපදේශ 24:10)

දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ දුක් විඳින විට ඔබට තිබිය යුතු ආකල්පය බයිබලියේ විස්තර කර ඇත. ඔබ ලජ්ජා විය යුතුය.

> **නුමුත් යමෙක් ක්‍රිස්තියානිකාරයෙකු මෙන් දුක්විඳී නම්, ඔහු ලජ්ජා නොවී, ඒ නාමය සම්බන්ධයෙන් දෙවියන්වහන්සේට ගෞරව කරාවා.** (1 පේත්‍රුස් 4:16)

ඔබගේ ආත්මය (ඔබගේ දුක්විඳීම) ඔබ දෙවියන්වහන්සේට කැප කළ යුතුය. උන්වහන්සේ සියල්ල කරන්නේ ඔබගේ යහපතට බව ඔබ දන්නෙහිය.

> **එබැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක් විඳින්නෝ යහපත කරමින්, විශ්වාස මැවුම්කාරයාණන්ට තමුන්ගේ ආත්ම භාරදෙත්වා. (1 පේත්‍රුස් 4:19)**

ඔබ දෙවියන්වහන්සේගේ කැමත්ත පරිදි දුක්විඳින විට ඔබ සන්තෝෂ විය යුතුය.

> **එහෙයින් ඔව්හු ඒ නාමය නිසා නින්දා විඳින්ට තුමූ වටින්නෝයයි ගණන්ගනු ලැබූ බැවින් සන්තෝෂව, සභාව ඉදිරියෙන් පිටත්ව ගොස් ... (ක්‍රියා 5:41)**

පාවුල්තුමා මෙසේ පවසයි.

> **බලාපොරොත්තුවෙහි ප්‍රීතිවෙයල්ලා; දුකේදී ඉවසිලිවන්තව සිටපල්ලා; යාච්ඤාවෙහි නොකඩව පැවතියල්ලා. (රෝම 12:12)**

> **නින්දා ලබන කල අපි ආශිර්වාදකරමුව; පීඩා ලබන කල අපි ඉවසමුව. (1 කොරින්ති 4:12)**

> **අපගේ සේවයට දෝෂ නොපැමිණෙන පිණිස කිසිවකින් බාධාවට කිසි ප්‍රස්තාවක් නොදී බොහෝ ඉවසීමෙන්ද පීඩාවලින්ද හිඟකම්වලින්ද විපත්තිවලින්ද ... (2 කොරින්ති 6:4)**

> **එබැවින් අපගේ ස්වාමින්වහන්සේගේ සාක්ෂිය ගැනවත් උන්වහන්සේගේ හිරකාරයෙක් වන මා ගැනවත් ලජ්ජා නොවී, දෙවියන්වහන්සේගේ බලයේ ප්‍රකාරයට ශුභාරංචිය නිසා මා සමග දුක් විඳපන්න. (2 තිමෝති 1:8)**

> **මක්නිසාද අප දුක් විඳීමට නියමව තිබෙන බව නුඹලාම දනිහුය. මක්නිසාද අප දුක්විඳීමට සිටින බව නුඹලා සමග සිටියදී කලින් නුඹලාට කීවෙමුව. (1 තෙසලෝනික 3:3-4)**

> **නුමුත් නුඹ සියලු කාරණා වලදී සිහි ඇතුව සිටපන්න, දුක් ඉවසාපන්න, ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකුගේ වැඩේ කරපන්න, නුඹේ සේවය සම්පූර්ණ කරපන්න.
> (2 තිමෝති 4:5)**

ඔබ දුක්විඳීම අත්දකින විට එය පුදුමයක් යයි නොසිතන්න.

> **ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධවෙන්නාක් මෙන් පුදුම නොවෙල්ලා. නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ එළිදරව් වීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස උන්වහන්සේගේ දුක් විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙයල්ලා.
> (1 පේත්‍රුස් 4:12-13)**

දුක්විඳීම කෙරෙහි නිවැරදි ආකල්පය පාවුල්තුමා මෙසේ සාරාංශගත කරයි.

> **එහෙයින් අපි ක්ලාන්ත නොවෙමුව; අපේ පිටත මනුෂ්‍යයා ක්ෂයවෙන නුමුත්, අපේ ඇතුල් මනුෂ්‍යයා දවසින් දවස අලුත් කරනු ලබන්නේය. මොහොතකට පවතින අපේ සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සාදාදෙන්නේය. මක්නිසාද පෙනෙන දේ කාලිකය; නොපෙනෙන දේ සදාකාලිකය. (2 කොරින්ති 4:16-18)**

පාවුල්තුමා දුක්විඳීම දුටුවේ සේවකයෙකු ලෙසය ... "අපට වැඩ කරයි" යයි ඔහු පැවසීය.

## දුක්විඳීමේ ධනාත්මක ප්‍රතිලාභ

දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව දුක්විඳීමේ ධනාත්මක ප්‍රතිලාභ බොහෝය. ඔබ මේවා තේරුම් ගන්නෙහි නම් ඔබගේම දුක්විඳීම සමග කටයුතු කිරීමට එය උපකාරී වනු ඇත. එමෙන්ම "යුද්ධයෙන් අනතුරට පත්වූවන්ට" ඔබ සේවය කරන විටද එය ප්‍රයෝජනවත් වේ.

## ඔබගේ ඇදහිල්ල පරීක්ෂා කරනු ලැබේ :

ආත්මික ලෝකයේ සියල්ල ඇදහිල්ල මත පදනම් වේ. ඔබගේ ඇදහිල්ලේ ශක්තිය පරීක්ෂා කර බැලිය යුත්තේ එබැවිනි.

> **එසේ ශෝකයට පත්වන්නේ නාස්තිවී යන්නාවූ, එසේද වුවත් ගින්නෙන් සෝදිසිකරන්නාවූ රනට වඩා අගේව තිබෙන නුඹලාගේ ඇදහිල්ල පරීක්ෂා කිරීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීමේදී ප්‍රශංසාවත් මහිමයත් ගෞරවයත් පැමිණෙන පිණිසය. (1 පේත්‍රුස් 1:7)**

ඔබ යේසුස්වහන්සේ මෙන් යාච්ඤා කරන විට එය ඇදහිල්ල පරීක්ෂා කිරීමකි. තිත්ත කුසලාන පහව යන ලෙස උන්වහන්සේ යාච්ඤා කළද එසේ වූයේ නැත. ඒ වෙනුවට එහි දුක්විඳීම පානය කිරීමට ඔබට බල කරනු ලැබේ. අපගේ යාච්ඤා වලට අපට අවශ්‍ය ආකාරයට පිලිතුරු නොලද නිසා අපගේ යාච්ඤා වලට පිළිතුරු නොලැබුණා නොවේයයි ඇදහිල්ල නිසා ඉගෙන ගනු ඇත.

## අන් අය සැනසීමට ඔබව සන්නද්ධ කර ඇත :

> **දයාබර කරුණාවල පියවූද සෑම සැනසිල්ලේ දෙවිවූද අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසාවේවා. අපි දෙවියන්වහන්සේගෙන් යම් සැනසිල්ලක් ලැබුවෙමුද ඒ සැනසිල්ල කරණකොටගෙන කොයි පීඩාවක් නුමුත් විඳින්නන් සනසන්ට අපට පුළුවන් වන පිණිස උන්වහන්සේ අපේ සියලූ පීඩාවලදී අප සනසනසේක. (2 කොරින්ති 1:3-4)**

ඔබ දෙවියන්වහන්සේගේ සහනය අන් අය සමග බෙදාගන්නා විට ඔබ ...

> **එබැවින් හෙළා තිබෙන අත්ද බෙලහීන දණහිස්ද සවි කරගනිල්ලා. කොර කකුල් අහක් කරනු නොලැබ, සුවවෙන පිණිස, නුඹලාගේ පාද වලට සමතලා පාරවල් සාදාගනිල්ලා. (හෙබ්‍රෙව් 12:12-13)**

## ඔබ කෙරෙහිම විශ්වාසය නොතැබීමට ඔබ ඉගෙන ගන්නෙහිය :

ආසියාවේදී පාවුල්තුමා තමා දුක්විඳීමේ පරමාර්ථය ගැන කතා කළේය.

> **එබැවින් සහෝදරයෙනි, ආසියාවේදී අපට පැමිණි පීඩාව ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමුව. එනම් ජීවිතය ගැන පවා අපට බලාපොරොත්තුවක් නැති තරමට උසුලන්ට බැරි පමණ, අප පිටට බර පැමුණුන බවය. එසේය, මළවුන් නැගුටුවන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි මිස අප කෙරහිම විශ්වාස නොකරන පිණිස මරණ-මුගිංවිය අප තුළේම තිබුණේය. (2 කොරින්ති 1:8-9)**

ඔබ මේ දේ තේරුම්ගනු ඇත.

> **නුමුත් ඒ බලයේ ඉතා උතුම්කම අපට නොව දෙවියන්වහන්සේට අයිති වන පිණිස මේ වස්තුව අපි මැටි භාජන වල දරමුව. (2 කොරින්ති 4:7)**

## ඔබ ධනාත්මක ආත්මික ගුණාංග වර්ධනය කරගනු ඇත :

> **එපමණකුත්නොව, පීඩා විඳීමෙන් ඉවසිල්ලද, ඉවසිල්ලෙන් සහතිකකමද, සහතිකකමෙන් බලාපොරොත්තුවීමද උපදින බව දැන අප විඳින පීඩා වලදීත් ප්‍රීතිමත් වෙමු. (රෝම 5:3-4)**
>
> **නුඹලා ස්වල්ප කලක් දුක වින්ද පසු, නුඹලා සම්පූර්ණ කර, ස්ථිර කර, ශක්තිමත් කර පිහිටුවනසේක. (1 පේත්‍රුස් 5:10)**

මේ ගුණාංග ඔබ යේසුස්වහන්සේගේ ප්‍රතිරූපයට සහතික කෙරෙනු ඇත. එය ඔබ සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම වේ (රෝම 8:28-29; හෙබ්‍රෙව් 2:10, 18).

## දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් ප්‍රකාශ වන්නේය :

උත්පත්තියේ සිටම අන්ධ වූ මිනිසෙකුව ගෝලයන් දුටු විට ඊට වගකිව යුත්තේ කවුරුන්දැයි ඔව්හු ඇසූහ. එය ඔහුගේ දෙමව්පියන්ගෙන් පාපයක්ද නැතහොත් ඔහුගේම පාපයක්ද. යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන්සේක.

> **යේසුස්වහන්සේ උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ ක්‍රියා මොහු කෙරෙහි ප්‍රකාශවන පිණිස මිස මොහුවත් මොහුගේ මවුපියන්වත් පව්කළ නිසා නොවේ. (යොහන් 9:3)**

## දෙවියන්වහන්සේගේ බලය පරිපූර්ණ වේ :

> **උන්වහන්සේද: මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේයයි මට කීසේක. එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි. (2 කොරින්ති 12:9)**

## අස්ථායි දෙය ඉවත් කෙරෙනු ඇත :

ඔබගේ ජීවිතයේ අස්ථායි දේ ඉවත් කිරීම දුක්විඳීමේ ප්‍රතිඵලයකි. ඔබ මිනිසුන්, වැඩ සැලසුම් හෝ ද්‍රව්‍යමය දේ මත රඳා පැවැත්ම නැවතෙනු ඇත. මේ සියල්ල ඔබට අවශ්‍ය වේලාවේදී අසාර්ථක වන දේ වේ. දෙවියන්වහන්සේ මේ දේට ඉඩ දෙනසේක.

> **උන්වහන්සේගේ ශබ්දයෙන් ඒ කාලයේදී පොළොව සෙළවුණාය. නුමුත් දැන් උන්වහන්සේ: මම පොළොව පමණක් නොව ස්වර්ගයත් තව වරක් කම්පාකරවන්නෙමියි කියා පොරොන්දු වී තිබේ. (හෙබ්‍රෙව් 12:26-27)**

ජීවිතයේ කුණාටු වලදී දේව වචනය මත ගොඩ නොනගන ලද සියල්ල බිඳ වැටෙනු ඇත. ගීතාවලිය 119:89፡ මතෙව් 7:24-27).

## ඔබගේ අවධානය වෙනස්වනු ඇත :

ඔබ දුක්විඳීම අත්දකින විට ඔබ බොහෝවිට හේතු-ඵල ධර්මය කෙරෙහි ඔබගේ අවධානය යොමුවන්නේය. මේ අසීරු අවස්ථාවන් ඇතිවීමට හේතුව පිළිබඳවද එය ඔබ ජීවිතය කෙරෙහි ඇති භයානක ප්‍රතිඵලයද ගැන ඔබ සිතනු ඇත. තාවකාලික අවස්ථාව අවබෝධ කරගැනීම ගැන නොව සදාතන ප්‍රතිලාභ හැඳිනගැනීම ගැන ඔබගේ අවධානය යොමු කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යය.

> **මොහොතකට පවතින අපේ සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සාදාදෙන්නේය. මක්නිසාද පෙනෙන දේ කාලිකය፡ නොපෙනෙන දේ සදාකාලිකය. (2 කොරින්ති 4:17-18)**
>
> **ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධවෙන්නාක් මෙන් පුදුම නොවෙල්ලා. නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ එළිදරව් වීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස උන්වහන්සේගේ දුක් විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙයල්ලා.<br>(1 පේත්‍රුස් :12-13)**
>
> **අපි ඉවසමු නම් උන්වහන්සේ සමග රජකම් කරන්නෙමුව. අපි උන්වහන්සේ නාඳුනමුය කියමු නම්, උන්වහන්සෙත්: නුඹලා නාඳුනමියි කියනසේක. (2 තිමෝති 2:12)**

## පැරණි ස්වයං-ස්වභාවය වෙනස් වන්නේය :

මෝවබ් දේශය ගැන දෙවියන්වහන්සේ මෙසේ පැවසූසේක.

**මොවබ් භාජනයෙන් භාජනයට වත්කරනු නොලැබ, වාල්කමට නොගොස්, තමාගේ බාල වයසේ පටන් සුවසේ හිඳ තමාගේ මණ්ඩි පිටින් නිශ්චල වී සිටියේය. එබැවින් ඔහුගේ රස ඔහු තුළ තවම තිබේ, ඔහුගේ සුවඳ වෙනස් නොවී තිබේ. (යෙරෙමියා 48:11)**

හොඳ මුද්‍රික පානය නිපදවීමේදී කරනු ලබන කැළඹීම හා වත්කිරීමට සමාන අත්දැකීම් මෝවබ්ට නොතිබූ බැවින් එම ජාතිය වෙනස්වූයේ නැත. මෝවබ් පහසුවෙන් සිටි අතර සමෘධියද තිබුණු බැවින් ඔහු ආත්මිකව පරිණත වූයේ නැත. එබැවින් එම ජාතිය වෙනස්වූයේ නැත. "ඔහුගේ සුවඳ" ඔහු තුළම තිබිණි. දුක්විඳීම ඔබගේ පැරණි ස්වභාවය ඉවත් කරයි. ඔබව කලතා, කරදරයට පමුණුවා, වත්කළ විට ඔබගේ ආත්මික සුවඳ මාංශයේ සිට ආත්මය දක්වා වෙනස්වනු ඇත.

## ඔබව සේවයට සූදානම් කරනු ඇත :

ඔබව පාවිච්චි කරන ලෙස ඔබ දෙවියන්වහන්සේගෙන් ඉල්ලා ඇත. ඔබ යේසුස්වහන්සේ මෙන් වීමට කැමතිය. උන්වහන්සේගේ භාවිතය සඳහා තෝරාගත් භාජනයක් වීමට ඔබ ඉල්ලා ඇත. එම යාච්ඥාවට පිළිතුර දුක්විඳීම තුළින් පැමිණිය හැකිය.

**බලව, මම නුඹ පවිත්‍රකළෙමි, නුමුත් රිදී මෙන් නොවේය: පීඩා නමැති උදුනේදී නුඹ තෝරාගතිමි. (යෙසායා 48:10)**

ඔබ දෙවියන්වහන්සේගේ දරුවෙකු වීමේ කැඳවීමේ සිට දෙවියන්වහන්සේ තෝරාගත් තැනැත්තෙකු වන්නේ දුක්විඳීම තුලිනි. දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව සිදුවන වේදනාවන් ඔබව උන්වහන්සේගේ භාවිතය සඳහා පිරිසිදු කෙරේ. එය උදුනක ලෝහ පිරිසිදු කරන්නාක් මෙනි. දුක්විඳීම තුළින් සතුරාට එරෙහිව යුද්ධ කිරීමට දෙවියන්වහන්සේ ඔබව සැබවින්ම සූදානම් කරනසේක.

## ඔබ ක්‍රිස්තුස්වහන්සේ සමග පාලනය කිරීමට සූදානම් කෙරේ :

**අපි ඉවසමු නම් උන්වහන්සේ සමග රජකම් කරන්නෙමුව. අපි උන්වහන්සේ නාඳුනමුය කියමු නම්, උන්වහන්සේත්: නුඹලා නාඳුනමියි කියනසේක. (2 තිමෝති 2:12)**

## ඔබ ආත්මික ආශිර්වාද ලබන්නෙහිය :

යේසුස්වහන්සේ මෙසේ පැවසූසේක.

**ධර්මිෂ්ඨකම නිසා පීඩා වින්ද තැනැත්තෝ ආශිර්වාදලද්දෝය: මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය. මනුෂ්‍යයන් මා නිසා නුඹලාට නින්දා පීඩාකොට නුඹලාට විරුද්ධව සියලු ආකාර අගුණ බොරුවෙන් කියන කල නුඹලා ආශිර්වාදලද්දෝය. ප්‍රීතිවෙයල්ලා, ඉතා සන්තෝෂ වෙයල්ලා: මක්නිසාද ස්වර්ගයෙහි නුඹලාගේ විපාකය මහත්ය ... (මතෙව් 5:10-12)**

## ඔබ කීකරුවීමට ඉගෙන ගන්නෙහිය :

**... උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නුමුත් තමන් වින්ද දේවලින් කීකරුකම ඉගෙනගත්සේක. (හෙබ්‍රෙව් 5:8)**

## දේව වචනය ඔබ තුළ පරීක්ෂා කර බලනු ඇත :

**පොළොවේ උදුනක සත්වරක් පවිත්‍ර කළ රිදී මෙන් ස්වාමීන්ගේ වචන පිරිසිදුය. (ගීතාවලිය 12:6)**

## ඔබ නිහතමානී කරන්නෙහිය :

**... ගිනි සර්පයන් සහ ගෝනුස්සන් ඇත්තාවූ, වතුර නැති, නියංසායෙන් යුක්තවූ ඒ මහත් භයංකර කාන්තාරය මැදින් නුඹ ගෙනාවාවූ, ගිනිගල් පර්වතයෙන් නුඹට වතුර නික්මවා දී, නුඹේ පියවරුන් නොදත්තාවූ, මන්නා වලින් කාන්තාරයේදී නුඹ පෝෂණය කළාවූ නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ මතක නැතිකොට: ... (ද්විතිය කථාව 8:15-16)**

## ඔබ ආත්මිකව විශාල කෙරෙනු ඇත :

මෙයින් අදහස් කරන්නේ ඔබ ආත්මිකව වර්ධනය වන බවයි.

> **මාගේ ධර්මිෂ්ඨකමේ දෙවියන්වහන්ස, මා හඬගසන කල මට උත්තරදුන මැනව: විපත්තියේදී ඔබ මා මිදුසේක. මට කරුණාකොට මාගේ යාච්ඤාව ඇසුව මැනව. (ගීතාවලිය 4:1)**

## ඔබ දෙවියන්වහන්සේව සමීපව දැනගන්නෙහිය :

දුක්විඳීම තුළින් ඔබ දෙවියන්වහන්සේව ඉතා සමීපව දැනගන්නෙහිය. බොහෝසේ දුක් විඳි යෝබ් මෙම සත්‍යය දැනගෙන මෙසේ පැවසීය :

> **මා ඔබ ගැන කනින් අසා තිබුණේය: නුමුත් දැන් මාගේ ඇසින් ඔබ දකිමි. එබැවින් මම මටම පිළිකුල්කොට, දූවිල්ලෙත් අලුවලත් හිඳ පශ්චාත්තාපවෙමියි කීවේය. (යෝබ් 42:5-6)**

අප සමහර දෙනෙක් දෙවියන්වහන්සේ දන්නේ පළමු අත්දැකීමෙන් නොවේ. ඔබ ජීවිතයේ ආශිර්වාද අත්දකින විට දෙවියන්වහන්සේ බොහෝවිට අවශ්‍යතාවක් නොව සුඛෝපභෝගී කෙනෙකු වේ. එහෙත් ඔබට සැබවින්ම අවශ්‍යතාවක් ඇතිවූ විට දෙවියන්වහන්සේ අත්‍යවශ්‍ය වේ. යෝබ් දෙවියන්වහන්සේව සමීපව දැනගත්තේ දුක්විඳීම තුළිනි. ඔහු දුක්විඳීමට පෙර දෙවියන්වහන්සේව දේවධර්මය තුළින් දැනගෙන සිටියේය. පසුව ඔහු උන්වහන්සේව අත්දැකීමෙන් දැනගත්තේය. පාවුල්තුමාටද මේ හා සමාන ආශාවක් තිබිණි. ඔහු මෙසේ පැවසීය.

> **... යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත-නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය. (පිලිප්පි 3:10-11)**

නැවත නැගිටීමේ බලය තුළින් ඔබට දෙවියන්වහන්සේව සමීපව දැනගත හැක්කේ දුක්විඳීම මගිනි. දුක්විඳින කාලය තුළ යෝබ් දෙවියන්වහන්සේගෙන් දුක්විඳීමට හේතුව ප්‍රශ්න කළේය. දෙවියන්වහන්සේ ප්‍රශ්න කිරීම වැරැද්දක් නොවේ. යේසුස්වහන්සේ මෙලොවට පැමිණි හේතුව උන්වහන්සේ දැන සිටිසේක. ඒ සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාප උදෙසා මැරෙන පිණිසය. එසේවුවද දුක් විඳින පැයේදී උන්වහන්සේ "මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මන්ද?" කියා මොර ගැසුසේක. ප්‍රශ්න කිරීමෙන් පසු පැවසූ දෙය වැදගත් වේ. යේසුස්වහන්සේගේ ඊළඟ වචනය වූයේ "පියාණෙනි, ඔබගේ අතට මාගේ ආත්මය භාර දෙමි" යන්න වේ.

ප්‍රශ්න ඇසුවද යෝබ්ගේ ප්‍රතිචාරය වූයේ :

> **උන්වහන්සේ මා මරනවා ඇත: මට බලාපොරොත්තුවක් නැත්තේය: එහෙත් උන්වහන්සේ ඉදිරිපිට මාගේ මාර්ග හරි බවට ඔප්පු දෙන්නෙමි. (යෝබ් 13:15)**

> **එහෙත් මාගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බවද අන්තිමේදී උන්වහන්සේ පොළොව පිට සිටින බවද දනිමි. මේ මාගේ හම නැතුව ගියායින් පසු, මාගේ මාංසය නැතුව නුමුත් දෙවියන්වහන්සේ දකින්නෙමි. (යෝබ් 19:25-26)**

සියලුම ප්‍රශ්න ඇසීමෙන් පසු අවධාරණය "මා" යන්නෙන් "ඔබවහන්සේ" යන්නට වෙනස් විය යුතුය. ඔබගේ දුක්විඳීම පිළිතුරු නොලද සියලුම ප්‍රශ්න සමග දෙවියන්වහන්සේගේ අතට කැප කළ යුතුය.

> **නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසකරපන්න. (හිතෝපදේශ 3:5)**

ඔබගේ දුක්විඳීමට හේතු සමහරක් දෙවියන්වහන්සේ එළිදරව් කරනු ඇත. එහෙත් ඒ සියල්ල ඔබට සම්පූර්ණයෙන් අවබෝධ කරගත නොහැකිය.

> **කාරණයක් සඟවා තැබීම දෙවියන්වහන්සේගේ ගෞරවයක්ය: රජුන්ගේ ගෞරවය නම් කාරණයක් සොයා දැනගැනීමය. (හිතෝපදේශ 25:2)**

**රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමින්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව්කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය. (ද්විතිය කථාව 29:29)**

දෙවියන්වහන්සේට පමණක් අයත් ඇතැම් රහස් තිබේ. යෝබ් මෙන් ඔබද ඔබගේ දුක්විඳීමට හේතුව සම්පූර්ණයෙන්ම දැන නොගන්නෙහිය.

**මනුෂ්‍යයෙකුගේ ගමන් ස්වාමීන්වහන්සේගෙන් පැමිණේ: එසේ නම් මනුෂ්‍යයා තමාගේ මාර්ගය තේරුම්ගන්නේ කොහොමද? (හිතෝපදේශ 20:24)**

දෙවියන්වහන්සේ අවසානයේදී යෝබ් සමග කතා කරන විට උන්වහන්සේ ස්වභාව ධර්මයෙන් බොහෝ නිදසුන් භාවිත කළද යෝබ්ට ඒවා පැහැදිලි කළ නොහැකි විය. දෙවියන්වහන්සේ අවධාරණය කර සිටියේ යෝබ්ට ස්වභාවික ලෝකයේ ඔහු දුටු දෙය ඔහුට අවබෝධ කරගත නොහැකි නම් ආත්මික ලෝකයේ ඔහුට නොපෙනෙන දේ කෙසේවත් අවබෝධ කරගත නොහැකි බවය.

යෝබ්ට දෙවියන්වහන්සේ මුණගැසුන විට දුක්විඳීම පිළිබඳ ඔහුගේ ප්‍රශ්න වලට පිළිතුරු නොලැබීම ගැටළුවක් නොවේ. ඔහු දෙවියන්වහන්සේ අභිමුඛයේ සිටී. ඒ අත්දැකීම වෙනත් කිසි දෙයකට ඉඩක් නොතබයි. මනුෂ්‍ය තර්ක මගින් ඔහු තවදුරටත් පාලනය වන්නේ හෝ හිරිහැර විඳින්නේ හෝ නැත. ඔහු ප්‍රශ්න පිළිතුරු වලින් නොව ඇදහිල්ලෙන් ඉවත දමයි.

දුක්විඳීම තුළින් ඔබ දෙවියන්වහන්සේව සමීපව දැනගත් විට ඔබ ඔබව සැබෑ ආකාරයෙන්ම දකින්නෙහිය. ඔබ දෙවියන්වහන්සේව තවදුරටත් වෙනත් කෙනෙකු මාර්ගයෙන් දැනගන්නේ නැත. දෙවියන්වහන්සේව එසේ මුහුණට මුහුණ ලා කෙරෙන හමුවීමෙන් තර්ක හා සාකච්ඡා වලට කළ නොහැකි වූ දේ ඉටු කෙරේ.

යෝබ් දෙවියන්වහන්සේ ඉදිරියේ සිටින විට ඔහුට අලුත් පිළිතුරු තිබුණේ නැත. ඔහුගේ දුක් විඳීම පිළිබඳව අලුත් කරුණු සැපයුවේ නැත. එහෙත් ප්‍රශ්න කිරීම ඇදහිල්ල මගින් ප්‍රතිස්ථාපනය කෙරිනි. යෝබ් දෙවියන්වහන්සේ අභිමුඛයේ සිටි බැවින් එම අත්දැකීම ප්‍රශ්න වලට හෝ අවිශ්වාසයට හෝ ඉඩක් තැබුවේ නැත.

## ජීවිතයේ කුණාටු

දුක්විඳීම ඇතැම්විට ස්වභාවික කුණාටුවකට සසඳනු ලබයි. ඔබ දුක් විඳින විට ඔබ ආත්මිකව බැලූ කල කුණාටුවක් අත්දකින්නේය. මෙම "කුණාටුව" ඔබට ආත්මිකවත් මානසිකවත් ශාරීරිකවත් ද්‍රව්‍යමය වශයෙන් හෝ හැඟීම් වලිනුත් බලපාන්නේය.

යේසුස්වහන්සේගේ ගෝලයන් අත්දුටු කුණාටුවක් ගැන බයිබලයේ සඳහන් වේ. මාක් 4:35-41හි මෙම කතාන්දරය කියවන්න. යේසුස්වහන්සේ ගෝලයන්ට අනෙක් පැත්තට යන්න යයි පවසා උන්වහන්සේ බෝට්ටුවෙන් ගියසේක. මෙම කුණාටුව සාතන්ගේ පහර දීමකි. සාතන් ඔවුන් වෙරළට යාම නැවතීමට උත්සාහ ගත්තේය. ඊට හේතුව ගෙරසේනයේ කිරීමට යන්නාවූ ආශ්චර්යමත් ක්‍රියාවන් නිසා වේ (මාක් 5 පරිච්ජේදය බලන්න).

සැනෙකින්ම යේසුස්වහන්සේ කුණාටුව කෙරෙහි ආධිපත්‍යය ගත්සේක. උන්වහන්සේ සතුරාගේ බලයට තරවටු කළසේක. කුණාටුව සංසිඳුනු අතර ඔවුහු ඔවුන්ගේ ගමන කිසිදු බාධාවකින් තොරව ගියෝය.

ජීවිතයේ අසිරුතා ස්වභාවික කුණාටුවකට සම කළ හැකිය. සාතන්ගේ "කුණාටුවක්" ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට බාධා පමුණුවන හා එලදායි කිතුනු සොල්දාදුවෙකු වීම වළක්වාලන දෙයක් වේ. එය ඔබගේ අකීකරුකම නිසා ඇතිවන්නාවූ දුක්විඳීමක් නොවේ. එය "දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි" සිදුවන දුක්විඳීමක්ද නොවේ. ඔබ වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්මට බාධා පමුණුවන දෙයක් හෝ ඔබගේ ආත්මික සටන ජයගැනීමට බාධා කෙරෙන දෙයක් හෝ සිදුවීම දෙවියන්වහන්සේට අවශ්‍ය නැත. ඔබ සාතන් විසින් ඇති කරන ලද කුණාටුවකට මුහුණ දෙන විට සතුරාට එරෙහිව බලය භාවිත කරන්න. සාතන්ගේ බලයට එරෙහි බලයක් යේසුස්වහන්සේ ඔබට දී ඇත.

බයිබලයේ සඳහන් තවත් ස්වභාවික කුණාටු දෙකක් ඇත. ඒවායින් පාපයට දඬුවමක් වශයෙන් දෙනු ලබන කුණාටුවක් හා “දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව” ඇතිවන කුණාටුවක් පැහැදිලි කෙරේ. යෝනාගේ කතාව හා යෝනාගේ කුණාටුව ගැන යෝනා 1 ප×විජේදයෙන් කියවන්න. එමෙන්ම පාවුල්තුමාගේ කතාව හා ක්‍රියා 27හි සඳහන් කුණාටුව ගැන ද කියවන්න.

| **යෝනා** | **පාවුල්තුමා** |
|---|---|
| යෝනා තමාවම කුණාටුවට තල්ලු කර ගත්තේය | පාවුල්තුමා කුණාටුවට අසුවුයේ ඔහුගේ වැරැද්දකින් නොවේ |
| ඔහුට ඊට ගෙවීමට සිදුවිය | මුහුදු යෑමෙන් වැළකීමට ඔහු උත්සාහ කළේය |
| කුණාටුවට හේතුව යෝනා වේ | පාවුලුතුමා කුණාටුවට පිළිතුර විය |
| කුණාටුව තිබියදී යෝනා නිදාගත්තේය | පාවුලුතුමා නිරාහාරව සිටිමින් යාච්ඤා කළේය |
| දෙවියන්වහන්සේගේ ආශිර්වාද යෝනා සමග නොවීය | දෙවියන්වහන්සේගේ ආශිර්වාද පාවුල්තුමා සමග විය |
| නාවිකයන් බියෙන් සිටියේය | නාවිකයන්ට ප්‍රීතියෙන් සිටින ලෙස දැන්විය |
| බේරීම සඳහා යෝනාව පිටුවහල් කළ යුතුය | බේරීම සඳහා සියලු දෙනාම නැව තුළ සිටිය යුතුය |

දෙවියන්වහන්සේගේ කැමැත්ත තුල හෝ පිටත ජීවිතයේ කුණාටුවලට මුහුණ දීමේ වෙනස්කම් තිබේ. දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් පිටත ඔබ කුණාටුවක් තුළින් ගමන් කරන විට එය ඔබ විසින්ම නිර්මාණය කරගත්තකි. නිදසුනක් ලෙස ඇදහිලිවන්තයෙකු ගැළවීම නොලද කෙනෙකු හා විවාහ වූ විට ඔහු ශුද්ධ ලියවිලි මූලධර්ම කඩ කර ඇති බැවින් කරදර වලට මුහුණ පාන්නේය. අකීකරුකම නිසා නිර්මාණය වූ කුණාටුවට හේතුව ඔබය. ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත හා ආඥා කඩ කර ඇත. බොහෝවිට මේ අවස්ථාවේ බරපතල කම ඔබට නොවැටහේ. ඔබ ආත්මිකව නිදාගන්නා අතර කුණාටුව ඔබ වටා වැඩි වන්නේය.

ඔබගේම පාපය නිසා කුණාටුවක් ඇති වූ විට ඔබ බිය වන අතර ඔබ වටා සිටින අයද බියට පත්වේ. මේ කුණාටුව සාතන්ගේ ප්‍රහාරයක් නොවේ. එය දෙවියන්වහන්සේගේ දඬුවමකි. “සතුරාට එරෙහි බලය” පිළිබඳ පොරොන්දු ඔබට භාවිතා කළ හැකිය. එහෙත් ඒ අවස්ථාව වෙනස් නොවෙනු ඇත. පාපය නිසා “කුණාටුවක්” ඇති වූ විට ඇත්තේ එකම විසඳුමකි. දෙවියන්වහන්සේගෙන් කමාව ඉල්ලීම පමනි.

එහෙත් දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ඔබ දුක් විඳින විට ඒ අවස්ථාව වෙනස්ය. ඔබ දුක් විඳින්නේ ඔබගේ වරදක් නිසා නොවේ. ඔබ එම ගැටළුවට හේතුව නොව පිළිතුර විය හැකිය. පාවුල්තුමා, මෙන් ඔබටද ආත්මික නායකත්වය භාරගත හැකිය. හේතුව දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබ කෙරෙහි බැවිනි. ඔබට අන් අයව දිරිමත් කළ හැකිය. මක්නිසාද ඔබ කුණාටුවට විසඳුමක් මිස හේතුවක් නොවන බැවිනි. ඔබ කරදරෙන් පැන යා යුතු නැත. නැවෙන් පැන යා යුතු නැත. ඔබ “නැව” තුළ සිටිය යුතුය. ඒ මෙය දෙවියන්වහන්සේගේ කැමැත්ත බැවිනි.

# දුක් විඳින සොල්දාදුවා

ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව දුක් විඳින විට ඔබ තනිවම නොවන බව පිළිගන්න. දෙවියන්වහන්සේගේ හමුදාවේ තව බොහෝ දෙනෙක් මෙවැනි ගැටුම් අත්දකිති.

> **ලෝකයෙහි සිටින නුඹලාගේ සහෝදරයන් කෙරෙහි එම දුක්ම පැමිණෙන බව දැන, නුඹලාගේ ඇදහිල්ලෙහි ස්ථිරව සිට, යක්ෂයාට විරුද්ධව සිටපල්ලා. (1 පේත්‍රුස් 5:9)**

ජීවිතයේ "කුණාටු" මගහැරිය නොහැකිය. පාලනය කළ නොහැකිය. එය මතෙව් 7:24-27හි විස්තර කර ඇති නිවෙස් දෙක පිළිබඳ උපමාව මෙන් වේ. දේව වචනය මත හා එසේ නැතිව තම ජීවිත ගොඩ නැගූ අය වෙත කුණාටු පැමිණෙනු ඇත. කුණාටුවේ ප්‍රතිඵලය තීරණය වන්නේ මනුෂ්‍යයාගේ ජීවිතයේ අත්තිවාරම මත වේ. දුක්විඳීම දෙවියන්වහන්සේගේ කැමත්තේ කොටසක් බව බලාපොරොත්තු විය යුතුය.

> **එසේය, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ භක්තිවන්ත ලෙස ජීවත්වන්ට කැමති සියල්ලෝම පීඩා විඳින්නෝය.(2 තිමෝති 3:12)**

මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්ට පමණක් නොව උන්වහන්සේ උදෙසා දුක්විඳින්ටත් නුඹලාට වරප්‍රසාද දෙන ලද්දේය (පිලිප්පි 1:29).

> **ඒ ඉවසීම වනාහි දෙවියන්වහන්සේගේ රාජ්‍යය උදෙසා දුක්විඳින නුඹලා ඒ රාජ්‍යයට සුදුස්සෝයයි ඒත්තුගනු ලැබීමට තිබෙන දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨ විනිශ්චයේ ඔප්පුවක්ය. (2 තෙසලෝනික 1:5)**
>
> **මක්නිසාද අප දුක් විඳීමට නියමව තිබෙන බව නුඹලාම දනිහුය. (1 තෙසලෝනික 3:4)**
>
> **එකල ඔව්හු නුඹලා පීඩා විඳීමට පාවාදී මරන්නෝය. නුඹලා මාගේ නාමය නිසා සියලු ජාතීන් විසින් වෛරකරනු ලබන්නහුය. (මතෙව් 24:9)**
>
> **නුමුත් ඒ සියල්ලට පළමුවෙන් මාගේ නාමය නිසා ඔව්හු නුඹලා පිට අත්හෙළා, සිනගෝගවලටත් හිරගෙවලටත් නුඹලා පාවාදෙමින්, නුඹලාට පීඩාකරන්නෝය, නුඹලා රජුන් හා ආණ්ඩුකාරයන් ඉදිරියට ගෙනයන්නෝය. (ලූක් 21:12)**
>
> **දාසයෙක් තමාගේ ස්වාමියාට වඩා උතුම් නොවේයයි නුඹලාට මා කී වචනය සිහිකරපල්ලා. ඔව්හු මට පීඩාකළෝනම් නුඹලාටත් පීඩා කරන්නෝය: මාගේ වචනය රක්ෂා කළෝ නම් නුඹලාගේ වචනයත් රක්ෂා කරන්නෝය. (යොහන් 15:20)**

එහෙත් දෙවියන්වහන්සේ සතුටු කිරීමට යයි සිතා ඔබ දුක් විඳිය යුතු යයි මෙයින් අදහස් නොකෙරේ. මිනිසුන් දුක් විඳින විට දෙවියන්වහන්සේ කෙසේවත් සතුටු වන්නේ නැත. ඕනෑකමින්ම දුක්විඳීම (තාපස ‰ංවිතය) පාපයකි. බොහෝදෙනෙක් මෙසේ කිරීමට උත්සාහ කරන්නේ දෙවියන්වහන්සේව සතුටු කිරීමට හා / හෝ තමන් මිනිසුන් ඉදිරියේ භක්තිමත් බව පෙන්වීමට වේ. එහෙත් දෙවියන්වහන්සේ සතුටු වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයෙන් පමණි. කෙසේ හෝ දෙවියන්වහන්සේ දුක්විඳීමේ ශෝකාන්තය ඔබගේ ජීවිතයට පැමිණි කල එය ඔබගේ යහපත සඳහා ක්‍රියා කරවනසේක.

මුල් සභා පිහිටුවීමේ සැලැස්මේ කොටසක් වුයේ ඇදහිලිවතුන්ට ඔවුන් දුක් විඳින්නට ඇති බවත් ඉගැන්වීමට වේ. මෙය අද බොහෝ සභා තුළ නැත.

> **අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක් විඳීමින් ඇතුල්වෙන්ට ඕනෑයයි කියා ගෝලයන්ගේ සිත් සවි කොට, ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාද කළෝය. (ක්‍රියා 14:22)**

යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ව කැඳවූයේ දුක්විඳීමට හා ප්‍රතික්ෂේප වීමට වේ.

> **තමාගේ කුරුසිය රැගෙන මා අනුව නේන තැනැත්තා මට සුදුසු නොවේ. (මතෙව් 10:38)**

**එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මතෙව් 16:24)**

**එවිට උන්වහන්සේ සමූහයා තමන් ගෝලයන් සමග ළඟට කැඳවා ඔවුන්ට කියනසේක්: කවරෙක් නුමුත් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේ කැමැත්ත අත්හැර, තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා. (මාක් 8:34)**

**යේසුස්වහන්සේ ඔහු දෙස බලා, ඔහුට ප්‍රේමකොට: නුඹට එකක් අඩුය. ගොස් නුඹ සන්තක සියල්ල විකුණා දිළිඳුන්ට දීපන්න, ස්වර්ගයෙහි නුඹට වස්තු ඇතිවන්නේය. නුඹ මා අනුව වරෙන්නැයි ඔහුට කීසේක. (මාක් 10:21)**

**උන්වහන්සේ සියල්ලන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේම ආශා වළකාගෙන, දවස්පතා තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (ලූක් 9:23)**

**තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ ගෝලයා වෙන්ට බැරිය. (ලූක් 14:27)**

ආත්මික සටන ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයක හා ප්‍රශංසා කෙරෙන උත්සවවල අනුපිළිවෙලක් නොවේ. දෙවියන්වහන්සේගේ හමුදාවේ සොල්දාදුවෙකු ලෙස දුක්විඳීම සඳහා ඔබ කැඳවා ඇත.

**ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ යහපත් භේවායෙකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙයන්න. (2 තිමෝති 2:3)**

ස්වභාවික යුද්ධයේ එක් මූල ධර්මයක් ආත්මික ක්ෂේත්‍රයටද අදාළය. "ඔබට තුවාළ සිදුවී ඇති නිසා සටන නොනවත්වන්න".

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. දුක්විඳීම ලෝකයට ඇතුළු වූයේ කෙසේද?

3. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයට දුක්විඳීම ඇතුළු වන ක්‍රම පහක් හඳුනාගන්න.

4. දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව දුක්විඳීමේ ධනාත්මක වාසි පහක් ලියන්න.

5. දුක්විඳීම අත්දකින විට ඇදහිලිවන්තයෙකුට තිබිය යුතු ආකල්ප තුනක් හඳුනාගන්න.

6. පහත දැක්වෙන ප්‍රකාශ කියවන්න. ඒ ප්‍රකාශය සත්‍යයක් නම් ඊට ඉදිරියෙන් ඇති හිස්තැනේ "ස" අකුරද අසත්‍යය නම් "අ" අකුරද ලියන්න.

   අ. __________ ඔබ දුක්විඳීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවේ.

   ආ. __________ ඔබ කරදර අත්දුටුවහොත් ඉන් අදහස් වන්නේ ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් ඉවත්ව ඇති බවය.

   ඇ. __________ පාවුල්තුමා මුහුදේදී කුණාටුව අත්දුටු විට ඔහු දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ සිටියේ නැත.

ඈ. __________ අප දෙවියන්වහන්සේගේ කැමැත්ත නොමැතිව දුක් විඳින විට අප බොහෝවිට අපගේම ගැටළුවේ හේතුව වේ. ඒ අකීකරුකම නිසාය.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

## උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. ඔබ දැන් දුක් විඳින්නෙහිද? ඒ කෙසේද? මෙම පරිච්ඡේදයේ දී ඇති දුක්විඳීමේ හේතු පහ නැවත බලන්න.

   - ඔබ වටා සිටින අය
   - ජීවිතයේ අවස්ථාවන්
   - ඔබගේ සේවය
   - සාතන්ගේ සෘජු ක්‍රියාකාරකම්
   - ඔබගේම පාපය

   ඔබගේ දුක්විඳීමේ හේතුව / හේතු මේවායින් කවරක්ද? ඔබගේ දුක්විඳීම ඔබගේම පාපය නිසා බව ඔබ සොයාගතහොත් ඔබ පසුතැවිලි විය යුතුය. ඔබගේ දුක්විඳීම අන් අය නිසා සිදුවුවක් නම් ඔබගේ සේවය නිසා හෝ ජීවිතයේ අවස්ථාවන් නිසා හෝ සෘජුවම සිදු කෙරෙන සාතන්ගේ ප්‍රහාරයන් නිසා හෝ නම් මෙය සිදුවීමට ඉඩ දී ඇති දෙවියන්වහන්සේගේ පරමා¾ථය කවරක්ද?

2. පහත සඳහන් “දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව දුක්විඳීමේ” ධනාත්මක වාසි නැවත බලන්න.
   ඔබගේ ජීවිතයේ ඉටු කිරීමට දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන ඒවා හඳුනාගන්න. ඉන්පසු එම ක්‍රියාවලිය සමග සහයෝගයෙන් කටයුතු කරන්න.

   - ඔබගේ ඇදහිල්ල පරීක්ෂා කරනු ලැබේ.
   - අන් අය සැනසීමට ඔබ සන්නද්ධ කර ඇත.
   - තමාවම විශ්වාස නොකිරීමට ඉගෙන ගන්න.
   - ධනාත්මක ආත්මික ගුණාංග වර්ධනය කරගන්න.
   - දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් ප්‍රකාශ කරන්න.
   - දෙවියන්වහන්සේගේ බලය පරිපූර්ණ කරන්න.
   - අස්ථායි දේ ඉවත් කරන්න.
   - ඔබගේ අවධානය වෙනස් කරන්න.
   - පැරණි ස්වයං-ස්වභාවය වෙනස් කරන්න.
   - සේවය සඳහා ඔබ සූදානම් කරන්න.
   - ඔබ ක්‍රිස්තුස්වහන්සේ සමග පාලනය සඳහා සූදානම්වන්න.
   - ඔබට ආත්මික ආශිර්වාද ලැබෙනු ඇත.
   - ඔබ කීකරු වීමට ඉගෙන ගන්නෙහිය.
   - දේව වචනය ඔබ තුළ පරීක්ෂා කෙරේ.
   - ඔබ නිහතමානී වේ.
   - ඔබ ආත්මිකව විශාල වේ.
   - ඔබ දෙවියන්වහන්සේව සමීපව දැනගනු ඇත.

3. ස්වභාවික සටන් වලදී සොල්දාදුවෝ එකිනෙකාට උපකාර කරති. එක් සොල්දාදුවෙකුට පහර එල්ලවන විට අනෙක් අය උපකාරයට පැමිණෙති. ඔවුහු ඔහුව ආරක්ෂා කිරීමට සතුරාට වෙඩි තබති. එවිට ඔහුට ආරක්ෂිත ස්ථානයකට පැන යා හැකිය. තුවාළ ලැබූ සොල්දාදුවෙකු, හෝ යුද්ධයෙන් ආබාධිත වුවෙකු හට, ඔබට ආත්මික ආවරණයක් දිය හැකි කෙනෙකු ගැන

ඔබ දන්නෙහිද? යාච්ඤා කිරීමෙන් හා ඔවුන්ව දිරිමත් කිරීමෙන් ඔබට සතුරෙකු සමග සටන් කරන කෙනෙකුට උපකාර කළ හැකිද?

4. 1 පේත්‍රුස්හි ඇති දුක්විඳීම පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන්න. මෙම පොත දුක්විඳීම ගැන අවධාරණය කරයි.

5. දුක්විඳීම පිළිබඳව පහත දැක්වෙන යොමු කිරීම් අධ්‍යයනය කරන්න.

**දුක්විඳීම :** 2 තිමෝති 2:3

**විපත්ති :** ක්‍රියා 14:20; රෝම 5:3; 12:12; 1 තෙසලෝනික 3:4; 2 තෙසලෝනික 1:4

**වධහිංසා කිරීම් :** මතෙව් 5:10-12, 44; 13:21; මාක් 4:17; ලූක් 11:49; 21:12; යොහන් 15:20; 1 කොරින්ති 4:12; 2 කොරින්ති 4:9; ක්‍රියා 8:1; 11:19; 13:50; 2 තිමෝති 3:12; රෝම 8:35; ගලාති 6:12

**දුක්විඳීම :** 1 පේත්‍රුස් 5:10; පිලිප්පි 1:29; 3:8; 4:12; 2 කොරින්ති 1:6; 2 තිමෝති 2:12; 3:12; ගලාති 5:11; 6:12; ක්‍රියා 9:16; 1 තෙසලෝනික 3:4; 2 තෙසලෝනික 1:5

**පීඩාව :** ගීතාවලිය 34:19; 119:67, 71, 75; මතෙව් 24:9; ක්‍රියා 20:23; 2 කොරින්ති 2:4; 4:17; 6:4; 1 තෙසලෝනික 3:3; 2 තිමෝති 1:8; 3:11; 4:5; 2 කොරින්ති 1:6; යාකොබ් 5:10; හෙබ්‍රෙව් 10:32-33

# විසිතුන්වන පරිච්ඡේදය

## සටනක් පරාජය වුවත් යුද්ධය ජයගත හැකි ක්‍රමය

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට ...

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සටනක් පරාජය වූ නමුත් යුද්ධය දිනූ මනුෂ්‍යයන් හතර දෙනෙක් පිළිබඳ බයිබලිය ආදර්ශ හඳුනාගැනීමට
- සටනක් පරාජය වුවත් යුද්ධය ජයගැනීමට පියවර 4 ක් නම් කිරීමට
- ඔබ ආත්මිකව අසමත් වුවත් නැවත වරක් යථා තත්වයට පැමිණිය හැකි බව ඔප්පු කර දෙන බයිබලිය උපුටා දැක්වීමක් ඉදිරිපත් කිරීමට
- සාතන් ඔබගේ අසමත්වීම් පිළිබඳව ඔබට දෝෂාරෝපණයට ලක් කරන කල භාවිත කළ හැකි බයිබලිය උපුටාගැනීමක් ඉදිරිපත් කිරීමට
- ආත්මික අසමත්වීම් වලින් ඔබට ඉගෙන ගත හැකි ක්‍රමය පැහැදිලි කිරීමට
හැකිවනු ඇත.

**යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය :**

> **මම යහපත් යුද්ධයෙහි යුද්ධකළෙමි. මම දිවීම කෙළවරකළෙමි. මම ඇදහිල්ල රක්ෂා කළෙමි. (2 තිමෝති 4:7)**

## හැඳින්වීම

මෙම පාඩමාලාවෙහි ඔබ ආත්මික යුද්ධය සම්බන්ධ උපක්‍රම රාශියක් ඉගෙන ගෙන ඇත. ඔබ මෙම දැනුම ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තියෙන් හා බලයෙන් යුතුව සටන් කිරීමෙහිදී යුද්ධ උපක්‍රම කොතෙක් දැන සිටියත් වරින් වර අසමත් වනු ඇත. එයින් අධෛර්යයට පත් නොවන්න. දෙවියන්වහන්සේගේ සමහර ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් පවා එවන් අවස්ථාවනට මුහුණ දී ඇත.

මෙම පරිච්ඡේදයෙහි දී ඔබහට සටන් වලදී පරාජය වුවත් යුද්ධය ජයගත්තාවූ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් හතර දෙනෙකු පිළිබඳව ඉගෙනීමට අවස්ථාව ලැබෙනු ඇත. අසමත්වීම් මධ්‍යයෙහි පවා යථා තත්වයට නැවත පැමිණීමට මෙන්ම ජයග්‍රහණය කරා යොමු වීමට පියවර ඉගෙන ගත හැක. එසේම සතුරා ඔබ වෙත එල්ල කරන දෝෂාරෝපණය සම්බන්ධව ගනු දෙනු කළ හැකි ක්‍රම ඉගෙන ගනු ඇත. අසමත්වීම් අපහට ඉතා වැදගත් ආත්මික පාඩම් ඉගැන්විය හැක ... සටනක් පරාජය වුවත් යුද්ධය ජයගත හැකි බව හොඳින් මතක තබාගන්න.

## සටනක් පරාජයවීම

තම සතුරන් හා සමග පැවති සටන් වලදී පරාජය වූ මනුෂ්‍යයන් පිළිබඳ ශුද්ධ ලියවිල්ලෙහි උදාහරණ දී තිබේ.

**යෝෂුවා :**

යෝෂුවා වනාහි මෝසෙස්ගෙන් පසුව ඉශ්‍රායෙල් ජනතාවගේ නායකත්වය භාරගත් ශ්‍රේෂ්ඨ යුද්ධ හමුදාපතිවරයෙකි. දෙවියන්වහන්සේ යෝෂුවා හට පැවරූ එක් අභියෝගයක් වූයේ ඉශ්‍රායෙල් ජනතාව දෙවියන්වහන්සේ පොරොන්දු වූ දේශය වෙතට යෝර්දාන් නදිය මැදින් එතෙර කිරීමය. සටනෙහිදී දෙවියන්වහන්සේ තහනම් කර තිබූ සතුරු කොල්ලය අතරින් යම් වස්තුවක් එක්

සොල්දාදුවෙක් සොරකම් කිරීමෙන් පව් කළේය. තම "කඳවුරෙහි පැවති පාපය" නිසා ඉශ්‍රායෙල්වරු හායි හිදී පරාජය අත් වින්දෝය (යොෂුවා 7).

## දාවිත් රජතුමා :

දාවිත් රජතුමාගේ යුගයෙහි දුෂ්ඨවූ අමලෙක්වරු රාජධානියෙහි දකුණු දෙසින් ආක්‍රමණය කොට ශික්ලග් නගරය දවා ලූ අවස්ථාවෙහි දාවිත් රජ වැදගත් වූ සටනක් පරාජය විය. සතුරෝ සියලු කාන්තාවන්ද දරුවන්ද වහලුන් ලෙස රැගෙන ගියෝය. ඒ අතර දාවිත්ගේ භාර්යාවන්ද විය. දාවිත්ගේ මිත්‍රයෝ මෙන්ම හමුදා භටයෝද කෙතරම් කෝපයට පත්වීද යත් දාවිත්ට ගල් ගසා මැරීමට තර්ජනය කළෝය. දාවිත් දැඩි සිත් තැවිල්ලට හා කනස්සල්ලට පත් විය (1 සාමුවෙල් 30:1-6).

දාවිත් රජ ජීවිතයේ එක් අවස්ථාවක ආත්මික ලෝකයෙහි ශ්‍රේෂ්ඨ සටනක් පරාජය විය. ඔහු අන් මනුෂ්‍යයෙකු සතු භාර්යාවක් වූ බෙත්ෂෙබා නම් කාන්තාව සමග කාමමිථ්‍යාචාරයෙහි හැසිරුණේය. එහි ප්‍රතිඵලයක් ලෙසට බෙත්ෂෙබා ගැබ්ගත් කල දාවිත් තම පාපය වසන් කරනු පිණිස ඇගේ පුරුෂයාව මැරෙව්වේය (2 සාමුවෙල් 11 සහ 12).

## එලියා අනාගතවක්තෘතුමා :

යෙසබෙල් නම් නපුරු රැජිනියක් එලියා ප්‍රොපේතවරයාව ඝාතනය කිරීමට සැලසුම් කර ඇති බව පණිවුඩකරුවෙකු යවමින් එලියාට දන්වා සිටියාය. එවිට එලියා ...

> **තමාම දවසක ගමන් කාන්තාරයට ගොස් රෝතෙම් ගසක් යට හිදගන, තමා මැරෙන ලෙස ඉල්ලමින්: ස්වාමින්වහන්ස, ඉතින් ඇත: දැන් ස්වාමින්වහන්ස, මාගේ ප්‍රාණය ගනමැනව, මක්නිසාද මාගේ පියවරුන්ට වඩා මම උතුම් නොවෙමියි කීවේය.**
> (1 රාජාවලිය 19:4)

මෙන්න, දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ මිනිසා ... රෝගීන් සුවකළාවූ මළවුන් නැගිටෙව්වාවූ ස්වාමීන්ගේ නාමයෙන් ස්වභාවධර්මයේ කරුණු වලට අණ කළාවූ බලවත් මිනිසා දැන් බයෙන්, කලකිරී, මැරෙන්නට ඕනැවී සැඟවී සිටී.

## ප්‍රේරිතවූ පාවුල් :

ප්‍රේරිතවූ පාවුල් ද ජීවිතයෙහි පරාජයන්ට මුහුණ දුන් සේක. වරක් ඔහු ලියුවේ ආසියාවෙහිදී ලැබූ අත් දැකීම් නිසා ඔහුට "උසුලන්නට බැරි තරම් බරද" "ජීවිතය ගැන පවා බලාපොරොත්තු නැති තරමට" තත්වයකට පැමිණි බවය (2 කොරින්ති 1:8). ඔහු සමහර අවස්ථාවලදී කරදරයටද, වියවුලටද, පීඩාවටද, බියටද, අපහසුවටද මුහුණ පෑවේය (2 කොරින්ති 4:8-11; 7:5-6)

# යුද්ධය ජය ගැනීම

ඉහත සඳහන් ශ්‍රේෂ්ඨ නායකයෝ සෑම දෙනෙකුට පාහේ සතුරා සමග ඇතිවූ සටන් පරාජය වී ඇත. ඔබ ආත්මික යුද්ධයෙහි නිරත වන කල ඔබද සමහර අවස්ථාවලදී පරාජය අත් විඳිනු ඇත. නමුත් සතුරා සමග එක සටනක් පරාජයවීම යනු ඔබ මුළු යුද්ධයම පැරදීමක් නම් නොවේ. යුද්ධයක් සෑදී ඇත්තේ සටන් බොහොමයක් එකතුවය. ඉන් එක් සටනක් පරාජයවූ නිසාම ඔබ මුළු යුද්ධයම පරාජය වී නොමැත.

මේ සෑම මනුෂ්‍යයෙකුම එක් සටනක් පරාජයවූ නමුත් නැවත වතාවක් ප්‍රකෘතිමත් වී යුද්ධය ජය ගත්තේය. ඔව්හු භාවිත කළ ආත්මික උපක්‍රම ඔබද සටනක් පරාජයවූ විට භාවිත කිරීමට උපකාරී වනු ඇත. ඔබ සටනක් පරාජය වූ කල සතුරාගේ උගුලෙන් ගැලවී ඒමට හැකියාවක් තිබේ.

> **ඔහුගේ මලපතෙන් මිදෙන පිණිසද, දෙවියන්වහන්සේ ඔවුන්ට පසුතැවිල්ල දෙනසේක්දෝයි බලමින් මෘදුකමින් තරවටුකරන්ට ඕනැය. (2 තිමෝති 2:26)**

"මිදෙනවා" යනු පිබිදීම හෝ තමාවම අවදි කර ගැනීමය. මලපතක් යනු සැඟවුන උගුලකි (මෙම පරිච්ඡේදයේ අවසානයේ ඇති කොටස බලන්න). "මලපතෙන් මිදෙන පිණිස" යන්නෙන් අදහස් වනුයේ ඔබ ආත්මික සටනකින් පරාජය වුවහොත් ඉන් පසු එයින් මිදී ප්‍රකෘති වීමට පියවර ගත යුතු බවය. සතුරාගේ මලපතින් මිදීමට ගත හැකි පියවර කිහිපයක් නම් මෙසේය.

## පළමු පියවර: ඔබගේ අසමත්වීම හඳුනාගන්න.

- හායි නුවරදී තමුන් පරාජය වූ බව යෝෂුවා හඳුනාගෙන ඒ බව පිළිගත්තේය. එබැවින් ඔහු මෙසේ පැවසීය.

**අහෝ, ස්වාමීන්වහන්ස, ඉශ්‍රායෙල්වරුන් තමුන්ගේ සතුරන්ට පිටිපෑවාට පසු මම මක්කියම්ද? (යෝෂුවා 7:8)**

- ශික්ලග්හිදී තමා පරාජය වූ බව පිළිගැනීමට දාවිත් හට අපහසු නොවීය. පරාජය දෑසින් දකින්නට තිබුණි. නුවර ගින්නෙන් දැවී, කාන්තාවෝ වහල්කමට ගෙන ගොස් තිබුණි. එනමුත් බෙත්ෂෙබා සමග තමාගේ පාපයෙහිදී අසමත්කම භාරගැනීමට දාවිත් හට එතරම් පහසු නොවීය. මේ පාපය පිළිබඳව දැනසිටියේ ඔහුත්, බෙත්ෂෙබාත් දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘතුමාත් පමණි. එනමුත් දාවිත් "මම දෙවියන්වහන්සේට විරුද්ධව පව් කළෙමි" යි කියා පිළිගත්තේය (2 සාමුවෙල් 12:13).

- එලියා තමාගේ අසමත්කම පිළිගත්තේය. ඔහු මෙලෙස පැවසීය.

**තමාම දවසක ගමන් කාන්තාරයට ගොස් රෝතෙම් ගසක් යට හිඳගන, තමා මැරෙන ලෙස ඉල්ලමින්: ස්වාමීන්වහන්ස, ඉතින් ඇත: දැන් ස්වාමීන්වහන්ස, මාගේ ප්‍රාණය ගතමැනව, මක්නිසාද මාගේ පියවරුන්ට වඩා මම උතුම් නොවෙමියි කීවේය.**
(1 රාජාවලිය 19:4)

- පාවුල් තම අසමත්කම පිළිගත්තේය. ඔහු පැවසුයේ, තමා "කරදරයටත්, වියවුලටත්, පීඩාවටත්, මැඩීමටත්, ජීවිතය පිළිබඳ බලාපොරොත්තු විරහිත බවටත්" පත්වී ඇති බවය (2 කොරින්ති 4:8-9; 2 කොරින්ති 1:8).

ඔබ සටනක් පරාජය වී ඇති බව පිළිගැනීම අහංකාරය මගින් වලකාලීමට ඉඩ නොතබන්න. ඔබ සතුරාගේ මර උගුලෙන් ගැලවී ඒමට නම්, පළමුව ඔබ එහි පැටලී ඇති බව අවබෝධ කරගත යුතුය.

**අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටාගනිමුව. සැබෑවද අප තුළ නැත.**
(1 යොහන් 1:8)

## දෙවන පියවර: පසුතැවිලිවන්න.

ඔබගේ අසමත්කම පිළිගැනීම පමණක් නොසෑහේ. ඔබට සමාවන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටිය යුතුය.

**අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක. (1 යොහන් 1:9)**

- දාවිත් බෙත්ෂෙබා සමග කළාවූ පාපය පිළිබඳව පසුතැවිලිවිය. ගීතාවලිය 52 හි සඳහන් ඔහුගේ මහඟු පසුතැවිල්ලේ යාච්ඤාව කියවා බලන්න. ඔබ අසමත් වී ඇති කල භාවිත කිරීමට මෙය කදිම ගීතිකාවකි.
- යෝෂුවා හායි හිදී අසමත්වීමට හේතුව සොයා බලා දැනගත්තේය. ඔවුන්ගෙන් සේනා නායකයෙක් දෙවියන්වහන්සේට අකීකරුවීම නිසා මුළු සේනාවම පරාජයවීමට සැලැස්වූ බව යෝෂුවා දැනගත්තේය. ඔහුත් මුළු සෙනඟත් දෙවියන්වහන්සේ හමුවෙහි පසුතැවිලි වූවෝය (යෝෂුවා 7).

* එලියා පසුතැවිලිවිය. ඔහු තමාගේ පාපිෂ්ඨ මුතුන් මිත්තන්ට වඩා යහපත් නොවන බව පිළිගත්තේය (1 රාජාවලිය 19:4)
* පාවුල් තමාගේ මාංශය සමග මහත් පොරබැදීමක් කළත් (රෝම 7) "මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම" හේතුකොටගෙන ජය ගැනීමට හැකිවූ බව පෙන්වා දුන්නේය (රෝම 8: හෙබ්‍රෙව් 6:1).

## තුන්වන පියවර: ඔබගේ ආත්මික ශක්තිය නැවත ගොඩනගන්න.

ස්වභාවික ලෝකයෙහි යුද්ධ හමුදාවක් යම් සටනකින් පරාජය වුවහොත් හමුදාව යථා තත්වයට ගෙන ඒම සඳහා කාලයක් වැය කරති. නැවත සටනට පිටත් වනුයේ ඉන් පසුවය. හමුදා සේනාංක භාරව සිටින නිලධාරීහු ගැටලුව විශ්ලේෂණය කොට බලා, වැරදි නිවැරදි කොට, භට පිරිස් ශක්තිමත් කොට දිරිගන්වති. ආත්මික ලොවෙහිද මෙම සත්‍යය ඉතා වැදගත් මූලධර්මයකි. ආත්මික සටනකදී ඔබ අසමත් වුවහොත් නැවත වතාවක් ඔබගේ ආත්මික ශක්තිය වර්ධනය කරගත යුතුය.

* යෝෂුවා නැවත වතාවක් සටන් බිමට පිටත්ව යැමට පෙර ආත්මික ශක්තිය උපදවා ගනු පිණිස ස්වාමින්වහන්සේ ඉදිරියෙහි යාච්ඤාවෙන් රැඳී සිටියේය. ඔහු පරාජයට හේතුව සොයා දැනගැනීමටත් නිවැරදි කිරීමට ගත යුතු පියවර දැනගැනීමටත් යාච්ඤා කළේය (යෝෂුවා 7:6-15).

* දාවිත් බෙත්ෂෙබා සමග තම අසමත්කමෙන් අනතුරුව නිරාහාරයෙන් සිට යාච්ඤා කළේය. බෙත්ෂෙබා ඔහු නිසා වැදූ පුත්‍රයා මියගිය පසුව දාවිත් ආහාර පාන ලබාගත්තේය. ශික්ලග්හි සිදුවීමෙන් අනතුරුව දාවිත් "ස්වාමින්වහන්සේ තුළ තමාව ශක්තිමත් කරගත්තේය" සටන් බිමට යාමට පෙර ඔහු තම හමුදාව සංවිධානය කලේය (1 සාමුවෙල් 30:6).

* එලියා විවේකගෙන, දේව දූතයෙකුගෙන් සත්කාර විඳ, දෙවියන්වහන්සේගේ විශේෂ වූ විදහා දැක්වීමකින් බලවත් කරනු ලැබ ශක්තිය නිපදවා ගන්නා තුරු කඳු මුදුනෙහි රැඳී සිටියේය (1 රාජාවලිය 19).

* පාවුල් දෙවියන්වහන්සේ තුළ තමාව දිරිගන්වා ගත්තේය. ඔහු තමාටම මතක් කර දුන්නේ, තමාගේ අසමත්වීමෙන් වත් තමාව දෙවියන්වහන්සේගෙන් වෙන්කර තැබිය නොහැකි බවය.

**ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්නේ කවුද? විපතවත්, සිත්වේදනාවවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්, නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත්, කඩුවවත් අප වෙන්කරන්නේද?**

**නුමුත් අපට ප්‍රේමකළාවූ තැනැන්වහන්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේදී අතිශයින්ම ජයගන්නෝ වමුව. මක්නිසාද මරණයටවත්, ජීවනයටවත්, දූතයන්ටවත්, අධිපතිකම්වලටවත්, දැන් පවතින දේවලටවත්, මතු පැමිණෙන දේවලටවත්, පරාක්‍රමවලටවත්, උසටවත් ගැඹුරටවත්, අන් කිසි මැවිල්ලකටවත්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්ට නොහැකිවන්නේයයි ඒකාන්තයෙන්ම දනිමි. (රෝම 8:35, 37-39)**

ඔබගේ ආත්මික ශක්තිය නැවත ගොඩනඟා ගැනීමට ක්‍රම කීපයක් මෙන්න:

* ආත්මික යුද්ධ වැදීම පිළිබඳව මෙතෙක් ලියැවී ඇති අතිවිශිෂ්ටතම ග්‍රන්ථය වන... දේව වචනය අධ්‍යයනය කරන්න.
* යාච්ඤාවෙන් හා නිරාහාරයෙන් කල් ගෙවන්න. මෙම පාඨමාලාවෙහිදී ඔබ ඉගෙනගත්තාවූ නිරාහාරය හා යාච්ඤාව පිළිබඳ මූලධර්ම ක්‍රියාවට නංවන්න. ඔබගේ ජීවිතයෙහි සතුරාගේ බලය බැඳලීමට කි%යා කරන්න. ඔබ අසමත්වීමට හේතු මොනවාදැයි ඔබට එළිදරව් කර දෙන ලෙසත් ඒවා නිවැරදි කිරීම පිණිස කළ යුතු ක්‍රියා මොනවාදැයි පෙන්වාදෙන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.

- මෙම පාඩමාලාවෙහි ඇතුලත් ආත්මික සටන් සඳහා උපක්‍රම පුනරීක්ෂණය කරන්න. ඔබගේ ශක්තිය නැවතත් නැවුම් කරන ලෙසත්, මෙම උපක්‍රම ක්‍රියාවට නැංවීමට ඔබට සහාය වන ලෙසත් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.
- ශාරීරික විවේකය ලබාගන්න. මිනිසා ශරීරය, ආත්මය හා ප්‍රාණයෙන් සමන්විතය. ඔබගේ ශාරීරික සිරුර වෙහෙසට පත්ව සිටින විට සාතන් එයින් වාසිය ගෙන ඔබගේ ආත්මයට හා ප්‍රාණයට බලපෑම් ඇති කරයි.

## හතරවන පියවර: නැවත සටන්බිමට යන්න.

සතුරාගේ උපක්‍රම අතුරින් ප්‍රධාන එකක් වනුයේ ඔබ ආත්මික සටනකින් පරාජයට පත් වූ කල අත්හැරදමා යාමට ඔබව පෙළඹවීමය. ඔබ පරාජය වූ විට සමහර අවස්ථාවලදී ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ පරාජය ගැන ඔබහට ඒත්තුගැන්වීමක් කරන බව සැබෑය. එහෙත් සතුරාගේ දෝෂාරෝපණය හා ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඒත්තුගැන්වීම අතර විශාල වෙනසක් පවතී. ශුද්ධාත්මයාණන්වහන්සේ සැමවිටම ඔබගේ පාපය කුමක්දැයි නිශ්චිත ලෙස පහදා දෙන නමුත් සාතන්ගේ දෝෂාරෝපණය පොදු වූවකි.

සාතන් පරාජය පිළිබඳව පොදු ලෙස ඔබට කතා කරයි.
"දැන් ඉතිං ඔබත් ඕක අත්හැර දමන්න. සියලු දෙනාම ඔබ ගැන විශ්වාසය රැඳවීම අතහැර දමා ගොස් ඇත.
දෙවියන්වහන්සේ සලකන්නේ නැහැ. නැත්නම් ඔබට උපකාර කරන්න තිබුණානේ.
ඔබ හරිම දුර්වලයි, කිසිම වැඩකට නැති කෙනෙක්, කවදාවත් ඔබට නම් ක්‍රිස්තියානි කෙනෙක් වෙන්න නම් බැහැ.
ඔයා හොඳ මදි"

සතුරාගේ දෝෂාරෝපණයට සවන් නොදෙන්න. ඔබගේ පරාජය පිළිගන්න. දෙවියන්වහන්සේ ඉදිරියෙහි පසුතැවිලිවන්න. එසේම අවබෝධ කරගත යුතු දෙය නම්..

> **එහෙයින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින්නන්ට දැන් දඬුවමට පත්කිරීමක් නැත. (රෝම 8:1)**

සාතන් ඔබට දොස් තැබීමට ලක් කරන්නාවූ උපක්‍රම පරාජය කිරීමට මෙම පදය භාවිත කරන්න. ඉන්පසු නැවත සටන් බිමට අවතීර්ණවන්න!

- යෝෂුවා පොරොන්දු දේශයෙහි තව බොහෝ සාර්ථක සටන් දියත් කළේය. ඔහු හායි නගරයට නැවත හැරී ගොස් වරක් ඔවුන්ව පරාජය කළාවූ එම සේනාවම සමග නැවත සටන් කොට ජය ලැබුවේය. පරාජයකට පසුව ඔබ නැවත සටන් බිමට පැමිණි විට සතුරා ඔබෙන් පැහැරගත් සියල්ල පමණක් නැවත සතු කරගැනීමට පමණක් නොව, නව ජයග්‍රහණ කරාද එළැඹිය හැකිය.
- ශික්ලග්හි සටනින් පරාජය වූ පසුව, දාවිත් නැවත වතාවක් මහත් ජයග්‍රහණ අත්පත් කරගැනීම පිණිස සටන් බිමට පැමිණියේය. සතුරා තමාගෙන් පැහැරගත් සියල්ල ඔහු නැවතත් තමා සන්තකයට හිමිකරගත්තේය. අමලෙක්වරු පැහැරගත් සියල්ල දාවිත් නැවතත් රැගෙන ආවේය.

> **මෙසේ දාවිත් අමලෙක්වරුන් විසින් ගෙනගිය සියල්ලත් තමාගේ භාර්යාවන් දෙදෙනාත් ගළවාගත්තේය. ලොකු කුඩා සියල්ලන්ගෙන්ද පුත්‍රයන්ගෙන්ද දූවරුන්ගෙන්ද කිසිවෙක්වත් කොල්ලයවත් ඔවුන් ගත්තාවූ කිසිවක්වත් අඩු නැතුව දාවිත් සියල්ලම නැවත ගෙනාවේය. (1 සාමුවෙල් 30:18-19)**

- එලියා තමාගේ කළකිරීමෙන් ඉවත්වී, ආත්මික සටන්බිමට නැවත හැරී ඇවිත්, ඔහුගේ සේවා ඉතිහාසයෙහි ඉටුකළ අතිවිශිෂ්ටතම හාස්කම් කිහිපයක්ම සිදු කළේය.
- පාවුල් පිළිබඳව නම්... මීට පෙර අප කියවූ බයිබල් කොටසෙහි ඉතිරි කොටස කියවන්න.

**"අපි හැම අතින්ම මඩිනු ලබමුව. එහෙත් හිර නොවී සිටිමුව, වියවුල්ව සිටිමුව, එහෙත් බලාපොරොත්තුවක් නැතුව නොවේය. ලුහුබඳිනු ලබමුව, එහෙත් අතිහරිනු නොලබමුව. හෙළා දමනු ලබමුව, එහෙත් විනාශ නොවී සිටිමුව"** (2 කොරින්ති 4:8, 9).

මෙන්න පරාජය අභිබවා ජයගත්තාවූ ආත්මික සටන්කාමියෝ: ඔහු පැවසූ දෙය නම්:

මඩිනු ලැබූ (කරදර) ... නුමුත් හිර නොවෙමු.
වියවුල් වුවද ... බලාපොරොත්තු සුන් නොකරගමු
පීඩා කරනු ලැබුවද ... ප්‍රතික්ෂේප නොවෙමු
හෙළනු ලැබුවද ... විනාශ නොවෙමු!

මතක තබාගන්න: "මක්නිසාද ධර්මිෂ්ඨයා සත් වරක් වැටුණත් නැගිටින්නේය" (හිතෝපදේශ 24:16)

## අසමත්කමෙන් ඉගෙනගැනීම

පාවුල් කොරින්තියේ සභාවට ලියුවේ:

**එබැවින් සහෝදරයෙනි, ආසියාවේදී අපට පැමිණි පීඩාව ගැන නුඹලා නොදැන සිටිනවාට නොකමැත්තෙමුව. එනම් ජීවිතය ගැන පවා අපට බලාපොරොත්තුවක් නැති තරමට, උසුලන්ට බැරි පමණ, අප පිටට බර පැමිණුණ බවය. එසේය, මළවුන්ගෙන් නැගුටුවන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි මිස අප කෙරෙහිම විශ්වාස නොකරන පිණිස මරණ තීන්දුව අප තුළේම තිබුණේය. උන්වහන්සේ මෙබඳු මහත් මරණයකින් අප ගැළෙවුසේක. මතුත් ගළවනසේක. උන්වහන්සේ තවදුරටත් අප ගළවනසේකැයි යන බලාපොරොත්තුව අප විසින් උන්වහන්සේ කෙරෙහි තබා තිබේ.** (2 කොරින්ති 1:8-10)

පාවුල් ලියමින් පවසා සිටියේ ආසියාවෙහිදී ඔහු ලැබූ අත්දැකීමෙන් තමා හොඳ පාඩමක් ඉගෙනගත් බවය. එම වැදගත් පාඩම නම්, "අපි අප කෙරෙහි විශ්වාස නොකළ යුතු බවත්, දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කළ යුතු බවත්ය". අසමත්කමක් ඇසුරෙන් අපට උගත හැකි මහඟු පාඩමක් මෙය වේ. ආත්මික යුද්ධයෙහිදී ඔබගේ ශක්තිය කෙරෙහි විශ්වාසය රැඳවිය නොහැකිය. ඔබගේ ශක්තිය, ඔබගේ බලය, ඔබගේ ජය තහවුරු වනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පමණකි.

පාවුල් ගැටලු, පරීක්ෂාකිරීම, සෝදිසිකිරීම් හා අසමත්කම් වලින් ඇති ආත්මික ප්‍රයෝජන සොයා බැලීම සඳහා ස්වභාවික ලෝකය ඉක්මවා ඊට ඔබ්බට බැලුවේය.

**එහෙයින් අපි ක්ලාන්ත නොවෙමුව. අපේ පිටත මනුෂ්‍යයා ක්ෂයවෙන නමුත්, අපේ ඇතුල් මනුෂ්‍යයා දවසින් දවස අලුත්කරනු ලබන්නේය. මොහොතකට පවතින අපේ සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලාසිටින්නාවූ අපට, ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සාදාදෙන්නේය. මක්නිසාද පෙනෙන දේ කාලිකය, නොපෙනෙන දේ සදාකාලිකය.** (2 කොරින්ති 4:16-18)

අපගේ බාහිර මනුෂ්‍යයා විනාශවුනත්, අභ්‍යන්තර මනුෂ්‍යයා නැවුම් කරනු ලබන බව පාවුල් ඉගෙන ගත්තේය. සටනෙහිදී ඇතිවන සැහැල්ලු දුක්විඳීම් ආත්මික වර්ධනය ගෙන දෙයි. වැදගත් වන්නේ දැසට පෙනෙන දෙය නොව ආත්මික ලොවෙහි සිදුවන දෙය වේ.

පාවුල් සටන අත්හැර යනු වෙනුවට, තම පරාජයෙන් පාඩම් ඉගෙන ගෙන ජයග්‍රහණය කරා ගමන් කළේය. 2 කොරින්ති 1:10 හි ඔහු පෙන්වා දෙන්නේ දෙවියන්වහන්සේ ...

- ගැළවුසේක. (අතීතයෙහිදී)
- මතුත් ගළවනසේක. (අනාගතයෙහිදී)
- තව දුරටත් ගළවනසේක. (වර්තමානයේ) කියාය.

## ජයග්‍රහණය කරා

පාවුල් විඳි සියලු ආකාර පීඩා, පරීක්ෂා, වියවුල්, කනස්සලුවීම්, කරදර සියල්ල මධ්‍යයේ පවා ඔහුගේ ජීවිතයෙහි අවසාන කාලය මෙලෙස කීමට හැකිවිය. එනම්,

> **"මම යහපත් යුද්ධයෙහි යුද්ධ කළෙමි, මම දිවීම කෙළවර කළෙමි, මම ඇදහිල්ල රක්ෂා කළෙමි."** (2 **තිමෝති** 4:7)

තාවකාලික සටනක් පරාජය වුවත්, සතුරා සමග යුදයෙහි ජය ගත හැකි ක්‍රමය ඔබ ඉගෙන ගතහොත් ඔබටත් දිනක මෙම වචන ප්‍රතිරාව කළහැකි වනු නියතය. එනම් "මම යහපත් යුද්ධයෙහි යුද්ධ කළෙමි"...!

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. මෙම පාඩමෙහිදී ඉගෙනගත් උදාහරණ අනුව, සටනක් පරාජයවූ නමුත් යුද්ධය දිනූ මනුෂ්‍යයන් හතර දෙනෙකු නම් කරන්න.

3. සටනක් පරාජයවූ නමුත් යුද්ධ ජයගැනීම සඳහා ගත යුතු පියවර හතරක් නම් කරන්න.

4. ඔබගේ අසමත්වීම පිළිබඳව සාතන් ඔබට දොස් පවරනවිට, ඔහුට විරුද්ධව භාවිතා කළ හැකි බයිබල් පදයක් නම් කරන්න.

5. ඔබ සාතන් සමග සටනකින් පරාජයවූ පසුව නැවත ප්‍රකෘතිමත් තත්වයට පැමිණිය හැකි බව ඔප්පු කිරීමට බයිබල් පදයක් දෙන්න.

6. පාවුල් ආසියාවෙහි ලත් පරාජයෙන් ඉගෙනගත් පාඩම කුමක්ද?

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. ඔබ සාතන් හා පැවති සටනකින් පරාජය වී තිබේද? එම පරාජයෙන් ජයගැනීමට පහත සඳහන් පියවර හතර අනුගමනය කරන්න.
   - ඔබගේ අසමත්කම හඳුනාගන්න
   - පසුතැවිලිවන්න
   - ඔබගේ ආත්මික ශක්තිය නැවුම් කරගන්න
   - නැවත සටන් බිමට පිවිසෙන්න

2. සාතන් ඇදහිලිවතුන් පරාජය කිරීම සඳහා භාවිතකරන එක් ප්‍රධාන උපක්‍රමයක් නම් රැවටීමය. "රැවටීම" යනු වැරදි මඟපෙන්වීමක් හෝ අතරමං කිරීමක් හෝ ඇත්ත නොවන දෙයක් විශ්වාස කිරීමට සැලැස්වීමය. රැවටිලිකාරකම පිළිබඳව බයිබලය අපට උගන්වන කාරණා කිහිපයක් නම්:

   - සාතන් රැවටිලිකාරයෙක් බැවින් පුද්ගලයන් පමණක් නොව ජාතීන් පවා රවට්ටන බව පවසා ඇත. එළිදරව් 20:10
   - සාතන් "සියලූ ආකාර රැවටිලිකාරකම හා අධර්මිෂ්ඨකම" සමග ක්‍රියා කරයි. 2 තෙසලෝනික 2:10
   - රැවටිලිකාරකම වැඩිවන බව අපට අනතුරු අඟවා තිබේ. 2 තිමෝති 3:13
   - රැවටිලිකාරකම වැඩිවන විට, යේසුස්වහන්සේගේ නැවත පැමිණීම පෙන්නුම් කරදෙන සිදුවීම් දක්නට ලැබෙන බැවින් ප්‍රවේසම් වීමට උපදෙස් දී තිබේ. මතෙව් 24; මාර්ක් 13; 2 තෙසලෝනික 2:3
   - සාතන් විසින් රැටවීමට භාවිතකරගන්නවුන් පිළිබඳ අනතුරු අඟවා තිබේ. 2 කොරින්ති 11:13; තීතස් 1:10; 2 පේතෘස් 2:13; 2 යොහන් 7
   - ගැළවීම නොලද සෑම මනුෂ්‍යයෙකුම තමාගේම හදවතින් රැවටී සිටී. යෙරමියා 17:9
   - ගැළවීම නොලද හැම මනුෂ්‍යයෙකුම පාපයෙන් රැවටී සිටී. 2 කොරින්ති 4:4; හෙබ්‍රෙව් 3:13
   - රැවටිලිකාර "සාධාරණ කථා" එනම් දේව වචනය හා නොගැළපෙන කතා පිළිනොගන්න. රෝම 16:18; 2 කොරින්ති 4:2

ඔබ රැවටීමට ලක්වනුයේ:

- එලක් නොමැති දර්ශනවාදයට ඇහුම්කන් දුන්නනොත්, කොලොස්සි 2:8
- ඔබ වස්තුව කෙරෙහි විශ්වාසකොට, මාංශයේ තෘෂ්ණාවට ඉඩ දුන්නොත්: මතෙව් 13:22; මාර්ක් 4:19; එපීස 4:22
- ඔබ දේව වචනය අසන්නෙක් පමණක් මිස එය කරන්නෙක් නොවේ නම්: යාකොබ් 1:22
- ඔබට පාපය නැතැයි ඔබ කියනවා නම්: 1 යොහන් 1:8
- ඔබ දුෂ්ට මනුෂ්‍යයන්ට සවන් දෙනවා නම්: 2 තිමෝති 3:13
- ඔබගේ කිසි වටිනාකමක් නොමැති නමුත් ඔබ වටිනා කෙනෙකු යයි ඔබ සිතනවා නම්: ගලාති 6:3
- ඔබ වපුරන දෙය කපා ගන්නේ නැතැයි සිතනවා නම්, ගලාති 6:7
- අධර්මිෂ්ඨයන් දේව රාජ්‍යය හිමිකරගනී යැයි ඔබ සිතනවා නම්. 1 කොරින්ති 6:9
- ඔබ සතුව ලෝකයෙහි ප්‍රඥාව තිබෙන බැවින් ඔබ බුද්ධිමතෙකැයි සිතනවා නම්: 1 කොරින්ති 3:18
- ආත්මික කෙනෙකු මෙන් පෙනෙන නමුත්, පාලනයෙන් තොරවූ ඔබගේ දිව ඔබගේ නියම ස්වභාවය එළිදරව් කර දෙයි නම්: යාකොබ් 1:26
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සැබවින්ම මාංශවත්ව පැමිණියේ යැයි ඔබ විශ්වාස නොකරයි නම්: 2 යොහන් 7
- පාපය සමග ඔබගේ සම්බන්ධතාවය ඔබට කිසිම බලපෑමක් ඇති නොකරාවියැයි ඔබ සිතනවා නම්: 1 කොරින්ති 15:33

මෙම ලේඛණය අධ්‍යයනය කළ පසුව ඔබව සතුරා රවටා ඇති අංශ දැකගැනීමට තිබේද? එසේ නම් මේ රැටවීම හඳුනාගන්න, පසුතැවිලිවන්න, නැවත සටන් බිමට අවතීර්ණවන්න.

3. ආත්මික යුද්ධයෙහිදී දෙවියන්වහන්සේ ඔබගේ මිදුම්කරුවාණෝ බව බයිබලය ප්‍රකාශකරයි. 2 සාමුවෙල් 22:2, 1 ලේකම් 11:14; ගීතාවලිය 18:2; 40:17; 70:5; 144:2; දානියෙල් 6:16

- උන්වහන්සේ ඔබගේ සතුරන් ඔබගේ දෑතට පාවාදෙනසේක. (විනිශ්චයකාරයා 3:28)
- යේසුස්වහන්සේ මිදුම්කරුවාණෝ යයි නම් කරනු ලැබූසේක. රෝම 11:26
- යේසුස්වහන්සේ පැමිණියේ මිදීම ප්‍රකාශ කරන පිණිසය. ලූක් 4:18
- ඔබ මුදාගන්නේ මනුෂ්‍යයාගේ ශක්තියෙන් නොවේ. ගීතාවලිය 33:16

දෙවියන්වහන්සේ මුදනසේක:

දුප්පතුන්: යෝබ් 36:15
උන්වහන්සේට බිය වන අය: ගීතාවලිය 34:7
ධර්මිෂ්ඨයන්ව: හිතෝපදේශ 11:8,21
ප්‍රඥාවන්ත ලෙස හැසිරෙන අය: හිතෝපදේශ 28:26
දේව භක්තිකයන්: 2 පේතෘස් 2:9

උන්වහන්සේ ඔබව මුදාගන්නේ:

දරුණු මනුෂ්‍යයන්ගෙන්: 2 සාමුවෙල් 22:49
සතුරාගෙන්: 2 සාමුවෙල් 22:18; ගීතාවලිය 18:48; 78:42
මනුෂ්‍යයන්ගේ උත්සාහයන්ගෙන්: 2 සාමුවෙල් 22:44; ගීතාවලිය 18:43
සියලු බියෙන්: ගීතාවලිය 34:4
මරණ බියෙන්: හෙබ්‍රෙව් 2:15
ඔබගේ කරදරයෙන්: ගීතාවලිය 34:17; 54:7; 81:7
පීඩාවලින් හා ව්‍යසනවලින්: ගීතාවලිය 34:19; ක්‍රියා 7:10; 2 තිමෝති 3:11
දුෂ්ට පාලකයන්ගෙන් හා දුෂ්ට මිනිසුන්ගෙන්: ක්‍රියා 12:11
ව්‍යවස්ථාවෙන්: රෝම 7:6
පරාජිතවීමෙන් මහිමවත් විමුක්තියට: රෝම 8:21
දෙවන මරණයෙන්: 2 කොරින්ති 1:10
අන්ධකාරයේ බලවේගයෙන්: කොලොස්සි 1:13
පැමිණෙන්ට තිබෙන දේව උදහසින්: 1 තෙසලෝනික 1:10
අසාධාරණවූ මිනිසුන්ගෙන්: 2 තෙසලෝනික 3:2
යුද්ධයෙන්: ගීතාවලිය 55:18
වැටීමෙන් සහ ඔබගේ ප්‍රාණය මරණයෙන්: ගීතාවලිය 56:13; 116:8
ඔබට වෛර කරන්නන්ගෙන්: ගීතාවලිය 69:14
නිරයෙන්: ගීතාවලිය 86:13
අසහනයෙන් : ගීතාවලිය 107:6
විනාශයෙන් : ගීතාවලිය 107:20

# අවසාන දැනුවත් කිරීම

## ''' ආත්මික යුද්ධයෙහි අවසාන මහා සටන

ආත්මික යුද්ධයෙහි අවසාන මහා සටන උදෙසා මුළු යුගයන් පුරා ආ ආත්මික යුද්ධයෙහි විශාලම සහ අවසාන සටන ජයාන්විත නිමාවකට ගෙන එන ගැටුමක් ඇත. සාතන් සහ ඔහුගේ දුෂ්ට බලසේනාව පරාජය වන අතර යේසුස්වහන්සේ රජුන්ගේ රජ ලෙසින් සදාකාලයෙන් සදාකාලයට රජකම් කරනසේක.

# විසිහතරවන පරිච්ඡේදය

## අවසාන යුද්ධය

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට ...

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- අවසාන යුද්ධය වෙත මඟපෙන්වන සිදුවීම් සාරාංශ කිරීමට
- අවසාන යුද්ධය විස්තර කිරීමට
- සාතන් සහ දුෂ්ට ආත්ම බලවේගයන්ගේ අවසාන ඉරණම විස්තර කිරීමට

**යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය :**

> **ඔවුන් මුළාකළ යක්ෂයා වනාහි, මෘගයාද බොරු අනාගතවක්තෘද වසන, ගින්නෙන්ද ගෙන්දගම්න්ද යුත් විලට හෙළනු ලැබුවේය. ඔව්හු සදාකාලේටම දිවා රෑ දෙක්හි වධකරනු ලබති. (එළිදරව් 20:10)**

## හැඳින්වීම

ඔබ මෙම පාඨමාලාවේ ඉගෙනගත් අයුරින් සාතන් කෙරෙහි වන අවසාන විනිශ්චය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම තුළින් දැනටමත් ප්‍රකාශයට පත්කොට ඇත. එහෙත් යේසුස්වහන්සේ යළි පොළොවට පැමිණෙන තුරු මෙම විනිශ්චය මුළුමනින් ඉෂ්ට වන්නේ නැත.

මේ පරිච්ඡේදය අවසාන යුද්ධය, දුෂ්ට බලවේගයන් පරාජයට පත් කරන මහා ආත්මික සටන වෙත යොමු වෙයි. මෙම අවසාන යුද්ධයෙන් යේසුස්වහන්සේ රජුන්ගේ රජ ලෙස ඔටුනු පැළඳීම, දේව රාජ්‍යය දෘශ්‍යමාන ලෙසින් ස්ථාපිත කිරීම සහ දුෂ්ට ආත්ම බලවේග කෙරෙහි වන අවසාන විනිශ්චය ප්‍රකාශයට පත් කරනු ඇත.

## අවසාන යුද්ධයට පෙරටුව යන සිදුවීම්

අවසාන යුද්ධයට පෙරටුව යන ප්‍රධාන සිදුවීම් මේවාය.

## යේසුස්වහන්සේගේ නැවත පැමිණීම :

ඇදහිලිවතුන් උදෙසා ස්වාමින්වහන්සේ යළි පොළොවට පැමිණෙන බව බයිබලය උගන්වයි. යේසුස්වහන්සේ ස්වකීය අනුගාමිකයන්ට මෙසේ පොරොන්දුවූ සේක.

> **මාගේ පියාණන්වහන්සේගේ ගෘහයෙහි බොහෝ වාසස්ථාන ඇත්තේය. එසේ නොවුයේ නම් මා විසින් නුඹලාට කියනවා ඇත. මක්නිසාද නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස යමි. මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙලකරමි නම්, මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි. (යොහන් 14:2-3)**

ඇදහිලිවතුන් වෙනුවෙන් යේසුස්වහන්සේගේ යළි පැමිණීම "ඔසවා ගැනීම" ලෙස හැඳින්වේ. ඇදහිලිවතුන් වෙනුවෙන් යේසුස්වහන්සේගේ යළි පැමිණීම පිළිබඳව විස්තර 1 තෙසලෝනික 4:13-18 හි දී ඇත. මේ පද පෙන්වා දෙන්නේ:

- යේසුස්වහන්සේම යළි පැමිණේ (16 පදය)
- යේසුස්වහන්සේ තුළ ඇදහිල්ල ඇතිව මළාවූ අය සොහොන් ගෙවලින් නැගිටීමක් සිදුවීම (16 පදය)
- "යම් පුද්ගලයෙකු එක් ස්ථානයකින් තවත් ස්ථානයකට ගැනීම" යන අරුත් දෙන "ඔසවා ගැනීමක්" සිදුවනු ඇත. ජීවත්ව සිටින ඇදහිලිවතුන් යේසුස්වහන්සේ සම්මුඛ වන පිණිස පොළොවෙන් ඇදගනු ඇත. (17 පදය)
- කලින් මරණයට පත් ඇදහිලිවතුන් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීමේදී ජීවත්ව සිටින ඇදහිලිවතුන් හා ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අතර නැවත හමුවීමක් සිදුවනු ඇත. (17 පදය)

සමහර ඇදහිලිවතුන් විශ්වාස කරන්නේ ඔසවා ගැනීම පීඩා කාලයට පෙර සිදුවන බවත් ඇදහිලිවතුන්ට පොළොවේ මේ දුෂ්කර කාලය අත් දකින්ට නොලැබෙන බවත්ය. අනෙක් අය විශ්වාස කරන්නේ මේ පීඩා කාලය අතර මැද" ඔසවා ගැනීම සිදුවන බවයි. පීඩා කාලය අවසානයේ ඔසවා ගැනීම සිදුවන බව තවත් අය විශ්වාස කරති. වඩාත් පොදු විශ්වාසය වන්නේ පීඩා කාලයේ ආරම්භයට පෙර ඇදහිලිවතුන්ගේ ඔසවා ගැනීම සිදුවන බවය. ඔසවා ගැනීමේ කාලය පිළිබඳ වෙනස් අදහස් ඇත්තේ බයිබලයේ අනාගතවාක්‍යමය කොටස් පිළිබඳ ඇති විවිධ අර්ථදැක්වීම නිසා වේ. ඔබ සැබෑ ඇදහිලිවන්තයෙකු හා ඔසවා ගැනීම සිදුවන ඕනෑම අවස්ථාවක යේසුස්වහන්සේ සමඟ යාමට සූදානම්ව සිටිය යුතු බව දැන ගැනීම වඩාත්ම වැදගත්ය.

මේ උතුම් සිදුවීම වන නිවැරදි වේලාව කිසි මිනිසෙකුට දැනගත නොහැකිය.

> **නුමුත් ඒ දවස හා පැය මාගේ පියාණන්වහන්සේ මිස දන්නා කෙනෙක් නැත, ස්වර්ගයෙහි දේවදූතයන්වත් පුත්‍රයාවත් දන්නේ නැත. (මතෙව් 24:36)**

ඔසවා ගැනීම සිදුවන නිවැරදි වේලාව කිසි මිනිසෙකු නොදන්නේ වුවත්, කාලය ළංවූ විට දක්නට ලැබෙන අනාගතවාක්‍යමය සලකුණු කීපයක් යේසුස්වහන්සේ පෙන්නුම් කළ සේක. ඔබට මේවා පිළිබඳව මතෙව් 24 කියවිය හැකිය.

## පීඩාව :

ලෝක ඉතිහාසයේ කිසිකලෙකත් නොවූ අයුරින් දුෂ්ට ආත්ම බලවේග වඩාත් ක්‍රියාශීලී වන පීඩාව නමින් හැඳින්වෙන දුෂ්කර කාලයක් පොළොවෙහි පවතින බවට බයිබලය පවසයි. සාතන් ඔහුගේ අශුද්ධ ත්‍රිත්වය වන, මෘගයා සහ බොරු අනාගතවක්තෘවරු පිහිටුවනවා ඇත (එළිදරව් 13: 16:13-14). "උසස් ස්ථානයේ ඇති ආත්මික දුෂ්ටකම" තුළින් පුදුම, සලකුණු ඇති කරමින් බොහෝ දෙනෙකු රවටනවා ඇත. ඔවුන් නමස්කාරය සොයමින් අයිතිවාසිකම පිළිබඳ විශේෂ සලකුණකින් මිනිසුන් වරදට පත් කරනු ඇත.

පීඩාව මාස 42ක් හෝ දවස් 1260ක් පවතිනු ඇත (දානියෙල් 9:24-27). එය ඉතා දුෂ්කර කාලයක් වනු ඇත. මීට පෙර ලෝකයේ අමාරු කාලයන් තිබිණ. එහෙත් කාරණා තුනකින් පීඩාව අනෙක් අමාරු කාලයන්ගෙන් පැහැදිලිව වෙන් කොට දැක්විය හැකිය.

1. **එය ප්‍රාදේශියව නොව ලෝක ව්‍යාප්තව පවතිනු ඇත.**

**මාගේ ඉවසීමේ වචනය නුඹ රක්ෂාකළ හෙයින් පොළොවේ වසන්නන් පරීක්ෂාකිරීමට මුළු ලෝකය පිටට පැමිණෙන්ට තිබෙන්නාවූ පරීක්ෂාවේ පැයෙන් මමත් නුඹ ආරක්ෂාකරන්නෙමි. (එළිදරව් 3:10)**

2. **ලෝකයේ අවසානය ළඟ බව මිනිසුන් දැනගනු ඇත.**

**ඔව්හු කඳුවලටත් පර්වතවලටත් කථාකොට: අප පිට වැටී, සිංහාසනයෙහි වැඩ ඉන්න තැනැන්වහන්සේගේ මුහුණ ඉදිරියෙනුත් බැටළු පැටවාණන්ගේ උදහසිනුත් අප සඟවා ගනිල්ලා, මක්නිසාද උන්වහන්සේගේ උදහසේ මහත් දවස පැමිණුණ බැවින් සිටින්ට පුළුවන් කාටදැයි කීවෝය. (එළිදරව් 6:16-17)**

3. **විපතෙහි සැරකම පෙර අත්දුටුවාටත් වඩා අධික වනු ඇත.**

පීඩා කාල පරිච්ඡේදය තුළ දෙවියන්වහන්සේ වෙතින් පොළොව වෙත පැමිණෙන විනිශ්චයන් මාලාවක් ඇත්තේය. මෙම විනිශ්චයයන් එළිදරව් 6" 8-9 හා 16 පරිච්ඡේද හා මතෙව් 24:4-14 හි විස්තර කර ඇත. මෙම විනිශ්චයයන්ට හේතුව වන්නේ දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කිරීම හා පාපය වෙනුවෙන් ලෝකයට දඬුවම් කිරීමය.

**සහස්‍ර වර්ෂය:**

සහස්‍ර වර්ෂය යනු පීඩා කාලයට පසු යේසුස්වහන්සේ ධර්මිෂ්ඨකමින් පොළොව පාලනය කරන අවුරුදු 1000ක කාල පරිච්ඡේදයකි.

**ස්වාමින්වහන්සේ මුළු පොළොව කෙරෙහි රජව සිටිනවා ඇත. ඒ කාලයෙහි ස්වාමින්වහන්සේ පමණක්ම දෙවිව සිටිනවා ඇත. උන්වහන්සේගේ නාමය පමණක්ම ඇතිවන්නේය. (සෙකරියා 14:9)**

යෙරුසලම් නගරය පාලනයේ මධ්‍යස්ථානය වනු ඇත.

**මතු දවස්වලදී ස්වාමින්වහන්සේගේ ගෘහයේ කන්ද කඳු මුදුනේ පිහිටුවනලදුව හෙල්වලට වඩා උසස්වන්නේය. සියලු ජාතිහුද ඒ වෙතට රැස්වී එන්නෝය. බොහෝ ජනයෝද පිටත්ව කථාකොට: වරෙල්ලා ස්වාමින්වහන්සේගේ කන්දටත් යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ ගෘහයටත් යමු: උන්වහන්සේ තමන්ගේ මාර්ග අපට උගන්වන සේක. අපිද උන්වහන්සේගේ මාවත්වල යන්නෙමුයයි කියන්නෝය. මක්නිසාද ව්‍යවස්ථාව සියොනෙන්ද ස්වාමින්වහන්සේගේ වචනය යෙරුසලමෙන්ද නික්ම යන්නේය. (යෙසායා 2:2-3)**

මෙම සහස්‍ර වර්ෂ කාල පරිච්ඡේදය ආරම්භවීමට පෙර සාතන් හා ඔහුගේ දුෂ්ට බල බැඳ දමනු ඇත. පොළොවේ මහත් යුද්ධයක් හටගන්නා අතර...

**එකල මෘගයාද ඌ ඉදිරියෙහි ඒ හාස්කම්කර උගේ සලකුණ ලැබූවන් සහ උගේ රූපයට නමස්කාරකළවුන් රැවටුවාවූ බොරු අනාගතවක්තෘද අල්ලනු ලැබුවෝය. ඔවුන් දෙදෙනාම ගෙන්දගමින් දැවෙන ගිනිවිලට පණපිටින් හෙළනු ලැබුවෝය. (එළිදරව් 19:20)**

**ඔහු යක්ෂයාද සාතන්දවූ පුරාණ සර්පයා වන ඒ මහා සර්පයා අල්ලා අවුරුදු දහසකට බැන්දේය. ඒ අවුරුදු දහස කෙළවරවන තුරු ඔහු විසින් ජාතීන් තවත් නොරවටන පිණිස ඔහු පාතාලයට හෙළා, ඒක වසා, ඔහු මතුයෙහි ඒක මුද්‍රාකළේය. මින්පසු ස්වල්ප කලකට ඔහු මුදනු ලබන්ට ඕනෑය. (එළිදරව් 20:2-3)**

## අවසාන යුද්ධය

අවුරුදු දහසකට පසු, සාතන් සමඟ අවසාන යුද්ධය හටගන්නවා ඇත.

**අවුරුදු දහස කෙළවරවූ කල සාතන් තමාගේ හිරගෙයින් මුදනු ලැබ, පොළොවේ සතර කොනේ සිටින්නාවූ ගොග් මාගොග් යන ජාතීන් මුළාකරන්ටත් ඔවුන් යුද්ධයට රැස්කරන්ටත් නික්ම එන්නේය. ඔවුන්ගේ ගණන මුහුදේ වැලි මෙන්ය. ඔව්හු පොළොවේ සෑම තැනටම ගොස් ශුද්ධවන්තයන්ගේ අන්දායමද ප්‍රියවූ නුවරද වටලාගත්තෝය. එවිට (දෙවියන්වහන්සේ වෙතින්) ස්වර්ගයෙහි ගිනි බැස ඔවුන් විනාශකෙළේය. (එළිදරව් 20:7-9)**

දෙවියන්වහන්සේ අහසින් ගිනි එවා දුෂ්ටාත්ම බලවේගවල සියලු විරෝධයන් අවසන් කරන සේක.

**'''එවිට (දෙවියන්වහන්සේ වෙතින්) ස්වර්ගයෙහි ගිනි බැස ඔවුන් විනාශකෙළේය. (එළිදරව් 20:9)**

මෙම අවසාන සටනට හේතුව වන්නේ සාතන් සම්පූර්ණයෙන්ම පරාජය කොට යේසුස්වහන්සේ සියල්ලන්ගේ ස්වාමින්වහන්සේ ලෙස ඒත්තු ගන්නා පිණිසය. මෙය දෙවියන්වහන්සේගේ කාලයන් පිළිබඳ සැලැස්ම සම්පූර්ණ කරයි.

**එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපීස 1:9-10)**

සාතන්ගේ කැරලිකාර කමේ සිට ලෝක ඉතිහාසයේ අද දක්වා පවතින්නාවූ ආත්මික සටනේ මෙය අවසාන සටනයි.

## සාතන්ගේ අවසාන ඉරණම

සාතන්ගේ ත්‍රිත්වයේ අවසාන ඉරණම ගිනි විලයි.

**ඔවුන් මුළාකළ යක්ෂයා වනාහි, මෘගයාද බොරු අනාගතවක්තෘද වසන, ගින්නෙන්ද ගෙන්දගමින්ද යුත් විලට හෙළනු ලැබුවේය. ඔව්හු සදාකාලේටම දිවා රෑ දෙක්හි වධකරනු ලබති. (එළිදරව් 20:10)**

සාතන්ගේ යක්ෂණික දූතයන්ද ගිනිවිලට හෙළනු ඇත.

**එවිට උන්වහන්සේ වම් පැත්තේ සිටින්නන්ට කියනසේක්: ශාපලත්තෙනි, මා කෙරෙන් පහව යක්ෂයාටත් ඔහුගේ දූතයන්ටත් සූදානම්කර තිබෙන සදාකාල ගින්නට පලයල්ලා. (මතෙව් 25:41)**

යක්ෂයෝම ඔවුන්ගේ අවසාන ඉරණම පිළිගත්තේය. මතෙව් 8 යේසුස්වහන්සේ ගෙරසේනයන්ගේ රටට ගිය කල යක්ෂාවේශවූ මිනිසුන් දෙදෙනෙක් මුණගැසුණු සේක. ඔවුන් යේසුස්වහන්සේට මොරගසමින් කියනුයේ

**බලව, ඔව්හු මොරගසමින්: දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෙනි, ඔබට අපෙන් කම මොකද? කාලයට ප්‍රථමයෙන් අපට වදදෙන්ට ඔබ මෙහි ආසේක්දැයි කීවෝය. (මතෙව් 8:29)**

## විනිශ්චය

මවනු ලැබූ සියල්ලන් දෙවියන්වහන්සේ විසින් විනිශ්චය කරනු ලබනවා ඇත. මෙය සදාකාලික විනිශ්චයේ කාලය ලෙස හැඳින්වේ. නොඇදහිලිවතුන් ලෙස මරණයට පත්වූවන් විනිශ්චයට මුහුණ දීම සඳහා නැවත නැගිටුවනු ලබනවා ඇත. ඔවුන් පාපයෙන් පසුතැවිලි නොවූ නිසාත් යේසුස්වහන්සේ ස්වකීය ගැළවුම්කරුවාණන් ලෙස පිළි නොගැනීම නිසාත් සදාකාලික නිරයෙහි දඬුවමට පත් කරනු ඇත.

**මළාවූ ලොකු අයද කුඩා අයද සිංහාසනය ඉදිරියේ සිටිනවා දුටිමි: පොත්ද දිගහරිනු ලැබුවේය. ජීවන-පොත වන තවත් පොතක් දිගහරිනු ලැබීය. මළාහු තමුන්ගේ ක්‍රියා ලෙස**

**පොත්වල ලියනලද දේවලින් විනිශ්චයකරනු ලැබුවෝය. සමුද්‍රය එහි උන් මළවුන් පාවාදුන්නේය. මරණයත් පාතාලයත් එහි උන් මළවුන් පාවාදුන්නෝය. ඔව්හු එකිනෙකා තම තමාගේ ක්‍රියා ලෙස විනිශ්චයකරනු ලැබුවෝය. මරණයත් පාතාලයත් ගිනිවිලට හෙළනලද්දේය. මෙය දෙවෙනි මරණයය. එනම් ගිනිවිලය. යමෙකුගේ නම ජීවන පොතෙහි ලියා නැති බව සම්බවීද ඔහු ගිනිවිලට හෙළනු ලැබුවේය. (එළිදරව් 20:12-15)**

පාපය පිලිබද පසුතැවිලි වී ගැළවුම්කරුවාණන් ලෙස යේසුස්වහන්සේ පිළිගත් සැබෑ ඇදහිලිවතුන් ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සදාකාලය ගෙවනු ඇත. (එළිදරව් 21)

මහා ආත්මික සටන අවසන් වනු ඇත.

**සියලු ජනයන්ද ජාතීන්ද භාෂාවන්ද උන්වහන්සේට සේවයකරන පිණිස ආණ්ඩු බලයද ගෞරවයද රාජ්‍යයක්ද උන්වහන්සේට දෙන ලද්දේය. උන්වහන්සේගේ ආණ්ඩුවද පහනොවන සදාකාල ආණ්ඩුවක්ය. උන්වහන්සේගේ රාජ්‍යයද නැති නොවන්නේය. (දානියෙල් 7:14)**

## ආත්මික ලෝකයේ ජයග්‍රහණය

මේ පරිච්ජේදය ආත්මික යුද්ධය පිළිබඳ පාඨමාලාව මේ පරිච්ජේදය අවසාන කරයි. ඇත්තවශයෙන්ම ඔබ මෙම විෂය පිළිබඳ ඉගෙන ගැනීම හෝ අධ්‍යයනය කිරීම කවදාවත් නොනවත්වනු ඇත. ස්වභාවික ලෝකයේ සොල්දාදුවෙකු මෙන් සතුරා සමග සටනේදී ඔබගේ දක්ෂතාවන් හා උපායයන් දියුණු කරගැනීම නොකඩවම කරනු ඇත.

ජිවිතයේ සෑම සටනකදී හා සතුරාගේ සියලු බලවේගයන් කෙරෙහි ඔබට ජයග්‍රාහී විය හැකි බවට ඔබ ධෛර්යවත් කිරීම මෙම අධ්‍යයනය අවසානයේ අපට අවශ්‍යය. මතක තබාගන්න'''

- යුද්ධය ඔබගේ ජයග්‍රහණය සහතික කොට ඇත. මක්නිසාදයත් එය රඳා පවතින්නේ ඔබ මත නොව එය රඳා පවතින්නේ දෙවියන්වහන්සේ මතය.

**තේජසේ රජ්ජුරුවෝ කවුද? බලපරාක්‍රම සහිත ස්වාමින්වහන්සේය. යුද්ධයෙහි බලසම්පන්නවූ ස්වාමින්වහන්සේය. (ගීතාවලිය 24:8)**

- ඔබ සටන් වදින විට දෙවියන්වහන්සේ විසින් ඔබව ආරක්ෂා කර ඇත.

**මාගේ ගැළවීමේ ශක්තියවූ ස්වාමිවූ දෙවියන්වහන්ස, යුද්ධ දවසේදී ඔබ මාගේ හිස වැසූ සේක. (ගීතාවලිය 140:7)**

- ඔබ අධෛර්යවත්ව සිටින කල දෙවියන්වහන්සේ විසින් සටනේදී ඔබ සනසනු ලබනවා ඇත.

**මක්නිසාද අපි මකිදෝනියට ආ කල පවා අපේ මාංසයට කිසි පහසුවක් නැතුව හැම අතින්ම දුක්වින්දෙමුව: පිටතින් විරුද්ධකම්ද ඇතුළතින් භයද විය. නුමුත් යටහතුන් සනසන්නාවූ තැනැන්වහන්සේ එනම් දෙවියන්වහන්සේ තීතස්ගේ ඊමෙන් අප සැනසූ සේක. (2 කොරින්ති 7:5-6)**

- ඔබගේ යුද්ධය මධ්‍යයේ දෙවියන්වහන්සේ ඔබ ධෛර්යවත් කරනු ලබනවා ඇත.

**තැතිගන්ටවත් භයවෙන්ටවත් එපා, මම පුරාණයේ පටන් නුඹට ප්‍රකාශකර නොදැන්නුවෙම්ද? නුඹලා මාගේ සාක්ෂිකාරයෝය. මා ඇර වෙන දෙවිකෙනෙක් ඇද්ද? නැත. වෙන පර්වතයක් නැත, අන් කිසිවෙකු ඇති බවක් නොදනිමි. (යෙසායා 44:8)**

**මක්නිසාද නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ වන මම භය නොවෙන්න, මම නුඹට පිහිටවන්නෙමියි කියමින් නුඹේ දකුණත අල්ලන්නෙමි. (යෙසායා 41:13)**

**නුඹලා සනසන්නේ මමමය. නැසී යන මනුෂ්‍යයාටත් තෘණ මෙන් පහව යන මනුෂ්‍ය පුත්‍රයාටත් භයවෙන්ටද නුඹේ මැවුම්කාරවූ, (යෙසායා 51:12)**

- ඔබට විරුද්ධව සාදන කිසි ආයුධයක් සඵල නොවන්නේය.

**නුඹට විරුද්ධව සාදන කිසිම ආයුධයක් සඵල නොවන්නේය. විනිශ්චයකිරීමට නුඹට විරුද්ධව නැගිටින සියලුම දිව් නුඹ විසින් වරදට පත්කරනවා ඇත. ස්වාමින්වහන්සේගේ මෙහෙකරුවාන්ගේ උරුමයත් මාගෙන් ඔවුන්ට ලැබෙන ධර්මිෂ්ඨකමත් එයාකාරයයි ස්වාමින්වහන්සේ කියනසේක. (යෙසායා 54:17)**

- ලෝකය කෙරෙහි ජයග්‍රහණය අත්පත් කරගත හැකිය.

**මක්නිසාද දෙවියන්වහන්සේගෙන් උපන් යමෙක් ඇද්ද එය ලෝකයෙන් ජයගන්නේය. ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව විශ්වාසකරන තැනැත්තා මිස ලෝකයෙන් ජයගන්නේ වෙන කවුද?**
**(1 යොහන් 5:4-5)**

- මාංශයට එරෙහිව ජයග්‍රහණය අත්පත් කරගත හැකිය.

**තවද ක්‍රිස්තුස්වහන්සේට අයිති තැනැත්තෝ මාංසය එහි ආශා සහ තෘෂ්ණා සමග කුරුසියෙහි ඇණ ගැසුවෝය. (ගලාති 5:24)**

- යක්ෂයාට එරෙහිව ජයග්‍රහණය අත්පත් කරගත හැකිය.

**සමාදානයේ දෙවියන්වහන්සේද නොබෝ කලකින් සාතන් නුඹලාගේ පාද යට දමා පොඩිකරනසේක. අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනුග්‍රහය නුඹලා සමඟ වේවා. (රෝම 16:20)**

- මරණය හා සොහොන් ගෙයට එරෙහිව ජයග්‍රහණ අත්පත් කරගත හැකිය.

**මම ඔවුන් මිනීවළේ බලයෙන් නිදහස්කරන්නෙමි; ඔවුන් මරණයෙන් මුදාගන්නෙමි. එම්බා මරණය, නුඹේ වසංගත කොතැනද? එම්බා මිනීවළ, නුඹේ විනාශය කොතැනද? පසුතැවිල්ල මාගේ ඇස්වලින් සැඟවී තිබෙයි. (හොෂෙයා 13:14)**

**නැතිකරනු ලබන්නාවූ අන්තිම සතුරා නම් මරණයය. එම්බා මරණය, තාගේ ජය කොයිද? එම්බා මරණය, තාගේ කටුව කොයිද? (1 කොරින්ති 15:26, 55)**

**උන්වහන්සේ මරණය සදාකාලයටම ගිලදැමූසේක." (යෙසායා 25:8)**

- දෙවියන්වහන්සේට එරෙහිව තමාම උසස් වන්නාවූ සියල්ල කෙරෙහි ජයග්‍රහණය අත්පත් කර ගත හැකිය.

  **අපි විවාදයන්ද දෙවියන්වහන්සේ ගැන දැනගැනීමට විරුද්ධව උසස්වන්නාවූ උසස් දේවල්ද බිඳහෙළා, සියලු සිතිවිලි ක්‍රිස්තුස්වහන්සේට කීකරුවීමට වාල්කරදෙමුව.**
  **(2 කොරින්ති 10:5)**

- සතුරාගේ සියලු බලවේගයන්ට එරෙහිව ජයග්‍රහණය අත්පත් කර ගත හැකිය.

**බලව, සර්පයන්ද ගෝනුස්සන්ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය.**
**(ලූක් 10:19)**

- ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන සටනෙන් ජයග්‍රහණය ලැබීම ගැන දෙවියන්වහන්සේට ස්තුති කිරීමට නිතරම මතක තබාගන්න.

**නුමුත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන අපට ජය දෙන්නාවූ දෙවියන්වහන්සේට ස්තුති වේවා. (1 කොරින්ති 15:57)**

- සටන අවසන් වූ කල ඔබ ජයග්‍රාහිව සිටගනු ඇත. (ස්ථිර)

**එබැවින් නපුරු දවසේදී විරුද්ධව සිටින්ටත් සියල්ල සම්පූර්ණ කරගෙන ස්ථිරව සිටින්ටත් පුළුවන්වන පිණිස, දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගනිල්ලා. (එපීස 6:13 )**

# පරීක්ෂා කිරීම

1. යුද්ධය පිළිබඳ ලිපිවලින් ලබාගත් ප්‍රධාන පදය ලියන්න.

2. අවසාන යුද්ධය කරා මඟ පෙන්වන සිදුවීම් විස්තර කරන්න.

3. අවසාන යුද්ධය විස්තර කරන්න. යුද්ධය ඇතිවන්නේ කවදාද? සතුරු බලවේග පරාජයට පත් කිරීමට කුමක් සිදුවන්නේද?

4. සාතන්ගේ හා නපුරු ආත්ම බලවේගවල අවසාන ඉරණම කුමක්ද?

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# උපාය මාර්ග දක්ෂ ලෙස හැසිරවීම

1. ඇදහිලිවතුන් සඳහා සාතන් ආත්මික "මලපත්" අටවන්නේය. මලපතක් සතුරන්ට ඇටවූ උගුලක් මෙන්ය. එය සඟවා ඇත, එහෙත් එහි ගොදුර වහල් බවට ගනු පිණිස හදිසියේම දුන්නක් සේ විවෘත වන්නේය. ඔබ මලපතකට හසුවී නැති බව නිසැකව දැනගන්න පිණිස ඔබගේ ජීවිතය පරීක්ෂා කර ගන්න.

- පක්ෂි වැද්දා: ගීතාවලිය 91:3; 124:7
- දුෂ්ටයා: ගීතාවලිය 119:110
- ඔබගේ තොල්: හිතෝපදේශ 18:7
- නරක මිතුරන්: හිතෝපදේශ 22:24-25
- මනුෂ්‍යයාට භය වීම: හිතෝපදේශ 29:25
- යක්ෂයා: 1 තිමෝති 3:7; 2 තිමෝති 2:26
- ධනය: 1 තිමෝති 6:9
- පාපය: හිතෝපදේශ 29:6
- ව්‍යාජ දෙවිවරු: නික්මයාම 23:33; විනිශ්චයකාරයා 2:3
- නින්දා කරන්නන්: හිතෝපදේශ 29:8
- පාපිෂ්ට සහකරුවා/සහකාරි: 1 සාමුවෙල් 18:23
- නොඅදහන්නන් සමඟ ගිවිසුම්: නික්මයාම 34:12

2. ආත්මික යුද්ධය පිළිබඳ කාරණා සඳහා එළිදරව් 2-3 පරිච්ජේදවල සඳහන් සභා සත අධ්‍යයනය කරන්න. ඔවුන් යුද්ධයේ කුමන අංශ වලින්ද පරාජයට පත්වුයේද? තත්වයන් නිවැරදි කරගැනීම සඳහා දෙවියන්වහන්සේගේ ආත්මයාණන් ඔවුන්ට දෙනු ලබන්නේ කුමන උපදේශයන්ද?

3. දැන් ඔබ ජයග්‍රාහකයෙකි! ඔබ මේ පාඨමාලාවෙන් ඉගෙන ගත්තේ ...

- නපුරාගේ බලය ජයගැනීම ඔබට හැකි බව 1 යොහන් 2:13-14
- යේසුස්වහන්සේ ලෝකය ජයගත් සේක. යොහන් 16:33
- උන්වහන්සේ ඔබ තුළ ජීවත්වන නිසා, ඔබට ලෝකය ජයගත හැකිය. 1 යොහන් 4:4
- ඔබ ජය ගනු ලබන්නේ නව උත්පාදයේ අත්දැකීමෙන් හා ඔබගේ ඇදහිල්ල තුළිනි. 1 යොහන් 5:4-5
- ඔබ ජයගන්නේ යේසුස්වහන්සේගේ ලේ හා ඔබගේ සාක්ෂිය නිසාය. එළිදරව් 12:11

ජයගන්නන්ට ඉතා අලංකාර පොරොන්දු කීපයක් දී ඇත්තේය. බලපෑමකින් යුක්ත ආත්මික යුද්ධයේ සටන්කර දුෂ්ටාත්ම බලවේගයන්ට එරෙහිව ජයග්‍රහණය කරන අයට...

- ජීවනයේ ගසෙන් කන්නෝය. එළිදරව් 2:7
- සැඟවුණු මන්නාවලින් කන්නේය. එළිදරව් 2:17
- සුදු වස්ත්‍රයෙන් පළඳවනු ඇත. එළිදරව් 3:5
- දෙවියන්වහන්සේගේ මාළිගාවේ කණුවක් වනු ඇත. එළිදරව් 3:12
- යේසුස්වහන්සේ සමඟ උන්වහන්සේගේ සිංහාසනයේ හිඳගනු ඇත. එළිදරව් 3:21
- අලුත් නාමයක් ලබනු ඇත. එළිදරව් 2:17
- ජාතීන් කෙරෙහි බලය ලබනු ඇත. එළිදරව් 2:26
- දෙවියන්වහන්සේගේ නාමය ඔවුන් පිට ලියනු ඇත. එළිදරව් 3:12
- දෙවියන්වහන්සේ සමඟ විශේෂ සබඳතාවයන් තිබෙනු ඇත. එළිදරව් 21:7
- අළුයම පහන් තාරකාව (යේසුස්වහන්සේ) ලබාගනු ඇත. එළිදරව් 2:28
- පියවූ දෙවියන්වහන්සේ ඉදිරියේ යේසුස්වහන්සේ විසින් පිළිගන්නවා ඇත. එළිදරව් 3:5
- දෙවන මරණයෙන් විනාශ නොවන්නේය. එළිදරව් 2:11

- ඔවුන්ගේ නම් ජීවන පොතෙන් මකා නොදමනු ඇත. එළිදරව් 3:5
- සියලු දේ උරුම කරගන්නේය. එළිදරව් 21:7

4. ආත්මික යුද්ධය පිළිබඳ මේ අත්පොතේ මෙය අවසාන පාඩම වුවද ඇත්තටම මේ විෂයය පිළිබඳව ඉගෙන ගැනීම කිසිකලෙක නොනැවතේ. ඔබ ස්වාමින්වහන්සේ සමඟ සිටින්නට යනතුරු ආත්මික සටන් නොකඩවා කරගෙන යනු ඇත. ඔබ එකිනෙකා සටන කරගෙන යන අතරතුර ඔබගේ ජයග්‍රහණයන්ගෙන් මෙන්ම ඔබගේ අසමත්වීම් වලින්ද යුද්ධය ගැන වඩාත් ඉගෙන ගන්නවා ඇත. ඔබගේ යුද්ධ හා ජයග්‍රහණයන් සටහන් කිරීම සඳහා "ආත්මික සටන් දිනපොත"ක් ලිවීමට ආරම්භ කරන්න. ඔබ යළි යුධ පිටියට පිවිස නොකඩවම සටන් කරගෙන යනතාක් අසමත්වීම් තාවකාලික වචනයක් බව මතක තබාගන්න. ඔබ ඉඳහිට සටනක් පරදිනවා ඇත. එහෙත් සේනාවල ස්වාමින්වහන්සේ ඔබට අවසාන ජයග්‍රහණය සහතික කොට ඇත.

# උප ග්‍රන්ථය

## බයිබලයෙහි තිරණාත්මක සටන්

පරණ ගිවිසුම් වාර්තාව සඳහා ඉතා වැදගත් එක් පරමාර්ථයක් පාවුල්තුමා පැහැදිලි කරයි.

ඔහු පැවසුයේ

> **ඒ සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධ වුනේය: ඒවා ලියා තිබෙන්නේ කාල වල කෙලවරට පැමිණ සිටින්නාවූ අපට අවවාද පිණිසය. (1 කොරින්ති 10:11)**

පරණ ගිවිසුම අප හට ඉගෙනීම සඳහා යමක් උදාහරණයක් සේ දක්වයි. ඔබ පරණ ගිවිසුම කියවන කළ ස්වභාවික ලෝකයේ සටන් කළ විවිධාකාරවූ යුද්ධ පිළිබඳ බොහෝ වාර්තා දකිනු ඇත. මෙම සටන් පිළිබඳව බයිබලයෙහි ඇතුලත් කර ඇත්තේ මන්දැයි ඔබ විමතියට පත්වනු ඇත. මෙම යුද්ධ වල වැදගත්කම පැවැති විට ලැබූ ප්‍රතිඵලයට වඩා ඔබ්බට බලපායි. පැරණි ගිවිසුමේ ස්වභාවික ලෝකයේ සටන් ජය ගැනීමට භාවිතා කල යුද්ධ උපක්‍රම අපහට ආත්මික ලොවෙහි සතුරන් පරාජය කිරීමට භාවිතා කළ හැකියි.

මෙම උපග්‍රන්ථයෙහි පැරණි ගිවිසුමෙහි ඇතුලත් ඓතිහාසික සටන් විශ්ලේශණය කොට, එම ස්වභාවික උපක්‍රම ආත්මික සටනේදී භාවිතා කිරීමට අදාල කරයි. සාමාන්‍ය ලෝකයෙහි යුද්ධ සෙබලෙක් තමාගේ දක්‍ෂතා වැඩි දියුණු කර ගැනීමට මින් පෙර පැවැති යුද්ධ සටන් උපක්‍රම වාර්තා සටහන් අධ්‍යයනය කරන්නාක් මෙන් ඔබගේ ආත්මික සටන් ක්‍රමය හැකියාවන් දියුණු කර ගැනීමට බයිබලයෙහි ඇතුලත් තිරණාත්මක සටන් පිළිබඳව අධ්‍යනය කරන්න.

## තිරණාත්මක සටනක්

යුද ආයුධ බලය යොදාගනිමින් කිසියම් කාරණාවක් පිළිබඳව තිරණයකට එළඹෙන්නාවූ සටන අප තිරණාත්මක සටනක් ලෙස හඳුන්වමු. එය අර්බුදකාරී අවස්ථාවකදී නියැලෙන සටනකි. එහි ප්‍රතිඵලය ලෙස ඉදිරියට යාම හෝ පසු බැසීම අත් වේ. ජය හෝ පරාජය හිමිවේ. එය ආරක්‍ෂාකාරී ක්‍රියාමාර්යක (තමා සතු සීමාව රැකගැනීමට) හෝ පහරදීමේ ක්‍රියාමාර්ගය (සීමාවන් අල්ලාගැනීම) ගත හැක. වෙනත් අයුරකින් පවසයි නම් එය වැදගත් ගැටුමකි. මෙම උපග්‍රන්ථයෙහි පැරණි ගිවිසුමෙහි සඳහන් "තිරණාත්මක සටන් " පිලිබඳ අවධානය යොමු කරයි. මෙම සටන් වලදී භාවිතා කරගෙන ඇති උපක්‍රම ඔබ හට ආත්මික තලයේ "තිරණාත්මක" සටන් දිනීමට උපකාරී වනු ඇත.

## පැරණි ගිවිසුමෙහි සටන් සඳහා හේතු

පැරණි ගිවිසුමෙහි ස්වභාවික සටන් ආත්මික කරුණු තුනක් හේතුවෙන් දියත් විය.

1. දෙවියන්වහන්සේ ගේ ජනතාව වහල් බවට පත් කරන්නාවූ දුෂ්ඨ බලවේග පරාජය කිරීම උදෙසා
2. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ජනතාවට දී ඇති ක්ෂේත්‍රයන් සතුරාගේ බලවේගයන්ගෙන් ලබා ගැනීම උදෙසා
3. දෙවියන්වහන්සේගේ ජනතාව එතුමාගෙන් හැරී ගිය කල ඔවුනට නපුර සඳහා දඬුවමක් ලෙසට.

අපගේ ආත්මික සටන්ද මෙම කාරණා උදෙසාම වනු ඇත.

# පොදු මූලධර්ම

ඔබ පැරණි ගිවිසුමෙහි ඇතුලත් සුවිශේෂී සටන් ඉගෙනීමට පෙර එහි ඇතුලත් පොදු මූලධර්ම ඉගෙනීම ඉතා වැදගත් වන්නේ ඒවා ආත්මික සටන් වලදී ද භාවිතා කළ හැකි බැවිනි.

## පලමුවන ප්‍රතිපත්තිය :

දෙවියන්වහන්සේගේ අනුමැතිය සහිතව ක්‍රමාණුකූලව මෙහෙයවන යුද්ධයකදී හමුදාව ආරක්ෂාකර ගැනීමට එතුමා පෙරොන්දු වී ඇත.(ද්විතිය කථාව 20:1-4)

## දෙවන ප්‍රතිපත්තිය :

ඉශ්‍රායෙල්ගේ සතුරෝ දෙවියන්වහන්සේගේද සතුරෝ වූහ. ජනතාව ජයග්‍රහණය ලැබීම සඳහා තමුන්ගේම ශක්තිය කෙරෙහි නොව දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කළ යුතු විය. (විනිශ්චය 5:31, නික්ම 17:16) ඔව්හු මෙලෙස කළ විට දෙවියන්වහන්සේ ඔවුන් උදෙසා සටන් කල සේක.

## තුන්වන ප්‍රතිපත්තිය :

සටන සිදුවන අවස්ථාවෙහි ගිවිසුම් පෙට්ටිය ඉශ්‍රායෙල් සමග දෙවියන්වහන්සේගේ වැඩ විසීමෙහි සංකේතය ලෙස ක්‍රියා කළේය (නික්ම 30:6, 25:21-22). ඉශ්‍රායෙල් ඉදිරියෙන් ගිවිසුම් පෙට්ටිය ඔසවාගෙන යාම තුලින් දෙවියන්වහන්සේ සැබවින්ම ඔවුන් සමඟ වැඩ වසන බව සංකේතවත් විය. ගිවිසුම් පෙට්ටියට කිසි බලයක් නොතිබූ නමුත් එය උන්වහන්සේගේ ජනතාව සමඟ එතුමාගේ අභිමුඛය සංකේතවත් කෙරුනි(1 සාමුවෙල් 4:1-11). අළුත් ගිවිසුමෙහි යේසුස් වහන්සේ පැවසුවේ ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන් තුල වැඩ වසන බවත්, එතුමා දෙවියන්වහන්සේගේ සත්‍ය වැඩ විසීම වන බවත්ය. (යොහාන් 14:16-17)

## හතරවන ප්‍රතිපත්තිය :

දෙවියන්වහන්සේ තම ජනතාව උදෙසා සටන් කිරීමට නම් ඔවුහු පවිත්‍රව සිටිය යුතු විය. (ද්විතිය 23:9-14). ඔව්හු සියළු පාපිෂ්ඨ දෙයින් වැලකී වෙන්වී සිටිය යුතු විය.

## පස්වන ප්‍රතිපත්තිය :

බියගුල්ලන් යුද්ධයෙන් බැහැර කලහ (ද්වි 20:8, විනි.7:1-6). බියගුළු අය සටන මැදදී තැතිගැන්වී ආපසු හැරෙනු ඇත.

## හයවන ප්‍රතිපත්තිය :

ජීවිතයෙහි කාරණාවල යෙදී සිටින අයව යුද්ධයෙන් බැහැර කරන ලදි. ද්වි 20:5-8 වාර්තා කරන පරිදි අළුත විවාහ වූ ස්වාමි පුරුෂයෙකු වසරක් යන තුරු යුද්ධ බිමට නොගියේය. මෙයට හේතුව වූයේ ඔහුගේ මූලික සැලකීම තම භාර්යාව වෙත රැදී පැවතීමය. ඉන් පසු නිවසක් සාදා ගැනීම, පැවැත්ම ස්ථිර කරගැනීම යනාදිය කාරණා නිසාය. ඔහු යුද්ධයේදී කාර්යක්ෂම වීමට වඩා ජීවිතයෙහි කාරණා පිළිබඳ පටලැවී ඇත. පාවුල් තිමෝතිට උපදෙස් දෙමින් ''සේවාකම් කරන්නාවූ කිසිවෙක් මේ ජීවිතයේ කාරණාවලට පටලැවෙන්නේ නැත '' (11 තිමෝති 2:4) යයි පැවසුවේ එබැවිනි. යේසුස්වහන්සේ ද අපට ජීවිතයෙහි කාරණා වලින් පැටලී සිටීම පිළිබඳව අනතුරු ඇඟවූ සේක. දානියෙල්ගේ අනාගත වාක්‍ය වලින් අපට ඉගෙන ගත හැකි කරුණක් නම්, අන්ත ක්‍රිස්තුස්ගේ අවසාන කාල ප්‍රධාන උපක්‍රමයක් වනුයේ "දෙවියන්වහන්සේ ගේ ශුද්ධ වන්තයන්ව ලෝකයෙහි කාරණාවලින් හෙම්බත් කරවීමය"

## හත්වන ප්‍රතිපත්තිය :

සතුරා මුළුමනින්ම විනාශ වන තුරු දෙවියන්වහන්සේ ගේ ජනතාව සටන් කළ යුතු විය (ගණන් 31:10-11)

### අටවන ප්‍රතිපත්තිය :

ඉශ්‍රායෙල් නුවර වටා පිහිටි පවුරු ඔවුන්ගේ ආරක්‍ෂාව උදෙසා වැදගත් විය. මෙම පවුරු අඩි 10ක් පරණ පුළුල් වුද අඩි 30 ක් පමණ උස් වු ද ඒවා විය. පවුරු මුදුනෙහි සිට රැකවල්ලු සතුරු ක්‍රියාකාරකම් පිළිබඳ සෝදිසියෙන් පසු වුහ. නවගිවිසුම ඇදහිලිවන්තයාව "කන්දක් මුදුනෙහි පිහිටවු නුවරකට "සමාන කොට දක්වයි. ඔබ මෙම පාඩමාලාවෙහි ඉගෙන ගත් පරිදි සතුරාගෙන් ඔබව ආරක්‍ෂා කරන්නාවු ආත්මික පවුරු ඇත.

### නවවන ප්‍රතිපත්තිය :

සේනාධිපතියාගේ හොරණෑ හඬින් එක් එක් සටන ඇරඹේ. (විනිශ් 7:18) එසේම සටන අවසානයේ හොරණෑ හඬින් හමුදාව සටනින් ඉවතට කැඳවා ගනු ඇත. (11 සාමුවෙල් 2:28, 18:16). යේසුස්වහන්සේ ආත්මික ලොවෙහි හොරණෑව පිඹිමින් අපහට මුළු ලොවට ගොස් ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අණ කොට සතුරාට එරෙහිව බලයද පැවරූ සේක(මතෙව් 28:18-20). අනාගතයේ යම් දිනෙක අපව සටනින් ආපසු කැඳවන හොරණෑ ශබ්දය ඇසෙනු ඇත. (1 තෙස:4:16-18)

## මෙම අධ්‍යනයෙහි සංවිධානය

මෙම උප ග්‍රන්ථයෙහි සාකච්ඡා කර ඇති සෑම සටනකම පහත සඳහන් කරුණු ඇතුලත් වේ. එනම්:

- ශුද්ධ ලියවිලි යොමුව: එක් එක් සටන පිළිබඳව ඔබගේ බයිබලයෙන් කතාව කියවන්න
- සටන් බිම: සටන සිදුවු ස්ථානයෙහි භූගෝලීය පිහිටීම
- ප්‍රතිවාදී බලවේග: සටනෙහි සහභාගි වූ පාර්ශව හඳුනාගැනීම
- සටනට හේතු: සටන සිදුවූයේ මන්ද
- උපක්‍රම: සටන ජය ගැනීමට හෝ පරාජය වීමට උපක්‍රම. සමහර උපක්‍රම නැවත නැවතත් බයිබලීය වාර්තා වල ඇත. උදා. ලෙස තම සතුරන්ට භය නොවන්නැයි නැවත නැවතත් ප්‍රකාශ කර තිබේ. එවැනි උපක්‍රම පලමු අවස්ථාවලදී පමණක් මෙම විශ්ලේෂණයෙහිදී සඳහන් කරන අතර නැවත නැවතත් සඳහන් නොකරනු ඇත.

## බයිබලයෙහි සඳහන් තීරණාත්මක සටන්

- ශුද්ධ ලියවිලි යොමුව: උප්පත්ති 14
- සටන් බිම: යෝර්දාන් නදිය අසල දාන් ප්‍රදේශයෙහි
- ප්‍රතිවාදී බලවේග: ආබ්‍රහම් සහ නැගෙනහිර දිගාවේ රජවරු 4 දෙනා
- සටනට හේතු: ආබ්‍රහම්ගේ ඥාතියෙකු වූ ලොත් නැමැත්තාව රජවරු අල්ලාගෙන ගොස් තිබුණි.

- උපක්‍රම :

1. ඔබ සතුරාගේ ක්ෂෙත්‍රයට යන ඕනෑම විටක සටනක් බලාපොරොත්තු විය හැක.

2. පහසුවෙන් පාලනය කල හැකි කණ්ඩායම් දෙකකට ආබ්‍රහම් තම බලකාය සංවිධානය කළේය. ඔහුගේ කුඩා බල ඇණි රජවරු හතර දෙනෙකුගේ හමුදාව පරාජය කළේය. ජයග්‍රහණය රැදී ඇත්තේ හමුදාවේ ප්‍රමාණය අනුව නොව සංවිධානාත්මකබව, සැළසුම්කරණය, හා දෙවියන්වහන්සේගේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම මතය.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: නික්මයාම 14-15
- සටන් බිම: මිසරයේ දේශ සීමාවෙහි පිහිටි රතු මුහුදේ පාමුල

- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් සහ මිසරයන්
- සටනට හේතු: ඉශ්‍රායෙල් සෙනග මිසරයේ වහල්බවින් බේරී යමින් සිටියහ. ඔවුහු මිසරයෙන් පලා යන අතර රතු මුහුද ඉදිරියෙත් පසු පසින් සතුරු සේනාවන් අතරට මැදි වූහ.
- උපක්‍රම

1. බාහිර වටපිටාවේ සිදුවීම් දෙස නොබලන්න: ඉශ්‍රායෙල් ඇස් ඔසවා බැලූ කල මිසරයෝ ඔවුන් පසු පස හබා එන බව දුටුවෝය. (නික්ම 14:10- 1) ඔවුහු දෙවියන්වහන්සේ දෙස නොබලා ඒ වෙනුවට තමුන්ගේ වාතාවරණය දෙස බැලූ කල බිය ගෙන දුනි.

2. ආපසු හැරී නොබලන්න: සෙනග ඊජිප්තුවේදී ඔවුහු භුක්ති වින්දාවූ යහපත් දේ ගැන සිතන්නට පටන් ගති. එය ආත්මික වහල් බවේ ස්වභාවික නිදර්ශනයකි. (නික්. 14:12) ඔබ ආපසු හැරී බලන කල ආත්මිකව ඉදිරියට යා නොහැක.

3. භය නොවන්න: ඉශ්‍රායෙල් ලද පලමුවන පණිවුඩය නම්, "භය නොවන්න" යන්නය (නික්ම 14:13) සතුරා ඉදිරියෙහි ඔබගේ බය ඔබව අඩපණ කරාවි. ඇදහිල්ල ඔබට ක්‍රියාත්මක වීමට ශක්තිය ලබා දෙයි.

4. නිශ්චලව නැගී සිටින්න. (නික්ම 14:13) ඔබ හට දෙවියන්වහන්සේගෙන් නිසැක මඟ පෙන්වීමක් ලැබෙන තුරු නිශ්චලව නැගී සිටින්න. නිතරම සතුරා ඉදිරියෙහි ඔබගේ ප්‍රතිචාරය මෙය විය යුතුය. භයෙන් පලා නොයන්න.

5. ස්වාමීන්වහන්සේට ඔබ උදෙසා සටන් කිරීමට ඉඩ දෙන්න. සටන ඔබගේ නොවේය. ඔබ සටන් කිරීම අවශ්‍ය නොවේ. දෙවියන්වහන්සේ ඔබ උදෙසා සටන් කරනු ඇත. (නික්ම 14:14)

6. ඔබගේ සමාදානය පවත්වාගන්න: සතුරාගේ තර්ජන හමුවේ ඔබගේ සාමය අහිමි කර නොගන්න. (නික්ම 14:14)

7. ඉදිරියටම යන්න, පසු නොබසින්න: දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ට රතු මුහුදට පා තැබීමට ඉදිරියට යාමට පැවසූ සේක. ඔවුහු ඉදිරියේ ඇති ජල කඳට යා යුතු වූවා මිස ඉන් පසු බැසිය යුතු නොවීය. (නික්ම 14:15-16,21)

8. දෙවියන්වහන්සේ ඔබ උදෙසා අති ස්වභාවික අයුරින් ක්‍රියාත්මක වන බවට නිසැක වන්න. (නික්ම 14:19-31). ඔබ ආත්මික සටනකදී බයිබලීය ප්‍රතිපත්ති අනුගමනය කරන කල, දෙවියන්වහන්සේ අති ස්වභාවික අයුරින් ක්‍රියා කොට සතුරා පරදවනු ඇත. මෙම සටන් වලදී දෙවියන්වහන්සේ නැවත නැවතත් උන්වහන්සේගේ ජනතාව උදෙසා අති ස්වභාවික අන්දමින් ක්‍රියා කරනු ඇත.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: නික්මයාම 17:8-16
- සටන් බිම: රෙෆීඩීම්හි
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් හා භයානක එඬේර ගෝත්‍රිකයන් වන අමලෙක්වරු
- සටනට හේතුව: ද්විතීය 25:17-18 බලන්න. අමලෙක්වරු ඉශ්‍රායෙල් ජනතාව " ක්ලාන්තව වෙහෙසව සිටි " කල පසුපසින් විත් බියගුළු පහර දීමක් සිදු කලහ.
- උපක්‍රම:

1. යාච්ඤාව තුලින් ජය අත්පත් කර ගන්න: ඉශ්‍රායෙල් හට කඩුවෙන් පමණක් ජය ගත නොහැකි විය. මෝසෙස් ගත් ක්‍රියා කලාපය යාච්ඤාවේ ක්‍රියාවක් ලෙස සැලකේ. (නික්ම 17:9-11) එමඟින් සටනෙහි ප්‍රතිඵලයට බලපෑ දෙවියන්වහන්සේ කෙරෙහි යැපීමේ ආකල්පයක් නිරූපනය විය (නික්ම 17:11)

2. “දෙවියන්වහන්සේගේ සැරයටිය” තදින් අල්ලා ගන්න: මෝසෙස් දෙවියන්වහන්සේගේ ආධිපත්‍ය බලය සංකේතවත් කරන (නික්ම 17:9) සැරයටිය තදින් අල්ලා ගත්තේය. ඔබ, සටනට යන විට දෙවියන්වහන්සේගේ ආධිපත්‍ය බලය තදින් අල්ලා ගත යුතුය' දෙවියන්වහන්සේ තුල කවුද යන වගත් අප සතු ආධිපත්‍ය බලය කුමක්ද කියාත් දැන සිටිය යුතුය.

3. ආත්මික නායකත්වයට කීකරු වන්න: මෝසෙස් උපදෙස් දුන් පරිදි යෝෂුවා කළේය. (නික්ම 17:9-10). දෙවියන්වහන්සේ අප මධ්‍යයෙහි මග පෙන්වීමට විශේෂ හැකියාව ලබා දී ඇති පුද්ගලයන් තබා ඇත. දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉටු කර ගැනීමට දෙවියන්වහන්සේ මෙම නායකයන්ට මගපෙන්වීමට හැකියාව ලබා දෙනසේක. හැම කෙනෙක්ම උපදෙස් දීමට පටන් ගත් කල වියවුල හටගනී.

4. පිටතට ගොස් සටන් කරන්න: ඔබට සැම විටම සටන් කිරීමට සිදුවනුයේ ආරක්ෂිත සටනක්ම නොවිය හැක. සමහර අවස්ථාවලදී ඔබ පහර දීම කළයුතු වේ. එවිට ආක්‍රමණශීලිව දැඩිව සතුරාට පහර දීමේ උපක්‍රම අවශ්‍යවේ. (නික්මයාම 17:9)

5. සහය පතන්න: ආත්මික අභියෝගවලට මුහුණ දීමට සහය සැපයීමට දෙවියන්වහන්සේ ඔබට පුද්ගලයන් ඔසවා දෙනු ඇත. මෝසෙස් ආත්මික නායකත්වය සපයන අතර හමුදා නායකත්වය දැරීමට දෙවියන්වහන්සේ යොෂුවා කැඳවූ සේක. මෝසෙස් වෙහෙසට පත් වූ කල ඔහුගේ දෑත් ඉහලට ඔසවා තබා ගැනීමට ආරෝන් සහ හූර් මෝසෙස්ට උපකාර කළෝය.

6. පසුගිය ජයග්‍රහන සිහිකරන්න: දෙවියන්වහන්සේගේ බලයෙන් පසුගිය කාලයෙහි ලැබූ ජයග්‍රහණ සිහිකිරීම වර්තමානයෙහි ඇති විරුද්ධවාදිකම් වලට මුහුණ දීමට නව ජවයක් ලබාදෙයි. දෙවියන්වහන්සේ මෝසස්ට කතාකොට මෙම සටනෙහි කථාව පොතක ලියා සිහිවටනයක් ලෙසට යොෂුවාගේ කනට ඇසීමට සලසන ලෙස පැවසූ සේක. (නික්ම 17:14). මෝසෙස්ට පසු නායකත්යගේ ගැනීමට නියමව සිටි යෝෂුවා පසු කලෙක පොරොන්දු දේශය අත්පත් කරගනු ඇත.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: ගණන් කථාව 14
- සටන් බිම: හොර්මා අසල පිහිටි කඳුකරය.
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල්වරු අමලෙක්වරුන්ට හා කානානිවරුන්ට එරෙහිව
- සටනට හේතු: ඉශ්‍රායෙල්වරු දේශය හිමි කර ගන්නා පිණිස අමලෙක්වරු හා කනානිවරු පලවා දැමීමට ගියහ.
- උපක්‍රම :

1. කොඳුරන්ට එපා : ඉශ්‍රායෙල්වරු තමුන්ගේ තත්‍වය පිළිබඳව කෙඳිරීය.(2,3, පද). කොඳුරමින් චෝදනා කිරීම දෙවියන්වහන්සේට ප්‍රසන්න නොවේ. (11 පදය)

2. දෙවියන්වහන්සේට එරෙහිව කැරළි නොගසන්න: කැරළිකාරකම පාපයකි. ඔබ එය සම්පූර්ණයෙන් අත්හල යුතුය. (9 පදය)

3. දූෂ්‍යමාන වාර්ථා වලින් වලකින්න: සාතන් මෙම දූෂ්‍යමාන ප්‍රවෘත්ති මගින් නොමග යවන අතර එයට එකග වීමට මහත් සමූහයද පෙළඹේ. මහත් සංඛ්‍යාවක් නිවැරදි වනුයේ කලාතුරකිනි. (ගණන් 14: 36 - 38)

4. දෙවියන්වහන්සේගේ හඬට කීකරුවන්න: දෙවියන්වහන්සේ පැහැදිළිවම ඉශ්‍රායෙල් නැවතත් කාන්තාරයට හැරී යා යුතු බව පැවසූ නමුත් ඔව්හු ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කළහ. (25 පදය)

5. ඕනෑවට වඩා නිසැක නොවන්න : ඉශ්‍රායෙල්වරුන් ඕනෑවට වඩා නිසැක කමින් හා කලින් සිතාගෙන සිටි පරිදි ක්‍රියාකළහ (42 - 44 පදය). ඔව්හු දෙවියන්වහන්සේගේ

ආශිර්වාදයෙන් තොරව සටනේ ඉදිරියට ගියහ. ජයග්‍රහණය උදෙසා දේව අභිමුඛය අවශ්‍ය වේ.

6. ඇදහිල්ලෙන් තීරණ ගන්න : භයෙන් නොවේ. භයෙන් ගන්නා වු තීරණ පරාජය ගෙන දෙයි.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: ගණන් කථාව 21: 1-3
- සටන් බිම: හොර්මා
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල්වරු හා කානානිය ගෝත්‍රික නායකයෙකු වු අරද්
- සටනට හේතු: ඉශ්‍රායෙල්වරුන්ව බලෙන් මෙම සටනට යොමු කරගන්නා ලදී. ඔව්හු සැලසුම් කර තිබුයේ දකුණ දිශාවෙන් දේශයට ඇතුළු වීමට නොවේ.
- උපක්‍රම :

1. අසමත්කම තාවකාලික වචනයක් බව හදුනාගන්න : ඉශ්‍රායෙල්වරු කානානිවරුන්ගේ රජ වු අරද් සමග සටන් වැදි මෙම ප්‍රදේශය මීට වසර 38 කට පෙර (ගණන් 14:45) පොරොන්දු දේශයට ඇතුළු වීමට තැත් කොට අත්හැර දැමු ස්ථානයට වේ. එකල ඉශ්‍රායෙල්වරු පරාජය වුවද , මෙවර ඔව්හු සාර්ථක වුහ. අසමත්කම සදාකාලිය පරාජයක් ලෙස කිසිවිටකවත් නොසලකන්න' ඔබ උත්සහා කි×ම අත්හැර දමනු තුරු පරාජය නොවනු ඇත.

2. පසුගිය අසමත්කම්වලින් ඉගෙන ගන්න :දෙවියන්වහන්සේ අසමත්කම් උපයෝගි කොට ගෙන ආත්මික සත්‍යයන් උගන්වනු ඇත. සටනෙහිදී දෙවියන්වහන්සේ ඔවුන් සමග සිටිය යුතු බව ඉශ්‍රායෙල්වරු ඉගෙන ගත්හ (2-3 පද). ඔබගේ අසමත්කම් වලින් ඔබ ඉගෙන ගත යුතු මොනවාදැයි දෙවියන්වහන්සේ ගෙන් අසා දැනගන්න.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: ගණන් කථාව 21: 21-32
- සටන් බිම: යහශ්
- ප්‍රතිවාදී බලවේග : ඉශ්‍රායෙල් සහ අමෝරිවරු
- සටනට හේතු : මෝසෙස් යොර්දානයේ බටහිරින් දෙවියන්වහන්සේ පොරොන්දු වු දේශයට ඇතුල්වීමට සිතා සාමකාමීව රට මැදින් පිවිසීමට අවසර පැතිය(21,22 පද). එනමුත් අමෝරිවරුන්ගේ රජ වු සීහොන් එය ප්‍රතික්ෂේප කළේය. (23 පදය)
- උපක්‍රම :

1. ගැටුම් ඇති වීම වැලැක්විය නොහැකි බව අවබෝධ කරගන්න: ඔබට දෙවියන්වහන්සේ පොරොන්දුවු දෙය හිමිකර ගැනීමට නම් ආත්මික ගැටුම් ඇතිවීම මගහැරිය නොහැක. දෙවියන්වහන්සේගේ පොරොන්දුව සාමකාමීව අත්පත් කර ගැනීමට සතුරා පිවිසුම් මාර්ගයෙහි ඉඩ නොසපයනු ඇත.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: ගණන් කථාව 31
- සටන් බිම: මෝවබ් සමභූමිය.
- ප්‍රතිවාදී බලවේග : ඉශ්‍රායෙල් සහ මිදියන්වරු
- සටනට හේතු : මිදියන්වරු බාල් නමස්කාර කළාවු (ගණන් 25) දුෂ්ඨ වු ජාතියක් බැවින් ස්වාමින්වහන්සේ ඔවුන්ව විනාශකිරීමට අණ කළ සේක.
- උපක්‍රම :

1. ඔබව පවිත්‍ර කරගන්න : සටනට යාමට පෙර ඉශ්‍රායෙල් ජනතාව පවිත්‍ර කිරීමේ ක්‍රියාවලියක් දෙවියන්වහන්සේ පිහිටවු සේක. උන්වහන්සේ ක්‍රියාවලිය පිහිටවු නමුත් ඔව්හු ඒ අනුව ක්‍රියා කළ යුතු විය. දෙවියන්වහන්සේ ඔබ සමග සතුරාව සටන්

කිරීමට අවශ්‍ය නම් ඔබ ආත්මිකව පවිත්‍ර වී සිටිය යුතුය. උන්වහන්සේ යේසුස්වහන්සේ තුලින් මාර්ගය පිහිටුවා ඇත. ඔබ ඒ අනුව ක්‍රියා කළ යුතුවේ.

2. පෞද්ගලික ලාභයන් පසෙක තබන්න: (25 - 54 පද) සටනෙහිදී සාමුහික ජයග්‍රහණය තකා ඔබගේ පෞද්ගලික උනන්දුවීම් දෙවෙනි තැනට දමන්න. (පසෙකට තබන්න)

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: ද්විතිය කථාව 2 : 24-37
- සටන් බිම: යහශ්
- ප්‍රතිවාදී බලවේග : ඉශ්‍රායෙල් සහ හෙෂ්බොන්හි රජවූ අමෝරිවරයෙක් වූ සීහොන්
- සටනට හේතු : සීහෝන් රජ ඉශ්‍රායෙල්වරුන්ට දෙවියන්වහන්සේ පොරොන්දු වූ දේශය වෙත යෝර්දානයෙන් එගොඩ වී තම දේශය තුලින් යාමට ඉඩදීම ප්‍රතික්ෂේප කළේය.
- උපක්‍රම :

1. දෙවියන්වහන්සේ දී ඇති දේශෙයෙහි අයිතිය අත්පත් කරගන්න: දෙවියන්වහන්සේ දැනටම ඉශ්‍රායෙල්වරුන්ට කනාන් දේශය දීමට පොරොන්දු වී ඇත. එය ආත්මයෙන් පූර්ණ වූ ජීවිතය සංකේත කරන්නකි (24 පදය). උන්වහන්සේ ඔබට උරුමයක්ද දී තිබේ. දැනටමත් එය ඔබට හිමිය. ඔබ එය අත්පත් කරගැනීමට ඉල්ලා සිටිය යුතුය. (ගණන් 21: 33-35 හි එද්රෙයිහි සටන බලන්න. එහිදීද දෙවියන්වහන්සේ දැනටම දී ඇති අයිතිය හිමිකර ගැනීම සඳහා උපක්‍රමය භාවිතා කිරීම දැකිය හැකිය.

2. දෙවියන්වහන්සේ ඔබ උදෙසා සටන් කිරීමට ඉඩ හරින්න: සීහොන් ඉශ්‍රායෙල්ට එරෙහිව එදිරිවාදී සටනක් දියත් කොට පරාජය අත්විඳීය. එයට හේතුව වූයේ ස්වාමින්වහන්සේ තම ජනතාව උදෙසා සටන් කිරීමය (31,33 පද)

3. දෙවියන්වහන්සේට කිසිවක් අපහසු නොවන බව හඳුනාගන්න: ඉශ්‍රායෙල්ට පරාජය කළ නොහැකි තරම් ශක්තියෙන් වැඩිවූ කිසි නුවරක් නොවීය(36 පදය). ඔබගේ ජීවිතයෙහි ජයගත නොහැකි වූ සාතන්ගේ එකුදු බලකොටුවක්වත් නොමැත.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: ද්විතිය කථාව 3 : 1- 11
- සටන් බිම: එද්රෙයි
- ප්‍රතිවාදී බලවේග : ඉශ්‍රායෙල් සහ බාෂාන්හි රජවූ අමෝරිවරුන්ගේ රජ ඕග්
- සටනට හේතු : මුලින්ම ඉශ්‍රායෙල් ඔත්තු කරුවෝ දේශය පරීක්ෂා කිරීමට ගිය අවස්ථාවේ දැක භයවූ යෝධයෙක් වැනි වූ ඕග් රජ (ගණන් 13:33) , ඔහුගේ මිනිසුන් සමග පැමිණ ඉශ්‍රායෙල්ට එරෙහිව සටන් කළේය.
- උපක්‍රම :

1. දෙවියන්වහන්සේ සතුරා ඔබේ අතට පාවා දෙන බවට නිසැක වන්න: දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට ඕග්ට එරෙහිව සටන් කිරීමට දුන් අණ සමග ඔහුව ඔවුන් අතට පාවා දෙන බවට පොරොන්දුවද ඇතුලත්විය. ( 3 පදය )

2. සියළු බාධක ජයගන්න: නුවරෙහි සවිමත් කොටු පවුරු වල උසවත් ඔවුන්ගේ රජුගේ ප්‍රමාණයවත් ස්වාමින්වහන්සේගේ සේනාව පරාජය කිරීමට සමත් නොවීය. ස්වාමීන්වහන්සේගෙන් බලවත් කරනු ලැබූවන් හට කිසිම දෙයක් වඩා අමාරු නොවේ.

3. ජයග්‍රහණයේ ඵල හිමිකරගන්න: ද්විතිය 3:8-11 එද්රෙයිහි ඉශ්‍රායෙල් ලද ජයග්‍රහණයේ ඵල සඳහන් කරයි. අප සටන් කරන සෑම සටනකින්ම අපගේ ආත්මික ජීවිතයෙහි “ ජයග්‍රහනයේ ඵල ” හිමිකර ගැනීමට අවස්ථා සැපයේ.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: යොෂුවා 6
- සටන් බිම: යෙරිකෝව
- ප්‍රතිවාදී බලවේග : ඉශ්‍රායෙල් සහ යෙරිකෝව රජ ඇතුළු ඔහුගේ බලසම්පන්න මිනිසුන්.
- සටනට හේතු :දෙවියන්වහන්සේ , යෙරිකෝ නගරය අල්ලා ගන්නා පිණිස ඉශ්‍රායෙල් ජනතාවට මගපෙන්වන ලෙස යොෂුවාට පැවසූ සේක.
- උපක්‍රම :

1. දෙවියන්වහන්සේගේ මාර්ගය ඔබේ මාර්ගය නොවන බව හඳුනාගන්න: කිසියම් අවස්ථාවක් කෙතරම් මෝඩ ලෙස පෙනුනද ඔබ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් සිටිය යුතුය. එතුමාගේ අදහස් හා මාර්ග ඔබගේ මෙන් නොවේ (යෙසායා 55:8). ලෝකය දුර්වල යයි පවසන දෙය දෙවියන්වහන්සේ ශක්තිවන්තයන්ව ලැජ්ජාවට පත්කිරීමට භාවිතා කරනසේක. (1 කොරින්ති 1:27). සමහර විට ස්වාභාවික මනසට මෝඩ මෙන් සිතෙන ක්‍රම මගින් දෙවියන්වහන්සේ මැදිහත්කම් කරන සේක. ඉශ්‍රායෙල්වරු සටන් කළේ කොතරම් ආඥාන ලෙස පෙනුනද දෙවියන්වහන්සේ ක්‍රමයටය. 1 කොරින්ති 1:25 බලන්න.

2. දෙවියන්වහන්සේ අසමුබය පිළිබඳව නිසැක බව සොයන්න. 6-13 පද වල නව වාතාවක් සඳහන් වන ගිවිසුම් පෙට්ටිය ඉශ්‍රායෙල්වරුන්ට සංකේතවත් කළේ දෙවියන්වහන්සේ ඔවුන් සමග සිටින බවය. සටනට බහින්නට පෙර, දෙවියන්වහන්සේගේ වැඩ විසීම ඔබ සමග බවට නිසැක කර ගන්න.

3. නිශ්ශබ්දතාවයේ උපක්‍රමය භාවිතාකරන්න: ඉශ්‍රායෙල්ට පැවසුයේ කෑගැසීමට අණ ලබන තෙක් (10 පදය) නිශ්ශබ්දව ගමන් කිරීමටය (හොරනෑ ශබ්දය ඇසීමේ බලාපොරොත්තුවෙන්)'

ඔබ පැවසිය යුතු දෙය කුමන වෙලාවක කෙසේ පැවසිය යුතුද කියා දෙවියන්වහන්සේගෙන් උපදෙස් ලැබෙන තුරු, සටනෙහිදී නිශ්ශබ්දතාවය නම් උපක්‍රමය යොදා ගන්න.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: යොෂුවා 7
- සටන් බිම: හායි නුවර
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් හා අමෝරිවරු
- සටනට හේතු: දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ට පොරොන්දු වු දේශය හිමි කර ගැනීමට යෝෂුවා තම හමුදාව මෙහෙය වීය.
- උපක්‍රම :

1. දෙවියන්වහන්සේගේ උපදෙස් විකෘති නොකරන්න: ආකන්ගේ පාපය ඉශ්‍රායෙල් කෙරෙහි දෙවියන්වහන්සේ අප්‍රසන්න කළ අතර ඉශ්‍රායෙල්හි මහත් කැළඹීමක් ඇතිවිය. (1- 5 පද) ජයග්‍රහනයේ සෙවනැලි අතර පාපය සෙමෙන් රිංගීමට බලා සිටියි.

2. කිසිවිට සතුරා අවතක්සේරු නොකරන්න : ඔත්තු කරුවෝ හායි නුවර ජනග්‍රහනය අවතක්සේරු කළහ (2-4 පද). සතුරාට මැරීමට , සොරාගැනීමට හා විනාශ කිරීමට ඇති බලය අවතක්සේරු නොකරන්න. එසේම , සතුරාගේ බලය පිළිබඳ තක්සේරුව ඔබව බිය පත් කළයුතු නොවේ. ඔබහට සතුරාගේ සියළු බලයට ඉහලින් බලය ඇත.

3. පරාජයට හේතුව සොයා ඒ පිළිබඳව ක්‍රියා කරන්න: පරාජයක් ඇති වුකළ එයට හේතුවක් ද තිබේ. වැරදිකාරයාට දෙවියන්වහන්සේගේ උපදෙස් වලට අනුකූලව දඬුවම් දීම ඉශ්‍රායෙල් ඉටුකළහ. (13,25,26, පද). මෙම විනයානුකුල ක්‍රියාව මගින් නැවතත් දෙවියන්වහන්සේගේ අනුමැතිය ලබා ගත හැකි විය. දෙවියන්වහන්සේගේ

අභිමුඛය ඔබ සමග රදවා තබා ගැනීමට නම්, පාපය සමග ගණුදෙනු කොට, පාපොච්චාරණය හා පසුතැවීම කළ යුතුය.

4. මාංශික තෘෂ්ණාවෙන් වැළකී සිටින්න: ආකන්ගේ පාපය ක්‍රමානුකූලව වැඩිවූවකි.... ඔහු දැක, ආශාවී, එය ගත්තේය. (21 පදය). 1 ප්‍රේතෘස් 2:11 හි අපට පවසා ඇත්තේ “මාංශික තෘෂ්ණාවෙන් වැළකීසිටින්න : එය ප්‍රාණයට එරෙහිව සටන් වදී. ” යනුවෙනි. ඇසෙහි තෘෂ්ණාව පියාණන්වහන්සේගෙන් නොව එහෙත් ලෝකයෙන්ය (1 යොහාන් 2:16). සතුරා මිනිසාට පළමුවර පහර දුන් මොහොතේ සිට මාංශික තෘෂ්ණාව සැම විටම පරාජය ගෙනදීමට මං පාදා ඇත.
(උත්පත්ති 3).

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: යෝෂුවා 8
- සටන් බිම: හායි
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් හා හායි නුවර වැසියෝ
- සටනට හේතු: දෙවියන්වහන්සේ හායි නුවර අත්පත් කරගන්නා ලෙස ඉශ්‍රායෙල්ට පැවසූ සේක. මෙවර ඔව්හු ජය ලබනු ඇත.
- උපක්‍රම :

1. එකිනෙකාට උපකාර කරන්න: කණ්ඩායමක් ලෙස එක්ව ක්‍රියා කිරීමෙන් ඉශ්‍රායෙල් සතුරාගෙන් සැගවී සිට ජය ගත්තෝය. අප එකිනෙකාට සහය දෙමින් එක්ව නැගී සිටින කළ සතුරාට එරෙහිව දැඩිව සිටිය හැකි බව දේශනාකාරයා 4:9-12 පෙන්වා දෙයි.

2. සූදානම්ව සිටින්න: යුද්ධයේදී යෙදී සිටින මනුෂ්‍යයන්ට සූදානම්ව සිටින්නයයි යෝෂුවා පැවසිය ( 4 පදය). ඔබ ආත්මික යුද්ධයක නිරත වී සිටී. ඔබ නිරතුරුව ඉදිරියට යාමටත් , සතුරාගෙන් ප්‍රවේසම් වීමටත් වගබලාගත යුතුය.

3. කඩුව පාවිච්චිකරන්න: හොර රහසේ සැගවී සිටි මනුෂ්‍යයන්ට යෝෂුවාගේ සලකුණේ ආයුධය වූයේ කඩුවය(18,19 පදය). ඇඳහිලිවතුන් සතුව දේවවචනය නම් වූ ආත්මික කඩුවක් ඇත (එපීස 6:17). සතුරාගේ පැමිණීම අන් අයට අනතුරු ඇගවීමේ සංඥාවක් ලෙස ඔබ එය භාවිතා කළ යුතුවේ.

4. හැරී සතුරාට මුහුණ දෙන්න: කාන්තාරය දෙසට පළා ගිය ඉශ්‍රායෙල්වරු නැවත හැරී තමුන්ව හබා එන සතුරන්ව කඩු මුවතින් මැරුවෝය (21 පදය ). ස්වාමින්වහන්සේගේ ශක්තියෙන් හැරී ඔබේ සතුරාට මුහුණ දෙන්න. “ දෙවියන්වහන්සේට යටත්ව සිටින්න නුමුත් යක්ෂයාට විරුද්ධව සිටින්න, එවිට ඔහු නුඹලා වෙතින් පළායනවා ඇත ” (යාකෝබ් 4:7).

5. ජයග්‍රහණය වෙතට වඩා ජයග්‍රහණය දෙන තැනැත්තා දෙස අවධානය යොමු කරන්න: ජයග්‍රහනය හිමි කර ගැනීමෙන් අනතුරුව යෝෂුවා සෙනග නමස්කාරයෙහි මග පෙන්විය (29-31 පද). සමහර අවස්ථාවල අපි කරන වැරද්දක් නම් ආත්මික ජයග්‍රහණයකදී එය අත්පත් කර ගැනීම සඳහා අපගේ දායකත්වය අවධාරණය කිරීමය. අපට අනතුරු අගවා ඇත්තේ, ”තමා කෙළින් සිටින්නේයයි සිටින තැනැත්තෝ නොවැටෙන්නට බලා ගනිවා”යනුවෙනි (1 කොරින්ති 10:12).

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: යෝෂුවා 10:1-27
- සටන් බිම: ගිබියොන්
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් සහ අමෝරි රජවරුන් පස් දෙනා එනම් යෙරුසලමේ, හෙබ්‍රොන්හි, යර්මුත්හි, ලාකීෂ්හි හා එග්ලෝන්හි රජ වරුන් හා හමුදාව සමගය.

- සටනට හේතු: ගිබියොන්හි රජ ඉශ්‍රායෙල් සමග ගිවිසුමකට එළඹීම හේතුවෙන් යෙරුසලමේ රජ ඔවුනට පහර දීමට හමුදාව එවූ බැවින් ගිබියොන්වරු ඔවුන්ට උපකාර කි×මට යෝෂුවාට කැඳවූහ. මෙම රජවරු පස් දෙනාට, අවශ්‍ය වූයේ ඉශ්‍රායෙල්වරු මෙම යුද්ධමය අතින් වැඳගත් වූ නුවර අල්ලා ගැනීමෙන් වැලැක්වීමටය.
- උපක්‍රම :

1. ඔබේ සතුරාව ඔබේ පාද යටතට දමන්න: පාද බෙල්ල මත තැබීම පුරාණ කාලයෙහි යටත්වීම සංකේතවත් කිරීමකි. මෙහිදී යෝෂුවාගේ සේනාපතියෝ එය ක්‍රියාවට නැංවූහ.(24-25 පද). යේසුස්වහන්සේ පවසා ඇත්තේ එතුමාගේ ශරීරය වන සභාවෙහි හිස උන්වහන්සේ බවය. උන්වහන්සේගේ සතුරාගේ සියළු බලය එතුමාගේ පා යටට පත් කර ඇත. අපි උන් වහන්සේගේ ශරීරය නම් , ඉන් අදහස් වන්නේ අපගේ පාද සතුරාගේ බෙල්ල මතය යන බවය.

2. බය නොවන්න, ධෛර්යමත් වන්න: සටන හමුවේ මෙය දෙවියන්වහන්සේ ඔබට දෙන වචනයයි. දෙවියන්වහන්සේ ඔබගේ පක්ෂයෙහි බව දැන ගැනීමෙන් ඔබට ශක්තිය ලැබේ. මෙම නිසැකකම ඔබ හට සතුරා ඉදිරියෙහි ශක්තිමත්ව සිටීමටත් දිරියෙන් යුතුව සිටීමටත් හැකියාව ලබාදේ (25 පදය).

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: යෝෂුවා 10: 28 -43
- සටන් බිම: දකුණු දිග පලස්තිනය.
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් සහ දකුණු දිග පලස්තින නගරයන්
- සටනට හේතු: දකුණු දිග පළස්තිනය අල්ලා ගැනීමට යෝෂුවා සටනක් දියත් කළේය.
- උපක්‍රම :

1. ප්‍රධාන බලකොටුවලට පහර දෙන්න: යොෂුවාගේ යුදධ උපක්‍රමය වූයේ කනානිවරුන්ගේ ප්‍රධාන නගරවලට විදුලි කෙටීම වැනි ක්ෂණික පහරදීම් සිදු කොට එහි වැසියන්ගේ සටන් කිරීමේ හැකියාව විනාශ කර දැමීමය (28-43 පද). ඔබගේ ජීවිතයේ සතුරන්වන ප්‍රධාන බල කොටු වලට පහරදීමෙන් (උදා. ලෙස මාංශයට) සතුරා ඔබට පහර දීමට ඇති හැකියාව දුර්වල කළ හැකිය.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: යෝෂුවා 11
- සටන් බිම: මෙරොම්හි ජලය අසල
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් සහ උතුරේ කානානි රජවරු හාෂෝර්හි රජවූ යාබින්ගේ නායකත්වය යටතේ
- සටනට හේතු: දෙවියන්වහන්සේගේ අණ පිළිපදිමින් යෝෂුවා පොරොන්දු වූ දේශයෙහි තවත් කොටසක් අත්පත් කරගැනීම සඳහා සෙනගට මග පෙන්වීය.
- උපක්‍රම :

1. නොකඩවා යෙදී සිටීම : යෝෂුවා දේශයේ රජවරු සමග අවුරුදු හයක් පමණ නොකඩවා සටනෙහි යෙදී සිටියේය (18 පදය). දෙවියන්වහන්සේගේ පොරොන්දු වී ඇති සියල්ල හිමි කර ගැනීමටත්, සියළු බලකොටු අල්ලා ගැනීමටත්, නුවර වාසීන් පලවා හැරීමටත් (පැරණි පාපිෂ්ඨ ස්වභාවය) සටනෙහි නොකඩවා නියැලි සිටීම අත්‍යාවශ්‍යවේ.

2. සතුරු හමුදාවේ ප්‍රමාණයට බය නොවන්න(4 පදය).

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: විනිශ්චයකාරයා 6:1-8:35

- සටන් බිම: යෙශ්‍රයෙල් මිටියාවත.
- ප්‍රතිවාදී බලවේග: ගිඩියොන් සහ ඔහුගේ මිනිසුන් තුන්සියයට එරෙහිව මිදියන්වරු හා අමලෙක්වරු
- සටනට හේතු: ඉශ්‍රායෙල්වරු පව් කළ බැවින් දෙවියන්වහන්සේ ඔවුන්ව මිදියන්වරුන් අතට සත් අවුරුද්දකට වහල්කමට පවා දුන්සේක. ඉශ්‍රායෙල් පසුතැවිලිවී ස්වාමීන්වහන්සේට මොර ගැසු කළ ඔවුන්ව ගලවා ගැනීමට උන්වහන්සේ ගිඩියොන් එවු සේක.
- උපක්‍රම :

1. අවවාදයට ඇහුම්කන් දෙන්න........ පාපය වහල්කම ගෙනදේ: ඉශ්‍රායෙල්ගේ පාපය ඔවුන්ව තම සතුරන් ඉදි×යේ බෙලහින කළේය(6:1-5). පාපය ඔබව ආත්මිකව සාතන්ගේ වහල්කමට ගෙනඑයි.

2. නැවත - පිහිටුවීම පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙන්ය: මිදියන්වරුන්ගේ පීඩාකිරීම ඉවසා දරාගැනීමට බැරි වු තැන ඉශ්‍රෘයෙල්වරු නැවතත් දෙවියන්වහන්සේගෙන් මිදීම සෙවීමට ගෙන ආවේය( 6:6-8). ඔබගේම පාපය හේතුකොටගෙන ඔබ සතුරාගේ වහලෙක් බවට පත්වූ කළ, නැවත ප්‍රකෘතිමත් කිරීම සඳහා ඔබට ඇති එකම බලාපොරොත්තුව නම් දෙවියන්වහන්සේ පමණකි.

3. දෙවියන්වහන්සේ සමග හුදකලා වන්න: ගිඩියොන් හට ඉශ්‍රායෙල් මුදා ගැනීමට අණ කරනු ලැබුවේ ඔහු තනිව සිටියදීය(6:11-14). ආත්මික සටනෙහි ශක්තිමත් නායකයෝ දෙවියන් වහන්සේ සමග තනිවම කාලය ගත කල යුතුය. ඔබ අන් අයට මිදීමේ සේවාවකින් සහය දැක්වීමට අදහස්කරයි නම් මෙම උපක්‍රමය අත්‍යවශ්‍යය.

4. රූප නමස්කාරයෙහි පූජාසන බිඳ හෙලන්න: ගිඩියොන් බාල් පූජාසන බිම හෙලා විනාශ කර දැමීය(6:25-31)' ඔබ දෙවියන්වහන්සේ හට සම්පූර්ණයෙන් කැපවීමකට පැමිණීම බාදා කරණ සියÆ ආකාර බල කොටු කඩා දමා, රූප නමස්කාරයේ සියÆ දෑ බිඳ දමා විනාශ කළ යුතුවේ.

5. දෙවියන්වහන්සේගේ ආත්මයේ බලයෙන් බලවත් වන්න: දෙවියන්වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය ඉටු කිරීම සඳහා උන්වහන්සේගේ ආත්මයෙහි බලය ගිඩියොන් මතට වැඩිසේක (6:34). එම හේතුව සඳහාම ඔබ පිටත් ශුද්ධාත්මයාණන්ගේ බලය පැමින ඔබව බලවත් කළ යුතුවේ. ක්‍රියා 1:8 බලන්න.

6. ඇඳහිල්ලේ ගැඹුරු මට්ටම් සොයන්න: ගිඩියොන් හට දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය රැදවීමට සළකුණක් අවශ්‍ය විය (6:36-40). සමහර කිතුණුවන් හට මෙලොවෙහි යම් කිසි සුභ දායක සලකුණක් නොදැක විශ්වාසය කළ නොහැකිය. ඔබ හට දෙවියන්වහන්සේ එතුමාගේ වචනයේ පරිසමාප්තියෙන්ම පිළිගැනීමට හැකිවන පරිදි මීට වඩා ගැඹුරු ඇඳහිල්ලක් සෙවිය යුතුය. ක්‍රියා 27:20-25 බලන්න.

7. තමාගේ ශක්තිය කෙරෙහි රැදී නොසිටින්න: මනුෂ්‍යයා තමාගේ හැකියාව කෙරෙහි රැදී සිටීම ඉවත් කිරීම සඳහා දෙවියන්වහන්සේ යුද්ධ හමුදාව කුඩා සංඛ්‍යාවකට අඩු කළ සේක. දෙවියන්වහන්සේ ඔබගේ ජිවිතයෙහි තම ශක්තිය කෙරෙහි රැදී සිටීම ඉවත් කිරීමට සහ ජය ලැබෙන්නේ එතුමා තුලින් බව අවබෝධ කර ගැනීමට ක්‍රියා කරණසේක.

8. පැකිළෙන්න එපා: දෙවියන්වහන්සේ ස්ථිර කරදීමෙන් පසුව පවා ගිඩියොන් සතුරාට මුහුණ දීමට පැකිලුනේය. ඔහු මීට පෙර කිසි දිනෙක යුද්ධයක් මෙහෙයවා නොමැත' ඔහුගේ හමුදාව නුපුහුණු හා අත්දැකීම් වලින් තොරය (7:9,10). ඔබට දෙවියන්වහන්සේ යන්නට පවසන නව දිශාවට යොමුවීමට ඔබ පැකිළෙන අවස්ථා තිබිය හැක. ඔබට අත්දැකීමක් නොමැති ලෙසත් හැකියාවකින් තොර ලෙසත් හැගෙන්නට පුÆවන. පැකිලෙන්න එපා.....දෙවියන්වහන්සේ කැදවන අයව එතුමා සන්නද්ධ කරනසේක.

9. සතුරාගේ බිය ඉලක්ක කරගන්න: දෙවියන්වහන්සේ ගිඩියොන් හට තම සතුරන් වූ මිදියන් වරුන්ගේ බය ගැන අසන්නට සැලසුසේක. බිය හඳුනා ගැනීම තුල දුර්වලතා සොයා ගත හැක. යාකොබ් 2:19 හි පවසන පරිදි යක්ෂයෝ දෙවියන්වහන්සේ විශ්වාස කොට බියෙන් වෙව්ලති. දෙවියන්වහන්සේගේ බලයෙන් සතුරාගේ බය ඉලක්ක කර ගන්න.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: විනිශ්චකාරයන්ගේ පොත 15
- සටන් බිම: ලෙහිය
- ප්‍රතිවාදී බලවේග: සම්සොන් සහ පිලිස්තිවරු
- සටනට හේතු: සම්සොන් පවුල් ප්‍රශ්ණයක් මත පිලිස්තිවරුන්ට පහර දුන්නේය. පිලිස්තිවරු එය ඔහුගේ භාර්යාව හා ඇයගේ පවුල වෙත පටවා ඔවුන් ගින්නෙන් දවා දඬුවම් කලහ. පළිගැනීම සම්සොන් සහ පිලිස්තිවරු අතර දිගින් දිගටම පැවතිය.
- උපක්‍රම :

1. දෙවියන්වහන්සේ පරාජය ජයට පත් කරන බව දැනගන්න: සම්සොන්ගේ සතුරෝ ජයග්‍රහණය පිළිබඳ ජය ගෝසා නගද්දී, සම්සොන් කෙරෙහි ස්වාමීන්වහන්සේගේ ආත්මය පැමිණ ඔහු වෙළා සිටි රැහැන් කඩා දැමීය (14 පදය). ඔහු කොටළුවෙකුගේ හනු කටුවක් ගෙන සතුරන්ට පහර දී දහසක් මරා දැමුවේය. ඉශ්‍රායෙල්හි වීරයාගේ පරාජය ලෙස දුටු දෙය ජයග්‍රහණයට පෙරළුනි (15 පදය). සාතන් අපගේ පරාජය ලෙස බැඳ දමන දේවල් දෙවියන්වහන්සේට ජයග්‍රහණයට හැරවීය නොහැකි කිසි රැහැනක් නොමැත.

2. දෙවියන්වහන්සේ ඔබගේ සැපයීම ලෙස පිළිගන්න: සම්සොන් පිලිස්තිවරු 1000 ක් මැරීමෙන් පසුව වෙහෙසට පත්වී පිපාසයෙන් පෙළුනි. දුර්වල තත්වයෙහි පසුවන සම්සොන් තම රට වැසියන් මැරීමේ පළිය ගැනීමට බලා සිටි පිලිස්තිවරුන්ගේ ගොදුරක් බවට පත්විය හැකිය. ඔහු තම අමාරු වේලාවෙහි දෙවියන්වහන්සේට හඬ ගැසීය. (18 පදය) දෙවියන් වහන්සේ සටනෙහිදී අපගේ ශක්තිය පමණක් නොව අපගේ සැපයීමද වේ.

3. ස්වාමීන්වහන්සේ උල්පතෙන් ප්‍රබෝධමත් වන්න: සම්සොන්ගේ හඬ ගැසීමට පිළිතුරු ලෙස දෙවියන්වහන්සේ ජලය පැන නැගීමට සැලසු සේක. ඔහු එයින් බී ප්‍රාණවත් කරනු ලැබීය (19 පදය). යේසුස්වහන්සේ පැවසුයේ "පිපාසා ඇත්තෙනි, මා ලගට ඇවිත් බොන්න" කියාය (යොහාන් 7:37). ස්වාභාවික ලෝකයෙහි යුදධ භටයින් හට වරින්වර විවේකය හා ප්‍රබෝධමත් වීම අවශ්‍ය වන්නාක් මෙන් අපටද ආත්මිකව ප්‍රාණවත් වීමක් අවශ්‍ය වේ. බොහෝදෙනෙක් මෙම ප්‍රාණවත් කර ගැනීම විනෝදාංශ, ක්‍රිඩා,හා සතුටුවීම් තුලින් ලැබීමට සොයති. සැබෑ ආත්මික ප්‍රාණවත් කිරීම ලබා ගත හැක්කේ"ස්වාමීන් වහන්සේගේ උල්පත "ලගට පැමිණීමෙනි.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: විනිශ්චකාරයන්ගේ පොත 20
- සටන් බිම: ගිබියාව.
- ප්‍රතිවාදී බලවේග: බෙන්ජමින් ගෝත්‍රයට එරෙහිව ඉශ්‍රායෙල් හි අන් සියළු ගෝත්‍රයන්
- සටනට හේතු: ලෙව්වරයෙකුගේ උපභාර්යාව ගිබියාහි මිනිසුන් කිහිපදෙනෙකු විසින් දූෂණය කොට මරා දමනු ලැබීය. ලෙවියා ඉශ්‍රායෙල්හි ගෝත්‍රික වැඩිමහල්ලන් කැඳවා තම චෝදනාව අසා නිසි ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස දැන්විය. බෙන්ජමින් ගෝත්‍රය හැර අන් සියළුම ගෝත්‍ර ගිබියාවේ වැසියනට දඬුවම් කළ යුතුයයි එකඟ වූහ. බෙන්ජමින් ග්‍රෝත්‍රය ඔවුන්ව ආරක්ෂා කළහ.
- උපක්‍රම :

1. දෙවියන්වහන්සේගෙන් උපදේශ ඉල්ලා සිටින්න: ඉශ්‍රායෙල්වරු යුද්ධ උපක්‍රම පිළිබඳ උපදෙස් පතමින් නැවත නැවතත් දෙවියන්වහන්සේ ඉදිරියට ගියෝය. (18,23,26,28 පද).

2. සාමුහික විනය ක්‍රියාත්මක කරන්න: ඉශ්‍රායෙල්හි අනෙකුත් සියළුම ගෝත්‍රයන් බෙන්ජමින් ගෝත්‍රයෙන් ඉල්ලා සිටියේ වරදකරුවනට දඬුවම් කරන පිණිස ඔවුන්ව බාර දෙන ලෙසටය (13 පදය). ඇදහිලිවන්තයන් ලෙසට අපි දෙවියන්වහන්සේ හා සමඟ එකමුතුව අපගේ ජීවිතයෙහි පාප ඇති අංග ඉවත් කිරීමට සාමුහිකව ක්‍රියා කල යුතුය.

3. සටන් කිරීම නවතා නොදමන්න: පළමු සටන් දෙකෙහිදී ඉශ්‍රායෙල් ගෝත්‍ර බෙන්ජමින් ගෝත්‍රය මගින් පරාජයට පත් වන ලදි. ඔව්හු හඬා, නිරාහාරව සිට, නැවතත් ස්වාමීන් වහන්සේ ගෙන් විමසීම සඳහා ගියෝය. උන්වහන්සේ නැවත වරක් සටනට යන ලෙසත්, එවිට ජය ලැබෙන බවටත් පොරොන්දු වූ සේක (18-28 පද).

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: 1 සාමුවෙල් 4.
- සටන් බිම: අපෙක් සහ එබන්-එසෙ¾ අතර
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල්වරු හා පිලිස්තිවරු
- සටනට හේතු: ඉශ්‍රායෙල්වරු දෙවියන්වහන්සේගේ සතුරන් වන පිලිස්තිවරුන්ට එරෙහිව සටන් කළෝය.
- උපක්‍රම :

1. ආත්මික භාවයේ “ ආකෘති“ කෙරෙහි විශ්වාසය නොරඳවන්න. ගිවිසුම් පෙට්ටිය වනාහි දෙවියන්වහන්සේ තම ජනතාව මධ්‍යයෙහි වැඩ වසන බවට දෘෂ්‍යමාන සංකේතයක්ය. (4 පදය). නමුත් මනුෂ්‍යයෝ තම ඇදහිල්ල එම ආකෘතිය කෙරෙහි තැබිය යුතු නොවේ. එයින් නියෝජනය වු දෙවියන්වහන්සේව ඔව්හු විශ්වාස කලයුතු විය.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: 1 සාමුවෙල් 11
- සටන් බිම: බෙෂෙක්
- ප්‍රතිවාදී බලවේග: අම්මොනිය නාහාෂ් සහ යාබෙෂ්හි සියළු වැසියෝ සමඟ සාවුල් ඇතුළු සියළු ඉශ්‍රායෙල්වරු.
- සටනට හේතු: අම්මෝනිවරු ඉශ්‍රායෙල් නුවරක්වු යාබෙෂ් - ගිලියද්ට පහර දුන්හ. සාවුල් හමුදාවක් රැස් කොට ඔව්හු පරාජය කළේය (11 පදය).
- උපක්‍රම :

1. සටන උදෙසා එළිවන යාමයෙහි සූදානම් වන්න: සාවුල් අම්මෝනිවරුනට උදෑසන එළිවන යාමයෙහි පහර දුන්නේය (11 පදය). ස්වාමීන් ඉදිරියට අලුයම පැමිණ ”ස්වාමීන්වහන්සේගේ සියලු යුධ ආයුධ පැළඳ ගන්න. ” (එපීස 6:11-17).

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: 1 සාමුවෙල් 13-14
- සටන් බිම: මික්මාෂ්
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් වරු හා පිලිස්තිවරුන්
- සටනට හේතු: යොනාතන් ගෙබාහිදී පිලිස්තින හමුදා නිළධාරියෙක් මැරුවේය.
- උපක්‍රම :

1. අර්බුධකාරී අවස්ථාවලදී ඉවසිලිවන්තව සිටින්න: සාවුල්ගේ නොඉවසිලිවන්ත කම නිසා ඔහුට රජකම අහිමි විය (13 පදය). තම හමුදාව පිලිස්තිවරු ඉදිරියෙන් පළා යනු දැක ඔහු බියපත් විය. දෙවියන්වහන්ස නැවති සිටින ලෙස ඔහුට දුන් අණට අකීකරු විය. ගැටුම්කාරී අවස්ථාවලදී බය හේතු කොට ගෙන අනුවණ ලෙස ක්‍රියා කිරීමට යොමු නොවන්න.

2. කැපවීම මිස සංඛ්‍යවන් වැදගත් යයි නොසලකන්න: ඉශ්‍රායල්වරු සටන් ජය ගත්තේ විශාල සංඛ්‍යාවකින් යුත් හමුදා නිසා නොව නිර්භීත කැපවූ මනුෂ්‍යයන් මගිනි (14:6).

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: 1 සාමුවෙල් 17
- සටන් බිම: ඒලා මිටියාවත
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් (දාවිත්) සහ පිලිස්තිවරු (ගොලියත්)
- සටනට හේතු: පිලිස්ති හමුදාව ඉශ්‍රායෙලට පහර දීමට රැස්ව සිටියහ. ඉශ්‍රායෙල් හමුදාව මිටියාවතෙහි විරුද්ධ පැත්තෙහි ආරක්‍ෂාකාරී ස්ථානයක රැඳී සිටියහ. පිලිස්තිවරුන්ගේ යෝධයෙකු පවසා සිටියේ සටන තමාත් ඉශ්‍රායෙල් යුද්ධ භටයෙකුත් අතර සිදු කොට සමථයකට පත් කරන ලෙසය.
- උපක්‍රම :

1. පෙර ලැබූ ජයග්‍රහණ වලින් ශක්තිය ලබා ගන්න: දාවිත් මීට පෙර වන මෘගයන්ගෙන් තම රැල බේරා ගැනීමේ ජයග්‍රහණ අත් දැක තිබුනි. දෙවියන්වහන්සේගේ රැල මෙම පිලිස්තියාගෙන් රැක ගත හැකි බව සාවුල්ට ඔහු නිසැක කර දුන්නේය (24-36 පද). පසුගිය අපහසුතා වලදී ශක්තිමත් වූ ඇදහිල්ල අළුත් අර්බුද වලට මුහුණ දීමේදී ඇදහිල්ල සපයා දේ.

2. බාධක දෙවියන්වහන්සේගේ ප්‍රස්ථාවන් ලෙස දකින්න: ඔබට ඇති වන සෑම අපහසුතාවයක්ම දෙවියන්වහන්සේට ඔබ තුලින් එතුමාගේ බලය එලිදරව් කර දීමට ප්‍රස්ථාවකි. දාවිත් ගෝලියත්ව දුටුවේ අභියෝගයක් ලෙස නොව ප්‍රස්ථාවක් ලෙසටය (32, 45-47 පද)

3. ඔප්පු කොට ඇති ආයුධ භාවිතා කරන්න: දාවිත් තම සටන් වලදී මෙතෙක් භාවිත කර නොමැති සාවුල් රජ සැපයූ ලෝකයෙහි යුධ ආයුධ භාවිත කිරීම (ඔප්පු කොට ඇති) ප්‍රතික්ෂේප කළේය (38, 39 පද). ආත්මික සටන් ලෞකික යුද්ධ උපක්‍රම මඟින් ජයගත නොහැක: එය ජයගත යුත්තේ දැනට ඔප්පු වී ඇති අත්හදා බලා ඇති ආත්මික යුද්ධායුධ මඟිනි.

4. ස්වාමින්වහන්සේගේ නාමයෙන් සතුරාට මුහුණ දෙන්න: ගෝලියත් කඩුවක්, හෙල්ලක් හා පළිහක් සහිතව පැමිණි අතර දාවිත් යෝධයාට මුහුණ දීමට පැමිණියේ ස්වාමින්වහන්සේගේ නාමයෙනි. (45-47 පද)

5. සටන ස්වාමින්වහන්සේගේ බව මතක තබා ගන්න: සතුරාට වාසිදායක ලෙස පෙනෙන්නට තිබිය හැකි නමුදු සටන ස්වාමින්වහන්සේගේ වූ කළ ජය නියතය. දාවිත් නිසැක ලෙස පෙන්වා සිටියේ මනුෂ්‍යයාගේ බලය නොව ස්වාමින්වහන්සේම සටනෙහි ප්‍රතිඵලය ලෙස අධිෂ්ටානය කරනු ඇත කියාය. " බලයෙන්වත්, ශක්තියෙන්වත් නොව මාගේ ආත්මයෙන් යැයි සේනාවල ස්වාමින්වහන්සේ පවසන සේක. "(සෙකරියා 4:6)

6. ඔබගේ හැකියාවන්ගෙන් සීමා නොවන්න: යෝධයා දාවිත් දෙස බැලුවේ යුධයෙහි කිසිම අත්දැකීමක් නොමැති යෞවනයෙක් ලෙස ස්වාභාවික අන්දමිනි (33 පදය). දෙවියන්වහන්සේ අපව දකින්නේ අපගේම නොහැකියාවන් වලින් සීමාවූ අය ලෙස නොවේ. උන්වහන්සේ අපව දකින්නේ උන්වහන්සේගේ බලය අප තුලින් ගලා යාමට ඉඩ දුන් කළ අප සිටින්නට යන තත්වය අනුවය.

7. ජයග්‍රහණය ප්‍රකාශ කරන්න: දාවිත් තමා දෙවියන්වහන්සේ තුල ලද අතීත ජයග්‍රහණ ප්‍රකාශ කලේය. අනාගත ජයග්‍රහණයන් පිළිබඳ ඇදහිල්ලේ ප්‍රකාශන ඉදිරිපත් කලේය.

8. ආත්මික සටනෙහි පරමාර්ථය වටහා ගන්න: දාවිත් 46 පදයෙහි එය සදහන් කර ඇත්තේ.... " මෙසේ ඉශ්‍රායෙල් කෙරෙහි දෙවි කෙනෙක් ඉන්න බව පොළවේ සියල්ලන්ම දැන ගන්නවා ඇත " යනුවෙනි.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: 1 සාමුවෙල් 30
- සටන් බිම: ශික්ලග්
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල් සහ අමෙලෙක්වරු
- සටනට හේතු: දාවිත් සහ ඔහුගේ හමුදා ශික්ලග් වලින් බැහැරව ගොස් සිටි අවස්ථාවක අමෙලෙක්වරු නගරයට පහර දී ඔවුන්ගේ පවුල් අල්ලා ගෙන ගොස් නගරයට ගිනිලෑවෝය.
- උපක්‍රම :

1. අපේක්‍ෂා සුන්වීමට ඉඩ නාරින්න: දාවිත්ගේ මනුෂ්‍යයෝ කොපමණ ශෝකයට පත් වී සිටියද යත් ඔහුට ගල් ගැසීමට කතා කලෝය ( 6 පදය) නුමුත් දාවිත් ස්වාමීන්වහන්සේ තුල ඔහුව දිරිමත් කර ගත්තේය. අධෛර්යවී ඔබ තනිවම සිටින විට, ස්වාමීන්වහන්සේ තුල ඔබව දිරි ගන්වා ගන්න. අපේක්ෂා සුන් වීමට ඉඩ නොදෙන්න.

2. සතුරා අල්ලා ගෙන ඇති සියල්ල නැවත අයිති කර ගන්න: සතුරා පැමිණෙන්නේ මරන්ටත්, සෙරකම් කරන්ටත් සහ විනාශ කරන්ටත්ය (1 පදය) දෙවියන්වහන්සේ දාවිත්ට පැවසුයේ සතුරා ලුහු බැද ගොස් සොරා ගත් සියල්ල නැවත ඔබට අත් පත් කර දීමට දෙවියන් වහන්සේට අවශ්‍ය බවය ( 8,18 පද).

3. එක් අයෙකු ලබන ජය සියළු දෙනාගේම ජය බව අවබෝධ කර ගන්න. ආත්මික සටන්වලදී මූලික ප්‍රතිපත්තියක් 24 පදය සපයා දෙයි. සටනේ ඉදිරිපෙළ සටන් වදින අයටද බඩු බලා ගන්නා අයටද ජයග්‍රහනයේදී සම සමව කොල්ලය බෙදා ගනු ඇත.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව: 2 සාමුවෙල් 5:1-16
- සටන් බිම: යෙරුසලම
- ප්‍රතිවාදී බලවේග: ඉශ්‍රායෙල්වරුන් සහ යෙබුසිවරුන්
- සටනට හේතු: යෙබුසිවරුන් යෙරුසලම අල්ලාගෙන එය ඔවුන්ගේ බල කොටුව සේ සැලකූ අතර එය නැවත අල්ලා ගැනීමට නොහැකි යයි සිතූහ. නමුත් දාවිත් එම නුවර අල්ලා ගත් අතර ඉශ්‍රායෙලයේ ජාතික ජීවිතයේ කේන්ද්‍රස්ථානය බවට පත් විය.
- උපක්‍රම :

1. සතුරාගේ පුරසාරම් බස් අසා නිවට නොවන්න: යෙබුසිවරුන් ඔවුන්ගේ නගරයෙහි බලකොටු ප්‍රබල බව පිළිගෙන දාවිත්ට නින්දා කරමින් " අන්ධයින් හා කොරුන් නුඹ පහ කර දමනවා ඇතැයි " පැවසූහ. (6 පදය) නුමුත් දාවිත් මේ කවට කම් කීම ඔහුට බාධාවක් කර නොගත්තේය ( 7 පදය). සතුරා ඔබට අපහාස කරමින් කවටකම් කරන කල, ඔබ දුර්වල මෙන් හැගෙන කළ, යොහාන් 8:44 අයිතිය ප්‍රකාශ කරන්න.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 සාමුවෙල් 5:7-25
- සටන් බිම : රෙඵාවරුන්ගේ මිටියාවත
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙල් සහ පිලිස්තිවරු

- සටනට හේතු :දාවිත්ව රජ ලෙස ආලේප කළ බව පිලිස්තිවරුන්ට අසන්නට ලැබූ කල, ඔහුට එරෙහිව පහර දීමක් සැලසුම් කළහ.
- උපක්‍රම :

1. පහරදීමෙන් සටන්කරන්න : දාවිත් සතුරන්ගේ පහරදීම තෙක් බලා නොසිටියෝය. ඔහු ඔවුන්ට එරෙහිව පිටත්ව ගියේය. සතුරා ඇවිත් ඔබව අල්ලා ගන්නා තුරු බලා සිටින්න එපා.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 සාමුවෙල් 10
- සටන් බිම : හේලාම් ප්‍රදේශය
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙල්ට එරෙහිව අම්මොන්වරු සහ සිරියන්වරු
- සටනට හේතු : අම්මොන්වරුන්ගේ රජ මිය ගිය කල ඔහුගේ පුත්‍රයා වෙත දාවිත් මිනිසුන් යවමින් තම පක්ෂපාතිබව ද ශෝකයද ප්‍රකාශ කළේය. නමුත් නව රජතුමා අසත්‍ය උපදේශන අසා දාවිත්ගේ ශෝක පණිවුඩ හා යහපත් චේතනා පිළිනොගෙන ඉශ්‍රායෙල්වරුන්ගේ හිස් අඩක් මුඩු කොට, ඇඳුම් කපා දමා නින්දා කොට ඔවුන්ව පිටත් කර හැරියේය. ( 1-5 පද )
- උපක්‍රම :

1. සටනේදී සාමුහිකව එකතුවන්න: දාවිත්ගේ යුද්ධ හමුදාපති තමාගේ සේනාව දෙපසකින් සටනට කොටුවී ඇති බව වටහාගත් කළ ඔහු තම සේනාව දෙකට බෙදා එක් කණ්ඩායමක් තම සොහොයුරාට බාර දුනි. ඔව්හු කණ්ඩායම් දෙකක් ලෙස සටන් කළද සතුරාව පරාජය කිරීමට එක්ව සටන් කළහ. අප භූගෝලීමය වශයෙන්, සංස්කෘතිමය හෝ නිකායන් අනුව අනෙකුත් ඇදහිලිවන්තයින් හා වෙනස්ව සිටියත් සතුරාට එරෙහිව අප සැම එකමුතුවී මිස එකිනෙකා සමග සටන් නොකල යුතුය.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 සාමුවෙල් 21:5-22
- සටන් බිම : ගොබ් සහ ගාද්
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙල් සහ පිලිස්තවරු
- සටනට හේතු :පිලිස්තිවරු නොකඩවා ඉශ්‍රායෙල් සමග යුද්ධ කිරීමෙහි නිරත වූහ.එවන් සටනක් පිළිබඳ කෙටි සඳහනකි.
- උපක්‍රම :

1. දේශයෙහි යෝධයන් පරාජය කරන්න: පිලිස්තිවරුන්ගේ යෝධයන් කිහිප දෙනෙකුම මෙම සටන් වලදී මරා දමන ලදි. මෙම යෝධයෝ වසර ගණනාවක්ම ඉශ්‍රයෙල්ට මහා හිරිහැරයක් ව සිටියහ' ඔබට තවමත් හිරිහැර කරන ඔබගේ පරණ මාංශික ජිවිතයෙහි සිට “ යෝධයෝ ” සිටීද? යෝධයන් පරාජය කොට ජය ලබන තුරු සටන් කරන්න.

2. දෙවියන්වහන්සේ විවිධ ක්‍රම භාවිතා කරණ බව හදුනාගන්න. වරක් දාවිත් දෙවියන්වහන්සේගේ බලයෙන් සරල ක්‍රමයක් වන කැටපෝලයක් සහ ගල් රැගෙන ගෝලයිත්ව පරාජය කළේය. මෙවර දෙවියන්වහන්සේ වෙනත් ක්‍රමයකින් යෝධයන් පරාජය කළසේක ( 16-17 පද ). දෙවියන්වහන්සේ පෙර කාලයේදී ක්‍රියා කළ ආකාරය අනුව දෙවියන්වහන්සේ සීමා නොකරන්න.

3. නායකත්වය ශක්තිමත් කරන්න: ශ්‍රේෂ්ඨ නායකයෝ පවා සටනෙහිදී දුර්වල වීමට හැකිය ( 15-17 පද ). මෙය විවේචනය කිරීමට කාලය නොව, එකිනෙකාට සහායවීමට කාලයයි.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 1 රාජාවලිය 20
- සටන් බිම : සමාරිය සහ පසුව අපෙක්
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙල්ය රජ වන ආහබ් සහ සිරියාවේ රජ වන බෙන්-හදද්
- සටනට හේතු : සිරියාවේ රජ වූ බෙන් හදද් තව රජවරු 32 ක් සමග එක්වී සමාරියට එරෙහිව සටනට පැමිණියේය.
- උපක්‍රම :

1. සතුරා නැවත වරක් හැරී එන බව වටහාගන්න: අනාගතවක්තෘවරයා ඉශ්‍රායෙල්හි රජහට පැවසුවේ සිරියාවේ රජ ඔහුට එරෙහිව නැවත ආහැකි බැවින් ශක්තිමත් වන ලෙසටය ( 22 පදය ). සටනින් ජය ගැන්ම කෙතරම් ශ්‍රේෂ්ඨ වුවද, එය යුද්ධයෙහි අවසානය නොවේ. සතුරා දෙවියන්වහන්සේගේ ජනතාව පරාජය කිරීමට නැවතත් තම උත්සාහය අලුත් කරනු ඇත.

2. මනුෂ්‍යයාගේ ඉච්ඡා බසට නොරැවටෙන්න. සිරියා රජුගේ යටහත් වීමට මුළාවී, ආහබ් රජ බෙන්-හදද් රජට සාමදානයෙන් පිටත්ව යාමට ඉඩ දුන්නේය. රැවටිලි බස් පසුපස සැගවී ඇත්තේ ආත්මාර්ථයයි. එය දෙවියන්වහන්සේගෙන් තොරව ක්‍රියා කරන අහංකාරයට ආත්මාර්ථකාමී හැගිම් වලට, යොමු කරවයි. හිතෝපදේශය 16:8.

3. සුදුසු ප්‍රමුඛතාවයන් පිහිටුවාගන්න: ආහබ් තමාට අහිමි වූ භූමි නැවත අත්පත් කර ගැනිම පිළිබද සැළකිලිමත් විය. " නමුත් ඔබගේ මෙහෙකරුවා එහෙ මෙහෙ කටයුතු කරන අතර ඔහු සැගවී ගියේය"(40 පදය) යන ප්‍රකාශනයෙන් ඔහු සුදුසු ප්‍රමුඛතාවයන් තබා ගෙන නොතිබු බව පෙන්නුම් වේ. දේව කැමැත්ත සඳහා පලමු ස්ථානය හිමිවිය යුතුය.

4. සතුරා සමග සාකච්ඡා කොට තීරණයකට නොඑළඹෙන්න: සිරියවරුන් හා ඉශ්‍රායෙල්වරුන් අතර පොර බැඳීම අවසන් කිරීමට බලය ආහබ් සතු විය. නුමුත් බෙන් හදද්ට නිදහස් වී යාමට ඉඩ හැරීමෙන්, සටන අහිතකර ප්‍රතිපල සහිතව දිගින් දිගටම පැවතෙනු ඇත. (42 පදය).

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 රාජාවලිය 3
- සටන් බිම : මෝවබ්
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙල් සහ මිත්‍ර පාක්ෂික යුදා හා ඒදොම් මෝවබ්ට එරෙහිව
- සටනට හේතු :මෝවබ්වරු කැරලිගසමින් ඉශ්‍රායෙල් වරිපණම් බදු ගෙවීම් ප්‍රතික්ෂේප කළේය. යෙහෝරාම් රජ යුදාවේ රජගෙන් මෝවබ් රජට එරෙහිව සටන් කිරීමට සහය පැතිය. ඔව්හු දෙදෙනා සටන් කිරීමට පටන් ගත් කළ ඒදොම්හි රජ ද ඔවුනට සහයට පැමිණියේය.
- උපක්‍රම :

1. එළිදරව්කිරීම් ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා: එළිෂා ස්වාමීන්වහන්සේගේ වචනයට පතිචාර දක්විම සඳහා සංගිත වාදනය කරන්නට සැලසීය. වීණා වාදනය වන අතර දෙවියන්වහන්සේගේ බලය ඔහු පිට පැමිණ එළිෂාට දෙවියන්වහන්සේගෙන් එළිදරව්ව හිමි විය( 11-15 පද ). යුදධවලදී මූලික උපක්‍රමයක් නම් ප්‍රශංසාකිරීමය. එමගින් දෙවියන්වහන්සේගෙන් එළිදරව් ලබාගැනිම පිණිස ඔබගේ ආත්මය සුදුසු ඉරියව්වකට රැගෙන එයි.

2. ජයග්‍රහණය සදහා සූදානම් වන්න: සමහර විට ඔබ ජය ලබාගැනීම සඳහා සූදනම්ව නොමැති කමින් ජය නොලබයි. දරුණු නියගයක් පැවති අතර ඉශ්‍රායෙල් හා යුදාහි සේනාවෝ ජලය නොමැතිව මිය යාමේ අනතුරට ලක්ව සිටියහ. එළිෂා භාසකමක් උදෙසා යාච්ඤා කළේය. දෙවියන්වහන්සේ පැවසුයේ, " මෙම මිටියාවත පුරා අගල් සාදන්න, " කියාය. දෙවියන්වහන්සේ එම අගල් ජලයෙන් පිරෙන්නට සැලැස්වූසේක ( 16-17 පද ). ඔබ දෙවියන්වහන්සේගේ ජිවනය අන් අයට බෙදා දීමට සැපයුම් මා¾ගයක් වීමට නම් එය නිසිලෙස ගලා යාමට නියාමාකාරයෙන් සූදානම්වී සිටිය

යුතුය. මේ සඳහා සමහරවිට ඔබගේ ආත්මික ජීවනයෙන් “ කුණු ” ටිකක් හාරා ඉවත් කිරීමට සිදුවිය හැක.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 රාජාවලින් 6:8 -23
- සටන් බිම : දෝතාන් හා සමාරිය.
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙල් සහ සිරියාව
- සටනට හේතු : සිරියවරුන් ඉශ්‍රායෙල් සමග සටන් කිරීමේදී සිරියවරුන්ගේ සේනාව රැඳී සිටින ස්ථානය එළිෂා ඉශ්‍රායෙල් රජුට එළිදරව් කලේය' එළිෂා කළ දෙය සිරියේ රජ දැනගත් කල ඔහුව අල්ලාගෙන ඒමට සේනාව යැවීය.
- උපක්‍රම :

1. යාච්ඤා කරන්න: ඔබ මේ වනවිට සමහර විට සටන් කරගෙන ඇති පරිදි පැරණි ගිවිසුමේ සටන් වලදී දෙවියන්වහන්සේට යාච්ඤා කිරීම නැවත නැවතත් සිදුකර තිබේ. මෙහිදී සිරිය වරු අන්ධ වන ලෙසට එළිෂා යාච්ඤා කළේය ( 18 පදය ). ආත්මික සටනෙහි ඉතා ප්‍රබල ආයුධයක් නම් යාච්ඤාවය.

2. ආත්මික අවබෝධයක් සහිත දැක්මක් වර්ධනය කර ගන්න: එළිෂාගේ සේවකයා දුටුවේ ස්වාභාවික දෙය පමණකි. නමුත් එළිෂා සතුව ආත්මික අවබෝධයකින් යුත් දැක්මක් තිබූ නිසා ඔහු කතාකොට, “ භය නොවන්න, මක්නිසාද ඔවුන් සමග (සිරියවරුන්) සිටින්නන්ට වඩා අප සමග සිටින්නෝ බොහෝය” යයි කීවේය. (16 පදය).

3. දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්වීමට ඉඩ දෙන්න : සිරියවරු අන්ධ වූ කල එළිෂා ඔවුන්ව ඉශ්‍රායෙල් රජ වෙත මග පෙන්වීය. ඔහු රජ තුමාගෙන් ඉල්ලා සිටියේ සිරියවරු නොමරණ ලෙසත් දෙවියන්වහන්සේගේ බලයේ නිදර්ශනයක් ලෙස ඔවුන්ව මුදා හරින ලෙසත්ය.(18-23 පද)

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 රාජාවලිය 6:24 -7:20
- සටන් බිම : සමාරිය
- ප්‍රතිවිරුද්ධ බලවේග : සිරියාව සහ ඉශ්‍රායෙල්
- සටනට හේතු :බෙන්-හදද් සහ ඔහුගේ සේනාව සමාරිය වටලැවෝය. සමාරියේ මහත් සාගතයක් ඇතිවිය. ආහාර හිගය කෙතරම් දරුණු වී ද යත් මනුෂ්‍යයෝ කුණු හා තමුන්ගේම දරුවන් කෑවෝය.
- උපක්‍රම :

1. කළ නොහැකි දෙය වෙත යොමු වන්න : කුෂ්ඨ රෝගීන් හතර දෙනා දැනට ඇති තත්වය සෝදිසි කර බැලීමේදී පෙනී ගියේ තමුන්ට සිදුවිය හැකි අයහපත්ම දෙය නම් සිරියවරුන් අතින් මැරුම් කෑමය. ඔව්හු යමක් නොකළහොත් කෙසේ නමුත් මියයනු නියතය. එමනිසා කළ නොහැකි දෙය වෙතට ඔව්හු යොමු වූහ. දෙවියන්වහන්සේ සිරියවරුන්හට මහත් සේනාවක් ඔවුන් වෙතට එන්නාක් මෙන් මහ හඬක් ඇසෙන්නට සැළසූ සේක. ඔව්හු තම වස්තුව අතහැර පලාගියහ ( 7:3-7 පද)' කළ නොහැකි කාරණා දෙසට ඔබ යොමු වන විට, දෙවියන්වහන්සේ ඔබ උදෙසා ක්‍රියා කරනසේක.

2. අනෙකුත් ඇදහිලිවතුන් සමග බෙදා ගන්න: කුෂ්ඨ රෝගීහු සතුරාගේ පරාජය පිළිබඳ යහපත් ආරංචිය අන් අය සමග බෙදාගත්හ( 7:8-10). ඔබට කිසිවක් නොකළ හැකි අවස්ථාවලදී දෙවියන්වහන්සේ මැදිහත් වී කාරණා ඉටු කර දුන් ආකාරයද පිළිබද අන් අය සමග බෙදා ගැනීමේ වගකීම ඔබ සතුය. මෙයින් අන් ඇදහිලිවන්තයෝ දිරිගනු ඇත.

3. දෙවියන්වහන්සේගේ අධි ස්වභාවික බලය පිළිබඳව උපහාසයෙන් නොසිතන්න: එක් නායකයෙකු දෙවියන්වහන්සේගේ අධි ස්වාභාවික බලය පිළිබඳව උපහාසයෙන් සිතා විශ්වාස නොකළ බැවින් ඔහුට දේව ආශිර්වාදය භුක්ති විදීමට නොහැකි විය. (7:2, 17-20)

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 රාජාවලිය 17
- සටන් බිම : සමාරිය
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙල් සහ අෂුර්වරුන්
- සටනට හේතු : ඉශ්‍රායෙල්හි රජ හෝශෙයා අවුරුදු පතා අෂුර්හි රජුට බදු ගෙවීමට තිබු නමුත් එය නවතා දැමීය. එබැවින් අෂුර්වරුන් ඉශ්‍රායෙල්ට පහර දුනි.
- උපක්‍රම :

1. කා¾යක්‍ෂම සටන් කිරීමක් සදහා නමස්කාරය ප්‍රධාන අංගයකි: ඉශ්‍රායෙල් දෙවියන්වහන්සේට නමස්කාර කිරීම නවතා දැමු කල, දෙවියන්වහන්සේ ඔවුන්ව අෂුර් වරුන්ගේ අතට පාවාදුන් සේක. නමස්කාරය ආත්මික සටන් කලාවේ ඉහලම විශේෂාංගයයි (යෝබ් 1 සහ 2 බලන්න). ඔබ නමස්කාර කිරීමට අසමත් වුවහොත්, ඉතා ඉක්මනින් සතුරාගේ අත් අඩංගුවට පත් වනු ඇත.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 රාජාවලිය 19
- සටන් බිම : යෙරුසලම
- ප්‍රතිවිරුද්ධ බලවේග : අෂුර්වරුන් සහ ඉශ්‍රායෙලය
- සටනට හේතු : ඉශ්‍රායෙල්හි රජ වු හෙසෙකියා දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කළේය. රූප නමස්කාරය තුරන් කිරීමට උත්සහ කළේය. ඔහුගේ රාජ්‍යයේ ආරක්‍ෂාව තහවුරු කරන පිණිස ඔහු අෂුර්හි රජුට කප්පම් ගෙවිය. ඒ අතර ඔහුට තර්ජනාත්මක ලිපියක් ලැබුණි.
- උපක්‍රම :

1. සතුරාගේ තර්ජන වලට භය නොවන්න: හෙසකියා රජ සතුරාගේ තර්ජන දෙවියන්වහන්සේ වෙතට රැගෙන ගියේය. දෙවියන්වහන්සේ ඔහුට පවසා සිටියේ භය වීමට කාරණයක් නොමැති බවත් සතුරා දේශයෙන් පහකර දමන බවත්ය' දෙවියන්වහන්සේ අෂුර්වරුන් පරාජය කළ ලෙසම සාතන්ව ද පරාජය කොට ඇත. එනිසා සාතන්ගේ තර්ජනවලට ඔබ බිය විය යුතු නොවේ.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 රාජාවලිය 24: 1-25:30
- සටන් බිම : යෙරුසලම
- ප්‍රතිවිරුද්ධ බලවේග : යුදාව සහ බබිලෝනිය
- සටනට හේතු : යුදාවරුන් දෙවියන්වහන්සේගේ ඇස් හමුවෙහි නපුරුව තිබු දේ දිගින් දිගටම කළහ. අවසාන වශයෙන් දෙවියන්වහන්සේ එවකට ලෝක බලවතුන් වු බබිලෝනියන් හට දෙවියන්වහන්සේගේ සෙනගව වහලුන් ලෙස ගෙන යාමට ඉඩ හල සේක. යෙරුසලම ගිනි ලා එහි පවුරු කඩා බිඳ දමන ලදී.
- උපක්‍රම :

1. පාපය වහල්භාවය ගෙන දෙන බව වටහාගන්න' දෙවියන්වහන්සේගේ ජනතාව වහල්භාවයට පත් වුයේ ඔව්හු දිගටම පව් කිරීමටත්, පාපොච්චාරණය නොකළ පාප

සහිතව ජීවත්වීමටත් පුරුදුවූ බැවිනි. සතුරා පරාජය කිරීම සඳහා දෙවියන්වහන්සේ ඔවුන්ව පාවිච්චි කිරීමට ඉඩ දෙනු වෙනුවට සතුරා ඔවුන්ව ග්‍රහණයට හසුකරගත්තේය.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 1 ලේකම් 14:8-17
- සටන් බිම : රෙපායිම් මිටියාවත සහ බාල්-පෙරාශිම්
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙල් සහ පිලිස්තවරු
- සටනට හේතු : දාවිත් එක්සත් වු ඉශ්‍රායෙල් හි රජ බවට පත්වීම, පිලිස්තිවරුන් හට නොසලකා සිටිය හැකි තර්ජනයක් නොවීය. එබැවින් ඉතා ඉක්මනින් දාවිත්ට විරුද්ධව සටන් ඇරඹුවෝය.
- උපක්‍රම :

1. තිරණාත්මක ජයග්‍රහණයක් ලැබෙන තෙක් රැඳී සිටින්න: දාවිත් සහ ඔහුගේ සේනාව පලමුවන සටන ජය ගත් නමුත් දේශය මුළුමනින්ම අල්ලා ගැනීමට නොහැකි වූ බැවින් (9-13 පද) එය තිරණාත්මක සටනක් නොවීය. දෙවෙනි සටනේදී දෙවියන්වහන්සේ ඔවුන්ට තිරණාත්මක ජයක් දුන් සේක. ඔව්හු පිලිස්තිවරුන් ඉශ්‍රායෙල් දේශ සීමාවෙන් පන්නා දැමූහ (13-17 පද).

2. සුදුසු කාලය තෙක් ඉවසා සිටින්න: කාර්යක්ෂම යුදධ කිරීමකදී නියමිත කාලයට ක්‍රියාත්මක වීම මූලික රහසකි. දෙවියන්වහන්සේ පොරොන්දු වූ පරිදි තමාට පෙරටුව ගොස් ඇති බව නිසැක වන තුරු දාවිත් ඉවසීමෙන් බලා සිටියේය (14-16 පද). නියමිත කාලය නම් මෙම වැදගත් මූලධර්ම මත බොහෝ සටන් ජය ගැනීම හෝ පරාජය වීම රැඳී පවතී.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 ලේකම් 12
- සටන් බිම : යෙරුසලම
- ප්‍රතිවිරුද්ධ බලවේග : රෙහොබෝවම් නම් යුදාහි රජුට එරෙහිව මිසරය සහ මිත්‍ර පාක්ෂිකයන්
- සටනට හේතු : රෙහෙබෝවම් දෙවියන්වහන්සේට අවිශ්වාසවන්ත වූ අතර කානානිවරුන්ගේ පාපිෂ්ඨ පුරුදු ලෙස ක්‍රියා කළේය. දෙවියන්වහන්සේගෙන් විනිශ්චයක් ලෙසට මිසරයේ ෂීෂක් රජට ඔහුව අල්ලා ගැනීමට ඉඩදුන්සේක.
- උපක්‍රම :

1. ආත්මික සුදානම් වන්න. ජයග්‍රහණය සඳහා ආත්මිකව සුදානම්වීම වැදගත්ය: "රෙහොබෝවම් ස්වාමින්වහන්සේ සෙවීමට තමාගේ සිත යොමු නොකළ " බැවින් (14 පදය) රෙහොබෝවම් නපුරුකම් කළේය. ඔබ සටන් බිමට පැමිනීමට පෙර දෙවියන්වහන්සේ සෙවීමට ඔබගේ සිත සුදානම් කරගන්න.

2. ඔබම යටහත් වන්න. රෙහොබෝවම් යටත් වූ කල දෙවියන්වහන්සේ ඔහුට " යම් පමණක ගැළවීමක් " සපයා දුන්සේක. ඔහුව මුළුමනින්ම විනාශ වීමට ඉඩ නුදුන් සේක ( 5-7 පද )

3. දෙවියන්වහන්සේගේ සේවයට යටත් වන්න :දෙවියන්වහන්සේ සමාව දෙන නමුත් අකිකරු කමෙහි ප්‍රතිඵල පවතී (8 පදය). ලෝකය අපේක්ෂාකරන සේවාව හා සසඳන කල දෙවියන්වහන්සේට භාරවීම කෙතරම් යහපත්ද. මතෙව් 11: 28-30 බලන්න.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 ලේකම් 18

- සටන් බිම : රාමොත්-ගිලියද්
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙල්හි රජ ආහබ් සහ යුදයේ රජ යෙහෝෂාපාට්ට විරුද්ධව සිරියවරුන්
- සටනට හේතු :යෙහෝෂාපාට් රජ ආහබ් රජ සමග එකතුවී සිරියවරුන්ට එරෙහිව සටන් කි×ම
- උපක්‍රම :

1. අශුදධ වූ පක්ෂපාතිකම් ඇති කර නොගන්න : යුදා සහ ඉශ්‍රායෙල් අතර අවුරු¥ 65 ක සතුරුකමකින් පසුව යෙහෝෂාපාට් ආහබ් රජ සමග මිත්‍රකමක් ඇරඹීය. මීට ඔහුගේ පුත්‍රයා ආහබ්ගේ දියණිය සරණපාවා ගැනීමද ඇතුලත් විය. මෙම අශුද්ධවූ මිත්‍රත්වය නිසා අන්‍යභක්තිකයන්ගේ දුෂ්ඨකම ඒ සමග පිවිසීම හේතුවෙන් පෞද්ගලිකව යෙහෝෂාපාට් ට මෙන්ම යුදා හට ද ඉතා බේදජනක තත්වයක් ගෙනදුනි. ¥ෂ්ටයන් සමග මිත්‍රත්වය කිසිවිටෙක සුබවාදී ආත්මික ප්‍රතිඵල ගෙන නොදෙයි.

2. උපදෙස් ලබාගැනීමෙහිදී විමසීම භාවිතා කරන්න: ආහබ් සටනට පිටත්ව යාමට පෙර දෙවියන්වහන්සේගෙන් වචනයක් ගෙන ඒම පිණිස ඔහුගේ ප්‍රොපේතවරු කැඳවීය. නමුත් වෘත්තිමය වූ මෙම ප්‍රොපේතවරු ආහබ් රජ ඇසීමට පි%යවූ කාරණා පැවසීමට කැමති වුහ' තමාගේ යැපීම සඳහා ආහබ් රජ කෙරෙහි නො/දුනු ප්‍රොපේතවරයෙකු කැඳවන ලෙස යෙහෝෂාපාට් තදින්ම ඉල්ලා සිටියේය. දෙවියන්වහන්සේගෙන් අනාගතවාක්‍යය පැවසූ මිකායා සොයා ආහබ් පණිවුඩකරුවන් යැවීය ( 1-16 පදය ) ආත්මික උපදේශනය සෙවීමේදී විමසිලිමත් බව භාවිතාකල යුතුය. බහුතරයක් එක් පක්ෂයක සිටිමින් එකගවීම සැමවිටම දේව කැමැත්ත තහවුරු කිරීමක් නොවේ.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 ලේකම් 20
- සටන් බිම : බෙරාකා මිටියාවත.
- ප්‍රතිවිරුද්ධ බලවේග : මෝවම්වරු, අම්මොන්වරු, සේයිර් කදුකරයේ ජනතාව යුදාහි රජවූ යෙහෝෂාපාට් රජට එරෙහිව
- සටනට හේතු : යුදාරටට එරෙහිව ජාතීන් කිහිපයක් එකතුව කුමන්ත්‍රණය කළහ.
- උපක්‍රම :

1. නිරාහාරව සිටීමේ උපක්‍රමය භාවිතා කරන්න : යෙහෝෂාපාට් මු¨ යුදය පුරා නිරාහාරයක් ප්‍රකාශ කළේය( 3 පදය ). දෙවියන්වහන්සේ ඔබ සමග ගණුදෙනුකරනුයේ එතුමා සමග ඔබට ඇති සම්බන්දතාව පදනම් කරගෙනය. නිරාහාරය මගින් දෙවියන්වහන්සේ වෙනස් නොවේ, වෙනසවන්නේ ඔබ වේ' එය ඔබ එතුමා සමග පවතින සම්බන්දතාවය හ×ගස්වා ඔබ කෙරෙහි එතුමාගේ ප්‍රතිචාරයට බලපෑමක් ඇතිකරවයි. යෝනා 3 පරිච්ජේදය බලන්න.

2. ඔබගේ දෑස ස්වාමින්වහන්සේ කෙරෙහි රඳවා තබන්න: යෙහෝෂාපාට් යාච්ඤ කරමින් “ අපි මක්කරමුද කියාත් නොදනිමුව. නමුත් අපේ ඇස් ඔබ දෙසම යොමුකර තිබේ ” යයි කීවේය ( 12 පදය )

3. උත්සාහ කිරීමට වඩා විශ්වාස කිරීම යහපත් බව මතක තබා ගන්න: දෙවියන්වහන්සේගෙන් යෙහෝෂාපාට්ට ලැබූ පිලිතුර වුයේ “ සටන ඔබගේ නොව ස්වාමින්වහන්සේගේය ”( 15 පදය ) යනුවෙනි. දෙවියන්වහන්සේට පමණක් අවශ්‍ය කාරණාව ඉටුකළ හැකිව තිබියදී, එතුමා කෙරෙහි විශ්වාසය රැදවීම, ස්වයං-උත්සාහයෙන් වෙර දැරීමට වඩා යහපත්ය.

4. සටන මධ්‍යයෙහි ප්‍රීතිමත් වන්න: හමුදාව ඉදිරියට යාමට පෙරටුවෙන් ගමන් කිරීමට ගායනා කරුවන් පත් කරන ලදි. දෙවියන්වහන්සේ සතුරාට එරෙහිව සැගවී පහරදීමක් සූදානම් කොට තබා පරාජය කළසේක.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 ලේකම් 25: 5-16
- සටන් බිම : ලුණු මිටියාවත
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඒදොම්වරු සහ අමශියා නම් යුදයේ රජ
- සටනට හේතු :අමශියා රජ ඒදොම් අන්‍ය ජාතිකයන්ට එරෙහිව යුද්ධ කළේය.
- උපක්‍රම :

1. දේවභක්තික උපදෙස් අනුගමනය කරන්න: අමශියා රජ තම සේනාව ශක්තිමත් කිරීම සඳහා ඉශ්‍රායෙල්වරුන්ගෙන් කුලි හේවායන් ලබාගත්තේය. මෙය දෙවියන්වහන්සේට අප%සන්න වූ නිසා උන්වහන්සේගේ ප්‍රොපේතවරයෙකු ලවා අමශියාට දන්වා සිටියේ ඉශ්‍රායෙල්වරු නැවත පිටත්කර හැරීම හෝ පරාජය ඔහු සතු බවය. අමශියා දේව භක්තික උපදේශය පිළිගත් බැවින් ජයග්‍රහණය ඔහු සතුවිය.

2. සියළු පිළිම විනාශ කරන්න: අමශියා ඒදොම්වරුවරුන්ගේ රූපවලට නමස්කාර කිරීමට ඇරඹීය ( 14 පදය )' කායිකෂම ආත්මික සටන ඔබගේ ජීවිතයෙහි ඇති සියළු පිළිම, එනම් ගල්, ලී හෝ භෞමික වස්තුව යන සියළු රූප නමස්කාර ක්‍රම විනාශ කර දමයි.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 ලේකම් 25: 17-24
- සටන් බිම : යුදයේ බෙත්-ෂෙමෙෂ්
- ප්‍රතිවිරුද්ධ බලවේග : ඉශ්‍රායෙලහි රජ වූ යෝවාෂ් යුදාහී රජ වූ අමශියාට එරෙහිව
- සටනට හේතු : අමශියා රජ ඒදොම්වරුවරුන්ගෙන් ලැබූ ජය ඔහුව අහංකාරයට පත් කළ බැවින් ඔහු ඉශ්‍රායෙල්ට සටනට අභියෝග කළේය.
- උපක්‍රම :

1. උඩගුකම පරාජය ගෙනදෙයි :අමශියා පෙර ලද ජයග්‍රහණයෙන් දැඩිසේ උඩගුවී සිටියේය. මෙය ඔහුව ඉශ්‍රායෙල්ට අභියෝගකිරීමට පෙළඹවීය(17-19). හිතෝපදේශ 16:5 බලන්න.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 ලේකම් 28
- සටන් බිම : යෙරුසලම
- ප්‍රතිවිරුද්ධ බලවේග : යුදයට එරෙහිව ආක්‍රමණශිලි සිරිය හමුදාව, ඉශ්‍රායෙල්, ඒදොම්, පිලිස්තින සහ අෂුරියානු හමුදා
- සටනට හේතු : සිරියානු ,ඉශ්‍රායෙල්, ඒදොම්, පිලිස්තින හා අෂුරියානු හමුදා'' යුදය ආක්‍රමණය කළහ.
- උපක්‍රම :

1. ලෞකික දුෂ්‍යකම ආත්මික ගරා වැටීම ගෙන දෙයි: ආහාස් රජ විජාතික දෙවිවරු නමස්කාර කරමින් ඔව්හු තමාට ශක්තිය සපයාවි යැයි සිතුවේය. නමුත් විජාතික දෙවිවරු ඔහුව විනාශ කළේය ( 23 පදය ). ලෝකයේ දුෂ්‍ය බලපෑම් හේතුවෙන් ආත්මික ගරාවැටීම් සිදුවේ.

2. අති දක්ෂ ශක්තිමත් මිනිසුන් පවා දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කළ විට ඇඳ වැටෙනු ඇත: 6 වෙනි පදය බලන්න.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 ලේකම් 32: 1-23 , සහ 11 රාජාවලිය 19
- සටන් බිම : යෙරුසලම
- ප්‍රතිවිරුද්ධ බලවේග : අෂූර්හි රජ වූ සෙනෙකෙරිබ් සහ යුදාහි රජ වූ හෙසෙකියා
- සටනට හේතු : අෂූර්හි රජ යුදය ආක්‍රමණය කරමින් පවුරු සහිත නුවර වටලා සිටියේය.
- උපක්‍රම :

1. සතුරාගේ සැපයුම් පද්ධතිය කපා දමන්න : හෙසකියාගේ උපක්‍රමය වුයේ අෂූර් වරුන් සඳහා ඇති ජල සැපයුම කපා හැරීමත් නුවර වටා පවුරු ගොඩ නැගීමත්ය (3,5 පද). සතුරාට සැපයුම් ලබාදෙන ප්‍රධාන පද්ධතියක් නම් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ බෙදුම් පැවතිමය. අපි සභාවේ අනෙකුත් ඇදහිලිවන්තයන් පිළිබඳව අපගේ දිව වැරදි අයුරින් භාවිතා කිරීමේදී සතුරාට වෙඩි බෙහෙත් සපයා දී ඔහුව සන්නද්ධ කරමු. එබැවින් අනෙකුත් ඇදහිලිවතුන්ව විවේචනය කිරීම හා ඔවුන් පිළිබද ඕපාදූප දෙඩවීම වෙනුවට අපි ඔවුන් වටා ආරක්‍ෂක පවුරු ගොඩ නගමු.

* * *

- ශුද්ධ ලියවිලි යොමුව : 11 ලේකම් 35: 20-24
- සටන් බිම : මෙගිද්දෝ මිටියාවත
- ප්‍රතිවිරුද්ධ බලවේග : මිසරයේ රජ වූ නෙකෝ සහ යුදයේ රජ වූ යොෂියා
- සටනට හේතු : මිසරයේ රජහට පලස්තිනය හරහා ගොස් බබිලෝනියෙහි නෙබුකද්නෙෂර් රජ යුදධ කිරීමට අවශ්‍ය විය. නමුත් යොෂියා රජ ඔවුනට යාමට ඉඩ නොදීය.
- උපක්‍රම :

1. රැවටීම දුරුකරන්න : නෙකෝ කී දෙවියන්වහන්සේගේ වචනය " (22 පදය) පරිදි ඉරණම වෙනස් කරගතහැකියැයි සිතා ආරක්ෂාව සඳහා යොෂියා රජ වෙස් මාරු කරගෙන සටනට ගියේය. ආත්මික සටන්වලදී රැවටීම කාර්යක්‍ෂම නොවන්නේ සාතන් රැවටීමේ ප්‍රධානියාව සිටින බැවිනි.

2. දෙවියන්වහන්සේ කතාකරන විට සවන් දෙන්න : යොෂියා පෙර කලක දෙවියන්වහන්සේ සමග නිවැරදි සම්බන්දතාවයක් දැරීය. ඔහුගේ යහපත් ක්‍රියාවන් 26 පදයෙහි සටහන් කර තිබේ. ඔහු දෙවියන්වහන්සේගේ හඬ දැන සිටියේය. නමුත් මේ අවස්ථාවෙහි ඔහු ඊට සවන් නොදුනි.

* * *

දැන් ඔබගේ වාරයයි

ඔබගේ ආත්මික සටන් පිළිබඳව ඓතිහාසික වාර්තාවක් තබන්න. සටන කුමන කාරණයක් සම්බන්ධයෙන්ද, සාතන් ඔබට පහර දීමට යෙදු උපක්‍රම, ජයගැනීම සඳහා ඔබ භාවිතා කළ ප්‍රති ප්‍රහාර උපක්‍රම යනාදිය සටහන් කරන්න.

# පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය

1. මක්නිසාද අපේ පොරබැදීම වනාහි මාංසයට හා රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ඨකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය.(එපීස 6:12)

2. සියළුම දෑ ප්‍රධාන වශයෙන් ස්වාභාවික හෝ ආත්මික ලෙස වෙන් කෙරේ. 1 කොරින්ති 15: 44-49 බලන්න.

3. සාතන්ගේ රාජ්‍යය සහ දෙවියන්වහන්සේගේ රාජ්‍යය.

4. සාතන්, යක්ෂයින්, ලෝකය සහ මාංශය.

5. පියවූ දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේ සහ දේව දූතයෝ

6. "රජතුමා" යන පදයෙහි අරුත නම් කිසියම් දේශ සීමාවක් තුල හෝ ජාතියක ස්වෛරී පාලකයාය.

7. රාජ්‍යයක් යනු රජෙකු විසින් පාලනය කරන්නා වු දේශයක් හා ජාතියක්ය.

8. ආත්මික සටන යනු අදෘෂ්‍යමාන ආත්මික සටනක් විශ්ලේශණය කිරීම හෝ එවැනි සටනක් තුළි ක්‍රියාකාරීවීමය. මේ සඳහා දුෂ්ඨ හා යහපත්, ප්‍රතිවිරුද්ධ බලවේග සාතන් ගේ ශිල්පීය උපක්‍රම, සහ සතුරා පරාජය කිරීම සඳහා ආත්මික උපක්‍රම අධ්‍යනය ඇතුලත් වේ. ආත්මික සටනෙහිදී ඉහත කරුණු විශ්ලේෂනය කර බැලීමට ඔබ්බෙන් ගොස් ජීවිතයෙහිත් සේවයහිත් එම උපක්‍රම සැබවින්ම ක්‍රියාකාරී ලෙස භාවිතා කිරීම අදාල කරගැනීම සිදු කරනු ඇත.

9. මෙම මහත් ආත්මික ගැටුමට හේතුව වනුයේ සාතන් තවමත් උත්තරීතර පාලකයා වීමට උවමනාවෙන් ක්‍රියා කිරීමය. මනුෂ්‍යයාගේ හදවත, මනස, ආත්මය හා ප්‍රාණය ඩැහැ ගැනීමට සාතන් දැඩි සටනක නිරතව් සිටී. ඔහුගේ උපක්‍රම යොමුවී ඇත්තේ දෙවියන්වහන්සේ කෙරෙහිත් එතුමාගේ සැලැස්මවල් හා ජනතාව කෙරෙහිත්ය.

10. ජීවිතයෙහි සියළුම සටන් ශාරීරික වුවද ආත්මික වුවද හැඟීම් වල වුවද, මානසික වුවද ආර්ථික වුවද මිනිස් පෞද්ගලිකත්වයන් පිළිබඳව වුවද එය ආත්මික කාරණාවක, බාහිර නිරූපනයක් පමණක් බව අප හඳුනාගත යුතය. ස්වාභාවික ලෝකයෙහි එදිනෙදා ජීවිතයෙහි වාතාවරණ අනුව මේවා සිදුවූවාක් මෙන් පෙනුනද මෙම ස්වාභාවික සටන්වල පදනම ඇත්තේ ආත්මික ලොවෙහිය.

## දෙවන පරිච්ඡේදය

1. පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් පසුතැවිලි වීමට කැඳවන්ට මම නාවෙමියි කීසේක.(ලූක් 5:32)

2. පසුතැවිලි වීම නම් " අභ්‍යන්තර තීරණයක් හෝ මනසේ වෙනසක් වන අතර එහි ප්‍රතිඵලය වන්නේ පාපයෙන් දෙවියන්වහන්සේ හා ධර්මිෂ්ඨකම වෙතට හැරෙන බාහිර ක්‍රියාවකි "

3. මෙම විෂය පිළිබඳ දෙවන පරිච්ඡේදයෙහි ඇතුලත් සාකච්ජාව පුනරීක්ෂණය කරන්න.

4. ඔබ පාපයට සමාව ඉල්ලා සිටින කල ඔබ "හැරීමක්" අත් දකියි. හැරීම යනු " වෙනතකට යාම "වේ. බයිබලිය පසුතැවීම හා සම්බන්දව මෙය සලකා බලන කල එහි අරුත වනුයේ " වැරදි මාර්ගයෙන් හැරී නිවැරදි මාර්ගය වෙතට යාමය ". ඔබ සාතන්ගේ රාජධානිය අත්හැර දමා දෙවියන්වහන්සේ ගේ රාජධානියට සම්බන්දවේ.

5. දෙවන පරිච්ඡේදයෙහි මෙම මාතෘකාව හා සම්බන්දව සාකච්ජාව පුනරීක්ෂණය කරන්න.
6. ඔබ පාපය පිළිබඳ පසුතැවිලි වී , ඔබගේ පාපිෂ්ඨ පාර්ගයෙන් හැරීමට තීරණය කළ විට එමගින් දෙවියන්වහන්සේත් ඔබත් අතර නිවැරදි සම්බන්දතාවයක් ගොඩ නැගේ. මෙම නිවැරදි සම්බන්දතාවය හෝ දෙවියන්වහන්සේ ඉදිරියෙහි දැහැමි ලෙස නැගී සිටීම " ධර්මිෂ්ඨකරනු ලැබීම " ලෙස නම් කරයි.

7. ඔබ පසුතැවිලිවීම හා හැරීම හේතුකොට ගෙන ධර්මිෂ්ඨ කරනු ලැබූ කල ඔබ පාපයේ ජීවිතයකින් හා පාපයේ දඩුවමින්ද "ගැලවීම " ලබනු ඇත. "ගැලවීම ලැබීම " යනු මෙයයි. බයිබලය ගැලවීම ලද ලෙසට හඳුන්වනුයේ මෙම සිදුවීමය.

8. තරුණයෙක් තමාගේ පාපිෂ්ඨ තත්වය වටහාගත් කල ඔහු තම පියා වෙත ගොස් පාපයට පසුතැවිලිවීමට තීරණය කළේය. මෙය පසුතැවිලිවීමේ නිදර්ශනයක් වේ. එනම් අභ්‍යන්තරයෙන් ගත් තීරණය බාහිරයෙන් ක්‍රියාත්මක කිරීමකි. ඉන්පසු ඔහු තම පැරණි ජීවිතය අත්හැර අළුත් ජීවිතයක් ආරම්භ කිරීමට පියා වෙතට හැරී ගියේය. මෙය හැරීම ලැබීමය.

## තුන්වන පරිච්ඡේදය

1. එම්බා, ඉශ්‍රායෙල්,අසාපන්න. අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ එකම ස්වාමීන්වහන්සේය.(ද්විතිය කතාව 6:4)

2. පියවූ දෙවියන්වහන්සේ , යේසුස් ක්‍රිස්තුස්වහන්සේ , ශුද්ධාත්මයාණන්වහන්සේ සහ දේව දූතයන්.

3. පියවූ දෙවියන්වහන්සේ, පුත්‍රවූ දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වූ දෙවියන්වහන්සේ

4. දුෂ්ඨවූ ආත්මික බලවේග සමග යුද්ධ වදින යහපත් ආත්මික බලවේගවල ප්‍රධාන අණ දෙන නිලධාරී තැන පියවූ දෙවියන්වහන්සේය. ආත්මික සටන් තලයේ උන්වහන්සේගේ විශේෂ කාර්යය මෙය වේ.

5. ආත්මික සටන්වලදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ක්‍රියාකාරීත්වය පහත සඳහන් අයුරිනි.

   මනුෂ්‍ය සංහතිය පාපයෙන් මුදාගැනීම : සතුරා විසින් අපව පාපය නැමැති වහල් බැම්මෙන් බැඳ සිරකරගෙන සිටි අතර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය හේතුකොටගෙන අපි නිදහස් කරනු ලැබ සිටිමු. නපුරු බලවේග වලට එරෙහිව ඇති ආධිපත්‍ය බලය: යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය මිනිස් සංහතිය පාපයෙන් මුදවාගන්නා පමණක් නොව , දුෂ්ඨ බලවේගවලින් ජයග්‍රාහිව නැගී සිටීමට ක්‍රියාකාරී විය. මේ නිසා ඔබ හට සතුරාට එරෙහිව ආධිපත්‍ය බලය පවතී. යක්ෂයාගේ ක්‍රියා විනාශ කිරීම: උන්වහන්සේ මිනිසත් බව ගෙන මෙලොවට පැමිණීමට එක් හේතුවක් වුයේද මෙය වේ. ඇඳහිලිවතුන් උදෙසා මැදිහත් කාරකම් කිරීම: මිහිපිට ආත්මික යුදධවල නිරතව සිටින ඇඳහිලිවතුන් උදෙසා ස්වර්ගයෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්වහන්සේ දකුණු පස සිට මැදහත්කාරකම් කරන සේක.

6. ශුද්ධාත්මයාණන්වහන්සේ ඇඳහිලිවතන්ගේ සටන් කිරීමට මගපෙන්වීම සපයන සේක. ස්වාභාවිකව දැනගත නොහැකි කාරණා උන්වහන්සේ එළිදරව් කර දෙන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ අපහට දෙවියන්වහන්සේ කැමැත්ත හා ක්‍රියාවන් කියා දෙන සේක. එසේම ආත්මික සටනෙහි යෙදී සිටින ඇඳහිලිවතුන් උදෙසා උන්වහන්සේ මැදහත්කාරකම් කරන සේක. උන්වහන්සේ ඇඳහිලිවන්තයා හට ශුද්ධාත්ම බව්තීස්මය තුලින් බලය සපයා දී ආත්මික ඵල සහ දීමනාවලින් ඔහුව සන්නද්ධ කරන සේක.

7.

| | |
|---|---|
| 1 h | 7 c |
| 2 d | 8 a |
| 3 b | 9 f |

| | |
|---|---|
| 4 g | 10 e |
| 5 l | 11 j |
| 6 i | 12 k |

8. සේනාවල ස්වාමීන්වහන්සේ.

## හතරවන පරිච්ඡේදය

1. ස්වාමීන්ගේ දූතයා උන්වහන්සේට භය ඇත්තන් හාත්පස කඳවුරු බැඳ ඔවුන් මුදාහරියි. (ගීතාවලිය 34:7 )

2. ස්වර්ගය සහ පොළොව

3. දෙවියන්වහන්සේ විසින් ඔවුන්ව මවන ලදි

4. මෙම පරිච්ඡේදයෙහි සඳහන් දේව දූතයන්ගේ විවිධ සේවාවන් අධ්‍යනය කරන්න.

5. මෙම පරිච්ඡේදයෙහි සඳහන් දේව දූතයන්ගේ උපලක්ෂන අධ්‍යයනය කරන්න.

6. හෙබ්‍රෙව් 1:14

7. සත්‍යයකි, 2 කොලොස්සි 2:18 සහ එළිදරව් 22:8-9 බලන්න.

8. අසත්‍යයකි. ගලාති 1:8 බලන්න.

9. තෝරා ගත් දේව දූතයන්
   පණිවුඩකරුවන්
   කෙරුබ්වරුන්
   ජීවමාන සත්වයින්
   සෙරප්වරු

10. යහපත සහ නපුර

11. කොලොස්සි 1:16

## පස්වන පරිච්ඡේදය

1. සිහි ඇතිව, අවදිව ඉඳිල්ලා, නුඹලාගේ විරුද්ධකාරයා වූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහ්යි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය.(1 පේතෘස් 5:8 )

2. සාතන් මුලාම්බරයේදී දේවදූතයෙක් ලෙසට දෙවියන්වහන්සේ මැවූ සේක.

3. සාතන්ගේ මුල් ස්වභාවයෙහිදී ඔහු ආලේපලත් කෙරුබ්වරයෙකු වූ අතර ඔහුගේ නම ලුසිෆර් විය.

4. සාතන් තමාගේ මූලික තත්වයෙන් වැටීමට හේතුවූයේ “ මම වෙමි ” යන ලෙසට කළාවූ ප්‍රකාශ පහක් මගින් විදහා දැක්වූ ඔහු තුල වූ අහංකාරත්වය හා කැරලි කාරකමය.

5. පස්වන පරිච්ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි එහි ප්‍රතිඵල බලන්න.

6. සාතන්ගේ ක්‍රියාකාරකම් ක්ෂෙත්‍රය ස්වර්ගයෙහිද මිහිපිටද සිදුවේ.

7. සාතන්ගේ පොදු ක්‍රියාකාරම් සැමවිටම දෙවියන්වහන්සේට , එතුමාගේ සැලැස්මට , එතුමාගේ ජනතාවට ,ඔවුන්ගේ නමස්කාරයට, දේවවචනයට, ඔවුන්ගේ සේවයන්ට, හා ඔවුන්ගේ හැසිරීමට එරෙහිව යොමුව වී තිබේ.

8. 5 වෙනි පරිච්ඡේදයෙහි සපයා ඇති ලේඛණය අධ්‍යනය කරන්න.

## හයවන පරිච්ඡේදය

1. එහෙත් පසු කාලවලදී සමහරු මුළා කරවන ආත්මයන්ද යක්ෂයන්ගේ ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලිලෙස කියනසේක. (1 තිමෝති 4:1 )

2. දෙවියන්වහන්සේ ඔවුන්ව මැවූ සේක.

3. ඔවුන්ගේ ක්‍රියාකාරකම මිහි පිටය.

4. සාතන් මෙන්ම ඔවුන්ගේ ක්‍රියාකාරකම්ද දෙවියන්වහන්සේට, එතුමාගේ සැලැස්මට හා එතුමාගේ ජනතාවට එරෙහිව යොමුවී පවතී.

5. හයවන පරිච්ඡේදයෙහි සඳහන් උපලක්ෂන ලේඛණය බලන්න.

6. හයවන පරිච්ඡේදයේ සඳහන් සාකච්ඡාව බලන්න.

7. ඔවුහු මුලාරම්භයේදී ස්වර්ගයෙහි දේවදූතයෝ වූහ.

8. ඔව්හු සාතන්ගේ කැරලිකාරකම සමග සහභාගි වූහ. එහි ප්‍රතිඵලය ලෙස ස්වර්ගයෙන් නෙරපනු ලැබූහ. එවක් පටන් ඔව්හු තව දුරටත් යහපත් ආත්මික පිවින් (දේව දූතයන්) නොව දුෂ්ඨ වූහ (යක්ෂයින්).

9. මෙම මාතෘකාව පිළිබඳ හයවන පරිච්ඡේදයෙහි සාකච්ජාව බලන්න.

## හත්වන පරිච්ඡේදය

1. ලෝකයටවත් ලෝකයේ තිබෙන දේවලටවත් ප්‍රේම නොකරල්ලා. යමෙක් ලෝකයට ප්‍රේමකෙරේ නම්, පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල ,එනම් මාංසයේ තෘෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ.( 1 යොහාන් 2:15-16)

2. මෙහිදී " මාංශය" ලෙසට නිරූපණය කෙරෙනුයේ සියළු මනුෂ්‍යයන් තුල පවතින පාපිෂ්ඨ ස්වාභාවයටය. එය දෙවියන වහන්සේට එරෙහිව එතුමාට අකීකරු වී මුරණ්ඩු වීම මගින් පෙන්නුම් වේ.

3. මෙහිදී "ලෝකය" ලෙසට සඳහන් වනුයේ දෙවියන්වහන්සේට එරෙහිවන්නාවූ දෑනට පවතින ලෝක පද්ධතිය පිළිබඳවය.

4. සාතන්.

5. ඔබගේ සාරංශය හත්වන පරිච්ඡේදයෙහි සඳහන් සාකච්ජාව හා සංසන්දනය කර බලන්න.

6. පාපය.

7. ලෝකය ඇදහිලිවතුන්ට ද්වේශ කරයි.

8. තෘෂ්ණාව නම් දැඩි ආශාව, ප්‍රාණයෙහි බලවත් හැඟීම්ය. දුෂ්ට දෙය කෙරෙහි මිනිසා තුළ පවතින ස්වභාවික ලැදියාවය. අපගේ මාංසික ස්වභාවය ප්‍රසන්න කරන පිණිස දුෂ්ට දේ කෙරෙහි ආශාවීම "මාංශික තෘෂ්ණාව" වේ.

9. සාතන් ලෝකයෙහි පරිසරය, අපගේ මාංශික තෘෂ්ණාවන් උද්දීපනය කිරීමටත් අපගේ පංචේන්ද්‍රියනට ආසාවන ලෙසත් සලස්වා මාංශයේ තෘෂ්ණාවට ආශාවක් ඇති කරවයි.

10. තෘෂ්ණාව පරික්ෂාවට යොමු කරයි, පරීක්ෂාව පාපයට යොමු කරයි, පාපය මරණයට යොමුකරයි.

11. ගලාති 5:19-21

## අටවන පරිච්ඡේදය

1. සිහි ඇතිව, අවදිව ඉන්න, නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. ලෝකයෙහි සිටින නුඹලාගේ සහෝදරයන් කෙරෙහි එම දුක්ම පැමිණෙන බව දැන, නුඹලාගේ ඇදහිල්ලෙහි ස්ථිරව සිට, යක්ෂයාට විරුද්ධව සිටින්න. ( 1 පේ්‍රතෘස් 5:8-9)

2. අටවෙනි පරිච්ඡේදයෙහි සඳහන් මෙම මාතෘකාවට අදාල සාකච්ඡාව කියවන්න.

3. අටවෙනි පරිච්ඡේදයෙහි සඳහන් මෙම මාතෘකාවට අදාල සාකච්ඡාව කියවන්න.

4. අටවෙනි පරිච්ඡේදයෙහි සඳහන් මෙම මාතෘකාවට අදාල සාකච්ඡාව කියවන්න.

5. අටවෙනි පරිච්ඡේදයෙහි සඳහන් මෙම මාතෘකාවට අදාල සාකච්ඡාව කියවන්න.

## නම වන පරිච්ඡේදය

1. පව්කරන තැනැත්තේ යක්ෂයාගෙන්ය මක්නිසාද යක්ෂයා පටන් ගැන්මේ සිට පව්කරන්නේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිණිසය, එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශ කරණ පිණිසය.(1 යොහාන් 3:8)

2. නමවන පරිච්ඡේදයෙහි මෙම මාතෘකාව පිළිබඳ සාකච්ඡාව බලන්න.

3. යක්ෂයාගේ ක්‍රියා විනාශ කර දැමීම.

4. දේව වචනය , බලය සහ ආධිපත්‍යය, යාඥාව, නිරාහාරය, රාජ්‍යයට යතුරු සහ යේසුස් වහන්සේගේ නාමය.

## දහවන පරිච්ඡේදය

1. යක්ෂයාට ඉඩ නොදෙන්න.(එපීස 4:27)

2. ආරක්ෂාකාර්‍ය සටන් වැදීම නම් තම දේශ සීමාව ආරක්ෂා කර ගැනීම සඳහා යුධ කිරීමය. එම ක්‍රමයෙහිදී සතුරා පහර දීමට පැමිණෙන තුරු බලා සිට තම බලවේග එකමුතුව ආරක්ෂාව පිණිස සටන් කරනු ඇත. මෙම සටන් වලදී සතුරාගේ දේශ සීමාවට ඇතුළුව ඉදිරියට යාමක් සිදු නොවේ. එහිදී දැනටම අත්පත් කරගෙන ඇති ප්‍රදේශ තහවුරු කර ආරක්ෂා කරනු ඇත.

3. පහරදීමේ සටන් වැදීම සීමා කඩාගෙන ඉදිරියට යන යුද්ධ කිරීමකි. එය බලාසිට ප්‍රතිචාර දක්වන සටන් ආරක්ෂිත වර්ගයේ ක්‍රමයක් නොවේ. මෙම සටන් ක්‍රමයෙහිදී පහර දීම පලමුව සිදුවේ. සතුරාව හඳුනා ගෙන සතුරාගේ ශිල්පීය උපක්‍රම වටහාගෙන, ආත්මික ලොවෙහි ඔහුට එරෙහිව පහරදීමේ සටන් ඉදිරියට දියත් කොට ඇත.

4. ආරක්ෂාව සඳහා පහරදීම සඳහා සිදු කරන සටන් වලදී, ඇඳහිලිවන්තයා පෞද්ගලිකව ක්‍රියා කළ යුතුවේ.

5. දහවන පරිච්ඡේදයෙහි මෙම විෂය සම්බන්දව සාකච්ජාව බලන්න.

6. දහවන පරිච්ඡේදයෙහි මෙම විෂය සම්බන්දව සාකච්ජාව බලන්න.

## එකොළොස්වන පරිච්ඡේදය

1. යක්ෂයාගේ උපාය වලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන්වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගන්න.(එපීස 6:11)

2. දහවන පරිච්ඡේදයෙහි මෙම විෂය සම්බන්ද සාකච්ජාව බලන්න.

3. එපීස 6:13-17

4. එකොළොස්වන පරිච්ඡේදයෙහි ආත්මික යුද්ධායුධ සම්බන්දව සාකච්ජාව බලන්න.

## දොළොස්වන පරිච්ඡේදය

1. ස්වාමීන්වහන්සේ තමන්ගේ ගබඩාව ඇර, තමන්ගේ කෝපයේ ආයුධ එළියට ගත්සේක. මක්නිසාද කල්දිවරුන්ගේ දේශයෙහි ස්වාමිවූ සේනාවල ස්වාමීන්වහන්සේ විසින් කරන්ට වැඩක් තිබේ. (යෙරමියා 5:25)

2. ඔබගේ සාරාංශය දොළොස්වෙනි පරිච්ඡේදයේ මෙම විෂය සම්බන්දව ඇති සාකච්ජාව බලන්න.

## දහතුන්වන පරිච්ඡේදය

1. මාගේ පුත්‍රවූ තිමෝතියස්නි, නුඹ ගැන කලින් කීවාවූ අනාගතවාක්‍යය ලෙස මේ ආඥාව නුඹට භාරදෙමි. ( 1 තිමෝති 1:18)

2. ආත්මික ලොවෙහි සිදුවන කාරනා පැහැදිලි කිරීමට ස්වාභාවික මූලධර්ම භාවිතා කරනු ලැබේ. අපට ස්වාභාවික ලොවෙහි දක්නට ලැබෙන කාරණා වටහා ගත හැකිය. ආත්මික ලොවෙහි සිදු වන කිසියම් දෙයක් හා ස්වාභාවික ලොවෙහි කාරණා එකිනෙක සංසන්දනය කල විට ස්වාභාවික ලොවෙහි කරුණු මගින් ආත්මික දේ වටහා ගත හැක. දෙවියන්වහන්සේ යුද්ධය පිළිබඳ ස්වාභාවික උදහරණ භාවිතා කලේ එයින් ආත්මික ලොවෙහි යුද්ධය පිළිබඳ බොහෝ මූලධර්ම අදාල කර ගත හැකි බැවිනි.

3. ඔබගේ සාරාංශය දහතුන් වන පරිච්ඡේදයෙහි මෙම විෂයට අදාල සකච්ජාව හා සංසන්දනය කර බලන්න.

## දහහතර වන පරිච්ඡේදය

1. මින්මතු අපි පාපයට සේවය නොකරන ලෙස පාප ශරීරය නැතිවන පිණිස, අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනලද බව දනිමුව. මක්නිසාද මැරුණාවූ තැනැත්තේ පාපය ගැන නිර්දෝෂකරනු ලැබ සිටියි.(රෝම 6:6-7)

2. උපක්‍රම යනු හමුදාමය ක්‍රියාකාරකම් සැකසීම හා දියත් කිරීමේ විද්‍යාවයි. එය ජයග්‍රහණය කරා යොමු කරවන සැලසුම් ක්‍රම වේ.

3. "ප්‍රති" යන වචනයෙහි අරුත නම්, විරුද්ධ, බාධක, පරාජය හෝ අසහනයට විරුද්ධව ක්‍රියා කිරීමය. ප්‍රතිශිල්පීය උපක්‍රමයක් යනු සාතන්ට එරෙහිව සංවිධානාත්මක සැලසුමක් හා ක්‍රමයක් මගින් දියත් වීමකි. එය නිර්මාණය කර තිබෙනුයේ ආත්මික ලොවෙහි සාතන් ගේ පහර දීම් බාධා කිරීමට, පරාජය කිරීමට හා සාතන්ව අසහනයට පත් කිරීමටය.

4. ඔබගේ සාරංශය දහහතරවන පරිච්ඡේදයේ සඳහන් සාකච්ඡාව හා සංසන්දනය කරන්න.

5. ඔබගේ සාරංශය දහහතරවන පරිච්ඡේදයේ සඳහන් සාකච්ඡාව හා සංසන්දනය කරන්න.

## පහළොස් වන පරිච්ඡේදය

1. මක්නිසාද අපි මාංසයෙහි හැසිරෙන නුමුත් මාංසයේ හැටියට යුද්ධ නොකරමුව. (මක්නිසාද අපේ යුද්ධායුධ මාංසික නොවේය. එහෙත් ඒවා බලකොටු බිඳහෙළීමට දෙවියන්වහන්සේ ඉදිරිපිට බල සම්පන්නය.) අපි විවාදයන්ද දෙවියන්වහන්සේ ගැන දැනගැනීමට විරුද්ධව උසස් වන්නාවූ සියලු උසස් දේවල්ද බිඳහෙළා, සියලු සිතිවිලි ක්‍රිස්තුස්වහන්සේට කීකරුවීමට වහල්කරදෙමුව.( 2 කොරින්ති 10:3-5)

2. මනසෙහි.

3. ඒවානම් දුෂ්ඨ කමේ ගිනි හෙල්ල වේ. සතුරා නිරතුරු ආත්මික ලොවෙහි අප වෙතට "ගිනිහෙල්ල" එල්ල කරයි. මින් බොහෝ "හෙල්ල පහරවල්" එල්ල වනුයේ මනස වෙතටය.

4. ඔබගේ පිළිතුර පහළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව හා සංසන්දනය කරන්න.

5. ඔබගේ පිළිතුර පහළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡාව හා සංසන්දනය කරන්න.

## දහසය වන පරිච්ඡේදය

1. නුමුත් දිව දමනයකරන්ට කිසි මනුෂ්‍යයෙකුට නුපුළුවන, ඒක කැරළිකාරවූ මරණීය විෂයෙන් පූර්ණවූ නපුරු දෙයක්ය.(යාකොබ් 3:8)

2. දිව.

3. මෙම විෂය සම්බන්ද දහසයවන පරිච්ඡේදයේ සාකච්ඡාව ඔබගේ සාරංශය සමග සංසන්දනය කර බලන්න.

4. මෙම විෂය සම්බන්ද දහසයවන පරිච්ඡේදයේ සාකච්ඡාව ඔබගේ සාරංශය සමග සංසන්දනය කර බලන්න.

## දහ හත් වන පරිච්ඡේදය

1. එවිට මම ඔවුන්ට උත්තරදෙමින්: ස්වර්ගයේ දෙවියන්වහන්සේම අපේ කාරණය සඑලකරනවා ඇත: එබැවින් උන්වහන්සේගේ සේවකයෝවූ අපි නැගිට ගොඩනගන්නෙමුව. නුමුත් නුඹලාට යෙරුසලමෙහි කිසි කොටසක් හෝ අයිතිවාසිකමක්වත් සිහිවීමේ ලකුණක්වත් නැතැයි කීවෙමි.(නෙහෙමියා 2:20)

2. ඔබගේ පිළිතුරු දහහත්වන පරිච්ඡේදයේ සපයා දී ඇති ලැයිස්තුව හා සමග සංසන්දනය කර බලන්න.

   සාතන් විනාශ කර දැමීමට ඉලක්ක කරන්නා වු ඔබගේ ආත්මික පවුරු නම්:

   - ගැලවීම නම් පවුර, ප්‍රශංසාව නම් දොරටු.
   - අපගේ ජීවිතයෙහි කුරුසියෙහි ක්‍රියාව.
   - ක්‍රිස්තියානි සාක්ෂිය.
   - අළුත් ස්වභාවයට වෙනස් වූ පරණ ස්වාභාවය
   - දුක් විදීමේදී හා පරීක්ෂා කරනු ලබන කළ සුදුසු ආකල්පය.
   - මාංශයේ ක්‍රියා ඉවතලෑම.
   - ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියා.
   - දේව වචනය.
   - ආත්මික යුද්ධය.
   - යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම පිළිබඳ බලාපොරොත්තුව.
   - තමාව සෝදිසිය

3. පාපය.

4. දහහත්වන පරිච්ඡේදයේ දී ඇති ලැයිස්තුව හා ඔබගේ ලැයිස්තුව සංසන්දනය කරන්න.

5. ඔබගේ උපක්‍රම ලැයිස්තුව 17 වන පරිච්ඡේදයෙහි දී ඇති ලැයිස්තුව සමග සංසන්දනය කරන්න.

## දහ අට වන පරිච්ඡේදය

1. සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය. (යොහාන් 10:10)

2. 18 වන පරිච්ඡේදයෙහි භෞතික ශරීරයට එරෙහිව සාතන්ගේ උපක්‍රම නම් කොටස හා ඔබගේ සාරාංශය සංසන්දනය කරන්න.

3. 18 වන පරිච්ඡේදයේ භෞතික ශරීරයේ ජයග්‍රහණය සඳහා ආත්මික ප්‍රති උපක්‍රම පිළිබඳ සාකච්ජාව හා ඔබගේ සාරාංශය සංසන්දනය කරන්න.

4. 18 වෙනි පරිච්ඡේදයේ මනුෂ්‍ය පෞද්ගලිකත්වයන් සාතන්ගේ උපක්‍රම ලෙස යොදා ගැනීම නම් කොටස හා ඔබගේ සාරාංශය සංසන්දනය කරන්න.

5. 18 වෙනි පරිච්ඡේදයේ ජයග්‍රහණය සඳහා මනුෂ්‍ය පෞද්ගලිකත්වයන් ආත්මික ප්‍රතිඋපක්‍රමය ලෙස භාවිතා කිරීම කොටස හා ඔබගේ සාරාංශය සන්සන්දනය කරන්න.

6. පවුලට එරෙහිව සාතන්ගේ උපක්‍රම නම් 18 වෙනි පරිච්ඡේදයේ සදහන් සාකච්ජාව හා ඔබගේ සාරාංශය සන්සන්දනය කරන්න.

7. පවුලෙහි ජයග්‍රහණය සඳහා ආත්මික ප්‍රති-උපක්‍රමය නම් 18 වෙනි පරිච්ඡේදයේ සඳහන් සාකච්ජාව හා ඔබගේ සාරාංශය සන්සන්දනය කරන්න.

8. මුදල් හා භෞතික අවශ්‍යතා පිළිබඳ සාතන්ගේ උපක්‍රම නම් 18 වෙනි පරිච්ඡේදයේ සඳහන් සාකච්ඡාව හා ඔබගේ සාරාංශය සන්සන්දනය කරන්න.

9. මුදල් හා භෞතික අවශ්‍යතා වල ජයග්‍රහණය සඳහා ආත්මික ප්‍රති උපක්‍රම නම් 18 වෙනි පරිච්ඡේදයේ සඳහන් සාකච්ජාව හා ඔබගේ සාරාංශය සන්සන්දනය කරන්න.

## දහනමවෙනි පරිච්ඡේදය

1. මම බැස එහිදි නුඹ සමා කථාකරන්නෙමිග නුඹ තනියම සෙනාගේ බර නුසුලාල ඔවුන් නුඹ සමා එය උසුලන පිණිස නුඹ කෙරෙහි තිබෙන ආත්මයෙන් ගෙන මම ඔවුන් කෙරෙහි තබන්නෙමිග (ගණන්කථාව 11:17)

2. පවරාදීම යනු එක් පුද්ගලයෙකුගෙන් අනෙක් පුද්ගලයා වෙතට සන්නිවේදනය වේ. මෙම පාඩමෙහි භාවිතා කර ඇති පරිදි "ආත්මය" ලෙසට නිරූපණය වනුයේ චරිතය,ආකල්ප,හෝ ක්‍රියාවක පසුපස ගැබ් වී ඇති අරමුණය. කිසියම් පුද්ගලයෙකු යහපත් හෝ නපුරු බලපෑමක් යටතේ සිට එම ආත්මය අන් අය වෙත පෞද්ගලික පදනමෙන් හෝ කණ්ඩායම් පදනමෙන් පවරා දිය හැක.

3. ගණන් කථාවේ 11:16-17 හි සඳහන් මෝසෙස් සහ වැඩිමහල්ලන් 70 දෙනාගේ කථාව.

4. ගණන් කථාවේ 13 හි ඔත්තු කාරයන් 10 දෙනාගේ කථාව.

5.
- ඔබගේ ආත්මය පාලනය කරන්න.
- දිව පාලනය කරගන්න.
- ඔබගේ ආසාවන් පාලනය කරගන්න.
- ඔබගේ යහළු මිතුරන් (සහභාගිකම් පවත්වන්නන්) ප්‍රවේශමෙන් තෝරා ගන්න.
- ඔබගේ ශාරීරික සංවේදි ඉන්දියයන් පාලනය කරගන්න.
- " අත් තැබීමේදි " ඉතා ආරක්ෂාකාරීවන්න.

## විසිවෙනි පරිච්ඡේදය

1. මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි. එබැවින් ඔහුගේ සේවකයෝ ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වෙස් ගනිත් නම් ඒක පුදුමයක් නොවේ: ඔවුන්ගේ අන්තිමය ඔවුන්ගේ ක්‍රියා ලෙස වන්නේය. (2 කොරින්ති 11:14-15).

2. ඒවා නමස්කාරය උදෙසා පාවිච්චි කරන ලදි.

3. පාවුල් තුමා "උසස් ස්ථානවල ආත්මික දුෂ්ඨකම" පිළිබඳව පවසන කල ඉන් අදහස් වන්නේ ලෝකයේ ආගමික පද්ධතියට ඇතුළුවී සිටින දුෂ්ඨ ආත්ම ගැනය. මෙම දුෂ්ඨ ආත්ම ධර්මිෂ්ඨයන්ගේ එක්රැස්වීම් වලට පවා ඇතුළු වී සිටී.

4. ඔබගේ සාරාංශය විසිවන පරිච්ඡේදයේ සාකච්ජාව හා සංසන්දනය කරන්න.

5. ඔබගේ පිළිතුර විසිවන පරිච්ඡේදයේ සාකච්ජාව හා සංසන්දනය කරන්න.

## විසි එක්වන පරිච්ඡේදය

1. දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරිය යේසුස්වහන්සේ ආලේපකළ බවත් දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටින බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසිරුණු බවත්ය.(ක්‍රියා 10:38).

2. පෙළඹවීමේ ආත්ම, දුර්වලකමේ ආත්ම, අපවිත්‍ර කමේ ආත්ම.

3. ආත්ම විමසීමේ දීමනාව ඇදහිලිවන්තයෙකු හට අන්අය තුල ක්‍රියා කරන ආත්ම විමසා දැන ගැනීමට මෙන්ම ක්ෂණයකින්ම එය දුෂ්ඨ ආත්මයක්ද එසේම එම ආත්මය පුද්ගලයා තුලින් හෝ පුද්ගලයාට එරෙහිව ක්‍රියාකරන්නේද යන්න දැන ගැනීමට හැකියාව සපයයි. එමගින් පෙළඹවීමේ ආත්ම හෝ බොරුකාර ආත්ම මගින් රැවටීම වලක්වාලයි. මෙවන් දීමනාව සතු කෙනෙකු හට යක්ෂ බලවේගවල උපායශීලි වැඩ මෙන්ම එහි අරමුණද හදුනා ගැනීමට හැකිවේ.

4. යක්ෂාවේශ වීම නම් මනුෂ්‍යයෙකුගේ සිරුර තුල එක් යක්ෂ ආත්මයක් හෝ ඊට වැඩි ගණනක් ජීවත් වීම තුලින් එම මනුෂ්‍යයාව යක්ෂයාට අවශ්‍ය පරිදි පාළනය කිරීමේ තත්වයකි.

5. ඔබගේ ලැයිස්තුව 21 වෙනි පරිච්ඡේදයේ දී ඇති ලැයිස්තුව හා සංසන්දනය කර බලන්න.

6. යක්ෂයන් කෙරෙහි සිත තුළ ආසාවක් දැක්වීම නම් යකුන් සාතන් හා යක්ෂයන් හා බැදි ක්‍රියාවන් පිළිබඳ කාරණා වලට උනන්දුව දැක්වීමය.

7. ඔබගේ ලැයිස්තුව 21 වෙනි පරිච්ඡේදයෙහි ඇති ලැයිස්තුව හා සංසන්දනය කරන්න.

8. යක්ෂයන්ගේ පීඩාවට ගොදුරුවීම නම් බාහිර වශයෙන් යක්ෂ බලවේග වලට යටවීම, ඒවා තමුන්ට එරෙහිව නැගිසිටීම හෝ බැඳීමකට ලක් වීමය.

9. ඔබගේ ලැයිස්තුව 21 වෙනි පරිච්ඡේදයෙහි ඇති ලැයිස්තුව හා සංසන්දනය කරන්න.

10. ඔබගේ සාරාංශය 21 වෙනි පරිච්ඡේදයෙහි සාකච්ජාව සමග සංසන්දනය කරන්න.

## විසිදෙවෙනි පරිච්ඡේදය

1. ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ යහපත් භේවායකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙන්න. (11 තිමෝති 2:3).

2. පාපය සහ සාතන්.

3. විසිදෙවෙනි පරිච්ඡේදයෙහි සාකච්ජා කොට ඇති ඇඳහිලිවන්තයෙකුගේ ජීවිතයට දුක් විඳීම ඇතුළුවන ක්‍රම 5 පුණරීක්ෂණය කරන්න.

4. දුක් විඳීමේදී ඇති වන යහපත් දේ පිළිබඳ 22 වෙනි පරිච්ඡේදයේ සාකච්ජාව පුණරීක්ෂණය කරන්න.

5. දුක් විඳීමේදී දැරිය යුතු නිවැරදි ආකල්පය පිළිබඳ 22 වෙනි පරිච්ඡේදයේ සාකච්ජාව පුණරීක්ෂණය කරන්න.

6. අ. අසත්‍යය
   ආ. අසත්‍යය
   ඇ. අසත්‍යය
   ඈ. සත්‍යයය

## විසි තුන්වෙනි පරිච්ඡේදය

1. මම යහපත් යුද්ධයෙහි යුද්ධ කළෙමි, මම දිවීම කෙළවරකළෙමි. මම ඇදහිල්ල රක්ෂා කළෙමි.( 11 තිමෝති 4:7).

2. දාවිත්, යොෂුවා,එළියා, පාවුල්

3.
    - ඔබගේ අසමත් කම හදුනා ගන්න.
    - පසුතැවිලි වන්න.
    - ඔබගේ ආත්මික ශක්තිය නැවතත් ගොඩනගා ගන්න.
    - යුද බිමට නැවත හැරී යන්න.

4. රෝම 8:1

5. 11 තිමෝති 2:26

6. ආත්මික සටනෙහිදී අප කෙරෙහි අපට විශ්වාසය තැබිය නොහැක. අපගේ ස්ථිර කම රැඳිය යුත්තේ දෙවියන්වහන්සේ තුලය.

## විසිහතරවෙනි පරිච්ඡේදය

1. ඔවුන් මුළාකළ යක්ෂයා වනාහි,මෘගයාද බොරු අනාගතවක්තෘද වසන, ගින්නෙන්ද ගෙන්දගමින්ද යුත් විලට හෙළනු ලැබුවේය: ඔව්හු සදාකාලෙටම දිවා රෑ දෙක්හි වධකරනු ලබති.(එළිදරව් 20:10).

2. ඔබගේ සාරාංශය 24 පරිච්ඡේදයේ සාකච්ජාව සමග සසඳන්න.

3. අවසාන සටන සිදු වනු ඇත්තේ සහශ්‍රයට පසුව කිසියම් කාල සීමාවකට යක්ෂයාව නිදහස් කළ විටය. යක්ෂයාගේ දුෂ්ඨ බලවේග විනාශ කරණ පිණිස දෙවියන්වහන්සේගෙන් ගිනි බැස එනු ඇත. සාතන් සහ ඔහුගේ සියළු දුෂ්ඨ බලවේග අවසාන ඉරණම් ස්ථානය කරා යනු ඇත.
4. ඔව්හු සදාකාලිකව දුක් විඳින පිණිස ගින්නෙන් හා ගෙන්දගමින් දැවෙන සදාකල ගිනි විලට හෙලනු ලැබේ.